
# මුක්(හ්)තසර් ජාමිඋල් උලූම් වල් හිකම්

## පුළුල් අර්ථ ඇති කෙටි ප්‍රකාශන

(සිංහල)



# مختصر جامع العلوم والحكم

සියලුම හිමිකම් ඇවිරිණි.

පළමු මුද්‍රණය.

හන්බලී සම්ප්‍රදායීය ඉමාම් අල් හාෆිල් ඉබ්නු රජබ්ගේ

# මුක්(හ්)තසර් ජාමිඋල් උලූම් වල් හිකම්

මුහම්මද් ඉබ්නු සුලෙය්මාන් ඉබ්නු අබ්දුල්ලාහ් අල් මිහ්නා

විසින් මෙය සංක්ෂිප්ත කොට සංස්කරණය කරන ලදී.

හදීස්වේදී අබ්දුල් අසීස් ඉබ්නු මර්සූක් අත්තරීෆී

විසින් එයට පෙරවදනක් ලබා දී එහි ඇතැම් තැන්වලදී අදහස් දක්වමින් මස්ජිද්වල හා සභාවන්වල පවා කියවා උපදෙස් දෙන ලදී.

ඉබ්නු අල් ජව්රී මුද්‍රණාලය




අපරමිත දයාන්විත වූ අසමසම කරුණා ගුණයෙන් යුත්
අල්ලාහ්ගේ නාමයෙන් ආරම්භ කරමි.

## පෙරවදන

ඔහුගේ දහම වෙත අප මග පෙන්වා ඔහුගේ සාක්ෂි හා සාධක තුළින් අපගේ හදවත් අලෝකමත් කළ ලෝවැසියන්ගේ පරමාධිපති වූ අල්ලාහ්ටම සියලු ප්‍රශංසා හිමිය. කීර්තිය හා ගෞරවය ඔහුට පමණක් සතුය. ඔහු මග පෙන් වූ දහම පහසුවෙන් පිළිපදින්නටත් ඔහුගේ භාග්‍ය හා දායාද තුළින් ඔහු අපහට අඛණ්ඩව පිරිනමන ආශිර්වාද පූර්ණවත් කරන්නටත් අපි ඔහුගෙන් ඉල්ලා සිටිමු.

වහී හෙවත් දේව පණිවිඩ සුවිශේෂී වනුයේ එහි වචනාර්ථ සමග සසදා බලන කල සාමාන්‍ය වචනයකට වඩා එහි ප්‍රමාණය කුඩා වීමය. ඉමාම් බුහාරි තුමා වාර්තා කළ සහ්ල් තුමාගේ හදීසය අනුව මුහම්මද් ﷺ තුමා එයට ජවාමිඋල් කලිම් (පුළුල් අර්ත ඇති කෙටි ප්‍රකාශන) යනුවෙන් නම් තබා ඇත.

මෙවැනි පුළුල් අර්ත ඇති ප්‍රකාශන මෙන් යමක් ගෙන එන්නට මිනිස් ශක්තියට නොහැකි බව එයට එකඟ වන හා එය පිළිනොගන්නා විද්වතුන් ඒකමතිකව පවසා ඇත. මේවා වර්තමානය හා අනාගතය විධිමත් කරන අයුරින් ආවරණය වී ඇත. වර්තමානයට ගැළපෙන පරිදි කෙටි වී ඇති ප්‍රමාණයේ හා එහි අන්තර්ගතව ඇති කරුණු තුළින් මෙම ප්‍රකාශනවල තරම පැහැදිලි වන්නේය. මේවා අල් කුර්ආනයේ හා සුන්නාවේ සමානව දැකිය හැක. ඒ දෙකම දේව පණිවිඩ වේ. සූරා නජ්ම් හි 3, 4 වැකිවල “ඔහු ආශාවන්ට අනුව කතා නොකරයි. එසේ කතා කළේ නම් එය දන්වනු ලබන දේව පණිවිඩයක් මිස නැත.” යැයි සඳහන් වී ඇත.

කෙටි කිරීම, ගොනු කිරීම, පැහැදිලි කිරීම හා සංස්කරණය කිරීම යනාදී කරුණු අවදානයට ගෙන සුන්නාවේ ද (නබි තුමාගේ ප්‍රකාශවල) හදීස් ප්‍රකාශන බොහෝමයක් විද්වතුන් විසින් සුවිශේෂී කොට පෙන්වා දී ඇත. ඒවා ජවාමිඋල් කලිම් (පුළුල් අර්ත ඇති කෙටි ප්‍රකාශන) වේ. ඒවා ඉතා කුඩා ප්‍රකාශන වුවද පුළුල් අර්ථ සහිතව ගොනු

වී ඇත. එම ගොනුවේ ඇති වචන, වාග් ශෛලය, කරුණු හා විස්තර පැහැදිලි කරනු ලබන්නේ නම් පන්හිදවල් සිදී යනු ඇත.

මෙය මුහම්මදානු සමූහයා වෙත පිරි නැමූ සුවිශේෂයකි. මෙම පුළුල් අර්ත ඇති කෙටි ප්‍රකාශන වල දැනුම් සම්භාරයක් අන්තර්ගත ව ඇත. උත්තරීතර අල්ලාහ් සූරා අල් බකරා 269 වන පාඨයේ "කවරෙකුට ප්‍රඥාව දෙනු ලබන්නේ ද සැබැවින්ම ඔහුට බොහෝ යහපත පිරිනමනු ලැබේ" යැයි ප්‍රකාශ කර සිටියි. එහෙයින් කවරෙකුට ප්‍රඥාව හා අල් කුර්ආනය පිරිනමනු ලැබුවේද දේව පුස්තක ලැබූ මුල්කාලීනයන් හා වෙනත් අයහට නොදුන් දැනුම් සම්භාරයක් ඔහුට පිරිනමනු ලබයි. ඊට හේතුව අල්ලාහ් ඔවුනට පවසා ඇත්තේ "ඔබ වෙත පිරිනමනු ලැබ ඇත්තේ ස්වල්පයක් පමණි" (අල් කුර්ආන් 17: 85) යනුවෙනි. නමුත් මුහම්මදානු සම්ප්‍රදායේ පවතින ප්‍රකාශන කුඩා වුවද එහි දැනුම් සම්භාරයක් අන්තර්ගතව පිහිටා ඇත.

මෙම වර්ගයේ හදීස් ගොනු කරනු ලැබූ පොත්පත් අතුරින් ඉමාම් යහ්යා ඉබ්නු ෂරෆ් අන්නවවීගේ "අල් අර්බඋන ෆී මබානිල් ඉස්ලාම් වකවාඉදිල් අහ්කාම්" යන පොත ඉතා ප්‍රසිද්ධිය. මෙම අංශය කරළියට ගෙන ආවේ මෙකී පොතය. කටපාඩම් කිරීමෙන් හා වටහා ගැනීමෙන් විද්වතුන් මෙන්ම කුඩා දරුවන් මෙයින් පළ නෙළා ගෙන ඇත. මෙම පොතෙහි මුල් කෘතිය වූයේ හදීස් විසි හයකින් සමන්විත වූ අල් හාෆිල් අබී අම්ර් ඉබ්නු අස්සිලාහි ගේ 'අල් අහාදීසුල් කුල්ලියියා' නම් පොත් පිංචයයි. ඉමාම් නවවි තුමා තවත් හදීස් දොළොහක් එකතු කරමින් හදීස් හතළියක් බවට එය වැඩි කළේය.

ඒවා මෙම පොතෙහි ආරම්භයේම සඳහන් කරනු ලැබ ඇත. ඉබ්නු අල් මුබාරක්, ඉබ්නු අස්සින්නී හා වෙනත් අය සතුව ද මෙවන් ගණයේ පොත් තිබිණ. නමුත් ඉමාම් නවවිගේ පොත වෙනත් පොත්වලට වඩා නිවැරදි භාවයෙන් හා තේරීමෙන් උසස් විය. විද්වත්හු එහි ඇති හදීස්වල අර්ථයේ නිවැරදි භාවය පිළිබඳ එකග වුවද ඒවායෙහි පැමිණි ඇතැම් හදීස් පිළිබඳ මතභේද ඉදිරිපත් කළහ.

විද්වතුන් එය වඩාත් ශ්‍රේෂ්ඨ හා උසස් ගණයේ පොතක් ලෙස ගෙන ඇති අතර වෙනත් කිසිදු පොතට නොලියවුණු සියයකට වඩා අධික ප්‍රමාණයක අටුවාවන් මෙම පොත සඳහා ලිය වී ඇත. මෙවන් පොත්වලට විශාල වටිනාකමක් හිමිය. ඒවා අතුරින් වඩාත් විශිෂ්ට ලෙස අවබෝධය ලබා දෙන, අධික බලපෑමක් ඇත කරන, වාර්තා සම්බන්ධතාවන් හා දැනුමෙන් විශිෂ්ට ලෙස ගොනුවුණු අල් හාෆිල් අන් නක්කාද් අබිල් ෆරජ් අබ්දිර් රහ්මාන් ඉබ්නු රජබ් අල් හන්බලීගේ 'ජාමිඋල් උලූම් වල් හිකම්' නම් කෘතිය ද එකකි.

කතුවරයා ගැන දන්නා ඕනෑම අයෙකු එහි අන්තර්ගතය ගැන පුදුමයට පත් නොවනු ඇත. යම් දෙයක මූලය විශිෂ්ට නම් එයින් බිහිවන දෑද විශිෂ්ට වනු ඇත. තවද යම් කරුණක් එයට සුදුසු ස්ථානයකින් ලබා ගන්නේ නම් එහි ප්‍රමිතිය පිළිබඳ පුදුමයට පත් වීමට අවශ්‍ය නැත. මන්ද ඔහු වාර්තාකරණය හා දැනුම එකටම ගොනු කළ අයෙකි. විවේචන, තර්කනය, විමර්ශනය හා යුක්තිය ඇගයීම පිළිබඳ මහාචාර්යවරයෙකි. -මා දන්නා තරමට- වාර්තාකරණයේ සියුම් දෝෂ හඳුනා ගැනීමේ දී ඔහුගෙන් පසු පැමිණි කිසිවකු ඔහු සමඟ සැසඳිය නොහැක. ඔහු ශ්‍රේෂ්ට කාල පරිච්ඡේදයන්වල පවසනු ලැබූ කියමන් සම්බන්ධයෙන් පුළුල් දැනුමක් ඇති අයෙකි. එමෙන්ම ඔවුන්ගේ ස්ථාවරයන්, ඔවුන් ජීවත් වුණු ප්‍රදේශ හා ඔවුන් සෑම කෙනෙකුට විශේෂිත වූ කරුණු පිළිබඳ මැනවින් දන්නෙකි. ඔහු අහ්මද් ඉබ්නු හන්බල්ගේ පියවර අනුගමනය කළ අයෙකි. 'ජාමිඋල් උලූම් වල් හිකම්' නමැති ඔහුගේ පොත ඒ සඳහා සාධාරණීය සාක්ෂියකි. ඔහුට ළංවන හා ඔහුට සමීප වන කවරුන් සිටිය හැකි ද!

අධ්‍යාපනය හදාරන ශිෂ්‍යයින් අතුරින් බොහෝ දෙනා මෙම පොත හරහා ප්‍රයෝජන ලබා ඇත. මෙම පොතෙහි ප්‍රමාණයත් සමග බලන කල, ප්‍රයෝජනවත් අධ්‍යාපනික කිසිදු මාතෘකාවක් ඉන් මග හැරී නැත. නමුත් පොදු ජනතාව අතර බොහෝ දෙනෙකු සහ ආරම්භක අධ්‍යාපනය ලබන ඇතැමුන් එහි සඳහන් කර ඇති පුළුල් දැනුමෙන්

ප්‍රයෝජනය ලබා නොමැත. ඒ දෙස බලන සෑම කෝණයකින්ම එහි සඳහන්ව ඇති සෑම කරුණක් තුළින්ම ප්‍රයෝජනය ලැබිය හැකිය. සියුම් බුද්ධියක් ඇති අයකු එහි කවර පැත්තකට යොමු වී බැලුවත් ඉන් ප්‍රයෝජන ලබනු නිසැකය.

හදීස්වල පද අර්ථ ගැන්වීමෙන් හා ඒ සඳහා කුර්ආනය, සුන්නාහ්ව හා සෙසු උපුටා ගැනීම් තුළින් සාක්ෂි හා සාධක ඉදිරිපත් කොට කතෘවරයා විසින් මෙහි පෙන්වා දී ඇති දැඩි විමර්ශනාත්මක කරුණු හේතුවෙන් මෙම පොත විශිෂ්ට ගණයේ පොතක් බවට පත්ව ඇත. එමෙන්ම විශ්ලේෂණය, තර්කනය, භාෂමය හැසිරවීම, ආගමික සීමාවන් හා නීතිරීති ඉදිරිපත් කිරීම වැනි කාරණාවන් ඉතා ප්‍රවේශමෙන් පුළුල් ලෙස අනුගමනය කර තිබීමෙන් එය පෙන්නුම් කරන්නේ කතුවරයාගේ ස්ථාවරත්වය, විශිෂ්ට දැනුම සහ සියලු විද්‍යාවන්හි විචක්ෂණ භාවයයි.

අධ්‍යාපනය හදාරන ආරම්භක සිසුවන් සහ සාමාන්‍ය ජනතාව ප්‍රයෝජනය ලබන අයුරින් මෙවැනි පුළුල් ග්‍රන්ථයක් දළ වශයෙන් හෝ කෙටියෙන් දැක්විය යුතුව ඇත. එය විද්වත් උදවියටද ප්‍රයෝජනවත් වේ. ඒ සමඟම එය කතුවරයාගේ අපේක්ෂිත සම්භවය උල්ලංඝනය නොවන අයුරින් පිහිටිය යුතු වන්නේය. එය සෑම කෙනෙකුටම මනා අයුරින් ඉදිරිපත් කළ නොහැකි කාර්යයකි. ආරම්භක පොත් පත් හා සංස්කරණයන් එකිනෙකට වෙනස් වනවාක් මෙන්ම සංක්ෂිප්තයන් ද වෙනස් වන්නේය. නමුත් එම සංෂිප්ත ග්‍රන්ථ තීක්ෂණ බුද්ධියක් නොමැත්තන් හට නව සංස්කරණයක් ලිවීමට වඩා අසීරු වනු ඇත.

සංෂිප්තයක් යනුවෙන් අදහස් කරනුයේ අකුරු හා වචන ගණන අඩුවෙන් පිහිටීම පමණක් නොවේ. එසේ සංෂිප්ත කරන්නාට අවශ්‍ය වනුයේ වචනය සහ අර්ථය වැසීමට හේතුවක් නොවන ප්‍රමාණයට අමතර දෑ ඉවත් කිරීමය. වටහා ගන්නට ප්‍රමාණවත් ලෙසින් පිහිටා ඇති කොටස් ප්‍රකාශයෙන් ඉවත් නොකළ යුතුය. අවබෝධය ලැබීමට

අමතරව යමක් ඇත්නම් එය මිනිසුන්ගේ අවශ්‍යතාවයට අනුව පිහිටන අතිරික්තයයි. යම් සංක්ෂිප්තයක් සමීපාර්ථයෙන් හා ලිහිල් වාක්‍ය ඛණ්ඩයෙන් තොර නම්, එය නොයෙකුත් අර්ථයන් සමඟ ගැටෙන සංකීර්ණ ස්වභාවයක් ඇති කර එය තේරුම් ගැනීමට අවශ්‍ය වන කාල අවකාශයටද බාධාවක් එල්ල කරනු ඇත. එය මුලින් නිවැරදි කරනු ලද්දේ නම් එය ඉමහත් ප්‍රයෝජනයක් වන්නේය. මෙවන් සංෂිප්ත ප්‍රකාශන අනුගමනය කිරීම කාලය නාස්ති කිරීමකි.

වටහා ගන්නට අපහසු සංෂිප්ත ග්‍රන්ථ මත ජනයා බැඳී සිටීම, අඩු වචන ප්‍රමාණයක් ධාරණය කොට ස්වල්ප ප්‍රයෝජනයක් ලබා උදම් ඇනීම, පූර්ණ වශයෙන් අර්ථය තේරුම් ගැනීමේ හා ගැටුම් නිරාකරණයේදී කල්මරමින් කාලය නාස්ති කිරීම, මුල් කාලීනයන්ගේ පොත් අතහැර දැමීම, කෙටි කලක් තුළ එහි අඛණ්ඩව සොයා බලන්නාට මනා නිපුණතාවක් ලැබිය හැකි පැහැදිලි සාධක සහිත, අර්ථ ව්‍යාප්තව පවතින ප්‍රධාන මූලධාර්මික ග්‍රන්ථ හා අටුවාවන් සොයා බැලීමට නොහැකි වීම යනා දී කරුණු දැනුමේ සාරය පිරිහීමටත් එයට අයත් උදවියගේ නිපුණතාව හීන වීමටත් හේතුව බව ප්‍රසිද්ධ විද්වතුන් බොහෝ දෙනා සඳහන් කර ඇති කරුණකි. මෙම ස්ථාවරත්වය එය සොයා බලන හා එහි මිහිර ලබන අයට පමණක් මිස වෙනත් අයහට දැන ගත නොහැකිය.

සුදුසු වචන හා එයට ආරෝපණය කළ යුතු සුදුසු කරුණු පොතක් සාරාංශගත කරන්නෙකු විසින් තෝරා ගත යුතුය. තනි වචන අනුව වචන වෙනස් නොවේ. ඒ වෙනුවට වචනයේ තේරුම ඊට පරව ඇති අර්ථයට ගැළපෙන පරිදි එහි වෙනස්කම් සිදුවීම උතුම්ය.

සමහර කතුවරුන් මුල්කාලීනයන් සහ සමකාලීනයන්ගේ පොත් පත් බොහොමයක් සාරාංශ ගත කොට ඇති නමුත් වාක්‍ය හසුරුවන්නේ කෙසේ ද, එය ඉදිරිපත් කරන්නේ කෙසේ ද එය විකාශනය කරන්නේ කෙසේ දැයි නොදනී. එමෙන්ම මිනිසුන්ගේ පෙළපතට සමාන පෙළපතක් වචනවලට ද ඇති බව ඔවුන් හඳුනන්නේ නැත. තම සීයා

අනුගමනය කිරීමට පුතාට අවසරය තිබුණත් ඔහුගේ පියාගේ පැමිණීමත් සමඟ ඔහුව අනුයුක්ත කිරීම අඩුපාඩුවකි. එලෙස ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් කරුණක අවසරය සහ අසම්පූර්ණකම අතර වෙනස හඳුනා ගෙන නැත.

අසම්පූර්ණ වූ, අර්ථය ද පූර්ණ නොවූ කොළ සහ පේළි ගණන කොපමණද යන්න ගණන් කිරීම ඇතැම් ග්‍රන්ථ සංෂිප්ත කරන්නන්ගේ අපේක්ෂාවයි. එය ගල් විසි කර ගෙඩි ගණන් කරන අයගේ තත්ත්වයට සමානය. ඔවුන් එසේ කිරීමට පෙළඹුණේ කතුවරුන්ගේ හා ග්‍රන්ථ සංෂිප්ත කරන්නන්න්ගේ නාමාවලියේ තම නාමයද බැබළවීමට ඔහු තුළ ඇති දැඩි ආශාව හේතුවෙනි. කවරෙකු එසේ කටයුතු කරන්නේ ද ඔහු මත තරඟකාරිත්වය හා අභිබවනය ආධිපත්‍යය දරනු ඇත.

මෙම සංක්ෂිප්තයන් පරීක්ෂා කර බලන්නා ඒවායෙහි ඇතැම් ස්ථාන තවත් ස්ථාන කිහිපයකින් ප්‍රකික්ෂේප කරන ආකාරයක් දකිති. ආරම්භ කාලීනයන් ග්‍රන්ථ සංක්ෂිප්ත කිරීමේ ක්ෂේත්‍රයෙන් බැහැරව සිටියේ එබැවිනි. මන්ද කෘතියක් සංක්ෂිප්ත කිරීමේදී සිදු වන්නේ එම කෘතියෙහි සාරය හා මුල්කරුණු සමඟ ගනුදෙනු කිරිමක් බැවිනි. සැබැවින්ම තම හදවතින් දකින, තම චින්තනයෙන් පල ලබන, තම දර්ශනයෙන් ක්‍රියා කරන තම බුද්ධියෙන් විශ්ලේෂණය කරන, තම අවබෝධයෙන් ආඛ්‍යාන සමාලෝචනය කරන, එහි අන්තය දක්වාම ගොස් විමර්ශනය කරන අවංක පුද්ගලයකුට හැර වෙනත් කිසිවකුට එවන් සංක්ෂිප්ති කෘතීන් මනා ලෙස සංස්කරණය කළ නොහැකි බැවිනි. මේ කියූ කරුණු සහිත උදවියට එය පහසු කාර්යයක් වන අතර එසේ නොමැති වූ විට එය අසීරු වන්නේය.

සාමාන්‍යයෙන් වැඩිහිටියන් උපදෙස් දෙනුයේ ප්‍රධාන උල්පත් අනුසාරයෙනි. නමුත් ජල ධාරාවන් ජලය වෙනස් කරනු ඇත. එය ජලයේ නාමයෙන් පිහිටන්නේ නම් එයට එම නම භාවිතා කෙරේ. දැනුමෙහි ප්‍රධාන උල්පත් සිතට ඉතා මිහිරිය. සත්‍යයට වඩාත් සුවදායකය. විඥානයට වඩාත් හිතකරය.

බොහෝ විට සාරාංශගත පොත් බලන්නට එතරම් ප්‍රියක් මා වෙත නොවීය. එය සිතින් පිටු දැක්කෙමි. ඉමාම් අල් හාෆිල් ඉබ්නු රජබ් (රහිමහුල්ලාහ්)ගේ ජාමිඋල් උලූම් වල් හිකම්' නම් පොතට සාරාංශයක් අෂ්-ෂෙයික් අල්මර් මුහම්මද් ඉබ්නු සල්මාන් අල්මහ්නා මා වෙත පිළිගැන්වීය. එවිට මම එය කියෙව්වෙමි. එය මා ප්‍රිය කරන තරමට ඉතා ඉක්මණින් මා වෙනස් කළේය. මා එය ප්‍රතික්ෂේප කිරීමෙන් පසු පිළිගැනීමට ලක් කළේය. මීට පෙර මේ පිළිබඳ මනා දැනුමක් හා ආශිර්වාදයක් මා ලබා තිබුණ ද මෙම ප්‍රඥාව තක්වාහි ප්‍රතිඵලයක් හා ඉඛ්ලාස් හි ප්‍රතිඵලයක් වන්නේය. - මම එසේ සිතමි. අල්ලාහ් ද ඒ ගැන සිතනු ඇත.-

මෙම 'අල්මුක්(හ්)සර්' නම් පොත ඉතා කීර්තිමත් සංක්ෂිප්ත පොතකි. විශේෂයෙන් සමාලෝචනය කරන්නටත් පස්වේල සලාතයට පසු පොදු ජනතාව අතර මස්ජිද්වල කියවීමටත් ඉතා සුදුසු පොතකි. එහි පද ඉතා සරලව පිහිටා ඇති අතර එහි අර්ථගැන්වීම් ද විවිධ පැතිකඩවලින් පිහිටා ඇත.

මෙම සාරාංශගත පොත් පිංචයෙහි මුල් පිටපතෙන් ප්‍රයෝජන ලැබුවාක් මෙන් ම මෙයින් ද ප්‍රයෝජන ලබන්නට ආශිර්වාද කරත්වා! යැයි අල්ලාහ්ගෙන් ඉල්ලා සිටිමි. අල්ලාහ් උදව් කරන්නාය. තහවුරු කරන්නාය. ප්‍රතිඵල පිරිනමන්නාය.

අබ්දුල් අසීස් ඉබ්නු මර්සූක් අත්-තරීෆී

1/8/1430 හිජ්රි

## අපරිමිත දයාන්විත අසම සම කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙනි.

ලෝවැසියන්ගේ පරමාධිපති වූ අල්ලාහ්ටම සියලු ප්‍රශංසා සතුය. අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය අපගේ නබි මුහම්මද් (ﷺ) තුමාණන්ටත් එතුමාගේ පවුලේ උදවියටත්, එතුමාගේ හිතමිතුරන් ඇතුළුව සියලු දෙනාටත් හිමි වේවා!

'ජාමිඋල් උලූම් වල් හිකම්' නම් මෙම සාරාංශගත පොත ඉමාම් අල් හාෆිල් ඉබ්නු රජබ් අල් හන්බලී විසින් සංස්කරණය කරන ලද්දකි. 'ජාමිඋල් උලූම් වල් හිකම්' නම් මෙම පොත ඉමාම් නවවිගේ 'අර්බඊනන් නවවියියා' නම් පොතෙහි අර්ථ කතනයක් මෙන්ම පුළුල්ව සැකසුනු පොතකි. විද්වතුන්ගේ පූර්ණ අවධානය ඒ වෙත යොමු කර ඇත. ඉස්ලාමයේ කවයේ ක්‍රියාකාරිත්වය රඳා පවතින මෙම ශුද්ධ වූ හදීස් විග්‍රහ කිරීම සඳහා ඔවුන් එය පරිශීලනය කිරීමේදී සැලකිය යුතු සඳහනක් ලෙස ගණන් ගෙන ඇත්තෝය. ඉන් මා අදහස් කළේ 'අර්බඊනන් නවවියියා' නම් පොතෙහි සඳහන් හදීස්ය.

මා අධ්‍යාපනය හදාරන මුල් අවදියේ මෙම විශිෂ්ඨ පොත ගැන අපගේ ෂෙයික්වරුන් විසින් පැසසුමට ලක් කරනු මම අසා ඇත්තෙමි. සැබැවින්ම එය දැනුම් සම්භාරයකින් හා විහිදී ඇති මුතු අදහස්වලින් ආවරණය වී ඇත. එබැවින් මාගේ සිතත් මාගේ ශිෂ්‍යයින්ගේ සිතත් එය කියවීමටත් එහි සමෘද්ධිමත් සාගරයෙන් දැනමුතුකම් සහ අවබෝධය මතු කර ගන්නටත් පෙළඹවීය. එහි ආරම්භය කියවීමට ආරම්භ කළ පසුව කතෘ තුමා විසින් ඉදිරිපත් කර ඇති ඉතා විශිෂ්ඨ පැහැදිලි කිරීම් හා ගුණාත්මක කරුණු සඳහන් කර තිබීමත් සමග එහි ඇතැම් දෑ ගැඹුරින් සොයා බැලීමටත් එහි ඇති අවිනිශ්චිත දෑ සොයා බැලීමටත් මිස වෙනත් කිසිවක් මා වැළැක්වූයේ නැත. නමුත් ආරම්භක අධ්‍යාපනය ලබන්නෙකු විද්වතුන්ගේ ප්‍රධාන පෙළේ

පොත්පත් වලට ප්‍රවේශ වීමට පෙර විශාල වෑයමක් දරන්නටත් හා දිගු කාලයක් වැය කරටන්නටත් අවශ්‍ය වන්නේය.

දැනුම සෙවීමට ගත් උත්සාහයෙන් වසර ගණනාවකට පසු නැවත වාරයක් මම පරිශීලනය කර බැලුවෙමි. එම පුස්තකය කියෙව්වෙමි. දැනුම හා ඥානය සෙවීමේ දී එහි පියගැට පෙළ තුළ පවතින පෙළගත වීමේ ක්‍රමයෙහි වැදගත්කම දැනගැනීමෙන් වටහා ගත නොහැකිව තිබූ පර්යේෂණ හා අසීරු ගැටලු තේරුම් ගන්නට මට පහසු විය.

එය මා දුටු කල්හි, දැනුම සෙවීමෙහි නිරතව සිටින මාගේ සහෝදරයින්ගෙන් බහුතරයක් දෙනා ෂෙය්ක්වරුන්ගේ සභාවන්වල වාඩි වීම හෝ ආගමික අධ්‍යාපන ආයතන වෙත පැමිණීම හෝ පොත්පත් කියවීමෙහි ඉවසීමෙන් සිටීම ඔහුට පහසු කාර්යයක් නොවන බව මම දැන ගත්තෙමි. එසේ දැනුමට ඇලුම් කරන්නන්හට මෙම පොතේ ඇති යහපත අහිමි වී යනු ඇතැයි මම බියවූයෙමි. එය සාරාංශගත කරන්නට මම එකග වූයෙමි.

කරුණු කෙටි කිරීමේදී සාමාන්‍ය මුස්ලිම්වරුන්ට වැටහෙන කරුණු මත සීමා වෙමින් සෙසු දෑ අතහැර දමා ඇත. ඔවුනට ප්‍රමාණවත් වන තරමට හා ඔවුන් සෑහීමට පත් වන තරමට අවශ්‍ය සියලු යහපත හා මග පෙන්වීම් එහි දැක ගන්නට ඇත. එය කියවන අතරවාරයේ -ඉන්ෂා අල්ලාහ්- පෙළගත වී ඇති ආකාරයත් සමග ඔවුන් කියවනුයේ එහි සංක්ෂිප්තිය නොව මුල් කෘතිය බව ඔවුන් හඟනු ඇත.

සාරාංශගත කිරීමත් සමගම විග්‍රහයේ සඳහන් ව ඇති හදීස් සොයා බලා පල කිරීමටත් හා විද්වතුන්ගේ තීන්දු තීරණ මෙනෙහි කරන්නටත් මම ක්‍රියාත්මක වූයෙමි. පොතෙහි ඇතැම් ස්ථානවලදී සුළුවෙන් අදහස් දක්වා ඇත්තෙමි. පසුව එය මම හදීස්වේදී අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් ඉබ්නු මර්සූක් අත්-තරීෆී වෙත භාර දුනිමි. එයට පෙරවදනක් ඉදිරිපත්

කිරීම, ඒ පිළිබඳව අදහස් දැක්වීම[1] සහ එහි සටහන් සමාලෝචනය කිරීම ගැන එතුමාට කාරුණික ස්තූතිය පුද කර සිටිමි. එමෙන්ම මා වෙනුවෙන් හා සෙසු පාඨකයින් වෙනුවෙන් අල්ලාහ් එතුමාට යහපත් ප්‍රතිඵල පිරිනමත්වා![2]

අපගේ පරමාධිපතියාණනි, අපගෙන් මෙය පිළිගනු මැනව! සැබැවින්ම ඔබ සර්ව ශ්‍රාවකය. සර්ව ඥානීය. අපට සමාව දෙනු මැනව! සැබැවින්ම ඔබ අති ක්ෂමාශීලීය. මහා කාරුණිකය. අපටත් අපගේ දෙමව්පියන් හා අපගේ හිතමිතුරන් ඇතුළු සියලු දනන් හටත් සමාව දෙනු මැනව. යා අල්ලාහ් පිළිගනු මැනව!

අපගේ නායක මුහම්මද් (ﷺ) තුමා වෙත ශාන්තිය හා සමාදානය අත්වේවා!

මෙය ලියන ලද්දේ

රියාද් හි වෙසෙන මුහම්මද් ඉබ්නු සුලෙය්මාන් ඉබ්නු අබ්දුල්ලාහ් අල්මිහ්නා විසිනි.
විද්‍යුත් තැපැල: Asmohanna.m@gmail.com
දුරකතන අංකය: 00966505490525.

1. එතුමාගේ අදහස් දැක්වීම අවසන් කිරීමත් සමග එතුමාගේ නම සඳහන් වී තිබෙනු ඔබට දැක ගත හැක.

2. සාරාංශගත කිරීමෙහිදී මා පිළිපැද්දා වූ ක්‍රමවේදය වනුයේ: සියලු දනන්හට පහසුවෙන් වටහා ගත හැකි වන සේ කතෘගේ ප්‍රකාශයේ වටහා ගන්නට අපහසු නොවන සියලු දෑ සටහන් කරමින් සෙසු කරුණු ඉවත් කිරීමය. මුල් ග්‍රන්ථයේ ප්‍රමාණයෙන් තුනෙන් එකක ප්‍රමාණයකින් මෙය සාරාංශගත වී පැමිණ ඇත.

## ඉමාම් ඉබ්නු රජබ් අල් හන්බලී පිළිබඳ හැඳින්වීමක්

එතුමා විවිධ ක්ෂේත්‍රවල නිපුනතා ලැබූ ආගමික නීති අවබෝධය පිළබඳ මනා දැනුමක් ඇති බග්දාද්හි විසූ අබ්දුර් රහ්මාන් ඉබ්නු අහ්මද් ඉබ්නු රජබ්ය. පසුව එතුමා දමස්කසයේ හන්බලී නිකායට අයත් විය.

දැනුමෙන් ධාරණ ශක්තියෙන් තැන්පත් බවින් උපදෙස් දීමෙන් හා ආකර්ෂණීය ලෙස පොත් ලිවීමෙන් විශිෂ්ටත්වය ලැබූ විද්වතුන් අතරින් එතුමා ද කෙනෙකි.

එතුමා බග්දාද්හි හිජ්රි වර්ෂ 736 දී උපත ලැබූ අතර කුඩා කාලයේදී තම පියාණන් සමග දමස්කසය බලා පිටත්ව ගොස් ඉමාම් ඉබ්නු කය්යුම් හා ඔහුගේ මට්ටමේ සිටි අයගේ සිසිවෙකු වූහ. සලෆි ප්‍රතිපත්තියක් ඇති ඔහු හන්බලී සම්ප්‍රදාය පිළිපදින විචාරයකු අටුවාචාරියෙකු සාහිත්‍ය වේදියෙකු හා ඉතිහාසඥයෙකු ලෙස බැබලීය. එතුමා හදීස් කලාවේ තතු හා ඒවා වාර්තාකල වාර්තාකරුවන් පිළිබඳ මනා අවබෝධයක සංකේතයක් වූහ.

එතුමා බොහෝ පොත් ලියා ඇති අතර ඒවා මෙම අංශයට යොමුව තිබිණ. එහි ප්‍රතිඵලයක් ලෙස ‘සහීහුල් බුහාරි’ හි අටුවාවක් වූ ‘ෆත්හුල් බාරී’ බිහි විය. මෙය ඉමාම් අල් හාෆිල් ඉබ්නු හජර්ගේ ‘ෆත්හුල් බාරී’ ග්‍රන්ථයට කලින් වූවකි. එහි ජනාසා සම්බන්ධ පාඩම දක්වා ලිය වී තිබිණ. දැන් අපේ අතට පත්ව ඇති වෙළුම් දහයකින් යුත් එය ස්ථිරභාවයෙන් හා අනගි භාවයෙන් යුත් විශිෂ්ට සනයේ එකකි.

එම පොත් අතුරින් කිහිපයක් මෙසේය:

‘ෂර්හ් සුනන් අත් තිර්මිදි’ අල් හාෆිල් ඉබ්නු හජර් තුමා පවසා ඇති පරිදි එය වෙළුම් 20කින් සමන්විතය. ඉන් වෙළුම් දෙකක් හැර වෙන කිසිවක් අපට ලැබී නැත. එය ‘ෂර්හු ඉලල් අත් තිර්මිදි’ වේ.

‘තක්දීරුල් කවාඉදු වතහ්රීරුල් ෆවාඉදි’ එය ‘කවාඉදු ඉබ්නු රජබ්’ ලෙසින් ප්‍රසිද්ධය. වෙළුම් හතරකින් සමන්විත එය ෆික්හ් කලාවේ විශිෂ්ට පොත් අතුරින් එකකි.

‘අත්-තාඉෆුල් මආරිෆ්’ එය ඍතු හා කාල ක්‍රියාකාරකම් පිළිබඳ පරිච්ඡේදයේ පළමු යොමුවයි.

‘ජාමිඋල් උලූම් වල් හිකම්’ එය ‘අල් අර්බඊනන් නවවියියා’ සඳහා වූ වෙළුම් දෙකකින් සමන්විත විග්‍රහයකි. ඉස්ලාමීය පොත් පත් අතුරින් කීර්තිමත් මෙන්ම ප්‍රසිද්ධ පොතකි.

එතුමා හිජ්රි 795 දී දමස්කසයේ අභාවයට පත් වූ අතර ඒ වන විට එතුමා පනස් නව වන වියේ පසු වූහ.

අල් අල්ලාමා ඉබ්නු නාසිරිද් දීන් අද්දමස්කසී තුමා මෙසේ පවසයි: ඉබ්නු රජබ්ගේ මිනී වල හෑරූ අය එතුමා ගැන මට මෙසේ පවසා සිටියේය. සැබැවින්ම ෂෙයික් තුමාගේ අභාවයට දින කිහිපයකට පෙර ඔහු වෙත පැමිණ ‘මෙම ස්ථානයේ මා වෙනුවෙන් මිනිවලක් හාරන්නැයි පවසා’ එතුමා වළ දමන ලැබූ ස්ථානය පෙන්වීය. ඔහු තවදුරටත්: මම ඔහු වෙනුවෙන් වල හෑරුවෙමි. මා එය අවසන් කළ පසු එතුමා කබ්රයට බැස එහි හාන්සි වී ඒ ගැන මවිතයට පත් ව ‘මෙය හොඳය’ යැයි පවසා ඉන් ඉවතට පැමිණියේය.

ඔහු තවදුරටත්: අල්ලාහ් මත දිවුරා පවසමි. දින කිහිපයක් ගත වීමෙන් පසු මිය ගිය එතුමාව මිනි පෙට්ටියේ දමා ඔසවාගෙන එනු ලැබීය. පසුව මම එතුමාව එම මිනී වළ තුළ තැන්පත් කළෙමි.

***

## الحَدِيْثُ الأَوَّلُ

## පළමු හදීසය

عن عُمَرَ - رَضِيَ اللهُ عَنْهُ - قَالَ: سَمِعْتُ رَسُولَ اللهِ - ﷺ - يَقُولُ:

«إِنَّمَا الأَعْمَالُ بِالنِّيَّاتِ، وَإِنَّمَا لِكُلِّ امْرِئٍ مَا نَوَى، فَمَنْ كَانَتْ هِجْرَتُهُ إِلَى اللهِ وَرَسُولِهِ فَهِجْرَتُهُ إِلَى اللهِ وَرَسُولِهِ، وَمَنْ كَانَتْ هِجْرَتُهُ لِدُنْيَا يُصِيبُهَا أَوْ امْرَأَةٍ يَنْكِحُهَا فَهِجْرَتُهُ إِلَى مَا هَاجَرَ إِلَيْهِ»،

رَوَاهُ البُخَارِيُّ وَمُسْلِمٌ

අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) කළ ප්‍රකාශයකට තමන් සවන් දුන් බව උමර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී.

"සියලු ක්‍රියාවන් චේතනාවන් අනුව පිහිටනු ඇත. සෑම කෙනෙකුටම ඔහු පතන දෑ ඇත. එහෙයින් කවරෙකුගේ හිජ්රත් හෙවත් නික්ම යෑම අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් වෙනුවෙන් පිහිටියේද ඔහුගේ හිජ්රතය අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් වෙනුවෙන් පිහිටනු ඇත. කවරෙකුගේ හිජ්රතය මෙලොව අත් කර ගැනීම හෝ කාන්තාවක් විවාහ කර ගැනීම වෙනුවෙන් පිහිටියේ ද එසේ ඔහු කවර දෙයක් වෙනුවෙන් හිජ්රත් කළේද ඒ වෙනුවෙන් ඔහුගේ හිජ්රතය පිහිටනු ඇත."

ඉමාම් බුහාරි හා මුස්ලිම් මෙම හදීසය දන්වා ඇත.

- විග්‍රහය -

මෙම හදීසය උමර් තුමා විසින් අල්කමා ඉබ්නු වක්කාස් අල්ලයිසී තුමාද, එතුමා විසින් මුහම්මද් ඉබ්නු ඉබ්‍රාහීම් අත්-තයිමී තුමාද, එතුමා විසින් යහ්යා

ඉබ්නු සර්ද් අල් අන්සාරි තුමා ද ලබා වාර්තා කර ඇත. මෙම හදීසය සඳහා වූ එකම වාර්තා සම්බන්ධතාව මෙය පමණි. මෙම වාර්තා සම්බන්ධතාව හැර නිවැරදිව සඳහන් වන වෙනත් වාර්තා සම්බන්ධතාවක් එයට නැත. අලී ඉබ්නු අල් මදීනී හා වෙනත් අය පවසා සිටින්නේ ද එලෙසය.

ඉමාම් කත්තාබී තුමා පවසනුයේ, ‘සැබැවින්ම මෙම හදීසය අබූ සර්ද් හා සෙසු අය විසින් වාර්තා කර තිබීමත් සමග එම වාර්තා සම්බන්ධතාව විෂයයෙහි හදීස් වේදීන් අතර කිසිදු විරුද්ධ මතයක් තිබෙනු මා නොදනිමි’ යන්නයි.

එමෙන්ම, එය බොහෝ මාර්ග ඔස්සේ වාර්තා කරනු ලැබ ඇතැයි ද පවසනු ලබන නමුත් ඒ කිසිවක් හදීස් ධාරණය කරන්නන් ඉදිරියේ නිවැරදි නොවන්නේය.

එය පූර්ව සාධක හදීසයක් බවත් එය පිළිගනු ලබන අයුරින්[3] ඉදිරිපත් වී ඇති බවත් විද්වත්හු ඒකමතික එකඟ වෙති. ඉමාම් බුහාරි තම ‘සහීහ්’ නම් කෘතිය ආරම්භ කර ඇත්තේද මෙම හදීසය සඳහන් කරමිනි. එය ඒ වෙනුවෙන් පිහිටන දෙසුමක ස්ථානයේ එතුමා තබා ඇති අතර එයින් පෙන්වා දෙනුයේ අල්ලාහ්ගේ තෘප්තිය අපේක්ෂා නොකරන සෑම ක්‍රියාවක්ම නිෂ්ඵල වන බව හා එයට මෙලොවෙහි හෝ මතුලොවෙහි කිසිදු ඵලක් නොමැති බවයි.

මේ හේතුවෙන් අබ්දුර් රහ්මාන් ඉබ්නු මහ්දී: “මම මාතෘකාවන් ගොනු කළේ නම් ඒ සෑම මාතෘකාවකටම උමර් තුමාගේ හදීසය තබමි” යැයි පවසා ඇත්තාහ.

3. පිළිගනු ලබන අයුරින් ඉදිරිපත් වී තිබීම: ඉමාම් අහ්මද් වැනි ඇතැම් විද්වතුන් මෙය මුතවාතිර් වර්ගයට අයත් හදීසයක් බව නම් කරයි. එනම් එය ප්‍රසිද්ධියෙන් හා ක්‍රියාවෙන් අඛණ්ඩව පැවත එන එකක් මිස වාර්තා සම්බන්ධතාවෙන් වූවක් නොවෙයි. වාර්තා සම්බන්ධතාව අඛණ්ඩව පැවතීමට වඩා මුල් වචනවල අඛණ්ඩව වාර්තා වීම බලවත් වන්නේය. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්-තරීෆී)

එතුමාණන් තව දුරටත් "පොතක් ලියන්නට කෙනෙකු අපේක්ෂා කරන්නේ නම් ඔහු 'ඉන්නමල් අඃමාලු බින්නීය්යාත්' නම් හදීසයෙන් ආරම්භ කරත්වා[4] යැයි පවසා ඇත්තාහ.

***

මෙම හදීසය, එය වටා නිරන්තරයෙන්ම දහම දෝළනය වන හදීස් අතුරින් එක් හදීසයකි. ඉමාම් ෂාෆි තුමා 'මෙම හදීසය දැනුමෙන් තුනෙන් කොටසකි' යැයි පවසා ඇති බවට වාර්තා වී ඇත.

ඉමාම් අහ්මද් විසින් වාර්තා කරන ප්‍රකාශයට අනුව, "ඉස්ලාමයේ මූලිකාංගයන් හදීස් තුනක් මත පදනම්ව ඇත. එනම්, උමර් තුමාගේ "ඉන්නමල් අඃමාලු බින්නිය්යාත්" නම් හදීසය. ආඉෂා තුමියගේ "මන් අහ්දස ෆී අම්රිනා..." නම් හදීසය හා නුඃමාන් ඉබ්නු බෂීර් තුමාගේ "අල් හලාලු බය්යිනුන් වල්හරාමු බය්යිනුන්" නම් හදීසය වේ.

අබූ දාවුද් තුමා විසින් වාර්තා කර ඇති පරිදි, සෑම අංශයකම සුන්නාවේ මූල ධර්මයන් හදීස් හතරකි. එනම්, 1. අල්-අඃමාලු බින්නිය්යාත් 2. අල් හලාලු බයියිනුන් 3. මින් හුස්නිල් ඉස්ලාමිල් මර්ඉ තර්කුහු මාලා යඃනී 4. උස්හුද් ෆිද් දුන්යා යුහිබ්බුකල්ලා වස්හුද් ෆීමා අයිදින් නාස් යුහිබ්බුකන්නාස් යන හදීස් හතර වෙති.

අල්-හාෆිල් අබුල් හසන් තාහිර් ඉබ්නු මුෆව්විස් අල් මආෆිරී අල් උන්දලිසීගේ කවියක:

අප අබියය දහමේ සාරය ප්‍රකාශන කිහිපයකි.

එය මානවසමාජයේ අති විශිෂ්ඨයාණන්ගේ ප්‍රකාශන හතරකින් යුක්තය.

4. මෙම කරුණ පිළිබඳ එකතුවක් පුළුල් ලෙස විමර්ශනය කර ඇති අතර ඉමාම් සුයූති තුමා එයට 'බුලූගුල් ආමාලි ෆී ෂර්හි ඉන්නමල් අඃමාලි' යන නමින් වෙනමම ලිපියක් ලියා ඇත. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්තරීෆී)

සැකසහිත දැයින් වැළකී, ලෞකිකත්වයෙන් ඈත් වන්න.

අනවශ්‍ය දෑ අතහැර, දැහැමි චේතනාවෙන් කටයුතු කරන්න.[5]

'ඉන්නමල් අඃමාලු බින්නීය්යාත්' තවත් වාර්තාවක 'අල් අඃමාලු බින්නිය්යාත්' යන ප්‍රකාශ දෙකම නිවැරදි මතය අනුව සීමා කිරීමක් හඟවනු ඇත.

'අල් අඃමාලු බින්නීය්යා' යන ප්‍රකාශය නිර්ණය කිරීමේදී ඔවුන් විවිධ මතභේද දරති.

මුල් කාලීන ඉමාම්වරුන් එහි නිර්ණායක පිළිබඳ විශ්වාස කරනුයේ: 'ක්‍රියාවන් නිවැරුදි වන්නේත් වලංගු වන්නේත් පිළිගනු ලබන්නේත් චේතනාවන් අනුව බවය. ක්‍රියාවන් යනුවෙන් අදහස් කරනුයේ චේතනාව අවශ්‍ය වන ආගමික ක්‍රියාවන් ය.

තවත් සමහරු: 'අල් අඃමාලු' යනුවෙන් මෙහි සඳහන් කර ඇත්තේ පොදු අර්ථයෙන් බවත් එහි විශේෂයෙන් කිසිවක් සඳහන් කර නැති බවත් සඳහන් කරති. මෙම ප්‍රකාශයට අනුව 'සියලු ක්‍රියාවන් පිහිටන්නේත් ඇති වන්නේත් චේතනාවන් අනුවය යනුවෙන් එම ප්‍රකාශය නිර්ණය කළ හැකි බව පවසනු ලැබ ඇත.

'අල් අඃමාලු බින්නීය්යාත්' නම් නබි (ﷺ) තුමාගේ ප්‍රකාශයේ නිර්ණායකය ලෙස දැහැමි ක්‍රියාවන් හෝ අයහපත් ක්‍රියාවන් හෝ පිළිගනු ලබන ක්‍රියාවන් හෝ ප්‍රතික්ෂේප කරනු ලබන ක්‍රියාවන් හෝ ඒ සඳහා කුසල් ලැබෙන ක්‍රියාවන් හෝ ඒ සඳහා කුසල් නොලැබෙන ක්‍රියාවන් හෝ වේවා ඒ සියල්ල චේතනාවන් අනුව පිහිටනු ඇතැයි යන අදහසද දරා ඇත.

---

5. අල්-හාෆිල් ඉබ්නු හජර් (රහිමහුල්ලාහ්) මෙසේ පවසයි: අබ්දුර් රහ්මාන් ඉබ්නු මහ්දී, -ඉමාම් සුයූතී පවසන අයුරින්- ෂාෆර්, අහ්මද්, ඉබ්නු මදීනී, අබූ දාවුද්, තිර්මිදි, දාරුකුත්නී, හම්සා අල් කිනානී යන ඉමාම්වරු සැබැවින්ම මෙය එනම්: උමර් තුමාගේ හදීසය' ඉස්ලාමයේ තුනෙන් එක් කොටසක් යන්නෙහි එකඟ වෙති. ඔවුන් අතුරින් ඇතැමෙකු එය හතරෙන් එකක් බව සඳහන් කර ඇත. ඉතිරි දෑ නියම කිරීමෙහි ඔවුන් අතර මතභේද පවතී. (අල්-ෆත්හ්: 1/17)

***

- ‘සෑම කෙනෙකුටම ඔහු පතන දෑ ඇත’ යන ප්‍රකාශය:

සැබැවින්ම මෙම ප්‍රකාශය කිසිවකුගේ ක්‍රියාවක් ඔහු චේතනා කරන දෑ අනුව මිස පිහිටන්නේ නැති බව දන්වා සිටියි. එහෙයින් ඔහු යහපතක් සිතුවේ නම් එය ඔහුට යහපතක් වනු ඇත. ඔහු අයහපතක් සිතුවේ නම් එය ඔහුට අයහපතක් වනු ඇත.

‘අන්-නියය්‍යා’ චේතනාව[6] විද්වතුන්ගේ ප්‍රකාශ අනුව අර්ථ දෙකකින් පිහිටයි.

**පළමුවැන්න:** නැමදුම් සමහරක් සමහරකගෙන් වෙන් කිරීමේ අදහසින් පිහිටා තිබීම. උදාහරණ වශයෙන් ලුහර් සලාතය අසර් සලාතයෙන් වෙන් කිරීම රමළාන් උපවාසය ඒ හැර වෙනත් උපවාසයන්ගෙන් වෙන් කිරීම සඳහන් කළ හැක. එසේ නැතහොත් දෛනික ක්‍රියාවන්ගෙන් නැමදුම් වෙන් කිරීම. උදාහරණ වශයෙන් සිසල සඳහා හා පිරිසිදු වීම සඳහා කරන ස්නානයෙන් කිලිටි ඇති වූ විට ඉන් මිදීම සඳහා කරන ජනාබත් ස්නානය වෙන් කිරීම සඳහන් කළ හැක.

**දෙවැන්න:** ක්‍රියාව පදනම් කර ගෙන වෙන් කිරීම. එනම්, එය අල්ලාහ්ට පමණක් ද එසේ නැතහොත් වෙනත් කෙනෙකුට ද එසේත් නැතහොත් එය අල්ලාහ් මෙන්ම වෙනත් කෙනෙකුට ද යන්නෙනි. මුල් කාලීන විද්වතුන්ගේ ප්‍රකාශ තුළ අධිකව දැකිය හැක්කේ මෙම නියයතයයි. මෙම පදය භාවිතා කිරීමෙන් තොරව ඊට සමීප පද භාවිත කරමින් අල්-කුර්ආනයේ බොහෝ තැන් වන ඒ ගැන සඳහන් වී ඇත.

6. නියයත් යන පදය නවා යන පදයෙන් බිඳී ආ පදයකි. එහි අදහස වන්නේ පළතුරක ඇටයයි. සිව් මහා ඉමාම්වරුන්ගේ ඒකමතික අදහස වනුයේ එය ප්‍රසිද්ධියේ පවසා සිටීම ආගමානුගත කළ ක්‍රියාවක් නොවන බවයි. නමුත් ඉමාම් ෂාෆි තුමා සලාතයේදී එය පිළිපැදිය යුතු බව සඳහන් කර ඇත. ඉබ්නුල් මුක්රී ඔහුගේ ‘මුඃජමාහ්’ හි ඉමාම් ෂාෆි විසින් ද ඔහුගෙන් රබීඃ ලබා ඔහු විසින් ද ඔහුගෙන් ඉබ්නු හුසෙයිමා තුමා ලබා ඔහු විසින් කළ වාර්තාවක් සම්බන්ධ කරමින් වාර්තා කර ඇත. ඒ සඳහා කිසිදු සාධකයක් නොමැත. මුල් කාලීනයන්ගේ ක්‍රියාව තුළ එසේ ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමක් නොතිබුණි. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්-තරීෆි)

නබි වදන් හා මුල් කාලීනයන්ගේ ප්‍රකාශවල මේ ගැන අධික වශයෙන් සඳහන්ව පැමිණ ඇත.

උදාහරණ වශයෙන්:

නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බව සෑද් ඉබ්නු අබී වක්කාස් තුමා වාර්තා කරන හදීසයක් බුහාරි හා මුස්ලිම්හි මෙසේ සඳහන් වී ඇත. "අල්ලාහ්ගේ තෘප්තිය වෙනුවෙන් ඔබ යම් විදයමක් වියදම් කරන්නේද ඒ සඳහා කුසල් හිමිවනු මිස නැත. එය ඔබ ඔබේ බිරයගේ කටට (ඔබේ) අතින් (කෑම) කටක් තැබුව ද එසේය."[7]

සුබෙයිද් අල්-යාමී විසින්: 'සැබැවින්ම සෑම කටයුත්තකදීම එය ආහාර පානවල හෝ වේවා 'නීය්යත්' තැබීම -චේතනාව ඇති කර ගැනීම- මට වඩාත් ප්‍රිය මනාපය!' යැයි පවසා ඇත.

එතුමා විසින් තවදුරටත්: 'ඔබ සෑම කටයුත්තකදීම, ඔබ 'අල් කුනාසා'[8] වෙත (කසල දමන ස්ථානයට) බැහර ව ගිය ද චේතානාව තබන්න.' යැයි පවසා ඇත.

සුෆ්යාන් අස්-සව්රී තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: 'මා තබන චේතනාවට වඩා වෙනත් කිසිවක් මා සුවපත් කරන්නේ නැත. හේතුව සැබැවින්ම එය මා සක්‍රීය කරන බැවිනි.'

ඉබ්නු මුබාරක් තුමා "කොතරම් දෝ සුළු ක්‍රියාවන් නිය්යතය උසස් කර ඇති අතර කොතරම් දෝ විශාල ක්‍රියාවන් නිය්යතය පහත් කර ඇත.[9] යනුවෙන් පවසා සිටියහ.

---

7. මූලාශ්‍රය බුහාරි (2742), මුස්ලිම් (1628)

8. කුනාසා යන පදයෙන් අදහස් වනුයේ කුණු කූඩය, අතුගා කුණු දමන ස්ථානය.

9. විද්වතුන් පවසා සිටිනුයේ: 'චේතනාව විද්වතුන්ගේ ව්‍යාපාරයයි.' එනම් සාමාන්‍යය ජනයාට වඩා සෑම ක්‍රියාවකම නිය්යතය අලංකාරව ගෙන එමින් එය වෙළඳකරණය කොට ප්‍රතිඵල හිමි කර ගැනීමේදී විද්වතුන් ඉදිරියෙන් සිටිති. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්-තරීෆි)

සූරත් අල් මුල්ක් හි 2වන පාඨයේ සඳහන් 'ලියබ්ලුවකුම් අය්යුකුම් අහසනු අමලා' (නුඹලා අතුරින් කවරෙකු වඩාත් දැහැමි ක්‍රියාවන් සිදු කරන්නේ දැයි ඔහු නුඹලාව පරීක්ෂා කරනු පිණිස...) යන පාඨයට ෆුලෙය්ල් තුමා අදහස් දක්වා ඇත්තේ 'එය වඩාත් අවංක චේතනාවෙන් හා නිවැරුදි ව ක්‍රියාවන් සිදු කරන්නේ දැයි ඔහු නුඹලාව පරීක්ෂා කරනු පිණිස' යන්නෙනි. එතුමා තවදුරටත් මෙසේ පවසා ඇත.: 'සැබැවින්ම ක්‍රියාව අවංක චේතනාවෙන් පිහිටා එය නිවැරදි නොවූයේ නම් පිළිගනු නොලබනු ඇත. එමෙන්ම ක්‍රියාව නිවැරුදිව පිහිටා අවංක චේතානවක් නොවූයේ නම් එය ද පිළිගනු නොලබනු ඇත. එය අවංක චේතනාවකින් හා නිවැරදිව පිහිටන තෙක් යැයි පවසා ඇත.' අවංක චේතනාව යනු එය අල්ලාහ් වෙනුවෙන් පිහිටුනු විටය. නිවැරදිව යනු එය නබි තුමාගේ පිළිවෙත අනුව පිහිටුනු විටය.

***

'එහෙයින් කවරෙකුගේ හිජ්රත් හෙවත් නික්ම යෑම අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් වෙනුවෙන් පිහිටියේද ඔහුගේ හිජ්රතය අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් වෙනුවෙන් පිහිටනු ඇත. කවරෙකුගේ හිජ්රතය මෙලොව අත් කර ගැනීම හෝ කාන්තාවක් විවාහ කර ගැනීම වෙනුවෙන් පිහිටියේ ද එසේ ඔහු කවර දෙයක් වෙනුවෙන් හිජ්රත් කළේද ඒ වෙනුවෙන් ඔහුගේ හිජ්රතය පිහිටනු ඇත.' යන ප්‍රකාශය වනාහි:

සියලු ක්‍රියාවන් චේතනාවන් අනුව පිහිටන බවත් යම් ක්‍රියාවක් කරන්නා එම ක්‍රියාවෙහි කොටස ඔහුගේ යහපත් හෝ අයහපත් චේතනාව අනුව පිහිටන බවත් නබි (ﷺ) තුමා සඳහන් කර සිටි කල්හි නීය්යතය හා සමාන ස්වරූපයේ පවතින ක්‍රියාවන් උපමා දක්වමින් ඒවා යහපත් වන්නේත් අයහපත් වන්නේත් චේතනාවන් වෙනස්වීම අනුව බවත් පවසා සිටියේය. එය සෙසු සියලු ක්‍රියාවන්ද මේ හා සමානව පැවතිය යුතු යැයි පවසන්නාක් මෙන් පිහිට ඇත.

ඒ අනුව කවරෙකු කැමැත්තෙන්ම අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් වෙනුවෙන් ඉස්ලාමයේ නිවහන වෙත හිජ්රත් කරන්නේද ඔහු සැබෑ ලෙසින්ම අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් වෙත හිජ්රත් කළ අයකු වන්නේය. එය ගෞරවයෙන් හෝ අභිමානයෙන් ඔහුට ප්‍රමාණවත් වන්නේය.

එබැවින් යෙදී ඇති කෝන්දේසියේ පිළිතුර එය වචනයෙන් නැවතත් ප්‍රකාශ කිරීමෙන් සීමා කර ඇත. ඊට හේතුව ඔහුගේ හිජ්රතයෙන් ඔහු චේතනා කළ දෑ මෙලොවෙහි හා මතුලොවෙහි අපේක්ෂිත අවසානය වන බැවිනි.[10]

කවරෙකු මෙලොව හෝ කාන්තාවක් පතමින් ඔහුගේ හිජ්රතය පිහිටියේද ඔහු කවර දෙයක් වෙත හිජ්රත් කළේද ඒ වෙනුවෙන් පිහිටනු ඇත.

'ඔහු කවර දෙයක් වෙනුවෙන් හිජ්රත් කළේද ඒ වෙනුවෙන්' යන ප්‍රකාශයෙන් මෙලොව විෂයයෙහි ඔහු පතන දෑ පහත් හා අල්ප බව වචනයෙන් සඳහන් නොකර පෙන්වා දෙයි.

'කවරෙකුගේ හිජ්රතය මෙලොව අත් කර ගැනීම හෝ කාන්තාවක් විවාහ කර ගැනීම වෙනුවෙන් පිහිටියේ ද' යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශයට හේතු වූයේ උම්මු කය්ස් තුමියගේ කතා වස්තුව බව ප්‍රකට කරුණකි. පසු පෙළේ සිටි බොහෝ විද්වතුන් එය සඳහන් කළ ද පූර්ව සාධක සහිත වාර්තා සම්බන්ධතාවක් මූලික වශයෙන් ඒ සඳහා දකින්නට නැත. අල්ලාහ් සියලු දෑ මැනවින් දන්නාය.![11]

ජිහාද් කිරීම හජ් ඉටු කිරීම හා එවැනි සෙසු ක්‍රියාවන්ද හිජ්රත් හා සමානව එම අර්ථයෙන්ම පිහිටනු ඇත. එහි විධිමත්බව හා අවිධිමත්බව චේතනාව අනුව පිහිටන්නේය.

අබූ මූසා අල් අෂ්අරී (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලද හදීසයක් බුහාරි හා මුස්ලිම් හි මෙසේ සඳහන් වෙයි. සැබැවින්ම ගම්බද අරාබි

---

10. නපුරු ප්‍රතිපත්තීන් හා සිතුවිලිවලින් හදවත හිජ්රත් කිරීම නපුරු නගරයක් වෙනුවෙන් ශාරීරික වශයෙන් හිජ්රත් කිරීමට වඩා වැදගත් වන්නේය. ඊට හේතුව දෙවැනි කාරණාව ආගමානුගත කරනු ලැබුවේ පළමුවැන්න තහවුරු කිරීමට මිස නොවීය. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්-තරීෆී)

11. - සර්ද් ඉබ්නු මන්සූර් ළඟ- මෙම කතා වස්තුව නිවැරදි වාර්තා සම්බන්ධතාවක් සහිතව සඳහන්ව පැමිණ තිබුණ ද එහි 'ඉන්නමල් අඃමාලු' යන හදීසය ඒ වෙනුවෙන් පැමිණි එකක් හෝ එයට හේතුවක් වූ බව හෝ සඳහන් වන්නේ නැත. බලන්න. ඉබ්නු හජර් තුමාගේ ෆත්හුල් බාරී (1/16) ඒ අනුව ගත් කතෘ මෙම කතාව හදීසයට හේතුවක් වීම වැළකී සිටියද මූලික වශයෙන් එම කතාවේ නිරවද්‍යතාව ප්‍රතික්ෂේප නොකළේය.

ජාතිකයෙකු නබි (ﷺ) තුමා වෙත පැමිණ: 'අල්ලාහ්ගේ දූතයාණනි, මිනිසෙකු වස්තුව සඳහා සටන් කරයි. තවත් මිනිසෙකු ප්‍රසිද්ධිය සඳහා සටන් කරයි.[12] තවත් මිනිසෙකු තම නිලය පෙන්වීම සඳහා සටන් කරයි. අල්ලාහ්ගේ මාර්ගයේ සිටින්නේ කවුදැ?යි විමසා සිටියේය. එවිට එතුමා: 'අල්ලාහ්ගේ වදන උසස් වනු පිණිස කවරෙකු සටන් කරන්නේද ඔහුය අල්ලාහ්ගේ මාර්ගයේ සිටින්නා' යැයි පවසා සිටියහ.[13]

අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) ප්‍රකාශ කළ ප්‍රකාශයකට තමන් සවන් දුන් බව පවසමින් අබූ හුරෙය්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ මෙම හදීසය ඉමාම් මුස්ලිම් තුමා මෙසේ දන්වයි.[14] ((මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ජනයා අතර පළමුව තීන්දු දෙනු ලබන්නා දිවි පිදූ මිනිසෙකි. ඔහු රැගෙනැවිත් ඔහුගේ ආශිර්වාදයන් ඔහුට දන්වා සිටී. ඔහු එය දැනගත් පසු : 'ඒ සඳහා නුඹ කුමක් කළෙහි දැ?'යි ඔහු (අල්ලාහ්) විමසයි. ඔහු: 'මම දිවි පුදන තෙක් ඔබ විෂයෙහි සටන් කළෙමි.' යැයි පවසයි. ඔහු: නුඹ බොරු කියන්නෙහිය. සැබැවින්ම නුඹ සටන් කළේ නිර්භීතයෙකු යැයි පවසනු ලැබීමටය. පසුව ඔහු සම්බන්ධයෙන් අණ කරනු ලැබ ඔහු මුණින් අත දමා නිරා ගින්නෙහි හෙළන තෙක් ඇදගෙන යනු ලබනු ඇත.

දැනුම හදාරා එය උගන්වා අල් කුර්ආනයද කියවූ මිනිසෙකි. ඔහු රැගෙනැවිත් ඔහුගේ ආශිර්වාදයන් ඔහුට දන්වා සිටී. ඔහු එය දැනගත් පසු : 'ඒ සඳහා නුඹ කුමක් කළෙහි දැ?'යි ඔහු (අල්ලාහ්) විමසයි. ඔහු: මම දැනුම හැදෑරුවෙමි. එය ඉගැන්නුවෙමි. ඔබ විෂයයෙහි මම අල් කුර්ආනය කියෙව්වෙමි යැයි පවසයි. ඔහු: ඔබ බොරු කියන්නෙහිය. සැබැවින්ම ඔබ දැනුම හදාරා එය ඉගැන්වූයේ ඔබ විද්වතෙකු යැයි පවසනු ලැබීමටය. ඔබ අල් කුර්ආනය කියෙව්වේ ඔබ අල් කුර්ආනය මැනවින් කියවන කාරිඃ වරයෙකු යැයි පවසනු ලැබීමටය. පසුව ඔහු සම්බන්ධයෙන් අණ කරනු ලැබ ඔහු ද මුණින් අත දමා නිරා ගින්නෙහි හෙළන තෙක් ඇදගෙන යනු ලබනු ඇත.

12. ප්‍රසිද්ධිය සඳහා සටන් කරයි: එනම් මිනිසුන් තමන් වීරයකු යැයි ඔහුව මෙනෙහි කිරීම පිණිස.

13. බුහාරි (2655), මුස්ලිම් (1904).

14. හදීස් අංක (1905)

අල්ලාහ් පොහොසත් කම ඇති කර සියලු ආකාරයයේ සම්පත් පිරිනැමූ මිනිසෙකි. ඔහු රැගෙනැවිත් ඔහුගේ ආශිර්වාදයන් ඔහුට දන්වා සිටී. ඔහු එය දැනගත් පසු : 'ඒ සඳහා නුඹ කුමක් කළෙහි දැ?'යි ඔහු (අල්ලාහ්) විමසයි. ඔහු: අල්ලාහ්ගේ මාර්ගයේ වියදම් කරනු ලබන කිසිදු අවස්ථාවක වියදම් නොකර අතහැර දැමුවේ නැත. යැයි පවසයි. ඔහු: නුඹ බොරු කියන්නෙහිය. සැබැවින්ම නුඹ එසේ සිදු කළේ ධානපතියෙකු යැයි පවසනු ලැබීමටය. පසුව ඔහු සම්බන්ධයෙන් අණ කරනු ලැබ ඔහු මුණින් අත දමා නිරා ගින්නෙහි හෙළන තෙක් ඇදගෙන යනු ලබනු ඇත.

අල්ලාහ්ගේ තෘප්තිය හැර වෙනත් අරමුණක් සඳහා හදාරන දැනුම පිළිබඳ අවවාද සඳහන්ව පැමිණ ඇත. උදාහරණ වශයෙන් නබි (ﷺ) ප්‍රකාශ කළ බවට අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් දන්වා සිටි හදීසයක් දැක්විය හැක. එය අහ්මද්, අබූ දාවූද්, ඉබ්නු මාජා යන ඉමාම්වරුන් විසින් වාර්තා කර ඇත. එනම්: "කවරෙකු අල්ලාහ්ගේ තෘප්තිය අපේක්ෂාවෙන් යම් දැනුමක් හදාරා ඔහු එමගින් මෙලොවෙහි වාසියක් බලාපොරොත්තු වන්නේද ඔහු මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ස්වර්ගයේ සුවඳ පවා නොලබනු ඇත."[15]

නබි (ﷺ) තුමාණන් පැවසූ බවට කඃබ් ඉබ්නු මාලික් (රළියල්ලාහු අන්හු) තුමා විසින් කළ ප්‍රකාශයක් ඉමාම් තිර්මිදි තුමා මෙසේ දන්වා සිටියි. "කවරෙකු අඥානයින් සීමා කිරීමට හෝ විද්වතුන් සමග තරඟ කිරීමට හෝ මිනිසුන්ගේ තෘප්තිය ලැබීමට හෝ දැනුම සොයන්නේද අල්ලාහ් ඔහු නිරයට ඇතුළත් කරනු ඇත."[16].

පොදුවේ අල්ලාහ් නොවන දෙයක් වෙනුවෙන් කටයුතු කිරීම සම්බන්ධයෙන් වූ අවවාදද පැමිණ ඇත. උදාහරණ වශයෙන් නබි (ﷺ) පැවසූ බව උබෙයි ඉබ්නු කඃබ් තුමා විසින් වාර්තා කර ඉමාම් අහ්මද් විසින් දන්වා සිටි හදීසයක්

15. අහ්මද් (2/338), අබූ දාවූද් (3664), ඉබ්නු මාජා (252), ඉබ්නු හිබ්බාන් මෙය පූර්ව සාධක සහිත හදීසයක් බව සඳහන් කර ඇත. (1/279) හාකිම් (1/85), ඉහ්යා නම් ප්‍රකාශනයේ අල් ඉරාකී (1/178): මෙය පූර්ණ වාර්තා සම්බන්ධතාවකින් යුක්තය. ඉමාම් අල් බානී අල් මිෂ්කාත් නම් ප්‍රකාශනයට අයත් සංස්කරණයේ (1/78) පවසා ඇත්තේද එලෙසය.

16. තිර්මිදි (2654), හාකිම් (86/1) මෙහි වාර්තා සම්බන්ධතාව දුර්වල සම්බන්ධතාකි.

පෙන්වා දිය හැක. නබි තුමාණෝ: "උසස්භාවය, උත්කෘෂ්ඨත්වය, දහම හා මහපොළොවේ පහසුකම් සලසා දීම පිළිබඳ සමූහයාට ශුභාරංචි දන්වනු. ඔවුන් අතරින් කවරෙකු මතුලොව ක්‍රියාවක් මෙලොව වෙනුවෙන් සිදු කරන්නේද මතුලොවෙහි කිසිදු කොටසක් ඔහුට හිමි වන්නේ නැත.[17]

අල්ලාහ් නොවන දෑ වෙනුවෙන් කරන ක්‍රියාවන් විවිධ කොටස් සහිත බව ඔබ දැන ගත යුතුයි.

විටෙක: එය මිනිසුන්ගේ අවධානය යොමු කිරීමට මිස වෙනත් කිසිවක් අපේක්ෂා කරනු නොලබන පැහැදිළි මූනිච්චාව වනු ඇත. එය කුහකයින් තම සලාතයේ සිටින තත්ත්වය මෙනි. මෙම පැහැදිළි මූනිච්චාව දෙවියන් විශ්වාස කරන්නාගේ සලාතයේ හෝ උපවාසයේ හෝ දැක ගන්නට නොහැක. නමුත් අනිවාර්ය සකාත් හජ් හා වෙනත් බාහිර ක්‍රියාවන් තුළ හෝ තමන්ට ප්‍රයෝජන ලබා දෙන ක්‍රියාවන්හි එය මතුවන්නට ඉඩ ඇත. එහෙයින් එහි චිත්ත පාරිශුද්ධිය අති වැදගත් වන්නේය.

එම ක්‍රියාව විනාශකාරී බව හා සැබැවින්ම එවන් පුද්ගලයින් අල්ලාහ්ගේ කෝපයටත් දඬුවමටත් භාජනය වන බව මුස්ලිම් වරයකුට සැකයක් නැත.

විටෙක එම ක්‍රියාව අල්ලාහ් වෙනුවෙන් පිහිටිය ද එහි මූනිච්චාව ද එකතු වනු ඇත. එය එහි මූලිකාංගවල එකතු වූයේ නම් පූර්ව සාධක සහිත මූලාශ්‍ර පෙන්වා දෙනුයේ එය අවලංගු වන බව හා එය නිෂ්ඵල වන බවය.

සහීහ් මුස්ලිම්හි සඳහන් පරිදි නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බව අබූ හුරෙය්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් මෙසේ සඳහන් වේ.[18] එතුමා: "උත්තරීතර හා උත්කෘෂ්ඨ අල්ලාහ් මෙසේ පවසයි: "ආදේශ තැබීමට හවුල්කරුවන් මට අවශ්‍ය නැත. කවරෙකු හෝ මා සමග වෙනත් කිසිවකු එහි හවුල් කර ගන්නේද ඔහු හා ඔහු ආදේශ කළ දෑ මම අතහැර දමමි."

17. අහ්මද් (5/134), ඉබ්නු හිබ්බාන් පූර්ව සාධක හදීසයක් බව සඳහන් කර ඇත. (405), හාකිම් (4/311), අල්බානී ගේ 'සහීහ් අල්ජාමිඃ' (2825)

18. හදීස් අංක (2985)

අහ්මද් තිර්මිදි ඉබ්නු මාජා යන ඉමාම්වරු විසින් වාර්තා කර ඇති පරිදි අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) ප්‍රකාශ කළ බවට සහාබාවරුන්ගෙන් කෙනෙකු වූ අබූ සර්ද් ඉබ්නු අබී ෆළාලා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් මෙසේය. එතුමාණෝ: 'ඒ ගැන කිසිදු සැකයක් නැති දිනයක් සඳහා මුල්කාලීනයන් හා පසුකාලීනයන් අල්ලාහ් එක්රැස් කළ විට නිවේදකයකු මෙසේ නිවේදනය කරයි. කවරෙකු අල්ලාහ් වෙනුවෙන් කළ ක්‍රියාවක තවත් කෙනෙකු හවුල් කර ගෙන එහි කුසල අල්ලාහ් නොවන කෙනෙකු වෙතින් පතා ඇත්තේද සැබැවින්ම ආදේශ තබන හවුල්කරුවන්ගේ අවශ්‍යතාවක් අල්ලාහ්ට නැත."[19]

ක්‍රියාවක ආරම්භය අල්ලාහ් වෙනුවෙන් පිහිටා පසුව එයට මූනිච්චාවේ චේතනාව හටගත් විටෙක, එය වැරදීමකින් සිදුවී පසුව එය අතහැර දැමුවේ නම් කිසිදු මතභේදයකින් තොරව ඔහුට එය හානියක් වන්නේ නැත.

ඒ සමගම එය දිගටම බැඳී පවතින්නේ නම් ඔහුගේ ක්‍රියාව නිෂ්ඵල වන්නේ ද එසේ නැතිනම් එයට හානියක් සිදුවේ දැයි සලකා බලන විට එය ඔහුගේ චේතනාවේ මූලය දෙස සලකා බැලෙයි. ඒ පිළිබඳ මුල් කාලීන විද්වතුන් අතර මතභේද පවතී. ඉමාම් අහ්මද් හා ඉබ්නු ජරීර් යන ඉමාම්වරු තීන්දු කර ඇත්තේ එමගින් ඔහුගේ ක්‍රියාවන් නිෂ්ඵල නොවන බවත් ඔහුගේ ආරම්භක චේතනාව සමග එය වලංගු වන බවත්ය.

ඉබ්නු ජරීර් තුමා පවසා සිටිනුයේ සැබැවින්ම මෙම මත ගැටලුව පිහිටනුයේ එහි ආරම්භය අවසානය සමගම බැඳී පවතින සලාතය උපවාසය හජ් වැනි කටයුතුවල බවයි. එසේ බැඳී නොපවතින අල් කුර්ආනය කියවීම් දික්ර් කිරීම ධනය වියදම් කිරීම දැනුම ව්‍යාප්ත කිරීම වැනි දෑ වනාහි ඒ වෙත පවතින මූනිච්චාවේ චේතනාව තුළින් එය බිඳ වැටෙනු ඇත. නැවත චේතනාව අලුත් කර ගැනීමේ අවශ්‍යතාව පිහිටනු ඇත.

එහෙයින් ක්‍රියාවක් පිවිතුරු චේතනාවෙන් සිදු කොට පසුව එමගින් දේව විශ්වාසී ජනයාගේ හදවත් තුළ අලංකාර පැසසුමක් අල්ලාහ් ඇතුළත් කර

19. අහ්මද් (3/466), තිර්මිදි (3154) ඔහු මෙම හදීසය හසන් ගරීබ් වර්ගයට අයත් හදීසයක් බව සඳහන් කරයි. ඉමාම් අල්බානී (රහිමහුල්ලා) එය හසන් වර්ගයට අයත් හදීසයක් බව සඳහන් කර ඇත. බලන්න: 'සහීහ් අල්-ජාමිඃ (482)

අල්ලාහ්ගේ භාග්‍යය හා ඔහුගේ දයාව තුළින් සතුටු වී ඒ සඳහා ශුභාරංචි බලාපොරොත්තු වන්නේ නම් එය ඔහුට හානියක් වන්නේ නැත. මෙම අර්ථයෙන්ම නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ හදීසයක් අබූ දර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කොට ඇත. 'සැබැවින්ම එතුමාණන්ගෙන් අල්ලාහ් වෙනුවෙන් යහපත් ක්‍රියාවක් සිදු කොට ඒ වෙනුවෙන් මිනිසුන් ඔහු ප්‍රශංසාවට ලක් කරන මිනිසෙකු පිළිබඳ විමසන ලදී. එවිට එතුමාණෝ "මෙය කල් ඇතිව ලබා දෙන මුඃමින්වරුන්ගේ ශුභාරංචියකි" යැයි පවසා සිටියහ. මෙය ඉමාම් මුස්ලිම් විසින් දන්වා ඇත. [20]

චිත්ත පාරිශුද්ධිය හා මූනිච්චාව පිළිබඳ මෙහි සඳහන් කරුණු ප්‍රමාණවත් වන බැවින්. මෙතෙක් කතා කළ දෑ සමග අපි සීමා කර ගන්නෙමු.

***

සමස්තයක් වශයෙන් බැලූ කල සහ්ල් ඉබ්නු අබ්දිල්ලාහ්ගේ ප්‍රකාශය කෙතරම් අලංකාරද! 'ආත්මයට චිත්තපාරිශුද්ධියට වඩා අසීරු කිසිවක් නැත. ඊට හේතුව කිසිදු කොටසක් එයට එහි නොලැබෙන බැවිනි."

යූසුෆ් ඉබ්නු අල් හසන් අර්-රාසී මෙසේ පවසා සිටියි. "මෙලොවෙහි වඩාත් බලවත් වන්නේ චිත්ත පාරිශුද්ධියයි. මගේ හදවතින් මුහුණිච්චාව ඉවත හෙළන්නට කෙතරම් උත්සාහ දැරුවද එය තවත් පැතිකඩකින් මතු වන්නේය."

ඉබ්නු උයය්යා තුමා මෙසේ පවසයි. "මුතර්රිෆ් ඉබ්නු අබ්දිල්ලාහ්ගේ ප්‍රාර්ථනා මෙසේ විය. 'අහෝ දෙවිඳුනි, සැබැවින්ම මම නුඹ වෙත පව් සමාව අයැද පසුව නැවතත් ඒ වෙත යොමු වූ දෑ වෙනුවෙන් මම ඔබෙන් සමාව අයැද සිටිමි. එමෙන්ම මාගේ ආත්මය වෙත ඔබ වෙනුවෙන් කවර කරුණක් පවරා ගෙන පසුව මම ඔබ වෙනුවෙන් ඉටු නොකළ දැයින්ද මා ඔබෙන් සමාව අයැද සිටිමි. එමෙන්ම ඔබේ තෘප්තිය අපේක්ෂාවෙන් අධිෂ්ඨාන කොට යමක් කර

20. හදීස් අංක (2642)

පසුව මාගේ හදවත සමග ඔබ දන්නා පරිදි මුසු වූ දැයින් ද මම සමාව අයැද සිටිමි. [21]

***

21. මෙම අර්ථයෙන් මඃකල් ඉබ්නු යසාර් තුමා විසින් වාර්තා කළ හදීසයක් ද පැමිණ ඇත. එතුමා මෙසේ පවසා සිටියි: මම අබූ බක්ර් සිද්දීක් (රළියල්ලාහු අන්හු) තුමා සමග නබි (සල්ලල්ලාහු අලයහි වසල්ලම්) තුමා වෙත ගියෙමි. එවිට එතුමාණන්: අහෝ අබූ බක්ර් කුහුඹුවා බඩ ගාමින් එනවාට වඩා සැහැල්ලුවෙන් ඔබ අතර ෂිර්ක් (අල්ලාහ්ට ආදේශ තැබීම) පැමිණෙනු ඇත. එවිට අබූ බක්ර් තුමා: අල්ලාහ්ට වෙනත් දෙවියකු පත් කිරීම මිස වෙනත් කිසිවක් ෂිර්ක් නොවන්නේ නොවේදැයි විමසා සිටිය. එයට නබි (සල්ලල්ලාහු අලයහි වසල්ලම්) තුමා: මාගේ ප්‍රාණය කවුරුන් සන්තකයෙහි ඇත්තේද ඔහු මත දිවුරා පවසමි. කුහුඹුවා බඩ ගාමින් ඒමට වඩා සැහැල්ලුවෙන් ෂිර්ක් පවතී. ඔබට මම යමක් දන්වා සිටින්න ද එය ඔබ පවසන්නේ නම් එය ස්වල්පයක් වුවද අධික වුවද ඔබෙන් පහ වී යනු ඇත? පසුව ඔබ 'අල්ලාහුම්ම ඉන්නී අඌදු බික අන් උෂ්රික බික වඅන අඃලමු වඅස්තග්ෆිරුක ලිමාලා අඃලමු' යා අල්ලාහ් මම දැනුවත්ව ඔබට ආදේශ තැබීමේ වරදින් මම ඔබෙන් ආරක්ෂාව පතමි. එමෙන්ම මම නොදනුවත්ම කරන දැයින්ද මම ඔබෙන් සමාව අයැද සිටිමි. ඉමාම් බුහාරි 'අදබ් අල් මුෆ්රද් නම් කෘතියෙහි (716) මෙය වාර්තා කර ඇති අතර මෙය පූර්ව සාධක සහිත හදීසයකි.

## الحَدِيْثُ الثّانِي

## දෙවන හදීසය

عَنْ عُمَرَ بنِ الخَطَّابِ رَضِيَ اللهُ عَنْهُ قَالَ:

" بَيْنَمَا نَحْنُ جُلُوسٌ عِنْدَ رَسُولِ اللهِ ﷺ ذَاتَ يَوْمٍ، إِذْ طَلَعَ عَلَيْنَا رَجُلٌ شَدِيدُ بَيَاضِ الثِّيَابِ، شَدِيدُ سَوَادِ الشَّعْرِ، لَا يُرَى عَلَيْهِ أَثَرُ السَّفَرِ، وَلَا يَعْرِفُهُ مِنَّا أَحَدٌ. حَتَّى جَلَسَ إِلَى النَّبِيِّ ﷺ . فَأَسْنَدَ رُكْبَتَيْهِ إِلَى رُكْبَتَيْهِ، وَوَضَعَ كَفَّيْهِ عَلَى فَخِذَيْهِ، وَقَالَ: يَا مُحَمَّدُ أَخْبِرْنِي عَنْ الْإِسْلَامِ. فَقَالَ رَسُولُ اللهِ ﷺ: الْإِسْلَامُ أَنْ تَشْهَدَ أَنْ لَا إلَهَ إلَّا اللهُ وَأَنَّ مُحَمَّدًا رَسُولُ اللهِ، وَتُقِيمَ الصَّلَاةَ، وَتُؤْتِيَ الزَّكَاةَ، وَتَصُومَ رَمَضَانَ، وَتَحُجَّ الْبَيْتَ إنْ اسْتَطَعْت إلَيْهِ سَبِيلًا.قَالَ: صَدَقْت . فَعَجِبْنَا لَهُ يَسْأَلُهُ وَيُصَدِّقُهُ!

قَالَ: فَأَخْبِرْنِي عَنْ الْإِيمَانِ. قَالَ: أَنْ تُؤْمِنَ بِاللهِ وَمَلَائِكَتِهِ وَكُتُبِهِ وَرُسُلِهِ وَالْيَوْمِ الْآخِرِ، وَتُؤْمِنَ بِالْقَدَرِ خَيْرِهِ وَشَرِّهِ. قَالَ: صَدَقْت.

قَالَ: فَأَخْبِرْنِي عَنْ الْإِحْسَانِ.

قَالَ: أَنْ تَعْبُدَ اللهَ كَأَنَّك تَرَاهُ، فَإِنْ لَمْ تَكُنْ تَرَاهُ فَإِنَّهُ يَرَاك.

قَالَ: فَأَخْبِرْنِي عَنْ السَّاعَةِ.

قَالَ: مَا الْمَسْئُولُ عَنْهَا بِأَعْلَمَ مِنْ السَّائِلِ.

قَالَ: فَأَخْبِرْنِي عَنْ أَمَارَاتِهَا.

قَالَ: أَنْ تَلِدَ الْأَمَةُ رَبَّتَهَا، وَأَنْ تَرَى الْحُفَاةَ الْعُرَاةَ الْعَالَةَ رِعَاءَ الشَّاءِ يَتَطَاوَلُونَ فِي الْبُنْيَانِ.

ثُمَّ انْطَلَقَ، فَلَبِثْتُ مَلِيًّا، ثُمَّ قَالَ لِي : يَا عُمَرُ أَتَدْرِي مَنْ السَّائِلُ؟. قُلْتُ: اللَّهُ وَرَسُولُهُ أَعْلَمُ.

قَالَ: فَإِنَّهُ جِبْرِيلُ أَتَاكُمْ يُعَلِّمُكُمْ دِينَكُمْ".

رَوَاهُ مُسْلِمٌ

අල් කත්තාබ්ගේ පුතණුවන් වන උමර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

“දිනක් අපි අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) තුමා අබියස වාඩි වී සිටියදී සුදෝ සුදු ඇඳුමින් සැරසුණු කළුම කළු හිසකෙස් සහිත මිනිසෙකු අප වෙත උදා විය. ඔහු මත මගියකුගේ සළකුනු දකින්නට නොවීය. අප අතර සිටි කිසිවකු ඔහු හඳුන්නනේ ද නැත. අවසානයේ ඔහු නබි (ﷺ) තුමා වෙත පැමිණ තම දණහිස් එතුමාගේ දණහිස් සමඟ සම්බන්ධ කොට තම දැත් ද එතුමාගේ කලවා මත තබා වාඩි විය.

පසු ව ඔහු: ‘අහෝ මුහම්මද්! ඉස්ලාමය ගැන තොරතුරු මාහට දන්වනු’ යැයි පැවසීය.

එයට අල්ලාහ්ගේ දූතයාණෝ: “ඉස්ලාම් යනු ඔබ නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නොමැති බවත් සැබැවින්ම මුහම්මද් අල්ලාහ්ගේ දූතයාණන් බවත් සාක්ෂි දැරීම, සලාතය විධිමත්ව ඉටු කිරීම, සකාත් (හෙවත් අනිවාර්ය ආගමික බද්ද) පිරිනැමීම, රමළාන් මාසයේ උපවාසයේ නිරත වීම හා ඔබ අල් බයිත් (හෙවත් මස්ජිදුල් හරම්) වෙත යාමට මගී පහසුකම් දරන්නේ නම් ඒ වෙත වන්දනාවේ යාම” යැයි පවසා සිටියහ.

තවදුරටත් ඔහු: ‘ඊමානය ගැන තොරතුරු මාහට දන්වනු’ යැයි පැවසීය.

එයට එතුමාණෝ: “අල්ලාහ්, ඔහුගේ මලක්වරුන් (හෙවත් දේව දූතයින්), ඔහුගේ ආගම්, ඔහුගේ දහම් දූතවරුන්, හා අවසන් දිනය පිළිබඳ ඔබ විශ්වාස කොට යම් දෙයක යහපත හා එහි අයහපත පෙර නියමය පරිදි සිදුවන

බවත් ඔබ විශ්වාස කිරීමය'' යැයි පැවසූහ. (එයට) ඔහු: 'ඔබ සත්‍යය පැවසුවෙහිය' යැයි පැවසීය.

තවදුරටත් ඔහු: 'ඉහ්සාන් ගැන තොරතුරු මාහට දන්වනු' යැයි පැවසීය.

එතුමාණෝ: "ඔබ අල්ලාහ්ව බලා සිටින්නාක් මෙන් ඔහුට නැමදුම් කිරීමය. හේතුව ඔබ ඔහු ව නොදුටුව ද සැබැවින්ම ඔහු ඔබ ව බලා සිටින බැවිනි'' යැයි පැවසූහ.

තවදුරටත් ඔහු: 'අස්සාඅත් හෙවත් අවසන් හෝරාව ගැන තොරතුරු මාහට දන්වනු' යැයි පැවසීය.

එතුමාණෝ: "ඒ ගැන විමසනු ලබන්නාට වඩා ඒ ගැන විමසා සිටින්නා මැනවින් දන්නාය'' යැයි පැවසූහ.

තවදුරටත් ඔහු: 'එහි සලකුණු ගැන මාහට දන්වනු' යැයි පැවසීය.

එතුමාණෝ : "වහලිය තම හිමියා ප්‍රසූත කරයි. එළුවන් දක්කන පාවහන් නොපළඳින විළිවසා ගත නොහැකි දිළිඳුන් ගොඩනැගිලි ඉදි කිරීමෙහි එකිනෙකා තරඟ වදියි.'' යැයි පැවසූහ.

පසුව ඔහු හැරී ගියේය. මම මද වේලාවක් නැවතී සිටියෙමි. පසුව එතුමා මා අමතා: "අහෝ උමර් විමසා සිටි තැනැත්තා කවුරුන්දැයි ඔබ දන්නෙහිද?''යි විමසා සිටියහ.

මම: 'අල්ලාහ් හා ඔහුගේ දහම් දූතයා මැනවින් දනී' යැයි පැවසුවෙමි.

එතුමාණෝ: "සැබැවින්ම ඔහු ජිබ්රීල්ය. ඔබේ දහම ඔබට ඉගැන්වීම සඳහා ඔබ වෙත පැමිණියේය'' යැයි පැවසූහ.

මෙය ඉමාම් මුස්ලිම් විසින් දන්වා ඇත.

## - විග්‍රහය -

මෙම හදීසයම අබූ හුරෙය්රා රළියල්ලාහු විසින් වාර්තා කොට ඇති අතර[22] ඉමාම් බුහාරි හා මුස්ලිම් යන දෙදෙනා විසින් එය දන්වා සිටිය ද මෙහි සඳහන් පද ඉමාම් බුහාරි විසින් දන්වා සිටි දෑ නොවන අතර ඉමාම් මුස්ලිම්ට පමණක් ආවේනික වූ හදීසයකි.

මෙය වඩාත් වැදගත් හදීසයකි. දහම පිළිබඳ පූර්ණ පැහැදිලි කිරීමක් මෙහි ආවරණය වී ඇත. නබි (ﷺ) ඉස්ලාමයේ අදියරයන් ඊමානයේ අදියරයන් හා ඉහ්සානයේ අදියරයන් පැහැදිළි කළ පසුව ‘මෙය ජිබ්රීල්ය. නුඹලාගේ දහම නුඹලාට ඉගැන්වීම පිණිස නුඹලා වෙත පැමිණ ඇතැ’යි[23] පවසා සිටි අතර ඒ සියල්ල දහම බවට පත් කළේය.

ඉස්ලාමය වනාහි,

මුහම්මද් (ﷺ) තුමාණන් එය පැහැදිළි කර සිටියේ ක්‍රියාවන් හා ප්‍රකාශයන් ඇතුළත් බාහිර ශරීර අවයව තුළින් සිදු කරන ක්‍රියාදාමයන් ලෙසය. ඒවායින් පළමු වැන්න අල්ලාහ් හැර වෙනත් දෙවියකු නොමැති බවත් මුහම්මද් අල්ලාහ්ගේ දූතයාණන් බවත් සාක්ෂි දැරීමය. එය දිවෙන් සිදු කරන්නා වූ ක්‍රියාවකි. පසුව සලාතය විධිමත්ව ඉටු කිරීම, සකාත් පිරිනැමීම, රමළාන් මාසයේ උපවාසයේ නිරත වීම හජ් වන්දනාව සඳහා පහසුකම් ඇති උදවිය මක්කා දේවස්ථානයට යෑම.

22. මෙම හදීසයම පද වෙනස්කම් සහිතව වාර්තා වී ඇත.

23. දැනුම, යහපත හා ප්‍රයෝජනය අපේක්ෂාවෙන් යුතුව ඒ සඳහා මිනිසෙකු වෙනත් හැඩරුවක් ගෙන වෙස් වලා ගැනීමේ අනුමැතිය මෙහි ඇත. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත් තරීෆී)

මෙයද සලාතය හා උපවාසය වැනි ශාරීරික වශයෙන් සිදු කරන ක්‍රියාවන්, සකාත් පිරිනැමීම වැනි මූල්‍යමය වශයෙන් සිදු කරන ක්‍රියාවන් හා හජ් වැනි ශාරීරික හා මූල්‍යමය වශයෙන් සිදු කරන ක්‍රියාවන් ලෙස බෙදී යයි.

ඉස්ලාමයේ මූලික ක්‍රියාවන් ද මෙහි සඳහන් කරනු ලැබ ඇත. 'ඉස්ලාමය කරුණු පහක් මත ගොඩ නැගී ඇත' යන ඉබ්නු උමර් තුමාගේ හදීසයේ පැහැදිලි කිරීමෙහි සඳහන්ව ඇත්තාක් මෙන් ඉස්ලාමය ඒවා මත ගොඩ නැගී ඇත. ඒ පිළිබඳ පැහැදිලි කිරීම ඉන්ෂා අල්ලාහ් එම හදීසය සඳහන් ස්ථානයේ සඳහන් කෙරෙයි.[24]

***

ඊමාන් හෙවත් විශ්වාසය වනාහි: මෙම හදීසයේ නබි (ﷺ) තුමා පැහැදිළි කර සිටියේ අභ්‍යන්තර විශ්වාසයන් සම්බන්ධයෙනි. එතුමා: "අල්ලාහ්, ඔහුගේ මලක්වරුන් (හෙවත් දේව දූතයින්), ඔහුගේ ආගම්, ඔහුගේ දහම් දූතවරුන්, මිය ගිය පසු යළි අවදි කරනු ලැබීම ගැන ඔබ විශ්වාස කොට යම් දෙයක යහපත හා එහි අයහපත පෙර නියමය පරිදි සිදුවන බවත් ඔබ විශ්වාස කිරීමය" යැයි පවසා සිටියහ.

මෙම මූලික කරුණු හය විශ්වාස කිරීම සම්බන්ධයෙන් අල්ලාහ් ඔහුගේ ග්‍රන්ථයේ විවිධ තැන්වල සඳහන් කොට ඇත. උදාහරණ වශයෙන්: "රසූල්වරු ඔහුගේ පරමාධිපතිගෙන් ඔහු වෙත පහළ කරනු ලැබූ දෑ විශ්වාස කළෝය. දේව විශ්වාසී සියල්ලන් ද අල්ලාහ්, ඔහුගේ මලක්වරුන්, ඔහුගේ ආගම්, ඔහුගේ දූතයාණන් පිළිබඳ විශ්වාස කළෝය. ඔහුගේ දූතවරුන් අතුරින් කිසිවකු අපි වෙන් නොකළෙමු." (අල් කුර්ආන් 2:285), "නමුත් යහපත වනුයේ අල්ලාහ්, අවසන් දිනය, මලක්වරුන්, දිව්‍ය ග්‍රන්ථ හා නබිවරුන් විශ්වාස කරන්නාය." (අල් කුර්ආන් 2:177), "ඔවුන් වනාහි ගුප්ත දෑ විශ්වාස කරති. සලාතය විධිමත්ව ඉටු කරති. අපි ඔවුනට පෝෂණය කළ දැයින් වියදම් කරති. එමෙන්ම නුඹ වෙත පහළ කරනු ලැබූ දෑ ද නුඹට පෙර පහළ කරනු ලැබූ දෑ ද විශ්වාස කරති. මතුලොව පිළිබඳ තරයේම විශ්වාස කරති. (අල් කුර්ආන් 2:3,4)

---

24. එය මෙම පොතේ සඳහන් තුන්වන හදීසයයි.

රසූල්වරු හෙවත් දහම් දූතයින් පිළිබඳ විශ්වාස කිරීම වනාහි: මලක්වරුන්, නබිවරුන්, දිව්‍යමය පුස්තක, නැවත නැගිටුවීම හා පෙර නියමයන් පිළිබඳ ඔවුන් විසින් දන්වා සිටි තොරතුරු සහ අල්ලාහ්ගේ ගුණාංග මීසාන් හෙවත් නිර්ණායකය, සිරාත් හෙවත් පාලම, ස්වර්ගය නිරය වැනි මතුලොව දිනයේ ගුණාංග වැනි ඔවුන් විසින් විස්තරාත්මක දන්වා සිටි තොරතුරු සියල්ලා පිළිබඳ විශ්වාස කිරීම අනිවාර්යය වන්නේය.

විශ්වාසය තුළ පෙර නියමය එනම් යහපත හා අයහපත දේව නියමය මත පිහිටනු ඇතැයි යන- විශ්වාස ද ඇතුළත් කර ඇත. මෙම ප්‍රකාශය මුල් කර ගනිමින් පෙර නියමය ප්‍රතික්ෂේප කොට, කලින් කිසිවක් සිදු නොවූවක් බවට -එනම් අල්ලාහ් විසින් පෙර නියමයක් නොතිබූ බවට- විශ්වාස කරමින් සිටින්නන්හට සාධකයක් වශයෙන් මෙම හදීසය ඉබ්නු උමර් තුමාණන් ගෙන හැර දක්වා ඇත. ඉබ්නු උමර් තුමා ඔවුනට එය තිරසාර ලෙස දන්වා සිටි අතර එවැන්නන්ගෙන් එතුමා දුරස් වී සිටි අතර කද්ර් පිළිබඳ විශ්වාසයෙන් තොරව ඔවුන්ගේ ක්‍රියාවන් පිළිගනු නොලබන බවට දන්වා සිටියේය.

මෙම හදීසයේ ඉස්ලාමය හා ඊමානය අතර නබි (ﷺ) තුමා වෙන් කළ බවත් සියලුම ක්‍රියාවන් ඊමානයේ කරුණු අතරට නොව ඉස්ලාමයේ කරුණු අතරට පත් කළ බවත් යම් අයකු විසින් පවසනු ලබන්නේ නම් එසේ දේව විශ්වාසයෙන් එම ක්‍රියාවන් බැහැර කිරීම සම්බන්ධයෙන් මුල් කාලීනයන් දැඩි සේ හෙළා දැක ඇති බව දැන ගත යුතුය.

සඳහන් කළ පරිදි නම්, ඊමානය තුළ සියලු ක්‍රියාවන් ඇතුළත් වන බවට අල්ලාහ්ගේ ප්‍රකාශය සාක්ෂි වශයෙන් පිහිටා ඇත. "සැබැවින්ම දෙවියන් විශ්වාස කරන්නන් වනාහි, අල්ලාහ් පිළිබඳ මෙනෙහි කරනු ලබන විට ඔවුන්ගේ හදවත් තිගැස්සෙති. ඔවුන් වෙත ඔහුගේ වදන් පාරායනය කරනු ලබන විට එය ඔවුනට විශ්වාසය වර්ධනය කරනු ඇත. ඔවුන් ඔවුන්ගේ පරමාධිපති වෙත සියල්ල භාර කරති. එමෙන්ම ඔවුන් වනාහි සලාතය විධිමත්ව ඉටු කරති. අපි ඔවුනට පෝෂණය කළ දැයින් වියදම් කරති. ඔවුහුමය සැබෑ දේව විශ්වාසීහු වන්නෝ..." (අල් කුර්ආන් 8:2-4) බුහාරි හා මුස්ලිම්හි සඳහන් හදීසයක අබ්දුල් කයිස් ආගන්තුක පිරිසට නබි (ﷺ) තුමා මෙසේ ප්‍රකාශ කළ බවට ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කර ඇත. එතුමාණෝ: "මම නුඹලාට කරුණු හතරක් පිළිබඳ අණ කර

සිටිමි.: එනම් අල්ලාහ්ව විශ්වාස කිරීම. අල්ලාහ්ව විශ්වාස කිරීම යනු කුමක්දැ?යි නුඹලා දන්නෙහු ද? එය, අල්ලාහ් හැර වෙනත් දෙවියකු නොමැති බවට සාක්ෂි දැරීමය. සලාතය විධිමත්ව ඉටු කිරීම සකාත් නිකුත් කිරීම රමළාන් මාසයේ උපවාසයේ නිරත වීම හා යුද්ධයෙන් අත්පත් කරගත් වස්තුවෙන් පහෙන් කොටසක් පිරිනැමීම වේ.''[25]

මෙම මූලාශ්‍ර අතරත් ජිබ්රීල් අලය්හිස් සලාම් තුමා ඉස්ලාමය හා ඊමානය ගැන කරුණු විමසා සිටීම, නබි තුමාණන් එය වෙන් වශයෙන් පැවසීම සියලු ක්‍රියා පිළිවෙත් ඊමාන් යන නාමය තුළට ඇතුළත් නොකර ඉස්ලාම් යන නාමය තුළට ඇතුළත් කිරීම යනාදී කරුණු අතරත් සමස්තයක් වශයෙන් බැලූ විට මූලික කරුණක් පැහැදිළි වන්නේය. එනම් වෙන් වෙන්ව භාවිතා කරන විටෙක හා පොදුවේ භාවිතා කරන විටෙක භාවිතා කරණ විවිධ නාමයන් ආවරණය වන පරිදි පිහිටන පොදු නාම ද දැකිය හැක. නමුත් එම නාමය වෙනත් නාමයක් සමග එකට භාවිතා කරන විට, එම නාමය ඇතැම් දෑ පමණක් පෙන්වා දෙන අතර ඒ සමග බැඳුණු නාමය එහි ඉතිරි දෑ පෙන්වා දෙයි. උදාහරණ වශයෙන් ෆකීර් (දිළිඳා) හා මිස්කීන් (දුප්පතා) යන පද දෙක පෙන්වා දිය හැක. ඒ දෙක වෙන් වෙන්ව භාවිතා කළ විට එහි දී අවශ්‍යතා ඇති සියලු දනන් එම පදවලට ඇතුළත් වෙයි. නමුත් ඒ දෙකම එකට භාවිතා කරන විටෙක ඒ නම් දෙකින් එකක් අවශ්‍යතා ඇති එක් වර්ගයක් පෙන්වා දෙන අතර අනෙක ඉන් ඉතිරි වන අනෙක් වර්ගයා පෙන්වා දෙයි.

ඉස්ලාම් හා ඊමාන් යන පද දෙක ද එලෙසමය. ඒ දෙක වෙන් වෙන්ව සඳහන් වන විට ඒ දෙකින් එකක අනෙක ඇතුළත් වෙයි. නමුත් ඒ දෙක එකට සම්බන්ධ කළ විට ඒ දෙකින් එකක් පෙන්වා දෙනුයේ එයට ආවේනික වූ ඇතැම් කරුණු පමණකි. අනෙක ඉතිරි කරුණු පෙන්වා දෙනු ඇත.

මෙම පැහැදිලි කිරීම තුළින් ඊමාන් හා ඉස්ලාම් යන පද භාවිත කිරීමේ ගැටලුව නිරාකරණය වෙයි. ඉස්ලාම් හා ඊමාන් යන සෑම පදයක්ම වෙන් වෙන්ව සඳහන් කරනු ලබන විට ඒ දෙක අතර වෙනසක් දැකිය නොහැක.

25. බුහාරි හදීස් අංක (523), මුස්ලිම් හදීස් අංක (17)

නමුත් ඒ නම් දෙක එකට සඳහන් කරන විට ඒ දෙක අතර වෙනසක් තිබෙන්නේය.

***

අල් ඉහ්සාන් යන පදය විවිරණය කරමින්: “ඔබ අල්ලාහ්ව බලා සිටින්නාක් මෙන් ඔහුට නැමදුම් කිරීමය” යනුවෙන් එතුමා කළ ප්‍රකාශය වනාහි:

මෙය ගැත්තකු අල්ලාහ්ට වැදුම් පිදුම් කරන ආකාරය පෙන්වා දෙයි. එනම්: ඔහුගේ සමීප සම්බන්ධතාවය ඔහු ඉදිරියට ගෙන තබමින් ඔහු තමන් බලා සිටින්නාක් මෙන් ඔහු අතර සිටීමය. එය බැතිමත් කම, බිය, ත්‍රස්ථය හා ගරුබුහුමන් කිරීම අනිවාර්ය කරනු ඇත. එමෙන්ම නැමදුමෙහි උපදෙස් ලැබීම හා එය අලංකාරව හා පූර්ණව ඉටු කිරීමට දරන උත්සාහ අනිවාර්යය කරනු ඇත.

“ඔබ ඔහු ව නොදුටුව ද සැබැවින්ම ඔහු ඔබ ව බලා සිටියි” යන එතුමාගේ ප්‍රකාශය වනාහි:

ඒ ගැන පැවසෙන ප්‍රකාශයක් වනුයේ: සැබැවින්ම මෙය පළමු වැන්න විස්තර කිරීමකි. සැබැවින්ම ගැත්තා ඔහු(අල්ලාහ්)ව දැකිය හැකි වන තරමට එම ගැත්තාට ඉතා සමීපයෙන් ඔහු සිටින බව සිතට ගන්නා මෙන් ද නැමදුම් ඉටු කිරීමෙහි අල්ලාහ් පිළිබඳ අධීක්ෂණයෙන් යුතු ව ඉටු කරන මෙන් ද අණ කරනු ලැබූ විට සැබැවින්ම එය ඔහුට අසීරු කාර්යයකි. එවිට අල්ලාහ් තමන් දෙස බලා සිටින බව හා තම රහසිගත දෑ හා බාහිර දෑ සියල්ල කෙරෙහි ඔහු නිරීක්ෂා කරමින් සිටින බව විශ්වාස කිරීම ඒ සඳහා පිටුවහලක් වනු ඇත.

තවත් ප්‍රකාශයක: මෙය තමන් අල්ලාහ් දෙස බලා සිටින්නේය යන හැඟීමෙන් නැමදුම් කිරීමට අපහසු අයට පෙන්වා දෙන මග පෙන්වීමකි. සැබැවින්ම අල්ලාහ් තමන් දෙස බලා සිටින්නේය. අධීක්ෂණය කරන්නේය යන හැඟීමෙන් යුතුව නැමදුම් කළ යුතුයි. ඔහු තමන් දෙස බලා සිටීම හේතුවෙන් ලැජ්ජා විය යුතුයි. සමහරු මෙසේ පවසයි. “ඔබ වෙත බලා සිටින්නන් අතුරින් ඉතා සියුම් ලෙස බලා සිටින අල්ලාහ් ගැන බියවනු.”

තවත් සමහරු “ඔබට හැකි පමණින් අල්ලාහ්ට බියවනු. ඔහු ඔබට සමීප වන තරමට ඔබ ලැජ්ජා වනු.”

මුල් කාලීන විද්වතුන්ගෙන් ඇතැමෙකු. “ප්‍රදර්ශනය සඳහා කවරෙකු අල්ලාහ් වෙනුවෙන් ක්‍රියාවක් කරන්නේ ද ඔහු හඳුනා ගනු ලබන්නෙකි. කවරෙකු අල්ලාහ්ගේ දර්ශණයට පමණක් සීමා වී කටයුතු කරන්නේ ද ඔහු චිත්ත පාරිශුද්ධිය ඇත්තෙකි.” කලින් සඳහන් කරන ලද මෙම ස්ථාවර දෙක මෙම ප්‍රකාශය පෙන්වා දී ඇත.

ඒ දෙකින් පළමුවැන්න: ඉඛ්ලාස් හෙවත් අවංකත්වයේ ස්ථාවරයයි. එනම් අල්ලාහ්ගේ දර්ශණයට පමණක් සීමා වෙමින් ඔහු වෙත තමන් බලා සිටින බව හා ඔහුට සමීපයෙන් සිටින බවට වූ චේතනාව ගෙන ඒමයි. ගැත්තා තම ක්‍රියාවෙහි එම චේතනාව ගෙනැවිත් ඒ මතම පදනම් වී දැහැමි ක්‍රියාවන් සිදු කරන විට ඔහු අල්ලාහ්ට පමණක් අවංකව ඉටු කරන්නෙකු වන්නේය. ඊට හේතුව ඔහුගේ ක්‍රියාව තුළට එම චේතනාව ගෙන ඒම තුළින් අල්ලාහ් නොවන දෑ වෙත හැරීමෙන් එය ඔහු ව වළක්වන බැවිනි.

දෙවැන්න: බලා සිටීමේ ස්ථාවරය. එනම්, තම හදවතින්ම උත්තරීතර අල්ලාහ් වෙනුවෙන් ඔහු බලා සිටින්නේය යන විශ්වාසයෙන් යුතුව ගැත්තෙකු ක්‍රියා කිරීමය. එම විශ්වාසය තුළින් හදවත ආලෝකමත් වන්නේය. ප්‍රඥාව ක්‍රියාත්මක වන්නේය. එය ඔහු ගැප්ත දෑ දකින්නාක් මෙන් පවතිනු ඇත.

ජිබ්රීල් අලයිහිස්සලාම් තුමාගේ හදීසය පෙන්වා දෙන ඉහ්සාන් යන ස්ථාවරයේ සැබෑ යථාර්ථය එයයි. ප්‍රඥාව හිමි අය ප්‍රඥාව ලබා ගැනීමේ ඔවුන්නොවුන්ගේ හැකියාව අනුව ඉහ්සාන් යන ස්ථාවරයේ වෙනස් වෙති.

සූරා රූම් 27 වැනි පාඨයේ ‘වලහුල් මසලුල් අඃලා ෆිස් සමාවාති වල් අර්ළ්’ යන්නෙහි යෙදී ඇති ‘අල් මසලුල් අඃලා’ යන පදයට විද්වතුන් පිරිසක් විස්තර කර ඇත්තේ ද එම අර්ථයෙනි. එයට තවත් උදාහරණයක් වනුයේ සූරා නූර් හි ‘අල්ලාහ්ය අහස්හි හා මහපොළොවෙහි ආලෝකය. ඔහුගේ ආලෝකයට උපමාව පළිගුවක් තුළ ඇති පහනකට සමානය’ යන පාඨයයි. ඉන් අදහස් වනුයේ දෙවියන් කෙරෙහි විශ්වාසය කරන්නාගේ හදවතෙහි පවතින ඔහුගේ ආලෝකයට උපමාව’ යන්නයි. උබය් ඉබ්නු කඃබ් හා වෙනත් මුල්කාලීන විද්වතුන් සඳහන් කර ඇත්තේද එලෙසය.

ජිබ්රීල් අලයිහිස් සලාම් තුමාගේ 'අස්සාඅත් හෙවත් අවසන් හෝරාව ගැන තොරතුරු මාහට දන්වනු' යන ප්‍රකාශය හා එයට පිළිතුරු වශයෙන් "ඒ ගැන විමසනු ලබන්නාට වඩා ඒ ගැන විමසා සිටින්නා මැනවින් දන්නාය" යන ප්‍රකාශය වනාහි:

ඉන් අදහස් කරනුයේ: අවසන් හෝරාව පිළිබඳව මැවීම් සියලු දෙනා අතර ඇති දැනුම සමානව පිහිටා ඇති බවයි. සැබැවින්ම එහි දැනුම පිළිබඳ වගකීම අල්ලාහ් දරා ඇති බව මෙය පෙන්වා දෙයි.

නබි (ﷺ) තුමා පැවසූ බවට ඉබ්නු උමර් තුමා වාර්තා කර කළ හදීසයක් බුහාරිහි මෙසේ සඳහන් වේ.[26] එතුමා: "ගුප්ත දෑ පිළිබඳ යතුරු පහකි. ඒවා පිළිබඳ අල්ලාහ් හැර වෙනත් කිසිවකු නොදනී" යැයි පවසා සිටීමෙන් පසුව එතුමා 'අවසන් හෝරාව පිළිබඳ දැනුම ඇත්තේ සැබැවින්ම අල්ලාහ් අබියසය. ඔහු වර්ෂාව පහළ කරයි ... යන අර්ථයෙන් වූ සූරා ලුක්මාන්හි 34 වැනි පාඨය පාරායනය කළහ.

'එහි සලකුණු ගැන මාහට දන්වනු' යන ප්‍රකාශය වනාහි,

එයින් අදහස් කරනුයේ එය සමීප බව පෙන්වා දෙන එහි සළකුණු පිළිබඳවය.

අවසන් හෝරාව සම්බන්ධයෙන් සළකුණු දෙකක් නබි (ﷺ) තුමා මෙනෙහි කර සිටියේය.

පළමුවැන්න: "වහලිය තම හිමියා ප්‍රසූත කිරීමයි"

මෙහි 'හිමියා' යනුවෙන් අදහස් කරනුයේ ඇයගේ අයිතිකරු හා ඇයගේ ප්‍රධානියා යන්නෙනි. මෙම ප්‍රකාශය රටවල් ජයග්‍රහණය ලබා සිරභාරයට පත් වන වහලියන් අධික වන තරමට වහල් භාවයේ වැඩිවීමක් සිදුවන බවත් ඔවුන්ගේ දරුවන් අධික වන බවත් පෙන්වා දෙයි. එවිට මව ඇයගේ ස්වාමියාට වහලියක් බවට පත් වෙයි. ඔහු විසින් ඇයට දාව දරුවන් ලැබී ඔවුන් ඔහුගේ තත්තවයට පත් වෙයි. එනම් ප්‍රධානියාගේ දරුවා ප්‍රධානියාගේ

26. හදීස් අංක (4778)

ස්ථානය දරනු ඇත. එනම් වහලියගේ දරුවා ඇයගේ ප්‍රධානියාගේ හා හිමියාගේ තත්ත්වයට පත් වනු ඇත.

දෙවන සළකුණ "එළුවන් දක්කන පාවහන් නොපළඳින විළිවසා ගත නොහැකි දිළිඳුන් ගොඩනැගිලි ඉදි කිරීමෙහි එකිනෙකා තරග වැදීම"

දිළිඳුන් යන්නෙන් පරිවර්තනය කර ඇත්තේ හදීසයේ ඇති 'අල් ආලා' යන පදයයි. එය සූරා ලුහා හි 'වවජදක ආඉලන් ෆඅග්නා' (ඔබව ඔහු කිසිවක් නොමැත්තෙකු ලෙස දැක පසුව ඔහු ඔබ පොහොසත් කළේය.) නම් පාඨයේ සඳහන් ආඉලන් නම් පදය මෙනි.

එයින් අදහස් කරනුයේ ජනයා අතර සිටින පහත්ම උදවියයි. ඔවුහු ඔවුන් අතර ප්‍රධානීන් බවට පත්වෙයි. උස් ගොඩනැගිලි තැනීම ඒවා අලංකාර කිරීම හා ඒවා ආරක්ෂා කිරීම යනාදිය පිළිබඳ පුරසාරම් දොඩන තරමට ඔවුන්ගේ ධනය අධික වෙයි.[27]

මෙම හදීසයේ අවසන් හෝරාව පිළිබඳ සඳහන් වන කරුණු අතරට 'කටයුතු ඒවාට සුදුසු නොවන අය වෙත පවරනු ලැබීම' ගැන ද යොමුවක් ඇතුළත්ව ඇත. නබි (ﷺ) තුමාගෙන් අවසන් හෝරාව පිළිබඳ විමසා සිටි පුද්ගලයකුට එතුමාණන් මෙසේ පවසා සිටියහ. කටයුතු එහි සුදුසු නොවන පුද්ගලයින් වෙත භාර කරනු ලබන විට අවසන් හෝරාව බලාපොරොත්තු වන්න.[28]

මේ සියල්ල අවසන් කාලය තහවුරු කරන පරිවර්තනයන් මෙන්ම කටයුතුවලදී ඇතිවන ප්‍රතිවිරුද්ධකම්ය.

***

27 මේවා අරාබි දේශය තුළ වර්තමානයේ මතුව ඇති සලකුණු වන්නේය. අවසන් හෝරාවේ සලකුණු පිළිබඳ පදනම: එය දිව්‍යමය පණිවිඩයේ සඳහන් කර ඇත්නම් ඉන් අදහස් වනුයේ අරාබි කරයේ හෝ අරාබි ප්‍රදේශවල මිස ඒ හැර වෙනත් අය අතර නොවේ. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්-තරීෆී)

28 අබූ හුරෙයිරා විසින් කළ වාර්තාවකි. මෙය බුහාරි හි හදීස් අංක 59 යටතේ සඳහන්ව ඇත.

## الحَدِيْثُ الثَّالِثُ

## තුන්වන හදීසය

عَن عَبْدِ اللهِ ابْنِ عُمَرَ رضي الله عنه قَالَ: سَمِعْتُ رَسُولَ اللهِ ﷺ يَقُوْلُ: ((بُنِيَ الإِسْلَامُ عَلَى خَمْسٍ: شَهَادَةِ أَنْ لَا إِلَهَ إِلَّا اللهُ وَأَنَّ مُحَمَّدًا رَسُولُ اللهِ، وَإِقَامِ الصَّلَاةِ، وَإِيتَاءِ الزَّكَاةِ، وَحَجِّ البَيْتِ، وَصَوْمِ رَمَضَانَ)).

رَوَاهُ البُخَارِيُّ وَمُسْلِمٌ

අල්ලාහ්ගේ දූතයාණන් කළ ප්‍රකාශයකට තමන් සවන් දුන් බව උමර් තුමාගේ පුත් අබ්දුල්ලාහ් (රළියල්ලාහු අන්හුමා) විසින් මෙසේ වාර්තා කරන ලදී.

නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නොමැති බවට හා සැබැවින්ම මුහම්මද් ඔහුගේ ගැත්තා හා ඔහුගේ දූතයාණන් බවට සාක්ෂි දැරීම, සලාතය ඉටු කිරීම, සකාත් පිරිනැමීම, දේව නිවස කරා හජ් වන්දනාවේ යෑම හා රමළාන් මාසයේ උපවාසයේ නිරත වීම යන කරුණු පහ මත ඉස්ලාමය ගොඩ නැගී ඇත.

මෙය බුහාරි හා මුස්ලිම් විසින් දන්වා ඇත.

***

### -විග්‍රහය-

මෙම හදීසයෙන් අදහස් කරනුයේ: සැබැවින්ම ඉස්ලාමය මෙම කරුණු පහ මත ගොඩ නැගී ඇති බවය. එය ගොඩනැගිල්ලක ඇති කණු හා ස්ථම්භ මෙනි.

මින් අදහස් කරනුයේ: ඉස්ලාමය ගොඩ නැගිල්ලකටත් එම ගොඩනැගිල්ලේ කණු මෙම කරුණු පහටත් උපමා කිරීමය. ඒවා නොමැතිව ගොඩනැගිල්ල ස්ථාවරව නොපවතී. ඉස්ලාමයේ ඉතිරි අනෙකුත් කරුණු ගොඩ නැගිල්ලේ

එකිනෙක මත දමා ඇති සෙසු අමුද්‍රව්‍ය මෙනි. ඒවායින් කිසිවක් අඩු වූ විට ගොඩනැගිල්ලෙහි ද අඩු පාඩුකම් දකින්නට ලැබේ. ඒවා ගොඩ නැගිල්ලේ කණුවල සිදුවන අඩුපාඩු මෙන් නොව ඊට වෙනස්ය. එකී අමතර අමු ද්‍රව්‍යවල අඩු පාඩු තිබුණ ද එය ස්ථාවරව පවතී. එහෙයින් මේ සියලු කරුණු නැති වීමෙන් කිසිදු සැකයකින් තොරව ඉස්ලාමය ඉවත් වනු ඇත. එමෙන්ම සාක්ෂි දැරීමේ ප්‍රකාශ දෙක නැතිවීමෙන් ද එය ඉවත් වනු ඇත.

***

සලාතය වනාහි, සැබැවින්ම එය අතහරින්නා ඉස්ලාමයෙන් බැහැර වන බව පෙන්වා දෙමින් හදීස් බොහෝමයක් පැමිණ ඇත. සහීහ් මුස්ලිම්හි නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ ප්‍රකාශයක් ජාබිර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. “මිනිසා අතර හා ෂිර්ක් හෙවත් දෙවියන්ට ආදේශ තැබීම හා කුෆ්ර් හෙවත් ප්‍රතික්ෂේප කිරීම අතර පවතින වෙනස සලාතය අතහැර දැමීමයි.” බුරෙය්දා,[29] සව්බාන්, අනස් (රළියල්ලාහු අන්හුම්) ඇතුළු වෙනත් අය විසින් ද මෙවැනිම හදීස් වාර්තා කර ඇත.

නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බවට වාර්තා කරමින් මුආද් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ දන්වා සිටියි: “කටයුත්තේ මූලය: ඉස්ලාමයයි. එහි කණුව සලාතයයි.”[30] සලාතය කූඩාරමක[31] ඇති කණුවලට උපමා කළේය. ඒවා නොමැතිව කූඩාරම ස්ථාවරව නොපවතී. කණු කඩා වැටුණේ නම් කූඩාරමද කඩා වැටෙනු ඇත.

29 මෙය ප්‍රසිද්ධ හදීසයකි. එනම්: “අප අතර හා ඔවුන් අතර පවතින ගිවිසුම සලාතයයි. එහෙයින් කවරෙකු එය මග හරින්නේද සැබැවින්ම ඔහු සත්‍යය ප්‍රතික්ෂේප කළේය.” අහ්මද් (346/5), තිර්මිදි (2621), නසාඊ (231/1), ඉබ්නු මාජා (1079) යන ඉමාම්වරු මෙම හදීසය වාර්තා කර ඇති අතර මෙය පූර්ණ සාධක සහිත හදීසයකි.

30 මෙම පොත් පිංචයේ 29 වන හදීසය මෙය වේ.

31 කූඩාරම යන්නෙහි අරාබි පදය ‘අල්-ෆුස්තාත්’ය එය අතු කොළවලින් යුත් නිවසකි.

උමර් (රළියල්ලාහු අන්හු තුමා) මෙසේ දන්වා සිටියි: "සලාතය අතහැර දමන්නාට ඉස්ලාමයේ කිසිදු කොටසක් නැත."[32]

අබ්දුල්ලා ඉබ්නු ෂකීක් තුමා මෙසේ පවසයි: 'දේව දූතයාණන්ගේ අනුගාමිකයින්, සලාතය හැර අතහැර දමන ලද ක්‍රියාවන් අතර දේව ප්‍රතික්ෂේපයක් යැයි අදහස් කළ වෙනත් කිසිදු ක්‍රියාවක් නොවීය.[33]

මෙම ප්‍රකාශය[34] මුල් කාලීන මෙන්ම පසුකාලීන කණ්ඩායම් විසින්ද දරා ඇත. එය ඉබ්නු මුබාරක්, අහ්මද්, ඉස්හාක් වැනි ඉමාම්වරුන්ගේ ප්‍රකාශයයි. ඉස්හාක් තුමා විද්වතුන්ගේ සංසදයද[35]ඒ අදහස මත සිටින බව පවසා ඇත.

මුහම්මද් ඉබ්නු නස්ර් අල් මිර්වදී සඳහන් කර සිටිනුයේ: 'මෙම ප්‍රකාශය හදීස්වේදීන් බහුතරයකගේ ප්‍රකාශය' වන බවයි.

ඔවුන් අතුරින් පිරිසක් 'කවරෙකු උවමනාවෙන්ම ඉස්ලාමයේ කුළුණු පහින් එකක් මග හරින්නේ ද එමගින් ඔහු දේව ප්‍රතික්ෂේපකයකු වන බව පවසා සිටිති. එය අහ්මද් විසින් කළ වාර්තාවකි. ඔහුගේ ශිෂ්‍යයින්ගෙන් පිරිසක් ද එම අදහසම තෝරා ගෙන ඇති අතර මාලිකී නිකායේ ඉබ්නු හබීබ් තුමාගේ ප්‍රකාශය ද එය විය.[36]

---

32. මුවත්තාහි ඉමාම් මාලික් තුමා මුසව්වර් ඉබ්නු මහ්රිමා තුමාගෙන් ලබා මෙම හදීසය වාර්තා කර ඇත. (හදීස් අංක 51) මෙහි වාර්තා සම්බන්ධතාව පූර්ව සාධක සහිතය.

33. ඉමාම් තිර්මිදිගේ වාර්තාවකි. හදීස් අංක 2622, මෙහි වාර්තා සම්බන්ධතාව පූර්ණ සාධක සහිත හදීසයකි.

34. එනම්: සලාතය අතහැර දමන්නාගේ ප්‍රතික්ෂේපකත්වය පිළිබඳ ප්‍රකාශයයි.

35. නබි අනුගාමිකයින්ගේ සංසදය මෙන්ම ඔවුන්ගෙන් පසු පැමිණි තාබිඊන්වරුන්ගේ සංසදය ද ඒ මතයම දරා ඇත. අය්යූබ් තුමාගෙන් හම්මාද් තුමා ලබා එය ඉමාම් මිර්වදී තුමා මෙසේ වාර්තා කරයි: සලාතය අතහැරීම දේව ප්‍රතික්ෂේපයයි. එහි කිසිදු මතභේදයක් අපි නොදරමු. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්තරීෆී)

36 ඒ පිළිබඳ නිසි දැනුම ඇත්තේ අල්ලාහ් අබියසය. වඩාත් නිවැරදි යැයි සිතනුයේ: දිනක වාර කිහිපයක් සලාතය අතහරින්නා එය සම්පූර්ණයෙන්ම අතහරින තෙක් දේව ප්‍රතික්ෂේපකයකු නොවන බවයි. සලාතය පස්වතාවක් බව පිළිගනිමින්

ඉමාම් අහ්මද් තුමාගේ වාර්තාවක: සැබැවින්ම උපවාසය හා හජ් වන්දනාව හැර විශේෂයෙන් සලාතය හා සකාතය පැහැර හැරීම ප්‍රතික්ෂේපයකි.[37] යැයි සඳහන්ව ඇත.

ජිහාද් හෙවත් දේව කටයුතු වෙනුවෙන් සටන් කිරීම ක්‍රියාවන් අතුරින් උතුම්ම ක්‍රියාවක් ලෙස තිබියදී ඉබ්නු උමර් තුමාගේ මෙම හදීසයේ ඒ ගැන සඳහන් කර නැත. එයට ව්‍යූහ දෙකක් ඇත.

පළමුවැන්න: ජිහාදය හෙවත් දෙවියන් වෙනුවෙන් සිදු කරනු ලබන අරගලය ෆර්ලු අය්න් (හෙවත් සියලු දනන් හට අනිවාර්යය කටයුත්තක්) නොවන අතර මෙම මූලිකාංගවලට වෙනස්ව එය ෆර්ලු කිෆායා (හෙවත් කටයුත්තට අදාළ සුළුතර පිරිසකට පමණක් අනිවාර්යය වන කටයුත්තක්) බව බහුතර විද්වතුන්ගේ මතයයි.

දෙවැන්න: සැබැවින්ම ජිහාද් හෙවත් අරගලය අවසන් කාලය දක්වාම පිහිටන ක්‍රියාවක් නොවන්නේය. ඊසා අලය්හිස් සලාම් තුමා පහළ වන විට ඉස්ලාම් දහම හැර වෙනත් දහමක් ඉතිරි ව පවතින්නේ නැත.[38] එවිට අරගල

දිනක සලාත් වාර දෙකක් පමණක් ඉටුකරමින් සිටින කල්තාක් ඔහු මුස්ලිම්වරයෙකි. ඔහු ශුද්ධ ආදේශ තබන්නෙකුට වඩා කවර පහත් තත්ත්වයක සිටිය ද එසේමය. නස්ර් ඉබ්නු ආසිම් තුමා කළ වාර්තාවක් අහ්මද් තුමා තම මුස්නද්හි සඳහන් කරන පරිදි: 'අප අතර සිටි මිනිසෙකු අල්ලාහ්ගේ දූතයාණන් වෙත ගොස් සලාත් වාර දෙකක් හැර වෙනත් කිසිදු සලාතයක් ඉටු නොකරන බවට ප්‍රතිඥාවක් ගත්තේය. එයට අල්ලාහ්ගේ දූතයාණන් ද ප්‍රතිඥා දුන්හ."

එසේ තිබියදී පවා කිසිදු අවශ්‍යතාවක් හෝ හේතුවක් නොමැතිව එක සලාතයක් අතහරින්නා මත් පැන් පානය කරන්නාට හා කාමයේ වරදවා හැසිරෙන්නාට වඩා දරුණු බව සඳහන් වෙයි. ඊට හේතුව ඒ සඳහා ෂරීආවේ ඇති ස්ථානය අති වැදගත් බැවිනි. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්තරීෆී)

37 මෙම ගැටලුව පිළිබඳ සවිස්තරාත්මකව දැන ගනු පිණිස ඒ පිළිබඳ ගැඹුරින් සඳහන් කරන ලද විමර්ශනයක් බුහාරි කෘතියෙහි අටුවාවක් වන ෆත්හුල් බාරී නම් කෘතියෙහි බලන්න. (1/20-25)

38 සැබෑ යථාර්ථය වනුයේ ජිහාද් අඛණ්ඩව පැවතීම එයට අදාළ කරුණු කාරණා පිහිටීම හා එය අනිවාර්යය භාවයට පත් වීම යනාදිය අවසන් හෝරාව තෙක් පිහිටනු ඇත. ජාබිර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලද හදීසයක් සහීහ් මුස්ලිම් හි මෙසේ සඳහන් වේ. "මාගේ සමූහයෙන් පිරිසක් අවසන් හෝරාව

කිරීම එහි බර අහක දමනු ඇත. මෙම මූලිකාංගවලට ප්‍රතිවිරුද්ධව ජිහාද් කිරීමේ අවශ්‍යතාවක් ඇති නොවනු ඇත. සැබැවින්ම එය දෙවියන් විශ්වාස කරන්නන් හට අනිවාර්යය වනුයේ ඔවුන් ඒ මත සිටිය දී අල්ලාහ්ගේ අණ පැමිණෙන තෙක් පමණය. සියල්ල දන්නා අල්ලාහ්ය.

***

---

සිදුවන තෙක් සත්‍යයේ පදනම මත එකිනෙකා අරගල කිරීමෙන් ඉවත් නොවෙයි.''

මේ සම්බන්ධයෙන් මුආවියා (රළියල්ලාහු අන්හු) තුමා ද මෙවැනිම හදීසයක් වාර්තා කර ඇත. එමෙන්ම ඊසා (අලයිහිස් සලාම්) තුමාගෙන් පසුව අවසන් හෝරාවේ සිට නියමිත දින ගණන සම්බන්ධයෙන් ද සඳහනක් වාර්තා වී ඇත. එහි නීතිය පිළිබඳ ඉම්රාන් ඉබ්නු හුසෙයින් විසින් වාර්තා කළ මර්ෆූඃ වර්ගයට අයත් හදීසයක් අබූ දාවූද් සතු විය. එනම්: ''මාගේ සමූහයෙන් පිරිසක් අවසන් හෝරාව සිදුවන තෙක් සත්‍යයේ පදනම මත එකිනෙකා අරගල කිරීමෙන් ඉවත් නොවෙයි. ඔවුන්ගේ අවසානයා මසීහ් දජ්ජාල්ව ඝාතනය කරන තෙක් පවතී '' (අෂ්-ෂෙය්ක් අබ්දුල් අසීස් අත්තරීෆි)

## الحَدِيْثُ الرَّابِعُ

## සිව්වන හදීසය

عَنْ عَبْدِ اللهِ بْنِ مَسْعُودٍ رَضِيَ اللهُ عَنْهُ قَالَ: حَدَّثَنَا رَسُولُ اللهِ ﷺ -وَهُوَ الصَّادِقُ الْمَصْدُوقُ-:

"إِنَّ أَحَدَكُمْ يُجْمَعُ خَلْقُهُ فِي بَطْنِ أُمِّهِ أَرْبَعِينَ يَوْمًا نُطْفَةً، ثُمَّ يَكُونُ عَلَقَةً مِثْلَ ذَلِكَ، ثُمَّ يَكُونُ مُضْغَةً مِثْلَ ذَلِكَ، ثُمَّ يُرْسَلُ إلَيْهِ الْمَلَكُ فَيَنْفُخُ فِيهِ الرُّوحَ، وَيُؤْمَرُ بِأَرْبَعِ كَلِمَاتٍ: بِكَتْبِ رِزْقِهِ، وَعَمَلِهِ، وَأَجَلِهِ، وَشَقِيٍّ أَمْ سَعِيدٍ؛ فَوَ الَّذِي لَا إلَهَ غَيْرُهُ، إنَّ أَحَدَكُمْ لَيَعْمَلُ بِعَمَلِ أَهْلِ الْجَنَّةِ حَتَّى مَا يَكُونُ بَيْنَهُ وَبَيْنَهَا إلَّا ذِرَاعٌ فَيَسْبِقُ عَلَيْهِ الْكِتَابُ فَيَعْمَلُ بِعَمَلِ أَهْلِ النَّارِ فَيَدْخُلُهَا. وَإِنَّ أَحَدَكُمْ لَيَعْمَلُ بِعَمَلِ أَهْلِ النَّارِ حَتَّى مَا يَكُونُ بَيْنَهُ وَبَيْنَهَا إلَّا ذِرَاعٌ فَيَسْبِقُ عَلَيْهِ الْكِتَابُ فَيَعْمَلُ بِعَمَلِ أَهْلِ الْجَنَّةِ فَيَدْخُلُهَا."
رَوَاهُ الْبُخَارِيُّ وَمُسْلِمٌ

අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරයි. අල්ලාහ්ගේ දූතයාණෝ අපට කතාවක් පැවසූහ. එතුමා අවංක හා සත්‍යවාදී ය.

සැබැවින්ම ඔබෙන් කෙනෙකු, ඔහුගේ මැවීම ඔහුගේ මවගේ කුස තුළ දින හතළිහක් ශුක්‍රාණු බිඳුවක් සේ එක්කාසු කරනු ලැබේ. පසුව එය (කූඩැල්ලෙකු සේ) ඒ හා සමාන කාලයක් එල්ලෙමින් පවතින මස් කැබැල්ලක් බවට පත් වේ. පසුව එය ඒ හා සමාන කාලයක් මස් ගොබයක් බවට පත් වේ. පසුව ඒ වෙත දේව දූතයකු එවනු ලැබ ඔහු විසින් එහි ප්‍රාණය පිඹිනු ලබයි. ඔහුගේ පෝෂණය, ඔහුගේ ක්‍රියාව, ඔහුගේ ආයු කාලය හා ඔහු භාග්‍යවන්තයකු ද එසේ නැතිනම් අභාග්‍යවන්තයකු ද යනාදී නියමයන් හතරක් නියම කරනු ලබයි. ඔහු හැර වෙනත් දෙවියකු නොමැති ඔහු මත දිවුරා පවසමි.

සැබැවින්ම ඔබ අතුරින් අයකු ස්වර්ග වාසීන්ගේ ක්‍රියාවන් සිදු කරයි. එය ඔහු අතර හා ස්වර්ගය අතර බාහුවක පරතරයක් පිහිටන තරම් පවතී. නමුත් පෙර නියමය ඔහු අභිබවා යයි. එහෙයින් ඔහු නිරා වාසීන්ගේ ක්‍රියාවන් සිදු කොට එහි පිවිසෙනු ඇත! එමෙන්ම ඔබ අතුරින් අයකු නිරා වාසීන්ගේ ක්‍රියාවන් සිදු කරයි. එය ඔහු අතර හා ඒ අතර බාහුවක පරතරයක් පිහිටන තරම් පවතී. නමුත් පෙර නියමය ඔහු අභිබවා යයි. ඔහු ස්වර්ගවාසීන්ගේ ක්‍රියාවන් සිදු කොට එහි පිවිසෙයි.!

ඉමාම් බුහාරි හා මුස්ලිම් මෙම හදීසය දන්වා ඇත.

***

## -විග්‍රහය-

මෙම හදීසය බුහාරි හා මුස්ලිම් යන දෙදෙනා විසින්ම වාර්තා කර ඇත. සමූහයා අතර මෙය පිළිගැනීමට ලක් වූ හදීසයකි.

සැබැවින්ම කලලයක් දින එකසිය විස්සක් තුළ අදියර තුනකින් වෙනස් වන බව මෙය පෙන්වා දෙයි. එය සෑම දින හතළිහකම එක් අදියරයක පවතී. පළමු දින හතළිහ තුළ ශුක්‍රාණු බිඳුවක් ලෙස පිහිටයි. පසුව දෙවන දින හතළියෙහි කූඩැල්ලෙකුගේ ස්වරූපයෙන් පවතී. එය ලේ කැටියකි. පසුව තුන්වන දින හතළියෙහි මස් කැබැල්ලක් ලෙස පවතී. දින එකසිය විස්සෙන් පසුව සුරදූතයකු විසින් ප්‍රාණය එතුළට පිඹියි. ඒ සමගම ප්‍රකාශ හතරක් ද නියම කරනු ලැබේ.

අල් කුර්ආනයේ බොහෝ තැන්වල විවිධ අදියරයන් තුළ කළලයක පෙරළීම සිදුවන ආකාරය පිළිබඳ අල්ලාහ් මෙනෙහි කර ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා සිටියි: "ජනයිනි, නුඹලා (විනිශ්චය දිනයෙහි නැවත) නැගිටුවනු ලැබීම පිළිබඳව සැකයෙහි සිටියෙහු නම් එවිට (නුඹලා සිතා බලවූ.) සැබැවින්ම අපි (අපගේ ශක්තිය) නුඹලාට පැහැදිලි කිරීමක් ලෙස අපි නුඹලාව පසින් ද පසුව ශුක්‍ර ධාතුවකින් ද පසුව (ඇලෙනසුලු) ලේ කැටියකින්

ද පසුව ස්වරූපයක් දෙනු ලැබූ හෝ ස්වරූපයක් දෙනු නොලැබූ මස් කැබැල්ලකින් ද මැව්වෙමු. (ඒවා අතුරින්) අපි අභිමත කරන අයව නියමිත කාලයක් දක්වා ර්භාෂයන්හි රඳවන්නෙමු...'' (සූරා අල් හජ්:5)

එමෙන්ම 'නුත්ෆා' හෙවත් ශුක්‍රාණු බිඳුව, 'අලකා' හෙවත් කූඩැල්ලෙකු මෙන් දිස්වන ලේ කැටිය, 'මුළ්ඝා' හෙවත් මස් පිඩුව යන අදියර තුන අල් කුර්ආනයේ නොයෙකුත් ස්ථානවල සඳහන් කර ඇත. තවත් එක් ස්ථානයක ඊටත් වඩා අමතර අදියර කිහිපයක් සඳහන් කර ඇත. සූරා අල් මුඃමිනීන්හි මෙසේ සඳහන් කර ඇත. ''තවද සැබැවින්ම අපි මැටියෙන් යුත් සාරයෙන් මිනිසාව මැව්වෙමු. පසුව අපි ආරක්ෂක ස්ථානයෙහි (ගර්භාශයෙහි) ශුක්‍ර ධාතුවක් ලෙස ඔහුව පත් කළෙමු. පසුව අපි ශුක්‍ර ධාතුව (ඇලෙනසුලු) ලේ කැටියක් බවට මවා පසුව ලේ කැටිය මස් කැබැල්ලක් බවට මවා පසුව මස් කැබැල්ල අස්ථි බවට මවා පසුව අපි එම අස්ථි මාංශයෙන් පැලඳුවෙමු. පසුව වෙනත් මැවුමක් බවට අපි එය නිර්මාණය කළෙමු. නිර්මාපකයින් අතුරින් ඉතා අලංකාර අල්ලාහ් අති උත්කෘෂ්ට විය. (සූරා අල් මුඃමිනූන්: 12-14)

මෙම වැකියේ අල්ලාහ් මෙනෙහි කර ඇත්තේ ආදම්ගේ පුතණුවන්ට ප්‍රාණය පිඹීමට පෙර ඔහුගේ මැවීම සම්බන්ධයෙන් වූ අදියර හතය. ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා ''ආදම්ගේ පුතණුවන් අදියර හතකින් මවනු ලැබ ඇතැ''යි පවසා පසුව මෙම පාඨය පාරායන කරයි.

ප්‍රාණය පිඹිණු නොලැබූ කළලයක් ගබ්සා කිරීම සඳහා කාන්තාවට අවකාශය ඇතැයි විද්වතුන්ගෙන් පිරිසක් පවසා සිටියි. ඔවුන් එය සලකන්නේ අස්ල් (ශුක්‍රාණු යෝනියෙන් පිටත හැළීමේ) ක්‍රමය සාධකයක් බවට ගනිමිනි. එය දුර්වල ප්‍රකාශයකි. හේතුව කළලයක් යනු හට ගැනුනු දරුවකි. ඇතැම් විට එයට හැඩයක් තිබෙන්නට පුළුවන. නමුත් අස්ල් කරන ශුක්‍රාණුව තුළ කොහෙත්ම දරුවකු දැකිය නොහැක.

අපගේ විද්වතුන් ඉතා පැහැදිලිව පවසා සිටිනුයේ. දරුවකු 'අලකා' හෙවත් ලේ කැටියේ අදියරට පත් වූ විට එසේ ගබ්සා කිරීම සුදුසු නොවන බවයි. ඊට හේතුව දරුවකු හට ගැනීමේ තත්ත්වය ඒ වන විට ආරම්භ වී ඇති බැවිනි. නුත්ෆා හෙවත් ශුක්‍රාණු බිඳුවට වඩා එය වෙනස්ය. එය පිටත හැළුු විට

කොහෙත්ම හට ගැනෙන්නේ නැත. එමෙන්ම දරුවකු හට ගැනෙන්නේ ද නැත.[39]

***

"ඔහු හැර වෙනත් දෙවියකු නොමැති ඔහු මත දිවුරා පවසමි. සැබැවින්ම ඔබ අතුරින් අයකු ස්වර්ග වාසීන්ගේ ක්‍රියාවන් සිදු කරයි..." යන ප්‍රකාශයේ සිට එම හදීසයේ අවසානය දක්වා වූ නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

මෙය ඉබ්නු මස්ඌද්[40] තුමාගේ ප්‍රකාශයෙන් ගනු ලැබූවක් යැයි සඳහන් වේ. මෙම අර්ථයෙන් වූ හදීසයන් විවිධ පැතිකඩවලින් නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බවට වාර්තා වී ඇත.

නබි (ﷺ) ප්‍රකාශ කළ බව සහ්ල් ඉබ්නු සඃද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන හදීසයක් සහීහ් බුහාරි හි මෙසේ සඳහන් වී ඇත. "ක්‍රියාවන් සියල්ල අවසානය අනුව පිහිටයි"[41] තවද නබි (ﷺ) ප්‍රකාශ කළ බව අබූ හුරෙය්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන හදීසයක් සහීහ් මුස්ලිම් හි මෙසේ සඳහන් වී ඇත. "සැබැවින්ම මිනිසා ස්වර්ග වාසීන්ගේ ක්‍රියාවන් -දිගු කලක් තිස්සේ- සිදු කරයි. පසුව ඔහුගේ ක්‍රියාව ඔහුට නිරා වාසීන්ගේ ක්‍රියාවක් තුළින් අවසන් කරනු ලබනු ඇත. එමෙන්ම සැබැවින්ම

39. ප්‍රාණය පිඹීමට පෙර දිළිඳුකම හෝ සාගින්නට බියෙන් එසේ ගබ්සා කිරීම සුදුසු නැත. ඊට හේතුව එහිදී අල්ලාහ් පිළිබඳ වැරදි සිතුවිල්ලක් හට ගෙන ඇති බැවිනි. නමුත් දෙවියන්ට ආදේශ තබන සතුරුන් අතර පදිංචිය නිසා හෝ කළලරූපය තුළ වෛද්‍යවරුන් විසින් ඔප්පු කරන අඩුපාඩුවක් හෝ ආබාධිත තත්වයක් නිසා හෝ මවගේ සෞඛ්‍ය තත්ත්වය නිසා හෝ එසේ ප්‍රාණය පිඹීමට පෙර ගබ්සා කිරීම වරදක් නොවන්නේය. (අෂ්-ෂෙය්ක් අබ්දුල් අසීස් අත්තරීෆී)

40. එනම් එය නබි (ﷺ) තුමාගේ ප්‍රකාශයක් නොවේ. ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමා එය අමතරව එකතු කළ එකකි. එනම් වාර්තාකරුගේ ප්‍රකාශයෙන් හදීසයේ මුල් පද වලට අමතරව එකතු කර ඇති අතර එයට සවන් දෙන්නා මෙම හදීසයෙන් වූවක් බව සිතා එය වාර්තා කොට ඇත. බලන්න: 'අල් බාඉස් අල් හසීස්' (පිටුව: 61)

41. බුහාරි (6607)

මිනිසා නිරා වාසීන්ගේ ක්‍රියාවන් -දිගු කලක් තිස්සේ- සිදු කරයි. පසුව ඔහුගේ ක්‍රියාව ඔහුට ස්වර්ග වාසීන්ගේ ක්‍රියාවක් තුළින් අවසන් කරනු ලබනු ඇත.[42]

සහ්ල් ඉබ්නු සඃද් (රළියල්ලාහු අන්හු) තුමා වාර්තා කළ තවත් හදීසයක් බුහාරි හා මුස්ලිම් හි මෙසේ සඳහන් වේ. සැබැවින්ම නබි (ﷺ) තුමා හා දෙවියන්ට ආදේශ කරන්නන් හමු විය. එතුමාගේ සගයින් අතර මිනිසෙකු විය. ඔහු පරස්පර හෝ පරස්පර විරෝධී කිසිවකු අත් නොහැර තම කඩුවෙන් ඔවුනට පහර දෙයි. එවිට ඔවුහු: -අද දින- මෙම පුද්ගලායට ඇති හැකියාව මෙන් අප අතුරින් කිසිවකුට හැකියාවක් නැතැ!යි'[43] පැවසුවෝය. එවිට අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) "ඔහු නිරා වාසීන්ගෙන් කෙනෙකි" යැයි පැවසූහ. එවිට එම පිරිසේ සිටි පුද්ගලයකු මම ඔහුගේ මිතුරෙකි. මම ඔහු පසුපසින් සිටියෙමි. දැඩි ලෙස ඔහු තුවාල ලැබීය. පසුව මරණය ඉක්මන් කර ගත්තේය. ඔහුගේ කඩුවෙහි මිට පොළවට තබා එහි උල[44] පපු දෙක අතර තබා ඔහුගේ කඩුව බහාලීය. පසුව සියදිවි නසා ගත්තේය. යැයි පැවසුවේය. පසුව එම පුද්ගලයා අල්ලාහ්ගේ දූතයාණන් වෙත පැමිණ 'සැබැවින්ම ඔබ අල්ලාහ්ගේ දූතයාණන් බව මම සාක්ෂි දරමි' යැයි පවසා එම කතාව කියා පෙන්වීය. එවිට අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) තුමා:

"සැබැවින්ම මිනිසා ජනයිනට මතුපිටින් පෙනෙන දැහි ස්වර්ග වාසීන්ගේ ක්‍රියාවන් සිදු කරයි. නමුත් ඔහු නිරා වාසීන්ගෙන් කෙනෙකි. එමෙන්ම මිනිසා ජනයිනට පෙනෙන දැහි නිරා වාසීන්ගේ ක්‍රියාවන් සිදු කරයි. නමුත් ඔහු ස්වර්ගවාසීන්ගෙන් කෙනෙකි.[45]

---

42. මුස්ලිම් (2657)

43. ඉබ්නු මන්ළූර් 'ලිසාන් අල් අරබ්' හි (1/602): සහ්ල් තුමාගේ හදීසයේ සඳහන් -'අද දින- මෙම පුද්ගලායට ඇති හැකියාව මෙන් අප අතුරින් කිසිවකුට හැකියාවක් නැතැ!යි' ප්‍රකාශයේ අර්ථය වනුයේ: 'ඔහු මතුපිටින් පෙනෙන ක්‍රියාවක් සිදු කළේය. ඔහු සිටින ස්ථාවරයේ ඔහු හැර වෙනත් කිසිවකු සිටිය නොහැකි ඔහුගේ හැකියාව මෙන් වෙනත් කිසිවකුට හැකියාවක් නොමැති ස්ථාවරයක ඔහු සිටියේය' යන්නයි.

44. ඉබ්නු අසීර් 'අන්-නිහායා' නම් කෘතියෙහි (2/152) කඩුවේ උල යනු කඩුවෙන් පහර දෙන අගිස්ස වේ යැයි සඳහන් කර ඇත.

45. බුහාරි (4202), මුස්ලිම් (112).

ඉමාම් බුහාරි තුමා ඔහුගේ වාර්තාවේ ඊට අමතරව "සියලු ක්‍රියාවන් අවසානය අනුව පිහිටයි" යනුවෙන් සඳහන් කර ඇත.[46]

***

'මිනිසුනට මතුපිටින් පෙනෙන දෑහි' යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි: සැබැවින්ම කරුණක අභ්‍යන්තරය එයට පටහැනිව පිහිටන බව එය පෙන්වා දෙයි. සැබැවින්ම නපුරු අවසානයක් ඇතිවනුයේ ගැත්තා සතුව අභ්‍යන්තරයේ පවතින කුතුහලය හේතුවෙනි. නපුරු ක්‍රියාවක පැතිකඩ මිනිසාට එඹී බැලිය නොහැක. එහෙයින් එම සැඟවුණු කරුණ මරණ මොහොතේ නපුරු අවසානයක් අනිවාර්යයෙන් ගෙන දෙනු ඇත.[47]

එමෙන්ම මිනිසා නිරා වාසීන්ගේ ක්‍රියාවන් සිදු කරයි. නමුත් ඔහුගේ අභ්‍යන්තරයේ සැඟවුණු යහපත් කටයුතු පවතී. ඔහුගේ අවසන් අවදිය තුළ එම යහපත් කටයුතු ඔහු අභිබවයා යයි. පසුව යහපත් අවසානයක් ඔහුට අනිවාර්යයෙන් ගෙන දෙනු ඇත.

අබ්දුල් අසීස් ඉබ්නු අබූ දාවූද් තුමා මෙසේ පවසයි: මරණ මංචකය අභිසය සිටින 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යනුවෙන් තල්කීන් පවසන මිනිසෙකු මම බැහැ දැක්කෙමි. ඔහු පවසන දෑහි අවසානයේ: 'ඔබ පවසන දෑ සම්බන්ධයෙන් ඔහු ප්‍රතික්ෂේප කරන්නෙකු විය. යැයි පවසා සිටියේය. අවසානයේ ඔහු ඒ මතම මියැදුණේය. 'පසුව මම ඔහු ගැන විමසුවෙමි. එවිට ඔහු මත් පැන්වලට ඇබ්බැහි වූ අයකු විය.' අබ්දුල් අසීස් තුමා 'නුඹලා පාපකම්වලට බියවනු. සැබැවින්ම ඔහුට අත් වූයේ එයයි. යනුවෙන් පවසා සිටියේය.

සුෆ්යාන් තුමා[48] දැඩි කනස්සල්ලෙන් පසු වූයේය. වැළපෙමින් සිටියේය. 'අල් කුර්ආනය සම්බන්ධයෙන් මම අභාග්‍යවන්තයකු වීම ගැන මම බියවෙමි"

46. මෙයද සහ්ල් තුමාගේ වාර්තාවකි. ඉහත කී පරිදි ඉමාම් බුහාරි තුමා මෙය දන්වා ඇත. (6607)

47. අධිකව රහසිගතව සිදුකරන ආගමික කටයුතු අවසාන මොහොතේ ඒවා තහවුරු කරනු ලබන්නට වැදගත් වන්නේය. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්-තරීෆි)

48. සුෆ්යාන් සව්රී: ප්‍රසිද්ධ ඉමාම් වරයෙකි. හිජ්රි 161හි මරණයට පත් විය.

යැයි අඩමින් මරණ මොහොතේ විශ්වාසය මගෙන් බැහැර කරනු ලැබේවි' යැයි බිය වෙමි යැයි පවසා සිටියේය.

මාලික් ඉබ්නු දීනාර් රාත්‍රියේ දිගු වේලාවක් තම රැවුල අල්ලා ගනිමින් මෙසේ ප්‍රාර්ථනා කරන්නෙකු වූහ. 'මාගේ පරමාධිපතියාණනි, නිරයේ වාසය කරන්නාගෙන් ස්වර්ගයේ වාසය කරන්නා කවුරුන්දැයි ඔබ මැනවින් දන්නෙහිය. එහෙයින් මාලික්ගේ නිවහන මෙම නිවහන් දෙකින් කවර නිවහනක් තුළ වනු ඇත් ද?'

මේ හේතුවෙන් සහාබාවරුන් හා ඔවුන්ට පසු පැමිණි දැහැමියන් තමන් ගැන කුහකත්වය සම්බන්ධයෙන් බිය වූහ.[49] ඒ ගැන වූ ඔවුන්ගේ කනස්සල්ල හා අවදානම දැඩි විය. දේව විශ්වාස වන්තයා තමන් ගැන සුළු පරිමානයේ කුහකත්වයක් තිබුණද ඒ සම්බන්ධයෙන් බිය වෙයි. අවසානයේ එය ඔහු අභිබවා ගොස් මහා කුහකත්වය වෙතට බැහැර කරනු ඇතැයි බිය වෙයි. පෙර කී පරිදි: නපුරුකමේ විෂ නපුරු අවසානයක් ගෙන දෙනු ඇත.[50]

නබි (ﷺ) තුමා තම ප්‍රාර්ථනාවෙහි අධික ලෙස මෙසේ ප්‍රාර්ථනා කර සිටියහ: 'යා මුකල්ලිබල් කුලූබ් සබ්බිත් කල්බී අලා දීනික' (අහෝ! හදවත් වෙනස් කරන්නාණනි, මාගේ හදවත ඔබේ දහම මත ස්ථාවර කරනු මැනව!) එවිට: අල්ලාහ්ගේ නබිවරයාණනි, සැබැවින්ම අපි ඔබ හා ඔබ ගෙන ආ දෑ විශ්වාස කර සිටින්නෙමු. ඔබ අප පිළිබඳවත් බිය වන්නෙහිදැ?යි විමසා සිටියේය. එවිට එතුමා: 'එසේය සැබැවින්ම හදවත අල්ලාහ්ගේ ඇඟිලි අතුරින් ඇඟිලි දෙකක් අතර පවතියි. ඔහු අභිමත කරන අයුරින් එය වෙනස් කරනු ඇත.''

49. කුහකත්වය ගැන මුතුන් මිත්තන් තුළ පැවති බිය සම්බන්ධයෙන් දීර්ග විමර්ශනයක් සඳහා 'ෆත්හුල් බාරී' (1/177) බලන්න. මෙම කෘතියෙහි ද 48 වන හදීසය සඳහා කරන ලද විග්‍රයෙහි මේ පිළිබඳ කරුණු කිහිපයක් කතෘ තුමා ද පෙන්වා දී ඇත.

50. ආචාර්ය සය්යිද් හුසෙයින් අල් අෆ්ෆානී ගේ 'සක්ෆුල් ඉබ්රාත් ෆිල් කබ්රි වල් මව්ති වස්සකරාත්' නම් කෘතිය අවසාන මොහොත පිළිබඳ මෙනෙහි කිරීමේදී වඩාත් පුළුල් හා විශිෂ්ඨ ලෙස ලියා ඇත. ඒ සම්බන්ධයෙන් එකතුවක් ඔහු එහි කර ඇති අතර එය වඩාත් ආකර්ශණීය ය. අල්ලාහ් ඔහුට යහපත් ප්‍රතිඵල පිරිනමත්වා!

අහ්මද් හා තිර්මිදී යන ඉමාම්වරු අනස් තුමා විසින් කළ මෙම වාර්තාව දන්වා ඇත.[51]

අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) කළ ප්‍රකාශයකට තමන් සවන් දුන් බව අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් ඉමාම් මුස්ලිම් මෙසේ දන්වා සිටියි. “සැබැවින්ම ආදම්ගේ දරුවන්ගේ හදවත් සියල්ල කාරුණිකයාණන්ගේ ඇඟිලි අතුරින් ඇඟිලි දෙකක් අතර පවතී. ඔහු අභිමත කරන පරිදි එය වෙනස් කරනු ඇත.” පසුව (ﷺ) තුමා මෙසේ පැවසීය. (අල්ලාහුම්ම මුසර්රිෆල් කුලූබ්, සර්රිෆ් කුලූබනා අලා තාඅතික” (අහෝ හදවත් වෙනස් කරන්නානනි, අපගේ හදවත් ඔබට යටත් වීම සඳහා වෙනස් කරනු මැනව!)[52]

මෙම අර්ථයෙන් හදීස් බොහෝමයක් වාර්තා වී ඇත.

***

51. අහ්මද් (3/122), තිර්මිදි (2140), හසන් වර්ගයට අයත් හදීසයකි. ඉබ්නු අබිල් ආස්ගේ ‘අස්සුන්නා’ නම් කෘතියට ලියන ලද විමර්ශනයේ ඉමාම් අල්බානී තුමා මෙය සහීහ් හදීසයක් බව පෙන්වා දෙයි.

52. මුස්ලිම් (2654)

## الحَدِيْثُ الخَامِسُ

## පස් වන හදීසය

عَنْ عَائِشَةَ رضي الله عنها قَالتْ: قَالَ رَسُوْلُ اللهِ ﷺ:
((مَنْ أَحْدَثَ فِيْ اَمْرِنَا هذَا مَا لَيْسَ مِنْهُ، فَهُوَ رَدٌّ))
رَوَاهُ البُخَارِيُّ وَمُسْلِمٌ
وَفِيْ رِوَايَةٍ لمُسْلِمٍ: ((مَنْ عَمِلَ عَمَلاً لَيْسَ عَلَيْهِ أَمْرُنَا، فَهُوَ ردٌّ)).

අල්ලාහ්ගේ දූතයාණන් ප්‍රකාශ කළ බව ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය මෙසේ වාර්තා කරයි.

"කවරෙකු අපගේ කටයුතුවල එහි නොමැති යමක් අලුතින් බිහි කරන්නේද එය ප්‍රතික්ෂේප කරන ලද්දකි."

ඉමාම් බුහාරි හා මුස්ලිම් මෙම හදීසය දන්වා ඇත.

ඉමාම් මුස්ලිම් සතු වාර්තාවක:

"කවරෙකු අපගේ කරුණක් නොවන යම් ක්‍රියාවක් සිදු කරන්නේද එය ප්‍රතික්ෂේප කරන ලද්දකි."

***

### -විග්‍රහය-

මෙම හදීසය ඉස්ලාමයේ මූලධර්මයන් අතුරින් ප්‍රධානතම මූලධාර්මික හදීසයකි. "සියලු ක්‍රියාවන් චේතානවන් අනුව පිහිටනු ඇත" යන හදීසය ක්‍රියාවන් සඳහා වූ අභ්‍යන්තරයේ පිහිටන නිර්ණායක් ලෙස පවතිනවාක් මෙන් මෙය ද ක්‍රියාවන් සඳහා වූ මතුපිටින් පිහිටන නිර්ණායකයක් ලෙස පවතී.

අල්ලාහ්ගේ තෘප්තිය අපේක්ෂා නොකර සිදු කරන සෑම ක්‍රියාවකින්ම එය සිදු කරන්නා හට කුසල් හිමි වන්නේ නැත. එමෙන්ම අල්ලාහ්ගේ හා ඔහුගේ

දූතයාණන්ගේ නියෝගය මත පදනම් නොවුනු සෑම ක්‍රියාවක්ම ප්‍රතික්ෂේප කරනු ලබන්නක් වන්නේය. අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් කවර කරුණක් සඳහා අනුමැතිය නොදුන්නේද එවැන්නක් දහම තුළ අලුතින් ඇති කරන සෑම කෙනෙකුටම දහම තුළ කිසිදු ඉඩක් නොලැබේ.

අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) තුමා තම දේශනයකදී "සැබැවින්ම කතාවෙන් වඩාත් නිවැරදි වනුයේ අල්ලාහ්ගේ ග්‍රන්ථයයි. මගපෙන්වීමෙන් වඩාත් ශ්‍රේෂ්ඨ වනුයේ මුහම්මද්ගේ මග පෙන්වීමයි. කරුණුවලින් වඩාත් නපුරු වනුයේ ඒවායින් අලුතින් ඇති කරනු ලැබූ ඒවායි."[53] යනුවෙන් පවසා සිටියහ. ඉර්බාල් ඉබ්නු සාරියා[54] විසින් වාර්තා කරනු ලැබූ හදීසය පිළිබඳ විස්තර කිරීමේදී අලුතින් බිහිකරන දෑ පිළිබඳ කතාව පසුව දන්වා සිටින්නෙමු. මෙහිදී අපි සාකච්ඡාවට බඳුන් කරනුයේ ආගමානුගත කරන්නාගේ කරුණක් නොවන පිළිවෙත් පිළිබඳව හා එය ප්‍රතික්ෂේප කරනු ලැබීම පිළිබඳවය.

ආගමානු ගත කරන්නාගේ නියෝගයක් නොමැති සෑම ක්‍රියාවක්ම[55] ප්‍රතික්ෂේප කරනු ලබන්නක් බව මෙම හදීසය වාචිකව පෙන්වා දෙන අතර ඔහුගේ නියෝගය ඇති සෑම ක්‍රියාවක්ම ප්‍රතික්ෂේප කරනු නොලබන්නක් බව අවබෝධාත්මක ලෙසින් පෙන්වා දෙන්නේය.

මෙහිදී ඔහුගේ නියෝගය යනුවෙන් අදහස් කරනුයේ: ඔහුගේ දහම හා ඔහුගේ පිළිවෙත යන්නයි.

***

'අපගේ කටයුත්තක් නොවන යම් ක්‍රියාවක්...' යන සල්ලල්ලාහු අලයිහි වසල්ම් තුමාගේ ප්‍රකාශය වනාහි:

---

53. මුස්ලිම් (867)

54. එනම් 'අලුතින් බිහි කරනු ලබන කරුණු පිළිබඳ නුඹලා අවවාදයෙන් සිටිය යුතුයි' යන සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමාගේ හදීසය සඳහන් කරන අවස්ථාවේදීය. එය මෙම කෘතියේ විසි අටවන හදීසයයි.

55. ඉන් අදහස් කරනුයේ: 'ඇඳුම් පැළඳුම් යාන වාහන ගෙවල් දොරවල් වැනි ලෞකික කටයුතුවලදී නොව ආගමික නැමදුම් හා බැඳුණු කටයුතුවල දීය' යන්නයි. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්තරීෆී)

ආගමික යුතුකම් වල නිරතවන්නන්ගේ ආගමික කටයුතු සියල්ලම ෂරීආ හෙවත් ආගමික නීතිරීති යටතේ පිහිටිය යුතු බවත් ආගමික නීතිරීති ඒවායෙහි නියෝග හා තහනම් කළ දෑ අනුගමනය කරමින් ක්‍රියාත්මක විය යුත්තක් බවත් පෙන්වා දෙන්නේය. කවරෙකුගේ ක්‍රියාවන් ෂරීආ නීතිරීති යටතේ ක්‍රියාත්මක වෙමින් එයට අනුකූලව පිහිටන්නේද එය පිළිගනු ලබන්නක් වන්නේය. එය එයින් බැහැර වූවක් ලෙස පිහිටන්නේ නම් එය ප්‍රතික්ෂේප කරනු ලබන්නක් වන්නේය.

ක්‍රියාවන් කොටස් දෙකකට බෙදේ. එනම් වත්පිළිවෙත් හා ගනුදෙනු වශයෙනි.

වත්පිළිවෙත් වනාහි: අල්ලාහ්ගේ හා ඔහුගේ දූතයාණන්ගේ නීතියෙන් බැහැර වූ පිළිවෙතක් ඉටු කරන්නේ නම් එසේ ඉටු කරන්නා වෙත පෙරළා දෙනු ලබනු ඇත. (ප්‍රතික්ෂේප කරනු ලැබේ.) එය ඉටු කරන්නා අල්ලාහ්ගේ ප්‍රකාශය යටතට ඇතුළත් වේ. එනම් “එසේ නැතහොත් අල්ලාහ් කවර දෙයක් පිළිබඳව අනුමැතිය ලබා නොදුන්නේ ද එවැන්නක් දහමෙහි පිළිවෙතක් බවට පත් කරන හවුල්කරුවන් ඔවුනට වෙත් ද?...” (සූරා අෂ්-ෂූරා: 21)

එහෙයින් කවරෙකු අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් නොතැබූ ක්‍රියාවක් ඉටු කිරීම තුළින් අල්ලාහ් වෙත සමීප වන්නට කටයුතු කරන්නේද ඔහුගේ එම ක්‍රියාව ප්‍රතික්ෂේප කරනු ලබන්නක් මෙන්ම නිෂ්ඵල ක්‍රියාවක් වන්නේය. එය මස්ජිදයේ අත්පුඩි ගසමින් විසිල් ගසමින් තම සලාතය ඉටු කරන්නන්ගේ තත්ත්වයට සමාන වන්නේය.

මෙය, අනවශ්‍ය දැයට සවන් දෙමින් නර්තනයේ යෙදිමින් ඉහ්රාම් නොවන තත්ත්වයේ හිස නිරාවරණය කරමින් අල්ලාහ් වෙත සමීප වන්නෙකු මෙනිය.

පොදුවේ පිළිවෙතක් තුළින් සමීප කරවන්නක් ඒ හැර වෙනත් කටයුත්තකින් සමීප කරවන්නේ නැත. හිරු එළියේ සිටගෙන සිටින මිනිසෙකු නබි (ﷺ) තුමාණෝ දුටුහ. එතුමා ඒ ගැන විමසූහ. එවිට සැබැවින්ම තමන් වාඩි නොවන බවටත් සිටගෙන සිටින බවටත් හෙවණ නොලබන බවටත් උපවාසයේ නිරත වන බවටත් භාරයක් තබා ඇත්තේ යැයි කියනු ලැබීය. එවිට නබි (ﷺ) තුමාණෝ ඔහුට වාඩි වන මෙන්ද හෙවණ ලබන මෙන්ද ඔහුගේ උපවාසය

පූර්ණ කරන මෙන්ද ඔහුට අණ කර සිටියහ. ඔහු එසේ සිටගෙන සිටීම හා හිරුට නිරාවරණය වී සිටීම යන කරුණු දෙක භාරයක් වශයෙන් ඉටු කර අල්ලාහ් වෙත සමීප වන්නට තබා නැත. නමුත් සලාතය, අදානය, අරෆාවෙහි ප්‍රාර්ථාව වැනි වෙනත් ස්ථානවල එසේ නැගිට සිටීම නැමදුමක් වන්නේය. එමෙන්ම ඉහ්රාම් ඇදගත් කෙනෙකු දේව සමීපය සඳහා හිරුට නිරාවරණය වෙයි. එක් ස්ථානයක සමීප වීම සඳහා ඇති කරුණක් අනෙකුත් සියලුම ස්ථානවල එසේ සමීප වන්නට පිහිටන්නේ නැති බව මෙය පෙන්වා දෙයි. ඒවා පිළිපදිනු ලබන්නේ ෂරීආවේ සඳහන්ව ඇති ස්ථානවල පමණය.

උත්සව දිනයේ උපවාසයේ නිරත වන්නෙක්, තහනම් කරනු ලැබූ වේලාවක සලාතය ඉටු කරන්නෙක් මෙන් විශේෂයෙන් තහනම් කරන ලද පිළිවෙතක් තුළින් එසේ සමීප වන්නට බලන්නා ද එලෙසමය.

කවරෙකු මූලික වශයෙන් ආගමානුගත කරනු ලැබූ සමීපතාව ඇති කරනු ලබන පිළිවෙතක් ඉටු කර පසුව ආගමානුගත කරනු නොලැබූ දෙයක් එහි ඇතුළත් කළේ නම් හෝ ආගමානුගත කරනු ලැබූවක් තුළින් එහි විකෘතිභාවයක් ඇති කරන්නේ නම් හෝ එයද ෂරීආ නීතියට පටහැනිය. එය කවර කරුණක් මගින් උල්ලංඝණය කරනු ලබන්නේද එවැන්නකින් උල්ලංගණය කිරීමේ තරම්ම හෝ එහි ඇතුළත් නොකළ යුතු දැයක් ඇතුළත් කිරීමේ තරම්ම පටහැනි වේ.

***

## الحَدِيْثُ السَّادِسُ

## හය වන හදීසය

عَنِ النُّعْمَانِ بْنِ بَشِيرٍ رَضِـيَ اللهُ عَنْهُ قَالَ : سَمِعْتُ رَسُولَ اللهِ ﷺ ، يَقُولُ

((إِنَّ الْحَلَالَ بَيِّنٌ ، وَإِنَّ الْحَرَامَ بَيِّنٌ ، وَبَيْنَهُمَا أُمُوْرٌ مُشْتَبِهَاتٌ لَا يَعْلَمُهُنَّ كَثِيرٌ مِنَ النَّاسِ ، فَمَنِ اتَّقَى الشُّبُهَاتِ اسْتَبْرَأَ لِدِينِهِ ، وَعِرْضِهِ ، وَمَنْ وَقَعَ فِي الشُّبُهَاتِ وَقَعَ فِي الْحَرَامِ ، كَالرَّاعِي يَرْعَى حَوْلَ الْحِمَى ، يُوشِكُ أَنْ يَرْتَعَ فِيهِ.

أَلَا وَإِنَّ لِكُلِّ مَلِكٍ حِمًى ، أَلَا وَإِنَّ حِمَى اللهِ مَحَارِمُهُ ، أَلَا وَإِنَّ فِي الْجَسَدِ مُضْغَةً ، إِذَا صَلَحَتْ ، صَلَحَ الْجَسَدُ كُلُّهُ ، وَإِذَا فَسَدَتْ ، فَسَدَ الْجَسَدُ كُلُّهُ ، أَلَا وَهِيَ الْقَلْبُ .

رَوَاهُ البُخَارِيُّ وَمُسْلِمٌ

අල්ලාහ්ගේ දූතයාණන් කළ ප්‍රකාශයකට තමන් සවන් දුන් බවට නුඃමාන් ඉබ්නු බෂීර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

"නියත වශයෙන්ම හලාල් (හෙවත් අනුමත දෑ) ඉතා පැහැදිලිය. එමෙන්ම හරාම් (හෙවත් තහනම් දෑ) ද ඉතා පැහැදිලිය. ඒ දෙක අතර සැක සහිත කරුණු ද ඇත. ජනයා අතුරින් බහුතරයක් දෙනා ඒවා ගැන නොදනිති. එහෙයින් කවරෙකු සැක සහිත දැයින් වැළකී සිටින්නේද ඔහු තම දහම තම මානය වෙනුවෙන් නිදොස් විය. නමුත් කවරෙකු එම සැක සහිත දෑහි වැටෙන්නේද ඔහු හරාම් හි වැටුණේය. එය වැටක් අවට සිට කලබලයෙන් වැට පනින්නට තැත් කරන එළුවන් දක්කන එඬේරුවකු මෙනි.

දැනගන්න. සෑම රජවරයකුටම වැටක් ඇත.

දැන ගන්න. අල්ලාහ්ගේ වැට වනුයේ ඔහු තහනම් කළ දෑය.

දැන ගන්න. සැබැවින්ම ශරීරය තුළ මස් කැබැල්ලක් ඇත. එය විධිමත් වූ විට ශරීරය මුළුමණින්ම විධිමත් වනු ඇත. එය විනාශ වූ විට ශරීරය මුළුමණින්ම විනාශ වී යනු ඇත.

දැන ගන්න. එයයි හදවත.

ඉමාම් බුහාරි හා මුස්ලිම් මෙම හදීසය දන්වා ඇත.

***

## -විග්‍රහය-

“හලාල් (හෙවත් අනුමත දෑ) ඉතා පැහැදිලිය. එමෙන්ම හරාම් (හෙවත් තහනම් දෑ) ද ඉතා පැහැදිලිය. ඒ දෙක අතර සැක සහිත කරුණු ද ඇත. ජනයා අතුරින් බහුතරයක් දෙනා ඒවා ගැන නොදනිති” යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

එහි අර්ථය වනුයේ: සැබැවින්ම ශුද්ධ අනුමත දෑ ඉතා පැහැදිලිය. එහි කිසිදු සැකයක් නැත. එමෙන්ම ශුද්ධ තහනම් දෑ ද එලෙසමය. නමුත් එම කරුණු දෙක අතර එය හලාල් ද එසේ නැතිනම් හරාම් ද යන්න පිළිබඳව මිනිසුන් බහුතරයක් තුළ සැක ඇති කරන දෑ ද ඇත. ගැඹුරු දැනුමක් ඇත්තවුන්හට ඒ ගැන සැකයක් නැත. පැති දෙකින් කවර පැත්තකට එය අයත් දැයි ඔවුහු දනිති.

ශුද්ධ හලාල් හෙවත් ශුද්ධ අනුමත දෑ වනාහි: පිවිතුරු බවභෝග, පළතුරු හා ගොවිපළ සතුන් අනුභවය, මිහිරි පානයන් පානය, තමන්ට අවශ්‍ය කපු හා ලිනන් හෝ ලෝම රෙදි ඇඳීම, විවාහ කර ගැනීම, ආභරණ පැළඳීම හා වෙනත් දෑ ඒ සඳහා වූ උදාහරණ කිහිපයකි. එමෙන්ම ව්‍යාපාරය හෝ දේපළ උරුමය හෝ ත්‍යාගය හෝ යුද්ධයේදී සතුරා දමා ගිය භාණ්ඩ වැනි ඔහු උපයාගත් දෑ නිත්‍යානුකූල ගිවිසුමකින් සිදු වී ඇත් නම් එය ද හලාල් වේ.

ශුද්ධ හරාම් හෙවත් ශුද්ධ තහනම් දෑ වනාහි: මියගිය සතුන්, රුධිරය හා ශූකර මාංශ අනුභවය, මධ්‍යසාර පානය, තහනම් කරනු ලැබූ අය විවාහ කර ගැනීම, පිරිමි සේද රෙදි ඇඳීම යනාදිය ඒ සඳහා වූ උදාහරණ කිහිපයකි. එමෙන්ම පොළිය, සූදුව, විකිණීමට සුදුසු නොවන දෙයක් විකුණා ලබන ලාබය, සොරකමකින් හෝ පැහැර ගැනීමකින් හෝ අල්ලසකින් හෝ වෙනත් වංචා සහගත අයුරින් සම්පත් අත්පත් කර ගැනීම වැනි තහනම් කරනු ලැබූ ඉපැයීමත් තහනම් වේ.

සැකසහිත දෑ වනාහි: යමක් අනුමත කර ඇත්තේ ද නැතහොත් තහනම් කර ඇත්තේ ද යන මතභේදයට තුඩු දෙන ඇතැම් සැක උපදවන කරුණුය. සැලකිය යුතු එම කරුණු අතුරින්: අශ්වයා, පෝනියා, බූරුවා හා තලගොයා වැනි සතුන් ආහාරයට ගැනීම, තහනම් දැයි විද්වතුන් අතර මතභේද ඇති අධික ලෙස ගැනීමෙන් මත් බව ඇති කරන යුෂ වර්ග පානය කිරීම, මෘග සතුන් හෝ එවන් වෙනත් සතුන්ගේ හම්වලින් නිමකළ ඇඳුම් අතර අනුමත කර තිබෙන්නේදැයි සැක උපදවන දෑ ඇඳීම ඉන් කිහිපයකි. එමෙන්ම මතභේදයට තුඩු දුන් ඉපැයීම් මාර්ග වනුයේ: අල් ඊනා[56] හා අත්-තවර්රුක්[57] වැනි ව්‍යාපාර ගනු දෙනු වල ඇතිවන ගැටලු වැනි දෑය. මෙම අර්ථයට සමාන ව මුෂ්තබිහාත් හෙවත් සැකයට තුඩු දුන් කාරණාවන් පිළිබඳ ඉමාම් අහ්මද් හා ඉමාම් ඉස්හාක් ඇතුළු වෙනත් ඉමාම්වරු විසින්ද විග්‍රහ කර ඇත්තේය.[58]

සමස්තයක් ලෙස බැලූ විට: සැබැවින්ම අල්ලාහ් තම නබිවරයාණන් හට අල් කුර්ආනය පහළ කළේය. එහි ජනතාවට අවශ්‍ය අනුමත දෑ හා තහනම් දෑ

56. අල්-ඊනා: නියමිත කාලයක් දක්වා නියමිත වටිනාකමක් සහිත භාණ්ඩයක් විකුණා පසුව එය මිලදී ගත් අයගෙන් කාලයක් ඔහු සන්තකයේ තිබූ හේතුවෙන් අඩු මිලකට නැවත මිලදී ගැනීම.

57. අත් තවර්රුක්: මිලදී ගන්නා නියමිත කාලයක් දක්වා මුදල් ලබා දීම ප්‍රමාද කොට භාණ්ඩයක් ලබා වෙනත් කෙනෙකුට අත්පිට මුදලට විකුණා මුදල් ගැනීම.

58. පොදුවේ සැකයට තුඩු දෙන දෑ ෂරීආවේ දකින්නට නොමැත. එසේ සැකයට තුඩු දෙනුයේ එකතු කිරීමක් වශයෙනි. කිසිවකු ළඟ සැකයට තුඩු දෙන කරුණක් තිබුණ ද එය තවත් කෙනෙකු ළඟ ක්‍රියාත්මක වන්නකි. සැබැවින්ම සැකය ඇති කරන දැයක් බව සිතන පොදු දෑ එය තහවුරු කිරීමේදී ඇතැම් විද්වතුන් අබියස නිත්‍යානුකූල වන්නේය. එසේ නැතහොත් ඉස්ලාමය නීතිගත කළ දෙයක් හෝ ආගමික වගකීමක් හෝ නොවන්නේය. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්තරීෆි)

පැහැදිළි කළේය. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: 'සෑම දෙයක්ම පැහැදිලි කරමින් අපි දේව ග්‍රන්ථය ඔබ වෙත පහළ කළෙමු.' (සූරාහ් අන් නහ්ල් 89), මෙය විස්තර කරමින් ඉමාම් මුජාහිද් ඇතුළුව තවත් ඉමාම්වරු 'අණ කරනු ලැබූ හා තහනම් කරනු ලැබූ සෑම දෙයක්ම' යන්න පවසා සිටිති. මුදල් හා ද්‍රව්‍ය වෙළඳාම පිළිබඳ නීතිරීති බොහෝමයක් පැහැදිලි කරමින් සූරා අන්නිසාවෙහි අවසානයේ අල්ලාහ් මෙසේ අවධාරණය කරයි: "නුඹලා නොමග නොයනු පිණිස අල්ලාහ් නුඹලාට පැහැදිලි කරයි. තවද අල්ලාහ් සියලු දෑ පිළිබඳව සර්වඥය." (සූරා අන්-නිසා 176) දූතයාණන් (ﷺ) වෙත අල් කුර්ආනය පහළ කිරීමෙන් එයට ආවේනික කරුණු ජනතාවට පැහැදිලි කිරීමේ වගකීම අල්ලාහ් පවරා ඇත්තේය. "අපි ඔබ වෙත මෙම මෙනෙහි කිරීම පහළ කළෙමු. කවර දෙයක් ඔවුන් වෙත පහළ කරනු ලැබුවේ ද එය ජනතාවට ඔබ පැහැදිළි කරනු පිණිසය. (සූරා අන්-නහ්ල්: 44) නබි (ﷺ) තුමාට හා ඔහුගේ සමූහයාට දහම මුළුමණින්ම පැහැදිලි කරන තෙක් එතුමාගේ ප්‍රාණය අත්පත් කර ගනු නොලැබීය. එතුමාණන් මරණයට පත්වීමට ටික කලකට පෙර ඒ බව දැනුවත් කර දේව වාක්‍ය පහළ කර සිටියේ මෙලෙසිනි: "අද දින නුඹලා වෙනුවෙන් නුඹලාගේ දහම මම පූර්ණවත් කළෙමි. මාගේ ආශිර්වාදයන් ද නුඹලා වෙත මම සම්පූර්ණ කළෙමි. නුඹලා වෙනුවෙන් වූ දහම ලෙස ඉස්ලාමය මම පිළිගත්තෙමි" (සූරා අල් මාඉදා:3)

නබි (ﷺ) තුමා මෙසේ අවධාරණය කළහ: "මම නුඹලාව පිරිසිදු සුදුවන් දෑ මත අතහැර යමි. එහි රාත්‍රිය ද එහි දහවල මෙන් පවතී. විනාශ වී යන්නෙකු මිස එයට බාධාවක් විය නොහැක"[59] අබූ දර් තුමා මෙසේ පවසයි: "අල්ලාහ්ගේ දූතයාණන් මරණයට පත් විය. අහසේ තම පියාපත් ගසමින් පියාසර කර කුරුල්ලෙකු ගැන වුවද එතුමා ඒ ගැන දැනුම අප වෙත දන්වා සිටියහ."[60]

ඉමාම් අහ්මද් 'අෂ්ෂුබ්හා'-සැක සහිත දෑ- පිළිබඳ මෙසේ විස්තර කරයි: සැබැවින්ම එය හලාල් හා හරාම් අතර ඇති තත්ත්වයයි. -එනම් ශුද්ධ අනුමත

59. අහ්මද් (4/126), ඉබ්නු මාජා (43) ෂෙය්ක් අල්බානී තුමා සහීහ් ඉබ්නු මාජාහි සඳහන් ඉර්බාල් ඉබ්නු සාරියා විසින් වාර්තා කළ හදීසය සහීහ් ගණයට අයත් බව දන්වා සිටියි.

60. අහ්මද් (5/153) මෙය අබූ දර් විසින් වාර්තා කරන ලද හදීසයකි. එමෙන්ම මෙහි වාර්තා සම්බන්ධතාව විසන්දි වී ගිය මුන්කතිඃ ගණයට අයත්ය.

දෑ හා ශුද්ධ තහනම් කළ දෑ අතර- එතුමා තවදුරටත්: කවරෙකු එයින් ආරක්ෂා වන්නේද ඔහුගේ දහමෙහි ඔහු ආරක්ෂා විය. යැයි පවසා ඇත්තේය. ඒ ගැන පැහැදිලි කරන තවත් අවස්ථාවක: හලාල් හා හරාම් මිශ්‍රවීමෙන් ඇතිවන්නකි යැයි සඳහන් කර ඇත. ඒ අනුව එය මෙසේ වර්ගී කරණයට පත් වේ. හලාල් හා හරාම් යන දෙකම මිශ්‍ර වූ තම ධනයේ ගනුදෙනු වනාහි, එම ධනයෙන් වැඩි කොටසක් හරාම් වූයේ නම් ඉමාම් අහ්මද් පවසනුයේ: එය සුළු වශයෙන් හෝ හඳුනාගත නොහැකි ප්‍රමාණයකින් හෝ වී නම් මිස එයින් වැළකී සිටිය යුතු බවය. එම ධනයෙන් වැඩි කොටසක් හලාල් වූයේ නම් එය ගනුදෙනු කිරීමටත්, එයින් අනුභව කිරීමටත් අනුමැතිය ඇත. නමුත් එම කරුණ පිළිබඳ සැකයක් ඇති වූ විට, එය සැක සහිත කරුණක් වන බැවින් එය අතහැර දැමීම දේව භක්තියට වඩාත් සුදුසුය.

තම ධනයේ හරාම් ඇති බවට හඳුනා ගත් අයකු සැබැවින්ම එය නිශ්චිත ලෙස හරාම් යැයි හඳුනා නොගන්නා තෙක් මුල් කාලීන විද්වතුන් පිරිසක් ඒ සඳහා අනුමැතිය ලබා දී ඇත. ඉබ්නු මස්ඌද් තුමා විසින් වාර්තා කළ සහීහ් හදීසයක සඳහන් පරිදි 'ප්‍රසිද්ධියේම පොළියෙන් අනුභව කරන කිලිටි මුදල් ඉපැයීමට ලැජ්ජා නොවන අසල් වැසියෙකු සංග්‍රහයක් සඳහා තමන්ව ඇරයුම් කර සිටියි. එවැන්නෙකු පිළිබඳ විමසනු ලැබීය. එවිට එතුමා: 'නුඹලා ඔහුට පිළිතුරු දෙනු. සැබැවින්ම (එය) නුඹලා වෙනුවෙන් පිලිගන්වනු ලබන්නකි. එහි පව්බර ඔහු සතු වන්නේය' යැයි පවසා සිටියේය.

ඉබ්නු මස්ඌද් තුමා විසින් වාර්තා කරන ලද මෙම හයදීසය ඉමාම් අහ්මද් සහීහ් හදීසයක් බව අවධාරණය කර තිබුණ ද ඔහු විසින් වාර්තා කර ඇති "පාපය යනු සිත් තුළ කොඳුරණ කරුණකි' යන ප්‍රකාශය ඊට පටහැනිව පිහිටා ඇත.

නිශ්චිත භාණ්ඩයක් හරාම් යැයි දැන ගන්නට ලැබුණ අවස්ථාවේ එය හරාම් යන මුහුණුවරින් ගනු ලැබේ. එහෙයින් ඒ සමග කටයුතු කිරීම ද හරාම්ය. එය විද්වතුන්ගේ ඒකමතික තීරණයකි යනුවෙන් ඉබ්නු අබ්දුල් බර් හා වෙනත් අයද සඳහන් කර ඇත.

පොළියෙන් හා සූදුවෙන් ණය ගෙවන මිනිසෙකු පිළිබඳවත් ඉබ්නු සීරීන් විසින් වාර්තා කරන ලද ප්‍රකාශයක "ඔහු ගැන වරදක් නැත." යැයි පවසා

සිටියේය. මෙය නිවැරදි වාර්තා සම්බන්ධතාවකින් යුතුව අල්-හල්ලාල් විසින් දන්වා ඇත.

“ජනයා අතුරින් බහුතරයක් දෙනා ඒවා ගැන නොදනිති. එහෙයින් කවරෙකු සැක සහිත දැයින් වැළකී සිටින්නේද ඔහු තම දහම තම මානය වෙනුවෙන් නිදොස් විය. නමුත් කවරෙකු එම සැක සහිත දෑහි වැටෙන්නේද ඔහු හරාම් හි වැටුණේය.” යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

සැකසහිත කරුණු සම්බන්ධයෙන් ජනයා කොටස් දෙකකට බෙදේ.

පළමුවැනි කොටසට අයත් වූවන් වනාහි: තමන්ට ඒ ගැන සැක පහළ වන බැවින් එවන් සැක සහිත දැයින් වැළකෙන්නන් වෙති. තම දහම හා මානය වෙනුවෙන් නිදොස් වූවෝ ඔවුහුය.[61]

නිදොස් වීම යන අර්ථය ලබා දී ඇත්තේ ‘ඉස්තබ්රඅ’ යන පදයටයි. එහි අදහස වනුයේ තම දහම හා මානය වෙනුවෙන් අඩු පාඩු වලින් නිදොස් භාවය පැතීමය. සැබැවින්ම කවරෙකු සැක සහිත කරුණක් සිදු කරන්නේ ද සැබැවින්ම එය ඔහුට දොස් නැගීමක් හා අපහාසයක් ඇති කරන බව මෙහි පෙන්වා දී ඇත. මුල්කාලීන ඇතැම් විද්වතුන් මෙසේ පවසා ඇත: “කවුරුන් හෝ චෝදනාවලට නිරාවරණය වුවහොත් ඔහු පිළිබඳ වැරදි ලෙස සිතූ අයට දොස් නොකිව යුතුයි.”

දෙවන කොටසට අයත් වූවන් වනාහි: තමන් ඉදිරියේ යමක් සැක සහිත දෙයක් බවට පත් වී තිබුණු පසුවත් එම සැකයෙහි වැටෙන්නන් වෙති. සැබැවින්ම නබි (ﷺ) තුමා දන්වා සිටියේ ‘ඔහු හරාම් හි වැටී ඇති බවය. මෙය අර්ත දෙකකින් විග්‍රහ වේ.

61. චේතනාවකින් යුතුව මිස කිසිවකු යමක් අතහැරීම සඳහා කුසල් පිරිනමනු නොලබන තත්ත්වයක තහනම් කරනු ලැබූ දෑ හා සැකසහිත දෑ දොස් නගනු ලැබීමට බියෙන් අතහැර දැමීම සුදුසු යැයි මෙහි පෙන්වා දෙයි. තහනම් කරනු ලැබූ දෑ අතහැර දමන ලෙස ඒ ගැන උපදෙස් දීමට මිනිසා තුළ සාමාන්‍ය නීතිය බලවත් වන්නේ නම් එහි වරදක් නැත. නමුත් ආගමික වත් පිළිවෙත් තුළ සාමාන්‍ය නීතිය බැඳී තිබුණද එහිදී ආගමික නීතිය අවශ්‍ය වන්නේය. එසේ සාමාන්‍ය නීතිය බැඳී පවතීම වරදක් නැත. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්-තරීෆී)

පළමුවැන්න: - තමන් ඉදිරියේ යමක් සැක සහිත දෙයක් බවට පත් වී තිබුණු පසුවත් - එම සැකය සමගම කටයුතු කිරීම වනාහි කෙමෙන් හරාම් දෑ සිදු කිරීමට සාධකයක් ලෙස පත් වීම.

දෙවැන්න: තමන් ඉදිරියේ ඇති සැක සහිත කටයුත්තක් එය හලාල් ද නැතහොත් හරාම් ද යන්න වග නොදැන ඒ වෙත මුලපුරන්නා. ඔහු අදාළ කටයුත්තෙහි හරාම් තත්ත්වයට පත්වීම පිළිබඳ අනාරක්ෂිත වන අතර පසුව එය හරාමයට සාපේක්ෂව පිහිටයි. සැබැවින්ම ඔහු එය හරාම් බව නොදනී.

සැක සහිත දෙයක් ලෙස ජනයා අනුමාන කරන යම් කරුණක් එය හලාල් බව දැනගෙන කවරෙකු එය සිදු කරන්නේ ද එහි වරදක් නැත. නමුත් ඒ පිළිබඳ ජනතාව ඔහුට දොස් පවරනු ඇතැයි බිය වූ විට ඒ අවස්ථාවේ තමන්ගේ මානය ආරක්ෂා කරනු පිණිස එය අතහැර දැමීම යහපත් වන්නේය. එය නබි (ﷺ) තුමාණන් සෆිය්යා සමග සිටිනු දුටු අයකුට ‘සැබැවින්ම ඇය හුයෙයිගේ දියණිය සෆිය්යාය’ යැයි එතුමා පවසා සිටියාක් මෙනි.[62]

අනස් (රළියල්ලාහු අන්හු) තුමා ජුමුආ සලාතය සඳහා පිටත්ව ගියේය. එවිට ජනයා සලාතය ඉටු කර නැවත හැරී යනු එතුමා දුටුවේය. එතුමා ලැජ්ජාවට පත්ව ජනයා නොදකින තැනකට මුවා වී මෙසේ පැවසීය ‘‘කවරෙකුට ජනයාට ලැජ්ජා නොවන්නේ ද ඔහු අල්ලාහ්ට ලැජ්ජා නොවන්නේය’’[63]

***

‘‘එය වැටක් අවට සිට කලබලයෙන් වැට පනින්නට තැත් කරන එළුවන් දක්කන එඬේරුවකු මෙනි. දැනගන්න. සෑම රජවරයකුටම වැටක් ඇත. දැන ගන්න. අල්ලාහ්ගේ වැට වනුයේ ඔහු තහනම් කළ දෑය’’ යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

62. බුහාරි (2035), මුස්ලිම් (2175).

63. ඉමාම් තබ්රානී ‘අල් අව්සත්’හි (8/87), ඉමාම් අල් හයිස්මී ‘අල් මජ්මඃ’හි (8/17), ‘එහි වාර්තා සබැඳියෙහි සිටින පිරිස පිළිබඳ මම නොදනිමි’ යැයි ද සඳහන් ව ඇත.

මෙය සැක කටයුතුවල වැටෙන්නන් හට නබි (ﷺ) තුමා ඉදිරිපත් කළ උදාහරණයකි. සැබැවින්ම ඔහු ශුද්ධ හරාමයේ වැටෙන්නට සමීපව ඇතැයි අවධාරණය කරයි. තහනම් කරනු ලැබූ දැට උපමාවක් ලෙස තමන් වෙත වෙනත් අය සමීප වීමෙන් වැළැක් වීම පිණිස රජවරුන් විසින් ආරක්ෂාව සඳහා ඉදි කරනු ලබන වැටකට නබි (ﷺ) තුමාණන් උපමා කර පෙන්වීය. අල්ලාහ් මෙම තහනම් කරනු ලැබූ දෑ ආරක්ෂා කරන්නේය. තම ගැත්තන් ඒ වෙත සමීප වීමෙන් වළක්වන්නේය. වැට අවට එළවන් දක්කාගෙන යන්නන් පිවිසීමට තැත් කර එතුළට පිවිසීමෙන් වැළැක්වීම සඳහා බාධකයක් ඔහු ඇති කළේය. අනුමත දෑ අබිබවා ගොස් සැක සහිත දෑහි වැටෙන්නා ද එලෙසමය. එවිට සැබැවින්ම ඔහු හරාම් කටයුත්තක් සඳහා ඉතා කිට්ටුවෙන්ම සමීප වී ඇත. එය ඔහුට නිර්මාණ කර දෙනුයේ ශුද්ධ තහනම් දෑ සමග මුසු වී එහි වැටීමය. මෙහි 'තහනම් දැයින් දුරස් වීමේ අවශ්‍යතාව හා මිනිසා තමන් අතර සහ ඒවා අතර බාධකයක් තබා ගැනීමේ අවශ්‍යතාව පෙන්වා දෙන්නේය.

නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බවට අබ්දුල්ලාහ් ඉබ්නු යසීද් තුමා විසින් වාර්තා කළ හදීසයක් ඉමාම් තිර්මිදි හා ඉබ්නු මාජා මෙසේ වාර්තා කරති. "ගැත්තා කමක් ඇතැයි සිතන දැයින් අරක්ෂා වනු පිණිස කමක් නැතැයි සිතන දෑ අතහැර දමන තෙක් ඔහු භක්තිමත් අය අතරට ළඟා නොවන්නේමය."[64]

හසන් තුමා මෙසේ ප්‍රකාශ කරයි.: 'හරාමයට බිය වී වැඩි හරියක් හලාල් අතහරින තෙක් බැතිමතුන්ගේ භක්තිමත්භාවය අඛණ්ඩව පවතී.'

64. තිර්මිදි(2451), ඉබ්නු මාජා (4215) - සහාබිවරයකු වූ අතිය්යා අස්සඃදිය්යා විසින්- මෙහි සඳහන් වාර්තා සම්බන්ධතාව දුර්වලය.

මෙහිදී කතෘවරයා අතිය්යා අස්-සඃදිය්යා විසින් දන්වා ඇති වාර්තාව හරහා මෙම හදීසය ප්‍රකාශ නොකර, අබ්දුල්ලාහ් ඉබ්නු යසීද්ගේ වාර්තාවෙන් ප්‍රකාශ කර ඇත්තේ හදීසය දුර්වල බව පැහැදිලි කිරීමටය. අබ්දුල්ලාහ් ඉබ්නු යසීද් නම් වාර්තාකරු දුර්වලයකි. නමුත් ඉමාම් අහ්මද් මෙම හදීස් ගොතන ලැබූ බව ප්‍රකාශ කරන අතරම ඉමාම් ජොස්ජානී 'මෙම හදීස් මුන්කර් ගණයට අයත් බව ප්‍රකාශ කරයි. වැඩි විස්තර සඳහා ඉමාම් සහබිගේ 'මීසාන් අල් ඉඃතිදාල්' (2/526) බලන්න. තවත් කරුණක් වනුයේ: මේ එකම හදීසයේ හැර 'අල්කුතුබුස් සිත්තා' නම් හදීස් ග්‍රන්ථ හයේ අබ්දුල්ලාහ් ඉබ්නු යසීද් පිළිබඳ කිසිදු සඳහනක් නොමැති වීමය. වැඩි විස්තර සඳහා ඉමාම් මිස්සිගේ 'තහ්සීබුල් කමාල්' (16/319) බලන්න. සියල්ල මැනවින් දන්නා අල්ලාහ්ය.

සුෆ්යාන් ඉබ්නු උයෙයිනා මෙසේ ප්‍රකාශ කරයි: "සැබැවින්ම ගැත්තෙකු තමන් අතර හා හරාම් කටයුතු අතර හලාලයෙන් යුත් තිරයක් ඇති කර ගන්නා තෙක් හා පාපය හා එයට සමානව පිහිටන සැක සහිත දෑ අතහැර දමන තෙක් ඔහු සැබෑ විශ්වාසය ලබන්නේ නැත."

***

"දැන ගන්න. සැබැවින්ම ශරීරය තුළ මස් කැබැල්ලක් ඇත. එය විධිමත් වූ විට ශරීරය මුළුමණින්ම විධිමත් වනු ඇත. එය විනාශ වූ විට ශරීරය මුළුමණින්ම විනාශ වී යනු ඇත. දැන ගන්න. එයයි හදවත." යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

ගැත්තා තම ශරීර අවයව තුළින් සිදුකරන යහපතත්, තහනම් කරනු ලබන දැයින් ඔහු වැළකී සිටීමත් සැක සහිත දැයට ඔහු බිය වීමත් ඔහුගේ හදවතෙහි ක්‍රියා කරන යහපත අනුව සිදු වන්නකි.

ඔහුගේ හදවත සුවපත් නම්, එතුළ අල්ලාහ්ට ප්‍රේම කිරීම, අල්ලාහ් කවර කරුණක් ප්‍රිය කරන්නේ ද එයට ප්‍රේම කිරීම, අල්ලාහ්ට බිය වීම හා ඔහු කවර කරුණක් පිළිකුල් කරන්නේ ද එහි වැටීමට බිය වීම යනාදිය හැර වෙනත් කිසිවක් නොමැති නම්, ඔහුගේ සම්පූර්ණ ශරීර අවයවවල ක්‍රියාකාරකම් දැහැමි වන්නේය. එය තහනම් දෑහි වැටීමෙන් ප්‍රවේසම් වීමක් වශයෙන් සියලුම ආකාරයේ තහනම් දැයින් වැළකී, සැක සහිත කටයුතුවලින් ආරක්ෂාවීමීට ද අවස්ථාව උදා කරනු ඇත.

හදවත නපුරු නම් තම ආශාවන්ට වහල් වීම ආධිපත්‍යය දරනු ඇත. ඔහු ප්‍රිය කරන දෑ අල්ලාහ් පිළිකුල් කළ ද එය සොයා යනු ඇත. ඔහුගේ ශරීර අවයව සියල්ලෙහි ක්‍රියාකාරිත්වය නපුරු වී යනු ඇත. සෑම පාපකමක් වෙතම හා සැක සහිත දෙයක් වෙතම ඒවා නැඹුරු වනුයේ ඔහුගේ හදවතෙහි ඇති වෙන තෘෂ්ණාව අනුවය.

අල්ලාහ් අබියස සුවපත් හදවතක් මිස ප්‍රයෝජනවත් නොවන්නේය. අල්ලාහ් මෙසේ පවසා සිටියි: "සුවපත් හදවතක් ඇතිව අල්ලාහ් වෙත පැමිණි අය මිස ධනය හෝ පිරිමි දරුවන් එල නොදෙන දින…" අෂ්-ෂුඅරා: 88,89) සුවපත් හදවතක් යනු: අනතුරු දායක පිළිකුල් සහගත සියලු දැයින් සුවපත් වූවක්

වෙයි. එම හදවතෙහි අල්ලාහ්ගේ ප්‍රේමය හා ඔහු ප්‍රිය කරන දෑ වෙත ඇලුම් කිරීම, අල්ලාහ්ගේ බිය හා ඔහු කවර දෙයක් දුරස් කළේ ද ඒ ගැන බිය වීම මිස වෙනකක් නොපවතී.

අල්ලාහ් පිළිබඳව දැනුම, ඔහුගේ ශ්‍රේෂ්ඨත්වය, ඔහුට ආදරය කිරීම, ඔහුට බිය වීම, ඔහුට භක්තිමත් වීම, ඔහුගෙන් යහපත පැතීම, ඔහු වෙත සියල්ල භාර කිරීම, යනාදී මේ කී සියල්ලෙන් හදවත පිරී පවතින තෙක් හදවත් සුවපත් වන්නේ නැත. තව්හීද් හෙවත් ඒකදේවත්වයේ යථාර්ථය එයයි. එය ලා ඉලාහ ඉල්ලල්ලාහ් -නැමදුමට සුදුසු අල්ලාහ් හැර වෙනත් දෙවියකු නැත- යන අර්ථයෙන් පිහිටා ඇත. තමන් ඇලුම් කරන තමන් හඳුනන තමන් ප්‍රේම කරන තමන් බියවන දෙවියන් බවට කිසිදු හවුල්කරුවකු නැති ඒකීය අල්ලාහ් පත්වන තෙක් එම හදවත් සුවපත් වන්නේ නැත.

හසන් තුමා මෙසේ පවසයි: ‘අවනතභාවය මත පිහිටා ඇත්තේ ද එසේ නැතහොත් පාපය මත පිහිටා ඇත්තේදැයි මා නිරීක්ෂණය කරන තෙක් මාගේ දෑසින් මා බැලුවේ නැත. මාගේ දිවෙන් මා කතා කළේ නැත. මාගේ දෑතින් මා ඇල්ලුවේ නැත. මාගේ දෙපයින් මා ගමන් කළේ නැත. එය අවනතවන්නක් ලෙස පිහිටියේ නම් ඒ සඳහා මුලපිරුවෙමි. එය පාපයක් ලෙස පිහිටියේ නම් මම පසු බැස්සෙමි.!

තම හදවත් සුවපත් කර ගත්තෝ මොවුහුය. ඒ තුළ අල්ලාහ් හැර වෙනත් අපේක්ෂාවක් ඉතිරි ව නොතිබිණි. ඔවුන්ගේ ශරීර අවයව දැහැමි විය. අල්ලාහ් වෙනුවෙන් මිස ඒවා ක්‍රියාත්මක නොවීය. ඒවා ඔහුගේ තෘප්තිය පවතින විෂයෙහි පමණක් ක්‍රියාත්මක විය. සියල්ල මැනවින් දන්නා අල්ලාහ්ය.

***

## الحَدِيْثُ السَّابِعُ
## සත් වන හදීසය

عَنْ تَمِيمٍ الدَّارِيِّ رَضِيَ الله عَنْهَ أَنَّ النَّبِيَّ ﷺ ، قَالَ :
"الدِّينُ النَّصِيحَةُ" ثلاثًا قُلْنَا : لِمَنْ يَا رَسُوْلَ اللهِ؟ قَالَ : لِلهِ وَلِكِتَابِهِ وَلِرَسُولِهِ وَلِأَئِمَّةِ الْمُسْلِمِينَ وَعَامَّتِهِمْ"
رَوَاهُ مُسْلِمٌ

සැබැවින්ම නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බව තමීම් අද්දාරී (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී.

එතුමා: “දහම උපදෙසකි” යැයි තුන්වරක්ම පවසා සිටියහ. (එවිට) අපි ‘අල්ලාහ්ගේ දූතයාණනි, එය කවුරුන් සතු වන්නක් දැ?’යි විමසා සිටියෙමු. “එය අල්ලාහ්ටත් ඔහුගේ ග්‍රන්ථයටත් ඔහුගේ දූතයාණන්ටත් මුස්ලිම්වරුන්ගේ නායකයින්ටත් ඔවුන් අතර සිටින පොදු ජනයාටත් සතු වන්නේය” යැයි පැවසූහ.

ඉමාම් මුස්ලිම් මෙම හදීසය දන්වා ඇත.

***

-විග්‍රහය-

අල් හාෆිල් අබූ නර්ම් තුමා: “මෙම හදීසයට විෂයක් ඇති’ බව පවසා ඇති අතර මුහම්මද් ඉබ්නු අස්ලම් අත්-තූසී[65] තුමා: ‘සැබැවින්ම එය දහමේ හතරෙන් කොටසකි’ යැයි පවසා ඇත්තේය.

65. ඉස්ලාමීය විද්වතෙකු, හාෆිල් වරයෙකු මෙන්ම ඉමාම්වරයකු වූ මෙතුමා නමින් මුහම්මද් ඉබ්නු අස්ලම් අත්-තූසී වේ. නැමදුම්වල නිරත වෙමින් හා ලෞකික ආශාවන්ගෙන් ඉවත්ව සිටිමින් නබි තුමාණන්ගේ සුන්නාව පිළිපැද්දා වූ ඉමාම්වරු අතරින් මෙතුමා ද ප්‍රසිද්ධ ඉමාම් වරයකි. අල්ලාහ් විෂයයෙහි නොයෙකුත් පීඩාවන්

හුදෙයිෆා ඉබ්නු අල් යමානි විසින් වාර්තා කරන ලද හදීසයක් ඉමාම් තබ්රානී විසින් මෙසේ වාර්තා කරන ලදී. නබි (ﷺ) තුමා: “කවරෙකු මුස්ලිම්වරුන්ගේ කටයුතු වලදී සැලකිලිමත් නොවන්නේ ද ඔහු ඔවුන් අතුරින් කෙනෙකු නොවන්නේය. එමෙන්ම කවරෙකු අල්ලාහ් වෙනුවෙන් ඔහුගේ දූතයාණන්, ඔහුගේ ආගම්, ඔහුගේ ඉමාම්වරු හා පොදුවේ මුස්ලිම්වරුන් වෙනුවෙන් උදේ සවස උපදෙස් නොකරන්නේ ද ඔහු ද ඔවුන් අතුරින් නොවන්නේය.”[66]

ඉමාම් කත්තාබී තුමා: උපදෙස යනු වාක්‍යයක් ප්‍රකාශ කරන වචනයකි. උපදෙස් ලබන්නාට යහපත පැතීම ඉන් අදහස් කෙරේ’ යැයි පවසා ඇත. තවදුරටත් එතුමා: ‘පරිභාෂාවේ උපදෙස යන අර්ථය ගෙන දෙන අන්-නුස්හ් නම් පදයේ මූලාර්ථය පිවිතුරු භාවයයි.

අම්ර් ඉබ්නු අස්-සලාහ් තුමා: “උපදෙස යනු ගොනු වූ වචන කිහිපයකි. එය උපදෙස් ලබන්නාට උපදෙස් කරන්නා විසින් සිතින් හා ක්‍රියාවෙන් සිදු කරන ක්‍රියාවලිය ගම්‍ය වී ඇත.

උත්තරීතර අල්ලාහ් වෙනුවෙන් වූ උපදෙස වනාහි: එය අල්ලාහ්ව ඒකීයත්වයට පත් කිරීම, කීර්තිමත් හා පූර්ණවත් ගුණාංග තුළින් ඔහුට ගුණ ගායනා කිරීම, එයට විරුද්ධව හා පටහැනි ගුණාංගවලින් ඔහු ව පිරිසිදු කිරීම, ඔහුට පිටුපෑමෙන් වැළකී සිටීම, ඔහුට අවනත වීම, අවංක ලෙස ඔහුට ප්‍රේම කිරීම, ඔහු විෂයයෙහි ආදරය කිරීම, ඔහු විෂයයෙහි කෝප වීම, ඔහුව ප්‍රතික්ෂේප කරන්නන් සමග අරගල කිරීම යනාදිය සහ මේ කරුණු වෙත අන් අය ඇරයුම් කිරීම සහ දිරිගැන්වීම යනාදියයි.

ඔහුගේ ග්‍රන්ථය වෙනුවෙන් වූ උපදෙස වනාහි: එය විශ්වාස කිරීම, එයට ගරුබුහුමන් දැක්වීම, එය පාරිශුද්ධත්වයට පත් කිරීම, එය පාරායනය කළ යුතු අයුරින් පාරායනය කිරීම, එහි ඇති නියෝග හා තහනම් කළ දෑ ඉදිරියෙහි

---

වලට මුහුණ දුන් අයෙකි. ඔහුගේ ශිෂ්‍යයකු වූ ඉමාම් ඉබ්නු හුසෙයිමා ‘රබ්බානී හාදිහිල් උම්මා’ (මෙම සමූහයේ විද්වතාණන්) යනුවෙන් නම් තැබීය. එතුමා ඉමාම් අහමද් සමග සම්බන්ධකම් පවත්වා ඇති අතර ඉමාම් අහ්මද් මිය ගිය පසුව හිජ්රි 242 නය්සාර්බූර්හි මරණයට පත් වූහ.

66 ‘අල් අව්සත්’හි ඉමාම් අත්-තබරානී (7469) ‘අස්-සගීර්’හි (2/50). ඉමාම් අල්බානී මෙය දුර්වල හදීසයක් බව දන්වා සිටියි. බලන්න ‘අල්ලර්ෆා’ (312)

අවනත වීම, එහි ඇති දැනුම් සම්භාරය හා උපමාවන් වටහා ගැනීම, එහි වදන් පරිශීලනය කිරීම, ඒ වෙත ඇරයුම් කිරිම. ඉක්මවා ගියවුන් එය විකෘති කිරීමෙන් හා අදේව වාදීන් ඒ ගැන පවසන දොසින් වැළැක්වීම යනාදියයි.

ඔහුගේ දූතයාණන් වෙනුවෙන් වූ උපදෙස වනාහි: මෙයට ඉතා සමීපය. එනම්: එතුමා හා එතුමා විසින් ගෙන ආ දෑ විශ්වාස කිරීම, එතුමාට ගරුබුහුමන් කිරීම, ගරු කිරීම, එතුමාව පිළිපදිමින් අනුගමනය කිරීම, එතුමා පෙන්වා දුන් ජීවනමාර්ගය ජීවමාන කිරීම, ඒ ගැන දැනුම ප්‍රචාරය කිරීම හා ව්‍යාප්ත කිරීම. එතුමාට හා එතුමාගේ පිළිවෙතට විරුද්ධවන්නන්හට විරුද්ධ වීම, එතුමාට හා එතුමාගේ පිළිවෙතට පක්ෂව කටයුතු කරන්නන් සමග පක්ෂව කටයුතු කිරීම, එතුමා පෙන්වා දුන් ගුණාංග තුළින් සදාචාර සම්පන්න වීම, එතුමාගේ විනය පිළිපදිමින් විනයානුකූල වීම, එතුමාගේ පවුලේ උදවිය හා එතුමාගේ මිතුරන්ට ප්‍රේම කිරීම යනාදියයි.

මුස්ලිම්වරුන්ගේ නායකයින් වෙනුවෙන් වූ උපදෙස වනාහි: සත්‍යය සඳහා ඔවුනට උපකාර කිරීම, එහි දී ඔවුනට අවනත වීම, ඒ සම්බන්ධයෙන් ඔවුන් මෙනෙහි කිරීම, මෘදු ලෙස හා සියුම් ලෙස ඔවුනට අවධාරණය කිරීම, ඔවුන් මත කඩා පැනීමෙන් වැළකීම ඔවුනට ආශිර්වාද පතමින් ප්‍රාර්ථනා කිරීම යනාදියයි.

පොදු මුස්ලිම්වරුන් වෙනුවෙන් වූ උපදෙස වනාහි: යහපත සලසන දෑ වෙත ඔවුන්ට මග පෙන්වීම, ඔවුන්ගේ මෙලොව කටයුතු හා මතුලොව කටයුතු පිළිබඳ දැනුම ලබා දීම, ඔවුන්ගේ රහස්‍ය දෑ සැඟවීම, ඔවුන්ගේ ගැටළු විසඳීම ඔවුන්ගේ සතුරන්ට එරෙහිව ඔවුනට සහාය දීම, එම සතුරන්ගෙන් වැළකී සිටීම, වංචා කිරීමෙන් හා ඔවුනට ඊර්ෂ්‍යා කිරීමෙන් වැළකීම, තමන් කැමති දෑ ඔවුනටත් ලැබිය යුතු බව ප්‍රිය කිරීම, තමන් පිළිකුල් කරන දෑ ඔවුනට අත්වීම සම්බන්ධයෙන් පිළිකුල් කිරීම හා ඒවාට සමාන අනෙකුත් දෑ යනාදියයි.

***

ඔවුන් වෙනුවෙන් වූ උපදෙස් අතුරින් තවත් කරුණු කිහිපයක් මෙසේය: ඔවුනට අත්වන හානිය හා පිළිකුල් සහගත දෑ ඔවුන්ගෙන් වැළැක්වීම, ඔවුන් අතර සිටින දිළිඳුන් සමග පරාර්ථකාමීව කටයුතු කිරීම, ඔවුන් අතර සිටින

දැනුම නොලද්දන් හට ඉගැන්වීම, ක්‍රියාවෙහි හා කතාවෙහි සත්‍යයෙන් දුරස් වන්නන් හට සත්‍ය වෙත මඟපෙන්වීමේ දී මෘදු ලෙස හැසිරීම, යහපත විධානය කිරීම හා අයහපතින් වැළැක්වීම යනාදියෙහි ඔවුන් සමග සියුම් ව කටයුතු කිරීම, ඔවුනට අත්වන පීඩාවන් එය ඔහුගේ ලෞකික ජීවිතයේ අත්වන පීඩාවක් වුව ද එය ඉවත් කිරීමට ප්‍රිය කිරීම, මුල්කාලීන විද්වතෙකු මෙසේ සඳහන් කර ඇත.: "සියලු මැවීම් අල්ලාහ්ට අවනත වීමත් (ඔහු වෙනුවෙන්) මාගේ මස් පිඩු තියුණු ආයුධවලින් වෙන් කරනු ලැබීමත් මම ප්‍රිය කරමි ." !

උමර් ඉබ්නු අබ්දුල් අසීස් මෙසේ පවසන්නෙකු විය. 'ඕහ්! නුඹලා අතර අල්ලාහ්ගේ ග්‍රන්ථය අනුව මා කටයුතු කර,. නුඹලාද එසේ කටයුතු කර, නුඹලා අතර එක් සුන්නාවක් ගෙන ක්‍රියා කරන සෑම කල්හිම මගෙන් අවයවයක් වැටී. එහි අවසානය මාගේ ආත්මය බැහැර වෙන තෙක් විය යුතු නොවේද?.'

උපදෙස් වර්ග අතරින් තවත් වැදගත් කරුණක් වන්නේ: යම් කටයුත්තක් සම්බන්ධයෙන් යමෙකු ඔබෙන් අදහස් පතන විට ඔහුට උපදෙස් දීමය. නබි (ﷺ) තුමා මෙසේ පවසා ඇත්තාහ. "නුඹලා අතුරින් කිසිවකු තම සහෝදරයාගෙන් උපදෙස් පතන විට ඔහු ඔහුට උපදෙස් දිය යුතුය."[67]

ෆුළෙයිල් ඉබ්නු ඉයාල් තුමා මෙසේ පවසා සිටියි: 'අධිකව සලාතය හා උපවාසය නිරත වීමෙන් ලබා ගත් අය අප වෙත නැත. අප සතුව ඇත්තේ ආත්මයේ ත්‍යාගශීලී භාවය, හදවතේ සුවපත් භාවය හා සමූහයාට දෙන උපදෙස් මගින් ලැබූ දෑය.

ඉබ්නු මුබාරක්ගෙන් 'කවර ක්‍රියාවක් උතුම් වන්නේ දැ?'යි විමසා සිටියදී හෙතෙම 'අල්ලාහ් වෙනුවෙන් උපදෙස් දීමය' යැයි පවසා සිටියේය.

67 අහ්මද් (4/256) මේ සම්බන්ධයෙන් ලිපියක් ද එල වී ඇත. අබූ හුරෙය්රා (රළියල්ලාහු අන්හු) තුමාගේ මර්ෆූඃ ගණයට අයත් හදීසය එම ප්‍රකාශය තවදුරටත් පොහොසත් කර සිටියි. එනම්: 'මුස්ලිම්වරයෙක් තවත් මුස්ලිම්වරයකුට කළ යුතු යුතුකම් සයකි.' එහි 'ඔබෙන් යමෙකු උපදෙස් පැතූ විට ඔබ ඔහුට උපදෙස් දෙන්න.' යනුවෙන් සඳහන් වී ඇත. මුස්ලිම් (2162)

මඃමර් තුමා මෙසේ පවසා සිටියේය: මිනිසුනට අධික ලෙස උපදෙස් දෙන්නා අල්ලාහ්ට බිය වන්නා වේ.

මුල්කාලීනයන් කිසිවකුට උපදෙස් දෙන්නට අපේක්ෂා කළ විට ඔවුහු ඔහුට රහසිගතව උපදෙස් දෙති. ඔවුන්ගෙන් ඇතැමෙකු: 'කවරෙකු ඔහු හා ඔහුගේ සහෝදරයා අතර රහසිගතව උපදෙස් දුන්නේද එය උපදෙසකි. කවරෙකු ජනයා ඉදිරියේ ප්‍රසිද්ධියේ කෙනෙකුට උපදෙස් දුන්නේද සැබැවින්ම ඔහු ඔහුට දොස් පවරන්නෙකි.' යැයි පවසා සිටියේය.

ෆුළෙයිල් තුමා: 'දේව විශ්වාස වන්තයා සඟවනු ලබයි උපදෙස් දෙනු ලබයි. පාපිෂ්ඨයා අපහාස කරනු ලබයි. දොස් පවරනු ලබයි.' යැයි පැවසීය.

අබ්දුල් අසීස් ඉබ්නු අබූ රව්වාද් තුමා: 'නුඹලාට පෙර විසූවන් අතර, මිනිසකු තම සහෝදරයාගේ යමක් දුටුවේ නම් මෘදු ලෙසින් ඔහුට අණ කර සිටියි. ඔහු අණ කර සිටීමෙහි හා තහනම් කිරීමෙහි ප්‍රතිඵල නෙළා ගනියි. සැබැවින්ම ඔවුන් අතර කිසිවකු තම මිතුරාට දොස් නගා සිටියේ නම් ඔහුගේ සහෝදරයා පිළිබඳ කෝප වී ඔහුට රහසේම අපහාස කරයි.

***

## الحَدِيْثُ الثَّامِنُ

## අට වන හදීසය

عن ابنِ عُمَرَ رَضِي اللهُ تَعاَلَى عَنْهُمَا أنَّ رَسُولَ اللهِ ﷺ قَالَ :
((أُمِرْتُ أَنْ أُقَاتِلَ النَّاسَ حَتَّى يَشْهَدُوا أَن لاَ إلهَ إِلاَّ اللهُ ، وَأَنَّ مُحَمَّدًا رَسُولُ اللهِ ، وَيُقِيمُوا الصَّلاَةَ ، وَيُؤتُوا الزَّكَاةَ ، فإذَا فَعَلُوا ذَلِكَ، عَصَمُوا مِنِّي دِمَاءَهُم وَأَمْوَالَهُمْ ، إلاَّ بِحَقِّ الإسْلاَمِ ، وَحِسَابهُم عَلَىَ اللهِ تعالَى.
رَوَاهُ البُخَارِيُّ وَمُسْلِمٌ

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) ප්‍රකාශ කළ බව ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

මිනිසුන්, නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නොමැති බවත් සැබැවින්ම මුහම්මද් අල්ලාහ්ගේ දූතයාණන් බවත් සාක්ෂි දරා සලාතය විධිමත්ව ඉටු කර සකාත් ද පිරිනමන තෙක් ඔවුන් සමග අරගල කරන මෙන් මම අණ කරනු ලැබුවෙමි. එසේ ඔවුන් ඒවා සිදු කළේ නම්, ඉස්ලාමයේ ඇති උරුමයක් වෙනුවෙන් හැරෙන්නට ඔවුන්ගේ ජීවිත හා ඔවුන්ගේ දේපළ ඔවුහු මගෙන් ආරක්ෂා කර ගත්තෝය. ඔවුන්ගේ විනිශ්චය ඇත්තේ උත්තරීතර අල්ලාහ් අබියසය."

මෙම හදීසය ඉමාම් බුහාරි හා මුස්ලිම් විසින් දන්වා ඇත.

***

-විග්‍රහය-

මෙම හදීසය බුහාරි හා මුස්ලිම් හි පල වී ඇත.

'ඉස්ලාමයේ ඇති උරුමයක් වෙනුවෙන් හැරෙන්නට' යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

මෙම පද පෙළ මුස්ලිම් තුමාට ආවේනික එකක් නොව ඉමාම් බුහාරි තුමාට පමණක් ආවේනික වූවකි.

මෙම හදීසයේ අර්තයෙන්ම නබි (ﷺ ) තුමා විසින් විවිධාකාර හදීස් වාර්තා කරනු ලැබ ඇත.

සහීහ් බුහාරි හි සඳහන් හදීසයක, නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බව අනස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරනු ලැබ ඇත.: "නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නොමැති බවත් සැබැවින්ම මුහම්මද් තුමාණන් ඔහුගේ ගැත්තා හා දූතයා බවත් ජනයා සාක්ෂි දරන තෙක් ඔවුන් සමග අරගල කිරීමට මා අණ කරනු ලැබ ඇත්තෙමි. නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නොමැති බවත් මුහම්මද් තුමාණන් අල්ලාහ්ගේ දූතයාණන් බවත් සාක්ෂි දරා අපගේ සලාතයට අනුව සලාත් ඉටු කර අපගේ දිශාවට මුහුණලා අප විසින් කපන ලද සතුන් අනුභව කළේ නම් ඔවුන්ගේ ජීවිත හා ඔවුන්ගේ ධනය ඒවායෙහි උරුමය මත මිස අප වෙත තහනම් වන්නේය."[68]

අබූ මාලික් අල් අෂ්ජඊ තුමා තම පියාගෙන් ලබා වාර්තා කළ හදීසයක් ඉමාම් මුස්ලිම් තුමා මෙසේ පල කර ඇත. ඔහුගේ පියාණන්: 'අල්ලාහ්ගේ දූතයාණන් කළ ප්‍රකාශයකට තමන් සවන් දුන් බව ප්‍රකාශ කරමින් 'කවරෙකු ලා ඉලාහ ඉල්ලල්ලාහ්' නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් කිසිවකු නොමැති බව පවසා අල්ලාහ් හැර වෙනත් දෑ නැමදුමට ලක් කිරීම ප්‍රතික්ෂේප කළේද ඔහුගේ ධනය හා ඔහුගේ ප්‍රාණය තහනම් වන්නේය. ඔහුගේ විනිශ්චය අල්ලාහ් වෙත පැවරෙනු ඇත" යැයි තවදුරටත් පවසා සිටියේය.[69]

සුෆ්යාන් ඉබ්නු උයයිනා විසින් මෙසේ වාර්තා කරන ලදී. සැබැවින්ම එතුමා 'මෙය සලාතය උපවාසය සකාත් හා හිජ්රත් යන දෑ අනිවාර්යය කිරීමට පෙර ඉස්ලාමයේ ආරම්භක අවදියේ වූවක්' බව පවසා සිටියේය. මෙය වඩාත්

68. බුහාරි (382)

69. මුස්ලිම් (23)

දුර්වල හදීසයකි. සුෆ්යාන් විසින් කළ මෙම ප්‍රකාශයේ නිවැරදි භාවය පිළිබඳ සලකා බැලිය යුත්තකි. මෙම හදීසයේ වාර්තාකරුවන් අල්ලාහ්ගේ දූතයාණන් සමග සිට ඇත්තේ මදීනාවෙහිය. ඔවුන්ගෙන් ඇතැමෙක් ප්‍රමාද වී ඉස්ලාමය වැළඳ ගත් අය වෙති.

“ඔවුන්ගේ ජීවිත හා ඔවුන්ගේ දේපළ ඔවුහු මගෙන් ආරක්ෂා කර ගත්තෝය.” යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

මෙම ප්‍රකාශයේ සටන් කිරීමටත් ඉස්ලාමයට විරුද්ධව සටන් කරන්නන් ඝාතනය කිරීමටත් අණ කරනු ලැබ ඇති බව පෙන්වා දෙයි. මේ සියල්ල මදීනාව වෙත හිජ්රත් කළ පසුව සිදු වූවකි. දැන ගත යුතු වැදගත්ම කරුණක් වනුයේ: නබි (ﷺ) තුමා ඉස්ලාමය තුළට ප්‍රවේශ වීමේ අපේක්ෂාවෙන් තමන් වෙත පැමිණි සෑම කෙනෙකුගෙන්ම සාක්ෂියේ ප්‍රකාශ දෙක පමණක් පිළිගෙන ඇත. එමගින් ඔහුගේ ජීවිතයට රැකවරණය ලැබූ අතර ඔහු ඔහුව මුස්ලිම්වරයකු බවට පත් කළේය. එතුමාණන් උසාමා ඉබ්නු සෙයිද් (රළියල්ලාහු අන්හු) තුමා තමන් වෙත කඩුව අමෝරණ විට ‘ලා ඉලාහ ඉල්ලල්ලාහ්’ යනුවෙන් පැවසූ පුද්ගලයකු මරා දැමීම හෙළා දුටුහ. ඔහු කෙරෙහි වූ එතුමාගේ පිළිකුල්භාවය ඉතා දැඩි විය.

අනස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් මුහම්මද් ඉබ්නු නස්ර් අල් මිර්වසීය්යු තුමා විසින් ඉතා දුර්වල වාර්තා සම්බන්ධතාවකින් මෙසේ දන්වා ඇත. “නබි (ﷺ) තුමාණෝ ඉස්ලාමය වෙත තමන්ට පිළිතුරු දෙන්නන් සලාතය විධිමත්ව ඉටු කර සකාත් දීමෙන් මිස පිළිගන්නෙකු නොවූහ.” මෙය තහවුරු කරනු ලැබූ හදීසයක් නොවේ. එය තහවුරු කරන ලද හදීසයක් යැයි නිර්ණය කළද ඉන් අදහස් කරනුයේ: සැබැවින්ම එතුමාණන් ඉස්ලාමය තුළ සලාතය හා සකාතය අතහැර දමන කිසිවෙකු කිසිවිටෙක එය පිළිගෙන නොමැති බවයි.

මේ අනුව: මෙම පාඩමට අයත් හදීස් ප්‍රකාශ අතර සමස්ථයක් වශයෙන් පෙන්වා දෙනුයේ: සැබැවින්ම සාක්ෂි දැරීමේ ප්‍රකාශ දෙක පැවසීමත් සමගම එය දරන්නා රැකවරණය ලබා එමගින් මුස්ලිම්වරයකු වන බවයි. එහෙයින් ඔහු සලාතය ඉටු කර සකාත් ද පිරිනමා ඉස්ලාමයේ නීති රීති අනුව කටයුතු කළේ නම් මුස්ලිම්වරුන්ට හිමි දෑ ඔහුට ද හිමිය. ඔවුන් වෙත පවරනු ලැබූ දෑ ඔහු වෙත ද පවරනු ලැබ ඇත. මෙම මූලිකාංගවලින් යමක් උල්ලංඝණය

කරන්නේ නම්, එසේ ඉටු කරන්නන් කණ්ඩායමක් වශයෙන් සිටින්නේ නම් ඔවුන් ඝාතනය කරනු ලබනු ඇත. සලාතය විධිමත්ව ඉටු කිරීමෙන් හා සකාත් දීමෙන් වැළකී සිටින සමූහයක් සමග අරගල කිරීමට සාධකයක් වශයෙන් අල්ලාහ්ගේ ප්‍රකාශ කිහිපයක් ද පිහිටා ඇත. එනම්: 'එහෙයින් ඔවුන් පාපක්ෂමාව අයැද සලාතය විධිමත්ව ඉටු කර සකාත්ද දෙන්නේ නම් ඔවුන්ගේ මාර්ගයේ නුඹලා අතහරිනු.'' (අත් තව්බා:5) උත්තරීතර අල්ලාහ්ගේ තවත් ප්‍රකාශයක: ''එහෙයින් ඔවුන් පාපක්ෂමාව අයැද සලාතය විධිමත්ව ඉටු කර සකාත් දෙන්නේ නම් දහමෙහි නුඹලාගේ සහෝදරයින් වෙති'' (අත්-තව්බා:11) සැබැවින්ම නබි (ﷺ) තුමා පිරිසක් සමග සටන් කරන විට අළුයම උදාවන තෙක් ඔවුන් වෙත පහර දුන්නේ නැත. අදානයට සවන් දුන්නේ නම් එසේය. එසේ නොමැති විට එතුමා ඔවුන් වෙත පහර දුන්හ.[70]

''ඔවුන්ගේ විනිශ්චය ඇත්තේ උත්තරීතර අල්ලාහ් අබියසය.'' යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

සැබැවින්ම සාක්ෂියේ ප්‍රකාශ දෙක පවසන්නා -සලාතය විධිමත් ව ඉටු කිරීමත් සමග- ඔහුගේ ජීවිතය හා ඔහුගේ ධනය මෙලොවෙහි සුරක්ෂිත වන්නේය. නමුත් මරණ දඬුවම නියම වන වරදක් කර ඇත්තේ නම් මිස. මතුලොවෙහි ඔහුගේ විනිශ්චය අල්ලාහ් වෙත පවතින්නකි. ඔහු සත්‍යවාදියෙකු නම් එමගින් අල්ලාහ් ඔහුව ස්වර්ගයට ඇතුළත් කරනු ඇත. ඔහු බොරු කාරයකු නම් සැබැවින්ම ඔහු කුහක පිරිස සමග නිරා ගින්නේ පහළම මහළේ සිටිනු ඇත.

මහින් ඉස්ලාමය වෙත නැවත පිවිසීමට ඉදිරිපත් වූ සින්දීක්වරයාගේ[71]-කුහකයකුගේ- පාපොච්ඡාරණය වලංගු වන බවත් ඔහුගේ කුහකත්වය මතු

70. බුහාරි (610), මුස්ලිම් (382) අනස් (රළියල්ලාහු අන්හු) තුමාගේ වාර්තාව අනුව.

71. සින්දීක් නම් වචනයේ මූලය පර්සියානු පදයකි. ඔවුහු දෙයිසාන් පසුව මානි පසුව මුස්දික් අනුගමනය කළෝ වෙති. සැබැවින්ම ආලෝකය යහපත බිහි කරන බවත් අන්ධකාරය නපුර බිහි කරන බවත් පිළිගෙන සිටියෝය. ඒ දෙක හැර මැවුම්කරුවකු පිළිගත්තේ නැත. ඔවුන් සනාදිකා වරුන්ගෙන් පැවත එන්නන් වෙති. ඔවුන් ඉසාලාමයට පෙර පර්සියානුවන් විසින් නෙරපාහැර ඝාතනය කරනු ලැබුවෝ වෙති. පසුව අද්වෙ වාදියාට කුහකයාට දේව ප්‍රතික්ෂේපය ප්‍රසිද්ධියේ

වූ වහාම ඔහුව ඝාතනය නොකළ යුතු බවත් අදහස් දක්වන විද්වතුන් මෙම පාඨය සාධකයක් ලෙස ඉදිරිපත් කරති . එය නබි (ﷺ) තුමාණන් කුහකයින් සමග ක්‍රියා කළ ආකාරය මෙනි. ඔවුන් ඇතැමෙකුගේ අභ්‍යන්තරයේ ඇති කුහකත්වය එතුමා දැන දැනම මතුපිටින් මුස්ලිම්වරුන්ගේ නීතිරීති අනුගමනය කරන්නනට සැලැස්විය. මෙය ඉමාම් ෂාෆිගේ ප්‍රකාශයයි. තවත් වාර්තාවක ඉමාම් අහ්මද් වාර්තා කර ඇති අතර ඉමාම් අල් කත්තාබී තුමා විද්වතුන් බොහෝ පිරිසකගෙන් ලබා මෙය සඳහන් කර ඇත.[72] සියල්ල මැනවින් දන්නා අල්ලාහ්ය.

***

පවසන්නාට මහා අපරාධකාරයාට මෙම සින්දීක් නම් වචනය භාවිත කරන ලදී. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත් තරීෆි)

72. ඉමාම් මාලික් මේ ගැන පවසනුයේ: ඔහුගේ තව්බාව පිළිගනු නොලබන බවයි. ඉමාම් අහ්මද් විසින් ද එසේ සඳහන් කර ඇත.

මා අදහස් කර සිටිනුයේ: සැබැවින්ම ඔහුගේ තව්බාව මෙලොවෙහි පිළිගනු නොලැබ, ඔහුට මරණ දඬුවම දීම අනිවාර්යය වන්නේය. ඔහුගේ මතුලොව වනාහි ගැත්තා තම තව්බාවෙහි සත්‍යවාදියෙකු වූ කවර අවස්ථාවක වුව ද සියලු පාපයන්ට අල්ලාහ් සමාව දෙනු ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: “අල්ලාහ්ගෙන් වූ භාග්‍යයක් හා ආශිර්වාදයක් වශයෙනි. අල්ලාහ් සර්වඥානීය මහා ප්‍රඥාවන්තය.” (සූරා හුජ්රාත්:8) සහීහ් මුස්ලිම් සඳහා ඉමාම් නවවි කළ විග්‍රහයේ සින්දීක් වරුන්ගේ තව්බාව සම්බන්ධයෙන් කර ඇති ප්‍රකාශය බලන්න. (1/207)

## الحَدِيْثُ التَّاسِعُ

## නව වන හදීසය

عَنْ أَبِي هُرَيْرَةَ رَضِيَ اللهُ عَنْهُ قَالَ: سَمِعْتُ رَسُولَ اللهِ ﷺ يَقُولُ: "مَا نَهَيْتُكُمْ عَنْهُ فَاجْتَنِبُوهُ، وَمَا أَمَرْتُكُمْ بِهِ فَأْتُوا مِنْهُ مَا اسْتَطَعْتُمْ، فَإِنَّمَا أَهْلَكَ الَّذِينَ مِنْ قَبْلِكُمْ كَثْرَةُ مَسَائِلِهِمْ وَاخْتِلَافُهُمْ عَلَى أَنْبِيَائِهِمْ."

رَوَاهُ البُخَارِيُّ وَمُسْلِمٌ

අල්ලාහ්ගේ දූතයාණන් කළ ප්‍රකාශයකට තමන් සවන් දුන් බව අබූ හුරෙය්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී.

“මා නුඹලාට කවර දෙයක් තහනම් කළේද නුඹලා එයින් වැළකී සිටිනු. එමෙන්ම මා නුඹලාට කවර දෙයක් නියෝග කළේද ඔබට හැකි පමණින් එය ඉටු කරනු. නුඹලාට පෙර සිටියවුන් විනාශ කර දැමුවේ ඔවුන්ගේ අධික ප්‍රශ්ණ කිරීම් හා ඔවුන්ගේ නබිවරුන් සම්බන්ධයෙන් වූ ඔවුන්ගේ මතභේදයයි.”

ඉමාම් බුහාරි හා මුස්ලිම් මෙම හදීසය දන්වා ඇත.

***

### -විග්‍රහය-

මෙම පදමාලාව සහිතව මෙම හදීසය වාර්තා කර ඇත්තේ ඉමාම් මුස්ලිම් තුමා පමණකි. ඔහු සතු තවත් වාර්තාවක මෙම හදීසය සඳහා හේතු කාරණා සඳහන් කර ඇත. අබූ හුරෙයිරා රළියල්ලාහු අන්හු තුමා විසින් වාර්තා කළ හදීසයක අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) තුමා අපහට දේශනාවක් කරමින් මෙසේ පවසා සිටියහ. “අහෝ ජනයිනි, අල්ලාහ් නුඹලාට හජ් වන්දනාව අනිවාර්යය කොට ඇත. එහෙයින් නුඹලා හජ් වන්දනාව ඉටු කරනු.” එවිට මිනිසකු: අහෝ අල්ලාහ්ගේ දූතයාණනි, සෑම වසරකම ද? යැයි විමසා

සිටියේය. එවිට එතුමාණන්: 'මම ඔව් යැයි පවසා සිටියේ නම් එය අනිවාර්යය වනු ඇත. (නමුත් ඒ සඳහා) නුඹලා හැකියාව නොදරන්නෙහුය." පසුව එතුමා: "මා නුඹලාට කවර කරුණක් මුදා හැර ඇත්තේ ද (ඒ ගැන නොවිමසා) එයත් සමග නුඹලා මා අතහැර දමනු. නුඹලාට පෙර සිටි අය විනාශ වී ගියේ: ඔවුන්ගේ නොමනා ප්‍රශ්න කිරීම් හා ඔවුන්ගේ නබිවරුන් පිළිබඳ ඔවුන් මතභේද ඇති කරගත් හේතුවෙනි. මා නුඹලාට යම් කරුණක් අණ කරන විට නුඹලා හැකි පමණින් එය පිළිපදිනු. මා නුඹලාට යම් දෙයක් තහනම් කළ විට එය නුඹලා අතහැර දමනු." යැයි පවසා සිටියහ.[73]

***

"මා නුඹලාට කවර කරුණක් මුදා හැර ඇත්තේ ද (ඒ ගැන නොවිමසා) එයත් සමග නුඹලා මා අතහැර දමන්න. නුඹලාට පෙර සිටි අය විනාශ වී ගියේ, ඔවුන්ගේ නොමනා ප්‍රශ්න කිරීම් හා ඔවුන්ගේ නබිවරුන් පිළිබඳ ඔවුන් මතභේද ඇති කරගත් හේතුවෙනි." යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශ වනාහි:

ප්‍රශ්න කිරීමේ පිළිකුල් භාවය හා එහි පහත්කම මෙය පෙන්වා දෙයි. ප්‍රශ්න කිරීමේ නිරතවීම වෙනුවට එතුමාගේ අණ පිළිපදිමින් හා එතුමා තහනම් කළ දැයින් වැළකෙමින් කටයුතු කරන මෙන් මෙය පෙන්වා දී ඇත. නබි තුමාණන්: "මා නුඹලාට යමක් තහනම් කළ විට නුඹලා එයින් වැළකී සිටිනු. මා නුඹලාට යම් නියෝගයක් විධානය කළ විට නුඹලා හැකි පමණින් එය පිළිපදිනු." යැයි පවසා ඇත්තාහ.

මුස්ලිම්වරයකු සැලකිලිමත් විය යුතු වනුයේ: අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් පිළිබඳ පැමිණ ඇති දෑ පරිශීලනය කොට එය වටහා ගන්නට උත්සාහ දරා, පසුව එය අධ්‍යාත්මික කටයුතු අතුරින් වී නම් එය තහවුරු කිරිමට නිරත වීම සහ එය වත්පිළිවෙත් සම්බන්ධ කටයුතු අතුරින් වී නම් එම නියෝග හැකි පමණින් ක්‍රියාත්මක කිරීමට හා තහනම් කර ඇති දැයින් වැළකී සිටීමට හැකි පමණින් වෙහෙස වීමය. ඔහුගේ සැලකිලිමත් භාවය ඒ වෙත යොමු විය යුතු අතර ඒ හැර වෙනත් දෙයක් වෙත නොවිය යුතුය.

73. මුස්ලිම් (1337)

-නියෝගයට හා තහනමට සවන් දෙන අවස්ථාවේ- සිදුවිය හැකි හා සිදුවිය නොවිය හැකි කරුණු අනිවාර්යය කිරීම සඳහා ඔහුගේ සැලකිල්ල යොමු වී ඇත්නම්, සැබැවින්ම එය තහනමට ඇතුළත් කරුණු අතුරින් වේ. එම කරුණ පිළිපැදීමට උත්සාහ කිරීමෙන් වැළකී සිටියි.

පුද්ගලයකු ඉබ්නු උමර් තුමාගෙන් හජරුල් අස්වද් ස්පර්ශ කිරීම සම්බන්ධයෙන් විමසා සිටයේය. එවිට එතුමා ඔහුට: 'නබි (ﷺ) එය ස්පර්ශ කොට එය සිප ගනු මම දැක ඇත්තෙමි' යැයි පවසා සිටියේය. පසුව ඔහු එතුමාට: එය මට නොහැකි වූයේ නම් ඔබ කුමක් සිතන්නෙහි ද? ඒ සඳහා මට තදබදයක් වූයේ නම් ඔබ කුමක් සිතන්නෙහි ද? යැයි විමසා සිටියේය. එවිට ඉබ්නු උමර් තුමා ඔහු දෙස බලා: 'ඔබ කුමක් සිතන්නෙහි දැ යැයි ප්‍රශ්න කිරීම යමනයේ තබා ගන්න. නබි (ﷺ) තුමා එය ස්පර්ශ කොට සිප ගනු මම දැක ඇත්තෙමි යැයි ඔහුට පිළිතුරු දුන්නේය.' ඉමාම් තිර්මිදි විසින් මෙය වාර්තා කර ඇත.[74]

ඉබ්නු උමර් තුමා අදහස් කළේ: නබි (ﷺ) තුමාව පිළිපැදීම විෂයයෙහි ඔහුට සැලකිල්ලක් තිබිය යුතුයි යන අපේක්ෂාව මිස කළ නොහැකි දෙයක් සිදු කිරීමේ අවශ්‍යතාව හෝ එහි නිරත වීමට පෙර ඔහුට අපහසුතාවට පත් කිරීම හෝ නොවීය. සැබැවින්ම ඔහු අනුගමනය කිරීමේ ක්‍රියාවලිය ඔහු නිෂ්ක්‍රීය කළ හැකිය. දහම පිළිබඳ අවබෝධය ලැබීම හා දැනුම සඳහා විමසා සිටීම පැසසුමට ලක් කරනු ලබනුයේ එය ක්‍රියාවෙහි පිහිටීම සඳහා ය. නමුත් එය වාද විවාදයට නොවේ.

මෙම අදහසින් සහාබාවරුන් හා තාබිඊන්වරුන් බොහෝමයක් දෙනා යමක් සිදු වීමට පෙර ඒ ගැන විමසීම පිළිකුල් කර ඇත්තාහ. ඒ සම්බන්ධයෙන් පිළිතුරු නොදුන්හ.

සෙයිද් ඉබ්නු සාබිත් තුමා යමක් පිළිබඳ විමසා සිටියේ නම් 'මෙය සිදුවූවක් දැ? යි විමසා සිටියි. ඔවුහු නැතැයි පිළිතුරු දුන් විට, 'එය සිදුවන තෙක් අතහැර දමන්නැයි' පිළිතුරු දී ඇත.

74. බුඛාරි (1611), -කතෘ තුමා පැවසූ පරිදි - තිර්මිදි (861)

මස්රූක් තුමා මෙසේ පවසයි: මම උබය් ඉබ්නු කඃබ් තුමාගෙන් කරුණක් විමසුවෙමි. එවිට එතුමා: 'එය සිදු වූවායින් පසු වූවක්දැ?'යි විමසා සිටියේය. එයට මම: 'නැතැ'යි පිළිතුරු දුනිමි. එතුමා: 'එය සිදුවන තෙක් අපට සැනසිල්ලේ ඉන්න දෙන්න. එය සිදු වූ විට අපගේ අදහස අපි ඔබට ඉදිරිපත් කරන්නෙමු' යැයි පවසා සිටියේය.

ඉමාම් ෂඅබී තුමා මෙසේ පවසයි: ගැටලුවක් පිළිබඳ අම්මාර් තුමාගෙන් විමසන ලදී. එවිට එතුමා: 'එය සිදු වූවායින් පසු වූවක් දැ?'යි විමසා සිටියේය. ඔවුහු 'නැතැ'යි පිළිතුරු දුන්හ. එතුමා: 'එසේනම් එය සිදුවන තෙක් අප අතහැර දමන්න. එය සිදු වූයේ නම් අපි එහි ස්වරූපය ගැන නුඹලාට පවසන්නම්' යැයි පිළිතුරු දුන්හ.

ඉබ්නු වහබ් තුමා මෙසේ පවසයි: රජවරයකු මෙසේ පවසනු මම අසා ඇත්තෙමි: "දැනුමෙහි මුහුණිච්චාව හදවත් දරුණු කරනු ඇත. අමානාපකම උරුම කරනු ඇත."

මය්මූනීය්යු තුමා මෙසේ පවසයි: අබ්දුල්ලාහ්ගේ පියාණන් අහ්මද් පිළිබඳ මම මෙසේ අසා ඇත්තෙමි. ඔහුගෙන් යම් ගැටලුවක් පිළිබඳ විමසා සිටි විට ඔහු: 'මෙම ගැටලුව ඇති වූයේ ද. ඉන්පසු එමගින් නුඹලා පරීක්ෂාවට ලක් වූයේද?.' යැයි විමසා සිටියි.

තවත් සඳහනක: මෙම හදීසයේ සඳහන් පරිදි කවරෙකු නබි (ﷺ) තුමා අණ කර ඇති දෑ පිළිපැද එතුමා වළක්වා ඇති දැයින් වැළකී, ඒ හැර වෙනත් දැයින් ඉවත් ව ඒ මත පදනම් වී ක්‍රියා කරන්නේ නම් මෙලොවෙහි හා මතුලොවෙහි ජය ඔහුට හිමි වනු ඇත. කවරෙකු එයට වෙනස්ව කටයුතු කර, වැරදි දෑ හා තමන්ට ලස්සන යැයි සිතන දෑ මත ක්‍රියා කරන්නේ ද ආගම් ලත් ජනයාගේ තත්වයට ඔහු පත් වීමෙන් නබි (ﷺ) තුමා ඔහුට අවවාද කර ඇත. ඔවුන් විනාශයට පත් වූයේ අධික ලෙස ප්‍රශ්න ඇසීම ඔවුන්ගේ නබිවරුන් පිළිබඳ ගැටුම් ඇති කර ගැනීම හා ඔවුන්ගේ රසූල්වරුන්ට ඔවුන් යටත් වී අනුගමනය නොකිරීම හේතුවෙනි.

***

"මා නුඹලාට කවර දෙයක් තහනම් කළේද නුඹලා එයින් වැළකී සිටිනු. එමෙන්ම මා නුඹලාට කවර දෙයක් නියෝග කළේද ඔබට හැකි පමණින් එය ඉටු කරනු." යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

ඇතැම් විද්වතුන් පවසා සිටිනුයේ: සැබැවින්ම තහනම නියෝගයට වඩා දැඩි බව මින් ගනු ලබන බවය. ඊට හේතුව සැබැවින්ම තහනම් කටයුත්තකින් කිසිවක් කිරීමට කිසිදු අවකාශය දී නොමැති අතර නියෝගය තමන්ගේ හැකියාවේ තරමට සිදු කිරීමට කොන්දේසි ඉදිරිපත් කර ඇති බැවිනි.[75]

මෙම ප්‍රකාශය ඇතැමුන් කර ඇති ප්‍රකාශවලට සමාන වන්නේය: එනම් දැහැමි ක්‍රියාවන් දැහැමියා මෙන්ම පාපතරයා ද සිදු කරනු ඇත. තවද පාපකම් වනාහි සත්‍යවාදියෙකු මිස එය අතහැර දමන්නේ නැත.

ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය මෙසේ දන්වා සිටින්නීය: "කැපවීමෙන් වැඩ කරන්නා අබිබවා යෑමට කවරෙකු සතුටු වන්නේද ඔහු පව් කිරීමෙන් වැළකිය යුතුය."

හසන් තුමා මෙසේ පවසයි: 'ගැත්තන්හට, අල්ලාහ් ඔවුන්හට තහනම් කළ දෑ අතහැර දැමීමට වඩා උතුම් වෙනත් කිසිදු ගැතිකමක් නොමැත."

පිළිපදිනු ලැබිය යුතු ක්‍රියාවක් සිදු කිරීමට වඩා තහනම් කරනු ලබන දෙයක් අතහැරීම උතුම් බව මතු පිටින් පෙනෙන්නට ඇත. එයින් අදහස් වන්නේ පිළිපැදිය යුතු නෆිල් හෙවත් අමතර ක්‍රියාවන් සිදු කිරීම පිළිබඳය. ඉබ්නු උමර් තුමාගේ ප්‍රකාශය එයට සාක්ෂියකි. එනම්: 'තහනම් දැයින් සුළු ප්‍රමාණයක් අතහැර දැමීම අල්ලාහ්ගේ මාර්ගයේ සිය දහස් වාරයක් වියදම් කිරීමට වඩා උතුම්ය.

උමර් ඉබ්නු අබ්දුල් අසීස් තුමා: 'රාත්‍රියේ නැගී සිට නැමදුමෙන් ජීවමාන කිරීම, දහවල් කාලයේ උපවාසයේ නිරත වීම හා ඒ අතර ඇති දෑහි නිරත වීම

75. සැබැවින්ම 'අතහැර දැමීම' මූලධර්මයයි. අභිමතයක් එයට අවශ්‍ය වන්නේ නැත. එහෙයින් එය හැකියාව යන න්‍යාය කොන්දේසි වශයෙන් පනවනු නොලැබේ. නමුත් 'ඉටු කිරීම' අවශ්‍ය කාර්යයකි. එයට අභිමතයක් අවශ්‍ය වන්නේය. සෑම කෙනෙකුම අතහරින අතර සෑම කෙනෙකුම සිදු කරන්නෙකු නොවන්නේය. (අෂ්-ෂෙය්ක් අබ්දුල් අසීස් අත්-තරීෆී)

තක්වා හෙවත් භක්තිමත්භාවය නොවන්නේය. නමුත් භක්තිමත් භාවය යනු අල්ලාහ් නියම කළ දෑ ඉටු කිරීමත් අල්ලාහ් තහනම් කළ දෑ අත හැරීමත්ය. ඒ සමගම නැමදුම් ක්‍රියාවක් ඉටු කළේ නම් එය යහපතින් යහපතය.' යැයි හෝ ඒ සමාන ප්‍රකාශයක් හෝ කර ඇත.

ඔවුන්ගේ මෙම ප්‍රකාශ සමස්තයක් ලෙස බැලූ කල, සැබැවින්ම තහනම් කරන ලද දෑ ඉතා ස්වල්ප වුවත් එයින් වැළකීම පිළිපදිනු ලබන අතිරේක දෑ අධිකව ඉටු කිරීමට වඩා උතුම්ය. හේතුව සැබැවින්ම එය අනිවාර්යය. නමුත් මෙය අතිරේකයක් පමණ වන බැවිනි.[76]

***

76. තහනම් කරනු ලැබූ දෑ හා වත්පිළිවෙත් ඒ දෙකින් කවර දෙයක් හෝ අනෙකට ප්‍රතිකර්මයක් වන්නේය. එය එහි ඇති මහිමය හා බලය අනුව පිහිටන්නේය. පිළිපදිනු ලබන අනිවාර්යය කටයුතුවල ප්‍රතිඵල රඳවා තබා ගැනීම තහනම් කරනු ලබන දෑ සමග අනිවාර්යය කටයුතු සිදු කිරීමට වඩා උතුම් වන්නේය. ඊට හේතුව සැබැවින්ම තහනම් කරනු ලබන දෑ අනිවාර්යය කටයුතු මත පැමිණියේ නම් අතිරේක දෑ ඊටත් වඩා සුදුසු වන බැවිනි. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්-තරීෆි)

## الحَدِيْثُ العَاشِرُ

## දහ වන හදීසය

عَنْ أَبِي هُرَيْرَةَ رَضِيَ اللهُ عَنْهُ قَالَ: قَالَ رَسُولُ اللهِ ﷺ:

"إِنَّ اللهَ طَيِّبٌ لَا يَقْبَلُ إِلَّا طَيِّبًا، وَإِنَّ اللهَ أَمَرَ الْمُؤْمِنِينَ بِمَا أَمَرَ بِهِ الْمُرْسَلِينَ فَقَالَ تَعَالَى: "يَا أَيُّهَا الرُّسُلُ كُلُوا مِنْ الطَّيِّبَاتِ وَاعْمَلُوا صَالِحًا"، (المؤمنون: 51) وَقَالَ تَعَالَى: "يَا أَيُّهَا الَّذِينَ آمَنُوا كُلُوا مِنْ طَيِّبَاتِ مَا رَزَقْنَاكُمْ" (البقرة: 173) ثُمَّ ذَكَرَ الرَّجُلَ يُطِيلُ السَّفَرَ أَشْعَثَ أَغْبَرَ يَمُدُّ يَدَيْهِ إِلَى السَّمَاءِ: يَا رَبِّ! يَا رَبِّ! وَمَطْعَمُهُ حَرَامٌ، وَمَشْرَبُهُ حَرَامٌ، وَمَلْبَسُهُ حَرَامٌ، وَغُذِّيَ بِالْحَرَامِ، فَأَنَّى يُسْتَجَابُ لَهُ؟."

رَوَاهُ مُسْلِمٌ

අල්ලාහ්ගේ දූතයාණන් ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

සැබැවින්ම අල්ලාහ් පිවිතුරුය. ඔහු පිවිතුරු දෑ මිස වෙනකක් පිළිගන්නේ නැත. සැබැවින්ම උත්තරීතර අල්ලාහ් කවර නියෝගයක් රසූල්වරුන්ට කර ඇත්තේද එයම දෙවියන් විශ්වාස කරන්නන් හටත් නියෝග කර ඇත. පසුව එතුමාණෝ (සූරතුල් මුඃමිනූන්හි 51 වන පාඨය) “අහෝ දූතවරුනි, පිවිතුරු දැයින් අනුභව කරනු දැහැමි ක්‍රියාවන් සිදු කරනු” යැයි පාරායනය කොට තවදුරටත් (සූරතුල් බකරා හි 173 වන පාඨය) අහෝ විශ්වාස කරන්නනි, අපි නුඹලාට පෝෂණය කළ පිවිතුරු දැයින් අනුභව කරනු” යන වැකිය අල්ලාහ් පවසන බව ප්‍රකාශ කර සිටියහ. පසුව තම හිසකෙස් අවුල් වී ගිය දිගු ගමනක නිරත වන මිනිසකු පිළිබඳ මෙනෙහි කළේය. ඔහු තම දෑත් අහස දෙසට දිගු කොට ‘අහෝ! මාගේ පරමාධිපතියාණනි, අහෝ! මාගේ පරමාධිපතියාණනි,

යැයි ප්‍රාර්ථනා කරයි. නමුත් ඔහුගේ ආහාරය අනුමත නොවූවකි. ඔහුගේ පානය අනුමත නොවූවකි. ඔහුගේ වස්ත්‍රය අනුමත නොවූවකි. ඔහු අනුමත නොවන හරාම් දැයින් වැඩී ඇත. එසේ නම් ඒ සඳහා ඔහුට පිළිතුරු සපයනු ලබනුයේ කෙසේද?

ඉමාම් මුස්ලිම් මෙම හදීසය දන්වා ඇත.

***

## -විග්‍රහය-

පිවිතුරු යන අදහසින් යෙදී ඇති 'අත්තය්යිබ්' නම් පදය මෙහි 'පාරිශුද්ධ' යන අර්ථයෙන් පිහිටා ඇත. එහි අර්ථය සැබැවින්ම අල්ලාහ් අඩුපාඩු සියල්ලෙන් පාරිශුද්ධය යන්නයි. උත්තරීතර අල්ලාහ් ඒ ගැන මෙසේ පවසයි: 'පාරිශුද්ධ -පිවිතුරු- කාන්තාවන් පාරිශුද්ධ -පිවිතුරු- පිරිමින් හට වෙති. ඔවුන් පවසන දැයින් ඔවුහු නිදොස් වූවෝ වෙති.'' (සූරා අන්-නූර් 26) ඉන් අදහස් කරනුයේ 'අශීලාචාර කිළිටි හා අයුතු දැයින් පාරිශුද්ධ වූවෝ' යන්නයි.

'ඔහු පිවිතුරු දෑ මිස වෙනකක් පිළිගන්නේ නැත.' යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

එහි අදහස: සැබැවින්ම අල්ලාහ් දානමාන කටයුතු අතුරින් පිවිතුරු හා අනුමත දෑ මිස වෙනකක් පිළි නොගන්නා බවයි.

'සැබැවින්ම අල්ලාහ් පිවිතුරුය. ඔහු පිවිතුරු දෑ මිස වෙනකක් පිළිගන්නේ නැත.' යන මෙම හදීසයේ අදහස ඊටත් වඩා පොදු වූවක් බව සඳහන් වී ඇත. එනම්: ක්‍රියාවන් අතුරින් මුහුණිච්චාව හා හාස්‍යය වැනි සියලුම අයහපත් කටයුතුවලින් පිවිතුරු වූ දෑ හැර වෙනත් කිසිවක් පිළිගන්නේ නැත. එමෙන්ම ධනයෙන් අනුමත පිවිතුරු දෑ හැර වෙනත් කිසිවක් පිළිගන්නේ නැත. එහෙයින් පිවිතුරු දෑ යනු එමගින් ක්‍රියාවන් ප්‍රකාශයන් හා විශ්වාසයන් යන කරුණු විස්තර කෙරේ. මේ සියල්ල යහපත් දෑ හා අයහපත් දෑ ලෙස කොටස් දෙකකට බෙදේ.

මුඃමින්වරයකුට පිවිතුරු ක්‍රියාවන් සිදු කිරීමට අවස්ථාව උදා කර දෙන වඩාත් වැදගත් කරුණ වනුයේ ඔහු ගන්නා පිවිතුරු ආහාරයයි. එමගින් ඔහුගේ ක්‍රියාවද පිරිසිදු වන්නේය. මෙම හදීසය 'අනුමත දෑ අනුභව කිරීමෙන් මිස සැබැවින්ම අල්ලාහ් ක්‍රියාවන් පිළිගන්නේ හෝ පිවිතුරු කරන්නේ හෝ නැත' යැයි පෙන්වා දෙයි. සැබැවින්ම තහනම් දෑ අනුභව කිරීම සිදු කරන ක්‍රියාවන් ව්‍යාර්ථ කරන අතර එය පිළිගනු ලැබීමද වළක්වාලයි. එම වාර්තාවෙන් පසු එතුමාණන් තවදුරටත්: "සැබැවින්ම අල්ලාහ් පිවිතුරුය. ඔහු පිවිතුරු දෑ මිස වෙනකක් පිළිගන්නේ නැත. සැබැවින්ම උත්තරීතර අල්ලාහ් කවර නියෝගයක් රසූල්වරුන්ට කර ඇත්තේද එයම දෙවියන් විශ්වාස කරන්නන් හටත් නියෝග කර ඇත." යැයි පවසා පසුව එතුමා (සූරතුල් මුඃමිනූන්හි 51 වන පාඨය) "අහෝ දූතවරුනි, පිවිතුරු දැයින් අනුභව කරනු දැහැමි ක්‍රියාවන් සිදු කරනු" යැයි පාරායනය කර (සූරතුල් බකරා හි 173 වන පාඨය) අහෝ විශ්වාස කරන්නනි, අපි නුඹලාට පෝෂණය කළ පිවිතුරු දැයින් අනුභව කරනු" යන වැකිය ද පාරායනය කර එසේ අල්ලාහ් පවසන බව ප්‍රකාශ කර සිටියහ.

ඉන් අදහස් කරනුයේ: සැබැවින්ම දූතවරුන් හා ඔවුන්ගේ සමූහයන් අනුමතව ඇති පිවිතුරු දෑ අනුභව කිරීමටත් දැහැමි ක්‍රියාවන් සිදු කිරීමටත් නියෝග කරනු ලැබ ඇති බවයි. අනුමත දෑ ආහාරයට ගන්නා තාක් කල් ක්‍රියාවන් විධිමත් මෙන්ම පිළිගැනීමට ලක් වනු ඇත. අනුමත නොවන දෙයක් ආහාරය සඳහා ගත් විට ක්‍රියාවන් කිසිසේත් ම පිළිගැනීමට ලක් නොවේ.!

ඉන් පසු ප්‍රාර්ථනා කර කර සිටියේ නම්, එම තහනම් කටයුත්ත සමග එය පිළිගනු ලබනුයේ කෙසේද? තහනම් ආහාර ගෙන සිදු කරන ක්‍රියාවන් පිළිගනු ලැබීමෙන් දුරස් වන බවට මෙය නිදසුනකි.

වහීබ් ඉබ්නු අල් වරිද් තුමා මෙසේ පවසයි: 'නුඹ මේ කුඹගස අතට ගත්තා නම් නුඹේ කුසට පිවිසෙන දෑ හලාල් ද හරාම් ද යන්න නුඹ අවධානයෙන් බලන තෙක් නුඹට කිසිවක් ප්‍රයෝජනවත් නොවන්නේය.'!

එමෙන්ම හරාම් මුදලින් දානමය කටයුතු සිදු කිරීම ද පිළිගනු නොලබන්නකි. සහීහ් මුස්ලිම්හි සඳහන් පරිදි: නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බව ඉබ්නු උමර් තුමා

විසින් වාර්තා කරන ලදී. ‘‘පිරිසිදුකමින් තොරව කරනු ලබන සලාතයක් හෝ වංචාවෙන් දෙනු ලබන දානයක් හෝ අල්ලාහ් පිළිගන්නේ නැත.[77]

අබූ දර්දා තුමා හා යසීද් ඉබ්නු අබී මය්සරා තුමා පිළිබඳ මෙසේ වාර්තා වී ඇත. සැබැවින්ම ඔවුන් දෙදෙනා අනුමත නොවන අයුරින් ධනය ලබා එමගින් දන් දෙන පුද්ගලයකුට උපමා වශයෙන් අනාථයකුගේ මුදල් ලබා එමගින් වැන්දඹුවකට අදින්නට සළස්වන අයකුගේ උපමාව ගෙන ඇත.

හසන් තුමා මෙසේ පවසයි: ‘අහෝ දුප්පතාට කරුණාව දක්වා ඔහු හට දන් දෙන්නනි, සැබැවින්ම ඔබ අපරාධ කළ අයට ඔබ කරුණා කරනු.’

පාලකයා හෝ ඔහුගේ නියෝජිතයින් හෝ පොදු අරමුදලෙන් අයුතු ලෙස මුදල් ලබා එමගින් දන් දුන්නේ නම් හෝ වහලෙකු නිදහස් කළේ නම් හෝ මස්ජිදයක් ඉදි කළේ නම් හෝ ඒ හැරුණු විට මිනිසුන්ට ප්‍රයෝජනවත් දෙයක් ඉටු කර දෙන්නේ නම් හෝ ඉබ්නු උමර් තුමාගේ ප්‍රකාශය පරිදි සැබැවින්ම ඔහු මංකොල්ල කරුවෙකු මංකොල්ල කෑ වස්තුවෙන් දන් දුන්නාක් මෙන් වන්නේය. එලෙසම ඔහු බසරාවෙහි පාලක අබ්දුල්ලාහ් ඉබ්නු ආමිර්ට මෙසේ පවසා සිටියේය: ඔහුගේ මරණය අවස්ථාවේ ජනයා ඔහු අබියසට රැස්වූවෝය. ඔහුගේ යහපත හා උපකාරය පිළිබඳ පැසසුම් කළෝය. ඉබ්නු උමර් තුමා නිහඬව සිටියේය. කතා කරන මෙන් ඔහුගෙන් ඉල්ලා සිටියේය. එවිට ‘වංචාවෙන් ගත් දැයින් දෙන දානය අල්ලාහ් පිළිගන්නේ නැත’ යන හදීසය පවසා සිටියහ.

‘අල් වරඃ’ නම් කෘතියෙහි අසද් ඉබ්නු මූසා තුමා මෙසේ පවසයි. ඉබ්නු ආමිර් තුමා අබ්දුල්ලාහ් ඉබ්නු උමර් තුමාට මෙසේ පැවසීය: අප ලිහිල් කරන මෙම දඬුවම අපි මතු කරන උල්පත් එහි අපට ප්‍රතිඵල ඇත්දැ?යි විමසා සිටියේය. එවිට ඉබ්නු උමර් තුමා: ඔබ නොදන්නෙහි ද සැබැවින්ම කිලිට්ටක් කිසිවිටෙක තවත් කිලිට්ටක් පහ කරන්නේ නැත.?

ඉබ්නු උමර් තුමා ඉබ්නු ආමිර් තුමාට මෙසේ පැවසීය. වහලුන් නිදහස් කිරීම ගැන ඔහු ඔහුගෙන් විමසා සිටියේය. ඔබට උදාහරණයක් වන්නේ හජ්වන්දනා කරුවකුගේ ඔටුවකු සොරකම් කර පසුව එමගින් අල්ලාහ්ගේ

77 මුස්ලිම් (224)

මාර්ගයේ සටන් කරන මිනසෙකුට සමාන උපමාවකි. එය පිළිගනු ලබන්නේ දැයි බලනු.?!

මිනිසුන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් පිරිනමන්නට යුක්ති ගරුක නායකයකු ඔවුනට අවශ්‍ය මස්ජිදයක් හෝ පාසලක් හෝ රෝහලක් හෝ එවැනි යම් දෙයක් ඉදි කර දෙන්නේ නම් එය පරිත්‍යාගයක් වනු ඇත.

"පසුව තම හිසකෙස් අවුල් වී ගිය දිගු ගමනක නිරත වන මිනිසකු පිළිබඳ මෙනෙහි කළේය. ඔහු තම දෑත් අහස දෙසට දිගු කොට 'අහෝ! මාගේ පරමාධිපතියාණනි, අහෝ! මාගේ පරමාධිපතියාණනි, යැයි ප්‍රාර්ථනා කරයි. නමුත් ඔහුගේ ආහාරය අනුමත නොවූවකි. ඔහුගේ පානය අනුමත නොවූවකි. ඔහුගේ වස්ත්‍රය අනුමත නොවූවකි. ඔහු අනුමත නොවන හරාම් දැයින් වැඩී ඇත. එසේ නම් ඒ සඳහා ඔහුට පිළිතුරු සපයනු ලබනුයේ කෙසේද?" යන (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

මෙම ප්‍රකාශයේ නබි (ﷺ) තුමා ප්‍රාර්ථනා කිරීමේ විනය, එය පිළිගැනීමට අවශ්‍ය වන හේතු සාධක හා එය පිළිගැනීමට බාධා වන කරුණු පිළිබඳ පෙන්වා දී ඇත්තාහ.

ප්‍රාර්ථනාව පිළිගැනීමට අවශ්‍ය කරුණු හතරක් සඳහන් වෙයි.

පළමුවැන්න: දිගු ගමනක නිරත වීම, අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් කළ වාර්තාවක නබි (ﷺ) තුමා පවසා සිටියාක් මෙන් ගමනක නිරත වීම ප්‍රාර්ථනා පිළිගැනීම අනිවාර්යය කරයි. එතුමාණන් මෙසේ පවසා සිටියහ: "කිසිදු සැකයකින් තොරව පිළිගනු ලබන ප්‍රාර්ථනාවන් තුනකි: අසාධාරණයට පත් වූ අයගේ ප්‍රාර්ථනාව, මගියාගේ ප්‍රාර්ථනාව හා පියකු තම දරුවා වෙනුවෙන් පතන ප්‍රාර්ථනාව." මෙය අබූ දාවූද්, ඉබ්නු මාජා හා තිර්මිදි යන ඉමාම්වරු[78] විසින් වාර්තා කර ඇත. ඉමාම් තිර්මිදි 'පියකු තම දරුවා මත කරන ප්‍රාර්ථනාව' යනුවෙන් සුළු වශයෙන් පද වෙනස් කර වාර්තා කර ඇත.

78. අබූ දාවූද් (1536), තිර්මිදි (3448), ෂෙයික් අල්බානී 'සහීහ් අත් තර්ගීබ්'හි (3132) මෙය හසන් ගණයට අයත් හදීසයක් බව සඳහන් කර ඇත.

ගමන දිගුවන තරමට ප්‍රාර්ථනාවට පිළිතුරු දෙනු ලැබීම සමීප වනු ඇත. ඊට හේතුව දිගු ගමනක නිරත වීමෙන් ආත්මාශාවන් බිඳ වැටීමටත්, දේශයෙන් හුදකලා වීමටත්, දුෂ්කරතා උසුලන්නටත් හේතු වන බැවිනි. ආත්මා ආශාවන් බිද වැටීම ප්‍රාර්ථනාව පිළිගැනීමට වඩාත් වැදගත් සාධකයක් වන්නේය.

දෙවැන්න: ඇඳුම් ඇදීමේ චාම්භාවය, හිසකෙස්වල ස්වභාවය, දූවිලි තැවරී තිබීම යනාදී කරුණු හට ගැනීම. එලෙස නබි (සල්ලල්ලාහු අලය්හි විසින්) ප්‍රකාශ කරනු ලැබූ ප්‍රසිද්ධ හදීසයක මෙසේ සඳහන් වී ඇත. “හිස කෙස් විකෘති වූ දූවිලි තැවරුණු දොරවල් වලට ගොඩ බසින කෙතරම් දෙනෙකු වෙත් ද අල්ලාහ් මත දිවුරා සිටයේ නම් වඩාත් යහපත් වනු ඇත.”[79]

තුන්වැන්න: තම දෙඅත් අහස දෙසට එසවීම. ප්‍රාර්ථනාව පිළිගනු ලබන්නට සාධකයක් වශයෙන් අපේක්ෂා කරනු ලබන එහි විනයන් අතුරින් එක් විනයකි. නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බව සල්මාන් තුමා විසින් වාර්තා කළ හදීසයක් මෙසේය. “සැබැවින්ම අල්ලාහ් ලැජ්ජා සහගත මෙන්ම උපකාර ශීලීය. මිනිසා තම දෙඅත් ඔහු වෙනුවෙන් ඔසවන විට ඒ දෙක හිස් අතින් හරවා එවන්නට ඔහු ලැජ්ජා වෙයි”[80] මෙය ඉමාම් අහ්මද්, අබූ දාවූද්, තිර්මිදි හා ඉබ්නු මාජා යන ඉමාම්වරු විසින් වාර්තා කර ඇත. නබි (ﷺ) තුමා වර්ෂාව පතා ඉටු කරන නැමදුමෙහි තම කිහිලි යට සුදු පැහැය පෙනෙන තරමට තම දෑස් ඔසවන්නෙකු වූහ. එමෙන්ම බද්ර් දිනයෙහිද දෙවියන්ට ආදේශ තබන්නන්ට විරුද්ධව තම උරහිස මත ඇති සාළුව වැටෙන තරමට අල්ලාහ්ගෙන් උදව් පතමින් තම දෑත් එසවූහ.

ප්‍රාර්ථනාවෙහි නබි (ﷺ) තුමා තම දෑත් එස වූ විවිධ ආකාරයන් පිළිබඳ මෙසේ වාර්තා වී ඇත.

- සැබැවින්ම එතුමා තම දබරැගිලිලෙන් පමණක් සංඥේතවත් කරමින් - අගවමින්- ප්‍රාර්ථන කර ඇත. එතුමා එය මින්බර් හෙවත් වේදිකාව මත

79. මුස්ලිම් (2622), අබූ හුරෙය්රා විසින් වාර්තා කළ හදීසයකි. සහීහ් සුනන් ඉබ්නු මාජා (6483)

80. අහ්මද් (5/438), අබූ දාවූද් (1488, තිර්මිදි (3556), ඉබ්නු මාජා (3865), ඉබ්නු හිබ්බාන් මෙය සහීහ් හදීසයක් බව දන්වා ඇත. (876), අල් හාකිම් (1/497), ‘සහීහ් අත් තර්ගීබ්’හි අල්බානි (1635).

සිටියදී හා තම වාහනයට නගින අවස්ථාවේදී එසේ සිදු කළ බව වාර්තා වී ඇත.

ඉබ්නු අබ්බාස් තුමා ඇතුළු තවත් පිරිසක් 'එය ප්‍රාර්ථාවේ අවංකභාවය වේ' යැයි පවසා ඇති අතර ඉබ්නු සීරීන් තුමා විසින් 'ඔබ අල්ලාහ්ට ප්‍රශංසා කරන විට එක් ඇඟිල්ලකින් අඟවන්න.' පවසා ඇති බව වාර්තා වෙයි.

- සැබැවින්ම එතුමා තම දැත් එසවීය. ඒ දෙකෙහි මතුපිට -එතුමා මුහුණලමින් සිටින- කිබ්ලා දිසාවට පිහිටන සේ හා ඒ දෙකෙහි ඇතුල් පැත්ත එතුමාගේ මුහුණට පරව තබා ගත්හ.

  ඇතැම් පෙර විසූ දැහැමි අයවලුන් පවසා සිටිනුයේ 'මේ අයුරින් එසවීම බැගෑපත් භාවය පෙන්වීමක් බවය.
- ඊට ප්‍රතිවිරුද්ධව තබා ගැනීම

  ඇතැමුන් මේ අයුරින් අත එසවීම අල්ලාහ්ගෙන් උදව් පැතීමක් හා ආරක්ෂාව පැතීමක් බව පවසයි.
- එතුමාගේ අල්ල අහස දෙසට පිහිටන සේ හා මතුපිට පොළොව වෙතට පිහිටන සේ එසවීම.

  ඉබ්නු උමර්, අබූ හුරෙය්රා හා ඉබ්නු සීරීන් වැනි අය විසින් 'සැබැවින්ම එයයි ප්‍රාර්ථනාව. අල්ලාහ්ගෙන් කණ්ණලව් කිරීම' යැයි පවසා ඇත.
- එයට ප්‍රතිවිරුද්ධ ලෙස එසවීම එනම් තම අත්දෙකෙහි අල්ල පෙරළා ඒ දෙකෙහි මතු පිට අහස දෙසටත් එහි ඇතුළත පොළොවට පරවත් තැබීම.

සහීහ් මුස්ලිම් හි සඳහන් වී ඇති පරිදි අනස් රළියල්ලාහු අන්හු තුමා මෙසේ වාර්තා කරයි: සැබැවින්ම නබි (ﷺ) තුමා වර්ෂාව පතමින් තම අත් දෙක අහසට එසවූහ. ඉමාම් අහ්මද් මෙය වාර්තා කර ඇති අතර එතුමාගේ තවත් ප්‍රකාශයක: තම දෙඅත් විහිදුවා ඒ දෙකෙහි මතුපිට අහසට පරව තබා ගත් බව සඳහන් වී ඇත.

ඉමාම් හුමයිදී: 'මෙයයි යාච්ඤා කිරීම' යැයි සඳහන් කර ඇත.

සිව්වැන්න: අල්ලාහ්ගේ 'රුබූබිය්යත්' හෙවත් පරමාධිපත්‍යය පිළිබඳ වාර ගණනක් මෙනෙහි කරමින් අල්ලාහ්ගෙන් බැගෑපත්ව ඉල්ලා සිටීම. මෙය ප්‍රාර්ථනාවට පිළිතුරු දීම සඳහා අපේක්ෂා කෙරෙන අති වැදගත් කරුණකි. අල් කුර්ආනයේ සඳහන් කරනු ලැබ ඇති ප්‍රාර්ථනාවන් ගැන සිතා බලන්නාට

බොහෝ විට එය ‘රබ්’ -පරමාධිපති- යන නාමයෙන් ආරම්භ කර තිබීම දැකිය හැක. ‘අපගේ පරමාධිපතියාණනි, මෙලොව යහපත හා මතුලොව යහපත අපහට පිරිනමනු මැනව! තවද අප නිරා ගින්නෙන් ආරක්ෂා කරනු මැනව!” (සූරා අල් බකරා :201), “අපගේ පරමාධිපතියාණනි අපට පෙර සිටියවුන් මත බර පැටවූවාක් මෙන අප මත බර නොපටවනු මැනව. තවද අපට දරා ගත නොහැකි දෑ ද අප මත නොපටවනු මැනව!” (අල් බකරා: 286), අපගේ පරමාධිපතියාණනි, ඔබ අපට (ඍජු) මග පෙන්වූවායින් පසුව අපගේ හදවත් ඔබ මුළාවට පත් නොකරනු මැනව!” (ආලු ඉම්රාන්: 8) අල් කුර්ආනයේ මෙවැනි ප්‍රාර්ථනාවන් බොහෝමයක් ඇත.

ප්‍රාර්ථනාවෙහි ‘යා සය්යිදී, මාගේ නායකයාණනි යැයි ප්‍රාර්ථනා කරන පුද්ගලයකු පිළිබඳ මාලික් තුමාගෙන් විමසන ලදී. එවිට එතුමා: නබිවරුන් තම ප්‍රාර්ථනාවන්හි පවසා සිටියාක් මෙන් ‘යා රබ්බි’ (මාගේ පරමාධිපතියාණනි) යනුවෙන් පවසත්වා” යැයි පිළිතුරු දී ඇත.

ප්‍රාර්ථනාව පිළිගැනීමට බාධා වන දෑ වනාහි:

සැබැවින්ම කෑමෙන් බීමෙන් ඇඳුමෙන් හා ආහාර වර්ගවලින් හරාම් දැහි ඉමහත් සේ ගැලී සිටීම යැයි නබි (ﷺ) තුමා පෙන්වා දී ඇත්තාහ. නබි (ﷺ) තුමාණෝ සඃද් තුමාට මෙසේ පවසා සිටියහ. “ඔබේ ආහාරය පිවිතුරු කර ගන්න. ඔබ ප්‍රාර්ථානව පිළිගනු ලබන්නෙකු බවට පත් වන්නෙහිය.[81]

හලාල් හෙවත් අනුමත දෑ අනුභව කිරීම පානය කිරීම පැළඳීම එමගින් ශරීරය වඩවා ගැනීම ප්‍රාර්ථනාවන් පිළිගැනීමට අනිවාර්යය හේතු වනු ඇත.

***

81. ‘අල් අව්සත්’හි ඉමාම් තබ්රානි (6491), ‘මජ්මඋස් සවාඉද්’හි අල් හය්සමී (10/291), තබරානි තුමා ‘අස්සගීර්හි’ද මෙය වාර්තා කර ඇති අතර පසුව ‘තවද මම ඔවුන් නොහඳුනන අයද එහි සිටි බව පවසා ඇත.

මෙම හදීසය ගැන මා පවසනුයේ: එය දුර්වල වුවත් සඳහන් කරන ලද තොරතුරු සහතිකය. ඊට හේතුව සඃද් ඉබ්නු වක්කාස් තුමා ප්‍රාර්ථාවන්ට පිළිතුරු සපයනු ලබන්නෙකු වූ බැවිනි. බලන්න: ‘සියරු අඃලාමින් නුබලාඉ’ (1/111 හා ඉන් පසු එන කරුණු)

“එසේ නම් ඒ සඳහා ඔහුට පිළිතුරු සපයනු ලබනුයේ කෙසේද?” යන සල්ලල්ලාහු අලය්හි වසල්ලම්ගේ ප්‍රකාශය වනාහි:

එහි අර්ථය: ඔහුට පිළිතුරු සපයනු ලබන්නේ කෙසේද? එය ප්‍රශ්නාර්ථයකි. එය මවිතය දනවන අයුරින් හා දුරස්බවක් පෙන්වා දෙමින් පිහිටා ඇත.

සැබැවින්ම තහනම් දෑ හි නිරත වීම පිළිතුරු ලැබීමට බාධකයක් වනු ඇත. අනිවාර්යය කටයුතු අතහැරීමද එලෙසමය. දෙවියන්ට අවනත වීමේ ක්‍රියාවල නිරත වීමෙන් ප්‍රාර්ථනාවට පිළිතුරු සපයනු ලැබීම අනිවාර්යය කරනු ඇත. ගුහාවට පිවිසුනු අය තමන් කළ දැහැමි කටයුතු පරදුවට තබා කණ්ණලව් කළ කල්හි ඔවුන් ආවරණය කළ කළු ගල ඉවත් වී ඔවුන්ගේ ප්‍රාර්ථානවට පිළිතුරු දෙනු ලැබ ඇත්තේ එබැවිනි.[82]

අබූ දර් තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: ආහාරයට ලුණු ප්‍රමාණවත් වනවාක් මෙන් ප්‍රාර්ථනාවට දැහැමි කටයුත්තක් ප්‍රමාණවත් වන්නේය. සලෆි වරුන් ඇතැමෙකු මෙසේ පවසයි: ඔබ පිළිතුරු ලබන්නට ප්‍රමාද යැයි දොස් නොකියන්න. මන්ද පාපකම් තුළින් එහි මාර්ග ඔබ වසා දමා ඇත.!

මෙම අර්ථයෙන් ඇතැම් කවීහු මෙසේ පවසා ඇත්තාහ.

සෑම ව්‍යසනයකදීම දෙවියන්ගෙන් අපි ප්‍රාර්ථනා කරන්නෙමු.

පසුව ව්‍යසනය ඉවත් වූ විට අපි ඔහු අමතක කර දමන්නෙමු.

ප්‍රාර්ථනාවට පිළිතුරු අපේක්ෂා කළ හැකි වන්නේ කෙසේද?

එම මාර්ග පාපයෙන් අපි වසා ඇත්තෙමු.

***

82 බුහාරි (3465), මුස්ලිම් (2743) ඉබ්නු උමර් තුමා විසින් වාර්තා කළ හදීසයකි.

## الحَدِيْثُ الحَادِي عَشَرَ

## එකොළොස් වන හදීසය

عن الحَسَنِ بنِ عَلِيٍّ سِبْطِ رَسُولِ الله ﷺ وَرَيْحَانَتِهِ رضي الله عنه قال :

حَفِظْتُ مِنْ رَسُول اللهِ ﷺ :

"دَعْ مَا يَرِيْبُكَ إِلَى مَا لاَ يَرِيبُكَ"

رواه النسائي والترمذي – وقال: "حسن صحيح"

අල්ලාහ්ගේ දූතයාණන්(ﷺ)ගේ මුණුබුරු හා එතුමාණන්ගේ පියුම වූ හසන් ඉබ්නු අලී (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. හෙතෙම මෙසේ පවසා සිටියේය: මම අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) ගෙන් කටපාඩම් කර ගත්තෙමි.

"ඔබට සැක ඇති කරන දෑ ඔබට සැක ඇති නොකරන තෙක් අතහැර දමනු."

මෙය ඉමාම් නසාඊ හා තිර්මිදි තුමා විසින් දන්වා ඇති අතර, පූර්ව සාධක සහිත හසන් ගණයට අයත් හදීසයකි.

***

-විග්‍රහය-

මෙම හදීසයේ අර්ථය: සැක සහිත තැන් වලදී නතර වීමටත් එයින් ආරක්ෂාවීමටත් යොමු කරවයි. සැබැවින්ම ශුද්ධ හලාල් හෙවත් ශුද්ධ අනුමත දෑ වනාහි එයින් දේව විශ්වාසියාගේ හදවතට කුතුහලය, කුකුස හා අනුමානය වැනි කිසිදු සැකයක් හට ගැන්නේ නැත. ඒ වෙනුවට ආත්මය ඒ ගැන සැනසිල්ලට පත් වෙයි. එමගින් හදවත තැන්පත් වෙයි. සැකසහිත දෑ

වනාහි එමගින් සැකයට තුඩු දෙන කුතුහලය හා කුකුස වැනි දෑ හදවතට ගට ගැනෙනු ඇත.

ෆුළෙයිය් තුමා මෙසේ පවසයි: "සැබැවින්ම භක්තිමත්කම වඩාත් බලවත් යැයි මිනිසුන් තරයේ විශ්වාස කරති. සැබැවින්ම මා වෙත කරුණු දෙකක් පැමිණි විට එයින් වඩාත් බලවත් හා විශ්වාසවන්ත දෑ මා අර ගනිමි. එහෙයින්, ඔබට සැක ඇති කරන දෑ සැකය නැතිකරන තෙක් අතහැර දමනු.

හස්සාන් ඉබ්නු අබී සිනාන් තුමා: 'භක්තිමත්භාවයට වඩා සැහැල්ලු කිසිවක් නැත. ඔබට යම් කිසිවක් සැකසහිත වූ විට ඔබ එය අතහැර දමනු' යැයි පවසා ඇත.

ඉමාම් හස්සාන් වැනි අයට එය ඉතා පහසු හා සැහැල්ලු කාර්යයක් වී ඇත.

හිෂාම් ඉබ්නු හස්සාන් තුමා: 'මුහම්මද් ඉබ්නු සීරීන් තුමා හතළිස් දහසක් අතහැර දමා ගියේය. අද දින එහි කිසිදු වරදක් ඔබ නොදකිනු ඇත !' යැයි පවසා ඇත.

යසීද් ඉබ්නු සුරෙය්ට තම පියාගේ උරුමයෙන් ලැබුණු ලක්ෂ පහක මුදලින් ඔහු ඉවත් විය. ඔහු එය කිසිවිටෙක ගත්තේ නැත. ඔහුගේ පියා පාලකයින්ගේ වැඩකටයුතු ඉටු කර දෙන අයෙකු වශයෙන් සිටි අතර යසීද් රට ඉදි කොළ විවීමේ සේවයේ නිරත විය. ඔහු මරණය දක්වාම එයින් පෝෂණය වූහ.

ආඉෂා රළියල්ලාහු අන්හා තුමිය විසින් වාර්තා කරන ලදී: සැබැවින්ම එතුමියගෙන් ඉහ්රාම් තත්ත්වයේ සිටින්නෙකු සඳහා දඩ මස් අනුභවය පිළිබඳ විමසන ලදී. එවිට ඇය: සැබැවින්ම එය දින කිහිපයක් පමණි. එහෙයින් 'ඔබට සැකයක් මතු වන දෑ ඔබ අතහැර දමන්න' යැයි පවසා සිටියාය.

මෙමගින් ඉස්මතු වන කාරණාවක් වනුයේ: විද්වතුන්ගේ මතභේදවලින් ඉවත්වීම වඩාත් සුදුසු බවයි. ඊට හේතුව සැක සහිත දැයින් එය වඩාත් දුරස් කරන බැවිනි. නමුත් -අපගේ මිතුරන් හා සෙසු- විද්වතුන් අතර සහතික කළ හැකි විද්වතුන් ප්‍රමාණයක් එය එසේ භාවිත කර නැත. එහෙයින් මතභේදාත්මක ගැටලු අතුරින් නබි (ﷺ) තුමා විසින් තහවුරු නොකරන ලද දෑ අවකාශයකි සහනයකි. එයට කිසිදු බාධාවක් නැත. එවන් අවකාශයන්

පිළිපැදීම ඉන් වැළකීමට වඩා යෝග්‍ය වන්නේය. මෙම අවකාශය නොවී නම් ඇතැම් විද්වතුන් අබිබවා ගොස් එය හේතු කොට ගෙන ඔවුන් එයින් වැළකී සිටිනු ඇත.

මෙහි සිහි බුද්ධියට ගත යුතු කරුණක් වනුයේ: සැකසහිත දැයින් වැළකී සිටීමේදී පිළිපදින සියුම් භාවය, එය දැහැමි වනුයේ තම සියලු තත්ත්වයන් ඍජුව පිහිටන හා තම ක්‍රියාවන් භක්තිමත් හා තැන්පත් කමට අනුකූලව පිහිටන අය හටය.

ප්‍රසිද්ධියේ තහනම් කරන ලද දෑ උල්ලංඝණය කිරීමෙහි වැටී, පසුව සැක සහිත සියුම් දැයින් ප්‍රවේසම් වන්නට අපේක්ෂා කරන්නෙකු වනාහි: සැබැවින්ම එය ඔහුට පිළිකුල් කරනු ලබනු ඇත. ඉරාක් වැසියන් මැස්සාගේ ලේ සම්බන්ධයෙන් ඉබ්නු උමර් තුමාගෙන් විමසා සිටි විට[83]: ඔවුන් මගෙන් මැස්සාගේ ලේ පිළිබඳ විමසා සිටිති. නමුත් ඔවුන් හුසෙයින් තුමාව ඝාතනය කළෝය යැයි පවසා නබි (ﷺ) තුමා 'ඒ දෙදෙනා මෙලොවෙහි මාගේ මල් වෙති යැයි පැවසූ බවට දන්වා සිටියේය.[84]

මිනිසෙකු බෂර් ඉබ්නු අල් හාරිස්ගෙන්: තමන්ට බිරියක් සිටින තම මව විසින් ඇයව දික්කසාද කරන්නැයි අණ කර සිටි මිනිසෙකු පිළිබඳ විමසා සිටියේය. එයට එතුමා: 'ඔහු සියලු කටයුතු වලදී ඔහුගේ මවට දැහිමි වන්නේ නම්, එමෙන්ම ඇයගේ දැහැමි භාවය ඔහුගේ බිරිය දික්කසාද කිරීමට පමණක් නොවී නම් එසේ සිදු කර ගනිත්වා. තම බිරිය දික්කසාද කිරීමට පමණක් ඔහු මව සමග දැහැමිව කටයුතු කර ඉන් පසුව ඇයට විරුද්ධව නැගී සිටින්නේ නම්, ඔහු එසේ සිදු නොකරත්වා' යැයි පවසා සිටියහ.

පළා විකුණන, පළා මිටි ගැට ගැසීම කොන්දේසියක් බවට පත් කරගත් මිනිසෙකු පිළිබඳ ඉමාම් අහ්මද්ගෙන් විමසා සිටින ලදී. එවිට අහ්මද්: මෙයත් ගැටළුවක් ද? යැයි පවසා සිටියේය. එවිට ඔහු ඉබ්‍රාහීම් ඉබ්නු අබී නුඅය්ම් යැයි

83. 'මගෙන් විමසා සිටියේය' යනුවෙන් අර්ථවත් වන 'යස්අලූනී' යන පදයත් එලෙසය. මුල් කෘතියේ - එනම් සහීහ් අල් බුහාරි හි සඳහන්ව ඇත්තේ 'යස්අලූන' යන පදයෙනි.

84. බුහාරි (3753)

ඔහුට පවසන ලදී. එවිට අහ්මද්: ඉබ්‍රාහීම් ඉබ්නු අබී නුඅය්ම් නම් එසේය. ඔහු එයට ගැලපෙන්නෙකි. යැයි පවසා සිටියේය.

මෙම ගැටලුව ඔහු එසේ පිළිකුල් කර සිටියේ එම තත්තවය නොගැලපෙන අයහටය. භක්තිමත් භාවයේ ඉතා සියුම්ව කටයුතු කරන්නන් වනාහි ඔවුන්ගේ තත්ත්වයට එය ගැලපෙන්නේය. ඉමාම් අහ්මද් තුමා ඔහුගේ සිත තුළ මෙම භක්තිමත්භාවය ක්‍රියා කරවන්නෙකු විය.

සැබැවින්ම ඔහු වෙනුවෙන් මේදය මිලට ගෙන එන මෙන් මිනිසෙකුට අණ කළේය. එවිට ඔහු එය කොළයක් මත තබා ගෙනාවේය. එම කොළය නැවත ව්‍යාපාරිකයා වෙත දෙන මෙන් අණ කළේය. ඉමාම් අහ්මද් තුමා ඔහුගේ මිතුරන්ගේ තීන්ත කුප්පියෙන් උදව් ගත්තේ නැත. ඔහු පිටත්ව යන විට තමන්ට උදව්වනු පිණිස තීන්ත කුප්පියක් රැගෙන ගියේය.

මිනිසෙකු ඔහුගේ තීන්ත කුප්පියෙන් ලියන්නට ඔහුගෙන් අනුමැතිය පැතීය. එවිට ඔහු දෙස බලා: 'ලියන්න. මෙය අඳුරු වැටුණු භක්තිමත් භාවයයි' යැයි පැවසුවේය.

තවත් කෙනෙකු ඔහුගෙන් අනුමැතිය පැතීය: එවිට ඔහු සිනහ වී මෙසේ පැවසීය: මාගේ භක්තිමත් භාවය හෝ ඔබේ භක්තිමත් භාවය මෙයට ලඟා වී නැත. ඔහු මෙසේ පවසා සිටියේ තම පහත්භාවය ඉස්මතු කරන අයුරිනි. එසේ නොවන්නට මෙම භක්තිමත්භාවය ඔහු තුළ ක්‍රියා කරමින් පැවතිනි. මෙම ස්ථාවරයට නොපැමිණි අයහට එලෙස කටයුතු කිරීම පිළිකුල් කළේය. ප්‍රසිද්ධියේ පවතින පිළිකුල් සහගත දෑ නොසළකා හැරිය අතර සැකසහිත දෑ තහනම් කිරීමකින් තොරව ඉදිරියට ගෙන ගියේය.

***

## الحَدِيْثُ الثَّانِي عَشَرَ

## දොළොස් වන හදීසය

عَنْ أَبِي هُرَيْرَةَ - رضى الله عنه - عَنِ النَّبِيِّ - ﷺ - قَالَ:
"مِنْ حُسْنِ إِسْلَامِ اَلْمَرْءِ: تَرْكُهُ مَا لَا يَعْنِيهِ"
حَدِيثٌ حَسَنٌ، رَوَاهُ اَلتِّرْمِذِيُّ وَغَيْرُهُ.

නබි (ﷺ) ප්‍රකාශ කළ බවට අබූ හුරෙය්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

"තමන්ට අවශ්‍ය නොවන දෑ අතහැර දැමීම පුද්ගලයකු සතු ඉස්ලාමයේ ගුණවත්බවින් එකකි."

හසන් වර්ගයට අයත් හදීසයකි. ඉමාම් තිර්මිදි ඇතුළු වෙනත් හදීස්වේදීන් ද මෙය වාර්තා කොට ඇත.

***

### -විග්‍රහය-

මෙම හදීසය අබූ හුරෙයිරා විසින් අබූ සල්මා ද ඔහු විසින් සුහ්රී ද ඔහු විසින් කුර්රත් ඉබ්නු අබ්දිර් රහ්මාන් ද ඔහු විසින් අව්සාඊ ද ලබා දන්වා ඇති අතර එම වාර්තාව තිර්මිදි හා ඉබ්නු මාජා යන ඉමාම්වරුන් විසින් පල කර ඇත. ඉමාම් තිර්මිදි මෙය 'ගරීබ්' ගණයට අයත් හදීසයක් බව සඳහන් කරයි.

කතෘතුමා මෙය හසන් ගණයේ හදීසයක් බව දන්වා සිටින අතර ඉබ්නු අබ්දුර් බර් තුමා: 'සුහ්රි විසින් වාර්තා වී ඇති මෙම හදීසය මෙම විශ්වසනීය වාර්තා සම්බන්ධතාවය තුළින් සුරක්ෂිතව පිහිටා ඇත' යනුවෙන් ප්‍රකාශ කර තිබීම කතෘ තුමා විසින් මෙය හසන් ගණයට අයත් හදීසයක් ලෙස කරන ලද ප්‍රකාශයට අනුගතව පිහිටා ඇත.

බහුතර විද්වතුන් පවසා සිටිනුයේ: එය සුරක්ෂිත වී ඇත්තේ මෙම වාර්තා සම්බන්ධතාවයෙන් නොව නබි (ﷺ) තුමා විසින් ලබා අලී ඉබ්නු හුසෙයින් විසින් වාර්තා කරන ලද මුර්සල් ගණයේ වාර්තා සම්බන්ධතාවයෙන් බවයි.

අලී ඉබ්නු හුසෙයින් විසින් වාර්තා කරන ලද මුර්සල් ගණයේ වාර්තා සම්බන්ධතාවයෙන් මිස නිවැරදි නොවන බව පවසන අය අතුරින් ඉමාම් අහ්මද්, යහ්යා ඉබ්නු මුර්න්, බුහාරි හා දාරුකුත්නි වැනි ඉමාම්වරුද ඇතුළත් වේ.

එහි නිවැරදි ප්‍රකාශය වනුයේ: එය මුර්සල් ගණයට අයත් යන්නයි.[85]

මෙම හදීසය විනයේ මූලධර්මයන් අතුරින් වූ ඉතා වැදගත් එකකි.

එහි අර්ථය වනුයේ: සැබැවින්ම යමෙක් තම ඉස්ලාමය අලංකාරවත් කර ගත්තේද ඔහු අනවශ්‍ය ක්‍රියා හා ප්‍රකාශ අතහැර දමා අවශ්‍ය ප්‍රකාශ හා ක්‍රියාවන් මත සීමා වීමය.

'අවශ්‍යතාව' යන තේරුම ගෙන දෙන 'යඃනීහ්' යන අරාබි පදයෙහි අදහස: යමක් පිළිබඳ තම අවදානය ඒ සමග සම්බන්ධ කර එය ඔහුගේ අපේක්ෂාව හා අරමුණ බවට පත් කර ගැනීමය. අවදානය යනු: යම් කරුණක් කෙරෙහි දක්වන දැඩි සැලකිල්ලයි.

ඉස්ලාමය යහපත් වූ විට: තමන්ට අවශ්‍ය නොවන තහනම් කරන ලද දෑ, සැක සහිත දෑ, හා පිළිකුල් සහගත දෑ මෙන්ම අනුමත වුවද එයින් තමන්ට අවශ්‍ය නොවන අමතර දෑ අතහැර දැමීමට නියම කෙරේ. සැබැවින්ම මුස්ලිම්වරයාගේ ඉස්ලාමය සම්පූර්ණ වී ඔහු ඉහ්සාන් නම් අදියර වෙත ළඟා වූ විට මේ සියල්ල ඔහුට අවශ්‍ය වන්නේ නැත.

---

85. මෙම ප්‍රකාශය නිවැරදිම ප්‍රකාශය විය හැක - සියල්ල මැනවින් දන්නා අල්ලාහ්ය.- අහ්මද්, ඉබ්නු මුර්න්, බුහාරි දාරු කුත්නි හා කතෘ හාෆිල් ඉබ්නු හජ්ර් වැනි හදීස් ධාරණය කළ ඉමාම්වරුන්ගේ ප්‍රකාශය එය බව මම දකිමි.

මා පවසා සිටිනුයේ: එය මුර්සල් ගණයට අයත් බව පවසනුයේ -ඉහත කී අය හැරෙන්නට- ඉමාම් තිර්මිදි, අල් හාෆිල් අල්-උකය්ලී හා ඉමාම් අල් බයිහකී යන අය වේ.

තමන්ට අනවශ්‍ය දෑ අතහැර දැමීම යන කාරණාවෙහි වැඩි වශයෙන් බලාපොරොත්තු වනුයේ: අනවශ්‍ය කතාබහෙන් දිව ආරක්ෂා කර ගැනීමය. උමර් ඉබ්නු අබ්දුල් අසීස් තුමා මෙසේ පවසා සිටියේය: 'තම කතාව ඔහුගේ යහපත් ක්‍රියාවෙන් එකක් ලෙස සලකන්නා ඔහුට අවශ්‍ය වන දෑහි මිස වෙනත් දෑහි ඔහු කතාව අඩු කර ගනී." එතුමා එසේ ප්‍රකාශ කළ සේම එය අනුමගනය කර ඇත්තේය. ජනයා අතුරින් බහුතරයක් දෙනා තම කතාව තමන්ගේ යහ ක්‍රියාවන්ගෙන් එකක් ලෙස සළකන්නේ නැත. එහෙයින් ඔවුන් එහි අවදානමට ලක් වන අතර ඒ ගැන විමර්ශනය කර නොබලයි.

ජනයා ඔවුන්ගේ කටයුතුවලදී කතා කරන බොහෝමයක යහපත නොමැති බව අල්ලාහ් අවධාරණය කර සිටියි: "ඔවුන්ගේ රහස් කතා අතුරින් බොහෝමයක යහපතක් නැත. (එහෙත්) දන්දීම හෝ යහකම් කිරීම හෝ ජනයා අතර සමතය ඇති කිරීම පිළිබඳ විධානය කරන්නෙකු(ගේ රහස් කතා) හැර. (සූරා අන් නිසා: 114)

උමර් ඉබ්නු කය්ස් අල් මලාඉය්යු තුමා: 'ජනයා ලුක්මාන් තුමා සමග සිටියදී මිනිසෙකු එතුමා අසළින් ගමන් ගත්තේය. එවිට ඔහු: ඔබ මේ ගෝත්‍රයේ ගැත්තෙකු නොවේදැ?යි විමසා සිටියේය. එවිට ඔහු 'එසේය' යැයි පිළිතුරු දුන්නේය. ඔහු: 'ඔබ මේ මේ කඳු අසල ගොපලු කටයුතු සිදුකරමින් සිටින්නෙහිය.' යැයි විමසීය. ඔහු 'එසේය' යැයි පිළිතුරු දුන්නේය. ඔහු: 'එසේ නම් මා දකින පරිදි ඔබට කුමක් සිදු වී ඇත්දැ?'යි විමසා සිටියේය. එයට ඔහු: 'කතාවෙහි සත්‍යතාවයත්, මට අවශ්‍ය නැති දැයින් මා දිගටම නිහඬව සිටීමත්' යැයි පවසා සිටියේය.

සහාබාවරුන් අතුරින් ඇතැමුන් රෝගාතුරුව සිටිය දී ඇතැමුන් ඔවුහු වෙත පැමිණ: ඔබේ මුහුණ ප්‍රසන්නව පැවතීමට හේතුව කුමක්දැ?යි විමසා සිටියෝය. එවිට: 'මා වෙත වඩාත් විශ්වසනීය ක්‍රියාවන් අතුරින් කරුණු දෙකක් විය. එනම්: මට අවශ්‍ය නැති දෑහි මම කතා නොකර සිටියෙමි. මාගේ හදවත මුස්ලිම්වරුන් පිළිබඳ නොවෙනස්ව පැවතුණි. යැයි ඔවුන් පවසා සිටියෝය.'[86]

86. යහපත විධානය කිරීම, අයහපතින් වැළැක්වීම, මිනිසුන් හැඩ ගස්වා ඔවුනට මග පෙන්වීම යනාදිය අති වැදගත් කරුණු බව ජනයා සිතන නමුත් මෙම පාඩමේ

## الحَدِيْثُ الثَّالِثُ عَشَرَ

## දහ තුන් වන හදීසය

عَنْ أَنَسِ بْنِ مَالِكٍ رَضِيَ اللهُ عَنْهُ عَنِ النَّبِيِّ ﷺ قَالَ:
"لَا يُؤْمِنُ أَحَدُكُمْ حَتَّى يُحِبَّ لِأَخِيهِ مَا يُحِبُّ لِنَفْسِهِ."
رَوَاهُ الْبُخَارِيُّ وَمُسْلِمٌ

අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) ප්‍රකාශ කළ බව අනස් ඉබ්නු මාලික් රළියල්ලාහු අන්හු තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී.

ඔබ අතුරින් කිසිවකු තමන් ප්‍රිය කරන දෑ තම සහෝදරයා වෙනුවෙනුත් ප්‍රිය කරන තෙක් ඔහු දෙවියන් විශ්වාස කරන්නෙකු නොවේ.

මෙය ඉමාම් බුහාරි හා මුස්ලිම් විසින් දන්වා ඇත.

***

### -විග්‍රහය-

මෙම හදීසය බුහාරි හා මුස්ලිම් යන සහීහ් ග්‍රන්ථ දෙකෙහිම සඳහන් වන්නේය. ඉමාම් අහ්මද් තුමා ද මෙය වාර්තා කර ඇති අතර එතුමා වාර්තා කළ පද පෙළ වනුයේ: “යහපතින් තමන් ප්‍රිය කරන දෑ ජනයා වෙනුවෙන් ද ප්‍රිය කරන තෙක් ගැත්තෙකු සැබෑ විශ්වාසය ළඟා කරගන්නේ නැත.” යන්නයි.

---

ගම්‍යව වී ඇති දෑ ග්‍රහණය කර ගන්නට සමත් වී නැත. එයින් ඉන් හැඩ ගැසීමට බැහැර වන්නේය. ඒ ගැන සෙවීමේදී ඒ සම්බන්ධයෙන් වූ ඍජු මූලාශ්‍ර සොයා යන්නේය. මෙම පාඩමේ හදීසයෙන් අපේක්ෂා කරනු ලබනුයේ: මිනිසාට අවශ්‍ය නොවන දැයින් අමතර ප්‍රකාශ, සොයා බැලීම් හා ක්‍රියාවන් යනාදිය අතහැර දැමීමය. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්-තරීෆි)

***

සහීහ් ග්‍රන්ථ දෙකෙහි සඳහන්ව ඇති වාර්තාවේ අර්ථය මෙම වාර්තාව පැහැදිලි කර සිටියි. 'විශ්වාසය නැතැ'යි යන්නෙන් අදහස් කරනුයේ: විශ්වාසය එහි සැබෑ යථාර්ථයෙන් හා එහි උපරිමයෙන් ඒ වෙත ලඟා වී නැතැයි යන්නයි.

ඉන් අදහස් කරනුයේ: අනිවාර්යය විශ්වාසයේ ඇතුළත් සමස්ත කරුණු අතුරින් පුද්ගලයකු තමන් ප්‍රිය කරන දෑ තම සහෝදර මුඃමින්වරයා වෙනුවෙන් ද ප්‍රිය කිරීම, එමෙන්ම තමන් පිළිකුල් කරන දෑ ඔහු වෙනුවෙන් පිළිකුල් කිරීම හා එය ඔහු තුළ නොමැති විටෙක ඔහුගේ විශ්වාසය එමගින් හීන වී යන බවය.

මුස්ලිම් හි නබි (ﷺ) තුමා පැවසූ බවට අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් ඉබ්නු අල් ආස් තුමා විසින් දන්වා ඇති වාර්තාවක් මෙසේ සඳහන් වී ඇත. 'නිරා ගින්නෙන් ඈත් වී ස්වර්ගයට පිවිසෙන්නට ප්‍රිය කරන්නා අල්ලාහ් හා අවසන් දිනය විශ්වාස කරමින් හා තමන් වෙත පිරිනමනු ලැබීම ගැන ප්‍රිය කරන දෑ අන් ජනයා වෙතත් ගෙන එමින් ඔහුගේ ඒ අපේක්ෂාව ලබා ගනිත්වා!'[87]

ඒ පිළිබඳ තවදුරටත් අබූ දර් විසින් වාර්තා කරන ලද සඳහනක් මෙසේය. අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) තුමා: අහෝ අබූ දර් සැබැවින්ම මම ඔබ ව දුර්වලයෙකු ලෙස දකිමි. මා වෙනුවෙන් මා කවර දෙයක් ප්‍රිය කරන්නේ ද එය ඔබ වෙනුවෙන් පිහිටීම ද සැබැවින්ම මම ප්‍රිය කරමි. 'දෙදෙනෙකු මත පාලන වගකීම නොදෙන්න. අනාථයාගේ ධනය භාර නොගන්න.'[88] එසේ එතුමා ඔහුට තහනම් කර සිටියේ ඔහුගේ දුර්වලකම දුටු බැවිනි.

මුහම්මද් ඉබ්නු වාසිඃ ඔහු සතු බූරුවෙකු විකුණුවේය. එවිට පුද්ගලයකු ඔහු දෙස බලා: එය මට දීමෙන් ඔබ තෘප්තිමත් වන්නෙහි දැ?යි විමසා සිටියේය. එවිට ඔහු: 'ඒ ගැන මම තෘප්තිමත් වී නම්, මම එය නොවිකුණමි.' සැබැවින්ම

87. දිගු හදීසයක සඳහන් වන මෙය ඉමාම් මුස්ලිම් විසින් පල කර ඇත. (1844)

88. මුස්ලිම් (1826)

තම සිතට තෘප්තිමත් වන දැයින් මිස තම සහෝදරයා වෙනුවෙන් තෘප්තිමත් නොවිය යුතු බව මෙය පෙන්වා දෙන්නේය.[89]

-අපි කතා කරමින් සිටින- අනස් තුමාගේ හදීසය, සැබැවින්ම මුඃමින්වරයා සතුටු වන දෙය තම සහෝදර මුඃමින්වරයාටද සතුටු කරවිය යුතු බවත් තමන් වෙනුවෙන් අපේක්ෂා කරන යහපත තම සහෝදර මුඃමින්වරයා වෙනුවෙන් ද ප්‍රිය කළ යුතු බවත් පෙන්වා දෙන්නේය. මේ සියල්ල ගෙන ආ හැක්කේ තම හදවත වංචාව, රැවටීම හා ඊර්ෂ්‍යාව වැනි දැයින් පූර්ණ ලෙස සුවපත් වීමෙන් පමණි. සැබැවින්ම ඊර්ෂ්‍යාව වනාහි, එසේ ඊර්ෂ්‍යා කරන්නා තුළ ඔහුට වඩා යමෙකු යහපතින් උසස් වීම හෝ ඔහුට සමාන වීම ගැන පිළිකුලක් ඇති කරලන්නේය. එය සැබැවින්ම ඔහු ඔහුගේ විශේෂත්වයන් තුළින් මිනිසුනට වඩා දක්ෂයකු වීමට ප්‍රිය කරන අතරම ඒ සම්බන්ධයෙන් ඔහු ඔවුන්ගෙන් වෙන් වන්නට බලන බැවිනි. නමුත් දේව විශ්වාසය එයට ප්‍රතිවිරුද්ධ දෙයක් ගෙන දෙන්නේය. එනම් එය දේව විශ්වාසවන්තයින් සියලු දෙනා අල්ලාහ් පිරිනමන යහපත් දැහි කිසිවක් අඩු නොකර එහි හවුල් කර ගනිති.

අලංකාරයේදී මිනිසුන් අතර තමන්ට වඩා කිසිවකු උසස් වීම ගැන පිළිකුල් කරන්නාට පාපයක් ඇති නොවන බව පෙන්වා දෙමින් සාධක පැමිණ ඇත. ඉමාම් අහ්මද් තුමා හා හාකිම් තුමා ඔහුගේ සහීහ් හි ඉබ්නු මස්ඌද් තුමා විසින් වාර්තා කළ හදීසයක් මෙසේ පල කර ඇත. එතුමා: මම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) වෙත පැමිණියෙමි. එතුමාණන් අබියස මාලික් ඉබ්නු මිර්වාද් අර්-රහාවීය්යි තුමාද විය. එවිට එතුමා පවසන දෑ මම ග්‍රහණය කර ගත්තෙමි. එනම්: අල්ලාහ්ගේ දූතයාණනි, ඔබ දකින අලංකාරය මට බෙදා දෙනු ලැබ ඇත. මිනිසුන් අතුරින් මාගේ පාවහන්වල පටි දෙකින් හෝ ඒ දෙකටත් වැඩියෙන් මට වඩා උසස් වන කිසිවකු මම ප්‍රිය නොකරමි. එය

89. ජරීර් ඉබ්නු අබ්දිල්ලාහ් අල් බජ්ලීගේ සිදු වීම මීට වඩා හාස්‍යය. ඔහුගේ සේවකයෙකු ඔහු වෙනුවෙන් කාසි තුන්සියකට අශ්වයකු මිලට ගත්තේය. ජරීර් තුමා එය දුටු කල්හි ඒ ගැන පුදුමයට පත්ව ව්‍යාපාරිකයාට අසාධාරණයක් සිදුව ඇත්තේදැයි බිය විය. පසුව ඔහු එම වෙළෙන්දා වෙතට ගොස් සැබැවින්ම ඔහුගේ අශ්වයා මීට වඩා අධික මිලකට වටින බව දන්වා සිටියේය. අවසානයේ කාසි අටසීයක් ඔහුට පිරිනමන තෙක් එසේ එහි වටිනාකම පවසමින් සිටියේය. බලන්න: ඉබ්නු හජර්ගේ ෆත්හුල් බාරී (1/168)

අපරාධයක් නොවේදැ?යි විමසා සිටියදී නබි (ﷺ) තුමා: "නැත එය අපරාධයක් නොවන්නේය. නමුත් අපරාධයක් වනුයේ කවරෙකු සත්‍ය පිළිගැනීමට උඩඟු වී -එසේ නැතිනම් සත්‍යය වසන් කර- මිනිසුනට අවමන් කරන්නේ ද ඔහුය.,[90] මෙහිදී උඩඟු කමින් හා අසාධාරණ ලෙසින් අලංකාරයේ කිසිවකු උසස් නොවන බැවින් එය පිළිකුල් සහගත නොවන බව සඳහන් වේ. අහංකාරය හා අපරාධය විග්‍රහ කර ඇත්තේ සත්‍යය පිළිගැනීමට උඩඟු වීම යන අර්ථයෙනි. එනම්, ඒ ගැන පවතින අහංකාර කම හා ඔහුගේ කැමැත්තට විරුද්ධ වූ විට උඩඟු කමින් එය පිළිගැනීමෙන් වැළකී සිටීමයි.

මෙහිදී ඇතැම් මුල්කාලීනයන් "යටත්භාවය: සත්‍ය ගෙන එන සෑම කෙනෙකුගෙන් එය කුඩා වුවද පිළිගැනීමයි." සත්‍යය ගෙන එන්නා කුඩා අයෙකු හෝ වැඩිහිටියෙකු වුවද ඔහු එය ප්‍රිය කරන්නක් හෝ ප්‍රිය නොකරන්නක් වුවද ඔහුගෙන් එය පිළිගන්නා යටහපත් භාවය ඇත්තෙකි. කවරෙකු අහංකාකරමින් සත්‍යය පිළිගැනීමට ප්‍රතික්ෂේප කරන්නේද ඔහු අහංකාරයෙකි.

ජනයා අවමන් කිරීම: එය ඔවුන් අපහාසයට පත් කිරීම හා ඔවුන් හැල්ලුවට ලක් කිරීමය. එය එසේ හට ගැනෙනුයේ තමන් දෙස පූර්ණවත් බැල්මකින් බලා සෙසු අය දෙස අඩුපාඩු සහිත බැල්මෙන් බැලීමෙනි.

***

සමස්තයක් ලෙස බලන කල, තමන් කැමති දෑ දෙවියන් විශ්වාස කරන සෙසු මුඃමින්වරුන් වෙනුවෙන් ද ප්‍රිය කිරීමත් තමන් පිළිකුන් කරන දෑ ඔවුන් වෙනුවෙන් ද පිළිකුල් කිරීමත් දේව විශ්වාසය ඇති මුඃමින්වරයාට අවශ්‍ය වන බවයි.

සැබැවින්ම අල්ලාහ් වෙනත් අයට වඩා යම් භාග්‍යයකින් තමන් සුවිශේෂී කර ඇති බවට පුද්ගලයකු දැන ගෙන ආගමික යහපත වෙනුවෙන් ඒ ගැන

90. අහ්මද් (1/385), අල් හාකිම් (4/182). මෙම හදීසය කතාවෙන් තොරව ඉමාම් මුස්ලිම් තුමා විසින් පල කර ඇත. එහි පද පෙළෙහි. 'සැබැවින්ම අල්ලාහ් අලංකාරය. ඔහු අලංකාරය ප්‍රිය කරන්නේය. අහංකාර කම යනු සත්‍යය වසන් කොට ජනයා අවමානයට පත් කිරීමය.

තොරතුරු ආශිර්වාදයන් පිළිබඳ කතා කිරීමේ ව්‍යූහයෙන් හා කෘතඥතාවීමෙහි ප්‍රමාණවත් නොවන බව හඟමින් දන්වා සිටින්නේ නම්, එය අනුමත වන්නේය. ඉබ්නු මස්ඌද් තුමා මෙසේ පවසා සිටියි: 'අල්ලාහ්ගේ ග්‍රන්ථය පිළිබඳ මට වඩා දන්නා හඳුනන කිසිවෙකු මා නොදනිමි.' අල්ලාහ් ඔහුට සුවිශේෂී වශයෙන් පිරිනමා ඇති දෑහි ජනයා හවුල් වීම ප්‍රිය කිරීම එය ඔහුව වැළැක්වූයේ නැත. ඉබ්නු අබ්බාස් තුමා: 'සැබැවින්ම මම අල්ලාහ්ගේ පුස්තකයෙන් වාක්‍යයක් ගෙනහැර පාමි. එහෙයින් මිනිසුන් සියලු දෙනා මා දැනගත් පරිදි ඒ ගැන ක්‍රියා කිරීම මම ප්‍රිය කරමි.' යැයි පවසා සිටියේය. ඉමාම් ෂාෆර් තුමා: 'මෙම දැනුම ජනයා හැදෑරීම මම ප්‍රිය කරමි. ඉන් කිසිවක් මා වෙත ආරෝපණය නොවිය යුතුය.' යැයි පවසා සිටියේය. උත්බත් අල් ගුලාම් තුමා උපවාසයෙන් මිදෙන්නට සිතූ විට, ඔහුගේ ක්‍රියාවන් දෙස බලා සිටින ඔහුගේ ඇතැම් සහෝදරයින් දෙස බලා 'මට හිමිවන කුසල් මෙන් ඔබටද (කුසල්) අත්වනු පිණිස. මා වෙත ජලය හෝ රට ඉදි ලබා දෙන්න. - මම එයින් උපවාසය මිදෙමි-' යනුවෙන් පවසන්නෙකු වූහ.

## الحَدِيْثُ الرَّابِعُ عَشَرَ

## දහ හතර වන හදීසය

عَنْ عَبْدِ اللهِ بْنِ مَسْعُوْدٍ رضي الله عنه، قَالَ: قَالَ رَسُولُ اللهِ ﷺ:

" لاَ يَحِلُّ دَمُ امْرِئٍ مُسْلِمٍ إِلاَّ بِإِحْدَى ثَلاَثٍ الثَّيِّبُ الزَّانِي وَالنَّفْسُ بِالنَّفْسِ وَالتَّارِكُ لِدِينِهِ الْمُفَارِقُ لِلْجَمَاعَةِ".

رَوَاهُ الْبُخَارِيُّ وَمُسْلِمٌ

අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) ප්‍රකාශ කළ බවට අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් රළියල්ලාහු අන්හු තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී.

කාමයේ වරදවා හැසිරුණු විවාහකයා, පණට පණ (ඝාතනය කිරීමෙන් මරණ දඬුවම නියම වූ පුද්ගලයා) සහ තම දහම අතහැර දමා සමාජය වෙන් කරන පුද්ගලයා යන තිදෙනාගෙන් අයකුගේ මිස වෙනත් කිසිදු මුස්ලිම්වරයකුගේ රුධිරය අනුමත නොවන්නේය.

මෙය ඉමාම් බුහාරි හා මුස්ලිම් විසින් දන්වා ඇත.

***

### -විග්‍රහය-

මෙම හදීසය ඉබ්නු අබ්බාස් විසින් මස්රූක් ද ඔහු විසින් අබ්දුල්ලාහ් ඉබ්නු මුර්රාද ඔහු විසින් අල් අඃමෂ් ද යන වාර්තා සම්බන්ධතාවෙන් බුහාරි හා මුස්ලිම් හි පළ වී ඇති හදීසයකි.

මුස්ලිම්හි සඳහන් වාර්තාවේ ‘තම දහම’ යන අර්ථය දෙන ‘ලි දීනිහි’ යන අරාබි පදය වෙනුවට ‘ඉස්ලාමය අතහරින්නා’ යන අර්ථය දෙන ‘අත්තාරිකු ලිල් ඉස්ලාම්’ යන පද පෙළ යෙදී ඇත.

මෙම අර්ථයෙන් වූ විවිධාකාර හදීස් වාර්තා වී ඇත.

මෙකී සෑම කරුණක් සඳහාම මරණ දඬුවම ඇති බව මුස්ලිම්වරුන් ඒකමතිකව පිළිගන්නා කරුණකි.

***

විවාහක පුද්ගලයකු කාමයේ වරදවා හැසිරීම වනාහි: ඔහු මිය යන තුරු ගල් ගසා මැරීම ඔහුට හිමි දඬුවම යන්නෙහි මුස්ලිම්වරු එකඟ වෙති. සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් විසින් මාඉස් හා අල් ඝාමිදිය්යාව[91] ගල් ගසා මරණ ලදී, එහි පද වෙනස් කරනු ලැබ අල් කුර්ආනයේ මෙසේ වී ඇත. 'වැඩිහිටි පිරිමියෙක් හා වැඩිහිටි කාන්තාවක් යන දෙදෙනා කාමයේ වරදවා හැසිරුණේ නම් කවර තත්ත්වයක වුව ද අල්ලාහ්ගෙන් වූ දඬුවමක් වශයෙන් ඔවුන් දෙදෙනාට ගල් ගසා මරා දමනු. තවද අල්ලාහ් සර්වබලධාරීය. මහා ප්‍රඥාවන්තය.[92]

***

පණට පණ යන ප්‍රකාශය වනාහි: එහි අර්ථය වැඩිවියට පත් අයෙකු කිසිදු උරුමයකින් තොරව උවමනාවෙන් ආත්මයක් ඝාතනය කළ විට ඔහු ද එසේ ඝාතනය කරනු ලැබීමය. එයට සාධක වශයෙන් කුර්ආනයේ සඳහන් වන

91. මාඉස්: ඔහු මාලික් අල් අස්ලමීගේ පුතණුවන්ය. ඝාමිදිය්යා: ඝාමිදී ගෝත්‍රික කාන්තාවකි. ඔවුන් දෙදෙනාගේ කතා වස්තුව වෙන් වෙන් වූ කතා වස්තු දෙකකි.

මාඉස්ගේ කතා වස්තුව බුහාරි හා මුස්ලිම්හි සඳහන් වන අතර ඝාමිදිය්යාගේ කතා වස්තුව මුස්ලිම්හි පමණක් සඳහන්ව ඇත. මුස්ලිම් තුමා මෙම කතා දෙකම එකට ගොනු කර හදීස් අංක 1690 යටතේ වාර්තා කොට ඇත.

92. උබය් ඉබ්නු කඃබ් තුමා විසින් සුර් ඉබ්නු හුබෙයිස් තුමා ලබා ඔහු විසින් කරන ලද වාර්තාවක් ඉබ්නු හිබ්බාන්හි (4428 - ඉහ්සාන්) මෙසේ පල වී ඇත. උබය් ඉබ්නු කඃබ් තුමා සුර් ඉබ්නු හුබෙයිස් තුමා බලා: සූරා අල් අහ්සාබ් හි (ආයාත්) ගණන කීය දැයි විමසීය. ඔහු: හැත්තෑ තුනකි යැයි පැවසීය. උබය්: දිවුරනු ලබන්නා මත දිවුරා පවසමි. එය සූරතුල් බකරාවෙහි තරමට පිහිටිය ද සැබැවින්ම මම එයින් රජ්ම් හි ආයතය එනම්: 'වැඩිහිටි පිරිමියෙක් හා වැඩිහිටි කාන්තාවක් යන දෙදෙනා කාමයේ වරදවා හැසිරුණේ නම් කවර තත්ත්වයක වුව ද අල්ලාහ්ගෙන් වූ දඬුවමක් වශයෙන් ඔවුන් දෙදෙනාට ගල් ගසා මරා දමනු. තවද අල්ලාහ් සර්වබලධාරීය. මහා ප්‍රඥාවන්තය.' යන ආයතය කියවමි. යැයි පැවසීය.

අල්ලාහ්ගේ ප්‍රකාශ මෙසේය. "අපි ඔවුනට එහි නියම කළෙමු සැබැවින්ම පණක් වෙනුවෙන් පණක් ද ...." (අල් මාඉදා 45), "අහෝ විශ්වාස කළවුනි, ඝාතනයක් විෂයයෙහි සමප්‍රතිචාර දැක්වීම නුඹලාට නියම කර ඇත. නිදහස් පුද්ගලයකු වෙනුවෙන් නිදහස් පුද්ගලයකු ද වහලෙකු වෙනුවෙන් වහලෙකු ද කාන්තාවක් වෙනුවෙන් කාන්තාවකු ද වේ." (අල් බකරා:178)

දහම අතහැර දමා සමාජය වෙන් කරන පුද්ගලයා වනාහි: ඉන් අදහස් කරනුයේ: ඉස්ලාමය අතහැර දමා, ඉන් ඉවත් වී මුස්ලිම් සමාජය බෙදා වෙන් කරන උදවියයි. සාක්ෂියේ ප්‍රකාශ දෙකට අයත් අය අතුරින් තම ප්‍රාණය අනුමත වන්නන් සමග ඔහු ව්‍යතිරේකයක් බවට පත්ව ඇත්තේ ආගම වෙනස් කිරීමට පෙර ඔහු සිටි තත්ත්වය සැලකිල්ලට ගෙනය. ඉන් පසුව ද ඔහුට ඉස්ලාමයේ නීතිය අනිවාර්යය වනු ඇත. එහෙයින් ඔහු පශ්චාත්තාප වී සමාව අයැද සිටින මෙන් ඉල්ලා සිටිනු ලැබේ. එමෙන්ම නැවතත් ඉස්ලාමය වෙත පැමිණෙන මෙන් ද ඉල්ලා සිටිනු ලැබේ. ඔහු සාක්ෂියේ ප්‍රකාශ දෙක පිළිගත් තත්ත්වයේ නැවතත් ඔහුගේ දහම අතහැර සමූහයා වෙන් කිරීමේ කටයුතුවල නිරත වී ඇත. එමෙන්ම ඉස්ලාමයේ ඇති මූලිකාංගයන් අතුරින් යමක් ප්‍රතික්ෂේප කිරීම, අල්ලාහ්ට හා ඔහුගේ දූතයාණන්ට දොස් පැවරීම, ඇතැම් මලක්වරුන් ප්‍රතික්ෂේප කිරීම, නබිවරුන් ප්‍රතික්ෂේප කිරීම, අල් කුර්ආනයේ සඳහන් කරන ලද දේව පුස්තක පිළිබඳ මනා දැනුමක් තිබියදී එය ප්‍රතික්ෂේප කිරීම, අල් කුර්ආනයට අපහාස වන අයුරින් කටයුතු කර එය අපිරිසිදු ස්ථානවල දැමීම, සලාතය වැනි දහම තුළ අත්‍යවශ්‍ය කරණු දැන ගැනීම ප්‍රතික්ෂේප කිරීම හා මෙවැනි ඉස්ලාමයෙන් බැහැර ක්‍රියාවන් සිදු කර ඉස්ලාමයට එරෙහිව වාද කර ඇත.

මේ සම්බන්ධයෙන් පිරිමියා හා කාන්තාව අතර වෙනසක් නැති බව බහුතර විද්වතුන්ගේ මතයයි.

'දහම අතහැර දමා සමාජය වෙන් කරන පුද්ගලයා' යන නබි තුමාගේ ප්‍රකාශය වනාහි සැබැවින්ම ඔහු පාපක්ෂමාව අයැද නැවත ඉස්ලාමය වෙත පැමිණියේ නම් මරණ දඬුවම ඔහුට ක්‍රියාත්මක කරනු නොලබන බවයි. හේතුව ඔහු නැවත පැමිණීමෙන් පසු තම දහම අතහැර දමනනෙකු හෝ සමාජය වෙන් කරන්නෙකු නොවන බැවිනි.

***

## الحَدِيْثُ الخَامِسُ عَشَرَ
## පහළොස් වන හදීසය

عن أَبِيْ هُرَيْرَةَ رضي الله عنه، أَنَّ رَسُولَ اللهِ ﷺ قَالَ :

"مَنْ كَانَ يُؤْمِنُ بِاللهِ وَاليَومِ الآخِرِ ، فَلْيَقُلْ خَيْراً أَوْ لِيَصْمُتْ، وَمَنْ كَانَ يُؤْمِنُ باللهِ وَاليومِ الآخِرِ ، فَلْيُكْرِمْ جَارَهُ ، وَمَنْ كَانَ يُؤْمِنُ باللهِ وَاليَومِ الآخِرِ ، فَلْيُكْرِمْ ضَيْفَهُ."

رَوَاهُ البُخَارِيُّ وَمُسْلِمٌ

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

කවුරුන් අල්ලාහ් හා පරමාන්ත දිනය විශ්වාස කරන්නේද ඔහු යහපතම කතා කරත්වා එසේ නැතහොත් නිහඬව සිටිත්වා. කවුරුන් අල්ලාහ් හා පරමාන්ත දිනය විශ්වාස කරන්නේද ඔහු තම අසල්වැසියාට ගරු කරත්වා, කවුරුන් අල්ලාහ් හා පරමාන්ත දිනය විශ්වාස කරන්නේද ඔහු තම ආගන්තුකයාට සත්කාර කරත්වා.

මෙය ඉමාම් බුහාරි හා මුස්ලිම් විසින් දන්වා ඇත.

***

## -විග්‍රහය-

"කවුරුන් අල්ලාහ් හා පරමාන්ත දිනය විශ්වාස කරන්නේද"[93] ඔහු මේ මේ දේ කරත්වා යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි: සැබැවින්ම මෙම කරුණු ඊමානයේ කරුණු අතරින් වන්නේ යැයි පෙන්වා දෙයි.

සැබැවින්ම සියලු ක්‍රියාවන් දේව විශ්වාසය තුළට ඇතුළත් වන බව ඉහතින් සඳහන් වී ඇත. විශ්වාසයේ ක්‍රියාවන් විටෙක, අනිවාර්යය කටයුතු ඉටු කිරීම තහනම් දැයින් වැළකීම වැනි අල්ලාහ්ට කළ යුතු යුතුකම් හා වගකීම් සමග බැඳේ. යහපත් දෑ කතා කිරීම හා ඒ හැර වෙනත් දෑ කතා කිරීමෙන් නිහඬවීම ද ඒවායින් එකකි.

විකෙට ආගන්තුකයින්ට සත්කාර කිරීම, අසල්වැසියාට ගරු කිරීම, ඔහුට හිංසා කිරීමෙන් වැළකීම වැනි ඔහුගේ ගැත්තන්හට කළ යුතු යුතුකම් හා වගකීම් සමග බැඳේ. මෙම කරුණු තුන දේව විශ්වාසවන්තයා වෙත අණ කරනු ලැබ ඇත.

ඒවායින් පළමුවැන්න: යහපත් දෑ කතා කිරීම හා ඒ හැර වෙනත් දෑ කතා කිරීමෙන් නිහඬ වීමයි.

අස්වද් ඉබ්නු අස්රම් අල් මහාරිබිය්යි තුමාගේ හදීසයක් ඉමාම් තබරානී විසින් මෙසේ වාර්තා කර ඇත. එතුමා: අල්ලාහ්ගේ දූතයාණනි, ඔබ මට උපදෙස් දෙන්නැයි මම අසා සිටියෙමි. එතුමාණන්: "ඔබේ දිව ඔබ සතුව තිබේදැ?"යි විමසූහ. එයට ඔහු: 'මාගේ දිව මා සතුව නොමැති නම් මා සතුව ඇත්තේ කුමක් දැ?යි' පැවසීය. එතුමාණන්: "ඔබේ අත ඔබ සතුව තිබේ දැ?"යි විමසූහ. එයට ඔහු: 'මගේ අත මා සතුව නොමැති නම් මා සතුව ඇත්තේ කුමක් දැ?'යි පැවසීය. එතුමාණන් "එසේ නම් ඔබේ දිවෙන් යහපත හැර වෙන කිසිවක්

93. ඉන් අදහස් කරනුයේ විශ්වාසයේ පරිපූර්ණතාවයයි. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්-තරීෆී)

නොපවසන්න. ඔබේ අත යහපත් දේ වෙත මිස දිගු නොහරින්න.'' යැයි පවසා සිටියහ.[94]

දිව තැන්පත්ව තබා ගැනීම දේව විශ්වාසයේ අංගයක් බව පෙන්වා දෙමින් කරුණු පැමිණ ඇත. නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බව අනස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් 'මුස්නද්' හි මෙසේ සඳහන් වේ. ''ගැත්තෙකුගේ දේව විශ්වාසය ඔහුගේ හදවත තැන්පත් වන තෙක් තැන්පත් වන්නේ නැත. ඔහුගේ හදවත ඔහුගේ දිව තැන්පත් වන තෙක් තැන්පත් වන්නේ නැත.''[95]

එහි නබි (ﷺ) තුමා පැවසූ බවට ප්‍රකාශිත අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් තුමා විසින් වාර්තා කරන ලද තවත් හදීසයක් මෙසේ සඳහන් වී ඇත. ''කවරෙකු නිහඬ වූයේ ද ඔහු ජය ලැබීය''[96]

නබි (ﷺ) තුමා පැවසූ බවට අබූ හුරෙය්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් බුහාරි හා මුස්ලිම්හි මෙසේ සඳහන් වී ඇත. ''සැබැවින්ම මිනිසා වචන තෙපලයි. එහි ඇති දෑ කුමක්දැ?යි ඔහුට පැහැදිලි නොවේ.

94. 'අල් කබීර්හි' (817) ඉමාම් තබරානී විසින් මෙය පළ කර ඇත. ඉමාම් අල්බානී තුමා මෙය 'අස්සිල්සිලතුස් සහීහ්' හි (1560) පළ කර ඇති අතර එහි වාර්තා සම්බන්ධතාව ගෙන හැර පාමින් මෙය නිවැරැදි වාර්තා සම්බන්ධතාවක් බවත් මෙහි සඳහන් පුද්ගලයින් සියලු දෙනා විශ්වසනීය අයලුවන් බවත් පවසා ඇත.

95. ඉමාම් අහ්මද් (3/198) එහි අවසානයේ ''තම හිංසනයෙන් තම අසල්වැසියා ආරක්ෂාව නොලබන පුද්ගලයා ස්වර්ගයට පිවිසෙන්නේ නැත.''

අෂ්-ෂෙයික් අල්බානි 'සහීහ් අත්-තර්ගීබ් වත් තර්හීබ්'හි (554, 2765) මෙය හසන් ගණයට අයත් බව සඳහන් කර ඇතැයි මම පවසා සිටිමි.

96. අහ්මද් (2/177), තිර්මිදි (2501), එම වාර්තා සම්බන්ධීකරණයන් අතර අබ්දුල්ලාහ් ඉබ්නු ලුහයිආද කෙනෙකි. එබැවින් 'තක්රීජ් අහාදීසුන් ඉහ්යා'හි (2526) අල් ඉරාකී සඳහන් කර ඇත්තේ: ඉමාම් තිර්මිදි තුමා එය දුර්වල වාර්තා සම්බන්ධතාවකින් පළ කර ඇති බවයි. එය තබාරනිහි ඉතා යහපත් වාර්තා සම්බන්ධතාවකින් යුතුව සඳහන්ව ඇත.)

එමගින් ඔහු පෙර අපරදිග අතර තරමට දුරසක් නිරා ගින්නට ලිස්සා යනු ඇත.[97]

නබි (ﷺ) තුමා පැවසූ බවට අබූ හුරෙයි්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ තවත් හදීසයක් ඉමාම් අහ්මද් හා තිර්මිදී මෙසේ පල කර ඇත. “සැබැවින්ම මිනිසා වචන කතා කරයි. එහි (හොඳ නරක පිළිබඳ) වරදක් නොදකී. ඒ හේතුවෙන් ඔහු නිරා ගින්නේ වසර හැත්තෑවක් පහතට වැටෙනු ඇත.[98]

නබි (ﷺ) තුමා පැවසූ බවට අබූ හුරෙයි්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් කළ තවත් වාර්තාවක් බුහාරිහි මෙසේ සඳහන් වේ. “සැබැවින්ම මිනිසා අල්ලාහ්ට තෘප්තිමත් වන වචන කතා කරයි. එහි බලපෑමක් ඇති බව නොසිතයි. අල්ලාහ් එමගින් ඔහුගේ තරාතිරම උසස් කරනු ඇත. සැබැවින්ම ගැත්තෙකු අල්ලාහ්ට කෝප වන වචන කතා කරයි. එහි බලපෑමක් ඇති බව නොසිතයි. එමගින් ඔහු නිරයට ඇද වැටෙනු ඇත.[99]

“ඔහු යහපතම කතා කරත්වා එසේ නැතහොත් නිහඬව සිටිත්වා.” යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි: කතා කිරීම හෝ නිහඬව සිටීම සමානය යන්නට මෙහි කිසිදු කතාවක් නැත. එකක් එය යහපතක් වී නම්. එය කතා කිරීමට අණ කරනු ලබන්නකි. එසේ නැතහොත් යහපතින් තොර වී නම් ඒ ගැන නිහඬවීමට අණ කරනු ලබන්නකි. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි. “දකුණු පසින් ද වම් පසින්ද හිඳ සටහන් කරන දෙදෙනා සටහන් කරන අවස්ථාව (සිහිපත් කරවු). ඔහු (මිනිසා) අබියස සිටින නිරීක්ෂකයකු (සටහන් කිරීමට) සූදනාමින් සිටීම මිස ඔහු කිසිදු වදනක් උච්චාරණය නොකරයි.” (සූරා කාෆ් 17,18) ඔහුගේ දකුණින් සිටින්නා යහපත සටහන් කරන්නා බවත් ඔහුගේ වමතින් සිටින්නා අයහපත සටහන් කරන්නා බවත් මුල් කාලීන දැහැමියන් ඒකමතිකව පවසා ඇත. අබූ උමාමාගේ මර්ෆූඃ ගණයට අයත් එම

97. බුහාරි (6477), මුස්ලිම් (2988).

98. අහ්මද් (2/236), තිර්මිදි (2314), ඉබ්නු මාජා (3970), අල්-අල්බානී තුමා ‘සහීහ් අත්-තර්ගීබ් වත් තර්හීබ් හි මෙය පූර්ව සාධක සහිත හදීසයක් බව සහතික කර ඇත.

99. බුහාරි (1478)

හදීසය වාර්තා කරනු ලැබ ඇත්තේ දුර්වල වාර්තා සම්බන්ධතාවක් සහිතවය.[100] එමෙන්ම හුදෙය්ෆා තුමාගේ මර්ෆූඃ ගණයට අයත් හදීසයක මෙසේ වාර්තා කරනු ලැබ ඇත. "සැබැවින්ම ඔහුගේ දකුණින් යහපත සටහන් කරන්නා සිටියි"[101]

කතා කරන සෑම දෙයක්ම ලියනු ලබන්නේ ද? එසේ නැතහොත් කුසල් හා දඬුවම ඇති දේ පමණක් හැර වෙනත් දෑ ලියනු නොලබන්නේ ද යන්න ගැන ප්‍රසිද්ධ ප්‍රකාශ දෙකක් මත විද්වතුන් මතභේද පල කරති.

ඉබ්නු අබ්බාස් තුමා විසින් ලබා අලී ඉබ්නු අබී තල්හා මෙසේ පවසයි: 'කතා කරන සෑම යහපතක්ම හා අයහපතක්ම ලියනු ලැබේ. එය 'මම කෑවෙමි, මම බිව්වෙමි, මම ගියෙමි, මම ආවෙමි යන ඔහුගේ ප්‍රකාශය ද ලියනු ලැබේ. එය බ්‍රහස්පතින්දා දිනයක වූවක්ද යන්නෙන් ද ලියනු ලැබේ. ඔහුගේ කතාව හා ඔහුගේ ක්‍රියාව ඉදිරිපත් කරනු ලැබේ. එහි ඇති යහපත හා අයහපත පිළිගන්නට සළස්වා ඒ හැර සෙසු දෑ ඉවත දමනු ලැබේ. ඒ පිළිබඳ උත්තරීතර අල්ලාහ්ගේ ප්‍රකාශය මෙසේය. "අල්ලාහ් අභිමත කරන දෑ (එයින්) මකා දමන්නේය. තවද ඔහු (අභිමත කරන දෑ) ස්ථාවර කරන්නේය. තවද මව් පුස්තකය ඇත්තේ ඔහු අබියසය." (සූරා අර්-රඃද් 39)

යහ්යා ඉබ්නු අබී කසීර් තුමා විසින් වාර්තා කරන ලදී. 'මිනිසෙකු බූරුවකු පිට නැග ගමන් ගත්තේය. පසුව ඔහු ඌ සමගම බිම ඇද වැටුනේය. එවිට ඔහු: 'බූරුවා අභාග්‍ය විය' යැයි පැවසීය. එවිට දකුණු පැත්තේ සිටි සගයා: කවර කරුණක් යහපත් ද එය මම ලිව්වෙමි. යැයි පැවසුවේය. වම් පස සිටින සගයා: කවර කරුණක් අයහපත් ද එය මම ලිව්වෙමි යැයි පැවසුවේය. එවිට දකුණු පස සගයා කවර කරුණක් අතහැරියේ ද එය ඔබ සටහන් කර ගනු යැයි

100. 'අල්-කබීර්' හි (8/191) ඉමාම් තබරානී විසින් වාර්තා කර ඇත.

101. හුදෙයිෆා තුමා විසින් වාර්තා කළ මෙම හදීසය මව්කූෆ් හා මර්ෆූඃ ලෙසින් ඉබ්නු ෂීබා තුමා විසින් පල කර ඇත. මා පවසා සිටිනුයේ: මව්කූෆ් ලෙස පිහිටි වාර්තාව වනාහි, එහි වාර්තා සම්බන්ධතාව හිරු මෙන් පැහැදිලිය, නිවැරදිය. මර්ෆූඃ ලෙස වාර්තාව වනාහි: එහි අබූ බක්ර් අය්යාෂ්, ආසිම් ඉබ්නු අබින් නුජූද් යන අය ද වෙති. ඔවුන් දෙදෙනා පිළිබඳ ඔවුන් දෙදෙනාගේ ධාරණය පිළිබඳ කතාබහට ලක්ව ඇත. මෙම ප්‍රකාශය මර්ෆූඃ ගණයට අයත් යැයි පැවසීම ගැටළු සහගතයි. සියල්ල මැනවින් දන්නා අල්ලාහ්ය.

අල්ලාහ් වම් පස සිටින සගයා වෙත දේව පණිවිඩ එව්වේය. එවිට බූරුවා අභාග්‍ය විය යැයි පැවසීම අයහපත් දෑ අතරට තහවුරු විය.

මෙය මතු පිටින් පෙනෙන්නේ කවර කරුණක් යහපත් නොවන්නේද එයට දඬුවම් කරනු නොලැබුණ ද එය අයහපතක් වන බවයි. සැබැවින්ම ඇතැම් පාපකම් සඳහා දඬුවම් කරනු නොලබනු ඇත. මහා පාපයන්ගෙන් වැළකී සිටීමෙන් ඒවාට ප්‍රතිකර්ම ඇති වන්නේය. නමුත් එම කාලය ව්‍යාජ දෑහි ගත කළ අයුරින් එයට අදාළ වූ පුද්ගලයා එම කාලය නාස්ති කර ගත්තේය. මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ එය ඔහුට අවාසියක් මෙන්ම පසුතැවිල්ලක් වනු ඇත. එය ද එක් වර්ගයක දඬුවමකි.

නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බව අබූ හුරෙය්රා රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් ඉමාම් අහ්මද් හා අබූ දාවූද් විසින් මෙසේ පළ කර ඇත. "අල්ලාහ්ගේ නාමය එහි සඳහන් නොකරන සභාවකින් නැගිට යන පිරිසක් බූරුවකුගේ කුණු වූ මළකඳකින් නැගිට ගියේ මිස නැත. ඔවුනට එය පාඩුවකි." මෙය ඉමාම් තිර්මිදි තුමාද වාර්තා කර ඇති අතර ඔහුගේ වදන් පෙළ මෙසේය. "අල්ලාහ්ගේ නාමය සඳහන් කරනු නොලැබූ සහ ඔවුන්ගේ නබිවරයා වෙත සලවාත් පවසනු නොලැබූ සභාවක කිසිදු කණ්ඩායමක් අඩුපාඩුකම් සහිතව මිස වාඩි වන්නේ නැත. ඔහු අභිමත කළේ නම් ඔවුනට දඬුවම් කරයි. ඔහු අභිමත කළේ නම් ඔවුනට සමාව දෙයි.[102]

ඇතැම් සලෆිවරුන් පවසා සිටිනුයේ: "මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ආදම්ගේ දරුවාට ඔහු ගත කළ ආයු කාලයේ හෝරාවන් ඉදිරිපත් කරනු ලබනු ඇත. එවිට ඒවායෙහි අල්ලාහ්ව මෙනෙහි නොකරන ලද සෑම හෝරාවක් සඳහාම ඔහුගේ ආත්මය දුකින් තැවෙනු ඇත."

මෙහි අවධාරණය වනුයේ: කතා කිරීමට යහපත් දෙයක් නොමැති වූ විට ඒ ගැන කිසිවක් කතා කිරීමට වඩා නිහඬව සිටීම උතුම් බවයි. අත්‍යාවශ්‍ය දෑ හැර.

102. අහ්මද් (2/527), අබූ දාවූද් (4855), තිර්මිදි (3380), ෂෙයික් අල්බානී 'සහීහ් අල් ජාමිඃ'හි (5607, 5750) මෙය පූර්ණ සාධක සහිත හදීසයක් බව පවසා සිටියාක් මෙන්ම තිර්මිදි තුමා ද පූර්ණ සාධක සහිත හදීසයක් බව පවසා ඇත්තේය.

එමෙන්ම, සැබැවින්ම අවශ්‍යතාවක් නොමැති ප්‍රකාශ බොහෝමයක් හදවත දරුණු කරනු ඇත. ඒ ගැන ඉබ්නු උමර් තුමා පැවසූ මර්ෆූඃ ගණයේ හදීසයක් තිර්මිදි හි මෙසේ සඳහන් වේ. 'අල්ලාහ්ව මෙනෙහි කිරීමෙන් තොරව අධික ලෙස කතා නොකරනු. හේතුව සැබැවින්ම අල්ලාහ්ව මෙනෙහි කිරීමෙන් තොරව අධික ලෙස කතා කිරීම හදවත් දරුණු කරනු ඇත. මිනිසුන් අතර අල්ලාහ්ගෙන් වඩාත් දුරස්ව සිටින්නා දරුණු හදවතක් ඇත්තාය.[103]

අබූ බක්ර් තුමා තම දිව අල්ලාගෙන 'මෙය මා වෙත ගෙන එන දෑ ගෙන දෙනු ඇත' යැයි පවසන්නෙකු වූහ.

උමර් තුමා: 'කවරෙකු ඔහුගේ කතාව අධික කර ගත්තේද ඔහුගේ වැටීම ද (පහත්කමද) අධික වන්නේය. කවරෙකු ඔහුගේ වැටීම අධික කර ගත්තේ ද ඔහුගේ පාපකම් අධික වන්නේය. කවරෙකුගේ පාපකම් අධික වන්නේ ද නිරාගින්න ඔහුට වඩාත් සුදුසු තැනක් වනු ඇත.' යැයි පවසා ඇත්තේය.

ඉබ්නු මස්ඌද් තුමා: නැමදුමට සුදුස්සා ඔහු හැර වෙනත් දෙවියකු නොමැති අල්ලාහ් මත දිවුරා පවසමි. මහපොළොව මත දිගු කලක් සිරගත වීමට දිව තරම් වඩාත් සුදුසු කිසිවක් නැත. යැයි පවසා ඇත්තේය.

වහ්බ් ඉබ්නු මුනබ්බිහ් තුමා: සැබැවින්ම ප්‍රඥාවේ මුල නිහඬතාව බව ප්‍රඥාවන්තයින් ඒකමතිකව පවසා ඇත.

මෙය විමර්ශනය කළ යුතු දිගු කොටසකි.

සැබැවින්ම නබි (ﷺ) තුමා යහපත කතා කරන මෙන් හා යහපත් නොවන දැයින් නිහඬව සිටින මෙන් අණ කර සිටීමේ අදහස වනුයේ: කතා කිරීම හෝ නිහඬතාව රැකීම පොදුවේ අණ කරන ලද ප්‍රකාශයක් නොවන්නේය. යහපත් දෑ කතා කළ යුතු අතර අයහපත් දැයින් නිහඬ වීම අවශ්‍ය වන්නේය. මුල් කාලීනයක් අයහපත් දැයින් හා අවශ්‍ය නොවන දැයින් නිහඬවීම අධික ලෙස ප්‍රශංසා කළෝය. එය සිතට බරක් වූ බැවිනි. එබැවින් බොහෝ ජනයාද ඒ

103. තිර්මිදි (3411) එහි වාර්තාකරණයේදී ඉබ්‍රාහීම් ඉබ්නු අබ්දුල්ලාහ් ඉබ්නු හාතිබ් ද ඇතුළත් වේ. ඒ හේතුවෙන් ෂෙයික් අල්බානී තුමා 'සිල්සිලතුල් ළඊෆා' (920) හි මෙම හදීසය දුර්වල හදීසයක් බව දන්වා ඇත.

අදහස තුළ වැටින. ඔවුන් තමන්ට අනවශ්‍ය දෑ පිළිබඳ නිහඬතාව රැකීමට උත්සාහ කළ අතර එමගින් ඔවුන්ගේ සිත් සුවපත් කර ගත්තෝය.

වඩාත් උතුම් වන්නේ නිහඬතාවද එසේ නැතිනම් කතා කිරීම ද? යනුවෙන් අහ්නෆ් ඉබ්නු කයිස් තුමා ඉදිරියේ මෙනෙහි කරමින් සිටියදී: පිරිසක් නිහඬතාව උතුම් බව පවසා සිටියේය. එවිට අහ්නෆ්: කතා කිරීම උතුම්ය. සැබැවින්ම නිහඬතාවයෙන් ඇතිවන මහිමය තම මිතුරා වෙත ලඟා වන්නේ නැත. නමුත් යහපත කතා කිරීම යනු එමගින් එය සවන් දෙන්නා ප්‍රයෝජන ලබනු ඇත.''

විද්වතුන් අතර මිනිසෙකු -උමර් ඉබ්නු අබ්දුල් අසීස් ඉදිරියේ- දැනුම මත නිහඬතාව රකින්නා දැනුම මත කතා කරන්නෙකු මෙන් දැයි විමසීය. එයට උමර් තුමා: '-මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ- තත්ත්වයෙන් ඒ දෙකින් වඩාත් උතුම් වන්නේ සැබැවින්ම දැනුම මත කතා කරන්නාය. ඊට හේතුව සැබැවින්ම එහි ප්‍රයෝජනය මිනිසුනට ඇති බැවිනි. එහි නිහඬතාව ඔහුට පමණක් වනු ඇත.' යැයි පවසා සිටියේය. පසුව එතුමාට එම පුද්ගලයා: අමීරුල් මුඃමිනීන් තුමනි -විශ්වාසීන්ගේ නායකයාණනි- කතා කිරීමේ අර්බුදය කෙසේ නම් වන්නේදැ?යි පැවසූ විට උමර් තුමා දැඩි ලෙස හඬන්නට පටන් ගත්තේය.

දිනක් උමර් ඉබ්නු අබ්දුල් අසීස් තුමා දේශනාවක් කළේය. ජනයා එයට වහල් වී සිටියේය. පසුව එතුමා දේශනාව නතර කළේය. එවිට ඔහුගෙන් මෙසේ විමසන ලදී. ඔබේ කතාව ඔබ සම්පූර්ණ කර තිබුණා නම්. එමගින් අල්ලාහ් අපට සෙත සලසනු ඇතැයි අපි අපේක්ෂා කළෙමු. යැයි පවසා සිටි විට එතුමා: "සැබැවින්ම කතාව අර්බුදයකි. දේව විශ්වාසියාට කතාවට වඩා ක්‍රියා කිරීම වඩාත් උසස් වන්නේය" යැයි පවසා සිටියේය.

-දිගු කලක් තිස්සේ- මම අමීරුල් මුඃමිනීන් උමර් ඉබ්නු අබ්දුල් අසීස් තුමාව සිහිනෙන් දැක ඇත්තෙමි. මෙම ගැටලුව සම්බන්ධයෙන් එතුමා කතා කරනු මම සවන් දී ඇත්තෙමි. සැබැවින්ම මා ද ඒ සම්බන්ධයෙන් ඔහු සමග කතා කර ඇති බව මම සිතමි. 'සැබැවින්ම යහපත කතා කිරීම නිහඬව සිටීමට වඩා උතුම්ය.' යන වග ඔහුගේ කතාවෙන් මම වටහා ගත්තෙමි. කතාව අතරවාරයේ දී සුලෙයිමාන් ඉබ්නු අබ්දුල් මලික් පිළිබඳ මෙනෙහි කිරීම සිදු වූ බව සිතමි. සැබැවින්ම උමර් තුමා එය ඔහුට පවසා සිටියේය.

සුලයිමාන් ඉබ්නු අබ්දුල් මලික් තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. සැබැවින්ම එතුමා: නිහැඬියාව බුද්ධියේ සිහිනයයි. කතා කිරීම එය අවදි කරවයි. තත්තවයකින් මිස තත්ත්වයක් පූර්ණ වන්නේ නැත.' එනම්: නිහැඬියාවත් කතාවත් අවශ්‍ය වන්නේය යන්නයි.

එවකට මිසර ජනයා අතර බුද්ධිමතෙකු වූ උබෙයිදුල්ලාහ් ඉබ්නු අබූ ජඃෆර්ගේ ප්‍රකාශය කෙතරම් අගනේ ද! ප්‍රඥාවන්තයින් අතුරින් කෙනෙකු 'සභාවක පුද්ගලයකු කතා කරන විට එම කතාව ඔහු මවිතයට පත් කළේ නම් ඔහු නිහැඬියාව රකිත්වා. ඔහු නිහැඬියාවේ සිටින විට එම නිහැඬියාව ඔහුට පුදුමයට පත් කළේ නම් කතා කරත්වා!"

මෙය වඩාත් යහපතකි. හේතුව කවරෙකු එලෙස සිටින්නේ ද ඔහුගේ නිහැඬියාවත් ඔහුගේ කතාවත් ඔහුගේ ආශාවට හා ඔහුගේ සිත් ආකර්ශණයට විරුද්ධව පවතිනු ඇත. කවරෙකු එලෙස සිටින්නේ ද ඔහු අල්ලාහ්ගේ ආශිර්වාදය ලබන්නටත් ඔහුගේ කතාවෙහි හා නිහැඬියාවේ නිවැරැදි භාවය ලබන්නටත් නම් කළ හැකි පුද්ගලයකු වනු ඇත. ඊට හේතුව ඔහුගේ කතාවත් ඔහුගේ නියැඬියාවත් අල්ලාහ් වෙනුවෙන් පවතින බැවිනි.

***

මෙම හදීසයේ නබි (ﷺ) අණ කර සිටි කරුණු අතුරින් දෙවන කාරණාව අසල් වැසියාට ගරු කිරීමයි.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: "නුඹලා අල්ලාහ්ව නමදිනු. ඔහුට කිසිවක් ආදේශ නොතබනු. දෙමාපියන් සමග යහපත් අයුරින් කටයුතු කරනු. තවද ඥාතීන් සමග ද අනාථයින් සමගද දිළිඳුන් සමග ද ඥාති අසල්වැසියා සමග ද සමීප අසල්වැසියා සමග ද අසලින් සිටින මිතුරා සමග ද මගියා සමග ද නුඹලාගේ දකුණත සතු කරගත් අය (වහලුන්) සමග ද (යහපත් අයුරින් කටයුතු කරනු). සැබැවින්ම අල්ලාහ් උඩඟුකමින් හා පුහුමානයෙන් සිටින්නන් ව ප්‍රිය කරන්නේ නැත." (සූරා අන් නිසා : 36)

මේ පිළිබඳ විග්‍රහ කරන්නන් විවිධ මත දරති.

ඔවුන් අතර ඇතැමෙකු 'ඥාතී අසල් වැසියා' යනු ඔහුට වඩාත් සමීපයෙන් කටයුතු කරන අසල් වැසියා යනුවෙන් ද 'සමීප අසල් වැසියා' යනු පිටස්තර අසල්වැසියා යනුවෙන් අදහස් පළ කර ඇත.

ඇතැමුන් 'ඥාතී අසල් වැසියා' යන්නෙහි කාන්තාව ඇතුළත් කරන අතර ඇතැමුන් ඇයව 'සමීප අසල් වැසියා' යන්නෙහි ඇතුළත් කරති.

තවත් ඇතැමුන්: ගමනක දී ඉතා කිට්ටුවෙන් සිටින්නා 'සමීප අසල්වැසියා' අතරට ඇතුළත් කරති.

ඇතැමුන්: 'ඥාතී අසල් වැසියා' යනු මුස්ලිම් අසල්වාසියා යනුවෙන් ද 'සමීප අසල් වැසියා' යනු මුස්ලිම් නොවන අසල්වාසියා යනුවෙන් අදහස් පළ කර ඇත.

'මුස්නද් අල්බස්සාර්' හි හුදෙයිෆා තුමා විසින් වාර්තා කළ මර්ෆූඃ ගණයට අයත් හදීසයක් මෙසේ සඳහන් වී ඇත. 'අසල්වාසීන් වර්ග තුනකි. එනම්: එක් උරුමයක් පමණක් සතු අසල්වාසියා -උරුමයෙන් වඩාත් පහළම අය ඔහු වෙයි- උරුමකම් දෙකක් සතු අසල්වාසියා සහ උරුමකම් තුනක් සතු අසල්වාසියා. උරුමයක් පමණක් සතු අසල්වාසියා වනාහි: අල්ලාහ්ට ආදේශ තබන අසල්වාසියාය. ඔහු සතුව ලෙන්ගතු කමක් නැත. ඔහු සතුව ඇත්තේ අසල්වාසියා යන උරුමය පමණය. උරුමකම් දෙකක් සතු අසල්වාසියා වනාහි: මුස්ලිම් අසල්වාසියාය. ඔහුට ඉස්ලාමයේ උරුමය හා අසල්වාසියා යන උරුමය සතු වන්නේය. උරුමකම් තුනක් සතු අසල්වාසියා වනාහි: ඥාතී මුස්ලිම් අසල්වාසියාය. ඔහුට ඉස්ලාමයේ උරුමය. අසල්වාසියා යන උරුමය හා ඥාතී උරුමය සතු වන්නේය.[104]

මෙම හදීසය මුත්තසිල් හා මුර්සල් ලෙස වෙනත් ව්‍යූහයන්ගෙන් වාර්තා වී ඇති අතර ඒ සියල්ල පිළිබඳ නොයෙකුත් අදහස් ඇත.

104. බස්සාර් (1896) ඉමාම් අල්බානී 'ලර්ෆ් අල් ජාමිඃ'හි (2674) එය දුර්වල හදීසයක් බව සඳහන් කර ඇත. කතෘතුමාගේ ප්‍රකාශය පෙන්වා දෙන්නේ ද එය දුර්වල බවය.

තවත් සඳහනක 'ඥාති අසල්වැසියා' සබඳකම් පාන්නට වඩාත් සමීප අසල්වැසියා බවත් 'සමීප අසල් වැසියා' අසල්වැසියන් අතර දුරින් සිටින්නා බවත් ප්‍රකාශ වී ඇත.

ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් වාර්තා කරන ලද හදීසයක් බුහාරි හි මෙසේ සඳහන් වේ. අල්ලාහ්ගේ දූතයාණනි, මට අසල්වැසියන් දෙදෙනෙකු සිටිති. ඔවුන් දෙදෙනාගෙන් කවරෙකු වෙත මා පරිත්‍යාග කළ යුතු වන්නේ දැයි විමසා සිටියාය. එවිට එතුමාණන්: 'ඔවුන් දෙදෙනා අතුරින් දොරටුවෙන් ඔබට වඩාත් සමීප අය වෙතය' යැයි පවසා සිටියහ.[105]

මුල්කාලීනයන් අතර පිරිසක්: "අසල්වාසීන්ගේ සීමාව නිවෙස් හතළිහකි" යැයි පවසා ඇත. සෑම පැත්තකින්ම නිවෙස් හතළිහක් ආවරණය වී ඇති කලාපය යැයි ද පවසනු ලැබ ඇත. 'මරාසීලිස් සුහ්රි' හි සඳහන් වන පරිදි මිනිසෙකු නබි (ﷺ) වෙත තම අසල්වැසියා පිළිබඳ පැමිණිලි කරමින් පැමිණියේය. පසුව නබි (ﷺ) තුමා "දැනගන්න. සැබැවින්ම නිවෙස් හතළිහක් අසල්වැසි නිවාස වේ" යැයි දැනුම් දෙන මෙන් එතුමාගේ මිතුරන් හට නියෝග කර සිටියේය. ඉමාම් සුහ්රී පවසා සිටිනුයේ එය "මෙසේ නිවෙස් හතළියක් ද මෙසේ නිවෙස් හතළියක් ද මෙසේ නිවෙස් හතළියක් ද මෙසේ නිවෙස් හතළියක් ද" යැයි පැවසීය. එනම්: ඔහුට ඉදිරියෙන් ද ඔහුට පසුපසින් ද ඔහුගේ දකුණු දෙසින් ද ඔහුගේ වම් දෙසින් ද නිවෙස් හතළිහකි.

'සමීප අසල් වැසියා' වනාහි: එය පිරිසක් විසින් විස්තර කර ඇත්තේ බිරිය යන අදහසිනි. තවත් පිරිසක් විසින් විස්තර කර ඇත්තේ මගී මිතුරා යනුවෙනි. ඉබ්නු අබ්බාස් තුමා ද ඔවුන් අතරින් කෙනෙකි. ගමේ පදිංචිව සිටින මිතුරා ඉන් ඉවත් කිරීමට ඔවුහු අපේක්ෂා කළේ නැත. ඔවුන් අදහස් කළේ සැබැවින්ම මගියාගේ මිතුරුකම් ප්‍රමාණවත් වන බවයි. පදිංචි ස්ථානය පවතින නිරන්තර මිතුරුකම් එයට වඩා උරුමයක් ඇත්තකි.

නබි (ﷺ) තුමා විසින් වාර්තා කළ බවට ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් වාර්තා කළ හදීසයක් බුහාරි හා මුස්ලිම් හි මෙසේ සඳහන් වෙයි.

105. බුහාරි (6020)

“සැබැවින්ම අසල්වැසියා උරුමක්කරුවකු වනු ඇතැයි මා සිතන තරමට ජිබ්රීල් තුමා ඔහු ගැන මට උපදෙස් දෙමින්ම සිටියහ.”[106]

ඔහුගේ අවශ්‍යතාවකදී ඔහුට උදව් කිරීම. ඔහු වෙත සිදු කරනු ලබන උපකාරවලින් එකකි නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බවට ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් ඉමාම් හාකිම් තුමා මෙසේ පළ කර ඇත. “තම අසල්වැසියා කුසගින්නෙන් පෙළෙන විට තම කුස පුරවාගන්නා දේව විශ්වාසී අයකු නොවන්නේය.[107]

සහීහ් මුස්ලිම් හි මෙසේ සඳහන්ව ඇත. ‘අහෝ අබූ දර්, ඔබ මස් ව්‍යාංජනයක් පිහන්නේ නම් එහි ජලය වැඩි කර ඔබේ අසල් වැසියා සමග බෙදීම් ඇති කර ගන්න.[108]

***

මෙම හදීසයේ නබි (ﷺ) අණ කර සිටි කරුණු අතුරින් තුන්වන කාරණාව ආගන්තුකයාට සත්කාර කිරීමය.

ඉන් අදහස් කරනුයේ: ඔහුට ආගන්තුක සත්කාරය ඉතා හොඳ අයුරින් පිළිගැන්වීමයි.

අබූ ෂුරෙයිහ් විසින් වාර්තා කළ හදීසයක් බුහාරි හා මුස්ලිම්හි මෙසේ සඳහන් වේ. මාගේ දෑස් අල්ලාහ්ගේ දූතයාණන් දැක ඇත. මාගේ දෙකන් එතුමා කවර කරුණක් කතා කළේද ඒවාට සවන් දී ඇත. යැයි පවසා, එතුමාණන්: ‘කවරෙකු අල්ලාහ් හා අවසන් දිනය විශ්වාස කරන්නේ ද ඔහු තම ආගන්තුකයාට එහි අනුමත කාලයෙහි ආගන්තුක සත්කාර කරත්වා යැයි පැවසූහ. එවිට ඔවුහු එහි අනුමත කාලය කුමක් ?දැයි විමසා සිටි විට ‘දහවලක් හා රාත්‍රියක් යැයි පැවසීය. එතුමාණන් තවදුරටත්: ‘ආගන්තුක සත්කාරය යනු

106. බුහාරි (6014,6015), මුස්ලිම් (2624, 2625)

107. හාකිම් (4/167) එතුමා එය සහීහ් හදීසයක් යැයි පවසා ඇති අතරම ඉමාම් අල්බානි තුමා ‘සහීහ් අල් ජාමිඃ’හි (5382) එය සහීහ් හදීසයක් යැයි පවසා ඇත.

108. මුස්ලිම් (2625).

දින තුනකි. ඉන් පසුව පිහිටන දෑ දානයකි.'[109] යැයි පවසා සිටියහ. නබි (ﷺ) තුමා පැවසූ බවට අබූ ෂුරයිහ් විසින් වාර්තා කරන හදීසය මුස්ලිම්හි මෙසේ සඳහන් වේ. එතුමාණන්: "ආගන්තුක සත්කාරය දින තුනකි. එහි අනුමත කාලය දහවලක් හා රාත්‍රියකි. ඉන් පසු ඔහු වෙත වියදම් කරන දෑ දානයකි. ඔහු පාපයට ලක් වන තුරු ඔහු අභියස රැඳී සිටීම අනුමත නොවන්නේය. යැයි පැවසූහ. ඔවුහු: අල්ලාහ්ගේ දූතයාණනි, ඔහුට පාපයක් ඇති වන්නේ කෙසේදැ?යි විමසා සිටියෝය. එයට එතුමාණන්: 'ඔහු ළඟ නවාතැන් ගනී. නමුත් ඔහුට සත්කාර කරන තරමට කිසිවක් ඔහු සතු නොවනු ඇත.'[110]

මෙම හදීස්වල සඳහන් වන පරිදි ආගන්තුකයාගේ ත්‍යාගී අනුමත කාලය දහවලක් හා රාත්‍රියක් වන අතර ආගන්තුක සත්කාරය දින තුනක් පවතිනු ඇත. එය ත්‍යාගය හා සත්කාරය අතර වෙන් කර ත්‍යාගී කාල සීමාව තරයේ ප්‍රකාශ කර ඇත. ඒ පිළිබඳ තරයේ ප්‍රකාශ කරමින් වෙනත් හදීස් ද පැමිණ ඇත.

නබි (ﷺ) ප්‍රකාශ කළ බව අල් මික්දාද් ඉබ්නු මඃදීකරිබ් විසින් වාර්තා කළ හදීසයක් අබූ දාවූද් හි මෙසේ පල කර ඇත. 'ආගන්තුක සත්කාර රාත්‍රිය සෑම මුස්ලිම්වරයකුගේම වගකීමකි. එය ගෙවී ගිය පසු කවරෙකු සිටින්නේ ද ඔහු ඔහුට ණයකි. ඔහු කැමතිනම් ගෙවා දමත්වා ඔහු කැමතිනම් අතහැර දමත්වා''[111]

උක්බත් ඉබ්නු ආමිර් තුමා විසින් වාර්තා කරන ලද හදීසයක් බුහාරි හා මුස්ලිම් හි මෙසේ සඳහන් වේ. අපි: 'අල්ලාහ්ගේ දූතයාණනි, ඔබ අපව එවන්නෙහිය, එවිට අප වෙත සත්කාර නොකරන පිරිසක් වෙත යන්නෙමු. ඒ ගැන ඔබ කුමක් සිතන්නෙහිදැ?යි විමසා සිටියෙමු. එයට අල්ලාහ්ගේ දූතයාණන් අප වෙත "නුඹලා යම් පිරිසක් වෙත ගොඩ බැස ඔවුන් විසින් නුඹලාට අවශ්‍ය

109. බුහාරි (6135), එහි අවසානයේ: 'ඔහුට වරදක් ඇතිවන තරමට ඔහු ළඟ රැඳී සිටීමට තමන්ට අනුමත නොවන්නේය." යැයි සඳහන් වී ඇත. මුස්ලිම් (48) පිටුව 1352.

110. මුස්ලිම් (48) පිටුව 1352.

111. අබූ දාවූද් (3750), ඉබ්නු මාජා (3677), ඉමාම් අල්බානී 'සහීහ් අත්-තර්ගීබ් වත් තර්හීබ්'හි මෙය සහීහ් හදීසයක් බව දන්වා ඇත.

වන ආගන්තුක සත්කාරය සැපයීමට නියෝග කළේ නම් නුඹලා එය පිළිගනු. ඔවුන් එසේ සිදු නොකළේ නම් ඔවුන් සතුව ඇති අවශ්‍ය ආගන්තුක සත්කාරයේ උරුමය නුඹලා ඔවුන්ගෙන් ලබා ගනු.'' යැයි පවසා සිටියහ.[112]

අබ්දුල්ලා ඉබ්නු අම්ර් තුමා මෙසේ පවසා සිටියහ: කවරෙකු ආගන්තුක සත්කාර නොකළේ ද ඔහු මුහම්මද්ගෙන් හෝ ඉබ්‍රාහිම්ගෙන් හෝ කෙනෙක් නොවන්නේය.

මෙම මූලාශ්‍ර පෙන්වා දෙනුයේ ආගන්තුක සත්කාරය එක් දහවලක් හා රාත්‍රියක් සැපයීම අනිවාර්යය වන බවයි. ලයිස් හා අහ්මද්ගේ ප්‍රකාශයද එය වේ. අහ්මද් තුමා තවදුරටත්: එය වළක්වනු ලැබූ විටෙක ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට ඇත. ඊට හේතුව එය අනිවාර්යය වගකීමක් වන බැවිනි.' එසේ යම් අයකු වැළැක් වූ විට ඔහුගේ ධනය තම අතින් ගත හැකි ද එසේ නැතහොත් ඒ පිළිබඳ පැමිණිල්ල විනිශ්චකාරයකු වෙත ගෙන යා හැකි ද? යන්න පිළිබඳ කරුණ මූලාශ්‍රගත වාර්තා දෙකක් මත පිහිටයි.

අවසන් දින දෙක වනාහි: එනම් දෙවන දින හා තුන්වන දින එය ආගන්තුක සත්කාරයේ පූර්ණභාවයයි. අහ්මද් විසින් වාර්තා කර ඇති මූලාශ්‍රය පවසා සිටිනුයේ: පළමු ත්‍යාගී අවකාශ කාලය මිස එය අනිවාර්යය නොවන බවයි. ඔහු තවදුරටත්: ත්‍යාගය හා සත්කාරය අතර වෙන් කර ඇති බවත් ත්‍යාගී අවකාශ කාලය පිළිබඳ තරයේ ප්‍රකාශ කර ඇති බවත්ය.

හමීද් ඉබ්නු සන්ජවීය්හ් පවසා සිටිනුයේ: -එම දහවලේ හා රාත්‍රියේ- ඔහු හා ඔහුගේ පවුල අනුභව කරන දැට වඩා යහපත් ආහාර වේලක වියදම් දැරීම ඔහුගේ යුතුකම බවයි. එමෙන්ම -සම්පූර්ණ දින තුනෙහිම- ඔහුගේ ආහාරයෙන් ඔහුට ආහාර සැපයීම ඔහුගේ යුතුකම බවයි.

මෙහි අවධානයට ගත යුතු කරුණක් ඇත. සල්මාන් තුමාගේ හදීසයේ මෙසේ වාර්තා වී තිබේ. එතුමා: ''අල්ලාහ්ගේ දූතයාණෝ අප ළඟ නැති දෑ ආගන්තුක

112. බුහාරි (6137), මුස්ලිම් (1727).

සත්කාර සඳහා වැය බැර දැරීම තහනම් කර ඇත්තාහ.''[113] යැයි පැවසීය. තමන් ළඟ නොමැති දෙයක් ආගන්තුක සත්කාරය වෙනුවෙන් වැය බර දැරීමට ආගන්තුක සත්කාර කරන්නාට තහනම් කර තිබීම එය තමන් ළඟ තිබෙන දැයින් මිස ආගන්තුක සත්කාර ගෞරවය කිරීම අනිවාර්යය නොවන බව පෙන්වා දෙයි. එහෙයින් ඔහු ළඟ අමතර යමක් නොමැති වූ විටෙක ඔහුට කිසිවක් අනිවාර්යය නොවන්නේය.

***

113. අහ්මද් (5/441), එම වාර්තාකරණයේදී දුර්වලතාවක් ඇත. 'අද් දුර්රුල් මන්සූර්' හි සූරා සාද් හි විග්‍රහය අවසානයේ එම පාඩම තුළ සල්මාන් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලද හදීසයේ සමස්තය ඉමාම් සුයූතී ගෙනහැර පා ඇත.

## الحَدِيْثُ السَّادِسُ عَشَرَ

## දහසය වන හදීසය

عَنْ أَبِي هُرَيْرَةَ رَضِيَ اللهُ عَنْهُ أَنَّ رَجُلًا قَالَ لِلنَّبِيِّ ﷺ: أَوْصِنِي. قَالَ: "لَا تَغْضَبْ"، فَرَدَّدَ مِرَارًا، قَالَ: "لَا تَغْضَبْ."

رَوَاهُ البُخَارِيُّ.

අබූ හුරෛය්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

“සැබැවින්ම මිනිසෙකු ‘මට උපදෙස් දෙන්නැ’යි නබි (ﷺ) තුමාණන්හට පැවසීය. එතුමාණෝ: ‘ඔබ කෝප නොවනු’ යැයි පැවසූහ. නැවත නැවතත් ඔහු එසේ විමසා සිටියේය. එතුමාණෝ: ‘ඔබ කෝප නොවනු’ යැයි පැවසූහ.

මෙය ඉමාම් බුහාරි විසින් දන්වා ඇත.

***

### -විග්‍රහය-

මෙම පුද්ගලයා යහපත් කරුණු සඳහා සමස්ත උපදෙසක් තමන්හට කරන මෙන් නබි (ﷺ) තුමාගෙන් ඉල්ලා සිටියේය. එසේ ඉල්ලා සිටියේ යහපත් කරුණු අධිකව ඇති බැවින් ඒවා ඔහුට ආරක්ෂා කිරීමට නොහැකි වනු ඇතැයි යන බිය හේතුවෙනි. එවිට නබි (ﷺ) තුමා ඔහුට කෝප නොවන මෙන උපදෙස් දුන්හ. පසුව ඔහු මෙම ප්‍රශ්ණයම නැවත නැවත විමසා සිටියේය. නබි (ﷺ) තුමාද එයම පිළිතුරු වශයෙන් ලබා දුන්හ. අයහපත් දෑ හී සමස්තය කෝපය බවත් ඉන් වැළකී සිටීම යහපත් දෑහි සමස්තය බවත් පෙන්වා දෙයි.

නබි (ﷺ) තුමාගෙන් එසේ විමසා සිටි පුද්ගලයා අබූ දර්දා විය හැක. අබූ දර්දා තුමා විසින් වාර්තා කරන හදීසයක් තබරානී හි මෙසේ පළ වී ඇත. එතුමා: අල්ලාහ්ගේ දූතයාණනි, ස්වර්ගයට මා ඇතුළත් කරන ක්‍රියාවක් මට දන්වා

සිටින මෙන් අසා සිටියෙමි. එවිට එතුමාණන්: ඔබ කෝප නොවනු. ඔබට ස්වර්ගය සතුය.[114] යැයි පවසා ඇති බව ප්‍රකාශ කර සිටියි.

අහ්මද් සතු හදීසයක: සැබැවින්ම ජාරියා ඉබ්නු කුද්දාමා තුමා: මම නබි (ﷺ) තුමාගෙන් .... මෙසේ විමසුවෙමි. එවිට එතුමා එය සඳහන් කර සිටි බව පවසා සිටියි.[115] මෙය බොහෝ විට විමසා සිටි පුද්ගලයා ජාරියා ඉබ්නු කුද්දාමා විය හැකි බව සිතිය හැක. නමුත් යහ්යා ඉබ්නු කත්තාන් විසින් වාර්තා කළ හදීසය ඉමාම් අහ්මද් විසින් වාර්තා කර ඇති අතර හෙතෙම: 'හිෂාම් පවසා ඇත්තේ එලෙසය' යැයි පවසා සිටියේය. එනම්: මෙම හදීසයේ හිෂාම් සඳහන් කර ඇත්තේ සැබැවින්ම නබි (ﷺ) තුමාගෙන් එසේ විමසා සිටි පුද්ගලයා ජාරියා බවයි. යහ්යා තුමා: 'ඔවුහු එසේ පවසා සිටිය ද ඔහු නබි (ﷺ) තුමාව හමු වී නැතැ'යි පවසා ඇත. අල් ඉජ්ලී හා වෙනත් අය විසින් ද පවසා ඇත්තේ සැබැවින්ම ඔහු තාබීවරයෙකු මිස සහාබිවරයකු නොවන බවයි.

උපදෙස් පතන්නා හට: 'ඔබ කෝප නොවනු' යැයි නබි (ﷺ) තුමා කළ ප්‍රකාශය කරුණු දෙකක් උසුලයි.

පළමුවැන්න: එතුමාගේ අපේක්ෂාව යහපත් ගති පැවතුම් ඇතිකරලීම සඳහා හේතු වන කරුණු කාරණා නියෝග කිරීමය. සැබැවින්ම ආත්මය එම ගතිගුණවලින් හැඩ ගැසුණු විට ඒවා එයට පුරුද්දක් බවට පත් වනු ඇත. කෝපය ඇතිවීමට හේතුවන කරුණු මතුවන විට එය පාලනය කිරීමට ඒවා බල කරනු ඇත.

දෙවැන්න: එම අපේක්ෂාව පිහිටනුයේ: ඔබට කෝපය ඇති වූ විට එය පදනම් කර ගනිමින් කටයුතු නොකිරීමය. නමුත් එය ක්‍රියාත්මක කිරීම හා එය විධානය කරන දෑ ක්‍රියාවට නැංවීම අතහැර දැමීමට ඔබ ඔබව කැප කළ යුතු වේ. කෝපය කවර කරුණක් අණ කර සිටින්නේ ද එය මිනිසා පිළි නොපැද ඒ සඳහා තමන්ව කැප කර සිටියේ නම් කෝපයේ හානිය ඔහුගෙන් ඉවත් වී යයි. ඇතැම් විට එය කෝප නොවූ අයකු සේ පෙනෙන තරමට ඔහුගෙන් කෝපය නිවී ඉතා ඉක්මණින්ම පහව යනු ඇත.

114. අල් මුඃජමුල් අව්සඃ(2374)
115. අහ්මද් (5/34)

කෝපය වළක්වාලන එය නිවා දමන කරුණු වල නිරත වන මෙන් කෝප වූ අය වෙත නබි (ﷺ) තුමා නියෝග කර ඇත. බුහාරි හා මුස්ලිම් හි සුලෙය්මාන් ඉබ්නු සුරද් විසින් වාර්තා කරන ලද හදීසයක් මෙසේ සඳහන් වේ. නබි (ﷺ) තුමාණන් අසළ අපි වාඩිවෙමින් සිටියදී එතුමා ඉදිරියේ මිනිසුන් දෙදෙනෙකු බැණ ගත්තෝය. ඔවුන් දෙදෙනාගෙන් එක් අයකු තම සගයාට කෝපාවිෂ්ඨ වී බැණ වැදුණේය. ඔහුගේ මුහුණ රතු විය. එවිට නබි (ﷺ) තුමාණන්: 'සැබැවින්ම මම ප්‍රකාශයක් දනිමි. එය ඔහු පැවසුවේ නම්, ඔහු ලබා ඇති දෑ ඔහුගෙන් පහව යනු ඇත. ඔහු අඌදු බිල්ලාහි මිනෂ් ෂෙයිතානිර් රජීම් යැයි පැවසුවේ නම් මැනව' යැයි. පැවසූහ. එවිට ඔවුහු එම පුද්ගලයාට නබි තුමාණන් පවසන දෑ ඔබට නොඇසේදැ?යි පවසා සිටි විට ඔහු: මම පිස්සෙකු නොවේ යැයි පවසා සිටියේය.[116]

නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බවට අබූ දර් තුමා විසින් වාර්තා කළ හදීසය ඉමාම් අහ්මද් හා අබූ දාවූද් මෙසේ පළ කර ඇත. එතුමාණන්: 'ඔබ අතුරින් කිසිවකු සිටගෙන සිටියදී කෝප වූ විට ඔහු වාඩි වෙත්වා. ඔහුගෙන් කෝපය පහව ගියේ නම් එසේය. එසේ නැතහොත් ඔහු හාන්සි වෙත්වා' යැයි පැවසූහ.[117]

මෙහි අර්ථය: සැබැවින්ම සිටගෙන සිටින්නා පළිගැනීමට සූදානම් තත්ත්වයේ පසුවන්නෙකි. වාඩි වී සිටින්නා එසේ නොවන්නේය. හාන්සි වී සිටින්නාට ඊටත් වඩා ඉන් දුරස්ව සිටියි. එහෙයින් එසේ අණ කර ඇත්තේ පළිගැනීමේ තත්තවයෙන් දුරස් කිරීමේ බලාපොරොත්තුවෙන් බව ප්‍රකාශ වී ඇත.

---

116. බුහාරි (6115), මුස්ලිම් (261)
'සැබැවින්ම මම පිස්සෙකු නොවේ' යැයි කියූ මිනිසාගේ ප්‍රකාශ සම්බන්ධයෙන් අල් හාෆිල් ඉබ්නු හජර් තුමා මෙසේ පවසා සිටියි: මෙම අණ කිරීමෙන් ඔහු දේව ප්‍රතික්ෂේපකයකු හෝ කුහකයකු බවට පත් ව ඇත. එසේ නැතහොත් මධ්‍යස්තභාවයෙන් තමන් ව බැහැර කරන තරමට කෝපය ඉහවහා ගිය අයකු ලෙස ඉද ඇත. එය මෙම පිළිතුරෙන් - කෝපය ඉහවහා ගිය කරුණ පහ කිරීම සඳහා- උපදෙස දුන් අය පවා නොසලකා හරින තරමටම විය. ඇත්තෙන්ම ඔහු පහත් අරාබිවරයකු බවද සැබැවින්ම මානසිකව වැටී ඇත්තෙකු මිස ෂෙයිතාන්ගෙන් ආරක්ෂාව නොපතනු ඇතැයි ඔහු අදහස් කළා විය හැක යැයි ප්‍රකාශ වී ඇත. 'ෆත්හුල් බාරි' (10/482)

117. අහ්මද් (5/152), අබූ දාවූද් (47820), 'ළර්ජ් අත් තර්ගීබ් වත් තර්හීබ්' හි (1645) අෂ්-ෂෙයික් අල්බානී තුමා මෙය දුර්වල හදීසයක් යැයි සඳහන් කර ඇත.

මුවර්රික් අල් අජලීගේ ප්‍රකාශය කෙතරම් මනහර ද: 'කිසි විටෙක මම ක්‍රෝධයෙන් පිරුණේ නැත. එමෙන්ම කවර කරුණක් මා පසුතැවිල්ලට පත් කළේ ද ඒ ගැන මම පිළිගත් විට කිසිම අවස්ථාවක මම කෝපයෙන් කතා කළේද නැත.'

දිනක් උමර් ඉබ්නු අබ්දුල් අසීස් තුමා කෝප විය. එතුමාගේ පුත් අබ්දුල් මලික් එතුමාට: 'අමීරුල් මුඃමිනීන් (විශ්වාසීන්ගේ නායක) තුමනි, අල්ලාහ් ඔබට මෙතරම් පිරිනමා තිබිය දී ඒවායින් ඔබව උසස් කර තිබියදී මේ අයුරින් ඔබ කෝප වන්නේදැ?යි විමසා සිටියේය. එයට එතුමා: අහෝ අබ්දුල් මලික් ඔබට කෝපය ඇති නොවන්නේ දැයි විමසා සිටියේය. එවිට අබ්දුල් මලික් තුමා: කෝපය හෙළි නොවන තරමට මා එය පාලනය කරමි." යැයි පැවසීය.

කෝපය ඇති වූ විට තම සිත් පාලනය කර ගත්තෝ මොවුහු වෙති.

උර්වත් ඉබ්නු මුහම්මද් අස්-සඃදී තුමාගේ හදීසයක් අහ්මද් හා අබූ දාවූද් විසින් මෙසේ පළ කර ඇත. සැබැවින්ම මිනිසෙකු ඔහු සමග කතා කළේය. එවිට ඔහු ඔහුගේ කෝපය ඇවිස්සීය. එවිට එතුමා නැගිට සිට වුළු ගත්තේය. පසුව අල්ලාහ්ගේ දූතයාණන් ප්‍රකාශ කළ බවට මාගේ සීයා වන අතිය්යා කළ ප්‍රකාශයක් මාගේ පියාණන් විසින් ලබා මට මෙසේ දන්වා සිටියේය. "කෝපය ෂෙයිතාන්ගෙන් වූවකි. ෂෙයිතාන් ගින්නෙන් මවන ලදී. සැබැවින්ම ගින්න නිවා දමනුයේ ජලයයි. එහෙයින් ඔබ අතුරින් කිසිවකුට කෝපය ඇති වූ විට, වුළු ධෝවනය කරත්වා."[118]

නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බවට අබූ හුරෙය්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලද හදීසයක් බුහාරි හා මුස්ලිම්හි මෙසේ සඳහන් වේ. 'වීරයා යනු මල්ලව පොර බදින්නා නොවේ. සැබෑ වීරයා යනු කෝපය ඇති වන අවස්ථාවේ තම සිත පාලනය කරන්නාය.[119]

118. අහ්මද් (4/226), අබූ දාවූද් (4784), 'ළර්ෆ් අත් තර්ගීබ් වත් තර්හීබ්' හි (1647) අෂ්-ෂෙයික් අල්බානී තුමා මෙය දුර්වල හදීසයක් යැයි සඳහන් කර ඇත. බලන්න: 'අස්සිල්සිලතුල් ළර්ෆා' (582)

119. බුහාරි (6114), මුස්ලිම් 2609)
පොර බදින වීරයා යනු: ඔහු සමග පොර බදින්නට මිනිසුන්ට හැකියාවක් නොමැති ශක්තිමත් මිනිසාය. නබි (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) තුමා දන්වා සිටියේද එම

නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බවට මුආද් ඉබ්නු අනස් අල්-ජුහ්නී විසින් වාර්තා කළ හදීසයක් ඉමාම් අහ්මද්, අබූ දාවූද්, තිර්මිදි, ඉබ්නු මාජා යන අය විසින් මෙසේ පළ කර ඇත. "කවරෙකු කෝපය ක්‍රියාත්මක කිරීමට හැකියාව තිබියදී එය පාලනය කරන්නේ ද -මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ සියලු මැවීම්වලට ඉහළින් අල්ලාහ් ඔහුව අමතනු ඇත. ඔහු කැමති කන්‍යාවියක් තෝරා ගන්නට සළස්වයි.[120]

නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බවට ඉබ්නු අබ්බාස් තුමා විසින් වාර්තා කරන ලද හදීසයක් ඉමාම් අහ්මද් මෙසේ පළ කර ඇත. 'ගැත්තෙකු තමන්ට අත්වන කෝපය පාලනය කිරීමට වඩා අල්ලාහ්ට වඩාත් ප්‍රිය කරන මාත්‍රාවක් නැත. ගැත්තෙකු අල්ලාහ් වෙනුවෙන් කෝපය පාලනය කරන විට ඔහුගේ අභ්‍යන්තරය දේව විශ්වාසයෙන් අල්ලාහ් පුරවනු මිස නැත.[121]

කෝපය: හදවතේ රුධිරය රත් කරන්නකි. හිංසාවක් ඇති වීමේ බියෙන් හිංසා කරන්නා වැළැක්වීම සඳහා එය ඉල්ලා සිටින අතර එසේ නැතහොත් එය සිදුවූයින් පසු හිංසාව ඇති කළ පුද්ගලයාගෙන් පළිගැනීමට ඉල්ලා සිටියි.

මුඃමින් වරයකුට අනිවාර්යය වන්නේ: ඔහුට හෝ වෙනත් අයකුට දහම විෂයයෙහි ඇති වන හිංසාවක් වැළැක්වීම සඳහා හෝ අල්ලාහ්ට හා ඔහුගේ

---

අර්ථයෙනි. එනම් කෝපය ඇති වූ විට තම සිත මඩලා පාලනය කරන්නා පොර බැදීමට සමාන කළේය. එවිට ඔහු මත කෝපයේ සළකුණු හෙළි වන්නේ නැත. සැබෑ වීරයා ඔහුය. බලන්න: 'අන් නිහායා ෆී ගරීබිල් හදීස්' (3/35)

120.අහ්මද් (3/440), තිර්මිදි (2021), අබූ දාවූද් (4777), ඉබ්නු මාජා (4186), ඉමාම් තිර්මිදි මෙය 'හසන් ගරීබ්' ගණයට අයත් හදීසයක් බව සඳහන් කර ඇත.

121. අහ්මද් (1/327), අල් හාෆිල් ඉබ්නු කසීර් තුමා සූරා ආලු ඉම්රාන්හි 134 වන පාඨය විස්තර කිරීමේදී මෙය සඳහන් කර ඇත. එහි හදීස් වාර්තාකරණය හසන් ගණයට අයත් බවත් එහි කිසිදු අඩුවක් නොමැති බවත් එහි පද පෙළ ද හසන් ගණයට අයත් බවත් පවසා ඇත.
මෙම අර්ථයෙන්ම ඉබ්නු උමර් තුමා විසින් වාර්තා කළ හදීසයක් 'මර්ෆූඃ' ගණයෙන් සඳහන් වී ඇත. එනම් 'අල්ලාහ්ගේ තෘප්තිය උදෙසා ගැත්තෙකු කෝපය පාලනය කිරීමේ මාත්‍රාවට වඩා අල්ලාහ් අබියස පවතින ප්‍රතිඵල අතරින් වෙනත් කිසිදු බලවත් මාත්‍රාවක් නැත.' ඉබ්නු මාජා (4189), 'අස්සවාඉද්'හි එහි වාර්තාකරණය සහීහ් ගණයට අයත් බව පවසා ඇති අතර 'ළර්ජ් අත් තර්ගීබ් වත් තර්හීබ්' හි (2752) අෂ්-ෂෙයික් අල්බානී තුමා මෙය 'සහීහ් ලිගයිරිහි' ගණයට අයත් හදීසයක් යැයි සඳහන් කර ඇත.

දූතයාණන්ට පිටුපාන්නන්හට ප්‍රතිචාර දැක්වීම සඳහා ඔහුගේ කෝපය පිහිටීමය.

නබි (ﷺ) තුමාගේ තත්ත්වය මෙය විය. සැබැවින්ම එතුමා තමන් වෙනුවෙන් පළිගන්නෙකු නොවීය. නමුත් අල්ලාහ් තහනම් කරනු ලබන දෙයක් උල්ලංඝනය කරනු ලබන විට එය විය. ඔහුගේ කෝපය සඳහා කිසිවක් පිහිටියේ නැත.

අල්ලාහ්ගේ මාර්ගයේ ජිහාද් කරන අවස්ථාවන්හි පහර දීම මිස එතුමාණන් කිසිවිටෙක සේවකයකුට හෝ කාන්තාවකට පහර දී නැත. අනස් තුමාණන් වසර දහයක් එතුමාණන්ට සේවය කළේය. එතුමාණන් ඔහුට කිසි විටෙක 'ච්' යනුවෙන් අපහාසයෙන් පවසා නැත. ඔහු සිදු කළ දෙයක් සඳහා ඔහුට ඔබ මෙසේ කළේ ඇයිදැ?යි හෝ ඔහු සිදු නොකළ දෙයක් සඳහා ඔබ මෙසේ කරන්නට තිබුණා නොවේදැ?යි හෝ විමසා නැත.[122]

අනස් තුමා විසින් වාර්තා කළ හදීසයක් තබරානී සතු වාර්තාවක මෙසේ සඳහන් වේ. "මම වසර දහයක් අල්ලාහ්ගේ දූතයාණන්ට සේවය කර ඇත්තෙමි. එතුමාණන්ට අනුගතව පවතින යම් කරුණක් හෝ එතුමාණන්ට පටහැනිව පවතින යම් කරුණක් හෝ වේවා සිදුවන දෑ අල්ලාගෙන් පිළිගැනීමක් ලෙස මිස මම නොදනිමි.[123]

ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමියගෙන් නබි (ﷺ) තුමාගේ ගතිපැවතුම් පිළිබඳ විමසන ලදී එවිට එතුමිය 'එතුමාණන්ගේ ගතිපැවතුම් කුර්ආනය විය"[124] යැයි පවසා සිටියාය. ඉන් අදහස් කරනුයේ: සැබැවින්ම එතුමාණන් එහි ඇති විනයන් තුළින් හැඩ ගැසී විනයානුකූලව කටයුතු කර ඇති අතර එහි ඇති ගුණ ධර්මවලින් හැඩ ගැසී සදාචාර සම්පන්න ලෙස කටයුතු කර ඇත්තාහ යන්නයි. අල් කුර්ආනය කවර කරුණක් මෙනෙහි කර සිටියේ ද

122. අනස් තුමාගේ හදීසය ඉමාම් බුහාරි (6038) හා ඉමාම් මුස්ලිම් (2309) විසින් පළ කර ඇත.

123. 'අල් අව්සත්'හි තබරානී (9148), 'අල් මජ්මඋ (9/16) හි අල්හයිසුමී පවසා සිටිනුයේ: තමන් නාදුනන පිරිසක් ද එහි සිටින බවයි.

124. මුස්ලිම් (746)

එතුමාණන්ගේ පිළිගැනීම එහි වූ අතර කවර කරුණක් කුර්ආනය නින්දා කර සිටියේ ද එතුමාණන්ගේ කෝපය එහි විය.

එමෙන්ම එතුමාණන් දැඩි ලෙස ලැජ්ජා විය. කිසිවකු පිළිකුල් කරන අයුරින් එතුමාණන් කිසිවකුට මුහුණ දුන්නේ නැත. නමුත් එම පිළිකුළ එතුමාණන්ගේ මුහුණින් දකින්නට විය. අබූ සර්ද් අල් කුද්රි තුමා විසින් වාර්තා කළ හදීසයක් 'අස්සහීහ්' හි මෙසේ පළ වී ඇත. 'කන්‍යාවියන් තම කන්‍යාභාවය පිළිබඳ ලැජ්ජා වීමට වඩා සැබැවින්ම නබි (ﷺ) ලැජ්ජා සහගත අයකු වූහ. එතුමාණන් තමන්ට පිළිකුල් සහගත දෙයක දුටු විට එය අපි එතුමාණන්ගේ මුහුණින් හඳුනා ගන්නෙමු.''[125]

මෙය අල්ලාහ්ගේ තෘප්තිය එමගින් බලාපොරොත්තු නොවූ බෙදීමකි යැයි ප්‍රකාශකයකු කළ ප්‍රකාශයක් ඉබ්නු මස්ඌද් තුමා එතුමාණන්ට දන්වා සිටි කල්හි එය එතුමාණන් අපහසුතාවයට ලක් කළේය. එතුමාණන්ගේ මුහුණ වෙනස් විය, කෝප විය. නමුත් 'මීට වඩා අධිකව මූසා තුමා හිංසා කරනු ලැබීය. ඔහු ඉවසීමෙන් කටයුතු කර ඇත්තාහ' යැයි පැවසීම මිස වෙනකක් වැඩි නොවීය. [126]

අල්ලාහ් පිළිකුල් කරන දෙයක් දුටු විට හෝ එවැන්නකට සවන් දුන් විට හෝ ඒ වෙනුවෙන් නබි (ﷺ) තුමාණන් කෝප වූහ. ඒ ගැන කතා කළේය. නිහඬව සිටියේ නැත. එතුමාණෝ ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමියගේ නිවසට ඇතුළු වූහ. එවිට රූප ගැන්වූ තිර රෙදි දුටුහ. එතුමාණන්ගේ මුහුණේ වර්ණය වෙනස් විය. එය එතුමා හෙළා දැක "මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ජනයා අතර දැඩි සේ දඬුවමට ලක්වන්නන් වනුයේ මෙවන් රූප හැඩ ගැන් වූ අය වෙති" යැයි පවසා සිටියහ.[127]

ඇතැමුන්හට ඔහු සමග සලාතය ඉටු කරන විට ප්‍රමාදයක් ඇති වන තරමට ජනයාට දිගු වේලාවක් සලාතය මෙහෙය වූ ඉමාම්වරයකු පිළිබඳ පැමිණිලි කරනු ලැබූ කල්හි එතුමාණන් කෝපයට පත් වූහ. එතුමාණන්ගේ කෝපය

125. බුහාරි (3369), මුස්ලිම් (2320).
126. බුහාරි (5749), මුස්ලිම් (1062).
127. බුහාරි (5758), මුස්ලිම් (2107).

දැඩි විය. එතුමාණන් මිනිසුනට උපදෙස් දුන්හ. සලාතය සැහැල්ලු කරන මෙන් අණ කළහ.[128]

මස්ජිදයේ කිබ්ලා දිසාවෙහි සෙම කැටයක් දුටු කල්හි එතුමාණන් කෝප වූහ. එය හූරා ඉවත් කළහ. පසුව මෙසේ පැවසූහ. "සැබැවින්ම ඔබ අතුරින් කිසිවකු සලාතයේ සිටින විට සැබැවින්ම ඔහුගේ ඉදිරියෙහි අල්ලාහ් වෙයි. එහෙයින් සලාතයේදී ඔහුගේ ඉදිරියෙහි සෙම කැට නොගසනු.[129]

එතුමාණන්ගේ ප්‍රාර්ථනා අතුරින් 'අස්අලුක කලිමතල් හක්කි ෆිල් ගලබි වර් රිලා' (කෝපයේදී හා තෘප්තියේදී සත්‍ය පදනම් වූ ප්‍රකාශය මම ඔබෙන් ඉල්ලා සිටිමි)[130] මෙය ඉතා බලවත් ප්‍රාර්ථනාවකි. එනම් සැබැවින්ම මිනිසා කෝප වුවද තෘප්තිමත් වුවද එක සමාන ලෙසින් සත්‍යය මිස වෙන කිසිවක් පැවසිය යුතු නැත. ජනයා අතුරින් වැඩි දෙනෙකු කෝප වූ විට ඔහු පවසන දෑ නතර නොකරති.

***

128. මුස්ලිම් (466), අබූ මස්ඌද් අල් අන්සාරි තුමා විසින් සිදු කරන ලද වාර්තාකරණය ඇසුරෙනි.
129. බුහාරි (720), ඉබ්නු උමර්, අබූ සඊද් හා අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හුම්) යන අයගේ වාර්තාවන්ට අනුව මුස්ලිම්හි (547, 548, 551)
130. අහ්මද් (4/246), නසාඊ (3/54,55), 'සහීහ් අල්ජාමිඃ'හි (1301) ෂෙයික් අල්බානී මෙය සහීහ් ගණයට අයත් හදීසයක් බව පෙන්වා දෙයි.

## الحَدِيْثُ السَّابِعُ عَشَرَ

## දහ හත් වන හදීසය

عَنْ أَبِي يَعْلَى شَدَّادِ بْنِ أَوْسٍ رَضِيَ اللهُ عَنْهُ عَنْ رَسُولِ اللهِ ﷺ قَالَ: "إِنَّ اللهَ كَتَبَ الْإِحْسَانَ عَلَى كُلِّ شَيْءٍ، فَإِذَا قَتَلْتُمْ فَأَحْسِنُوا الْقِتْلَةَ، وَإِذَا ذَبَحْتُمْ فَأَحْسِنُوا الذِّبْحَةَ، وَلْيُحِدَّ أَحَدُكُمْ شَفْرَتَهُ، وَلْيُرِحْ ذَبِيحَتَهُ."

رَوَاهُ مُسْلِمٌ

අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) තුම ප්‍රකාශ කළ බව අබූ යඃලා ෂද්දාද් ඉබ්නි අවුස් රළියල්ලාහු අන්හු තුමා විසින් වාර්තා කරන ලදී.

“සැබැවින්ම අල්ලාහ් සියලු දෑට යහපත කිරීම නියම කර ඇත. එහෙයින් ඔබ (මරණ දඬුවම වශයෙන් යමෙක්) මරණ විට එම මරණය යහපත් අයුරින් සිදු කරනු. ඔබ (ආහාරය සඳහා සතුන්) කපන විට එසේ කැපීම යහපත් අයුරින් සිදු කරගනු. ඔබ අතුරින් කෙනෙකු තම පිහිය හොඳින් මුවහත් කරත්වා ඔබ කපන්නට යන සතා සන්සුන් වන්නට ඉඩ හරිත්වා”

මෙය ඉමාම් මුස්ලිම් විසින් දන්වා ඇත.

***

-විග්‍රහය-

ක්‍රියාවන් අතර පවතින සෑම කටයුත්තකදීම යහපත අනුගමනය කිරීම අනිවාර්යය බව මෙම හදීසය පෙන්වා දෙයි. නමුත් ඒ සෑම දෙයකටම යහපත කිරීම පිහිටනුයේ එයට අදාළ පරිදිය.

අනිවාර්යය කටයුතුත්තක දී යහපත් අනුගමනය කිරීම යනු: එහි අනිවාර්ය ක්‍රියාවන් පූර්ණ ආකාරයෙන් ගෙන ඒම එහි අනිවාර්යය ප්‍රමාණය වන අතර

එහි යහපත අනුගමනය කිරීම යනු ඒවා සමගම ඒවායෙහි ඇති අනිවාර්යය නොවන සතුටු දායක දෑ පූර්ණ ආකාරයෙන් ගෙනැවිත් ඉටු කිරීමයි.

තහනම් දෑ අතහැර දැමීමෙහි යහපත් අයුරින් කටයුතු කිරීම යනු: එයින් වැළකී සිටීම හා එහි අභ්‍යන්තරය මෙන්ම බාහිර දෑ ද අතහැර දැමීමයි. එහි යහපත් අයුරින් කටයුතු කිරීමෙහි මෙම ප්‍රමාණය අනිවාර්යය වන්නේය.

නිර්ණය කරනු ලැබූ දෑ මත ඉවසීමෙන් කටයුතු කිරීමේදී යහපත අනුගමනය කිරීම යනු: ඒ මත කිසිදු පිළිකුලකින් හෝ තැතිගැනීමකින් තොරව ඒවා ඒ අයුරින්ම ඉවසීමෙන් යුතුව ගෙන ඒමය.

මැවීම් සමග ගනුදෙනු කිරීමේදී හා ඔවුන් සමග ආශ්‍රය කිරීමේ දී අනිවාර්යයයෙන් පිළිපැදිය යුතු යහපත යනු: අල්ලාහ් ඒ සම්බන්ධයෙන් අනිවාර්යය කළ සියලුම යුතුකම් හා වගකීම් ක්‍රියාත්මක කිරීමය.

මිනිසුන් සහ සතුන් අතරින් මරණයට අනුමැති දෑ මරණ අවස්ථාවේ යහපත පිළිපැදිම යනු: ඉතා ඉක්මණින් හා පහසුවෙන් ප්‍රාණය ඉවත් වන අයුරින් කටයුතු කිරීමයි. නබි (ﷺ) තුමා මෙම හදීසයේ සඳහන් කර ඇති වර්ගය එයයි. මෙම තත්ත්වය පැහැදිලි කිරීමට අවශ්‍ය කරුණු හෝ උපමා ස්වරූපයෙන් එය පැහැදිලි කර ඇත්තාක් මෙන් පෙනේ.

මරණයට පත් කිරීම හෝ කැපීම යනුවෙන් අදහස් කරනුයේ ඒවා ඉටු විය යුතු ක්‍රමවේදයයි.

එහි තේරුම: ඝාතනය කිරීමේ ක්‍රමය යහපත් අයුරින් සිදු කරනු. කැපීමේ ක්‍රමය යහපත් අයුරින් සිදු කර ගනු යන්නයි.

සතුන් කැපීමේදී යහපත් ක්‍රමය පිළිපැදීමේ අනිවාර්යය ප්‍රමාණය සමස්තයක් වශයෙන් ඉබ්නු හසම් තුමා පැහැදිලි කර ඇත.

නබි (ﷺ) තුමා 'සතුන්ගේ ඉවසීම ඉක්මවා යෑමෙන් වැළැක් වූහ. යැයි බුහාරි හා මුස්ලිම්හි සඳහන්ව ඇත. එනම්: සතා අල්ලාගත් පසුව හීයක් හෝ එවැනි දෙයකින් මිය යන තෙක්ම පහර දීමය.

ඉබ්නු උමර් තුමා විසින් වාර්තා කළ හදීසයක් බුහාරි හා මුස්ලිම්හි මෙසේ සඳහන් වේ. සැබැවින්ම එතුමා කුකුලන් හිටවා තබා ඒවාට ඉලක්ක කරමින් විදින පිරිසක් අසළින් ගමන් ගත්තේය. එවිට ඉබ්නු උමර් තුමා 'මෙය සිදු කළේ කවුරුන්දැ?යි විමසා සිටිමින් සැබැවින්ම නබි (ﷺ) තුමා මෙසේ සිදු කරන්නන් හට ශාප කර ඇත්තේය යැයි පවසා සිටියේය.[131]

ඇත්තවශයෙන්ම නබි (ﷺ) තුමා පණ ඇති දෙයක් ඉලක්කයට ගැනීම තහනම් කළ බවට ඉබ්නු අබ්බාස් තුමා විසින් වාර්තා කළ හදීසයක් මුස්ලිම් තුමා පළ කර ඇත්තේය.[132] ඉලක්කය යනු හීයෙන් විදින ලද දෑය.

මෙම අර්ථයෙන් හදීස් බොහෝමයක් වාර්තා වී ඇත.

සතෙකු කපන අවස්ථාවේ ඉතා කාරුණික ලෙස කැපීම පිළිබඳ නියෝග සඳහන්ව පැමිණ ඇත. අබූ සඊද් අල් කුද්රි තුමා විසින් වාර්තා කළ හදීසයක් ඉබ්නු මාජා තුමා මෙසේ පළ කර ඇත. අල්ලාහ්ගේ දූතයාණන් එළුවෙකුගේ කණින් ඇද යන මිනිසෙකු අසළින් ගමන් ගත්හ. එවිට එතුමාණන් "උගේ කණ අතහැර දමනු. උගේ බෙල්ලෙ ඉදිරි කොටසින් අල්ලා ගනු" යැයි පැවසූහ.[133]

ඉබ්නු අබ්බාස් තුමා විසින් වාර්තා කළ හදීසයක් තබරානී තුමා මෙසේ පළ කර ඇත. එළුවකුගේ ගාත් මත තම කකුල තබමින් ඌ බලමින් සිටියදී තම පිහිය මුවහත් කරමින් සිටින මිනිසෙකු අසළින් අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) ගමන් ගත්හ. එවිට එතුමා: "එය කළින් කළ යුතු නොවේ ද? එය වාර ගණනාවක් මරන්නට ඔබ සිතන්නෙහිදැ?"යි විමසා සිටියහ.[134]

131. බුහාරි (5515), මුස්ලිම් (1958)
132. මුස්ලිම් (1957).
133. ඉබ්නු මාජා, එහි මූසා ඉබ්නු මුහම්මද් අත්-තයිමීද සිටියි. ඉමාම් හාෆිල් 'අත්තක්රීබ්හි (7006) මුන්කර් ගණයට අයත් හදීසයක් බව සඳහන් කරයි.
134. 'කබීර්' හි අත්තබරානී (11332), ආල් හාකිම් (4/231), එහි අවසානයේ 'ඔබ වාර ගණනාවක් මරන්නට සිතන්නෙහි ද? ඌ ඇළ පැත්තට පෙරළා දමන්නට පෙර ඔබේ පිහිය ඔබ මුවහත් කරන්නට තිබුණා නොවේ ද? යි සඳහන් වී ඇත. ඉමාම් හාකිම් තුමා මෙම හදීසය ඉමාම් බුහාරිගේ කොන්දේසි මත පදනම් නොවූ සහීහ් ගණයට අයත් හදීසයක් බව සඳහන් කර සිටින අතරම අෂ්-ෂෙයික් අල්බානී

ඉමාම් අහ්මද් මෙසේ පවසයි: 'කැපීම සඳහා ඉතා මෘදු ලෙස රැගෙන යනු ලැබිය යුතුය. උගෙන් පිහිය සඟවා තැබිය යුතුය. කපන අවස්ථාවේ මිස පිහිය හෙළි නොකළ යුතුය.'

මුආවියා ඉබ්නු කුර්රා තම පියාගෙන් ලබා වාර්තා කළ හදීසයක් මුස්නද් හි මෙසේ සඳහන් වේ. මිනිසකු අල්ලාහ්ගේ දූතයාණනි, සැබැවින්ම මම එළුවකු කපන්නට යම් මම උෟට කරුණාව දක්වමි යැයි පවසා සිටියේය. එවිට එතුමා: "එළුවාට ඔබ කරුණා කරන්නේ නම්, අල්ලාහ් ද ඔබට කරුණා කරනු ඇත."[135/ 136]

මුතර්රිෆ් ඉබ්නු අබ්දුල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: 'බට්ටිච්චන්ට කරුණාව දැක්වීම තුළින් සැබැවින්ම අල්ලාහ් කරුණාව දක්වනු ඇත.'

***

'සහීහ් අත්-තර්ගීබ් වත්-තර්හීබ්'හි (2265) මෙය සහීහ් හදීසයක් බව සඳහන් කර ඇත.

135. අහ්මද් (3/436), 'අස්සිල්සිලතුස් සහීහා' හි අෂ්-ෂෙයික් අල්බානී තුමා එහි වාර්තාකරණය සහීහ් ගණයට අයත් බව පවසා ඇත.

136. මෙය ඉස්ලාමයේ ඇති පුළුල් භාවයයි. එහි සැකැස්මෙහි ඇති පූර්ණත්වයයි. සතුන් සමග මෘදු ලෙස කටයුතු කිරීම හා යහපත් අයුරින් කටයුතු කිරීම පෙන්වා දී ඇත. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්-තරීෆී)

## الحَدِيْثُ الثَّامِنُ عَشَرَ
## දහ අට වන හදීසය

عن أبي ذَرٍّ وَمُعاذِ بْنِ جبلٍ رضيَ الله عنهما، عنْ رسولِ اللهِ ﷺ، قَالَ: "اتَّقِ اللهَ حَيْثُمَا كُنْتَ وأَتْبِعِ السَّيِّئَةَ الْحسنةَ تَمْحُهَا، وخَالقِ النَّاسَ بخُلُقٍ حَسَنٍ"

رواهُ التِّرْمذيُّ وقال: "حديثٌ حسنٌ" وفي بعض النُّسخ: (حَسَنٌ صَحِيْحٌ)

අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) ප්‍රකාශ කළ බව අබූ දර් තුමා හා මුආද් ඉබ්නු ජබල් තුමා (රළියල්ලාහු අන්හුමා) යන අය විසින් වාර්තා කරන ලදී.

“ඔබ කොතැනක සිටියද අල්ලාහ්ට බැතිමත්ව කටයුතු කරන්න. පාපයට පරව යහපතක් සිදු කරන්න. එය එ(ම පාප)ය මකා දමනු ඇත. මිනිසුන් සමග ගුණ යහපත් බවින් කටයුතු කරන්න.”

මෙය ඉමාම් තිර්මිදි විසින් දන්වා ඇති අතර එය හසන් වර්ගයට අයත් හදීසයක් බව පවසා ඇත. ඇතැම් පිටපත්වල එය සහීහ් හසන් වර්ගයට අයත් බව සඳහන් වී ඇත.

***

‘තක්වා’හි මූලධර්මය: ගැත්තා තමන් හා ඔහු බිය වන සහ ඔහු ප්‍රවේශම් වන්නට බලන දෑ අතර ඔහු ව ආරක්ෂා කරන්නක් වශයෙන් රැකවරණයක් ඇති කිරීමය. ගැත්තා තම පරමාධිපතිට තබන තක්වාව ඔහු අතර හා ඔහුගේ පරමාධිපති සම්බන්ධයෙන් බිය වන දෑ -ඔහුගේ කෝපය, කෝන්තිය, දඬුවම වැනි දෑ- අතර ඒවායින් ආරක්ෂාවනු පිණිස රැකවරණයක් සලසා ගැනීමය.

එය ඔහුට අවනත වී ක්‍රියා කිරීමයි. එමෙන්ම ඔහුට පිටුපෑමෙන් වැළකී සිටීමයි.

හසන් තුමා මෙසේ පවසයි: 'භක්තිමත් ජනයා ඔවුනට තහනම් කළ දැයින් වැළකී සිටිනු ඇත. ඔවුන් වෙත අනිවාර්යය කරනු ලැබූ දෑ ඉටු කරනු ඇත.'

තල්ක් ඉබ්නු හබීබ් තුමා: 'තක්වා යනු අල්ලාහ්ට අවනත වෙමින් අල්ලාහ්ගෙන් වූ ආලෝකය මත පදනම් වී අල්ලාහ්ගේ තිළිණ අපේක්ෂාවෙන් ක්‍රියා කිරීම හා අල්ලාහ්ගේ ආලෝකය මත පදනම් වී අල්ලාහ්ගේ දඬුවමට බියෙන් අල්ලාහ්ට පිටුපෑම අතහැර දැමීමයි.

'අල්ලාහ්ට භක්තිමත් විය යුතු අයුරින් භක්මත් වනු' (ආලු ඉම්රාන්: 102) යන අල්ලාහ්ගේ ප්‍රකාශය විස්තර කරමින් ඉබ්නු මස්ඌද් තුමා පවසා සිටිනුයේ: 'පිළිපදිනු ලැබ පිටුපානු නොලැබීම මෙනෙහි කරනු ලැබ අමතක කරනු නොලැබීම හා කෘතඥ වී ගුණමකු නොවී සිටීම යැයි පවසා සිටියේය.

***

"ඔබ කොතැනක සිටියද අල්ලාහ්ට බැතිමත්ව කටයුතු කරන්න." යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

එහි අදහස: මිනිසුන් ඔහුව දකින අයුරින් හෝ නොදකින අයුරින් ප්‍රසිද්ධියේ මෙන්ම රහසිගතව සිටියදී යන්නයි.

ඉමාම් ෂාෆිඊ තුමා: වඩාත් දුෂ්කර කරුණු තුනක් ඇත. ඒවානම්: නැතිබැරි හිඟ අවස්ථාවක පරිත්‍යාග කිරීම, තනිව සිටින අවස්ථාවක භක්තිමත් වීම හා අපේක්ෂා කරනු ලබන හා බිය ඇති කරනු ලබන අය අබියස සත්‍යය කතා කිරීම යැයි පැවසීය.

අබූ සුලයිමාන් තුමා මෙසේ පවසයි: පරාජිතයා යනු: 'තම යහපත් ක්‍රියා මිනිසුනට මතුපිටින් පෙනෙන්නට සළස්වා ගෙල නහරට වඩා තමන්ට සමීපයෙන් සිටින්නාට අශීලාචාරය දැයින් කැපී පෙනෙන්නාය.!'

ඔවුන්ගෙන් සමහරු ගැමි අරාබි කාන්තාවක් වෙත ගොස් : අපට දැකිය හැක්කේ ග්‍රහලෝක පමණි! යැයි පැවසූහ. එවිට ඇය 'එසේ නම් ග්‍රහලෝක ඇති කළ අය කොහේදැ?යි විමසා සිටියාය.

මුහම්මද් ඉබ්නු අල් මුන්කදිර් තුමා, කාන්තාවක් සමග සිටගෙන කතා කරමින් සිටින පුද්ගලයකු දුටුවේය. එවිට එතුමා: සැබැවින්ම අල්ලාහ් ඔබ දෙදෙනා බලා සිටියි. යැයි පැවසූහ.

ඉමාම් අහ්මද් තුමා කවියක මෙසේ සඳහන් කර ඇත.

දවසක් කවදා හෝ හිස් වී නම්, 'මම හිස්වූයෙමි' යැයි නොපවසන්න.

එනමුත් මා වෙත නිරීක්ෂකයකු ඇතැයි පවසන්න.

මොහොතක් හෝ අල්ලාහ් අනවධානි යැයි නොසිතන්න.

ඔහුට කිසිවක් සැඟ වී මුළා වී ගොස් ඇතැයි ද නොසිතන්න.

නබි (ﷺ) තුමා කවර කරුණක් මුආද් තුමාට උපදෙස් දී තිබුණේ ද එතුමා ඒ අයුරින්ම පිළිපැද්දේය. උමර් තුමා යම් කිසි කටයුත්තක් සඳහා එතුමාව එව්වේය. ඔහු කිසිවක් නැතිව ආපසු පැමිණියේය. ඔහුගේ බිරිය ඔහුට අවවාද කළාය. එවිට ඔහු: 'මා සමග පීඩකයෙක් විය. කිසිවක් ගැනීමෙන් ඔහු මා වැළැක්වීය. සැබැවින්ම එතුමා ඉන් අදහස් කළේ එතුමාගේ පරමාධිපතියාණන්ය. නමුත් එතුමාගේ බිරිය සිතා සිටියේ සැබැවින්ම උමර් ඔහු සමග නිරීක්ෂකයකු යවා ඇති බවය.

කවරෙකුට මෙම නිලය සදාකල් හෝ බොහෝ විට ඇති වන්නේ නම් ඔහු දැහැමියන් අතරින් වන්නේය. ඔවුහු අල්ලාහ්ව බලා සිටින්නාක් මෙන් ඔහුට නැමදුම් කරන්නෝ වෙති. එවන් දැහැමියන් අතරින් දොස් නගනු ලබන දෑ හැර මහා පාපයන්ගෙන් හා අශීලාචාර දැයින් වැළකී සිටින්නෝ වෙති.

***

'පාපයට පරව යහපතක් සිදු කරන්න. එය එම පාපය මකා දමනු ඇත' යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

ගැත්තෙකු රහසිගත ව හා ප්‍රසිද්ධියේ තක්වාව හෙවත් භක්තිමත්භාවය පිළිපදින මෙන් නියෝග කරනු ලැබ සිටිය ද ඒ සමගම තක්වා විෂයයෙහි ඇතැම් විට අඩුපාඩු සිදුවන්නට ද ඉඩ ඇත. එවිට එම අයහපත මකා දමන ක්‍රියාවක් කරන්නැයි ඔහු නියෝග කර සිටියි. එනම් එයට පරව ඔහු යහපතක් සිදු කිරීමය.

මෙම උපදෙස තුළ කවර උපදෙසක් නබි (ﷺ) තුමා විසින් කර ඇත්තේ ද එයට සමගාමී ව 'මුත්තකීන්' හෙවත් භක්තිමතුන් පිළිබඳ අල්ලාහ් මෙසේ විස්තර කර සිටියි. "(133) තවද නුඹලාගේ පරමාධිපතිගෙන් වූ සමාව වෙත ද (ස්වර්ග) උයන වෙත ද නුඹලා එකිනෙකා ශීඝ්‍ර වවු. එහි පළල අහස් හා මිහිතලය (තරම්)ය. එය බිය භක්තිකයින්ට සූදානම් කරනු ලැබ ඇත. (134) (ඔවුහු) කවුරුන්ද යත් සමෘද්ධියෙහිදී හා (දිළිඳු කමින් වූ) පීඩාවෙහිදී (අල්ලාහ්ගේ මාර්ගයේ) වියදම් කරන්නෝ වෙති. තවද කෝපය මැඩ පවත්වා ගන්නෝ වෙති. තවද (ඔවුන්ට අපරාධ කළ) ජනයින්ට සමාව දෙන්නෝ ද වෙති. අල්ලාහ් යහපත කරන්නන්ව ප්‍රිය කරන්නේය. (135) තවද (ඔවුහු) කවුරුන්දයත් ඔවුන් අශික්ෂිත දැයක් කළ විට හෝ ඔවුන් තමන්ටම අපරාධ කර ගත් විට අල්ලාහ්ව මෙනෙහි කර තමන්ගේ පාපයන්ට සමාව ඇයැදිති. අල්ලාහ් හැර පාපයන් සමා කරන්නේ කවරෙකු ද? තවද ඔවුහු දැනුවත්වම ඔවුන් කළ (පාපකාරී) දෑ මත (පශ්චාත්තාප නොවී) තිරසාරව නොසිටිති. (136) ඔවුන් නම්, ඔවුන්ගේ (යහ)ප්‍රතිඵලය වන්නේ තම පරමාධිපතිගෙන් වූ සමාව ද (ස්වර්ග) උයන් ද වේ. ඊට යටින් ගංගාවෝ ගලා බසිති. (ඔවුහු) එහි සදාතනිකයෝ වෙති. (යහ)ක්‍රියා කරන්නන්ගේ වේතනය කෙතරම් යහපත් ද!" (ආලු ඉම්රාන් 133-136)

මැවීම් සමග යහපත් ආකාරයෙන් කටයුතු කරන මුත්තකීන් හෙවත් බිය බැතිමතුන් පිළිබඳ වර්ණනා කර ඇත. එහිදී වියදම් කිරීම, කෝපය පාලනය කිරීම, ඔවුනට සමාව දීම යනාදී වශයෙන් විස්තර කර ඇති අතර ඔවුන් පිළිබඳ වූ වර්ණනාව අතර උපකාර කිරීම හා පීඩාවන් දරා ගැනීම එකතු කර ඇත. එය සදාචාරයේ උච්චම ස්ථාවරයයි. නබි (ﷺ) මුආද් තුමාට උපදෙස් දුන්නේ එයයි. පසුව "ඔවුන් අශික්ෂිත දැයක් කළ විට හෝ ඔවුන් තමන්ටම අපරාධ කර ගත් විට අල්ලාහ්ව මෙනෙහි කර තමන්ගේ පාපයන්ට සමාව ඇයැදිති." යැයි ඔවුන් ගැන වර්ණනා කර ඇත. ඒ මත ඔවුන් අඛණ්ඩව සිටියේ නැත. සැබැවින්ම බිය බැතිමතුන් විසින් ඇතැම් වේලාවට මහා

පාපයන් සිදුවන්නට ඉඩ ඇත. එය අශීලාචාර දැය. එමෙන්ම සුළු පාපයන් ද සිදු වනු ඇත. එය තමන්ටම සිදු කර ගන්නා අපරාධයයි. නමුත් ඔවුන් ඒ මතම රැඳී සිටින්නේ නැත. එය සිදු වූවායින් පසු අල්ලාහ්ව මෙනෙහි කරති. ඔහුගෙන් සමාව අයැද සිටිති ඒ පශ්චාත්තාප වෙති. මෙහි පශ්චාත්තාප වීම යනු: නිරත වීමෙහි ස්ථාවරත්වය අතහැර දැමීමය.

අල්ලාහ්ව මෙනෙහි කරති යන ප්‍රකාශය වනාහි: එනම් ඔහුගේ බලය, ඔහුගේ ග්‍රහණයේ හා පළිගැනීමේ දැඩි භාවය හා පාපකම් සිදු කරන්නන් හට කවර දඬුවමක් ප්‍රතිඥා කර ඇත්තේ ද ඒ පිළිබඳ ඔවුන් මෙනෙහි කර බැලීමය. එවිට එම තත්ත්වයෙන් නැවත හැරීමටත් සමාව අයැද සිටීමටත් එය අතහැර දැමීමට එය බල කරනු ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි. “සැබැවින්ම බිය භක්තිමත් වන්නන් ෂෙයිතාන්ගෙන් පෙලඹවීමක් ඔවුන්ව ස්පර්ශ කළ විට ඔවුහු (අල්ලාහ්ව) මෙනෙහි කර එසැණින් ඔවුහු (සත්‍යය) පැහැදිලිව දකින්නන් වෙති.” (අල් අඃරාෆ්: 201)

නබි (ﷺ) ප්‍රකාශ කළ බව බුහාරි හා මුස්ලිම්හි මෙසේ වාර්තා වී ඇත. ගැත්තෙකු පාපයක් සිදු කරයි. පසුව ඔහු: ‘මාගේ පරමාධිපතියාණනි, සැබැවින්ම මම පාපයක් සිදු කළෙමි. එහෙයින් මට සමාව දෙනු මැනව!’ යැයි ඉල්ලා සිටියි. එවිට අල්ලාහ් ‘මාගේ ගැත්තා පාපය සමා කරන එමෙන්ම පාපය හේතුවෙන් ග්‍රහණය කරන පරමාධිපතියෙකු සැබැවින්ම ඔහුට සිටින බව දැන සිටියි. සැබැවින්ම මාගේ ගැත්තාට මම සමාව දුනිමි’ යැයි පවසයි. පසුව ඔහු තවත් පාපයක් සිදු කරයි. ඔහු: ‘මාගේ පරමාධිපතියාණනි, සැබැවින්ම මම පාපයක් සිදු කළෙමි. එහෙයින් මට සමාව දෙනු මැනව!’ යැයි ඉල්ලා සිටියි. එවිට අල්ලාහ් ‘මාගේ ගැත්තා පාපය සමා කරන එමෙන්ම පාපය හේතුවෙන් ග්‍රහණය කරන පරමාධිපතියෙකු සැබැවින්ම ඔහුට සිටින බව දැන සිටියි. පසුව ඔහු තුන්වන වරටද පාපයක් සිදු කර: ‘මාගේ පරමාධිපතියාණනි, සැබැවින්ම මම පාපයක් සිදු කළෙමි. එහෙයින් මට සමාව දෙනු මැනව!’ යැයි ඉල්ලා සිටියි. එවිට අල්ලාහ් ‘මාගේ ගැත්තා පාපය සමා කරන එමෙන්ම පාපය හේතුවෙන් ග්‍රහණය කරන පරමාධිපතියෙකු සැබැවින්ම ඔහුට සිටින බව දැන සිටියි. මාගේ ගැත්තාට සැබැවින්ම මම සමාව දුනිමි. යැයි පවසයි. පසුව ඔහු තවත් පාපයක් සිදු කර ‘මාගේ පරමාධිපතියාණනි, සැබැවින්ම මම පාපයක් සිදු කළෙමි. එහෙයින් මට සමාව දෙනු මැනව!’ යැයි ඉල්ලා සිටියි. එවිට අල්ලාහ් ‘මාගේ ගැත්තා පාපය

සමා කරන එමෙන්ම පාපය හේතුවෙන් ග්‍රහණය කරන පරමාධිපතියෙකු සැබැවින්ම ඔහුට සිටින බව දැන සිටියි. සැබැවින්ම මම මාගේ ගැත්තාට සමාව දුනිමි. මාගේ ගැත්තා ඔහු අභිමත කරන දෑ සිදු කරත්වා! යැයි පවසයි.[137] ඉන් අදහස් කරනුයේ මෙම තත්ත්වයේම සදා සිටීමය. එනම් පාපයක් සිදු කරන සෑම අවස්ථාවකම ඒ සඳහා සමාව අයැද සිටීමයි.

නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බව අබූ බක්ර් අස්සිද්දීක් තුමා විසින් වාර්තා කළ හදීසයක් තිර්මිදි හි මෙසේ සඳහන් වේ. ''පාප ක්ෂමාව අයැද සිටින්නා එදින හැත්තෑ වාරයක් නැවත නැවතත් සිදු කළ ද ඔහු එහි අඛණ්ඩව රැඳී සිටින්නේ නැත.''[138]

අලී (රළියල්ලාහු අන්හු) තුමා විසින් ලබා ඉබ්නු අබිද් දුන්යා මෙසේ වාර්තා කරයි. (නුඹලා අතර ශ්‍රේෂ්ඨයා වනුයේ වැරදි සිදු කරන පව්සමාවෙහි නිරත වන සෑම කෙනෙකුමය. ඔහු නැවත යොමු වූයේ නම් යැයි විමසන ලදී. එයට 'ඔහු අල්ලාහ්ගෙන් සමාව අයදැ පසුතැවිලි වෙයි.' යැයි පැවසීය. නැවතත් ඔහු යොමු වූයේ නම් යැයි විමසන ලදී. එයට ද 'ඔහු අල්ලාහ්ගෙන් සමාව අයදැ පසුතැවිලි වෙයි.' යැයි පැවසීය. නැවතත් ඔහු යොමු වූයේ නම් යැයි විමසන ලදී. එයට ද 'ඔහු අල්ලාහ්ගෙන් සමාව අයැද පසුතැවිලි වෙයි.' යැයි පැවසීය. කවදා වන තෙක් දැයි විමසන ලදී. එයට ඔහු 'ෂෙයිතාන් බලහීන වන තෙක්' යැයි පැවසීය.

137. බුහාරි (7507), මෙම හදීසය අබූ හුරෙය්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කර ඇත.

138. අබූ දාවූද් (1514), තිර්මිදි (3559), එතුමා මෙම හදීසය ගරීබ් ගණයට අයත් හදීසයක් බවත් එහි වාර්තාකරණය බලවත් නොවන බවත් සඳහන් කර ඇත. ෂෙයික් අල්බානී 'සහීහ් අල්ජාමිඃ'හි (5004) මෙය දුර්වල හදීසයක් බව පවසා ඇත.
මා පවසා සිටිනුයේ: 'ෆත්හුල් බාරි'හි (1/137) අල් හාෆිල් ඉබ්නු හජර් තුමා මෙය සඳහන් කර ඇති අතර එහි වාර්තාකරණය හසන් ගණයට අයත් බව හෙතෙම පවසා සිටියි.

ඉබ්නු මස්ඌද් තුමා විසින් වාර්තා කළ හදීසයක් ඉබ්නු මාජා තුමා මර්ෆූඃ ගණයට අයත් හදීසයක් ලෙස පළ කර ඇත. "පවට පසුතැවිලි වන්නා කිසිදු පවක් නැති තැනැත්තෙකු මෙනි"[139]

හසන් තුමාට මෙසේ පවසන ලදී. අප අතුරින් කිසිවකු හෝ ඔහුගේ පරමාධිපතිට ලැජ්ජා විය යුතු නොවේ ද? ඔහුගේ පාපකම් හේතුවෙන් ඔහු සමාව අයැද සිටියි. පසුව නැවත එය සිදු කරයි. පසුව නැවතත් සමාව ඇයද සිටියි පසුව නැවතත් සිදු කරයි. එයට එතුමා: 'එයින් නුඹලාගෙන් ජය ලබන්නේ නම් යැයි ෂෙයිතාන් ආශා කරයි. එහෙයින් නුඹලා පව්සමාව අයැදීමෙන් වෙනතකට නැඹුරු නොවනු.'

නබි (ﷺ) තුමා පැවසූ බවට අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් තුමා විසින් වාර්තා කළ හදීසයක් 'අල්මුස්නද්'හි මෙසේ සඳහන්ව ඇත. "නුඹලා කරුණාව දක්වන්න. නුඹලාටද කරුණා කරනු ලබනු ඇත. නුඹලා සමාව අයැද සිටින්න. නුඹලාට සමාව පිරිනමනු ලබනු ඇත. කියනමට සවන් දී උදව් නොකළවුන්ට විනාශය අත්වේවා! එමෙන්ම ඔවුන් දැනුවත්ව ඔවුන් සිදු කළ දැහි අඛණ්ඩව රැඳී සිටින්නන්හට ද විනාශය අත්වේවා! යැයි පැවසූහ.[140]

'කියමනට සවන් දී උදව් නොකළවුන්' යන්නෙන් අර්ථවත් කර ඇත්තේ 'අක්මාඋල් කව්ල්' නම් අරාබි පදයයි. එය විස්තර කර ඇත්තේ: කවරෙකුට පුනීලයක් මෙන් දෙකන් තිබී ප්‍රඥාවෙන් යුත් සහ යහපත් උපදෙස්වලට සවන් නොදීමය. ඔහුගේ කනට ඒවායින් කිසිවක් ප්‍රවේශවන විට වෙනත්

139. ඉබ්නු මාජා (4250), වාර්තාකරණයේදී අබූ උබය්දුල්ලාහ් ඉබ්නු අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් තුමා හා -මෙම හදීසයේ වාර්තාකරු වන - ඔහුගේ පියා අතර විසන්ධිවීමක් සිදුව ඇත. එය එම හදීසය දුර්වල හදීසයක් බවට පත් කළේය. නමුත් එය විවිධ මාර්ග ඔස්සේ වාර්තා වී තිබීමෙන් බලවත් වන්නේය. අෂ්-ෂෙයික් අල්බානී තුමා එය විවිධ මාර්ග ඔස්සේ වාර්තා වී තිබීම හේතුවෙන් එය හසන් ගණයට අයත් බව පවසා සිටියි. නිවැරදි දෑ මැනවින් දන්නා අල්ලාහ්ය. බලන්න: 'අල්-ලර්ෆා' (615).

140. අහ්මද් (2/165), 'අස්සහීහ්'හි (482) ෂෙයික් අල්බානී තුමා මෙය සඳහන් කර ඇත. එතුමා මෙහි වාර්තාකරණය පිළිබඳ සඳහන් කිරීමේදී 'එය සහීහ් ගණයට අයත් වාර්තාකරණයක් බවත් එහි සියලු වාර්තාකරුවන් විශ්වසනීය බවත් සඳහන් කර ඇත.

පැත්තකින් එය පිටවෙයි. සවන් දුන් දැයින් කිසිදු ප්‍රයෝජනයක් ඔහු ලබන්නේ නැත.

***

'පාපයට පරව යහපතක් සිදු කරන්න.' යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

යහපත යනුවෙන් අදහස් කරනුයේ එම පාපය වෙනුවෙන් වූ පව් සමාව අයැද සිටීමය. තව්බාව හෙවත් පාපක්ෂමාව යන අර්ථය වඩාත් පොදු වූවක් බව ඉන් අදහස් කරනු ලැබේ. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා ඇත. "(නබිවරය,) නුඹ දහවලෙහි දෙකෙළවරෙහි ද රාත්‍රියෙන් කොටසක ද සලාතය විධිමත්ව ඉටු කරනු. සැබැවින්ම යහකම් අයහකම් ඉවත් කරන්නේය. මෙය මෙනෙහි කරන්නන්හට උපදෙසකි. (සූරා හූද්: 114)[141]

නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බව අබූ බක්කර් (රළියල්ලාහු අන්හු) විසින් වාර්තා කළ හදීසයක් ඉමාම් අහ්මද්, අබූ දාවූද්, තිර්මිදි, නසාර්, ඉබ්නු මාජා යන ඉමාම්වරු විසින් පළ කර ඇත. 'යම් කිසි පුද්ගලයකු යම් පවක් සිදු කර පසු ව නැගිට සිට පිරිසිදු වී පසු ව සලාත් ඉටු කර පසු ව අල්ලාහ්ගෙන් සමාව ඉල්ලා සිටින්නේ නම්, අල්ලාහ් ඔහුට සමාව දෙනු මිස නැත. පසුව 'තවද (ඔවුහු) කවුරුන්දයත් ඔවුන් අශික්ෂිත දැයක් කළ විට හෝ ඔවුන් තමන්ටම

141. යහපත අයහපත මකා දමන්නාක් මෙන් එතරම් නොවූව ද අයහපත ද යම් ප්‍රමාණයක් යහපත මකා දමනු ඇත. උත්තරීතර අල්ලාහ්: 'නුඹලා නොදැනුවත්වම නුඹලාගේ ක්‍රියාවන් නිෂ්ඵල වී යනු ඇත." යැයි පවසා ඇත. ඔහු තවත් ස්ථානයක 'නුඹලාගේ දානයන් නුඹලා නිෂ්ඵල කර නොගන්න' යැයි පවසා ඇත. ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය ඊනා ගනුදෙනු කළ අවස්ථාවක උම්මු සෙයිද් ඉබ්නු අර්කම් තුමියට මෙසේ ප්‍රකාශ කළාය. 'ඔහු පසුතැවිලි නොවන්නේ නම් අල්ලාහ්ගේ දූතයාණන් සමඟ ඔහු කළ ජිහාදය අවලංගු කළ බව ඔහුට දන්වා සිටින්න. පොදුතාවයෙන් අමතර දෙයක් ලෙස දැහැමියන් බොහෝමයක් දෙනා මෙම කරුණ නොසලකා හරියි. ඔහු යහපත සිදු කරයි. නමුත් හරාම්හි වැටී සිටියි. ඔහු තැන්පත් වෙයි. එවිට අවනතවීම සඳහා ඔහු සිදු කරන සෑම කටයුත්තකදීම ෂෙයිතාන් ඔහුගේ දෑස් ඉදිරියට පැමිණෙයි. අවසානයේ ඔහු තැන්පත් වී අධික ලෙස පාපකම් ඉටු කරන්නට බලයි. යටත් විය යුතු දෑ ඉතිරිව ඇතැයි සිතයි. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්තරීෆී)

අපරාධ කර ගත් විට අල්ලාහ්ව මෙනෙහි කර තමන්ගේ පාපයන්ට සමාව ඇයැදිති.” යන ආලු ඉම්රාන් 135 වැනි පාඨය පරායනය කළහ.[142]

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බවට උස්මාන් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් ‘සහීහ් මුස්ලිම්’හි මෙසේ පළ වී ඇත. “කවරෙකු වුළූ ධෝවනය කරන්නේ ද, එම වුළූ ධෝවනය ඉතා මැනවින් ඉටු කරන්නේ ද ඔහුගේ පාපකම් ඔහුගේ නියවලින් පවා බැහැර වන තරමට ඔහුගේ ශරීරයෙන් බැහැර වී යනු ඇත.[143]

මේ සම්බන්ධයෙන් වූ හදීස් බොහෝමයක් ඇත.

මාලික් ඉබ්නු දීනාර් : ‘වේළුණු කොළය සුළඟ වට්ටන්නාක් මෙන් වැරදි සඳහා හඬා වැළපීම පව් ද මකා දමනු ඇත.’ යැයි ප්‍රකාශ කර සිටියේය.

***

ගැටලු දෙකකදී ජනයා මතභේද වෙති.

ඒ දෙකින් පළමුවැන්න: දැහැමි ක්‍රියාවන් මහා පාපකම්වලට හා සුළු පාපකම්වලට ප්‍රතිකර්මයක් වන්නේ ද එසේ නැතහොත් සුළු පාපකම්වලට හැර වෙනත් දැට ප්‍රතිකර්මයක් නොවන්නේ ද යන ගැටලුවයි.

අතැමුන් පවසා සිටිනුයේ: සුළු පාපකම්වලට හැර වෙනත් දෑ සඳහා එය ප්‍රතිකර්මයක් නොවෙයි. මහා පාපකම් වනාහි ඒ සඳහා තව්බා කිරීම අවශ්‍ය ය. ඊට හේතුව අල්ලාහ් තව්බා කරන මෙන් ගැත්තන් හට නියෝග කර ඇති බැවිනි. තව්බා නොපතන්නා අපරාධකරුවකු ලෙස සැළකේ. සැබැවින්ම තව්බාව අනිවාර්යය බව මුළු සමූහයාම එකග වෙති. අනිවාර්යය දෑ චේතනාවෙන් හා අධිෂ්ඨානයෙන් මිස ඉටු කරනු ලබන්නේ නැත. වුළූ

142. අහ්මද් (1/10), අබූ දාවූද් (1521), තිර්මිදි (3006), ‘අල්-කුබ්රා’හි අන්-නසාඊ (6/315), ඉබ්නු මාජා (1395).
අල්-හාෆිල් ඉබ්නු හජර් ‘අත්-තහ්සීබ්’හි (අස්මා ඉබ්නු අල් හකම් අල් ෆිසාරී) සම්බන්ධයෙන් පවසන විට මෙය සඳහන් කර ඇත. පසුව: ‘මෙම හදීසය වාර්තාකරණයෙන් ඉතා යහපත්ය’ යැයි පවසා සිටියේය. අෂ්-ෂෙයික් අල් බානී තුමා ‘සහීහ් අත්-තර්ගීබ්’හි මෙය සහීහ් හදීසයක් ලෙස සඳහන් කර ඇත.

143. මුස්ලිම් (245).

ගැනීම, සලාතය ඉටු කිරීම හා සෙසු ඉස්ලාමයේ වගකීම් ඉටු කිරීම යනාදිය මහා පාපකම්වලට ප්‍රතිකර්මයක් වන්නේ නම් තව්බාවේ අවශ්‍යතාවක් ඇති නොවන්නේය. මෙය මුළුමණින්ම අසත්‍ය ප්‍රකාශයකි.

එමෙන්ම අනිවාර්යය වගකීම් සිදු කිරීම තුළින් මහා පාපයන්ට සමාව දෙනු ලබන්නේ නම් එම වගකීම් ගෙන එන විට නිරයට පිවිසෙන කිසිදු පාපයක් කිසිවකුට ඉතිරි වන්නේ නැත.! මෙය මුර්ජිආ පාර්ශවයින්ගේ ප්‍රකාශයට සමානය. එය ව්‍යාජ ප්‍රකාශයකි.

මෙය ඉබ්නු අබ්දුල් බර් 'අත්තම්හීද්' නම් කෘතියෙහි සඳහන් කර ඇති ප්‍රකාශයයි. ඉජ්මා නොහොත් මුස්ලිම් සම්මුතිය පවසා සිටිනුයේ ද එලෙසය. ඒ සඳහා සාධක වශයෙන් පහත හදීසයන් ගෙනහැර දක්වා ඇත.

නබි (ﷺ) තුමාණන් මෙසේ ප්‍රකාශ කර ඇත: "පස් වාර සලාතයන් ද ජුමුආව අනෙක් ජුමුආව දක්වා ද රමළානය අනෙක් රමළානය දක්වා ද මහා පාපයන්ගෙන් වැළකී සිටින තාක් කල් ඒවා අතර ඇති දෑ සඳහා ප්‍රතිකර්ම වන්නේය. මෙය අබූ හුරෙය්රා විසින් වාර්තා කර ඇත.[144] සැබැවින්ම මෙම හදීසය මෙවන් අනිවාර්යය වගකීම් තුළින් මහා පාපයන් මැකී නොයන බව පෙන්වා දෙයි.

මෙම හදීසයේ අර්ථය ඉබ්නු අතිය්යා තුමා ඔහුගේ තෆ්සීරයෙහි කියමන් දෙකක් මත පදනම් ව ප්‍රකාශ කර ඇත.

පළමුවැන්න: එතුමා අහ්ලුස්සුන්නාවරුන්ගෙන් බහුතර පිරිසකගේ මතය පවසා ඇත. එනම් සුළු පාපයන් සඳහා මෙම වගකීම් ප්‍රතිකර්මයක් වීමට නම් සැබැවින්ම මහා පාපයන්ගෙන් වැළකී සිටීම කොන්දේසියක් වන්නේය. එහෙයින් එයින් නොවැළකුණු විට කොහෙත්ම එම වගකීම් කිසිවකට ප්‍රතිකර්මයක් වන්නේ නැත.

144. මෙය බුහාරි හා මුස්ලිම් යන එකතුවෙහි සඳහන් වී නැති නමුත් සහීහ් මුස්ලිම්හි (233) පමණක් වෙනමම සඳහන් වී ඇත.

දෙවැන්න: සැබැවින්ම ඒවා[145] පොදුවේ සුළු පාපයන් සඳහා ප්‍රතිකර්මයක් වුව ද මහා පාපයන් සඳහා ප්‍රතිකර්මයක් නොවෙයි. එවන් දැයක් සිදු වුවද කුඩා පාපයන් සඳහා තව්බා පැතීමේ හා එහි සදා නිරත නොවීමේ කොන්දේසිය මත විය යුතුය. මෙය වඩාත් නිවැරැදි ප්‍රකාශය යැයි එතුමා පවසා සිටියි. එමෙන්ම හස්සාක් විසින් ද මෙය ප්‍රකාශ කරනු ලැබ ඇත.

'කුඩා පාපයන් සඳහා තව්බා පැතීමේ හා එහි සදා නිරත නොවීමේ කොන්දේසිය මත' යන එතුමාගේ ප්‍රකායෙහි අදහස වනුයේ සැබැවින්ම ඒ මත අඛණ්ඩව සිටින විට එය මහා පාපයක් බවට පත් වේ. එවිට යහ ක්‍රියාවන් එයට ප්‍රතිකර්මයක් නොවනු ඇත යන්නයි.

එතුමා පවසා සිටි පළමු ප්‍රකාශය ආගන්තුක ප්‍රකාශයකි. අපගේ සමගාමීන් අතුරින් අබූ බක්ර් අබ්දුල් අසීස් ඉබ්නු ජඃෆර් තුමා ද මෙවැනිම ප්‍රකාශයක් කර ඇත.

නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බව උස්මාන් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් සහීහ් මුස්ලිම්හි මෙසේ සඳහන් වී ඇත. "කවර මුස්ලිම් පුද්ගලයකු හෝ වේවා ඔහුට අනිවාර්ය සලාතයේ වේලාව පැමිණ පසුව ඔහු ඒ සඳහා වූ වුළූ ධෝවනයත් එහි වූ භක්තිමත් භාවයත් හා එහි රුකූ ඉරියව්වන් මනා ලෙස ඉටු කරන්නේ නම් එයට පෙර සිදු වූ පාපයන් සඳහා ඔහු මහා පාපයක් සිදු නොකරන තාක් කල් එය ඔහුට ප්‍රතිකර්මයක් බවට පත්වනු මිස නැත. එය එහි මුළු කාලයට අදාළ වන්නේය."[146]

හදීස්වේදීන්ගෙන් පිරිසක් හා තවත් කිහිප දෙනෙකු විසින් සැබැවින්ම මෙම ක්‍රියා පිළිවෙත් මහා පාපයන්ට ප්‍රතිකර්මයක් වන බව අදහස් පළ කර ඇත. ඔවුන් අතරින් ඉබ්නු හසම් තුමා ද කෙනෙකි. අනා ඉබ්නු අබ්දුල් බර් 'අත්-තම්හීද්' නම් කෘතියෙහි එයට ප්‍රති උත්තරයක් ලබා දී ඇත. මෙම ප්‍රකාශකයාගේ ප්‍රකාශය නොවී නම් මෙම පාඩම පිළිබඳ කතා කිරීමට මම බොහෝ කැමැත්තෙන් සිටියෙමි. වැළපීමෙන් හෝ සමාව අයැද සිටීමෙන් හෝ තව්බා පැතීමෙන් තොරව සැබැවින්ම ඒවා සලාතය මගින් කමා කරනු

145. 'සැබැවින්ම ඒවා' යනු හදීසයේ සඳහන් වී ඇති පරිදි පස් වාර සලාතයන් ජුමුආ.... වැනි දැහැමි ක්‍රියාවන් වේ.
146. මුස්ලිම් (228).

ලබනු ඇතැයි යන පදනම මත ස්ථාවරව සිට අඥානයකු රැවටී මහා පාපයන්හි ගිලී යාම මම බිය වෙමි. තවද අල්ලාහ් අපි රැකවරණයත් ආශිර්වාදයත් ඉල්ලා සිටින්නෙමු.[147]

මා පවසා සිටිනුයේ:[148] මෙවැනිම ප්‍රකාශ වුළු ඩෝවනය වැනි කරුණු සම්බන්ධයෙන් ඇතැම් හදීස් වේදීන් කළ ප්‍රකාශ තුළ ද ඇතුළත්ව ඇත. ලය්ලතුල් කද්ර් රාත්‍රියෙහි සලාත් ඉටු කිරීම සම්බන්ධයෙන් ඉබ්නු අල් මුන්දිර් තුමා ද මේ හා සමාන ප්‍රකාශයක් කර ඇත. එතුමා: “කවරෙකු එහි සලාත් ඉටු කරන්නේ ද එවැනි අය හට ඔහුගේ සුළු හා මහා යන සියලු පාපයන් සඳහා සමාව දෙනු ලැබීම අපේක්ෂා කරනු ලැබේ.” සැබැවින්ම එම ප්‍රකාශය යමෙකු මහා පාපයන් හි නිරතව සිටයදී ඉස්ලාමයේ වගකීම් ඉටු කිරීම තුළින් එම මහා පාපයන් සඳහා ඔහුට සමාව දෙනු ඇතැයි යන අදහස ගම්‍ය වී ඇත්නම් එය පැහැදිලි ව්‍යාජ ප්‍රකාශයකි. දහම එය අහෝසි කර ඇති බව දැනගත යුතුව ඇත. මහා පාපයන්හි දිගටම නිරත වීම අතහැර දමා අනිවාර්යය වගකීම් ප්‍රවේසමෙන් පිළිපැද එයින් පෙර සිදු වූ පාපයන් සඳහා කිසිදු තව්බාවක් හෝ පසුතැවිල්ලකින් තොරව එමගින් සියලු පාපයන් වලට ප්‍රතිකර්මයක් වනු ඇතැයි සිතන්නේ නම් එම කියමන සමස්තයක් වශයෙන් පැවසිය හැක.

නිවැරැදි ප්‍රකාශ වනුයේ බහුතරය දරන ප්‍රකාශයයි. එනම්, නියත වශයෙන්ම මහා පාපයන්ට තව්බාවෙන් තොරව සමාව දෙනු නොලබන බවය. සැබැවින්ම තව්බාව ගැත්තන් හට නියම වූ අනිවාර්යය කරුණකි. අල්ලාහ් මෙසේ පවසයි. “කවරෙකු පව්සමාව අයැද නොසිටියේ ද ඔවුහුමය අපරාධකරුවෝ.” (සූරා අල් හුජුරාත් 16)

***

දෙවන ගැටලුව වනුයේ: මහා පාපයන් මෙන් සුළු පාපයන්ටත් තව්බාව අනිවාර්යය වන්නේ ද? නැද්ද? යන ගැටලුවයි. සැබැවින්ම ඒවා මහා පාපයන්ගෙන් වැළකී සිටීම තුළින් ප්‍රතිකර්මයක් බවට පත් වන බැවිනි. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: කවර කරුණක් තහනම් කරනු ලැබුවේ

147. අත්-තම්හීද් (4/49)
148. ඉබ්නු රජබ්ගේ ප්‍රකාශය.

ද එවන් මහා පාපයන්ගෙන් නුඹලා වැළකී සිටින්නෙහු නම් නුඹලාගේ පාපයන් සඳහා නුඹලාට සමාව දී අපි නුඹලාව ගෞරවණීය පිවිසුමක් වෙත ඇතුළත් කරන්නෙමු. (සූරා නිසා:31)

මේ සම්බන්ධයෙන් ද ජනයා විවිධ මත දරති.

ඔවුන් අතුරින් ඇතැමුන්: ඒ සඳහා තව්බාව අනිවාර්යය කර ඇත. එය අපගේ සමගාමීන් හා සෙසු ආගමික නීතිවේදීන් හා ප්‍රකාශකයින්ගේ මතය වේ.

ඒ සඳහා තව්බා අනිවාර්යය නොවන බව ද ඇතැමුන් පවසති.

පැරණීනන් පවසා සිටිනුයේ 'ඒ දෙකින් එකක් අනිවාර්යය වන බවයි. එනම් තව්බාව හෝ පාපයන්ට ප්‍රතිකර්මයක් ලෙස පිහිටන දැහැමි දෑ ඉටු කිරීම බවයි.

සුළු පාපයන් හා මහා පාපයන් පිළිබඳ මෙනෙහි කිරීමෙන් පසුව අල්ලාහ් තව්බාව නියෝග කර ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. "(නබිවරය!) විශ්වාසිකයින්ට (බැලීමට තහනම් දැයින්) තමන්ගේ බැල්ම පහත හෙළන මෙන් ද තමන්ගේ ලිංගික අවයව (පාපයන්ගෙන්) ආරක්ෂා කරගන්නා මෙන් ද පවසවු. එය ඔවුනට ඉතාමත් පිවිතුරුය. සැබැවින්ම අල්ලාහ් ඔවුන් කරන දෑ පිළිබඳව අභිඥානවන්තය. (30) තවද (නබිවරය,) විශ්වාසික කාන්තාවන්ට (බැලීමට තහනම් දැයින්) තමන්ගේ බැල්ම පහත හෙළන මෙන් ද තමන්ගේ ලිංගික අවයව (පාපයන්ගෙන්) ආරක්ෂා කරගන්නා මෙන් ද තමන්ගේ අලංකාරයන් එයින් එළිපිට පෙනෙන දෑ හැර7 (සෙසු දෑ) හෙළි නොකරන මෙන් ද තම හිස් ආවරණ මගින් තමන්ගේ ළය පෙදෙස් ද ආවරණය කරන මෙන් දතමන්ගේ ස්වාමි පුරුෂයින්ට ද තමන්ගේ පියවරුන්ට ද තම ස්වාමි පුරුෂයින්ගේ පියවරුන්ට ද තම පිරිමි දරුවන්ට ද තම ස්වාමි පුරුෂයින්ගේ පිරිමි දරුවන්ට ද තම සහෝදරයින්ට ද තම සහෝදරයින්ගේ පිරිමි දරුවන්ට ද තම සහෝදරියන්ගේ පිරිමි දරුවන්ට ද තම කාන්තාවන්ට ද තම දකුණත හිමි කරගත් අයට(වහලුන්ට) ද පිරිමින් අතුරින් කාමාශාවෙන් තොර වූ උපස්ථායකයින්ට ද කාන්තාවන්ගේ රහසඟ පිළිබඳව පැහැදීමක් නොමැති පිරිමි දරුවන්ට ද මිස (වෙනත් කිසිවෙකුට) තම අලංකාරය හෙළි නොදක්වන මෙන් ද ඔවුන් සඟවා ඇති ඔවුන්ගේ අලංකාර දෑ (අන් අය විසින්) දැනගනු ලබන ආකාරයට තම පාද නොගසන මෙන් ද පවසවු. තවද අහෝ

විශ්වාසිකයිනි, නුඹලා ජයග්‍රහණය ලබනු පිණිස නුඹලා සියල්ලෝම අල්ලාහ් වෙත පශ්චාත්තාප වී යොමු වවු. (31) (සූරා නූර්: 30,31) සුළු පාපයන් සඳහා විශේෂයෙන් තව්බා කරන මෙන් ද අල්ලාහ් නියෝග කර ඇත. “විශ්වාස කළවුනි, එක් පිරිසක් තවත් පිරිසකට උපහාස නොකරවු. (උපහාසයට ලක් වූ) ඔවුන් (උපහාස කළ) මොවුන්ට වඩා යහපත් අය විය හැකිය. තවද කාන්තාවන් අන් කාන්තාවන්ට උපහාස නොකරවු. (උපහාසයට ලක් වූ) ඔවුන් (උපහාස කළ) මොවුන්ට වඩා යහපත් අය විය හැකිය. තවද නුඹලා නුඹලා අතරම අඩුපාඩු නොසොයවු. තවද නුඹලා එකිනෙකාට (පිළිකුල් සහගත) විකට නමින් නොඅමතවු. විශ්වාස කළායින් පසුව පාපතර නාම(යෙන් ඇමතීම) ඉතා නින්දා සහගතය. තවද කවරෙකු හෝ පශ්චාත්තාප නොකළේ ද ඔවුන්මය අපරාධකරුවෝ වන්නේ.” (සූරා අල් හුජුරාත්: 11)

***

“මිනිසුන් සමග ගුණ යහපත් බවින් කටයුතු කරන්න.” යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

මෙයද තක්වා හෙවත් භක්තිමත්භාවයේ කරුණු අතුරින් එකකි. මෙය පිළිපැදීමෙන් මිස තක්වාව පූර්ණවත් වන්නේ නැත. එය වෙනම ම පවසා ඇත්තේ ඒ පිළිබඳ විස්තර කිරීමේ අවශ්‍යතාව මතය. සැබැවින්ම තක්වාව යනු අල්ලාහ්ගේ වගකීම් ඉටු කිරීම පමණක් මිස ඔහුගේ ගැත්තන්ගේ වගකීම් ඉටු කිරීමක් නොවන බව ජනයා අතර බහුතරයක් දෙනා සිතති. මිනිසුන් සමග යහපත් සම්බන්ධකම් පවත්වන මෙන් වූ නියෝග පැමිණ ඇත. අල්ලාහ්ගේ යුතුකම් මෙන්ම ඔහුගේ ගැත්තන්ගේ යුතුකම් යන දෙකම එකට ඉටු කිරීම වඩාත් වැදගත් කරුණක් වන්නේය. එය පූර්ණව ඉටු කිරීමට ශක්තිය ඇත්තේ නබිවරුන් හා සත්‍යවාදීන් පමණය.

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බවට අබූ හුරෙය්රා විසින් වාර්තා කළ හදීසයක් අහ්මද් හා අබූ දාවූද් යන ඉමාම්වරු විසින් පළ කර ඇත. “දේව

විශ්වාසයෙන් වඩාත් පරිපූර්ණවත් මුඃමින්වරුන් වනුයේ සදාචාරයෙන් වඩාත් යහපත් උදවියයි.[149]

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බවට ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් වාර්තා කළ හදීසයක් තවදුරටත් ඒ දෙදෙනා විසින් මෙසේ පළ කර ඇත. ''සැබැවින්ම මුඃමින්වරයා ඔහුගේ යහපත් ගුණධර්ම තුළින් රාත්‍රියේ නැගී සිට නැමදුම් කරන උපවාස රකින්නාගේ තරාතිරම ලබනු ඇත.''[150]

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බවට අබූ දර්දා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් තවදුරටත් ඒ දෙදෙනා විසින් මෙසේ පළ කර ඇත. 'තුලනය තුළ තබනු ලබන දැයින් ගුණයහපත්කමට වඩා බරැති වෙනත් කිසිවක් නොමැත. සැබැවින්ම ගුණයහපත්කම ඇත්තා උපවාසය රකිමින් සලාතය ඉටු කරන්නාගේ තත්ත්වය එමගින් ඔහු උදා කර ගනු ඇත. [151]

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බවට අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් ඉබ්නු හිබ්බාන් විසින් මෙසේ පළ කර ඇත. 'මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ නුඹලා අතුරින්

149. අහ්මද් (2/250), අබූ දාවූද් (4682), තිර්මිදි (1162) එතුමා මෙය සහීහ් හසන් ගණයට අයත් හදීසයක් බව දන්වා ඇති අතර ෂෙයික් අල්-අල්බානී තුමා 'සහීහ් අත්-තර්ගීබ් වත් තර්හීබ්'හි (2660) සහීහ් හදීසයක් බව සඳහන් කර ඇත.

150. අහ්මද් (6/90), අබූ දාවූද් (4798), ආල් හාකිම් (1/6) එතුමා බුහාරි හා මුස්ලිම්ගේ කොන්දේසියට අනුව එය සහීහ් හදීසයක් බව සඳහන් කර ඇත. අෂ්-ෂෙයික් අල් අල්බානි තුමා පවසා සිටිනුයේ. 'ආඉෂා තුමියගෙන් සවන් දීම විෂයයෙහි මතභේදයක් නොවූයේ නම් ඔවුන් දෙදෙනා පවසා සිටි පරිදි ඉමාම් සහබී ද එයට අනුගත වන්නේය. පසුව මෙසේ පවසා සිටියේය 'නමුත් මෙම හදීසය සෑම තත්ත්වයකින් ඉහත කී පරිදි සහීහ් වන්නේය. බලන්න: 'අස්සිල්සිලතුස් සහීහා' 794).

151. අහ්මද් (6/442), අබූ දාවූද් (4799), තිර්මිදි (2002) එතුමා මෙය සහීහ් හසන් ගණයට අයත් හදීසයක් බව පවසා සිටියි. නමුත් හදීසයේ ඇති දෙවන කොටස - එනම් 'සැබැවින්ම ගුණයහපත්කම ඇත්තා ....' යන නබි තුමාගේ ප්‍රකාශය - අතා විසින් මුත්රිෆ් ද ඔහු විසින් කුබෙයිසා ඉබ්නු අල්ලයස්ද යන වාර්තාකරණයෙන් තිර්මිදි ළඟ හැර වෙන් කිසිවෙකු ළඟ සඳහන්ව තිබෙනු මා දැක නැත. එතුමා තවදුරටත් පවසනුයේ: 'ඒ ප්‍රකාරව මෙය ගරීබ් වර්ගයට අයත් හදීසයක් බවයි. අෂ්-ෂෙයික් අල්අල්බානී තුමා 'අස්සහීහා' හි (876) එහි වාර්තාකරණය මැනවින් පිහිටා ඇති බව පවසන අතරම 'සහීහ් අත්-තර්ගීබ්'හි (2641) ඒ සියල්ල සහීහ් ගණයට අයත් බව සඳහන් කර ඇත.

අල්ලාහ් වෙත වඩාත් ප්‍රියතම සභිකයින්ගෙන් මට වඩාත් සමීප අය කවුරුන්දැ?යි මම නුඹලාට දන්වා සිටින්නදැ?යි විමසා සිටියහ. ඔවුහු 'එසේය' යැයි පිළිතුරු දුන්නෝය. එතුමාණන්: "නුඹලා අතර සිටින ගුණයහපත්කමින් වඩාත් යහපත් පුද්ගලයාය යැ"යි පැවසූහ.[152]

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බවට අබූ උමාමා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් අබූ දාවූද් තුමා මෙසේ පළ කර ඇත. "තම ගතිගුණ යහපත් කරගත් තැනැත්තාහට උසස් ස්වර්ගයේ නිවසක් ලබා දීමට මම භාර වෙමි."[153]

හුස්නුල් හුලුක් හෙවත් 'යහපත් ගතිගුණ' යන පදයට මුල් කාලීනයන් විස්තර කර ඇති අයුරු වාර්තා කරනු ලැබ ඇත.

ඒ බව හසන් (රහිමහුල්ලාහ් තුමා) පවසා සිටිනුයේ: 'හුස්නුල් හුලුක් යනු: උපකාරශීලී භාවය, තැන්පත් හා සැහැල්ලුකම හා දරා ගැනීම.' යන්නයි.

ඉබ්නු අල් මුබාරක් තුමා පවසා ඇත්තේ: 'එය මුහුණේ (ආලෝකය) විහිදුවාලීම, යහපත ක්‍රියාත්මක කිරීම හා හිංසාව වැළැක්වීමය.' යන්නයි.

ඉමාම් අහ්මද් තුමා පවසා ඇත්තේ: 'හුස්නුල් හුලුක් යනු: මිනිසුන්ගෙන් ඇති වන දෑ උහුලා ගැනීමය.' යන්නයි.

ඇතැම් විද්වතුන් පවසා සිටිනුයේ: 'හුස්නුල් හුලුක්' යනු අල්ලාහ් වෙනුවෙන් කෝපය මැඩලීම, පිළිකුල හා දුරස්භාවය නපුරු පුද්ගලයා හා දහමෙහි නව කරුණු මතු කරන්නා වෙනුවෙන් පමණක් හෙළි කිරීම. පුහුණු කිරීමක් හෝ දණ්ඩ නීතිය ක්‍රියාත්මක කිරීමක් වශයෙන් මිස නොමග ගිය අය නොසළකා හැරීම. පිළිකුල් සහගත ක්‍රියාවක් වැළැක්වීමට හා අපරාධකරුට කිසිදු

152. කතෘවරයා පවසන පරිදි ඉබ්නු හිබ්බාන් (485) හි මෙම හදීසය පළ කර ඇති අතර ඊට පෙර ඉමාම් අහ්මද් 'මුස්නද්'හි (2/217) මෙය පළ කර ඇති බවයි. එහි වාර්තාකරණය සහීහ් වර්ගයට අයත් බව අෂ්-ෂෙයික් අහ්මද් ෂාකිර් ඔහුගේ සංස්කරණයක් වූ 'අල් මුස්නද්'හි හදීස් අංක (7035) දරණ යටතේ සඳහන් කර ඇත.

153. අබූ දාවූද් (4800), අෂ්-ෂෙයික් අල් අල්බානී 'සහීහ් අත්-තර්ගීබ් වත් තර්හීබ්'හි (648) හසන් ගණයට අයත් හදීසයක් බව දන්වා සිටියි. ඒ පිළිබඳ විමර්ශණය 'අස්සහීහ්'හි (373) බලන්න.

ඉක්මවීමකින් තොරව අපරාධය හේතුවෙන් ග්‍රහණය කිරීම හැර සෙසු සෑම මුස්ලිම්වරයකුටම හා ගිවිසුම් ඇතිකර ගත් අයට අත්වන හිංසාවන් වැළැක්වීම.

***

## الحَدِيْثُ التَّاسِعَ عَشَرَ

## දහ නව වන හදීසය

عن ابنِ عبَّاسٍ، رضيَ الله عنهمَا، قَالَ:

"كُنْتُ خَلْفَ النَّبِيِّ ﷺ يوْماً فَقال لِي: يَا غُلامُ، إِنِّي أُعلِّمك كَلِمَاتٍ: احْفَظِ اللهَ يَحْفَظْكَ، احْفَظِ اللهَ تَجِدْهُ تُجَاهَكَ، إِذَا سَأَلْتَ فَاسْأَلِ اللهَ، وَإِذَا اسْتَعَنْتَ فَاسْتَعِنْ بِاللهِ،

واعلَمْ: أَنَّ الأُمَّةَ لَو اجتَمعتْ عَلَى أَنْ ينْفعُوكَ بِشيْءٍ، لَمْ يَنْفعُوكَ إِلاَّ بِشَيْءٍ قَد كَتَبَهُ اللهُ لَكَ، وإِنِ اجْتَمَعُوا عَلَى أَنْ يَضُرُّوك بِشَيْءٍ، لَمْ يَضُرُّوكَ إِلاَّ بَشَيْءٍ قَدْ كَتَبَهُ الله عليْكَ، رُفِعَتِ الأَقْلامُ، وجَفَّتِ الصُّحُفُ."

رواهُ التِّرمذيُّ وقَالَ: ((حديثٌ حسنٌ صَحيحٌ.))

وفي رواية غيرِ التِّرْمِذيِّ:

"احفظَ اللهَ تَجِدْهُ أَمَامَكَ، تَعَرَّفْ إِلَى اللهِ في الرَّخَاءِ يعرِفْكَ في الشِّدةِ، واعْلَمْ أَنّ مَا أَخْطَأَكَ لَمْ يَكُنْ لِيُصيبكَ، وَمَا أَصَابَكَ لمْ يكُن لِيُخْطِئَكَ واعْلَمْ أَنَّ النَّصْرَ مَعَ الصَّبْرِ، وأَنَّ الْفَرَجَ مَعَ الْكَرْبِ، وأَنَّ مَعَ الْعُسرِ يُسْراً.

ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

දිනක් මම නබි (ﷺ) තුමාට පසුපසින් වාඩිවී (ගමනක් යමින්) සිටියෙමි. එවිට එතුමා මා අමතා: දරුව, සැබැවින්ම මම ඔබට වචන කිහිපයක් උගන්වමි: ඔබ අල්ලාහ් ව ආරක්ෂා කරනු. ඔහු ඔබ ව ආරක්ෂා කරනු ඇත. ඔබ අල්ලාහ් ව ආරක්ෂා කරනු. ඔබ ඉදිරියේම ඔබ ඔහු දකිනු ඇත. ඔබ ඉල්ලන විට අල්ලාහ්ගෙන්ම ඉල්ලනු. ඔබ උදව් පතන විට අල්ලාහ්ගෙන්ම උදව් පතනු.

දැනගනු: සැබැවින්ම මුළු සමූහයාම ඔබට යම් සෙතක් කිරීමට එක්රැස් වුව ද අල්ලාහ් ඔබට එය නියම කර ඇති

දෙයක් නම් මිස ඔවුන් විසින් ඔබට සෙත සලසන්නට නුපුළුවන. එමෙන්ම ඔබට යම් හානියක් කිරීම ඔවුන් ඒකරාශී වුව ද අල්ලාහ් ඔබට එය නියම කර ඇති දෙයක් නම් මිස ඔවුන් විසින් ඔබට හානි කරන්නට නුපුළුවන. පන්හිදවල් ඉවතට ගනු ලැබීය. පිටපත් සිදී ගොස් ඇත.

මෙය තිර්මිදි විසින් පළ කර ඇති අතර එය 'හසන් සහීහ්' ගණයට අයත් හදීසයක් බව සඳහන් කර ඇත.

තිර්මිදි හැර වෙනත් වාර්තාවල සඳහන් පරිදි

අල්ලාහ්ගේ කටයුතු ආරක්ෂා කරන්න. ඔබ ඉදිරියේම ඔබ ඔහුව දකිනු ඇත. සමෘද්ධිමත් අවදියේ අල්ලාහ් වෙත ඔබ ව හඳුන්වා දෙන්න. දුෂ්කර අවදියේ ඔහු ඔබ ව හඳුනා ගනු ඇත. සැබැවින්ම ඔබට වැරදුණු දෙයක් ඇත්නම් එය ඔබට හිමිවිය යුත්තක් නොවේ. ඔබට හිමි වූ දෙයක් ඇත් නම් ඔබට එය වැරදී යන්නක් නොවේ. යන බව දැන ගන්න. සැබැවින්ම උපකාරය ඉවසීම සමග ඇත. සැබැවින්ම සහනය පීඩාව සමග ඇත. දුෂ්කරත්වය සමග පහසුකම ඇත.

***

- විග්‍රහය -

මෙම හදීසයෙහි ඉතා වැදගත් උපදෙස් කිහිපයක් හා ආගමික කටයුතුවල වැදගත්ම නීතිරීති කිහිමයක් අන්තර්ගත වී ඇත. ඇතැම් විද්වතුන්: "මෙම හදීසය පරිශීලනය කර බැලුවෙමි. එය මා පුදුමයට පත් කළේය. මම කොතරම් නොසැළකිලිමත්ව සිටියෙම් ද! මෙම හදීසය පිළිබඳ නොදැනුවත් වීම ගැන හා එහි අර්ථය සුළු ප්‍රමාණයක් පමණක් වටහා ගෙන තිබීම මා කණස්සල්ලට පත් කර ඇත." යැයි පවසන තරමටම වැදගත්කමක් මෙයට ලැබී ඇත.

සැබැවින්ම මෙය විස්තර කිරීම සඳහාම විශාල වෙළුමක් මා විසින් වෙන් කර ඇත.[154]

‘ඔබ අල්ලාහ් ව ආරක්ෂා කරනු’ යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

එනම්: ඔහුගේ සීමාවන් ඔහුගේ වගකීම් ඔහුගේ නියෝග ඔහු තහනම් කළ දෑ යනාදිය ආරක්ෂා කර ගන්න. මෙය ආරක්ෂා කිරීම ඔහු නියෝග කර ඇති අවස්ථාවේ ඒවා පිළිපැදීමෙන් ඔහු තහනම් කළ විට එයින් වැළකී සිටිමින් ඔහුගේ සීමාවන් අබියස නතර වීමය. කවර කරුණක් අණ කර ඇත්තේද එමෙන්ම අවසර දී ඇත්තේද එය තහනම් කර ගන්නා තරමට ඉක්මවා කටයුතු නොකළ යුතුය.

කවරෙකු එසේ ක්‍රියා කළේ ද ඔහු අල්ලාහ්ගේ සීමාවන් ආරක්ෂා කරන්නන් වන්නේය. අල්ලාහ් එවැන්නන් පිළිබඳ ඔහුගේ ග්‍රන්ථයේ මෙසේ පැසසුමට ලක් කර ඇත. “මෙය නුඹලාට ප්‍රතිඥා දෙනු ලැබූවකි. (මෙය අල්ලාහ් වෙතට) යොමු වී (තම දහම) ආරක්ෂා කර ගත් සැමටත් අදෘශ්‍යමානව (සිටින්නා වූ) පරම කරුණා හරිත (අල්ලාහ්)ට බිය වී තවද (ඔහු වෙතට) යොමු වූ හදවතකින් පැමිණෙන සැමටත් හිමිය.” (සූරා කාෆ්: 32,33) අල් හෆීල් නම් පදයට මෙහි විස්තර කර ඇත්තේ අල්ලාහ්ගේ නියෝග ආරක්ෂා කරන්නා හා තම පාපයන් සඳහා සමාව අයැද සිටින පරිදි තම පාපයෙන් ආරක්ෂා වී සිටින්නාය.

***

‘ඔහු ඔබව ආරක්ෂා කරනු ඇත’ යන නබි තුමාගේ ප්‍රකාශය වනාහි:

කවරෙකු අල්ලාහ්ගේ සීමාවන් ආරක්ෂා කර ඔහුගේ වගකීම් පිළිබඳ සැළකිලිමත් වන්නේ ද අල්ලාහ් ඔහුව ආරක්ෂා කරනු ඇත. සැබැවින්ම ප්‍රතිඵලය වනුයේ එම වර්ගයටම අදාළ ක්‍රියාවෙනි. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. ‘නුඹලා මාගේ ගිවිසුම ඉටු කරනු. මම ද නුඹලාගේ ගිවිසුම ඉටු කරමි.’ (සූරා අල් බකරා:40)

[154] එම විග්‍රහය ‘නූරුල් ඉක්තිබාස් ෆී මිෂ්කාති වසිය්යතින් නබිය්යි ලි ඉබ්නි අබ්බාස්’ නම් කෘතියයි. එය මුද්‍රණය කරනු ලැබ හාවිතයේ දක්නට ඇත.

අල්ලාහ් තම ගැත්තා ආරක්ෂා කිරීම තුළ ආකාර දෙකක් ඇතුලු වන්නේය.

පළමුවැනි ආකාරය: ඔහුගේ මෙලොව යහපත් කරුණුවලදී ඔහුට ආරක්ෂාව සැපයීම. උදාහරණ වශයෙන්, ඔහුගේ ශරීරය, ඔහුගේ දරුවන්, ඔහුගේ පවුල හා ඔහුගේ ධනය වැනි මෙලොව කටයුතු පෙන්වා දිය හැක. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. "ඔහුට (මිනිසාට ඉදිරියෙන් ද ඔහුට පසුපසින් ද අනුපිළිවෙළට පැමිණෙන්නන් (වන මලක්වරුන්) සිටිති. ඔවුහු අල්ලාහ්ගේ නියෝගය පරිදි ඔහු ව ආරක්ෂා කරති. (සූරා අර්-රඃද්: 11) ඉබ්නු අබ්බාස් තුමා පවසා සිටිනුයේ ඔවුහු මලක්වරුන් වෙති. අල්ලාහ්ගේ නියෝගයෙන් ඔවුහු ඔහු ව ආරක්ෂා කරන අතර පෙර නියමය පැමිණීමත් සමගම ඔවුහු ඔහුගෙන් ඉවත්ව යති.

තරුණ හා ශක්තිමත් අවදියේ කවරෙකු අල්ලාහ්ව ආරක්ෂා කරන්නේද ඔහුගේ වයස්ගත හා බලය හීනවී ගිය අවදියේ අල්ලාහ් ඔහුව ආරක්ෂා කරනු ඇත. ඔහුගේ සවන ඔහුගේ බැල්ම ඔහුගේ ශක්තිය හා ඔහුගේ බුද්ධිය තුළින් ඔහු ඔහුට විඳින්නට සළස්වන්නේය.

විද්වතෙකු වසර සියයක් පසුකර ජීවත් විය. ඔහුගේ ශක්තිය හා බුද්ධිය මනා තත්ත්වයේ භුක්ති විඳිමින් සිටියේය. දිනක් එකවරම ඔහු පැන්නේය. එහිදී ඔහුට දෝෂාරෝපන එල්ල වූහ. පසුව මෙසේ පැවසීය: "කුඩා කාලයේ පාපයන්ගෙන් අප ආරක්ෂා කරගත් අවයව මේවාය. වයස් කාලයේ දී අප වෙනුවෙන් අල්ලාහ් ඒවා ආරක්ෂා කර ඇත."[155]

ඊට ප්‍රතිවිරුද්ධව: මුල් කාලීනයෙකු මිනිසුන්ගෙන් ඉල්ලා සිටින යාචික වැඩිහිටියෙකු දුටුවේය. එවිට ඔහු: "සැබැවින්ම මොහු මොහුගේ කුඩා කාලයේ අල්ලාහ් සම්බන්ධයෙන් නොසළකා හැරියේය. එහෙයින් වැඩිහිටි අවදියේ අල්ලාහ් ඔහුව නොසළකා හැර ඇත."

---

155. එම විද්වතා අල් කාලී, අබුත් තය්යිබ්, තාහිර් ඉබ්නු අබ්දුල්ලාහ් ඉබ්නු තාහිර් අත්-තබරීය. සියලු ආකාරයේ ඵකවණයන් ඔහු විද ඇත. ඔහුගේ එකසිය දෙවන වියේදී ඔහු මරණයට පත් වන තුරුම විනිසුරුවෙකු ආගමික තීන්දු ලබා දෙන්නෙකු ගුරුවරයකු හා වැඩසටහන්වලට සහභාගී වන්නෙකු ලෙස සිටියහ. මෙම තොරතුරු 'අල් බිදායා වන්නිහායා'හි හිජ්රි 450 දී මරණයට පත්වූවන් සම්බන්ධයෙන් සඳහන් කර ඇත.

ගැත්තාගේ යහපත් කම හේතුවෙන් ඔහු මිය ගිය පසුව ඔහුගේ පරම්පරාව විෂයයෙහි ද අල්ලාහ් ආරක්ෂා කරන්නේය. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: "ඊට යටින් ඔවුන් දෙදෙනා සතු නිධානයක් විය. ඔවුන් දෙදෙනාගේ පියාණන් දැහැමියකු විය." (සූරා අල් කහ්ෆ්: 82) සැබැවින්ම ඔවුන් දෙදෙනාට ආරක්ෂාව ලැබුණේ ඔවුන් දෙදෙනාගේ පියාගේ දැහැමි භාවය හේතුවෙනි. සර්ද් ඉබ්නු අල් මුසය්යිබ් තම පුතණුවන්ට: "ඔබ වෙනුවෙන් ඔබට මා රැකවරණයක් වීමේ අපේක්ෂාවෙන් මම මාගේ සලාතය අධිකව ඉටු කරමි. යැයි පවසා මෙම පාඨය පාරායනය කර ඇත.

උමර් ඉබ්නු අබ්දුල් අසීස් තුමා: "යම් මුඃමින්වරයකු මරණයට පත් වූයේ නම් ඔහුගෙන් පසු අය හා ඔහුගෙන් ද පසු අය විෂයෙහි අල්ලාහ් ඔහුට ආරක්ෂාව සළසනු ඇත." යැයි පවසා ඇත්තාහ.

ඉබ්නු අල් මුන්කදිර් තුමා: "දැහැමි මිනිසෙකු හේතුවෙන් ඔහුගේ දරුවා ද දරුවාගේ දරුවා ද ඔහු අවට සිටින නිවැසියන් ද අල්ලාහ් ආරක්ෂා කරනු ඇත." යැයි පවසා ඇත්තාහ.

අල්ලාහ්ගේ කටයුතු ආරක්ෂා කරන්නන් හට ඔහුගේ ආරක්ෂාව ලැබීමේ අපූරු කරුණු අතරින් තවත් කරුණක් වනුයේ: ඔවුන්ට අත්වන හානියෙන් ඔවුන් ආරක්ෂා කිරීම සඳහා හානිදායක සතුන් පවා පත් කරලීමයි. නබි (ﷺ) තුමාණන්ගේ සේවකයකු නැවක යාත්‍රා කරමින් සිටිය දී එය කැඩුනි.[156] පසුව ඔහු දූපතකට ගොඩ බැස්සේය. එවිට ඔහු සිංහයකු දුටුවේය. ඌ ඔහුට මාර්ගය පෙන්වන තෙක් ඌ සමගම ඔහු ද ගමන් කරන්නට විය. නියමිත ස්ථානයේ ඔහුව නතර කළ කල්හි ඌ -සමුගන්නට යනවාක් මෙන්- ගොරවටන්නට ගෙන පසුව ඔහුගෙන් හැරී ගියේය.[157]

ඉබ්‍රාහිම් ඉබ්නු අද්හම් වත්තෙහි නිදමින් සිටියදී, ඔහු අසල කටෙහි විෂ සහිත දෂ්ට සර්පයකු විය. ඔහු අවදි වන තෙක්ම ඌ මැස්සන් එළවමින් සිටීය.

එයට ප්‍රතිවිරුද්ධව අල්ලාහ් විෂයෙහි සැලකිලිමත් නොවූ අය වනාහි ඔහුගේ මැවීම් අතර ද ඔහු සැලකිල්ලට පත් නොකරයි. තමන්ට තම පවුලෙන් හෝ

156. මුහුදේ දී.
157. අල් හාකිම් (3/606), අත්තබරානී (7/80,81)

වෙනත් අයගෙන් ප්‍රයෝජනයක් අපේක්ෂා කළ හැකි අය අතුරින් පවා පීඩාවන් හා හිංසාවන් ඔහු වෙත ප්‍රවේශ වන තරමට එය පවතී. මුල් කාලීන ඉමාම්වරයකු මෙසේ පවසා සිටියේය: ‘සැබැවින්ම මම අල්ලාහ්ට පිටුපෑවෙමි. මාගේ සේවකයාගේ හා මාගේ සත්වයාගේ හැසිරීම තුළින් එය මම හඳුනා ගත්තෙමි.’

ආරක්ෂාව ලබන දෙවන ආකාරය එම ආකාර දෙකින් අති වැදගත් වන්නේය. එනම්: ගැත්තෙකුහට ඔහුගේ දහම ඔහුගේ විශ්වාසය යනාදියෙහි ලැබෙන අල්ලාහ්ගේ ආරක්ෂාවයි. ඔහුගේ ජීවිතයේදී නොමග යවන සැකසහිත දැයින් හා තහනම් කරන ලද ආත්මාශාවන්ගෙන් ඔහු ඔහුව ආරක්ෂා කරයි. ඔහු මරණයට පත්වන අවස්ථාවේ ඔහුගේ දහම ඔහුට ආරක්ෂා කර දෙයි. ඔහු දේව විශ්වාසය මතම මරණයට පත්වන්නට සලසයි. අල්ලාහ්ගේ සීමාවන් ආරක්ෂා කළ මුඃමින්වරයාට රැකවරණය ලබා දෙයි. ඔහු අතර හා ඔහුගේ දහම විනාශ කරන දෑ අතර විවිධ ආකාරයේ රැකවරණයන්ගෙන් ආවරණය කරයි. සැබැවින්ම ඒවා පිළිබඳ ගැත්තාට හඳුනා ගත නොහැකිය. ඇතැම් විට එය ඔහුට පිළිකුල් සහගතද විය හැක. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. “මෙලෙස (ඔහුට අප සාධක පෙන්වනුයේ) පාපය හා අශීලාචාර දෑ ඔහුගෙන් පහ කිරීම පිණිසය. සැබැවින්ම ඔහු (විශ්වාස කොට අවනත වීම සඳහා) තෝරා ගනු ලැබූ අපගේ ගැත්තන් අතුරිනි.” (සූරා යූසුෆ්: 24)

පාපිෂ්ඨයින් පිළිබඳ මෙනෙහි කරමින් හසන් තුමා: “ඔවුහු ඔහුට අවමන් කර ඔහුට පිටුපෑවෝය. ඔවුහු ඔහු ට ගෞරවය කළේ නම් ඔහු ඔවුන් ආරක්ෂා කරනු ඇත.” යැයි පවසා සිටියේය.

ඉබ්නු මස්ඌද් තුමා මෙසේ පවසා සිටියහ: “සැබැවින්ම ගැත්තා ව්‍යාපාරික හා පාලන කටයුතු සම්බන්ධයෙන් ඒවා ඔහුට පහසුකම් සපයන තරමට වැදගත්කමක් දෙයි. අල්ලාහ් ඔහු දෙස බලයි. පසුව මලක්වරුන් හට: “නුඹලා ඔහු එයින් ඈත් කරනු. සැබැවින්ම මම ඔහුට එය පහසු කරන්නේ නම්, ඔහු නිරා ගින්නට ඇතුළත් කරන්නට මට සිදු වෙයි.’ යැයි පවසයි. එහෙයින් අල්ලාහ් ඔහුව එයින් හරවයි. ඔහු කිසිවක් නැති තත්ත්වයට පත් වෙයි. ඔහු: පුද්ගලයකු මා පසුකර ගෙන ගොස් ඇත. පුද්ගලයකු මා පහත් කර ඇත. යැයි පවසයි. එය අල්ලාහ්ගේ භාග්‍යය මිස වෙනකක් නොවේ.

***

"ඔබ අල්ලාහ් ව ආරක්ෂා කරන්න. ඔබ ඉදිරියේම ඔබ ඔහු දකිනු ඇත." යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි: -තවත් වාර්තාවක හදීසයේ 'ඔබ ඉදිරියේම' යනුවෙන් අර්ථවත් කරන 'තුජාහක' යන අරාබි පදය වෙනුවට 'අමාමක' යන පදය භාවිත කර ඇත.

එහි තේරුම: සැබැවින්ම කවරෙකු අල්ලාහ්ගේ සීමාවන් පිළිපදිමින් ඒවා ආරක්ෂා කර ඔහුගේ යුතුකම් රකින්නේ ද ඔහුගේ සෑම තත්ත්වයකදීම ඔහු සමග අල්ලාහ් සිටිනු දැක ගනු ඇත. ඔහු ඔහුව ආවරණය කරයි. ඔහුට උදව් කරයි. ඔහුට රැකවරණය ලබා දෙයි. ඔහුට ආශිර්වාද කරයි. ඔහුව බලවත් කරයි. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. සැබැවින්ම අල්ලාහ් බියබැතිමතුන් සමගය. ඔවුහුමය දැහැමියෝ වන්නෝ" (සූරා අන් නහ්ල් 128), අල්ලාහ්ගේ මෙම විශේෂ පෙනී සිටීම මූසා හා හාරූන්ට හිමි විය. "නුඹලා දෙදෙනා බිය නොවනු. සැබැවින්ම මම නුඹලා දෙදෙනා සමග සිට සවන් දෙමි. බලමි." (සූරා තාහා 46) මෙම විශේෂ පෙනී සිටීම ජය, ස්ථාවරත්වය, රැකවරණය හා උපකාරය අනිවාර්යය කරයි. එය අල්ලාහ් සඳහන් කරන තවත් ආකාරයක පෙනී සිටීමකට වඩා වෙනස්ය. එනම් "... ඔහු(අල්ලාහ්) ඔවුන්ගෙන් සිව්වැන්නා ලෙස නොවී තිදෙනෙකු අතර රහස් සාකච්ඡාවක් නොමැත. තවද ඔහු ඔවුන්ගෙන් හයවැන්නා ලෙස නොවී පස්දෙනෙකු අතර (රහස් සාකච්ඡාවක්) නොමැත. එයට වඩා අඩු සංඛ්‍යාවක් සිටිය ද අධික සංඛ්‍යාවක් සිටිය ද ඔවුන් කොතැනක සිටියද ඔහු ඔවුන් සමග නොවී (ඔවුන් අතර රහස් සාකච්ඡාවක්) නොමැත..." (සූරා මුජාදලාහ් :7) සැබැවින්ම මෙම පෙනී සිටීම ඔවුන් සිදු කරන ක්‍රියාවන් සඳහා ඔහුගේ දැනුම ඔහුගේ බැල්ම ඔහුගේ නිරීක්ෂණය අනිවාර්යය කරන්නකි. එමෙන්ම එය ගැත්තන්හට ඒ ගැන බිය ගැන්වීමක් නියම කරනු ඇත.

"සමෘද්ධිමත් අවදියේ අල්ලාහ් වෙත ඔබ ව හඳුන්වා දෙන්න. දුෂ්කර අවදියේ ඔහු ඔබ ව හඳුනා ගනු ඇත." යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

ඉන් අදහස් කරනුයේ: සැබැවින්ම කවරෙකු සමෘද්ධිමත් ව සිටින තත්ත්වයේ අල්ලාහ්ගේ සීමාවන් ආරක්ෂා කර ඔහුගේ යුතුකම් සැලකිල්ලෙන් ඉටු කර ඇත්තේ ද එමගින් ඔහු ඔහුව අල්ලාහ් වෙත හඳුන්වා දී ඇත. ඔහු හා ඔහුගේ පරමාධිපති අතර විශේෂ දැන හැඳින ගැනීමක් ඇති වන්නේය. එවිට දුෂ්කර අවස්ථාවන්හි ඔහුගේ පරමාධිපති ඔහුව හඳනා ගනු ඇත. සමෘද්ධිමත්

තත්ත්වයේ ඔහුට තමන් පිළිබඳ හඳුන්වා දුන් සේ ඔහු ඔහුට රැකවරණය ලබා දෙන්නේය. මෙම දැන හඳුනා ගැනීම තුළින් පීඩාවන්ගෙන් ඔහු ඔහු ව ආරක්ෂා කරන්නේය. මෙය විශේෂ දැන හඳුනා ගැනීමකි. එය තම පරමාධිපතිට ගැත්තා සමීප වීමත් ඔහුට ඔහු ආදරය කිරීමත් ඔහුගේ ප්‍රාර්ථනාවට පිළිතුරු දීමත් අනිවාර්යය කරනු ඇත.

ගැත්තා තම පරමාධිපතිට හඳුන්වා දීමේ ආකාර දෙකකි.

ඒ දෙකින් පළමුවැන්න: පොදු හඳුන්වා දීම එනම්: පිළිගැනීම, තහවුරු කිරීම, විශ්වාසය යනාදිය ගැන තමන්ව හඳුන්වා දීමය. මෙය දේව විශ්වාසවන්තයින්හට පොදු වූ කාරණාවකි.

දෙවැන්න: විශේෂ හඳුන්වා දීම: එය අල්ලාහ් වෙත මුළු හදවතම නැඹුරු කරවීමත් සියල්ලෙන් මිදී ඔහු වෙත යොමු වීමත් ඔහුව මෙනෙහි කරමින් සැනසුම ලබා ඔහු ට ලැජ්ජා වීමත් ඔහුට බිය වීමත් අනිවාර්යය කරනු ඇත.

මෙම විශේෂ හඳුන්වා දීම පිළිබඳ දැනුමැත්තෝ ඒ වටා ගමන් කරති. ඔවුන් අතුරින් කෙනෙකු 'මෙලෝ වැසියන් අතර දුප්පතුන් වනාහි ඔවුහු එයින් පිටව යති. එහි ඔවුන් භුක්ති විඳී දෑ කොතරම් අගනේ ද!'' යැයි පැවසීය. එවිට: 'ඒ කුමක් දැ?' ඔහුගෙන් විමසන ලදී. ඔහු: 'අල්ලාහ්ගේ දැන හැඳිනීම' යැයි පැවසීය.

අල්ලාහ් තම ගැත්තන්හට තමන් ව හඳන්වා දීම ද ආකාර දෙකකි.

පළමුවැන්න: පොදු හඳුන්වා දීමයි. එනම් ඔහුගේ ගැත්තන් පිළිබඳ ඔහුගේ දැනුම හා ඔවුන් සගවන දෑ හා ඔවුන් ප්‍රසිද්ධියට පත් කරන දෑ පිළිබඳ ඔහුගේ නිරීක්ෂණයයි.

දෙවැන්න: විශේෂ හඳන්වා දීමයි. එනම්: එය තම ගැත්තා වෙනුවෙන් වූ ඔහුගේ ආදරය. ඔහු වෙත සමීප වීම, ඔහුගේ පැතුමට පිළිතුරු සැපයීම, දුෂ්කරතාවලින් ඔහුව මුදවා ගැනීම යනාදිය අනිවාර්යය කරනු ඇත. තම පරමාධිපති පිළිබඳ නබි (ﷺ) තුමා පැවසූ ප්‍රකාශයක් එය මනාවට පෙන්වා දෙයි. ''මාගේ ගැත්තා මම ඔහුට වඩාත් ප්‍රියමානප වන තෙක් අතිරේක නැමදුම්වල නිරත වී මා වෙත ළංවෙමින්ම සිටියි. මම ඔහුට ප්‍රිය කළේ නම් ඔහු සවන් දෙන ඔහුගේ සවන ඔහු බලන ඔහුගේ බැල්ම ඔහු අල්ලන ඔහුගේ

අත හා ඔහු ගමන් කරන ඔහුගේ පාදය බවට මම පත්වෙමි. එමෙන්ම ඔහු මගෙන් ඉල්ලා සිටියේ නම් සැබැවින්ම මම ඔහුට එය පිරිනමමි. ඔහු මගෙන් රැකවරණය පතන්නේ නම් මම ඔහුට රැකවරණය සළසමි.''[158]

සමස්තයක් ලෙස බැලූ කල: තමන් සමෘද්ධිමත් තත්ත්වයේ සිටියදී බැතිමත්කම හා අවනතභාවයෙන් යුතුව අල්ලාහ් සමග කටයුතු කරන්නේ නම් තමන් දුෂ්කර තත්ත්වයේ සිටියදී උපකාරශීලී ව හා ඉතා කාරුණික ව අල්ලාහ් තමන් සමග කටයුතු කරනු ඇත.

නබි (ﷺ) විසින් ප්‍රකාශ කළ බවට අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලද හදීසයක් ඉමාම් තිර්මිදි තුමා මෙසේ පළ කර සිටියි. ''දුෂ්කර අවස්ථාවන්හි තමන්ට අල්ලාහ් පිළිතුරු සපයනු ඇතැයි සතුටු වන්නා සමෘද්ධිමත් අවස්ථාවන්හි ප්‍රාර්ථනා කිරීම වැඩි කරත්වා!''[159]

***

''ඔබ යමක් ඉල්ලූ විට අල්ලාහ්ගෙන්ම ඉල්ලනු. ඔබ උදව් පතන විට අල්ලාහ්ගෙන්ම උදව් පතනු.'' යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

මෙය සූරා අල් ෆාතිහා හි ''ඔබවම නමදිමු ඔබෙන්ම උපදව් පතමු'' යන පාඨයෙන් ගනු ලැබූවකි. සැබැවින්ම අල්ලාහ්ගෙන් ඉල්ලීම යනු: ඔහුගෙන් ප්‍රාර්ථනා කිරීම හා ඔහු වෙත කැමැත්ත පළ කිරීමයි. ප්‍රාර්ථනාව යනු නැමදුමකි.

***

''පන්හිදවල් ඉවතට ගෙන ඇත. පිටපත් සිඳී ගොස් ඇත.'' යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

158. මෙම හදීසය ඉමාම් බුහාරි විසින් වාර්තා කර ඇත. එමෙන්ම 'අර්බඊනන් නවවි'හි තිස් අටවන හදීසයයි. මේ පිළිබඳ විස්තර 'ඉන්ෂා අල්ලාහ්' පහතින් සඳහන් වෙයි.

159. තිර්මිදි (3382), ෂෙයික් අල් අල්බානී 'අස්-සිල්සිලතිස් සහීහා'හි (593) මෙය සඳහන් කර ඇත.

පෙර නියමයන් සියල්ල පෙරාතුවම ලියවී ඇති බවත් දිගු කලකට පෙරම එය ලියා අවසන් බවත් පෙන්වීම සඳහා යෙදී ඇති වක්‍රාකාර කියමනකි. සැබැවින්ම පොතක් ලියා අවසන් වී එහි කාලය දීර්ග වූ විට එයින් පන්හිදවල් ඉවත් වනු ඇත. පන්හිදවල් සිදී යනු ඇත. දීර්ගව ලියවුනු දැද සිදී යනු ඇත. දීර්ගව ලියවුන් පොත්වල කොළ ද සිදී යනු ඇත. මෙය ඉතා අලංකාර මෙන්ම වඩාත් ගැළපෙන අනුරූපකයකි.

"සැබැවින්ම සියලු මැවීම් එක් ව අල්ලාහ් තීන්දු නොකළ දෙයකින් ඔබට යම් සෙතක් සළසන්නට අපේක්ෂා කළේ නම් ඒ සඳහා ඔවුහු හැකියාව නොදරනු ඇත. එමෙන්ම අල්ලාහ් ඔබට නියම නොකළ දෙයකින් ඔබට හානියක් සිදු කරන්නට අපේක්ෂා කළේ නම් ඒ සඳහා ඔවුන් හැකියාව නොදරනු ඇත."[160] යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

ඉන් අදහස් කරනුයේ: ගැත්තෙකුට මෙලොව ජීවිතයේ ප්‍රයෝනවත් යමක් ලැබීමත් හානි දායක යමක් සිදු වීමත් ඒ සියල්ලම ඔහුට නිර්ණය කරනු ලැබූ නියමයන් වේ යන්නයි. "(නබිවරය,) ඔබ පවසන්න. අල්ලාහ් අපට නියම කළ දැ මිස වෙනෙකක් අප නොලබන්නේමය." (සූරා අත්-තව්බා: 51) අල්ලාහ්ගේ තවත් ප්‍රකාශයක් මෙසේය. "කිසිදු ව්‍යසනයක් අපි එය ඇති කරන්නට පෙර පුස්තකයේ සඳහන්ව මිස මිහිතලයේ හෝ නුඹලා අතර හෝ සිදුවන්නේ නැත. (සූරා අල් හදීද්: 22) තවත් ප්‍රකාශයක "නුඹලා නුඹලාගේ නිවෙස් වල සිටිය ද කවරෙකු වෙත මරණය නියම කරනු ලැබුවේ ද ඔවුන් තමන්ගේ (අවසාන) සැතපෙන ස්ථානයන් වෙත බැහැර වනු ඇත." (සූරා ආලු ඉම්රාන්:154)

"සැබැවින්ම ඔබ කවර දෙයක් පිළිකුල් කරන්නේ ද එහි ඉවසීමෙන් කටයුතු කිරීමෙහි අධික යහපත ඇත්තේය." යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි: ඉන් අදහස් කරනුයේ: සැබැවින්ම ගැත්තාට නියම කරනු ලැබූ වේදනා සහගත යම් අභාග්‍යයක් ඇති වී ඔහු ඒ මත ඉවසීමෙන් සිටින විට එම ඉවසීම තුළ ඔහුට බොහෝ යහපත ඇතැයි යන්නයි.

160. මෙය ඉමාම් අහ්මද්ගේ වාර්තාව වන අතර අර්ථයෙන් ඉමාම් තිර්මිදිගේ වාර්තාව යි.

සිදුවන කරදරවලදී තීන්දුව හා නියමය විශ්වාස කරන්නන් හට තත්ත්වයන් දෙකක් ඇත.

පළමුවැන්න: එය පිළිගැනීමය. මෙය වඩාත් උසස් වූ උතුම් නිලයයි. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: “අල්ලාහ්ගේ අනුමැතියෙන් තොර කිසිම දූර්භාග්‍යයක් ඇති නොවන්නේමය. තවද කවරෙකු අල්ලාහ්ව විශ්වාස කරන්නේද ඔහු(අල්ලාහ්) ඔහුගේ හදවතට යහමග පෙන්වන්නේය. අල්ලාහ් සියලු දෑ කෙරෙහි සර්වඥය. (සූරා අත්-තඝාබුන්:11) අල්කමා තුමා මෙසේ පවසයි: එය මිනිසාට ඇති වන දූර්භාග්‍යයයි. සැබැවින්ම එය අල්ලාහ් වෙතින් යැයි ඔහු දැන සිටියි. එයට යටත් වෙයි. එය පිළිගනියි.

අබූ දර්දා තුමා: “සැබැවින්ම අල්ලාහ් යම් තීන්දුවක් තීරණය කළ විට එය පිළිගැනීම මට වඩාත් ප්‍රියමනාප වන්නේය.” යැයි පැවසීය.

උමර් ඉබ්නු අබ්දුල් අසීස් තුමා: “මම අවදි වූයෙමි. තීන්දු කරන ලද හා නියම කරන ලද තැන්වලදී මිස වෙනත් සතුටක් මා වෙත නැත.”

එබැවින් මෙම නිලයට කවරෙකු පැමිණෙන්නේ ද ඔහුගේ ජීවිතය මුළුමණින්ම සතුටින් හා සුවයෙන් පවතී. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: “පිරිමියෙකුගෙන් හෝ කාන්තාවකගෙන් තමන් විශ්වාසිකයෙකු ව සිට කවරෙකු දැහැමි ක්‍රියාවන් සිදු කළේ ද ඔහුට අපි යහපත් ජීවිතයක් ගත කරන්නට සළස්වමු.” (සූරා අන් නහ්ල්: 97) මුල් කාලීන් විද්වතෙකු විසින් පවසා ඇත්තේ “යහපත් ජීවිතය යනු: එය පිළි ගැනීම හා සෑහීමට පත් වීම” බවයි.

එසේ පිළිගන්නන් විටෙක පරීක්ෂා කරන්නාගේ යථාර්ථය සහ එම පරීක්ෂණයේ ගැත්තාට ඔහු තබා ඇති යහපත පිළිබඳ සැළකිලිමත් වන අතර ඔහු(අල්ලාහ්)ගේ තීන්දුව ගැන උනන්දුවක් නොදක්වති. තවත් විටෙක තීන්දුව පිළිගැනීමේ දී හිමි වන කුසල පිළිබඳ සැලකිලිමත් වෙති. පසුව කවර කරුණක් පරීක්ෂාවට යොමු කරනු ලැබුවේ ද එහි වේදනාව ඔවුනට අමතක වී යයි. විටෙක පරීක්ෂා කරන්නාගේ බලය ඔහුගේ කීර්තිය හා ඔහුගේ පරිපූරණත්වය සැලකිලිමත් වෙති. වේදනාව නොහඟන තරමට ඒවා දැකීමෙහි ගිලෙන්නට බලති. මෙය දැන හැඳිනීම හා ආදරය ඇති විශේෂ පුද්ගලයින් ඔහු වෙත සේන්දු කරවයි. ඇතැම් විට ඔවුන්ගේ ආදරණීයයන්

පිළිබඳ හදවතින්ම ඔවුන් සැලකිලිමත් වන බැවින් ඔවුනට අත් වූ ඉරණම භුක්ති විඳින තරමටම එය පත් වනු ඇත.

දෙවන තත්ත්වය: පරීක්ෂණය මත ඉවසීමයි. මෙය පෙර නියමය පිළිගැනීමට නොහැකි උදවිය සතුය. පිළිගැනීම යනු ඒ සඳහා අමතරව අපේක්ෂා කරනු ලබන සතුටු දායක දෙයකි. නමුත් ඉවසීම යනු මුඃමින්වරයකුට අනිවාර්යයෙන් තිබිය යුත්තකි.

හසන් තුමා: 'පිළිගැනීම හිතකරය. නමුත් ඉවසීම මුඃමින්වරයා ස්ථාවර කරන්නකි.''

පිළිගැනීම හා ඉවසීම අතර වෙනස: සැබැවින්ම ඉවසීම යනු: සිත පාලනය කිරීම, -වේදනාවක් අත් වූ අවස්ථාවක- කෝපය වළක්වා ගැනීම, එය පහව යෑම ගැන සතුටු වීම හා තැතිගැනීම් ඇති කරන ක්‍රියාවන්ගෙන් තම අවයව පාලනය කිරීමය.

පිළිගැනීම යනු: පෙර නියමය පිළිබඳ හදවතේ පවතින පුළුල් භාවය හා විශාලත්වය, වේදනාව ඇති කළ දෑ ඉවත් වීම සම්බන්ධයෙන් ඇති කැමැත්ත අතහැර දැමීම, වේදනාවක් දැනුන ද එය පිළිගැනීම එය සැහැල්ලු කරනු ඇත. එය ස්ථාවරත්වයේ හා දැනුමේ ජීවයෙන් හදවත බැඳී පවතින බැවිනි. පිළිගැනීම බලවත් වූ විට ඉහත කී පරිදි වේදනාව දැනීම මුළුමණින්ම ඉවත් වනු ඇත.

***

''දුෂ්කරත්වය සමග සැබැවින්ම පහසුව ඇත.'' යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

එය සූරා අත් තලාක් හි 7 වන පාඨයේ සඳහන් ''දුෂ්කරතාවයෙන් පසු පහසුව අල්ලාහ් ඇති කරන්නේය'' යන අල්ලාහ්ගේ ප්‍රකාශයෙන් ගනු ලැබූවකි.

පීඩාව සමග සහනය හා දුෂ්කරතාවය සමග පහසු ව යන කාරණා එකිනෙක සම්බන්ධ කර බැලීමේදී එහි දැකිය හැකි සැඟවුනු කරුණක් වනුයේ: සැබැවින්ම දුෂ්කරත්වය වනාහි, එය දැඩි වන විට එය බලවත් වන විට එමෙන්ම එකිනෙක වළක්වන විට මැවීම් දෙසින් එය හෙළිදරව් කිරීමෙන්

ගැත්තාහට ආයාසයක් ඇති වන්නේය. ඔහුගේ හදවත අල්ලාහ් සමග පමණක් බැඳෙන්නේය. එය අල්ලාහ් මත තබන විශ්වාසයේ යථාර්ථයයි. අවශ්‍යතාවන් අපේක්ෂා කරනු ලබන සාධක අතරින් වඩාත් බලවත් සාධකයකි. සියල්ල ඔහු වෙත භාර කරන්නාහට සැබැවින්ම අල්ලාහ් ප්‍රමාණවත් වන්නේය. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. "කවරෙකු අල්ලාහ් මත භාර කරන්නේ ද ඔහු ඔහුට ප්‍රමාණවත්ය." (අත්-තලාක්: 3)

තවදුරටත්: සැබැවින්ම මුඃමින්වරයා ප්‍රාර්ථනා කිරීමෙන් හා ඔහු යටහත් වීමෙන් පසු සැනසුම ප්‍රමාද වන විට එයින් ඔහු ආයාසයට පත් වූ විට පිළිතුරු වල බලපෑමක් ඔහුට හෙළි නොවූ විට ඔහු තමන්ටම දොස් පවරා ගනිමින් මෙසේ පවසයි: 'සැබැවින්ම මෙය මට පිරිනමනු ලැබුවේ ඔබ දෙසිනි. ඔබ තුළ එය යහපත් නම්, මම එය පිළිගනිමි.' මෙම දොස් නැගීම අවනත වනවාට වඩා අල්ලාහ් වෙත ඉතා ප්‍රිය මනාපය. සැබැවින්ම එය ගැත්තා ඔහුටම යටහත් වීමෙන් ඉවත් කරන්නේය. සැබැවින්ම තමන් පරීක්ෂාවට ලක් කරනු ලැබූ අය අතරින් කෙනෙකු බවත් තමන් ප්‍රාර්ථනාවට පිළිතුරු සපයනු ලබන්නන් අතුරින් නොවන බවත් එය පිළිගන්නට සලස්වයි. -එවිට- ඒ හේතුවෙන් ප්‍රාර්ථනාවට පිළිතුරු ලැබීම හා දුෂ්කරතාවෙන් සැනසුම ලැබීම ඔහු වෙත ඉක්මන් වනු ඇත. ඊට හේතුව ඔවුන්ගේ හදවත් බිඳී යන විට සැබැවින්ම අල්ලාහ් එහි පැමිණෙන බැවිනි.

සමහරවිට ඔබ දකින දේ නොපවතින අතර

සදාකාලිකව පතන දැයින් ඔබට සහනයක් ලැබෙනු ඇත

සමහරවිට යම් සහනයක් එමගින් අල්ලාහ් දෙන අතර

සෑම දිනකම ඔහුගේ මැවීම් පිළිබඳ කටයුතු ඔහුට ඇත.

දුෂ්කරතාවක් ඇති වූ විට පහසුවකින් සැනසුම ලබන්න.

සැබැවින්ම අල්ලාහ්ගේ නියමය දුෂ්කරතාවයට පරව පහසු ව සැලසීමය.

***

## الحَدِيْثُ العِشْرُونَ

## විසි වන හදීසය

عَنْ أَبِي مَسْعُودٍ الْبَدْرِيِّ رَضِـيَ اللهُ عَنْهُ، قَالَ: قَالَ رَسُولُ اللهِ ﷺ: «إِنَّ مِمَّا أَدْرَكَ النَّاسُ مِنْ كَلَامِ النُّبُوَّةِ الْأُولَى: إِذَا لَمْ تَسْتَحْيِ، فَاصْنَعْ مَا شِئْتَ»

رَوَاهُ الْبُخَارِيُّ.

අල්ලාහ්ගේ දූතයාණන් ප්‍රකාශ කළ බවට අබූ මස්ඌද් අල් බද්රි (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

"මුල් කාලීන නබිවරුන්ගේ ප්‍රකාශයෙන් මිනිසා ලබා ඇති දෑ වනුයේ: ඔබ ලැජ්ජා නොවන විට, ඔබ කැමති දෑ කරත්වා"

මෙම හදීසය බුහාරි විසින් දන්වා ඇත.

***

### -විග්‍රහය-

"මුල් කාලීන නබිවරුන්ගේ ප්‍රකාශයෙන් මිනිසා ලබා ඇති දෑ" යන නබි තුමාගේ ප්‍රකාශය වනාහි:

මෙය පෙර සිටි නබිවරුන් විසින් උපුටා ලැබූවක් බවත් ඔවුන් අතර මෙය හුවමාරු වූ බවත් පරම්පරාවෙන් පරම්පරාවට එකිනෙකා මෙය උරුම කර ගත් බවත් පෙන්වා දෙයි. එමෙන්ම සැබැවින්ම පෙර පැවති නබිත්වයන්[161] -

161. 'අන්-නුබුව්වාත්' නබිත්වය හා 'අත්-තනබ්බුආත්' දේව අනාවරණය යන පද ආගමික ව යෙදෙන යෙදුමකි. එම පද අහසින් ලැබෙන තොරතුරුවලට මිස භාවිත වන්නේ නැත. පොදු ජනයා බොහෝ දෙනෙකු මෙන්ම ඇතැම් විශේෂ පුද්ගලයින් පවා මෙම යෙදුම අසත්‍ය ප්‍රකාශවලට හා භෞතික අනාවැකි සඳහා පහත් ලෙස වැරදියට භාවිත කරති. ඔවුහු 'තුන්බළ ෆුලානුන් බිකදා' -මෙමගින් පුද්ගලයකුට

දේවා අනාවරණයන්- මෙම කියමන සමග පැමිණි බවත් මෙම සමූහයාගේ මූලාරම්භය දක්වාම මිනිසා අතර මෙය ප්‍රචලිත ව පැවති බවත් පෙන්වා දෙයි.

"ඔබ ලැජ්ජා නොවූ විට, ඔබ කැමති දෑ කරත්වා" යන ප්‍රකාශය වනාහි: මෙහි අර්තයේ ප්‍රකාශ දෙකක් ඇත.

පළමුවැන්න: මෙය විධානයක අර්ථය ගෙන දෙන්නේ නැත. නමුත් එය අවමන් සහගත මෙන්ම හා ඉන් වැළකී සිටිය යුතුය යන අර්ථය ගෙන දෙයි. මෙම ප්‍රකාශය දරන්නන් සතුව එය භාවිත කරන ක්‍රමවේද දෙකක් ඇත.

1- මෙය තර්ජනාත්මක අර්ථයෙන් පිහිටීම: එනම්: ඔබට ලැජ්ජාවක් නොමැති නම් ඔබ කැමති දෑ කරනු. සැබැවින්ම අල්ලාහ් ඒ සඳහා ඔබට විපාක දෙනු ඇත. එයට උදාහරණ ලෙස අල්ලාහ්ගේ ප්‍රකාශය මෙසේ පිහිටා ඇත. "නුඹලා කැමති දෑ කරනු. සැබැවින්ම ඔහු නුඹලා කරන දෑ පිළිබඳ නිරීක්ෂණය කරන්නාය." (සූරා ෆුස්සිලත්: 40) ඔහුගේ තවත් ප්‍රකාශයක "ඔහු හැර නුඹලා කැමති දෑ සඳහා ගැතිකම් කරනු" (සූරා අල් සුමර්: 15) මෙය පිරිසකගේ තේරීමයි. අබූ අල් අබ්බාස් සෑලබ් තුමාද ඔවුන් අතරින් කෙනෙකි.
2- සැබැවින්ම එය නියෝගයකි. එහි අර්ථය පණිවිඩයකි. එනම්: සැබැවින්ම කවරෙකු ලැජ්ජා නොවන්නේද ඔහු අභිමත දෑ කරනු ඇත. සැබැවින්ම අශීලාචාර ක්‍රියාවෙන් වැළකී සිටින්නා ලැජ්ජාව ඇති අයෙකි. කවරෙකුට ලැජ්ජාවක් නැත්තේ ද පිළිකුල් සහගත අශීලාචාර සියලු දෑහි ගිලී යයි. මෙය අබූ උබෙයිද් අල් කාසිම් ඉබ්නු සලාම්, ඉබ්නු කුතෙයිබා, මුහම්මද් ඉබ්නු නස්ර් අල් මිර්වදියියි හා වෙනත් අයගේ මතයයි. මෙම ප්‍රකාශයට සමාන ප්‍රකාශයක් පෙන්වා දෙමින් ඉමාම් අහ්මද් තුමා විසින් කළ වාර්තාවක් අබූ දාවූද් විසින් පළ කර ඇත.

---

අනාවැකි පළ කරනු ලැබීය- යනුවෙන් පවසති. මෙය වරදකි. නමුත් ඔවුන් ඒ වෙනුවට පැවසිය යුත්තේ 'තුච්කඋ ෆුලානුන් කදා' මෙලෙස පුද්ගලයකු අපේක්ෂා කරයි.- හා එවැනි වෙනත් පද භාවිතා කිරීමය. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්-තරීෆී)

දෙවන ප්‍රකාශය: මෙම ප්‍රකාශයේ මතු පිටින් පෙනෙන පරිදි සැබැවින්ම තමන් කැමති දෑ සිදු කරත්වා මෙන් වූ නියෝගයකි. සැබැවින්ම එහි අර්ථය: ඔබ සිදු කරන්නට යන ක්‍රියාව සම්බන්ධයෙන් -අල්ලාහ් ගැන හෝ මිනිසුන් ගැන හෝ ලැජ්ජාවක් නොමැති විට ඉන් ඔබ කැමති නම් එය ඉටු කරනු යන්නයි.

නබි (ﷺ) තුමාණන් ලැජ්ජාව දේව විශ්වාසයේ කොටසක් බවට පත් කළේය. ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලද හදීසයක් බුහාරි හා මුස්ලිම්හි මෙසේ සඳහන් වේ. සැබැවින්ම නබි (ﷺ) තුමාණන් මිනිසෙකු අසළින් ගමන් ගත්හ. ඔහු තම සහෝදරයාට ලැජ්ජාව පිළිබඳ අවවාද කරමින් 'ඔබ ලැජ්ජා විය යුතුය' යැයි පැවසීය. 'එය ඔබට හානියක් ඇති කරනු ඇත' යැයි පවසන්නක් මෙන් විය. එවිට අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) "ඔබ ඔහු ව අතහැර දමන්න. සැබැවින්ම ලැජ්ජාව යනු දේව විශ්වාසයෙන් එකකි." යැයි පවසා සිටියහ.[162]

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බවට ඉම්රාන් ඉබ්නු හුසෙයින් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් බුහාරි හා මුස්ලිම්හි මෙසේ පළ වී ඇත. "ලැජ්ජාව යහපත් දෑ සිදු කිරීමෙන් මිස පැමිණෙන්නේ නැත." මුස්ලිම්හි සඳහන් තවත් වාර්තාවක: "ලැජ්ජාව සියලු යහපත වන්නේය"[163]

***

සැබැවින්ම ලැජ්ජාව වර්ග දෙකක් බව ඔබ දැනගත යුතුයි.

පළමුවැන්න: කිසිදු ඉපැයීමකින් තොරව සහජයෙන් හා ස්වභාවික ගුණාංගයෙන් එය පිහිටා තිබීමය. එය අල්ලාහ් ගැත්තාට පිරිනමා ඇති ගුණයහපත්කම හේතුවෙන් හිමි වූවකි.

දෙවැන්න: අල්ලාහ් පිළිබඳ අවබෝධය සහ ඔහුගේ මහිමය, ඔහු තම ගැත්තන්ට සමීප වීම හා ඔවුන් දෙස ඔහු නිරීක්ෂණය කිරීම යනාදිය පිළිබඳ දැනුම තුළින් ඇති වන්නක් ලෙස පිහිටීමය. දේව විශ්වාසයේ කරුණු අතුරින් වඩාත් උසස් වනුයේ එයයි. එය ඉහ්සාන් නම් නිලයටත් වඩා උසස් වූවකි.

162. බුහාරි (24), මුස්ලිම් (36)
163. බුහාරි (6117), මුස්ලිම් (33)

අල්ලාහ් ගැන ලැජ්ජාවක් ඇති වනුයේ ඔහුගේ ආශිර්වාද දෙස බැලීමෙන් හා ඒවාට කෘතඥ වීමේ දී තමන් තුළ අඩු පාඩු දැකීමෙනි.

සහජයෙන්ම හිමි වූ ලැජ්ජාව ගැත්තාගෙන් ඉවත් වූ විට අශීලාචාර වැරදි සිදු කිරීමෙන් ඔහුව වළක්වන කිසිවක් ඉතිරි වන්නේ නැත. ඔහු දේව විශ්වාසයක් නොමැත්තෙකු මෙන් පත් වනු ඇත.

මැනවින් දන්නා අල්ලාහ් පමණය.

***

## الحَدِيْثُ الوَاحِدُ والعِشْرُونَ

## විසි එක් වන හදීසය

عَنْ سُفْيَانَ بْنِ عَبْدِ اللهِ رَضِـيَ اللهُ عَنْهُ، قَالَ: قُلْتُ:

يَا رَسُولَ اللهِ، قُلْ لِي فِي الْإِسْلَامِ قَوْلًا، لَا أَسْأَلُ عَنْهُ أَحَدًا غَيْرَكَ، قَالَ: قُلْ آمَنْتُ بِاللهِ، ثُمَّ اسْتَقِمْ»

رَوَاهُ مُسْلِمٌ.

සුෆ්යාන් ඉබ්නු අබ්දිල්ලාහ් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

මම අල්ලාහ්ගේ දූතයාණන්ගෙන්: අල්ලාහ්ගේ දූතයාණනි, ඔබෙන් හැර වෙන කිසිවකුගෙන් මා ඒ ගැන විමසා නැති ඉස්ලාමයේ ප්‍රකාශයක් මා හට පවසන්න. යැයි මම විමසා සිටියෙමි.

එතුමා: ‘මම අල්ලාහ්ව විශ්වාස කරමි යැයි පවසා පසුව ස්ථිර ව සිටින්න’ යැයි පවසා සිටියහ.

මෙය ඉමාම් මුස්ලිම් විසින් දන්වා ඇත.

***

### -විග්‍රහය-

“ඔබෙන් හැර වෙන කිසිවකුගෙන් මා ඒ ගැන විමසා නැති ඉස්ලාමයේ ප්‍රකාශයක් මා හට පවසන්න” යනුවෙන් සුෆ්යාන් තුමා කළ ප්‍රකාශය වනාහි:

එම ප්‍රකාශයෙන් පසුව වෙනත් කිසිදු ප්‍රකාශයක අවශ්‍යතාවක් නොමැති තරමට ඉස්ලාමයේ කරුණු සියල්ල ඇතුළත් පූර්ණවත් ප්‍රකාශයක් තමන්හට උගන්වන්නැයි හෙතෙම නබි (ﷺ) තුමාණන්ගෙන් ඉල්ලා සිටියේය. එවිට එතුමාණන් “මම අල්ලාහ්ව විශ්වාස කරමි යැයි පවසා පසුව ඔබ ස්ථිර ව සිටින්න.” යනුවෙන් ඔහුට පිළිතුරු දුන්හ. තවත් වාර්තාවක: “මාගේ

පරමාධිපති අල්ලාහ් ය යැයි පවසා පසුව ස්ථීර ව සිටින්න.'' යනුවෙන් සඳහන් ව ඇත. මෙය උත්තරීතර අල්ලාහ්ගේ ප්‍රකාශයෙන් ගන්නා ලද්දකි. එනම් ''සැබැවින්ම 'අපගේ පරමාධිපති අල්ලාහ්' යැයි (විශ්වාසයෙන් යුතුව) පවසා පසුව (එහි) ස්ථීර ව සිටියවුන් (පිළිබඳව නම්) මලක්වරුන් ඔවුන් වෙත (මරණාසන්න මොහොතේ දී මෙලෙස පවසමින්) පහළ වෙති. 'නුඹලා බිය නොවවු. තවද නුඹලා දුක් නොවවු. නුඹලාට ප්‍රතිඥා දෙනු ලබමින් සිටි (ස්වර්ග) උයන පිළිබඳව නුඹලා ශුභාරංචි ලබා ගනිවු.' (සූරා ෆුස්සිලත්: 30) අබූ බක්කර් අස්-සිද්දීක් තුමා 'පසුව ස්ථීර ව සිටියෝය'' යනුවෙන් අර්ථ ගන්වා ඇති 'සුම්මස්තකාමූ' යන පදය විස්තර කිරීමේදී: 'ඔවුන් අල්ලාහ්ට කිසිවක් ආදේශ නොකළෝය' යැයි පවසා සිටියේය. එතුමා විසින් පවසන ලද තවත් ප්‍රකාශයක: ''ඔහු හැර වෙනත් දෙවියෙකු වෙත ඔවුහු නොහැරියෝය' යැයි පවසා ඇත. එතුමා විසින් කළ තවත් ප්‍රකාශයක: ''පසුව සැබැවින්ම ඔවුන්ගේ පරමාධිපති අල්ලාහ් වේ යැයි ඔවුන් ස්ථීර ව සිටියෝය'' යනුවෙන් සඳහන් වී ඇත.[164]

අතැමුන් පවසා සිටින පරිදි එහි අදහස: 'ඒක දේවත්වය මත ස්ථීර ව සිටීමය' යන්නයි. සැබැවින්ම මිනිසාට නිරා ගින්න තහනම් කරනු ලබන පරිපූර්ණ ඒකදේවත්වය යනුවෙන් අදහස් කරනුයේ: 'ලා ඉලාහ ඉල්ලල්ලාහු' යන්නෙහි අර්ථය තහවුරු කිරීමය. සැබැවින්ම 'අල් ඉලාහ්' -දෙවියා- යනු භක්තිය, කීර්තිය, බිය, ආදරය, අපේක්ෂාව, භාරකාරත්වය හා පැතුම යනාදියෙන් පිදුම් ලබන බැවින් ඔහු අවනතභාවයට ලක් වන අතර පිටු පානු නොලබනු ඇත. සියලු පාපයන් ඒකියත්වය පහළට ඇද දමන්නකි. සැබැවින්ම ඒවා තෘෂ්ණාව වෙත ඇරයුම් කරන්නාට දෙන පිළිතුරකි. ඔහු ෂෙයිතාන්ය. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. 'තම ආශාව තම දෙවියන් බවට පත් කරගත් අය ඔබ නොදුටුවෙහිද'' (සූරා අල් ජාසියා: 23) හසන් තුමා ඇතුළු තවත් පිරිසක්: 'ඔහු වනාහි, කිසිවකට ආශා කරන්නේ නම් ඔහු මත ඔහු ගොඩ වනු මිස නැත.' යැයි පවසා ඇත. එය ඒක දේවත්වය මත ස්ථීර ව සිටීම යන කාරණාව අහෝසි කර දමනු ඇත.

164. ස්ථීර ව සිටීම තුළින් මානසික රෝග ලක්ෂණ වලින් ගැත්තා ආරක්ෂා වන්නේය. සෑම මොහොතකම එයට සූදානමින් සිටියි. සැබැවින්ම ගැත්තා ඔහුගේ අවසානය සිදුවනුයේ කවදාදැයි නොදනී (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්-තරීෆී)

'අල්ලාහ් ව මම විශ්වාස කළෙමි යැයි නුඹ පවසනු' යන වාර්තාව වනාහි. එහි අර්ථය ඉතා පැහැදිලිය. සැබැවින්ම දේව විශ්වාසය වනාහි එහි දැහැමි ක්‍රියාවන් ඇතුළත් වන බව මුල් කාලීනයන් අතර මෙන්ම ඔවුන් අනුගමනය කළ හදීස් වේදීන් අතර ද පවතින මතයයි.

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. "නුඹට අණ කරනු ලැබූ පරිදි නුඹ ද නුඹ සමග (සිටි) පශ්චාත්තාප කළවුන් ද (යහ ක්‍රියාවන්හි) ස්ථාවර ව සිටිවු. තවද නුඹලා සීමාව ඉක්මවා නොයවු. සැබැවින්ම ඔහු නුඹලා කරමින් සිටින දෑ පිළිබඳව සර්ව සුපරික්ෂාකාරීය." (සූරා හූද්: 112) ඔහුට හා ඔහු අනුගමනය කළවුන්ට ස්ථිර ව සිටින මෙන් ද කවර දෙයක් ඔවුනට අණ කරනු ලැබුවේ ද එවන් දෑ (කුරිරුකම්)හි ඔවුන් ඉක්මවා නොයා යුතු මෙන් ද අල්ලාහ් ඔහුට නියෝග කර ඇත. එමෙන්ම සැබැවින්ම ඔහු ඔවුන්ගේ ක්‍රියාවන් දෙස නිරීක්ෂා කරන බවත් ඒ ගැන සොයා බලන බවත් තවදුරටත් ඔහු දන්වා ඇත.

ඇතැමෙකු විසින් ලබා ඉමාම් අල්-කුෂෛය්රී හා වෙනත් අය විසින් මෙසේ සඳහනක් කර ඇත. එනම් සැබැවින්ම ඔහු නබි (ﷺ) තුමාණන්ව සිහිනෙන් දුටුවේය. (එහි දී) ඔහු එතුමාගෙන්: අල්ලාහ්ගේ දූතයාණනි, හූද් සහ එහි සහෝදරයින්[165] මාගේ හිසකෙස් පැහෙන්නට සැළැස්වීය යැයි ඔබ පවසන්නෙහිය. ඒවායින් කවර කරුණක් ඔබේ හිසකෙස් පැහෙන්නට සැළැස්වී දැ?යි විමසා ඇත. එතුමා: එහි ප්‍රකාශිත 'ෆස්තකිම් කමා උමිර්ත' (ඔබට අණ කරනු ලැබූ පරිදි ස්ථිර ව සිටින්න) යන ප්‍රකාශය' බව පවසා සිටියහ.

165. 'හූද්, අල්-වාකිආ, අල් මුර්සලාත්, 'අම්ම යතසාඅලූන්', 'ඉදෂ් ෂම්සි කුව්විරත්' යනාදී සූරාවන් මාගේ හිසකෙස් පැහෙන්නට සැලැස්වීය.' යන හදීසය ඉමාම් අත්තිර්මිදිහි (3297) පළ වී ඇත. ඉමාම් හාකිම් (2/476) විසින් ද පළ කර ඇති මෙය ඉමාම් බුහාරිගේ කොන්දේසි අනුව සහීහ් ගණයට අයත් හදීසයක් බව හෙතෙම අවධාරණය කරයි.

සැබැවින්ම මෙම සිහිනය ගැන ඉමාම් අස්-සුයූතී 'අද් දුර්'හි සූරා 'හූද්' විස්තර කිරීමේදී සඳහන් කර ඇති අතර 'ෂුඅබල් ඊමාන්'හි ඉමාම් බය්හකී වෙත එය උපුටා දක්වා ඇත. එය දැනුමට හෝ හැඟුමට ප්‍රයෝජනවත් නොවන බැවින් එය මෙහි ගෙන ඒම ප්‍රයෝජනවත් නොවන බව මම සිතමි.

ස්ථිර භාවය යනු ඍජු මාර්ගය වෙත වූ ගමන් මගයි. -අඩුවෙන් හෝ වැඩියෙන් හෝ- කිසිදු ඇදයක් නොමැති ඍජු දහම එයයි.

බාහිර හා අභ්‍යන්තර සියලු අවනත ක්‍රියාවන් සිදු කිරීම, එමෙන්ම තහනම් කරන ලද සියලු දෑ අතහැරීම යනාදී සියල්ල එය ඇතුළත් කර ගෙන ඇත. මෙම උපදෙස දහමේ පවතින සියළු කරුණුවලට සමස්ත උපදෙසක් බවට පත් ව ඇත.

***

## الحَدِيْثُ الثَّانِي والعِشْرُونَ
## විසි දෙවන හදීසය

عَنْ جَابِرِ بْنِ عَبْدِ اللهِ رَضِـيَ اللهُ عَنْهُمَا

"أَنَّ رَجُلًا سَأَلَ رَسُولَ اللهِ ﷺ فَقَالَ: أَرَأَيْتَ إِذَا صَلَّيْتُ الْمَكْتُوبَاتِ، وَصُمْتُ رَمَضَانَ، وَأَحْلَلْتُ الْحَلَالَ، وَحَرَّمْتُ الْحَرَامَ، وَلَمْ أَزِدْ عَلَى ذَلِكَ شَيْئًا، أَأَدْخُلُ الْجَنَّةَ؟

قَالَ: "نَعَمْ"

رَوَاهُ مُسْلِمٌ.

ජාබිර් ඉබ්නු අබ්දිල්ලාහ් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

සැබැවින්ම මිනිසෙකු අල්ලාහ්ගේ දූතයාණන්ගෙන්:

'මා අනිවාර්යය සලාත් ඉටු කර, රමළාන් මාසයේ උපවාසයේ නිරත වී, අනුමත දෑ අනුමත කර, තහනම් දෑ තහනම් කරමින් කටයුතු කර, ඒ හැර වෙනත් කිසිදු අමතර දෙයක් සිදු නොකළේ නම් මා ස්වර්ගයට පිවිසෙනු ඇතැයි ඔබ සිතන්නෙහිදැ?යි විමසා සිටියේය.'

එතුමා "එසේය" යැයි පැවසූහ.

***

-විග්‍රහය-

ජාබිර් (රළියල්ලාහු අන්හු) විසින් ලබා අබූ සුබෙයිර් විසින් වාර්තා කළ මෙම හදීසය ඉමාම් මුස්ලිම් විසින් පළ කර ඇත. එහි අවසානයේ මීට අමතරව

'අල්ලාහ් මත දිවුරා පවසමි. එයට වඩා අමතර කිසිවක් නොකරමි'' යැයි සඳහන් වී ඇත.

ඇතැමුන් 'අනුමත දෑ අනුමත කිරීම' යන ප්‍රකාශය විස්තර කර ඇත්තේ එය අනුමතය යනුවෙන් විශ්වාස කිරීම බව හා 'තහනම් දෑ තහනම් කිරීම' යන කාරණාව විස්තර කර ඇත්තේ එය තහනම් මෙන්ම ඒ සමග වැළකී සිටිය යුතු බව විශ්වාස කිරීම බවය.

අනුමත දෑ අනුමත කිරීම යන්නෙන් අදහස් කරනු ලබනුයේ එය ක්‍රියාවට ගෙන ඒමය. හරාම් නොවන දෑ පෙන්වා දෙන වාක්‍ය ඛණ්ඩයක් වශයෙන් මෙහි හලාල් යන පදය යෙදී ඇත. එහි අනිවාර්යය දෑ සතුටු දායක දෑ අනුමත දෑ යනාදිය ඇතුළත් වන්නේය. එහි අර්තය: සැබැවින්ම තමන්ට තහනම් කරනු නොලැබූවක් සිදු කිරීම, තමන්ට අනුමත කරනු ලැබූ දෑ ඒ හැර වෙනත් දෙයක් වෙත ඉක්මවා කටයුතු නොකිරීම හා තහනම් කරනු ලැබූ දැයින් වැළකී සිටීමය.

උදාහරණ ඉදිරිපත් කිරීමේ දී ''අනුමත නොකරන තහනම් නොකරන පුද්ගලයා'' යනුවෙන් පවසනු ලැබ ඇත. තහනම් ක්‍රියාවෙන් නොවැළකී සිටි විට, තහනම් දෙයක් තහනම් කර ඇති බව විශ්වාස කළ ද ඔහුට අනුමත කරනු ලද දැහි ඔහු නතර නොවනු ඇත. එමෙන්ම තහනම් ක්‍රියාව සිදු කරන හා ඒ ගැන බිය නොවන්නා එය අනුමත යැයි විශ්වාස නොකර සිටිය ද ඒ සඳහා අනුමත කරන්නෙකු බවට ඔවුන් පත් කර ගනී.

මේ සෑම තත්ත්වයක්ම පවතින අතර මෙම හදීසය අනිවාර්යය දෑ ඉටු කර තහනම් දැයින් වැළකී සිටින්නන් ස්වර්ගයට පිවිසෙනු ඇතැයි පෙන්වා දී ඇත.

මෙම අර්ථය සහිත ව පිරිසක් විසින් පිරිසක් ලබා එසේ අඛණ්ඩ ව වාර්තාකරණයට ලක් වූ මුතවාතිර් හෝ ඊට සමීප නිලයකින් යුත් නබි (ﷺ) තුමාණන් විසින් දන්වා සිටි හදීසයන් පැමිණ ඇත. උදාහරණයක් වශයෙන් නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බවට අබූ හුරෙය්රා තුමා හා අබූ සඊද් තුමා සහාබාවරුන් විසින් වාර්තා කළ හදීසයක් අන් නසාඊ, ඉබ්නු හිබ්බාන්, අල්-හාකිම් යන ඉමාම්වරුන් විසින් මෙසේ පළ කර ඇත. නබි (ﷺ) තුමාණෝ: ''කවර ගැත්තෙකු පස් වැඳැරුම් සලාත ඉටු කර, රමළාන් මාසයේ උපවාසයේ

යෙදී, සකාත් ද නිකුත් කර, සත් මහා පාපයන්ගෙන් වැළකී සිටින්නේ ද ඔහු වෙනුවෙන් ස්වර්ගයේ දොරටු විවෘත කරනු ලැබ ඔහු එහි කැමති දොරටුවකින් පිවිසෙනවා මිස නැත" යැයි පවසා පසුව (සූරා නිසා 31 වන පාඨය වන) "කවර දැයකින් නුඹලා වළක්වනු ලැබ ඇත්තේද එවැනි මහා පාපයන්ගෙන් නුඹලා වැළකුණේ නම් නුඹලාගේ (සුළු) වැරදි වලට නුඹලාට පාප ක්ෂමා ව පිරිනමන්නෙමු. තවද නුඹලා ව ගෞරවාන්විත පිවිසුම් ස්ථානයකට(ස්වර්ගයට) අපි ඇතුළු කරන්නෙමු."[166]

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් බුහාරි හා මුස්ලිම්හි මෙසේ වාර්තා වී ඇත. ඇත්ත වශයෙන්ම ගැමි අරාබිවරයෙකු: 'අල්ලාහ්ගේ දූතයාණනි, මා එය කළ විට ස්වර්ගස්ථවීමට හැකි ක්‍රියාවක් මට කියා දෙන්නැ'යි විමසා සිටියේය. එතුමාණන්: "ඔබ අල්ලාහ් නමදින්න. ඔහුට කිසිවක් ආදේශ නොතබන්න. නියම කරන ලද සලාතය ඉටු කරන්න. අනිවාර්යය කරන ලද සකාතය ද ඉටු කරන්න. රමළානයේ උපවාසය රකින්න. යනුවෙන් පැවසූහ. ඔහු: 'ඔබ ව සත්‍ය සමග එවූ අය මත දිවුරා පවසමි. මීට වඩා කිසිවක් මම අමතර ව නොකරමි. එමෙන්ම මීට වඩා කිසිවක් මම අඩු නොකරමි' යැයි පැවසීය. ඔහු හැරී ගිය කල්හි නබි (ﷺ) තුමාණන්: "ස්වර්ග වාසීන් අතර මිනිසෙකු දකින්නට කවරෙකු සතුටු වන්නේ ද මෙම පුද්ගලයා දෙස බලත්වා' යැයි පැවසූහ.[167]

තල්හා ඉබ්නු උබෙයිදුල්ලාහ් විසින් වාර්තා කරන ලද හදීසයක් මෙසේ සඳහන් වී ඇත. 'සැබැවින්ම හිසකෙස් වියවුල් වූ ගැමි අරාබිවරයෙකු අල්ලාහ්ගේ දූතයාණන් වෙත පැමිණ, 'අල්ලාහ්ගේ දූතයාණනි, සලාතයෙන් අල්ලාහ් මට නියම කර ඇත්තේ කුමක්දැ?'යි මට දන්වා සිටින්න' යැයි විමසා සිටියේය. එවිට එතුමාණන්: 'පස්වාර සලාත්ය. නමුත් ඔබ අමතර යමක් සිදු කරන්නේ නම් මිස.' යැයි පවසා සිටියහ. උපවාසයෙන් අල්ලාහ් මට අනිවාර්යය කර ඇත්තේ කුමක් දැයි මට දන්වා සිටින්නැයි විමසා සිටියේය. එවිට එතුමාණන්: 'රමළාන් මාසයේ උපවාසය. නමුත් ඔබ අමතර යමක් සිදු

166. අන්නසාඊ (2438), ඉබ්නු හිබ්බාන් (1748), අල් හාකිම් (1/200) එතුමා මෙය සහීහ් ගණයට අයත් හදීසයක් බව පවසා සිටිය ද අෂ්-ෂෙයික් අල් අල්බානී 'ළඊෆු අත්-තර්ගීබ් වත්-තර්හීබ්'හි (452) මෙය 'ළඊෆ්' ගණයට අයත් හදීසයක් බව පෙන්වා දී ඇත.

167. බුහාරි (1397), මුස්ලිම් (14).

කරන්නේ නම් මිස.' යැයි පවසා සිටියහ. 'සකාතයෙන් අල්ලාහ් මට නියම කර ඇත්තේ කුමක්දැ?'යි මට දන්වා සිටින්න' යැයි විමසා සිටියේය. එවිට අල්ලාහ්ගේ දූතයාණන්: 'ඉස්ලාමයේ නීති රීති ඔහුට දන්වා සිටියේය. එවිට ඔහු: 'සත්‍ය තුළින් ඔබ ගෞරවයට පත් කළ අය මත දිවුරා පවසමි. මම අමතර යමක් සිදු නොකරමි. එමෙන්ම අල්ලාහ් මට නියම කළ කිසිවක් අඩු නොකරමි. යැයි පැවසීය. එවිට අල්ලාහ්ගේ දූතයාණන්, 'ඔහු සත්‍ය පවසා ඇත්නම් ඔහු ජය ගත්තේය.' යැයි හෝ 'ඔහු සත්‍ය පවසා ඇත්නම්, ස්වර්ගයට පිවිසුණහ' යැයි පවසා ඇත්තාහ.[168]

ගැමි අරාබිවරයා අදහස් කළේ: සැබැවින්ම ඔහු නියම කරන ලද සලාතය, අනිවාර්යය කරන ලද සකාතය, රමළාන් උපවාසය, දේව නිවස වෙත හජ් ඉටු කිරීම යනාදියට වඩා අතිරේක කිසිවක් අමතර ව සිදු නොකිරීම යන වගය. ඒ හැර ඉස්ලාමයේ නීති රීති හෝ එහි අනිවාර්යය කටයුතු හෝ වෙනත් දෑ කිසිවක් සිදු නොකරන්නේ යැයි  අදහස් කර නැත.

මෙම හදීසයේ තහනම් දැයින් වැළකී සිටීම ගැන සඳහනක් නැත. ඊට හේතු ව මෙහි විමසා සිටි තැනැත්තා විමසා සිටියේ: තමන් ස්වර්ගයට ඇතුළත් කරන ක්‍රියාවන් පිළිබඳ පමණක් වූ බැවිනි.

මෙම ක්‍රියාවන් ස්වර්ගයට පිවිසීම සඳහා නියම කරනු ලබන සාධක වෙති. ඇතැම් විට තහනම් දෑ සිදු කිරීම එයට බාධාවක් විය හැක. අම්ර් ඉබ්නු අල් ජුහනී විසින් වාර්තා කළ බවට ඉමාම් අහ්මද් විසින් දන්වා සිටි හදීසය එය පෙන්වා දෙයි. එනම්: මිනිසෙකු නබි (ﷺ) තුමාණන් වෙත පැමිණ: 'අල්ලාහ්ගේ දූතයාණනි, අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නොමැති බවත් සැබැවින්ම ඔබ අල්ලාහ්ගේ දූතයාණන් බවත් මම සාක්ෂි දරමි. පස්වාර සලාත් ඉටු කරමි. මාගේ ධනයේ සකාත් ඉටු කරමි. රමළාන් මාසයේ උපවාසය රකිමි. යැයි පැවසීය. එවිට අල්ලාහ්ගේ දූතයාණන්: 'කවරෙකු මෙම තත්ත්වයේ මරණයට පත් වූයේ ද ඔහු නබිවරුන් සත්‍යවාදීන් හා දිවි පිදූවන් සමග වනු ඇත. යැයි පවසා -තම ඇඟිලි දෙක හිටවා තබා- ඔහු තම දෙමව්පියන්ට හිංසා නොකරන තාක්කල්' යැයි පවසා සිටියහ.[169]

168. බුහාරි (46), මුස්ලිම් (11).
169. එය 'අල් මුස්නද්'හි සඳහන් ව තිබෙනු මා දැක නැත.

සලාතය වැනි ඇතැම් ක්‍රියාවන් සිදු කිරීම මත ස්වර්ගයට පිවිසීමේ පිළිවෙළ ද සඳහන් ව පැමිණ ඇත. සහීහ් ගණයේ හදීසයක මෙසේ සඳහන් වෙයි. "සිසිල සහිත අවස්ථා දෙකෙහි සලාතය ඉටු කරන්නා ස්වර්ගය පිවිසීය."[170]

මේ සියල්ලටම අවශ්‍ය හේතුව සඳහන් විය. එහි කොන්දේසි එකතු වීමෙන් හා එහි ප්‍රතිවිරෝධතා නොමැති වීමෙන් මිස ඔහුගේ ක්‍රියාව ක්‍රියාත්මක වන්නේ නැත. බෂීර් ඉබ්නු අල්-හසාසිය්යා විසින් වාර්තා කරනු ලැබූ ඉමාම් අහ්මද් විසින් පළ කර ඇති හදීසය එය පෙන්වා දෙයි. ඔහු: 'මම ප්‍රතිඥා දෙනු පිණිස නබි (ﷺ) තුමාණන් වෙත පැමිණියෙමි. එතුමා: නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නොමැති බවත් සැබැවින්ම මුහම්මද් ඔහුගේ ගැත්තා හා දූතයා බවත් සාක්ෂි දැරීම, මා විසින් සලාතය ඉටු කිරීම, මා විසින් සකාත් නිකුත් කිරීම, මා විසින් ඉස්ලාමයේ වන්දනාවක් වූ හජ් ඉටු කිරීම, මා විසින් රමළාන් මාසයෙහි උපවාසය රැකීම, මා විසින් අල්ලාහ්ගේ මාර්ගයේ කැපවීම යනාදිය කොන්දේසි වශයෙන් පැනවූහ. පසුව මම: අල්ලාහ්ගේ දූතයාණනි, කරුණු දෙකක් වනාහි, අල්ලාහ් මත දිවුරා පවසමි ඒ දෙක ඉටු කිරීමට මාහට ශක්තිය නොමැත. එනම් ජිහාද් හා සදකාව වේ. එවිට අල්ලාහ්ගේ දූතයාණන් ඔහුගේ අතින් අල්ලා පසුව එය සොළවා: 'ජිහාද් (හෙවත් කැපවීම ද) නැත. සදකා (හෙවත් සකාතය) ද නැත. එසේ නම් කවර කරුණක් තුළින් ඔබ ස්වර්ගයට පිවිසෙන්නට බලන්නේ දැයි විමසා සිටියහ. එවිට මම: 'අල්ලාහ්ගේ දූතයාණනි, මම ඔබට ප්‍රතිඥා දෙමි' යැයි පවසා ඒ සියල්ල ඉටු කිරීමට මම ප්‍රතිඥා දුනිමි'[171]

---

මෙම හදීසය ඉබ්නු හිබ්බාන් විසින් (3438) පළ කර ඇති අතර ඉමාම් අල් හය්සමී 'අල් මුජ්මඃ'හිද (1/46) මෙය සඳහන් කර ඇත. හෙතෙම: මෙය අල් බස්සාර් විසින් වාර්තා කර ඇති අතර බස්සාර් හැර එය වාර්තා කළ සෙසු පිරිස සහීහ් ගණයට අයත් වාර්තාකරණයකින් වාර්තා කර ඇති අතර ඔහුගේ වාර්තාකරණය හසන් ගණයට හෝ සහීහ් ගණයට හෝ අයත් වන බව සඳහන් කර ඇත.'

170. බුහාරි (547), මුස්ලිම් (635). සිසිල සහිත අවස්ථා දෙක වනාහි ෆජ්ර් හා අස්ර් සලාත් දෙකය.

171. අහ්මද් (5/224), මුඅස්සර් ඉබ්නු අෆාසා අෂ්ෂෙය්බානී හෙවත් අබුල් මුසන්නා අල් අබ්දී හැර මෙහි සෙසු වාර්තාකරුවන් විශ්වසනීයයන් වෙති. නමත් අල් අජලී තුමා පවසනුයේ ඔහු ද අබ්දුල්ලාහ් වරුන් අතුරින් කෙනෙකු වන බැවින් -එනම් එතුමා මස්ඌද් තුමාගේ පුතෙකි- විශ්වසනීය බවයි. අත්-තක්රීබ් හි අල් හාෆිල් මෙය මක්බූල් ගණයට අයත් හදීසයක් බව අවධාරණය කරයි.

සකාත් හා ජිහාද් නොමැතිව ස්වර්ගයට පිවිසීමට මෙම කරුණු ප්‍රමාණවත් නොවන බව මෙම හදීසයේ සඳහන් වී ඇත.

සැබැවින්ම ඇතැම් මහා පාපකම් සිදු කිරීම ස්වර්ගයට පිවිසීමට බාධාවක් වන බව සහීහ් ගණයට අයත් හදීස්වල සඳහන් වී ඇත. “ඥාති සම්බන්ධකම් බිඳ දමන්නා ස්වර්ගයට පිවිසෙන්නේ නැත.”,[172] “කවරෙකුගේ සිත තුළ අනුවක තරම් අහංකාරකම ඇත්තේ ද ඔහු ස්වර්ගයට පිවිසෙන්නේ නැත.”[173] යනා දී නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය එයට උදාහරණ වේ.

‘සැබැවින්ම මිනිසා ඔහු මෙලොව සිදු කළ පාපය හේතුවෙන් වසර සියයක් ස්වර්ගයේ දොරටු ව අසළ රඳවා තබනු ලැබේ.’ යැයි මුල් කාලීන විද්වතෙකු පවසා ඇත.

මේ සියල්ල වළක්වනු ලබන බාධක වෙති.

මෙහි දී ස්වර්ගයට ඇතුළු වීමේ අනුපිළිවෙලට පැමිණි හදීසවල අර්ථය හුදෙක්ම ඒක දේවත්වය ලෙස පෙනේ. මෙම අර්ථයෙන් යුතු හදීස් බොහෝමයක් ඇත. විද්වතුන් පිරිසක්: ‘සැබැවින්ම ඒකදේවත්වයේ ප්‍රකාශය ස්වර්ගයට පිවිසීමටත් නිරා ගින්නෙන් මිදීමටත් අවශ්‍ය සාධකයක් වුව ද ඒ සඳහා ‘ෆරාඉල්’ හෙවත් අනිවාර්ය කටයුතු ඉටු කිරීමේ කොන්දේසිය මත හා මවානිඃ හෙවත් මහා පාපයන් සිදු කිරීමෙන් වැළකී සිටීමේ බාධකය මත පිහිටිය යුතුව ඇත’ යැයි පවසා සිටියි.

හසන් තුමා පවසා සිටිනුයේ: මෙය මුදුන් කණුවයි. එසේ නම් තුනුබ් (හෙවත් මුදුන් කණුව සමග සම්බන්ධ කරන අමුද්‍රව්‍ය) කොහෙදැ?යි විමසීය. ඉන් අදහස් කරනුයේ: සැබැවින්ම ඒකදේවත්වයේ ප්‍රකාශය කූඩාරමේ මුදුන් කණුව බවයි. නමුත් කූඩාරම සෙසු අමුද්‍රව්‍ය රහිතව රැඳෙන්නේ නැත. එය අනිවාර්යය කටයුතු සිදු කිරීම හා තහනම් කරන ලද දෑ අතහැර දැමීම වන්නේය.

---

මා පවසනුයේ: මෙම හදීසය වාර්තාකරණයෙන් යහපත් හදීසයක් බවයි. මැනවින් දන්නා අල්ලාහ්ය.

172. බුහාරි (5984), මුස්ලිම් (2556)

173. මුස්ලිම් (91)

ලව්හබ් ඉබ්නු මුනබ්බිහ්ගෙන්: 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' ස්වර්ගයේ යතුර නොවේ දැ?'යි විමසන ලදී. ඔහු: 'එසේය, නමුත් දැති වලින් තොර යතුරක් නැත. දැති සහිත යතුරක් ඔබ ගෙන ආවේ නම් ඔබට විවෘත කරනු ලැබේ. එසේ නොවන්නේ නම් ඔබට විවෘත කරනු නොලැබේ.' යැයි පැවසීය.

තවත් පිරිසක්: 'මෙය 'ෆරාඉල්' හෙවත් අනිවාර්යය කටයුතු නියම කිරීමට හා 'හුදූද්' හෙවත් සීමාවන් පැනවීමට පෙර තිබූ තත්ත්වය වේ' යැයි පවසා සිටියි. අස්-සව්රී තුමා: 'ෆරාඉල්' හා 'හුදූද්' එය වෙනස් කළේය' යැයි පවසයි.

තවත් පිරිසක්: මෙම වදන් පෙළ බලපෑම් ඇති කරන්නක් ලෙස පැමිණ ඇත්තේ එය සැබෑ ලෙසින් හා අවංක ලෙසින් පවසන්නෙකුහටය. එහි අවංකභාවය පාපකම් මත පිහිටීම තහනම් කරයි. හසන් ගණයේ වාර්තාකරණයන් සිදු කළ වාර්තාකරුවන් විසින් පළ කර ඇති හදීසය මෙසේය. නබි (ﷺ) තුමා: කවරෙකු 'ලා ඉලාහ ඉල්ලල්ලාහු' යැයි අවංක ලෙසින් පවසා සිටියේ ද ඔහු ස්වර්ගයට පිවිසෙනු ඇත. යැයි පවසා සිටියහ. 'එහි අවංකත්වය කුමක් දැ?'යි එතුමාගෙන් විමසන ලදී. එතුමා: 'අල්ලාහ් තහනම් කළ දැයින් ඔබව එය වැළැක්වීමය' යැයි පැවසීය. මෙය වෙනත් වාර්තාකරණයන් ඔස්සේ ද පළ වී ඇති නමුත් එම වාර්තා ව්‍යූහයන් දුර්වලය.

'කවරෙකු හදවතට එකඟව 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යනුවෙන් සාක්ෂි දැරුවේ ද අල්ලාහ් ඔහුට නිරා ගින්න තහනම් කළේය'[174] යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය පැහැදිලි කරමින් පැමිණ ඇත. එනම්: මෙම ප්‍රකාශයට අදාළ උදවිය අතුරින් නිරා ගින්නට පිවිසෙන්නන් එසේ පිවිසෙනුයේ එම ප්‍රකාශයේ සත්‍යභාවයේ ඇති අඩුවක් හේතුවෙනි. එම ප්‍රකාශය සැබෑ ලෙස පිළිපදිනු ලැබූ විට අල්ලාහ් හැර සෙසු සියලු දැයින් සිත පිරිසිදු වන්නේය. 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යන ප්‍රකාශය සම්බන්ධයෙන් සැබෑ ලෙස කටයුතු කරන්නා ඒ හැර වෙනත් කිසිවක් ප්‍රිය නොකරයි. ඒ හැර වෙන කිසිවක් අපේක්ෂා නොකරයි. අල්ලාහ්ට හැර වෙනත් කිසිවකුට බිය නොවෙයි. අල්ලාහ් මත හැර වෙනත් කිසිවෙකු මත විශ්වාසය නොතබයි. ආත්මයේ බලපෑම හෝ එහි ආශාවන් කිසිවක් ඔහුට ඉතිරි වන්නේ නැත. අල්ලාහ් හැර

174. බුහාරි (128), මුස්ලිම් (132)

වෙනත් බලපෑමක් එම සිතෙහි ඉතිරි වූයේ නම් එය එම ප්‍රකාශයේ සත්‍යභාවයේ පවතින අඩුපාඩුවකි.

මෙම අර්ථයට සාක්ෂියක් ලෙස නබි (ﷺ) තුමාණන් කළ ප්‍රකාශයක් මුආද් තුමා විසින් මෙසේ වාර්තා කර ඇත. එතුමාණන්: කවරෙකුගේ මෙලොව තෙපලන ප්‍රකාශයේ අවසන් ප්‍රකාශය ‘ලා ඉලාහ ඉල්ලල්ලාහ්’ වන්නේ ද ඔහු ස්වර්ගයට පිවිසෙයි.[175] අවංක භාවය, පශ්චාත්තාපය, සිදු වුණු දෑ පිළිබඳ පසුතැවිල්ල නැවතත් එවන් දෙයක් වෙත යොමු නොවන බවට වූ ස්ථාවරත්වය යනාදියෙන් තොරව මරණය ළඟා වූ තැනැත්තා එම ප්‍රකාශය පවසන්නට බලන්නේ නැත.

175. අහ්මද් (5/233), අබූ දාවූද් (3116). අල් අල්බානී තුමා ‘සහීහ් අල් ජාමිඃ’හි (6479) මෙය සහීහ් ගණයට අයත් හදීසයක් බව සඳහන් කර ඇත.

## الحَدِيْثُ الثَّالِثُ والعِشْرُونَ

## විසි තුන් වන හදීසය

عَنْ أَبِي مَالِكٍ الْأَشْعَرِيِّ رَضِيَ اللهُ عَنْهُ قَالَ: قَالَ رَسُولُ اللهِ ﷺ:

«الطُّهُورُ شَطْرُ الْإِيمَانِ، وَالْحَمْدُ لِلهِ تَمْلَأُ الْمِيزَانَ، وَسُبْحَانَ اللهِ، وَالْحَمْدُ لِلهِ تَمْلَآنِ أَوْ تَمْلَأُ مَا بَيْنَ السَّمَاوَاتِ وَالْأَرْضِ، وَالصَّلَاةُ نُورٌ، وَالصَّدَقَةُ بُرْهَانٌ، وَالصَّبْرُ ضِيَاءٌ، وَالْقُرْآنُ حُجَّةٌ لَكَ أَوْ عَلَيْكَ، كُلُّ النَّاسِ يَغْدُو، فَبَائِعٌ نَفْسَهُ، فَمُعْتِقُهَا أَوْ مُوبِقُهَا»

رَوَاهُ مُسْلِمٌ.

අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බව අබූ මාලික් අල්-අෂ්අරී (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

“පිරිසිදුකම ඊමාන් -දේව විශ්වාසයෙ-හි අඩකි. අල් හම්දු ලිල්ලාහ් -සියලු පැසසුම් අල්ලාහ්ටය යන ප්‍රකාශය- තුලාව පුරවා දමයි. සුබ්හානල්ලාහ් -අල්ලාහ් අති පිවිතුරුය- අල්හම්දු ලිල්ලාහ්- සියලු පැසසුම් අල්ලාහ්ටය යන ප්‍රකාශ දෙක අහස් හා මහපොළොව අතර ඇති දෑ පුරවා දමයි. සලාතය ආලෝකයයි. දානය දීප්තියයි, ඉවසීම ඇවිලෙන ආලෝකයයි. අල් කුර්ආනය ඔබට පක්ෂව හෝ විපක්ෂව පිහිටන සාධකයයි. සෑම මිනිසෙකුම උදෑසන අවදි වනුයේ තම ආත්මය විකුණන්නෙකු ලෙසය. එය නිදහස් වීමට හෝ විනාශ වී යාමට හේතු වන්නේය.

මෙය ඉමාම් මුස්ලිම් විසින් වාර්තා කර ඇත.

-විග්‍රහය-

“පිරිසිදුකම ඊමාන්-දේව විශ්වාසයෙ-හි අඩකි” යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

මෙහි ඇතැමුන් ‘පිරිසිදුකම’ විග්‍රහ කර ඇත්තේ පාපකම් අතහැර දැමීම යනුවෙනි. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි. “සැබැවින්ම අල්ලාහ් පාපක්ෂමාව අයැද සිටින්නන් ප්‍රිය කරන අතරම පිරිසිදු කර ගන්නන් ද ප්‍රිය කරනු ඇත.” (සූරා අල් බකරා: 222)

බහුතරයක් දරන නිවැරදි ප්‍රකාශය වනුයේ: මෙහි පිරිසිදුකම යන්නෙහි අදහස ‘කිලිටි ජලයෙන් පිරිසිදු කර ගැනීමය. එබැවින් ඉමාම් මුස්ලිම්[176] තුමා ඔහුගේ ප්‍රකාශනයේ වුළු පාඩමේ ආරම්භයේම මෙය ගෙනැවිත් ඇත. එලෙසම අන්නසාඉ, ඉබ්නු මාජා හා වෙනත් ඉමාම්වරු විසින් ද මෙය පළ කර ඇත.

මේ අනුව, ජලයෙන් පිරිසිදු කිරීම දේව විශ්වාසයේ අඩකි යන අර්ථයේ ජනයා මතභේද දරති.

මා පවසා සිටිනුයේ: සෑම කරුණකම එයට යටින් පැතිකඩ දෙකක් ඇති බවයි. ඒ දෙකින් එකක් එහි අඩක් වන්නේය. එම පැතිකඩ දෙකෙහි සංඛ්‍යාව සමාන වුව ද දෙකින් එකක් අධික වුව ද එක සමානය. “මා අතර හා මාගේ ගැත්තා අතර සලාතය කොටස් දෙකක් වශයෙන් මම බෙදුවෙමි”[177] යන හදීසය එයට සාධක ලෙස පිහිටා ඇත. ඉන් අදහස් කරනුයේ: සලාතයේ අල් කුර්ආන් පාරායනයයි. එය සූරා අල් ෆාතිහා යැයි විස්තර කර ඇත. එනම්: සැබැවින්ම එය නැමදුම හා අයැදුම සඳහා බෙදා ඇති බව අවධාරණය කර සිටියි. නැමදුම අල්ලාහ් සතු වූවකි. අයැදුම ගැත්තා සතු වූවකි. එහි වචන සමාන ලෙස බෙදී ඇති බව ඉන් අදහස් කරන්නේ නැත.

කත්තාබී තුමා මෙසේ සඳහන් කරයි: “වසරේ අඩක් ගමන් යාමයි. ඉන් අඩක් පදිංචි ව සිටීමයි” යන අරාබි ප්‍රකාශය ද එයට සාක්ෂි දරන්නේය. එනම්: එම කටයුතු දෙකෙහි කාල ප්‍රමාණ දෙක එක සමාන නොවන්නේය. නමුත් ඒ

---

176. ‘සහීහ්’හි කතෘ ඉමාම් මුස්ලිම් ඉබ්නු හජ්ජාජ් තුමා
177. මුස්ලිම් (395)

දෙකෙහි කාල ප්‍රමාණය එකිනෙක වෙනස් ව පැවතුණ ද ඒ දෙක සඳහා කාල දෙකක් බෙදා ඇත්තේය.'' තවත් විග්‍රහයකුගේ ප්‍රකාශය අනුව, 'ඔබ අවදි වූයේ කෙසේදැ?'යි ඔහුගෙන් විමසන ලදී. 'මා වෙත මිනිසුන් අඩක්ම කෝප වූ තත්ත්වයේ මා අවදි වූයෙමි' යැයි පැවසීය. ඔහු ඉන් අදහස් කර සිටියේ: සැබැවින්ම ජනයා ඔහුට පක්ෂව තීරණ කිරීම හා ඔහුට එරෙහිව තීරණ කිරීමෙහි නිරත ව සිටින බවයි. ඔහුට එරෙහිව තීරණය ගැනීම කෝපයයි. ඔහුට පක්ෂව තීරණය ගැනීම ඔහු පිළිබඳ වූ තෘප්තියයි. ඒ දෙකම වෙන් වෙන් වූ කණ්ඩායම් දෙකකි.

කවියෙකු මෙසේ ප්‍රකාශ කර සිටියි:

මා මිය ගිය විට මිනිසුන් කොටස් දෙකක් වෙති. කොටසක් මාගේ මරණයට

දොස් නගති. කොටසක් මා සිදු කළ දෑ සඳහා ප්‍රශංසා කරති.

එහි අදහස ඔවුන් කණ්ඩායම් දෙකකට බෙදී සිටිනු ඇතැයි යන්නයි.

***

''අල් හම්දු ලිල්ලාහ් -සියලු පැසසුම් අල්ලාහ්ටය යන ප්‍රකාශය- තුලාව පුරවා දමයි. සුබ්හානල්ලාහ් -අල්ලාහ් අති පිවිතුරුය- අල්හම්දු ලිල්ලාහ්- සියලු පැසසුම් අල්ලාහ්ටය යන ප්‍රකාශ දෙක අහස් හා මහපොළොව අතර ඇති දෑ පුරවා දමයි.'' යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

මෙය වාර්තාකරු විසින් ඇති වූ සැකයකි.

අන්-නසාඊ සහ ඉබ්නු මාජාහි සඳහන් වාර්තාවක: 'සුබ්හානල්ලාහ්' (අල්ලාහ් සුවිශුද්ධ) යැයි පැවසීමත් 'අල්ලාහු අක්බර්' (අල්ලා අති ශ්‍රේෂ්ඨය) යැයි පැවසීමත් අහස් හා මහපොළොව පුරවා දමන්නකි.'' අල් ෆර්යාබිය්යු තුමා මෙසේ පළ කර ඇත: ''පාඨ දෙකකි. ඒ දෙකින් එකක් කවරෙකු පවසන්නේ ද අර්ෂය හැර වෙන කිසිවක් එයට බාධාවක් නොවනු ඇත. අනෙක අහස් හා මහපොළොව අතර පුරවයි. එනම් 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' (අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නොමැත) යන ප්‍රකාශය හා අල්ලාහ් අක්බර්' (අල්ලාහ් අති ශ්‍රේෂ්ටය) යන ප්‍රකාශයයි.

අති විශිෂ්ට මෙම පාඨ හතරෙහිම මහිමයන් මෙම හදීස්වල ඇතුළත්ව ඇත. එනම්: 'සුබ්හානල්ලාහ්' (අල්ලාහ් සුවිශුද්ධය), 'අල්හම්දු ලිල්ලාහ්' (සියලු ප්‍රශංසා අල්ලාහ්ටය), 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' (නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නැත), 'අල්ලාහු අක්බර්' (අල්ලාහ් අති ශ්‍රේෂ්ටය යන පාඨ හතර වේ.

'අල්හම්දු ලිල්ලාහ්' (සියලු ප්‍රශංසා අල්ලාහ්ටය) යන පාඨය වනාහි: සියලුම හදීස් එය තුළාව පුරවනු ඇතැයි යන්නෙහි ඒකමතිකභාවයක් පෙන්නුම් කරයි. 'සුබ්හානල්ලාහ්' (අල්ලාහ් සුවිශුද්ධය) යන පාඨය වනාහි: මුස්ලිම් හි සඳහන් වාර්තාව අනුව 'සුබ්හානල්ලාහ්' සහ 'අල්හම්දු ලිල්ලාහ්' යන පාඨ දෙක අහස් හා මහපොළොව අතර ඇති දෑ පුරවා දමනු ඇතැයි යනුවෙන් සඳහන් වී ඇත. අහස් හා මහපොළොව අතර පුරවා දමනුයේ මෙම පාඨ දෙකම ද එසේ නැතිනම් එම පාඨ දෙකින් එකක් දැයි යන්න ගැන මෙම හදීසය වාර්තා කරන වාර්තාකරුට සැකයක් මතු වී ඇති බව පෙනේ.

සෑම අවස්ථාවකම, හම්ද් පැවසීමෙන් තොර වුව ද තස්බීහ් පැවසීම උතුම් වන්නේය. අලී තුමා, අබූ හුරෙය්රා තුමා, අබ්දුල්ලාහ් ඉබ්නු උමර් තුමා, බනූ සලීම් ගෝත්‍රයේ මිනිසකු විසින් වාර්තා කළ හදීසයේ පැහැදිලිව මේ ගැන පැමිණ ඇත. එනම්: "තස්බීහ් පැවසීම තුළාවෙන් අඩකි. අල්හම්දු ලිල්ලාහ් එය පුරවනු ඇත."[178]

එයට හේතුව: සැබැවින්ම තහ්මීද් හෙවත් අල්හම්දු ලිල්ලාහි යැයි පවසා අල්ලාහ්ට ප්‍රශංසා කිරීම වනාහි, අල්ලාහ් සතු ප්‍රශංසාවට ලක් විය යුතු සියලුම දෑ තහවුරු කරන්නකි. එහි දී පරිපූර්ණවත් ගුණාංග හා සියලුම කීර්තිමත් ගුණාංග ඇතුළත් වන්නේය. තස්බීහ් හෙවත් සුබ්හානල්ලාහ් යැයි අල්ලාහ්ව පිවිතුරු කිරීම වනාහි: අඩුපාඩු අනතුරු අතපසුවීම් හා මගහැරීම්වලින් අල්ලාහ්ව පිවිතුරු කිරීමකි. තහවුරු කිරීම පූරණවත් භාවයයි. එබැවින් තස්බීහ් පමණක් වෙනමම කියවී පැමිණ නැත. එය පූර්ණවත්භාවය තහවුරු කරන කරුණක් සමග බැඳී පවතී. විටෙක එය 'සුබ්හානල්ලාහි වබිහම්දිහි', 'සුබ්හානල්ලාහි වල් හම්දු ලිල්ලාහි' යනාදී ප්‍රකාශ මෙන් 'හම්ද්' -ප්‍රශංසාව-

178. සෑම රකඅතයකම පාරයනය කරන සූරතුල් ෆාතිහාව 'අල්හම්දු ලිල්ලාහි රබ්බිල් ආලමීන්' යන පාඨයෙන් ආරම්භ වී ඇත්තේ එබැවිනි. එය නොකියවන තැනැත්තාගේ සලාතය වලංගු නොවන්නේය. (අෂ්-ෂෙයික් අබ්දු අසීස් අත්-තරීෆී)

සැමග බැඳී පවතී. තවත් විටෙක 'සුබ්හානල්ලාහිල් අළීම්' (සර්වබලධාරී අල්ලාහ් සුවිශුද්ධය) යන ප්‍රකාශය මෙන් ඔහුගේ මහිමය හා කීර්තිය පෙන්වා දෙන ඔහුගේ නම් අතුරින් කිසියම් විශේෂණ නාමයක් සමග බැඳී පවතී.

සැබැවින්ම අහස් හා මහපොළොව අතර ඇති දෑ පුරවන දෑ වනාහි, එය තස්බීහ් හා තහ්මීද් යන දෙකෙහිම එකතුව යැයි අබූ මාලික්ගේ හදීසය පෙන්වා දෙන්නේ නම් කරුණ ඉතා පැහැදිලිය. ඒ දෙකින් සෑම එකක්ම එය පුරවන බවට අදහස් කරන්නේ නම් තුළාව අහස් හා මහපොළොවෙහි ඇති දෑට වඩා විශාලත්වයෙන් වැඩි වන්නේය. එයට සාධක වශයෙන් සල්මාන් තුමා විසින් වාර්තා කරන ලද සහීහ් හදීසයක් පෙන්වා දිය හැක. සැබැවින්ම එතුමා: "මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ තුලාව තබනු ලැබේ. එහි අහස් හා මහපොළොව කිරණු ලබන විට එය විශාලවත් වන්නේය..." මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයක් ලෙස අල් හාකිම් තුමා පළ කර ඇති අතරම එය සහීහ් යැයි ද පවසා ඇත. නමුත් එය මව්කූෆ් ගණයට අයත් හදීසයක් බව ප්‍රසිද්ධය.[179]

හම්ද් හෙවත් 'අල්හම්දුලිල්ලාහ්' හා තහ්ලීල් හෙවත් 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යන පද දෙක අතරින් කවර පදයක් වඩාත් උතුම් වන්නේ දැයි මතභේදයට ලක්ව ඇත. මෙම මතභේදය ඉබ්නු අබ්දුල් බර් හා වෙනත් අය විසින් ද ගෙන හැර පා ඇත. අන්-නක්ඉය්යු තුමා පවසා සිටිනුයේ: 'එම පද අතරින් ප්‍රශංසාවේ පදය ගුණ කිරීමෙන් අධික බව ඔවුහු අදහස් කරන බවයි. අස්-සව්රී තුමා: 'හම්ද් වැනි පදය මෙන් ගුණ කරනු ලබන වෙනත් පදයක් නැත' යනුවෙන් පවසා ඇත.'

ප්‍රශංසාවේ හම්ද් යනු පදය අල්ලාහ්ගේ පූර්ණවත් සියලුම වර්ගයේ වර්ණනාවන් තහවුරු කිරීම් ඇතුළත් කර ගෙන ඇති අතර එහි තව්හීද් හෙවත් ඒකීයත්වයේ ප්‍රකාශය ද ඇතුළත් වන්නේය.

***

179. අල් හාකිම් (4/586), ඔබ දකින පරිදි කතෘ තුමා ඒ සම්බන්ධයෙන් තීරණය කර ඇත්තේ එලෙසය.

"සලාතය ආලෝකයයි. දානය දීප්තියයි, ඉවසීම ඇවිලෙන ආලෝකය යි" යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

ක්‍රියාවන් අතරින් මෙම ක්‍රියා වර්ග තුන ඒ සියලු දැහි ආලෝකය ලෙස පිහිටයි. නමුත් ඒ අතරත් විශේෂ කොට පවසන ලද ආලෝක වර්ග ද ඇත.

සලාතය පොදු ආලෝකයයි. එය දෙවියන් විශ්වාස කරන්නන්ගේ හදවත් හා දැක්ම තුළ ඔවුනට පවතින ආලෝකයයි. එමගින් දෙවියන් පිළිබඳ භක්තියෙන් පසුවන්නන්ගේ දෑස් පිනවනු ඇත. නබි (ﷺ) තුමාණන් මෙසේ පවසා සිටියහ: 'මාගේ දෑස් පිනවීම සලාතය තුළ පත් කර ඇත' (මෙය අහ්මද් හා අන්-නසාඊ විසින් පළ කර ඇත.[180] එය මුඃමින්වරුන් හට ඔවුන්ගේ මිණීවලෙහි ආලෝකයයි. විශේෂයෙන් රාත්‍රී කාල සාලතයන්. අබූ දර්දා තුමා මෙසේ පවසා ඇත: 'රාත්‍රි අඳුර එය මිනීවලෙහි අන්ධකාරයයි. ඔබ එහි රකආත් දෙකක් සලාතය ඉටු කරන්න.' එය මුඃමින්වරුන්හට මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ හා සිරාත් මත පවතින අන්ධකාරයන්හි ආලෝකය වන්නේය. නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බවට අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් විසින් වාර්තා කළ හදීසයක් 'අල් මුස්නද්' හා 'සහීහ් ඉබ්නු හිබ්බාන්' හි මෙසේ සඳහන්ව ඇත. 'කවරෙකු එය ආරක්ෂා කරන්නේ ද එය ඔහුට මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ආලෝකයක් සාක්ෂියක් මෙන්ම මිදීමක් වන්නේය. කවරෙකු එය ආරක්ෂා නොකළේද ඔහුට ආලෝකයක් හෝ මිදීමක් හෝ සාක්ෂියක් හෝ වන්නේ නැත.[181] [182]

දානය වනාහි: එය දීප්තියයි. එය හිරු මතුපිටින් ඊට පරව පවතින ආලෝක ධාරාවයි. එය යමක් පෙන්වා දීමේදී එහි සාධක පැහැදිළිව පවතින බැවින් එයට පැහැදිළි සාක්ෂිය යැයි ද නම් කෙරී ඇත. එමෙන්ම සඳකාව නොහොත්

180. අහ්මද් (3/128), අෂ්-ෂෙයික් අල් අල්බානී "සහීහ් අල්ජාමිඃ'හි සහීහ් හදීසයක් බව පෙන්වා දී ඇත.

181. අහ්මද් (2/169), ඉබ්නු හිබ්බාන් (1467), ඉමාම් මුන්දිර් තුමා 'අත්-තර්ගීබ් වත් තර්හීබ්'හිද මෙය සඳහන් කර ඇති අතර ඉමාම් අහ්මද් එය අලංකාර වාර්තාකරණයකින් යුතුව වාර්තා කර ඇති බවත් ගරු හදීස්වේදී අබ්දුල් අසීස් ඉබ්නු අබ්දුල්ලාහ් ඉබ්නු බාස් (රහිමහුල්ලාහ්) තුමා එහි වාර්තාකරණය අලංකාර වාර්තාකරණයක් බව පවසනු තමන්ගේ කනට වැකුණු බවත් පවසා සිටියි.

182. සලාතයේ මහිමය එහි වැදගත්කම එය අතහැරීමේ බරපතලකම යනාදිය පැහැදිලි කිරීම් මෙහි ආරම්භයේ ඉදිරිපත් කර ඇත.

දානය දේව විශ්වාසයේ නිරවද්‍යතාව තහවුරු කරන පැහැදිලි ආලෝකයයි. එයට හේතුව සැබැවින්ම ධනය වනාහි: එය තෘෂ්ණාව ප්‍රිය කරයි. එමගින් එය මසුරු වන්නේය. අල්ලාහ් වෙනුවෙන් එය නිකුත් කරන්නට කාරුණික වන විට අල්ලාහ් පිළිබඳත් ඔහුගේ ප්‍රතිඥාව හා අවවාදය පිළිබඳවත් එයට ඇති විශ්වාසයේ නිරවද්‍යතාව පෙන්වා දෙන්නේය.

ඉවසීම වනාහි: සැබැවින්ම එය ඇවිලෙන ආලෝකයයි. ඇවිලෙන ආලෝකය යනු හිරුගේ ආලෝකය මෙන් උෂ්ණත්වයක් හා ඇවිලීමක් ඇති කරන ආලෝක වර්ගයකි. එය සඳුගේ ආලෝකයට හාත්පසින්ම වෙනස්ය. එය ශුද්ධ ආලෝකයයි. එහි ප්‍රභාව මිස ඇවිලීමක් නැත. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. "ඔහු සූර්යයා ආලෝකය ලබා දෙන්නක් වශයෙන් ද චන්ද්‍රයා ආලෝකය විහිදුවන්නක් වශයෙන් ද ඇති කළේය." (සූරා යූනුස්: 5) අල්ලාහ් සූරා අල් මාඉදා 44 වැනි පාඨයේ "සැබැවින්ම අපි තව්රාතය පහළ කළෙමු. එහි යහමග හා ආලෝකය ඇත" යැයි පවසමින් තව්රාතයේ ආලෝකය ඇති බවට සඳහන් කර සිටියදීම සැබැවින්ම මූසා තුමාට හිමි වූ පිළිවෙත 'ළියාඋ' ඇවිලෙන ආලෝකය යනුවෙන් අල්ලාහ් වර්ණනා කොට ඇත. 'සැබැවින්ම අපි මූසාට හා හාරූන්ට (හොඳ නරක වෙන් කරන) නිර්ණායකය ද දැවෙන ආලෝකයක් ද බිය භක්තිකයින් සඳහා උපදේශයක් ද පිරිනැමුවෙමු. (සූරා අල් අන්බියා: 48) ඔවුන්ගේ පිළිවෙත් බොහෝ වේලාවට දුෂ්කර, පීඩන හා බැරෑරුම් බැවින් අල්-ළියාඋ ඇවිලෙන ආලෝකය යනුවෙන් භාවිත කර ඇත. නමුත් මුහම්මද් (ﷺ) ට හිමි වූ පිළිවෙතෙහි අවංක හා ඉවසන සුළු කරුණු ඇතුළත්ව ඇති බැවින් එය වර්ණනා කරනු ලැබුවේ නූර් ආලෝකය ලෙසයි. "...ධර්ම පුස්තකයෙන් නුඹලා සඟවමින් සිටි දෑ අතුරින් බොහෝමයක් නුඹලාට පැහැදිලි කරමින් ද (ඒවායින්) බොහෝමයක් (පැහැදිළි කිරීමෙන් ඔවුන්ට ප්‍රයෝජනයක් නොවන හෙයින්) නොසලකා හරිමින් ද අපගේ රසූල්වරයා නුඹලා වෙත පැමිණ ඇත. සැබැවින්ම අල්ලාහ්ගෙන් නුඹලා වෙත ආලෝකයක් (ලෙස නබිවරයා) හා පැහැදිලි ධර්ම පුස්තකයක් (ලෙස අල් කුර්ආනය) පැමිණ ඇත." (අල් මාඉදා:15)

ඉවසීම ආත්මයට දුෂ්කර කාර්යයක් වූ කල්හි, ආත්මය සමග අරගල කිරීමටත් එය පාලනය කිරීම සඳහා එහි බිහිවන තෘෂ්ණාව මැඩලීමටත් අවශ්‍ය වන්නේය. සැබැවින්ම අස්සබ්ර් හෙවත් ඉවසීම යන පදය භාෂාමය වශයෙන් රඳවා තබා ගැනීම යන අර්ථය ගෙන දෙයි.

පැසසුමට ලක් වූ ඉවසීම වර්ග කිහිපයකි.

1. අල්ලාහ්ට අවනත වීමෙහි ඉවසීම
2. අල්ලාහ්ට පිටුපෑමෙන් දුරස්වීමෙහි ඉවසීම
3. අල්ලාහ්ගේ නියමයන් මත ඉවසීම

අවනත වීමෙහි හා තහනම් දැයින් ඈත්වීමෙහි දරණ ඉවසීම වේදනාසහගත නියමයන් මත ඉවසීමට වඩා උතුම් වන්නේය. මෙය මුල් කාලීනයන් විසින් පැහැදිළි ව සඳහන් කර ඇති අතර ඔවුන් අතරින්: සඊද් ඉබ්නු ජුබෙයිර්, මය්මූනා ඉබ්නු මිහ්රාන් හා තවත් කිහිප දෙනෙකු ද වෙති.

***

"අල් කුර්ආනය ඔබට පක්ෂව හෝ විපක්ෂව පිහිටන සාධකයයි." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

අම්ර් ඉබ්නු ෂුඅය්බ් තුමා තම පියාගෙන් ද පියා තම සීයාගෙන් ද සීයා නබි (ﷺ) තුමාණන්ගෙන් ලබා ගෙන ඇති බව පවසමින් ඔහු විසින් මෙසේ වාර්තා කරන ලදී. එතුමාණන්: මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ මිනිසෙකු වෙසින් කුර්ආනය පෙනී සිට, එය උසුලා පසුව එහි වූ නියෝගයට පිටු පෑ මිනිසෙකු ගෙන එනු ලැබේ. ඔහු වෙනුවෙන් පෙනී සිට එය මෙසේ පවසයි: මාගේ පරමාධිපතියාණනි, ඔබ ඔහුට මා උසුලන්නට සැලැස්වීය. නමුත් ඉසිලූ තැනැත්තා නපුරුය. මාගේ සීමාවන් ඉක්මවා කටයුතු කළේය. මාගේ අනිවාර්යය කටයුතු නොසලකා හැරියේය. මා මත ඇති පාපයන් මත නැග ගියේය. මට අවනත වීම අතහැර දැමුවේය. යැයි පවසයි. එසේ ඔහු ඔහුට එරෙහිව සාක්ෂි ඉදිරිපත් කර අවලාද නගමින්ම සිටියි. අවසානයේ: ඔහු පිළිබඳ කටයුතු ඔබ සතුය' යැයි පවසනු ලැබේ. පසුව ඔහුගේ අතින් අල්ලාහ් නිරා ගින්නේ මුණින් අතට හෙළන තෙක් ඔහු ඔහුව නැවත එවන්නේ නැත. පසුව දැහැමි මිනිසෙකුට එය පිරිනමනු ලැබේ. ඔහු එය උසුලා ආරක්ෂා කරයි. ඔහුට යටහත්ව එය වාද කරන්නෙකු ලෙස පෙනී සිට මෙසේ පවසයි: මාගේ පරමාධිපතියාණනි, ඔබ ඔහුට මා උසුලන්නට සැලැස්වීය. ඉසිලූ ඔහු ඉතා යහපත්ය. මාගේ සීමාවන් ආරක්ෂා කළේය. මාගේ අනිවාර්යය කටයුතු ඉටු කළේය. මා මත ඇති පාපකම්වලින් වැළකී සිටියේය. මට අවනත වෙමින් පිළිපැද්දේය යැයි පවසයි. මෙසේ ඔහු වෙනුවෙන් පක්ෂව සාක්ෂි ඉදිරිපත්

කරමින්ම සිටියි. අවසානයේ ඔහු පිළිබඳ කටයුතු ඔබ සතුය' යැයි පවසනු ලැබේ. පසුව එය ඔහුගේ අතින් අල්ලා ඉස්තබ්රක් නොහොත් වටිනා සේද රෙදි අන්දා ඔහුට රජ කිරුළු පළන්දවා අමෘත පානයෙන් ඔහුට පොවන තෙක් එය ඔහු අතහරින්නේ නැත.[183]

"සෑම මිනිසෙකුම උදෑසන අවදි වනුයේ තම ආත්මය විකුණන්නෙකු ලෙසය. එය නිදහස් වීමට හෝ විනාශ වී යාමට හේතු වන්නේය." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

සැබැවින්ම සෑම මිනිසෙකුම තමන් ව විනාශ කර ගැනීමට හෝ එය සතුටින් තබා ගැනීමට හෝ උත්සාහ දරයි. එහෙයින් කවරෙකු අල්ලාහ්ට අවනත වීමෙහි තමන් කැප කරන්නේ ද සැබැවින්ම ඔහු ඔහුගේ ආත්මය අල්ලාහ් වෙනුවෙන් විකුණා දැමීය. ඔහුගේ දඬුවමින් එය ආරක්ෂා කර ගත්තේය. එමෙන්ම කවරෙකු අල්ලාහ්ට පිටුපෑමෙහි තමන් කැප කරන්නේ ද ඔහු ඔහුගේ ආත්මය අල්ප ආශාවන්ට විකුණා දැමීය. අල්ලාහ්ගේ කෝපය හා ඔහුගේ දඬුවම අනිවාර්යය කරන පාපකම් තුළින් එය ඔහු විනාශ කර දැමීය. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. "මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අල් කුර්ආනය මිනිසෙකු වෙනුවෙන් පෙනී සිටී. සැබැවින්ම අල්ලාහ් විශ්වාසිකයින් අතුරින් ඔවුන්ගේ ප්‍රාණයන් ද ඔවුන්ගේ ධනය ද ඔවුන් සඳහා ස්වර්ගය වෙනුවට මිලට ගත්තේය. ඔවුහු අල්ලාහ්ගේ මාර්ගයෙහි යුද වදිති. එවිට ඔවුහු ඝාතනය කරති. ඔවුහු ඝාතනයට ද ලක් වෙති. (මෙය) තව්රාත්හි ද ඉන්ජීල්හි ද අල් කුර්ආනයෙහි ද ඔහු(අල්ලාහ්) කෙරෙහි (පවරා ගත්) සැබෑ ප්‍රතිඥාවක් වශයෙනි. තවද අල්ලාහ්ට වඩා තම ගිවිසුම මැනවින් ඉටු කරන්නා කවරෙකු ද? එබැවින් නුඹලා (අල්ලාහ් සමග) ගිවිස ගත් නුඹලාගේ ව්‍යාපාරය පිළිබඳව නුඹලා සතුටු වවු. මහත් වූ ජයග්‍රහණය එයමය. (සූරා අත් තව්බා: 111)

සැබැවින්ම මුල්කාලීනයන්ගෙන් ඇතැමෙකු ඔවුන්ගේ ධනසම්පත්වලින් ඔවුන්ගේ ආත්මය අල්ලාහ්ගෙන් මිලට ගත්තෝය. ඔවුන් අතුරින් හබීබ් අබී මුහම්මද් වැනි තම ධනය මුළුමණින්ම දන් දුන් ඇතැමෙකු ද විය. එමෙන්ම කාලිද් අත්-තහාන් වැනි තුන් හතර වතාවක් එහි වටිනාකමට රිදී දන් දුන්

183. ඉබ්නු අබූ ෂය්බා (10/491), එම වාර්තා කරණය දුර්වලය.

ඇතැමෙකු ද විය. එමෙන්ම දැහැමි ක්‍රියාවන්හි වෙහෙසව කටයුතු කරන්නෙකු ද විය. ඔහු මෙසේ පැවසීය: සැබැවින්ම මම හිරකරුවෙකි. මාගේ වහල්භාවයෙන් නිදහස් වීමෙහි මා කැපවී කටයුතු කරමි. ඔවුන් අතුරින් අම්ර් ඉබ්නු උත්බාද අයෙකි. ඔවුන්ගෙන් ඇතැමෙක් ප්‍රාණ වන්දියක ප්‍රමාණයට සෑම දිනකම දොළොස් දහසක් පමණ තස්බීහ් පවසන්නන්ද විය. එය ඔහු තම ආත්මය මරා දමා, එහි වන්දිය වශයෙන් එය ගෙවන්නෙකු මෙන් තිබිණ.

හසන් තුමා මෙසේ පැවසීය: ‘මුඃමින්වරයා මෙලොවෙහි සිරකරුවෙකු මෙනි. තම වහල්භාවයෙන් නිදහස්වීමෙහි කැපවෙයි. ඔහු අල්ලාහ් හමුවන තෙක් කිසිවකුට බිය වන්නේ නැත.

***

## الحَدِيْثُ الرَّابِعُ والعِشْرُونَ

## විසි හතර වන හදීසය

عَنْ أَبِي ذَرٍّ رَضِيَ اللهُ عَنْهُ ، عَنِ النَّبِيِّ ﷺ فِيمَا يَرْوِي عَنْ رَبِّهِ عَزَّ وَجَلَّ أَنَّهُ قَالَ :

"يَا عِبَادِي إِنِّي حَرَّمْتُ الظُّلْمَ عَلَى نَفْسِي وَجَعَلْتُهُ بَيْنَكُمْ مُحَرَّمًا فَلَا تَظَالَمُوا، يَا عِبَادِي كُلُّكُمْ ضَالٌّ إِلَّا مَنْ هَدَيْتُهُ فَاسْتَهْدُونِي أَهْدِكُمْ، يَا عِبَادِي كُلُّكُمْ جَائِعٌ إِلَّا مَنْ أَطْعَمْتُهُ فَاسْتَطْعِمُونِي أُطْعِمْكُمْ، يَا عِبَادِي كُلُّكُمْ عَارٍ إِلَّا مَنْ كَسَوْتُهُ فَاسْتَكْسُونِي أَكْسُكُمْ، يَا عِبَادِي إِنَّكُمْ تُخْطِئُونَ بِاللَّيْلِ وَالنَّهَارِ وَأَنَا أَغْفِرُ لَكُمْ ذُنُوبَكُمْ جَمِيعًا فَاسْتَغْفِرُونِي أَغْفِرْ لَكُمْ، يَا عِبَادِي إِنَّكُمْ لَنْ تَبْلُغُوا ضَرِّي فَتَضُرُّونِي وَلَنْ تَبْلُغُوا نَفْعِي فَتَنْفَعُونِي.

يَا عِبَادِي لَوْ أَنَّ أَوَّلَكُمْ وَآخِرَكُمْ وَإِنْسَكُمْ وَجِنَّكُمْ كَانُوا عَلَى أَتْقَى قَلْبِ رَجُلٍ وَاحِدٍ مِنْكُمْ مَا زَادَ ذَلِكَ فِي مُلْكِي شَيْئًا، يَا عِبَادِي لَوْ أَنَّ أَوَّلَكُمْ وَآخِرَكُمْ وَإِنْسَكُمْ وَجِنَّكُمْ كَانُوا عَلَى أَفْجَرِ قَلْبِ رَجُلٍ وَاحِدٍ مِنْكُمْ مَا نَقَصَ ذَلِكَ مِنْ مُلْكِي شَيْئًا.

يَا عِبَادِي لَوْ أَنَّ أَوَّلَكُمْ وَآخِرَكُمْ وَإِنْسَكُمْ وَجِنَّكُمْ قَامُوا فِي صَعِيدٍ وَاحِدٍ فَسَأَلُونِي فَأَعْطَيْتُ كُلَّ إِنْسَانٍ مِنْهُمْ مَسْأَلَتَهُ مَا نَقَصَ ذَلِكَ عِنْدِي إِلَّا كَمَا يَنْقُصُ الْمِخْيَطُ إِذَا دَخَلَ الْبَحْرَ.

يَا عِبَادِي إِنَّمَا هِيَ أَعْمَالُكُمْ : أُحْصِيهَا لَكُمْ ثُمَّ أُوَفِّيكُمْ إِيَّاهَا ، فَمَنْ وَجَدَ خَيْرًا فَلْيَحْمَدِ اللهَ. وَمَنْ وَجَدَ غَيْرَ ذَلِكَ فَلَا يَلُومَنَّ إِلَّا نَفْسَهُ."

رَوَاهُ مُسْلِمٌ.

නබි (ﷺ) තුමාණන් තම පරමාධිපති පිළිබඳ දන්වා සිටියදී එතුමාණන් මෙසේ ප්‍රකාශ කළ බව අබූ දර් විසින් වාර්තා කරන ලදී:

“මාගේ ගැත්තනි, අසාධාරණය (අපරාධය) මම මා මතම තහනම් කර ගත්තෙමි. ඔබ අතරත් එය මා තහනම් කරනු

ලැබුවක් බවට පත් කළෙමි. එබැවින් නුඹලා එකිනෙකාට අසාධාරණකම් නොකරන්න.

මාගේ ගැත්තනි, මා කවරෙකුහට මඟ පෙන්වූයේ ද එවැන්නෙකු හැර සෙසු නුඹලා සියලු දෙනා නොමඟ ගියවුන් වෙති. එබැවින් නුඹලා මගෙන් යහමඟ පතනු. මම නුඹලාට මඟ පෙන්වමි. මාගේ ගැත්තනි, මා කවරෙකුහට පෝෂණය කළේ ද එවැන්නෙකු හැර සෙසු නුඹලා සියලු දෙනාම සාගින්නෙන් පෙළෙන්නන් වෙති. එබැවින්ම නුඹලා මගෙන් පෝෂණය පතනු. මම නුඹලාට පෝෂණය ලබා දෙමි. මාගේ ගැත්තනි, මා කවරෙකුහට අඳින්නට සැළැස්සුවේ ද එවැන්නෙකු හැර සෙසු නුඹලා සියලු දෙනා නිරුවත් අය වෙති. එබැවින් නුඹලා මගෙන් අඳින්නට පතනු. මම නුඹලාට අඳින්නට සළසමි.

සැබැවින්ම නුඹලා රාත්‍රියේ හා දහවලේ වැරදි කරන්නෙහුය. මම සියලු පාපයන්ට සමාව දෙන්නෙක්මි. එබැවින් නුඹලා මගෙන් සමාව අයැදිනු. මම නුඹලාට සමාව දෙමි. නුඹලා මට හානියක් කරන තරමට මට හානි කිරීමට නුඹලාට නොහැක්කේමය. එමෙන්ම මට ප්‍රයෝජනයක් කරන තරමට නුඹලා මට ප්‍රයෝජනයක් කළ නොහැක්කේමය.

මාගේ ගැත්තනි, නුඹලාගේ පළමුවැන්නා නුඹලාගේ අන්තිමයා නුඹලාගේ මනුෂ්‍ය වර්ගයා සහ නුඹලාගේ ජින්වර්ගයා කිසියම් මිනිසෙකුගේ ධාර්මික හදවත තරම් වඩාත් බැතිමත් වූයේ නම් එය කිසිසේත් මාගේ ආධිපත්‍යය වැඩි නොකරනු ඇත. එමෙන්ම මාගේ ගැත්තනි, නුඹලාගේ පළමුවැන්නා, නුඹලාගේ අන්තිමයා, නුඹලාගේ මනුෂ්‍ය වර්ගයා සහ නුඹලාගේ ජින්වර්ගයා කිසියම් මිනිසෙකුගේ දුෂ්ට හදවත තරම් දුෂ්ට වූයේ නම්,

එය කිසිම දෙයකින් මාගේ ආධිපත්‍යය අඩු නොකරනු ඇත.

මාගේ ගැත්තනි, නුඹලාගේ පළමුවැන්නා, නුඹලාගේ අන්තිමයා, නුඹලාගේ මනුෂ්‍ය වර්ගයා සහ නුඹලාගේ ජින්වර්ගයා එක් තැනක සිට මාගෙන් ඉල්ලීමක් කරන්නේ නම් (එසේ ඉල්ලන) සෑම මිනිසෙකුටම ඔහු ඉල්ලන දෑ මම පිරිනමමි. ඉඳිකටුවක් මුහුදට දමනු ලැබූ විට එය (එහි ජලය) අඩු නොකරන පරිදි මා සතුව ඇති දෑද එය අඩු කරන්නේ නැත.

මාගේ ගැත්තනි, සැබැවින්ම නුඹලාගේ ක්‍රියාවන් වූ කල්හි, ඒවා මම නුඹලා වෙනුවෙන් සටහන් කර තබා ඇත්තෙමි. පසුව නුඹලාට මා ගෙවනුයේ ඒවාට පමණි. එබැවින් කවරෙකු යහපත සොයා ගත්තේ ද ඔහු අල්ලාහ්ට ප්‍රශංසා කළ යුතුයි. ඒ හැර වෙනත් දෙයක් ලැබුවේ ද ඔහු ඔහුටම මිස (අල්ලාහ්ට) දොස් නොපැවරිය යුතුයි.

මෙම හදීසය මුස්ලිම් විසින් වාර්තා කොට ඇත.

***

-විග්‍රහය-

මෙම හදීසය ඉමාම් මුස්ලිම් විසින් පළ කර ඇති අතර ඉමාම් අහ්මද්: ‘සිරියා වැසියන් සඳහා වඩාත් විශිෂ්ඨ හදීසක්’ බව පවසා සිටියි.

***

තම පරමාධිපතිගේ පිළිබඳ දන්වා සිටියදී “මාගේ ගැත්තනි, අසාධාරණය (අපරාධය) මම මා මතම තහනම් කර ගත්තෙමි.” යනුවෙන් නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

ඉන් අදහස් කෙරෙනුයේ: තම ගැත්තන්හට අපරාධ කිරීම ඔහු ඔහුටම තහනම් කර ගත් බවයි. සැබැවින්ම අල්ලාහ් අපරාධ කිරීමට බලය ඇති නමුත් ඉන් යමක් දුටු වහාම එය ක්‍රියාත්මක නොකරන බව පෙන්වා දෙයි.[184]

***

"ඔබ අතරත් එය මා තහනම් කරනු ලැබූවක් බවට පත් කළෙමි. එබැවින් නුඹලා එකිනෙකාට අපරාධ නොකරන්න" යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

අපරාධය වර්ග දෙකකි.

පළමුවැන්න: තමන්ටම කර ගන්නා අපරාධයයි. එයින් වඩාත් බරපතල වනුයේ අල්ලාහ්ට ආදේශ තැබීමය. ඊට පරව මහා හා සුළු වශයෙන් ඒ හා සමාන වෙනත් විවිධ වර්ගයේ පාපකම්ය.

දෙවැන්න: තමන්ට නොව වෙනකෙකුට කරන අපරාධයයි. මෙම හදීසයේ සඳහන් වනුයේ එයයි.

නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බවට ඉබ්නු උමර් තුමා විසින් වාර්තා කරන ලද හදීසයක් බුහාරි හා මුස්ලිම් හි මෙසේ සඳහන් වී ඇත. එතුමාණන්: "අපරාධය යනු මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ සිදුවන අපරාධ වේ."[185] නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බව අබූ හුරෙය්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලද තවත් හදීසයක් 'සහීහ් අල් බුහාරි' හි මෙසේ සඳහන් වේ: තම සහෝදරයාට කළ අපරාධයක් කවරෙකු සතු ව ඇත්තේ ද එයින් ඔහුව මිදිය යුතුයි. එය හුදු දීනාරයක් හෝ දිර්හමයක් හෝ නොවේ. එය ඔහුගේ යහපත් කුසල් අතරින් ගනු ලබන්නට පෙර විය යුතුය. ඔහුට යහකම්

184. අල්ලාහ්ගේ යුක්තිය හා උපකාරයේ පූර්ණත්වය හේතුවෙන් ඔහුගෙන් එය සිදුවන ආකාරය පිළිබඳ ස්වරූපයෙන් තොරය. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්තරීෆී)

185. බුහාරි (2447), මුස්ලිම් (2579).

නොමැති වූයේ නම් තම සහෝදරයාගේ අයහකම් ගෙනු ලැබ, ඔහු මත එය හෙළනු ලැබේ.[186]

***

"මාගේ ගැත්තනි, මා කවරෙකුහට මඟ පෙන්වූයේ ද එවැන්නෙකු හැර සෙසු නුඹලා සියලු දෙනා නොමඟ ගියවුන් වෙති. එබැවින් නුඹලා මගෙන් යහමඟ පතනු. මම නුඹලාට මඟ පෙන්වමි. මාගේ ගැත්තනි, මා කවරෙකුහට පෝෂණය කළේ ද එවැන්නෙකු හැර සෙසු නුඹලා සියලු දෙනාම සාගින්නෙන් පෙළෙන්නන් වෙති. එබැවින්ම නුඹලා මගෙන් පෝෂණය පතනු. මම නුඹලාට පෝෂණය ලබා දෙමි. මාගේ ගැත්තනි, මා කවරෙකුහට අඳින්නට සැළැස්සුවේ ද එවැන්නෙකු හැර සෙසු නුඹලා සියලු දෙනා නිරුවත් අය වෙති. එබැවින් නුඹලා මගෙන් අඳින්නට පතනු. මම නුඹලාට අඳින්නට සළසමි. සැබැවින්ම නුඹලා රාත්‍රියේ හා දහවලේ වැරදි කරන්නෙහුය. මම සියලු පාපයන්ට සමාව දෙන්නෙක්මි. එබැවින් නුඹලා මගෙන් සමාව අයැදිනු. මම නුඹලාට සමාව දෙමි." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

සැබැවින්ම සියලු මැවීම් තමන්ගේ ආගමික කටයුතුවලදී මෙන්ම මෙලොව කටයුතුවලදී ද තමන්හට යහපත සලසා ගැනීමටත් තමන්ට අත්වන පීඩා වළක්වා ගැනීමටත් උත්තරීතර අල්ලාහ් වෙත නැඹුරු වීමේ අවශ්‍යතාව ඇත්තන් බවත් සැබැවින්ම ඒ සියලු දැයින් කිසිවකුත් ගැත්තන්හට සතු නොවන බවත් මෙය අවධාරණය කරයි. "අල්ලාහ් කවරෙකුට යහමග පෙන්වූයේ ද ඔහු යහමග ලැබූවෙකි. තවද ඔහු කවරෙකු නොමග යන්නට ඉඩ හැරියේ ද එවිට ඔහුට මග පෙන්වන උදව්කරුවෙකු නුඹ නොලබන්නේමය." (සූරා අල් කහ්ෆ්: 17)

ගැත්තන් අල්ලාහ්ගෙන් යහමග හා සමාව ඉල්ලා සිටිනවාක් මෙන්ම ආගමික කයටුතුවලදී සියලු යහපත ද ආහාර පාන, ඇඳුම් පැළඳුම් හා වෙනත් ලෞකික කටයුතුවල දී සියලු යහපත ද අල්ලාහ්ගෙන් ඉල්ලා සිටීම ඔහු ප්‍රිය කරන බව මෙම හදීසය පෙන්වා දෙයි.

186. බුහාරි (2449)

තවත් හදීසයක "නුඹලා අතර කිසිවකු හෝ වේවා, තම පාවහනේ පටිය කැඩී ගියත් එවන් සියලු අවශ්‍යතා තම පරමාධිපතිගෙන් ඉල්ලා සිටිය යුතුය."[187] යනුවෙන් සඳහන් වී ඇත.

මුල් කාලීන ඇතැම් විද්වතුන් තම අවශ්‍යතාව අනන පිටිවල හා එළු ව්‍යාංජනයේ ලුනුවල පිහිටා තිබුණ ද එය පවා ඉල්ලා සිටින තරමට තම අවශ්‍යතා සියල්ල අල්ලාහ්ගෙන් ඉල්ලා සිට ඇත. ඒ අනුව ගැත්තා තම සියලු අවශ්‍ය අල්ලාහ්ගෙන් ඉල්ලා සිටින විට ඔහුගේ අවශ්‍යතා හා ඔහුගේ බැගෑපත්කම අල්ලාහ් වෙත හෙළි කරයි. එය අල්ලාහ් ප්‍රිය කරන්නේය.

එමෙන්ම මුල් කාලීන ඇතැම් විද්වතුන් මෙලොව යහපතින් යමක් අල්ලාහ්ගෙන් ඉල්ලා සිටීමට ලැජ්ජා වී ඇත. වඩාත් යෝග්‍යය වන්නේ සුන්නාව පිළිපැදීමයි.[188]

***

"මා කවරෙකුහට මඟ පෙන්වූයේ ද එවැන්නෙකු හැර සෙසු නුඹලා සියලු දෙනා නොමඟ ගියවුන් වෙති" යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

කීර්තිමත් අල්ලාහ්: "මම මාගේ ගැත්තන් අවංකයින් ලෙස මවා ඇත්තෙමි. (තවත් වාර්තාවක -මට අවනත වන- මුස්ලිම්වරුන් ලෙස මවා ඇත්තෙමි.) නමුත් ෂෙයිතානුන් (නපුරු බලවේගයන්) ඔවුන් ඉබාගාතේ යන්නට සැළැස්වීය"[189] යනුවෙන් නබි (ﷺ) තුමාණන් විසින් කළ ප්‍රකාශයක් ඉයාල් ඉබ්නු හිමාර් විසින් දන්වා ඇති අතර මෙම ප්‍රකාශය මෙම හදීසයට ප්‍රතිවිරුද්ධ ලෙස පිහිටා ඇති බව ඇතැමුන් අනුමාන කරති. එය එලෙස නොවේ. සැබැවින්ම අල්ලාහ් මිනිසා මැව්වේය. ඉස්ලාමය පිළිගැනීම, වෙනත්

187. ඇතැම් පිටපත්වල සඳහන් පරිදි එය තිර්මිදි විසින් පළ කර ඇත. වැඩි විස්තර සඳහා 'සිල්සිලතුල් ආහාදීස් අල් ළඊෆා' (1392) බලන්න. 'සවාඉද් අල් බස්සාර්'හි (පිටු අංක 305) අල් හාෆිල් ඉබ්නු හජර් තුමා මෙය හසන් ගණයට අයත් හදීසයක් බව සඳහන් කර ඇති බව අෂ්-ෂෙයික් අල් අල්බානී තුමා සඳහන් කර ඇත.

188. අල්ලාහ්ගෙන් අයැද සිටින මුඃමින්වරුන් අල්ලාහ්ගේ පැසසුමට ලක් වනු ඇතැයි සූරා අල්බකරාහි 201 වැනි පාඨය පෙන්වා දෙයි. එනම්: "අපගේ පරමාධිපතියාණනි, මෙලොවෙහි යහපතත් මතුලොවෙහි යහපතත් අපට පිරිනමනු මැනව! තවද නිරා ගින්නේ දඬුවමින් අප ආරක්ෂා කරනු මැනව!"

189. මෙය මුස්ලිම් විසින් පළ කළ හදීසයකි (2865)

දෙයකට නොව ඔහු වෙත පමණක් නැඹුරු වීම ඒ සඳහා සැළසුම් කිරීම ඒ සඳහා ඉතා බලවත් ලෙස සූදානම් වීම යනාදී සහජ හැකියාවෙන් යුක්තව මිනිසා මවා ඇත. නමුත් එය ක්‍රියාවට නැංවීම සඳහා අවනතභාවය (ඉස්ලාමය) පිළිබඳ ගැත්තා හැදෑරීම අනිවාර්යය වන්නේය. ඒ ගැන දැන ගැනීමට පෙර මිනිසා කිසිවක් නොදන්නා අයකු විය. අල්ලාහ් මෙසේ පවසයි: "නුඹලා කිසිවක් නොදන්නන් ලෙසින් අල්ලාහ් නුඹලාව නුඹලාගේ මව්වරුන්ගේ කුසවල් වලින් පිට කරන්නේය." (සූරා අන්-නහ්ල් 78) ඔහු තම නබිවරයා දෙස බලා "නුඹ ව මුළා වූ අයකු ලෙස දැක පසුව ඔහු මඟ පෙන්වීය." (සූරා අල්-ලුහා: 7) ඉන් අදහස් කරනුයේ: ඔහු ඔබට ඉගැන්වූ පුස්තකය හා ප්‍රඥාව පිළිබඳ නොදන්නා අයකු ලෙස ඔහු ඔබ ව දැක ඇති බවයි. උත්තරීතර අල්ලාහ් මෙසේ ද පවසයි: "මෙලෙස අපගේ නියෝගයෙන් වූ ප්‍රාණය(අල් කුර්ආනය) අපි නුඹ වෙත හෙළිදරව් කළෙමු. ධර්ම පුස්තකය කුමක් ද යන්න හෝ ඊමානය(විශ්වාසය) කුමක් ද යන්න හෝ නුඹ දැන නොසිටියෙහිය..." (සූරා අෂ්-ෂූරා: 52) සහජයෙන්ම සත්‍ය පිළිගන්නා අයුරින් මිනිසාව බිහි කරනු ලැබ ඇත. එහෙයින් අල්ලාහ් ඔහුට මඟ පෙන්වූයේ නම් ඔහුට යහමග පෙන්වන අයකු මාධ්‍යයක් බවට පත් කර දෙන්නේය. එවිට ශක්තිමත් ලෙස මඟ පෙන්වනු ලැබුවායින් පසු එම ක්‍රියාවෙන් මඟ ලැබූවෙකු බවට පත් වන්නේය. එමෙන්ම අල්ලාහ් ඔහු අවමානයට ලක් කළේ නම්, තම සහජභාවය වෙනස් කරන දෑ ඔහුට උගන්වන අයකු පත් කරන්නේය. නබි (ﷺ) තුමාණන් මෙසේ පවසා සිටියහ. "ඉපදෙන සෑම දරුවකුම සහජ ස්වභාවය මත පිහිටයි. එහෙයින් ඔහු ව යුදෙව්වෙකු බවට පත් කරන්නේත් ඔහු ව කිතුනුවකු බවට පත් කරන්නේත් ඔහු ව මජූසි (අග්නි වන්දනාකරුවන්) බවට පත් කරන්නේත් ඔහුගේ දෙමාපියන් වෙති.[190]

මුඃමින්වරයකු අල්ලාහ්ගෙන් යහමග ඉල්ලීම වනාහි: සැබැවින්ම යහමග වර්ග දෙකකි.

හිදායා මුජ්මල්: එනම් ඉස්ලාමය හා ඊමානය වෙත වූ යහමගයි. එය මුඃමින්වරයාට ඇති වන්නකි.

190. බුහාරි (3/219), මුස්ලිම් (2658)

හිදායා මුෆස්සල්: එනම් ඉස්ලාමයේ හා ඊමානයේ කොටස් එකිනෙක පැහැදිලි කර ගැනීම සඳහා දැනුම වෙත මග පෙන්වන ඔහුගේ යහමගයි. එමෙන්ම ඒවා ඉටු කිරීම සඳහා පිහිටන ඔහුගේ උපකාරයයි. මෙය සෑම මුඃමින්වරයකුටම දිවා රාත්‍රියේ අවශ්‍ය වන්නකි. එහෙයින් අල්ලාහ් තම ගැත්තන් හට ඔවුන්ගේ සෑම සලාතයකම ඇති සෑම රකඅතයකම "අපට ඍජු මග පෙන්වනු මැනව" (සූරා අල් ෆාතිහා) යන ප්‍රකාශය පාරායනය කරන්නැයි නියෝග කර ඇත. නබි (ﷺ) තුමාණන් රාත්‍රියෙහි තම ප්‍රාර්ථනාවෙහි 'ඔබේ අවසරයෙන් කවර කරුණක සත්‍යය පැටලවී ඇත්තේ ද එහි මට මග පෙන්වනු මැනව. සැබැවින්ම ඔබ අභිමත කරන්නන් හට ඍජු මාර්ගය වෙත මඟ පෙන්වන්නෙහිය.[191]

කිඹුහුම් ගිය අයකු 'අල්හම්දු ලිල්ලාහ්' (අල්ලාහ්ටම සියලු ප්‍රශංසා) යැයි පවසයි. එවිට 'යර්හමුකල්ලාහ්' (අල්ලාහ් ඔබට කරුණා කරත්වා) යැයි ඔහුට පවසනු ලැබේ. නැවතත් ඔහු: 'යහ්දීකුමුල්ලාහ්' අල්ලාහ් ඔබට යහමග පෙන්වත්වා!) යැයි පවසනුයේ එහෙයිනි. ඒ පිළිබඳ සුන්නාවේ සඳහන්ව පැමිණ ඇත්තේ එලෙසය.[192] සැබැවින්ම මුස්ලිම්වරයකු වූ කලී තමන් වෙනුවෙන් යහමග ප්‍රාර්ථනා කිරීම අවශ්‍ය නොවන බව සිතමින් ඉරාක ආගමික නීතිවේදීන්ගෙන් ඇතැමෙකු එය පිළිකුල් කරති. නමුත් මේ සම්බන්ධයෙන් පෙන්වා දී ඇති සුන්නාව අනුගමනය කිරීමක් වශයෙන් බහුතර විද්වත්හු ඔවුනට වෙනස් මත දරති.

යහමග හා ස්ථාවරත්වය අල්ලාහ්ගෙන් පතන මෙන් නබි (ﷺ) තුමාණන් අලීතුමාට නියෝග කළේය.[193]

පාපයන් සඳහා පාපක්ෂමාව පැතීම වනාහි: එය සමාව ඉල්ලා සිටීමකි. ගැත්තා ඒ සඳහා ඉතා අවශ්‍යතාවයකින් පසු වෙයි. ඊට හේතුව ඔහු දිවා රාත්‍රියේ වැරදි කරන බැවිනි. අල් කුර්ආනයේ තව්බා, ඉස්තිග්ෆාර් යන කරුණු නැවත නැවතත් මෙනෙහි කරමින්, ඒ දෙක ඉටු කිරීමට නියෝග කරමින් හා උනන්දු කරමින් පැමිණ ඇත.

---

191. මුස්ලිම් (770)
192. බුහාරි (5870)
193. මුස්ලිම් (2725) මෙය පෙර සඳහන් වූ හදීසයකි.

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බවට අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් බුහාරි හි මෙසේ පළ වී ඇත. " අල්ලාහ් මත දිවුරා පවසමි. සැබැවින්ම මම දිනක හැත්තෑ වාරයකට අධික ලෙස අල්ලාහ්ගෙන් සමාව අයැද සිටිමි. පව් සමාව අයැද ඔහු වෙත යොමු වෙමි."[194] මෙය අන්නසාඊ හා ඉබ්නු මාජා විසින් පළ කර ඇති අතර ඔවුන් දෙදෙනාගේම තවත් ප්‍රකාශයක "සැබැවින්ම මම සෑම දිනකම සිය වාරයක් අල්ලාහ්ගෙන් සමාව ඇයැද ඔහු වෙත යොමු වෙමි."[195] යැයි සඳහන් වී ඇත.

නබි (ﷺ) තුමාණන් කළ ප්‍රකාශයකට සවන් දුන් අගර් අල් මුසනී තුමා විසින් වාර්තා කළ හදීසයක් මුස්ලිම් හි මෙසේ පළ වී ඇත. "අහෝ ජනයිනි, නුඹලාගේ පරමාධිපති වෙත පශ්චාත්තාප වී යොමු වන්න. හේතුව සැබැවින්ම මම දිනක සිය වාර්යක් පශ්චාත්තාප වී ඔහු වෙත යොමු වෙමි."[196] මෙය අන්-නසාඊ විසින් ද පළ කර ඇත. ඔහුගේ ප්‍රකාශයක: "අහෝ ජනයිනි, නුඹලාගේ පරමාධිපති වෙත නුඹලා පශ්චාත්තාප වී යොමු වන්න ඔහුගෙන් පාපක්ෂමාව ඉල්ලා සිටින්න. හේතුව සැබැවින්ම මම සෑම දිනකම සියවාරයක් අල්ලාහ් වෙත පශ්චාත්තාප වී ඔහුගෙන් සමාව ඇයද සිටිමි."[197] යනුවෙන් වාර්තා කර ඇත.

***

"නුඹලා මට හානියක් කරන තරමට මට හානි කිරීමට නුඹලාට නොහැක්කේමය. එමෙන්ම මට ප්‍රයෝජනයක් කරන තරමට මට ප්‍රයෝජනයක් කළ නොහැක්කේමය." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

කිසිදු සෙතක් හෝ හානියක් අල්ලාහ් වෙත සේන්දු කරවන්නට සැබැවින්ම ගැත්තන්හට නොහැකිය. සැබැවින්ම අල්ලාහ් තමන් විෂයයෙහි අවශ්‍යතාවෙන් තොරය. ප්‍රශංසා ලාබීය. ගැත්තන්ට යටත් වීමේ අවශ්‍යතාවක් ඔහුට නැත. ඔහු වෙතට එහි ප්‍රයෝජන ළඟා වන්නේ ද නැත. එමගින්

194. බුහාරි (5948)
195. 'අල්-කුබ්රා'හි අන්නාසාඊ (6/114), ඉබ්නු මාජා (3815).
196. මුස්ලිම් (2702)
197. 'අල්-කුබ්රා'හි අන්නාසාඊ (6/116)

ප්‍රයෝජන ලබන්නෝ ඔවුහුමය. ඔවුන්ගේ පිටුපෑමෙන් ඔහුට හිංසාවක් ඇති වන්නේ නැත. එමගින් හිංසාවට පත් වන්නෝ ඔවුහුමය.

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: "(නබිවරය,) ප්‍රතික්ෂේප කිරීමෙහි යුහුසුලු වන්නන් නුඹව ශෝකයට පත් නොකළ යුතුය. සැබැවින්ම ඔවුන් අල්ලාහ්ට කිසිවකින් හෝ හානි ඇති නොකරන්නෝමය." (සූරා ආලු ඉම්රාන්: 176) තවත් ස්ථානයක: "...කවරෙකු තම විළුඹ මත ආපසු හැරී යන්නේ ද (එමගින්) ඔහු අල්ලාහ්ට කිසිවකින් හෝ හානි ඇති නොකරන්නේමය. අල්ලාහ් කෘතවේදීන්ට යහ ප්‍රතිඵල මතු ලබා දෙනු ඇත." (සූරා ආලු ඉම්රාන්: 144) නබි (ﷺ) තුමාණන් තම දේශනයේ මෙසේ පවසන්නෙකු වූහ. " කවරෙකු අල්ලාහ්ට හා ඔහුගේ දූතයාට පිටු පාන්නේ ද ඔහු නොගම ගියේය. ඔහු තමන්මට මිස හානි පමුණුවා ගන්නේ නැත. අල්ලාහ්ට කිසිදු හානියක් සිදු වන්නේ නැත."[198] උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: "තවද නුඹලා ප්‍රතික්ෂේප කළ ද (අල්ලාහ්ට කිසිදු හානියක් නොවනු ඇත. මන්දයත්) සැබැවින්ම අහස්හි හා මිහිතලයෙහි ඇති දෑ අල්ලාහ් සතුය. අල්ලාහ් සදා පොහොසත්ය. සදා ප්‍රශංසාලාභීය." (සූරා අන් නිසා: 131). අල්ලාහ් මූසා (අලෛයිහිස් සලාම්) තුමා පිළිබඳ සඳහන් කරමින් මෙසේ පවසා ඇත. "නුඹලා හා මිහිතලයේ සිටින සියල්ල (අල්ලාහ්ව) ප්‍රතික්ෂේප කළ ද සැබැවින්ම අල්ලාහ් සර්ව සම්පූර්ණය ප්‍රශංසාලාභීය." යැයි මූසා පවසා සිටියේය." (සූරා ඉබ්‍රාහීම්: 8) තවත් ස්ථානයක "උන්ගේ මාංශ ද උන්ගේ රුධිරය ද අල්ලාහ් වෙත ළඟා නොවන්නේමය. නමුත් නුඹලා අතුරින් වූ බිය භක්තිමත්භාවය ඔහු වෙත ළඟා වන්නේය..." (සූරා අල් හජ්: 37).

එහි තේරුම: සැබැවින්ම අල්ලාහ් ඔහුට පිටුපාන්නන් පිළිකුල් කරන්නාක් මෙන් ඔහුට භක්තිමත්ව කටයුතු කරන ඔහුට අවනත වන තම ගැත්තන්ට ප්‍රිය කරන්නේය. ඔහු වෙත පාපක්ෂමාව අයැද සිටින්නන්ගේ පශ්චාත්තාපය තුළින් ඔහු සතුටු වන්නේය. එය කෙතරම් ද යත් යම් කෙනෙකුගේ මගී සතෙකු ඌ මත තිබූ ඔහුගේ ආහාර පාන සමග කාන්තාරයේ නැති වී, පසුව එය ඔහු සොයා යයි. අවසානයේ ඔහුට මගක් සොයා ගත නොහැකිව ආයාසයට පත්වෙයි. මරණය පිළිගනියි. ජීවිතය ගැන බලා පොරොත්තු සුන් වී යයි. පසුව ඔහුගේ ඇස් පියවී යයි. නින්දට වැටෙයි. අවසානයේ ඔහු අවදි

198. අබූ දාවූද් (1097), (2119) මෙහි වාර්තාකරණය ලර්ෆ් ගණයට අයත් ය.

වූ වහාම උං ඔහු ඉදිරියේ පවතී. එය මැවීමක් උපරිමයෙන්ම සතුටු වන ස්වරූපයකි. ගැත්තා පාපක්ෂමාව අයැදීම හේතුවෙන් අල්ලාහ් ඊටත් වඩා මහත්සේ සතුටට පත් වෙයි. මේ සියල්ල පිහිටනුයේ තම ගැත්තන් ඔහුට අවනත වීමෙන් හා ඔහු වෙත පව්සමාව අයැදීමෙන් ඔහුට කිසිදු ප්‍රයෝජනයක් නොමැති වීමත් සමගමය. ඒවායෙහි ප්‍රයෝජන නැවත ලැබෙනුයේ ඔහු වෙත නොව ඔවුන් වෙතය. නමුත් මෙය ඔහුගේ ගැත්තන් වෙත පිරිනමන ඔහුගේ උපකාරයේ, ඔහුගේ යහපත් කමේ සහ ඔවුන් වෙත සෙත සැලසීමට හා ඔවුනට අත්වන පීඩාවන් දුරු කිරීමට පවතින ඔහුගේ කැමත්තෙහි පූර්ණත්වයයි. ඔහු තම ගැත්තන් අතුරින් ප්‍රිය කරනුයේ ඔහු ගැන හඳුනා ගන්නා ඔහුට ආදරය කරන ඔහුට බියවන ඔහුට භක්තිමත්ව කටයුතු කරන ඔහුට අවනත වන ඔහු වෙත සමීපවන්නට බලන අයටය. එමෙන්ම ඔහු හැර වෙනත් කිසිවකු තම පාපයන් සමා නොකරන බවත් තම ගැත්තන්ගේ පාපයන්ට සමාව දීමේ බලය ඇත්තේ ඔහුට පමණක් බවත් ඔවුන් දැන සිටීම ඔහු ප්‍රිය කරයි. අබූ දර් තුමා විසින් වාර්තා කළ මෙම හදීසය පිළිබඳ අබ්දුර් රහ්මාන් ඉබ්නු ගනම්ගේ වාර්තාවේ සඳහන් පරිදි: "නුඹලා අතර කවරෙකු සැබැවින්ම සමාව දීමේ බලහිම්පාණන් මා බව දැන, පසුව මගෙන් සමාව අයැද සිටින්නේ ද මම ඔහුට සමාව දෙමි. ඒ ගැන මට දොසක් නැත."

සූරා ආලු ඉම්රාන් 135 වැනි පාඨයේ සඳහන් අල්ලාහ්ගේ ප්‍රකාශ පිළිබඳ සිතා බලන්න. එනම්: "තවද (ඔවුහු) කවුරුන්දයත් ඔවුන් අශික්ෂිත දැයක් කළ විට හෝ ඔවුන් තමන්ටම අපරාධ කර ගත් විට අල්ලාහ් ව මෙනෙහි කර තමන්ගේ පාපයන්ට සමාව අයැදිති. අල්ලාහ් හැර පාපයන් සමා කරන්නේ කවරෙක් ද?..." සැබැවින්ම පාපකම් කරන්නන් සරණ පතා යන්නට හෝ තමන් කළ පාපයන් සඳහා සමාව ලබන්නට ඔහු හැර වෙනත් කිසිවකු ඔවුනට නොමැති බව මෙහි පෙන්වා දී ඇත. එමෙන්ම පසුබැස්සා වූ තිදෙනා පිළිබඳ යථාර්ථය පැවසීමේ දී අල්ලාහ්ගේ ප්‍රකාශයත් එලෙසමය. "...කෙතරම්දයත් මිහිතලය විශාල වුව ද ඔවුන් කෙරෙහි එය පටු විය. ඔවුන්ගේ ආත්මාවන් ද ඔවුනට පටු විය. අල්ලාහ්ගෙන් මිදෙන්නට ඔහු වෙතම මිස (වෙනත් ක්‍රියා මාර්ගයක්) නැතැ'යි ඔවුහු ස්ථිරවම දැන ගත්තෝය. පසුව ඔවුන් පශ්චාත්තාප වනු පිණිස අල්ලාහ් ඔවුන් වෙත යොමු වුණේය. සැබැවින්ම අල්ලාහ්මය පශ්චාත්තාපය පිළිගන්නා, පරම කරුණාභරිත. (සූරා අත්-තව්බා 118) අල්ලාහ් වෙත යොමු වීමෙන් මිස

වෙනත් සරණක් ඔවුනට නොමැති බව ඔවුනට හැඟෙන තරමට ඔහුගේ සමාවේ අදියරයන් පැහැදිලි කර ඇත. එහෙයින් සැබැවින්ම ගැත්තා මැවීම්වටල බිය වූ විට ඔහුගෙන් පලා යයි. ඔහු හැර වෙනත් දේ වෙත දිව යයි. නමුත් අල්ලාහ්ට බියවන්නන් වනාහි, ඔහු වෙත යොමු වීම මිස වෙනත් යොමුවක් ඔහුට නැත. ඔහු පිළිබඳ හැර වෙනත් බියක් ඔහුට නැත. ඔහු වෙත හැර පළා යන්නට වෙනත් තැනැක් නැත. එහෙයින් ඔහු ඔහු වෙතම දිව යයි. නබි (ﷺ) තුමාණන් තම ප්‍රාර්ථනාවෙහි මෙසේ පවසන්නෙකු වූහ. "ඔබ වෙත යොමු වීමෙන් මිස ඔබෙන් කිසිදු සරණක් හෝ කිසිදු මිදීමක් නැත."[199] එතුමාණන් තව දුරටත්, "ඔබේ තෘප්තිය තුළින් ඔබේ කෝපයෙන් ද ඔබේ සමාව තුළින් ඔබේ දඬුවමින් ද ඔබ තුළින් ඔබෙන් ද මම ආරක්ෂාව පතමි."[200]

"මාගේ ගැත්තනි, නුඹලාගේ පළමුවැන්නා නුඹලාගේ අන්තිමයා නුඹලාගේ මනුෂ්‍ය වර්ගයා සහ නුඹලාගේ ජින්වර්ගයා කිසියම් මිනිසෙකුගේ ධාර්මික හදවත තරම් වඩාත් බැතිමත් වූයේ නම් එය කිසිසේත් මාගේ ආධිපත්‍යය වැඩි නොකරනු ඇත. එමෙන්ම මාගේ ගැත්තනි, නුඹලාගේ පළමුවැන්නා, නුඹලාගේ අන්තිමයා, නුඹලාගේ මනුෂ්‍ය වර්ගයා සහ නුඹලාගේ ජින්වර්ගයා කිසියම් මිනිසෙකුගේ දුෂ්ට හදවත තරම් දුෂ්ට වූයේ නම්, එය කිසිම දෙයකින් මාගේ ආධිපත්‍යය අඩු නොකරනු ඇත." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

සැබැවින්ම මැවීම් අල්ලාහ්ට අවනත වීම හේතුවෙන් ඔහුගේ ආධිපත්‍යය වැඩි වන්නේ නැත. මැවීම් සියල්ල දැහැමි වුව ද ඔවුන් අතර සිටින වඩාත් ධාර්මික මිනිසකුගේ හදවතට වඩා ඔවුන්ගේ හදවත් වඩාත් පිවිතුරු වුව ද ඒ කිසිවක් වැඩි කරන්නේ නැත. එමෙන්ම පාපිෂ්ඨයින් සිදු කරන පාපකම් තුළින් ඔහුගේ ආධිපත්‍යයේ කිසිවක් අඩු වන්නේ ද නැත. ජින් වර්ගයා හා මිනිස් වාර්ගයා යන සියලු දෙනා වැරදි කරන පාපිෂ්ටයින් වුව ද එහි අඩුවක් ඇති වන්නේ නැත.

සැබැවින්ම පිවිතුරු අල්ලාහ් පැවැත්මෙන් පොහොසත්ය. ඔහු හැර වෙනත් අයගේ අවශ්‍යතාවක් ඔහුට නැත. පොදුවේ ඔහුගේ පැවැත්ම ඔහුගේ ගුණාංග

199. බුහාරි (7050), මුස්ලිම් (2710).
200. මුස්ලිම් (486)

සහ ඔහුගේ ක්‍රියාව යානාදියෙහි පූර්ණත්වය ඔහු සතුය. ඔහුගේ රාජ්‍යය පරිපුන් රාජ්‍යයකි. කිසිදු අයුරකින් එහි අඩුවක් වන්නේ නැත.

***

“මාගේ ගැත්තනි, නුඹලාගේ පළමුවැන්නා, නුඹලාගේ අන්තිමයා, නුඹලාගේ මනුෂ්‍ය වර්ගයා සහ නුඹලාගේ ජින්වර්ගයා උස් තැනකට නැගී මාගෙන් ඉල්ලීමක් කරන්නේ නම් (එසේ ඉල්ලන) සෑම මිනිසෙකුටම ඔහු ඉල්ලන දෑ මම පිරිනමමි. ඉඳිකටුවක් මුහුදට දමනු ලැබූ විට එය (එහි ජලය) අඩු නොකරන සේ මා සතුව ඇති දෑ ද එය අඩු කරන්නේ නැත.” යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

මින් අදහස් කරනුයේ: පිවිතුරු අල්ලාහ්ගේ බලමහිමයේ පූර්ණත්වය හා ඔහුගේ පාලනයේ පූර්ණත්වයයි. ඔහුගේ සම්පත් ඔහු පිරිනැමීමෙන් සැබැවින්ම ඔහුගේ රාජ්‍ය තුළ කිසිවක් අඩු වන්නේ හෝ නැති වන්නේ හෝ නැත. මිනිස් හා ජින්වර්ගයා අතරින් පළමු අය හා අවසන් අය දක්වා සියල්ලන්හට ඔවුන් ඉල්ලා සිටින සියලු දෑ එකම ස්ථානයේ පිරිනැමුවද කිසිදු අඩුවක් වන්නේ නැත. මෙහිදී ඔහුගෙන් ඉල්ලන මෙන්ද ඔවුන්ගේ අවශ්‍යතාවන් ඔහුගෙන් බැගෑපත්ව අයදින මෙන් ද මිනිසා දිරිගන්වා ඇත.

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් බුහාරි හා මුස්ලිම් හි මෙසේ සඳහන් වී ඇත. “අල්ලාහ්ගේ අත පිරී පවතී. දිවා රාත්‍රියේ අඛණ්ඩ වියදමක් තිබුණ ද එය හිස් වන්නේ නැත. අහස් හා මහපොළොව මැවූ දා පටන් ඔහු වියදම් කරන දෑ නුඹලා නොදුටුවෙහු ද? ඔහුගේ සුරතෙහි ඇති කිසිවක් හිස් වූයේ නැත.”[201]

ඉඳිකටුවක් මුහුදට දමනු ලැබූ විට එය (එහි ජලය) අඩු නොකරන සේ මා සතුව ඇති දෑ ද එය අඩු කරන්නේ නැත.” යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය ඔහු සතු ව ඇති දෑ හි කිසිදු අඩුවක් සිදු වන්නේ නැති බව තහවුරු කරයි. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: “නුඹලා අබියස ඇති දෑ අවසන් වී යන්නේය. තවද අල්ලාහ් අබියස ඇති දෑ ඉතිරි ව පවතින්නකි.” සූරා අන්-නහ්ල්: 96) මුහුදට ඉඳි කටුවක් ගිල්වා එය පිටතට ගත් විට මුහුදෙන් කිසිවක්

201. බුහාරි (7411), මුස්ලිම් (993).

එය අඩු කරන්නේ නැත. ගොඩබිමේ ජලය හෝ එහි ගලායන ගංගා එය වැඩි කරන්නේ නැති සේම ඉන් ගනු ලැබූ විට ද එසේමය. කිසිවක් එය අඩු කරන්නේ නැත. එයින් ගනු ලබන දෑට අමතර ව වඩාත් අධික ප්‍රමාණයක් එහි ව්‍යාප්තව පවතින බැවිනි. ස්වර්ගයේ ආහාර හා එහි ඇති දෑ ද එලෙසමය. සැබැවින්ම කිසිවක් හිස් වී යන්නේ නැත. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා සිටියි: "තවද (අවාරයෙන්) හිඟ නොවන හා තහනම් නොකරන ලද අධික පලතුරු අසල ද" (අල්-වාකිආ : 32,33)

තිර්මිදි හා ඉබ්නු මාජා විසින් පළ කළ හදීසයක අල්ලාහ් අබියස ඇති දෑ ඔහු පිරිනැමීමෙන් කිසිවක් අඩු නොවීමට හේතු වූ කරුණු පැහැදිළි කළ එතුමාණන්ගේ තවත් ප්‍රකාශයක් මෙසේය.: "එය සැබැවින්ම මම කීර්තිමත් ස්වයං පෝෂිත දානපති වන බැවිනි. මා සිතන දේ මම කරමි. මාගේ පිරිනැමීම ප්‍රතිඥාවකි. මාගේ දඬුවමත් ප්‍රතිඥාවකි. මා යම් දෙයක් සිතූ විට එයට මාගේ නියෝගය 'කුන්' -වනු- යැයි පැවසීම පමණි. එවිට එය සිදුවනු ඇත.[202]

තෘෂ්ණාවෙන් මැවීම් වෙත ඔබ යටත් නොවන්න.

සැබැවින්ම එය දහමින් ඔබට හානිකරය.

අල්ලාහ්ගේ භාණ්ඩාගාරයේ ඇති දැයින් පෝෂණය පතන්න.

සැබැවින්ම එය කාෆ් හා නූන් අතර වූ නියෝගයක් පමණි.

***

"මාගේ ගැත්තනි, සැබැවින්ම නුඹලාගේ ක්‍රියාවන් වූ කල්හි, ඒවා මම නුඹලා වෙනුවෙන් සටහන් කර තබා ඇත්තෙමි. පසුව නුඹලාට මා ගෙවනුයේ ඒවාට පමණි." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

ඉන් අදහස් කරනුයේ අල්ලාහ් තම ගැත්තන්ගේ ක්‍රියාවන් සටහන් කර පසුව ඒ සඳාහා ප්‍රතිඵල ඊට අදාළව පිරිනමන බවයි. මෙය අල්ලාහ්ගේ ප්‍රකාශය

202. තිර්මිදි (2495), ඉබ්නු මාජ (4257), මෙය හසන් ගණයට අයත් හදීසයක් බව තිර්මිදි තුමා පවසයි.

මෙනි: "ප්‍රතික්ෂේප කළවුනි, අද දින (විනිශ්චය දින) නුඹලා නිදහසට කරුණු ඉදිරිපත් නොකරවු. නුඹලාට ප්‍රතිඵල දෙනු ලබනුයේ නුඹලා කරමින් සිටි දෑටමය. විශ්වාස කළවුනි, නුඹලා (පිවිතුරු වූ) අව්‍යාජ පශ්චාත්තාපයකින් අල්ලාහ් වෙත (හැරී) පශ්චාත්තාප වවු. නුඹලාගේ පරමාධිපති නුඹලාගේ දුෂ්ටකම් නුඹලාගෙන් ක්ෂමා කර ස්වර්ග උයන් වලට නුඹලාව ඇතුළු කර විය හැක. ඊට යටින් ගංගාවෝ ගලා බසිති. එදින අල්ලාහ් නබිවරයාව ද ඔහු සමග විශ්වාස කළවුන්ව ද අවමන් නොකරන්නේය. ඔවුන්ගේ ආලෝකය ඔවුන් ඉදිරිපිට ද ඔවුන්ගේ (ක්‍රියා ලේඛන මගින්) දකුණු අත් වලට ශීඝ්‍රයෙන් ගමන් කරයි. (එවිට) 'අපගේ පරමාධිපතියාණනි, අපගේ ආලෝකය අපට පරිපූර්ණ කරනු මැනව. තවද අපව ක්ෂමා කරනු මැනව. සැබැවින්ම ඔබ සියලු දෑ කෙරෙහි අති බලසම්පන්න යැ'යි ඔවුහු පවසති." (සූරා අත්-තහ්රීම්: 7,8) තවත් පාඨයක මෙසේ සඳහන් වේ. "... තවද ඔවුහු කළ දෑ (තමන් ඉදිරියේ) ඉදිරිපත් කරන්නක් ව ඔවුන් දකින්නෝය. තවද නුඹගේ පරමාධිපති කිසිවෙකුට අපරාධ නොකරන්නේය." (සූරා අල්-කහ්ෆ්: 49)

***

"එබැවින් කවරෙකු යහපත සොයා ගත්තේ ද ඔහු අල්ලාහ්ට ප්‍රශංසා කළ යුතුයි. ඒ හැර වෙනත් දෙයක් ලැබුවේ ද ඔහු ඔහුටම මිස (අල්ලාහ්ට) දොස් නොපැවරිය යුතුයි." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

සැබැවින්ම සියලු යහපත අල්ලාහ්ගෙන් බව මෙය පෙන්වා දෙයි. එය තම ගැත්තා එයට සුදුස්සෙකු නොවී සිටි තත්ත්වයක ඔහු වෙත පුදන ලද භාග්‍යයකි. එමෙන්ම ආදම්ගේ දරුවන්ගෙන් සිදුවන සියලු නපුරුකම් ඔහුගේ ආත්මයේ තෘෂ්ණාව අනුගමනය කිරීමෙන් ඇති වන්නකි. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. "නුඹට යම් යහපතක් ඇති වූයේ නම් එය අල්ලාහ්ගෙන් ය. නුඹට යම් අයහපතක් ඇති වූයේ නම් එය නුඹගෙන්මය..." (සූරා අන්-නිසා: 79) ශුද්ධ වූ අල්ලාහ් ගැත්තෙකුහට ආශිර්වාද කිරීමටත් ඔහුට මග පෙන්වීමටත් සිතූ විට ඔහු ඔහුට උදව් කරනු ඇත. ඔහුට අවනත වීම සඳහා ආශිර්වාද කරනු ඇත. එය අල්ලාහ්ගෙන් වූ භාග්‍යයක් වන්නේය. එමෙන්ම ඔහු ගැත්තෙකු අවමන් කිරීමට සිතූ විට ඔහු ව ඔහුගේ ආත්මයට භාර කර ඔහු හා එය අතර කටයුතු කරන්නට අතහැර දමනු ඇත. එවිට ඔහු අල්ලාහ්ව මෙනෙහි කිරීමට අවධානය යොමු නොකළ බැවින් ෂෙයිතාන් ඔහු

නොමග යවනු ඇත. අල්ලාහ් මෙසේ පවසා සිටියි: "... තවද ඔහු තම මනෝ ඉච්ඡාව අනුගමනය කළේය. ඔහුගේ කරුණ ඉක්මවා යෑමක් විය." (සූරා අල් කහ්ෆ්: 28) එය ඔහුගෙන් වූ යුක්තියයි. එහෙයින් සැබැවින්ම සාක්ෂි හා සාධක අල් කුර්ආනය පහළ කිරීමෙන් හා රසූල්වරු එවීමෙන් ගැත්තා වෙත පෙන්වා දී ඇත. රසූල්වරුන්ට පසු කිසිදු මිනිසෙකු වෙත ඉදිරිපත් කිරීමට තරම් කිසිදු සාක්ෂියක් අල්ලාහ් මත ඉතිරි වූයේ නැත.

අල්ලාහ් ස්වර්ගවාසීන් පිළිබඳ තොරතුරු මෙසේ දන්වා සිටියි: සැබැවින්ම ඔවුන් ඔවුනට පිරිනැමූ ඔහුගේ භාග්‍යය වෙනුවෙන් අල්ලාහ් ව පැසසුමට ලක් කරති. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: "ඔවුන්ගේ හදවත් තුළ ඇති ක්‍රෝධය අපි ඉවත් කරන්නෙමු. ඔවුනට පහළින් ගංගාවෝ ගලා බසිනු ඇත. තවද "මෙ(ම ස්වර්ග)ය වෙත අපව මග රැගෙන ආ අල්ලාහ්ටමය සියලු ප්‍රශංසා. අල්ලාහ් අපට මග පෙන්වූයේ නැතිනම්, අපි යහමග ලැබූවන් නොවන්නෙමු..." (සූරා අල් අඃරාෆ්: 43) තවත් පාඨයක: "තමන්ගේ ප්‍රතිඥාව අපට සැබෑ කළ අල්ලාහ්ටම සියලු පැසසුම් හිමිය. ඔහු (ස්වර්ග) භූමිය අපට උරුම කර දුන්නේය. (එබැවින්) ස්වර්ගයෙහි අප අභිමත කළ තැනක වෙසෙන්නට හැකිය..." (සූරා අස්-සුමර්: 74)

උත්තරීතර අල්ලාහ් මෙසේ ද පවසයි: "තවද ඔවුහු (මෙසේ) පවසති "අපගෙන් (සියලු) දුක ඉවත් කළා වූ අල්ලාහ්ටම සියලු පැසසුම් හිමිය. සැබැවින්ම අපගේ පරමාධිපති අති ක්ෂමාශීලීය තුතිය අගය කර( ප්‍රතිඵල දෙ)න්නාය." "ඔහු තම දායාදයෙන් අපව සදාතනික නිවසෙහි(ස්වර්ගයෙහි) ගෘහස්ථ කළේය. එහි (කිසිදු ශරීර) වෙහෙසක් අපව ස්පර්ශ නොකරන්නේය. තවද එහි (කිසිදු) කාන්සියක් අපව ස්පර්ශ නොකරන්නේය." (සූරා ෆාතිර්: 34,35)

නිරා වැසියන් පිළිබඳ තොරතුරු දන්වා සිටිය දී, සැබැවින්ම ඔවුහු ඔවුන්ටම දොස් නගා ගන්නා බවත් ඔවුහු ඔවුන්වම දැඩි ලෙස පිළිකුල් කරන බවත් දන්වා සිටියි: "සත්‍යයේ ප්‍රතිඥාව අල්ලාහ් නුඹලාට ප්‍රතිඥා දුන්නේය. (එහෙත්) මම නුඹලාට (අසත්‍ය) ප්‍රතිඥා ලබා දී නුඹලාට (එය) කඩ කළෙමි. තවද මා නුඹලාට (පාපය වෙත) ඇරයුම් කිරීම මිස නුඹලා කෙරෙහි කිසිදු බලයක් මා වෙත නොවීය. එවිට නුඹලා මට පිළිතුරු දුන්නෙහුය. එබැවින්

නුඹලා මට අවලාද නොකරවු. නුඹලා නුඹලාටම අවලාද කර ගනිවු…" (සූරා ඉබ්රාහීම්: 22)

***

## الحَدِيْثُ الخَامِسُ والعِشْرُونَ

## විසි පස් වන හදීසය

عَنْ أَبِي ذَرٍّ رَضِيَ اللهُ عَنْهُ:

"أَنَّ نَاسًا مِنْ أَصْحَابِ رَسُولِ اللهِ ﷺ قَالُوا لِلنَّبِيِّ ﷺ: يَا رَسُولَ اللهِ ذَهَبَ أَهْلُ الدُّثُورِ بِالْأُجُورِ، يُصَلُّونَ كَمَا نُصَلِّي، وَيَصُومُونَ كَمَا نَصُومُ، وَيَتَصَدَّقُونَ بِفُضُولِ أَمْوَالِهِمْ."

قَالَ: "أَوَلَيْسَ قَدْ جَعَلَ اللهُ لَكُمْ مَا تَصَّدَّقُونَ؟ إِنَّ بِكُلِّ تَسْبِيحَةٍ صَدَقَةً، وَكُلِّ تَكْبِيرَةٍ صَدَقَةً، وَكُلِّ تَحْمِيدَةٍ صَدَقَةً، وَكُلِّ تَهْلِيلَةٍ صَدَقَةً، وَأَمْرٌ بِالْمَعْرُوفِ صَدَقَةٌ، وَنَهْيٌ عَنْ مُنْكَرٍ صَدَقَةٌ، وَفِي بُضْعِ أَحَدِكُمْ صَدَقَةٌ."

قَالُوا: يَا رَسُولَ اللهِ أَيَأْتِي أَحَدُنَا شَهْوَتَهُ وَيَكُونُ لَهُ فِيهَا أَجْرٌ؟

قَالَ: "أَرَأَيْتُمْ لَوْ وَضَعَهَا فِي حَرَامٍ، أَكَانَ عَلَيْهِ وِزْرٌ؟ فَكَذَلِكَ إِذَا وَضَعَهَا فِي الْحَلَالِ كَانَ لَهُ أَجْرٌ."

رَوَاهُ مُسْلِمٌ.

අබූ දර් තුමා විසින් වාර්තා කරන ලදී.

අල්ලාහ්ගේ දූතයාණන්(ﷺ)ගේ මිතුරන් අතරින් පිරිසක් නබි (ﷺ) තුමාට: අල්ලාහ්ගේ දූතයාණෙනි, ධනවත් අය ප්‍රතිඵල වලින් ඉදිරියට ගොස් ඇත. අප සලාත් ඉටු කරන්නාක් මෙන් ඔවුහු ද සලාත් ඉටු කරති. අප උපවාසය රකින්නාක් මෙන් ඔවුහු ද උපවාසය රකිති. අමතර ව ඔවුන්ගේ ධනයෙන් ඔවුහු දානමාන (පුණ්‍ය කටයුතු ද සිදු) කරති යැයි පවසා සිටියහ.

එවිට එතුමාණන් (ﷺ): "නුඹලා පුණ්‍ය කටයුතුවල නිරතවන දෑ අල්ලාහ් නුඹලාට ඇති නොකළේ ද? (සුබ්හානල්ලාහ් - -අල්ලාහ් සුවිශුද්ධය- යැයි පවසන) සෑම තස්බීහයක්ම දානයකි. (අල්ලාහු අක්බර් - අල්ලාහ්

අතිශ්‍රේෂ්ඨය- යැයි පවසන) සෑම තක්බීරයක්ම දානයකි. (අල්හම්දුලිල්ලාහ් - සියල පැසසුම් අල්ලාහ්ටය- යැයි පවසන) සෑම තහ්මීදයක්ම දානයකි. (ලා ඉලාහ ඉල්ලල්ලාහ් - නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නැත යැයි පවසන) සෑම තහ්ලීලයක්ම දානයකි. යහපත විධානය කිරීමත් දානයකි. පිළිකුල් සහගත දැයින් වැළැක්වීමත් දානයකි. නුඹලා අතර කෙනෙකු (නිත්‍යානුකූල ව) කාමයේ හැසිරීම ද දානයකි." යැයි පවසා සිටියහ.

එවිට ඔවුහු: 'අල්ලාහ්ගේ දූතයාණනි, අප අතරින් කෙනෙකු ඔහුගේ කාමය සංසිඳුවා ගැනීමට පැමිණෙයි. එහි දී ඔහුට කුසල් හිමි වන්නේ දැ?'යි විමසා සිටියහ.

එතුමාණන්: "තහනම් දැහි ඔහු එය (කාමය) සංසිඳුවා ගත්තේ නම් ඔබ දකින පරිදි එය බරපතල පාපයක් නොවන්නේ ද? එමෙන්ම ඔහු එය අනුමත දැහි සංසිඳුවා ගත් විට ඔහුට කුසලක් හිමි වන්නේය.

මෙම හදීසය මුස්ලිම් විසින් වාර්තා කර ඇත.

***

## -විග්‍රහය-

මෙම හදීසයේ සහාබාවරුන්, තමන්ට සිදු කළ නොහැකි වූ තමන් හැර සෙසු අය විසින් සිදු කරනු ලබන යහපත් ක්‍රියාවන් හා එය සිදු කිරීමට පාදක වූ හේතූන් පිළිබඳ පසුතැවිලි වී ඇති බව පෙන්වා දෙයි.[203]

203. ස්ථාවරය වනුයේ: තම ආගමික කටයුතු වලදී තමන්ට ඉහළින් සිටින තැනැත්තා දෙස බලන්නා දියුණු වීම හා තම මෙලොව කටයුතුවලදී තමන්ට පහළින් සිටින තැනැත්තන් දෙස බලන්නා ස්වල්ප දෙයින් තෘප්තියට පත්වීමයි. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්-තරීෆි)

මෙම හදීසයේ ධනවත් අය -ඔවුන්ගේ ධනය- දන්දීමෙන් ඔවුනට ලැබෙන දානයේ මහිමය සැබැවින්ම දිළිඳු සහාබාවරු තමන්ටත් ලැබිය යුතු යැයි ආශා කළහ. එවිට නබි (ﷺ) තුමාණන් දන්දීමට ඔවුන්ටත් හැකි බව පෙන්වා දුන්හ.

බුහාරි හා මුස්ලිම් හි සඳහන් අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් ලබා අබූ සාලිහ් විසින් වාර්තා කරන ලද හදීසයක් මෙසේ සඳහන් වී ඇත. ‘මක්කාවේ සිට මදීනාවට නික්ම ගිය මුහාජිර්වරුන් අතර සිටි දිළිඳු ජනතාව නබි (ﷺ) තුමාණන් වෙත පැමිණ: “ධනවත් උදවිය උසස් තරාතිරම්වලින් හා සදාතනික සැප පහසුකම්වලින් ඉදිරියට ගොස් ඇතැ”යි පැවසූහ. එවිට එතුමාණන්: ‘ඒ කුමක් දැ?’යි විමසා සිටියහ. ඔවුහු: අප සලාත් ඉටු කරන්නාක් මෙන් ඔවුන් ද සලාත් ඉටු කරති. අප උපවාසය රකින්නාක් මෙන් ඔවුන් ද උපවාසය රකිති. ඔවුහු දන් දෙති. නමුත් අපි දන් නොදෙමු. ඔවුන් වහලුන් නිදහස් කරති. නමුත් අපි වහලුන් නිදහස් නොකරමු.’ යැයි පැවසූහ. එවිට එතුමාණන්: “නුඹලා ව පසුකරගෙන ගියවුන් වෙත නුඹලාට ලඟා විය හැකි එමෙන්ම නුඹලාට පසුපසින් සිටින්නන් සමග නුඹලාට තරග වැදිය හැකි නුඹලා සිදු කරන දෑ මෙන් යමකු සිදු කරන්නේ නම් මිස නුඹලාට වඩා ශ්‍රේෂ්ඨ විය නොහැකි කරුණක් මම නුඹලාට කියා දිය යුතු නොවේ දැ?යි පැවසූහ. එවිට ඔවුහු: එසේය අල්ලාහ්ගේ දූතයාණනි, පිළිතුරු දුන්නෝය. එතුමාණන්: “සෑම සලාතයකටම පසුව තිස්තුන් වාරයක් බැගින් නුඹලා ‘සුබ්හානල්ලාහ්’ යනුවෙන් පවසා අල්ලාහ්ව සුවිශුද්ධ කරනු. අල්ලාහු අක්බර් යනුවෙන් පවසා අල්ලාහ්ව ශ්‍රේෂ්ඨත්වයට පත් කරනු. අල්හම්දු ලිල්ලාහ් යනුවෙන් පවසා අල්ලාහ්ව ප්‍රශංසාවට ලක් කරනු.” යැයි පැවසූහ. අබූ සාලිහ් තුමා තවදුරටත් මෙසේ පවසා සිටියහ. ‘දිළිඳු මුහාජිර්වරු නැවතත් අල්ලාහ්ගේ දූතයාණන් වෙත පැමිණ: ‘අප සිදු කරන දේ අපගේ සහෝදර ධනවත් උදවියද දැන, එලෙසම ඔවුන් ද කටයුතු කරන බව අපට දැනගන්නට ලැබී ඇත.’ යැයි පැවසුවෝය. එයට එතුමාණන්: ‘එය අල්ලාහ්ගේ භාග්‍යයයි. ඔහු කැමති උදවියට එය පිරිනමනු ඇත.”[204]

මෙහි අර්ථය වනුයේ: මුදලින් හැර වෙනත් දෙයකින් දානයක් කළ නොහැකි බව දිළිඳු ජනයා සිතා සිටියහ. ඒ සඳහා ඔවුනට හැකියාවක් නොතිබිණ. එවිට

204. බුහාරි (842), මුස්ලිම් (95).

නබි (ﷺ) තුමාණන් සියලුම ආකාරයේ යහපත් ක්‍රියාවන් හා සියලුම ආකාරයේ උපකාරයන් දානයක් වන බව ඔවුනට දන්වා සිටියහ.

ධනයෙන් තොර දානය වර්ග දෙකකි.

ඒ දෙකින් පළමුවැන්න: මැවීම් වෙත දක්වන යහපත් උපකාරයන් ඇතුළත් වන දෑය. එය ඔවුනට දානයක් වනු ඇත. ඇතැම් විට ධනයෙන් සිදු කරන දානයට වඩා උතුම් විය හැක. එය යහපත විධානය කිරීම පිළිකුල් සහගත දැයින් වැළැක්වීම යනාදිය පෙන්වා දිය හැක. සැබැවින්ම එය අල්ලාහ්ට අවනත වීම වෙත ඇරයුම් කිරීමකි. එමෙන්ම ඔහුට පිටුපෑමෙන් වැළැක්වීමකි. එය ධනයෙන් ලැබෙන ප්‍රයෝජනයට වඩා උතුම් වන්නේය. එමෙන්ම ප්‍රයෝජනවත් දැනුම ඉගැන්වීම, අල් කුර්ආනය කියවීමට ඉගැන්වීම, මාර්ගයේ ඇති හානිදායක දෑ ඉවත් කිරීම, මිනිසුනට ප්‍රයෝජන ගෙන දෑ දැහි යුහුසුළුව කටයුතු කිරීම. ඔවුනට ඇති වන පීඩාවන් ඉවත් කිරීම වැනි දෑ ද ඒ හා සාමනය. එමෙන්ම මුස්ලිම්වරුන් වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීමත් ඔවුන් වෙනුවෙන් සමාව අයැද සිටීමත් එයට අදාළ වන්නේය.

දානයේ වර්ග අතුරින් ජනයාට අත්වන පීඩාවන් වැළැක්වීම ද එකකි. අබූ දර් විසින් වාර්තා කළ බුහාරි හා මුස්ලිම්හි සඳහන් හදීසයක් මෙසේය. එතුමා: 'අල්ලාහ්ගේ දූතයාණෙනි, ක්‍රියාවන් අතුරින් උතුම්ම ක්‍රියාව කුමක්දැ?යි මම එතුමාණන්ගෙන් විමසා සිටියෙමි. එවිට එතුමාණන්: "අල්ලාහ්ව විශ්වාස කිරීමත්, අල්ලාහ්ගේ මාර්ගයේ ජිහාද් -අරගල- කිරීමත් වේ" යැයි පවසා සිටියහ. 'වහලුන් නිදහස් කිරීමෙන් වඩාත් උතුම් වන්නේ කුමක්දැ?යි විමසා සිටියෙහි. ඔවුහු: "ඔවුන් සතු උදවිය ළඟ ඇති වඩාත් වටිනා අය හා මිලෙන් වඩාත් අධික අය වෙති යැයි පැවසූහ." මට එය ඉටු කිරීමට නොහැකි වී නම් යැයි විමසා සිටියෙමි. එතුමාණන්: 'යමක් සිදු කරන කෙනෙකුට උපකාර කිරීම හෝ කිසිවක් කර කියාගත නොහැකි කෙනෙකුට ඔබ යමක් කිරීම" යැයි පවසා සිටියහ. මම: අල්ලාහ්ගේ දූතයාණනි, ඇතැම් ක්‍රියාවන් සිදු කිරිමට මට අපොහොසත් වූයේ නම් ඔබ කුමක් සිතන්නෙහි ද? ඔහු: 'ඔබේ නපුරුකමින් මිනිසුන් වළක්වන්න. සැබැවින්ම එය දානයකි.[205]

205. බුහාරි (2518), මුස්ලිම් (84)

මිනිසෙකු තම පවුල වෙනුවෙන් වියදම් කිරීම සදකාවක් යැයි පවසනු ලැබූ සහීහ් හදීස් ද පැමිණ ඇත. නබි (ﷺ) තුමාණන් පැවසූ බවට අබූ හුරෙය්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලද හදීසයක් සහීහ් මුස්ලිම්හි මෙසේ සඳහන් වී ඇත. "අල්ලාහ්ගේ මාර්ගයේ ඔබ වියදම් කරන දීනාරයකි. වහලුන් නිදහස් කිරීමේ දී ඔබ වියදම් කරන දීනාරයකි. දුගියන් වෙනුවෙන් ඔබ දන් දෙන දීනාරයකි. ඔබේ පවුල වෙනුවෙන් වියදම් කරන දීනාරයකි. මේවා අතුරින් වඩාත් උතුම් වන්නේ ඔබේ පවුල වෙනුවෙන් වියදම් කරන දෑය" යනුවෙන් එතුමාණෝ පවසා ඇත්තාහ.206

මෙම අදහසින් යුත් දීර්ඝ ලෙස සඳහන් වන හදීස් බොහෝමයක් ඇත.

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බව අනස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් බුහාරි හා මුස්ලිම්හි මෙසේ සඳහන් වේ. 'යම් කිසි මුස්ලිම්වරයකු පැලයක් සිටුවා එසේ නැතහොත් වගාවක් වගා කර මිනිසෙකු හෝ පක්ෂියකු හෝ සතෙකු හෝ ඉන් අනුභව කරන්නේ නම් ඔහුට එය දානයක් වනු මිස නැත"207

මුදලින් තොර දෙවන වර්ගයේ සදකාව -දානය- වනාහි: දික්ර් හි වර්ග මෙන් එය සිදුකරන්නා වෙත පමණක් සීමා කරමින් ප්‍රයෝජනය ගෙන දෙන දෑය.

මෙහිදී සලාතය, උපවාසය, හජ් වන්දනාව, ජිහාදය වැනි දෑ සදකාවක් බව සඳහන් කර නැත. සැබැවින්ම මෙසේ සිහිපත් කර ඇත්තේ දිළිඳුන්ගේ ප්‍රශ්නයට පිළිතුරක් වශයෙනි. ඔවුන් එසේ ප්‍රශ්න කර සිටියේ ධනවතුන් තම ධනය මුල් කර ගෙන අමතර දැයක් ක්‍රියාවට නැංවූ හෙයිනි. ෆරාඉල් හෙවත් අනිවාර්යය කටයුතුවලදී ඔවුන් සියලු දෙනාම එකසේ එහි සහභාගී වූහ.

***

සදකාවට හා සෙසු ක්‍රියාවන්ට වඩා දික්ර් කිරීම උතුම් බව සඳහන් කරමින් හදීස් පෙළක්ම පැමිණ ඇත. නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බව අබූ දර්දා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ එවැනි හදීසයක් මෙසේය.

206. මුස්ලිම් (995)
207. බුහාරි (2320), මුස්ලිම් (1553)

“නුඹලාගේ ක්‍රියාවන් අතුරින් උතුම් වූ ද නුඹලාගේ හිමිකරුවාණන් අබියස වඩාත් පිවිතුරු වූ ද නුඹලාගේ තරාතිරම් වඩාත් උසස් කරන්නා වූ ද නුඹලා රන් හෝ රිදී දෑ වියදම් කිරීමට වඩා උතුම් වූ ද නුඹලාගේ සතුරන් නුඹලා මුණ ගැසී ඔවුන්ගේ ගෙලට පහර දී ඔවුන් ද නුඹලාගේ ගෙලට පහර දීමට වඩා ශ්‍රේෂ්ට වූ ක්‍රියාවක් මම නුඹලාට දැනුම් දෙන්නදැ?යි නබි (ﷺ) තුමාණන් විමසා සිටියහ. ඔවුහු ‘එසේය’ අල්ලාහ්ගේ දූතයාණනි, යැයි පිළිතුරු දුන්හ. එතුමාණන් ‘එය අල්ලාහ්ව දික්ර් කිරීමය. (මෙනෙහි කිරීමය) යැයි පවසා සිටියහ. මෙය ඉමාම් අහ්මද් හා තිර්මිදි විසින් වාර්තා කර ඇත.[208]

මෙම අර්ථයෙන් යුත් විවිධාකාර හදීස් බොහෝමයක් ඇත.

***

208. අහ්මද් (5/195), තිර්මිදි (3377), එතුමා අමතර වශයෙන්: මුආද් ඉබ්නු ජබල් (රළියල්ලාහු අන්හු) තුමා ‘අල්ලාහ්ව දික්ර් කිරීමට වඩා අල්ලාහ්ගේ දඬුවමින් ආරක්ෂා කරන වෙනත් කිසිවක් නැත’ යැයි පැවසූ බව සඳහන් කරයි. ඉමාම් අල්හාකිම් තුමා ද එය සහීහ් වාර්තාකරණයක් බව පවසන අතරම. ඉමාම් අල් මුන්දිරිතුමා එම වාර්තාකරණය හසන් ගණයට අයත් බව සඳහන් කරයි. ඉමාම් අල් අල්බානී තුමා ‘සහීහ් අත්-තර්ගීබ්’හි (1493) මෙය සහීහ් ගණයට අයත් හදීසයක් බව පවසා ඇත.

## الحَدِيْثُ السَّادِسُ والعِشْرُونَ

## විසි හය වන හදීසය

عَنْ أَبِي هُرَيْرَةَ، رَضِيَ اللهُ عَنْهُ قَالَ: قَالَ رَسُولُ اللهِ ﷺ:

"كُلُّ سُلَامَى مِنَ النَّاسِ عَلَيْهِ صَدَقَةٌ، كُلَّ يَوْمٍ تَطْلُعُ فِيهِ الشَّمْسُ: تَعْدِلُ بَيْنَ اثْنَيْنِ صَدَقَةٌ، وَتُعِينُ الرَّجُلَ فِي دَابَّتِهِ، فَتَحْمِلُهُ عَلَيْهَا، أَوْ تَرْفَعُ لَهُ عَلَيْهَا مَتَاعَهُ صَدَقَةٌ، وَالْكَلِمَةُ الطَّيِّبَةُ صَدَقَةٌ، وَبِكُلِّ خُطْوَةٍ تَمْشِيهَا إِلَى الصَّلَاةِ صَدَقَةٌ، وَتُمِيطُ الْأَذَى عَنِ الطَّرِيقِ صَدَقَةٌ."

رَوَاهُ الْبُخَارِيُّ وَمُسْلِمٌ.

අල්ලාහ්ගේ දූතයාණන් ප්‍රකාශ කළ බවට අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී.

“මිනිසාගෙන් වූ සෑම පුරුකකටම හිරු උදාවන සෑම දිනකම ඒ සඳහා දිය යුතු දානයක් ඇත: දෙදෙනෙකු අතර සමතය ඇති කිරීම දානයකි. මිනිසකු තම වාහනයේ නංවා ප්‍රවාහනය කිරීම හෝ ඒ මත ඔහුගේ බඩුබාහිරාදිය පටවා ගෙන යෑම ද දානයකි. ප්‍රිය වචනය ද දානයකි. සලාතය වෙත ගමන් කරන සෑම පියවරකින්ම දානයක් ඇත. මාර්ගයේ ඇති හානිදායක දෑ ඉවත් කිරීම ද දානයකි.

මෙම හදීසය බුහාරි හා මුස්ලිම් විසින් දන්වා ඇත.

***

-විග්‍රහය-

“මිනිසාගෙන් වූ සෑම පුරුකකටම හිරු උදාවන සෑම දිනකම ඒ සඳහා දිය යුතු දානයක් ඇත: යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

අබූ උබය්ද් තුමා මෙසේ පවසයි: පුරුක යන තේරුම ලබා දී ඇති 'අස් - සුලාමා' යන අරාබි පදය මූලික වශයෙන්: "ඔටුවාගේ විළුඹෙහි ඇති අස්ථියට කියනු ලැබේ. ඒ අනුව මෙම හදීසයේ තේරුම ආදම්ගේ දරුවා සතුව ඇති අස්ථිවලින් සෑම අස්ථියකටම දානයක් ඇති බව පවසනවාක් මෙන් පෙනේ.

නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බව ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් වාර්තා කළ හදීසයක් ඉමාම් මුස්ලිම් තුමා මෙසේ පළ කර ඇත. "ආදම්ගේ දරුවා පුරුක් තුන්සිය හැටක් මත මවනු ලැබ ඇත. කවරෙකු එම පුරුක් තුන්සිය හැටක ප්‍රමාණයේ තරමට අල්ලාහ්ව මෙනෙහි කර, අල්ලාහ් පැසසුමට ලක් කර, නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නොමැති බව අල්ලාහ් පිළිබඳ විශ්වාසය දරා, අල්ලාහ්ව සුවිශුද්ධ කොට, මුස්ලිම්වරුන්ගේ මාර්ගයේ ඇති බාධකයක් ඉවත් කර, එසේ නැතිනම් කටු පඳුරුක් හෝ ඇට කටුවක් හෝ ඉවත් කර, යහපත විධානය කර, පිළිකුල් සහගත දැයින් වළක්වා, සවස් කාලයට එළැඹෙන්නේ ද සැබැවින්ම ඔහු ඔහුගේ ආත්මය නිරා ගින්නෙන් දුරස් කර ගත්තේය."[209]

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බවට බුරය්දා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් ඉමාම් අහ්මද් හා අබූ දාවූද් විසින් මෙසේ පළ කර ඇත. "මිනිසා තුළ පුරුක් තුන්සිය හැටක ප්‍රමාණයක් ඇත. ඒ සෑම පුරුකක් සඳහාම දානයකින් දන් දීම ඔහු සතු යුතුකමකි" යැයි එතුමාණන් පැවසූහ. ඔවුහු: 'අල්ලාහ්ගේ නබිවරයාණෙනි, එයට ශක්තිය දරනුයේ කවුරුන්ද?'යි ඔවුහු විමසා සිටියෝය. එතුමාණන්: "මස්ජිදය තුළ දමන කෙළ වළ දැමීම, යමක් මාර්ගයේ ඇත්නම් එය ඉවත් කිරීම එසේ ඔබට නොලැබුණේ නම්, ලුහා රකආත් දෙකක් ඉටු කිරීම ඔබට ප්‍රමාණවත් වනු ඇත." යැයි පවසා සිටියහ.[210]

නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බව අබූ මූසා තුමා විසින් වාර්තා කරන ලද හදීසයක් බුහාරි හා මුස්ලිම්හි මෙසේ සඳහන් වේ. "සෑම මුස්ලිම්වරයකු මතම දානයක් ඇත." ඔවුහු: ඔහු එය නොලැබුවේ නම් යැයි විමසා සිටියහ. එතුමාණන්: "ඔහු තම දෑතින් වැඩක් කර තමන්ටම යහපතක් කර දානයක් ඉටු කරත්වා." යැයි

209. මුස්ලිම් (1007)

210. අහ්මද් (5/354), අෂ්-ෂෙයික් අල් අල්බානි තුමා 'සීහීහ් අත් තර්ගීබ්'හි මෙය සහීහ් ගණයට අයත් හදීසයක් බව සඳහන් කර ඇත.

පැවසූහ. ඔවුහු එයට හැකියාවක් නොමැති නම් හෝ එය සිදු කළ නොහැකි නම්? යැයි විමසා සිටියෝය. එතුමාණන්: "ඔහු අසරණ අවශ්‍යතා ඇත්තන් හට උපකාර කරත්වා" යැයි පැවසූහ. එයද සිදු කළ නොහැකි නම් යැයි විමසුවෝය. එතුමාණන්: "ඔහු යහපත විධානය කරත්වා" යැයි පැවසූහ. ඔවුහු: එය ද සිදු කළ නොහැකි නම් යැයි විමසුවෝය. එතුමාණන්: "අයහපතින් වැළකී සිටිත්වා සැබැවින්ම එය ඔහුට දානයක් වන්නේය." යැයි පැවසූහ.[211]

***

හදීසයේ තේරුම: මෙම අස්ථි හා ඒවායෙහි පුරුක් එකිනෙක බැඳී තිබීම අල්ලාහ් තම ගැත්තාට පිරිනමා ඇති අතිමහත් ආශිර්වාද වලින් එකකි. එහෙයින් ඒ සෑම අස්ථියක් සඳහාම ආදම්ගේ දරුවන් දන් දෙන සදකාවක අවශ්‍යතාවක් ඇත්තේය. එය එම ආශිර්වාදයට කෘතඥවීමක් වශයෙන් පිහිටනු පිණිසය.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: "අහෝ මිනිස, ත්‍යාගශීලී වූ නුඹගේ පරමාධිපති පිළිබඳව නුඹව රවටා දැමුවේ කුමක් ද?. ඔහු කවරෙකු ද යත් නුඹව මවා පසුව නුඹව නිසි අයුරින් හැඩ ගස්වා පසුව නුඹව නිසි ලෙස සැකසුවේය. කවර හැඩයක් ඔහු අභිමත කළේ ද ඒ අයුරින්ම නුඹව පිළියෙල කළේය." (සූරා අල් ඉන්ෆිතාර්: 6-8), තවත් පාඨයක "නුඹලාව නිර්මාණය කර නුඹලාට ශ්‍රවණ ද දෘෂ්ටි ද හදවත් ද ඇති කළේ ඔහුමය. නුඹලා කෘතඥ වනුයේ අල්ප මාත්‍රයකි" යැයි (නබිවරය,) පවසවූ." (සූරා අල් මුල්ක්: 23). තවත් පාඨයක: "නුඹලා කිසිවක් නොදැන සිටිය දී නුඹලාගේ මව්වරුන්ගේ කුසෙන් අල්ලාහ් නුඹලාව පිට කළේය. තවද නුඹලා කෘතඥ වනු පිණිස නුඹලාට ශ්‍රවණ ද දෘෂ්ටීන් ද හදවත් ද ඔහු ඇති කළේය." (සූරා අන්-නහ්ල්: 78). තවත් පාඨයක: "අපි ඔහුට ඇස් දෙකක් දිවක් හා තොල් දෙකක් ඇති නොකළෙමු ද?" (සූරා අල් බලද්: 8,9)

කෘතඥ වීම තරාතිරම් දෙකක් මත පවතී.

211. බුහාරි (5676)

පළමුවැන්න: අනිවාර්යය කෘතඥතාවයි: එනම් අනිවාර්යය කටයුතු ඉටු කරමින් තහනම් දැයින් වැළකී සිටීමයි. එය අවශ්‍යම කටයුත්තකි. එම ආශිර්වාදයට කෘතඥවීමට එය ප්‍රමාණවත් වන්නේය.

දෙවන තරාතිරම: සතුටුදායක කෘතඥතාවයි: එනම් -අනිවාර්ය කටයුතු ඉටු කිරීමෙන් හා තහනම් කරන ලද දැයින් වැළකී සිටීමෙන් පසු- අමතර වශයෙන් අවනත වීම් කටයුතු ගැත්තා විසින් ඉටු කිරීමයි. නබි (ﷺ) තුමාණන් සලාතයේදී එලෙස කැපවීමෙන් කටයුතු කර ඇත්තාහ. එතුමාණන්ගේ දෙපා ඉදිමෙන තරමටම එය විය. එවිට: ඔබ පෙර සිදු කළ හා පසු සිදු කළ පාපකම්වලට සමාව දෙනු ලැබ තිබියදී ඔබ මෙය කරන්නෙහි දැ'යි එතුමාණන්ගෙන් විමසන ලදී. එවිට, එතුමාණන්. "මම කෘතවේදී ගැත්තෙකු විය යුතු නොවේදැ?යි පවසා සිටියහ.[212]

නබි (ﷺ) තුමාණන් සදකා වශයෙන් අපට පෙන්වා දී ඇති වර්ග මේවාය. ඒ අතරින් පුනරුත්තාපනය, ප්‍රිය වචනය, මාර්ගයේ ඇති හිංසාකාරී දෑ ඉවත් කිරීම, යහපත නියෝග කිරීම, පිළිකුල් දැයින් වැළැක්වීම යනාදී කෙනෙකුට සෙත සලසන දෑ ද ඇත. එමෙන්ම තස්බීහ්, තක්බීර්, තහ්මීද්, තහ්ලීල්, සලාතය වෙත පිය නැගීම, ලුහා හි රකආත් දෙක ඉටු කිරීම වැනි තමන්ට ප්‍රයෝජනවත් දෑ මත පමණක් සීමා වන දෑ ද ඇත. මෙම කරුණු දෙක (ඉහත කී) ඒ සියලු දැයින් වෙන් කර ගත් කොටස් දෙකකි. සලාතය තුළ ගැතිකමෙහි හා අවනතභාවයෙහි ශරීර අවයව සියල්ල භාවිත කෙරේ. එවිට එම අවයව සුවපත්ව තිබීමේ ආශිර්වාදය සඳහා කෘතඥවීමට එය ප්‍රමාණවත් වන්නේය. සඳහන් කරන ලද සෙසු කරුණු විශේෂයෙන් ශරීර අවයව කිහිපයක් පමණක් බෙහෙවින් භාවිතා කරන කරුණු වන්නේය. ශරීරයේ පවතින පුරුක්වල ප්‍රමාණයට එය ගෙන එන තෙක් එයින් පමණක් සදකාව සම්පූර්ණ වන්නේ නැත. ආඉෂා තුමිය තම පියාගෙන් ලබා වාර්තා කළ හදීසයට අනුව එය පුරුක් තුන්සිය හැටකි.

***

212. බුහාරි (1130), මුස්ලිම් (2819)

එය ඉටු කරන පුද්ගලයා මත පමණක් සීමා කරන සදකා වර්ග අතරින් දික්ර් වර්ග, නබි (සල්) තුමා වෙත ආශිර්වාද පැතීම (සලවාත් පැවසීම), අල් කුර්ආනය පාරායනය කිරීම ඇතුළත් වනු ඇත.

ඒවායින්: පෙර කළ ක්‍රියාවන් පිළිබඳ ස්වයං විවේචනය, පෙර කළ පාපකම් පිළිබඳ පසුතැවිලි වීම, සමාව ඇයද සිටීම, ඒ පිළිබඳ දුක්වීම, තම ආත්මය පහත් කොට ඒ මත දොස් පවරා ගැනීම, අල්ලාහ්ට බියෙන් ඇඬීම, අහස් හා මහපොළොවේ ආධිපත්‍යය ගැනත් මතුලොව කටයුතු පිළිබඳවත් පරිශීලනය කිරීම වැනි සිතෙහි දේව විශ්වාසය වර්ධනය කරන දෑ ද ඇතුළත් වන්නේය. භක්තිය, ආදරය, අපේක්ෂාව, පැවරුම හා හදවත හා බැඳුණු එවැනි ක්‍රියාකාරකම් බොහෝමයක් එමගින් හට ගන්නේය.

'සැබැවින්ම මෙලෙස සිතා බලා කටයුතු කිරීම අමතර ශාරීරික ක්‍රියාකාරකම් අතරින් උතුම් වන්නේය' යැයි පවසනු ලැබ ඇත. මේ පිළිබඳ තාබිඊන්වරුන් අතරින් බොහෝ දෙනෙක් ද වාර්තා කර ඇත. සඊද් ඉබ්නු අල් මුසය්යිබ්, අල් හසන්, උමර් ඉබ්නු අබ්දුල් අසීස්, වැන්නන් ඔවුන් අතරින් කිහිප දෙනෙකි. ඉමාම් අහ්මද්ගේ ප්‍රකාශයේ එය පෙන්වා දී ඇත. ඉමාම් කඃබ් තුමා: "අල්ලාහ්ගේ බිය හේතුවෙන් මා හඬා වැළපීම මාගේ බර ප්‍රමාණයට රත්රන් මා දන්දීමට වඩා මට ප්‍රියමනාප වන්නේය." යැයි පවසා ඇත.

***

## الحَدِيْثُ السَّابِعُ والعِشْرُونَ
## විසි හත් වන හදීසය

عَنِ النَّوَّاسِ بْنِ سَمْعَانَ عَنِ النَّبِيِّ ﷺ قَالَ:

"الْبِرُّ: حُسْنُ الْخُلُقِ، وَالْإِثْمُ: مَا حَاكَ فِي صَدْرِكَ، وَكَرِهْتَ أَنْ يَطَّلِعَ عَلَيْهِ النَّاسُ"

رَوَاهُ مُسْلِمٌ.

وَعَنْ وَابِصَةَ بْنِ مَعْبَدٍ قَالَ: "أَتَيْتُ رَسُولَ اللهِ ﷺ

فَقَالَ: "جِئْتَ تَسْأَلُ عَنِ الْبِرِّ وَالْإِثْمِ؟"

قُلْتُ: نَعَمْ، قَالَ: "اسْتَفْتِ قَلْبَكَ، الْبِرُّ: مَا اطْمَأَنَّتْ إِلَيْهِ النَّفْسُ، وَاطْمَأَنَّ إِلَيْهِ الْقَلْبُ، وَالْإِثْمُ: مَا حَاكَ فِي النَّفْسِ، وَتَرَدَّدَ فِي الصَّدْرِ، وَإِنْ أَفْتَاكَ النَّاسُ وَأَفْتَوْكَ."

قَالَ الشَّيْخُ رحمه الله حدِيثٌ حَسَنٌ، رويناه في مُسنَدَ الإمامين أحمد والدارمي، بإسناد حسنٍ

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බව අන්-නව්වාස් ඉබ්නු සම්ආන් තුමා විසින් වාර්තා කරන ලදී. “දැහැමිකම යනු: යහපත් සදාචාරයයි. පාපය යනු ඔබේ සිත තුළ හට ගැනෙන සැකයයි. ජනයා ඒ දෙස බැලීම ඔබ පිළිකුල් කරන්නෙහුය.”

මෙය ඉමාම් මුස්ලිම් විසින් දන්වා ඇත.

වාබිසා ඉබ්නු මඃබද් තුමා විසින් වාර්තා කරන ලදී. මම අල්ලාහ්ගේ දූතයාණන් වෙත පැමිණියෙමි. එවිට එතුමාණන්: “ඔබ දැහමි කම හා පාපය ගැන විමසන්නට පැමිණියෙහිදැ?”යි විමසා සිටියහ.

මම: ‘එසේය!’ යැයි පැවසුවෙමි. එතුමාණන්: ඔබේ හදවතින් විමසන්න. දැහැමිකම යනු: සිත ඒ ගැන සැනසුමට පත්වන දෑය. හදවත ඒ වෙත තැන්පත් වන දෑය. පාපය යනු: සිත තුළ සැකය ඇති කරන හදවතෙහි කුතුහලය ඇති කරන දෑය. ජනයා ඔබට තීන්දු කළ ද ඔබ ඔබෙන් තීන්දු පතන්න.

ෂෙයික් තුමා “මෙය හසන් ගණයට අයත් හදීසයක් බව පවසා ඇති අතර, අහ්මද් හා අද්දාරිමී යන ඉමාම්වරුන් දෙදෙනාගේ මුස්නද්වල හසන් ගණයට අයත් හදීසයක් බව වාර්තා කර ඇත්තෙමු. යැයි පවසා ඇත.[213]

***

## -විග්‍රහය-

නව්වාස් තුමා විසින් වාර්තා කළ හදීසයේ නබි (ﷺ) තුමාණන් ‘අල් බිර්’- දැහැමිකම- යන පදය විස්තර කර ඇත්තේ ‘යහපත් සදාචාරය’ යන්නෙනි. වාබිසා විසින් වාර්තා කළ හදීසයේ එතුමාණන් එය විස්තර කර ඇත්තේ සිත සහ හදවත තැන්පත් වන දෑ යන්නෙනි. එතුමාණන් ‘අල් බිර්’ යන පදය විස්තර කිරීමේදී එසේ වෙනස් වූ අදහස් පළ කර ඇත්තේ සැබැවින්ම එය පොදුවේ කරුණු දෙකක් මත සලකා බැලීමෙනි.

පළමුවැන්න: මැවීම් සමග ගනුදෙනු කිරීම හා ඔවුනට උපකාර කිරීම සලකා බැලීමෙනි. ඉබ්නු මුබාරක් තුමා ‘කිතාබ් අල් බිර් වස්සිලා’ යන නමින් කෘතියක් ලියා ඇති අතර ‘සහීහ් අල් බුහාරි’ හා ‘ජාමිඋත් තිර්මිදි’ යන ග්‍රන්ථවල ‘කිතාබුල් බිර් වස්සිලා’ යන මැයෙන් මාතෘකාවක් ද ඇත. පොදුවේ මැවීම් සමග යහපත් අයුරින් කටයුතු කිරීම පිළිබඳ එහි ඇතුළත්ව ඇත.

ඉබ්නු උමර් තුමා: දැහැමිකම යනු සැහැල්ලු ක්‍රියාවකි, නිදහස් ස්වරූපයකි එමෙන්ම මෘදු කතාවකි’ යනුවෙන් පවසන්නෙකු විය.

213. මෙය මෑලූල් ගණයට අයත් ප්‍රකාශයකි. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්-තරීෆි)

අල් බිර් යන අර්ථයෙහි දෙවැනි අදහස වනුයේ: එමගින් බාහිර මෙන්ම අභ්‍යන්තර සියලු අවනත වීමේ ක්‍රියාවන් ඉටු කරනු ලැබීම අපේක්ෂා කෙරෙයි. උත්තරීතර අල්ලාහ් එය මෙසේ ප්‍රකාශ කර සිටියි: "...එනමුත් යහකම (ඇත්තන්) නම්, අල්ලාහ්ව ද පරමාන්ත දිනය ද මලක්වරුන් ද ධර්ම පුස්තකය ද නබිවරුන් ද විශ්වාස කරන්නන්ය. තවද ධනය තමන් (එය) ඇලුම් කළ ද සමීපතයින්ට(ඥාතීන්ට) ද අනාථයින්ට ද දුගියන්ට ද මගීන්ට ද යාචකයින්ට ද (නිදහස තහවුරු වූ) වහලුන්ට ද පිරිනමන්නන්ය. තවද සලාතය ස්ථාපිත කර zසකාතය පිරිනමන්නන්ය. තවද යම් ප්‍රතිඥාවක් දුන් විට තම ප්‍රතිඥාව ඉෂ්ට කරන්නන්ය. තවද සැබැවින්ම දිළිඳුකම හා පීඩාදායික අවස්ථාවන්හි ද යුද අවස්ථාවන්හි ද ඉවසීමෙන් සිටිනවුන්ය. ඔවුහු සත්‍යය පවසන්නෝය. තවද ඔවුහුමය බිය බැතිමත් වූවෝ." (සූරා අල් බකරා: 177)

මෙම අර්ථයට අනුව 'අල්-බිර්- යහකම තුළ අල්ලාහ් ඔහුගේ මලක්වරුන් ඔහුගේ ආගම් ඔහුගේ දූතවරුන් විශ්වාස කිරීම වැනි අභ්‍යන්තර සියලු අවනතවීම් හා ධනය වියදම් කිරීම, සලාතය විධිමත්ව ඉටු කිරිම, සකාත් නිකුත් කිරීම, පොරොන්දු ඉෂ්ට කිරීම, රෝගාබාධ හා දිළිඳුකම වැනි පෙර නියමයන් මත ඉවසීම, සතුරන් හමුවන මොහොතේ ඉවසීම යනා දී සියලුම බාහිර අවනතවීම් ද ඇතුළත් වෙයි.

නව්වාස් තුමා විසින් වාර්තා කළ හදීසයේ මේ සියලු කරුණු ඇතුළත් වන පරිදි නබි (ﷺ) තුමාගේ පිළිතුරු පිහිටින. ඊට හේතුව සැබැවින්ම යහපත් සදාචාරය තුළින් අපේක්ෂා කරනු ලබනුයේ: ආගමික හැදියාවන්ට අනුව හැඩ ගැසීම හා අල්ලාහ් කවර කරුණක් තම පුස්තකයේ ගැත්තන් හට විනයක් ලෙස පෙන්වා ඇත්තේ ද එවන් විනයන් පිළිපැද විනයානු කූල ජීවිතයක් ගත කිරීමයි.

***

නව්වාස් තුමා විසින් වාර්තා කළ හදීසයේ සඳහන් "පාපය යනු ඔබේ සිත තුළ හට ගැනෙන සැකයයි. ජනයා ඒ දෙස බැලීම ඔබ පිළිකුල් කරන්නෙහුය." යන ප්‍රකාශය වනාහි:

සැබැවින්ම 'අල්-ඉස්ම්'-පාපය- යනු වැරුද්දක්, පීඩනයක්, කුතුහලයක්, තිගැස්මක් හදවත තුළ බලපෑම් කරන දෑ වන අතර හදවත ඒ සඳහා විවෘතව

පවතින්නේ නැත. ඒ සමගම ජනයා ඒ ගැන සොයා බලන විට ඔවුන් එය පිළිකුල් කරන තරමට ඔවුන් අතර එය පිළිකුල් සහගත කරුණක් වන්නේය. සැකයක් ඇති වූ මොහොතක පාපය හඳුනාගැනීමේ පියවර අතරින් උසස්ම පියවරයි. එනම්: එය සිදු කළ අය හා එය සිදු නොකළ අය මත ජනයා පිළිකුල් කරන දෑය.

***

වාබිසා සහ අබූ සඃලබා විසින් වාර්තා කළ හදීසයේ සඳහන් "ජනයා ඔබට තීන්දු කළ ද" යන ප්‍රකාශය වනාහි:

එහි අදහස: සැබැවින්ම මිනිසාගේ හදවත තුළ සැකය ඇති කරන දෑ වනාහි, එය පාපයකි. සැබැවින්ම එය පාපයක් නොවන බව වෙනත් කිසිවකු විසින් ඔහුට තීන්දු දුන්නේ නම්, එවිට දෙවැනි පියවර ගත යුතුය. එනම්: වෙනත් කිසිවෙකු අබියස නොව එය සිදු කරන්නා අබියස එය පිළිකුල් සහගත ක්‍රියාවක් වීමයි. එය ද පාපයක් බව පෙන්වා දෙයි. සැබැවින්ම එසේ දකිනුයේ කවරෙකුගේ හදවත ඊමානයෙන් විවෘත ව පවතින්නේ ද එවන් අය පමණි. එසේ ඔහුට තීන්දු දුන් පුද්ගලයා තීන්දු දී ඇත්තේ කිසිදු ආගමික සාධකයකින් තොරව ඔහු සිතූ පරිදි එසේ නැතහොත් තෘෂ්ණාව වෙත ඔහු යොමු වෙමිනි. තීන්දු දෙන්නා තීන්දු දීමත් සමග ආගමික සාධකයක් එහි වූ විට තීන්දු පතන්නාගේ හදවත තුළ ඒ පිළිබඳ පැහැදිලිතාවක් නොතිබුණත් ඒ වෙත යොමු වීම ඔහුට අනිවාර්යය වන්නේය. උදාහරණ වශයෙන් ගමනක හෝ රොගී තත්ත්වයක උපවාසයෙන් මිදීම, ගමනේ දී සලාතය කෙටි කිරීම වැනි ආගමික සහන හා බොහෝ නූගතුන්ගේ හදවත් පැහැදිලි කර නොගත් මෙවැනි වෙනත් දෑ පෙන්වා දිය හැක. මෙයට වෙනත් කියමනක් නැත.

සමස්තයක් ලෙස බැලූ කල, කවර කරුණක් සම්බන්ධයෙන් සාක්ෂි හා සාධක පැමිණ ඇත්තේ ද අල්ලාහ්ට හා ඔහුගේ දූතයාණන්ට අවනත වීම මිස දේව විශ්වාසියාට වෙනත් මගක් නැත. එය විවෘත හදවතින් හා පිළිගැනීමෙන් එයට මුහුණ දීම අවශ්‍ය වන්නේය. සැබැවින්ම අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් ආගමානුගත කළ දෑ වනාහි, ඒ පිළිබඳ විශ්වාස කිරීමත් එය පිළිගැනීමත් එයට යටත්වීමත් අනිවාර්යය වන්නේය. අල්ලාහ්ගෙන් හෝ ඔහුගේ දූතයාණන්ගෙන් කිසිදු සාධකයක් නොවූ කල, එමෙන්ම සහාබාවරුන් හා සමූහයාගේ මුල් කාලීනයන් ඒ ගැන කිසිදු තීන්දුවක් ලබා දී

නොමැති කල -දෙවියන් විශ්වාස කිරීමෙන් ප්‍රඥාවේ හා යථාර්ථයේ ආලෝකය තම හදවත තුළ තැන්පත් කරගත්- මුඃමින්වරයාගේ සිත තුළට ඉන් යමක් පහළ වූ විට, දුටු සැක සහිත දෑ ඔහුගේ හදවත තුළ වද දුන් විට, දැනුමෙන් හා දහමින් විශ්වාස කළ නොහැකි, තම අදහස් අනුව තොරතුරු දන්වා සිටින්නන් මිස සහනය සඳහා ඒ ගැන තීන්දු දෙන වෙනත් කිසිවකු ඔහුට හමු නොවූයේ නම්, එවන් තීරකයින් ඔහුට තීන්දු දුන්න ද එම මුඃමින්වරයා තම හදවත තුළ වද දුන් දෑ වෙත යොමු විය යුතු වේ.

***

## الحَدِيْثُ الثَّامِنُ والعِشْرُونَ

## විසි අට වන හදීසය

عَنِ الْعِرْبَاضِ بْنِ سَارِيَةَ رَضِيَ اللهُ عَنْهُ قَالَ: «وَعَظَنَا رَسُولُ اللهِ ﷺ مَوْعِظَةً، وَجِلَتْ مِنْهَا الْقُلُوبُ، وَذَرَفَتْ مِنْهَا الْعُيُونُ، فَقُلْنَا: يَا رَسُولَ اللهِ، كَأَنَّهَا مَوْعِظَةُ مُوَدِّعٍ، فَأَوْصِنَا!

قَالَ: "أُوصِيكُمْ بِتَقْوَى اللهِ، وَالسَّمْعِ وَالطَّاعَةِ، وَإِنْ تَأَمَّرَ عَلَيْكُمْ عَبْدٌ، فَإِنَّهُ مَنْ يَعِشْ مِنْكُمْ بَعْدِي فَسَيَرَى اخْتِلَافًا كَثِيرًا، فَعَلَيْكُمْ بِسُنَّتِي وَسُنَّةِ الْخُلَفَاءِ الرَّاشِدِينَ المَهْدِيِّينَ، عَضُّوا عَلَيْهَا بِالنَّوَاجِذِ، وَإِيَّاكُمْ وَمُحْدَثَاتِ الْأُمُورِ، فَإِنَّ كُلَّ بِدْعَةٍ ضَلَالَةٌ"

رَوَاهُ أَبُو دَاوُدَ وَالتِّرْمِذِيُّ، وَقَالَ حَدِيثٌ حَسَنٌ صَحِيحٌ.

අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) තුමා ප්‍රකාශ කළ බවට අල් ඉර්බාල් ඉබ්නු සාරියා තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. අල්ලාහ්ගේ දූතයාණෝ (ﷺ) අපට උපදෙසක් දුන්හ. එයින් හදවත් තිගැස්සී ගියේය. ඇස් කඳුළු සලන්නට විය. එවිට අපි: 'අල්ලාහ්ගේ දූතයාණෙනි, මෙය සමු ගැනීමේ උපදෙසක් මෙන් පෙනේ. එහෙයින් අපට උපදෙස් දෙන්නැ'යි පවසා සිටියෙමු.

එතුමාණන්: අල්ලාහ්ට බැතිමත් වීම, සවන් දීම හා අවනත වීම යනාදිය පිළිබඳ මම නුඹලාට උපදෙස් දෙමි. -වහලෙකු නුඹලා අතර නායකත්වයට පත්වූයේ නම්- සැබැවින්ම ඔහු නුඹලා අතර ජීවත්ව සිට බොහෝ මතභේද දකින්නේ නම් එවිට නුඹලා මාගේ පිළිවෙත හා යහමග ගිය මග පෙන් වූ නායකයින්ගේ පිළිවෙත පිළිපැදීම නුඹලා වෙත පැවරුනු යුතුකමක් වන්නේය. ඒවා වාර්වක දත්වලින් තදින් හපා ගන්න. අළුතින් බිහි වූ කටයුතු පිළිබඳ මම නුඹලාට අවවාද කරමි. අලුතින් බිහි වූ සෑම දෙයක්ම නොමග ගිය දෑය.'

මෙය අබූ දාවූද් තිර්මිදි විසින් වාර්තා කර ඇති අතර මෙය හසන් සහීහ් ගණයට අයත් හදීසයක් බව පවසා සිටියි.

***

## -විග්‍රහය-

මෙම හදීසය අහ්මද්, අබූ දාවූද්, තිර්මිදි සහ ඉබ්නු මාජා යන ඉමාම්වරු විසින් වාර්තා කර ඇත.

තිර්මිදි තුමා මෙය 'හසන් සහීහ්' ගණයට අයත් හදීසයක් බව පවසා සිටින අතරම අල් හාෆිල් අබූ නුඅය්ම් 'මෙය සිරියාවාසීන්ගේ සහීහ් හදීස් අතරින් වඩාත් ආරෝග්‍යමත් හදීසයකි' යැයි පවසා ඇත.

***

"අල්ලාහ්ගේ දූතයාණෝ (ﷺ) අපට උපදෙසක් දුන්හ." යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

නිරන්තරයෙන් සිදු කරනු ලබන ජුමුආ දේශනාව අවුරුදු දේශනාව වැනි දේශනාවන්ට අමතර ව නබි (ﷺ) තුමාණන් තම සහාබාවරුන් අතර අධික වශයෙන් දේශනා කර ඇත. නමුත් ඔවුනට දෙන උපදෙස් දීර්ඝ වූයේ නැත. ඇතැම් විට එය ඔවුනට ප්‍රතිඥා ගැනීමක් පමණක් විය. අබූ වාඉල් තුමා විසින් වාර්තා කළ හදීසයක් බුහාරි හා මුස්ලිම් හි මෙසේ සඳහන් වී ඇත. අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් තුමාණන් සෑම බ්‍රහස්පතින්දා දිනකම අපට උපදෙස් දෙමින් සිටියහ. එවිට මිනිසෙකු එතුමා දෙස බලා: අහෝ අබ්දුර් රහ්මාන් ඔබේ කතාවට අපි ප්‍රිය කරන්නෙමු. එයට අපි ඇලුම් කරන්නෙමු. සෑම දිනකම ඔබ අපට එසේ කතා කිරීම අපි ප්‍රිය කරන්නෙමු' යැයි පැවසීය. එයට එතුමා: 'නුඹලාට මා එසේ කතා කිරීමෙන් මා වළක්වා සිටියේ එය දික් වීමෙන් පිළිකුල් භාවයක් ඇතිවනු ඇතැයි බිය මිස වෙනකක් නොවීය. සැබැවින්ම

අල්ලාහ්ගේ දූතයාණෝ උපදේශනාව කෙටි කරන්නෙකු වූහ. එය අප මත දිගු වීම පිළිකුල් කළ බැවිනි.[214]

උපදෙසෙහි වාග්චාතුර්යය ආරෝග්‍යාමත් උපදෙසකි. සැබැවින්ම එය හදවත් පිළිගැනීමටත් ඒවා ආකර්ශනය කිරීමටත් වඩාත් සමීප වන්නේය. වාග්චාතුර්යය යනු: ඉදිරිපත් කරනු ලබන වචන භාවිතය, ඒවා වඩාත් පැහැදිලිව පැවතීම, සවනට වඩාත් මිහිරිභාවයක් ගෙන දෙන හදවත් තුළ ගැඹුරින් පතිත වන ඉතා අලංකාර ස්වරූපයෙන් උපදෙස් පිහිටීමය. නබි (ﷺ) තුමා තම දේශනාව කෙටි කර ගත්හ. එය දික් කළේ නැත. එය සාරාංශ ගත කෙටි උපදෙසක් විය.

***

"එයින් හදවත් තිගැස්සී ගියේය. ඇස් කඳුළු සලන්නට විය." යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

මෙය විශේෂණ පද දෙකකි. අල්ලාහ් පවසන පරිදි මුඃමින්වරුන් උපදෙසට සවන් දෙන අවස්ථාවේ මේ විශේෂණ පද දෙකින් පැසසුමට ලක් කර ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා සිටියි: "සැබැවින්ම විශ්වාසිකයින් වනුයේ අල්ලාහ් පිළිබඳව සිහිපත් කරනු ලැබූ කල්හි ඔවුන්ගේ හදවත් තැති ගන්නා වූ ද..." (සූරා අල් අන්ෆාල්: 2), තවත් පාඨයක: "... (නබිවරය, අවනත වී) යටහත්ව කටයුතු කරන්නන්ට ශුභාරංචි දෙනු. ඔවුහු වනාහි අල්ලාහ්ව මෙනෙහි කරනු ලැබූ විට ඔවුන්ගේ හදවත් තැති ගන්නන්ය..." (සූරා අල් හජ්: 34,35) තවත් පාඨයක: "විශ්වාස කළවුනට අල්ලාහ් හා සත්‍යයෙන් පහළ වූ දෑ (අල් කුර්ආනය) මෙනෙහි කිරීම සඳහා ඔවුන්ගේ හදවත් (බියෙන් යටහත් වීමට ... වේලාව නොපැමිණියේ ද?" (සූරා අල් හදීද්: 16) තවත් පාඨයක: "අල්ලාහ් ඉතා අලංකාර උපදේශයක් (එනම්) එකිනෙකට (පටහැණි නොවූ) එකඟතාවෙන් යුත් නැවත නැවත සඳහන් කරන (දෑ අඩංගු) ග්‍රන්ථයක් පහළ කර ඇත. එයින් ඔවුන්ගේ පරමාධිපතිට බියවන්නන්ගේ චර්ම(යේ රෝම) වෙව්ලන්නේය. පසුව ඔවුන්ගේ චර්ම ද හදවත් ද අල්ලාහ්ව මෙනෙහි කිරීම පිණිස මෘදු වන්නේය..." (සූරා අල් සුමර්: 23), තවත් පාඨයක: "තවද රසූල්වරයාට පහළ කරනු ලැබූ දෑ (අල්

214. බුහාරි (70), මුස්ලිම් (2821)

කුර්ආනය) ඔවුහු ශ්‍රවණය කළෙහු නම් සත්‍යය ඔවුන් හඳුනා ගත් හෙයින් කඳුළු සලන ඔවුන්ගේ දෑස් නුඹ දකිනු ඇත…" (සූරා අල් මාඉදා: 83)

***

"මෙය සමු ගැනීමේ උපදෙසක් මෙන් පෙනේ. එහෙයින් අපට උපදෙස් දෙන්න" යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

එතුමාණන් (ﷺ) වෙනත් උපදෙස්වලදී දැක් වූ සැලකිල්ලට වඩා මෙහිදී කරුණු ඉදිරිපත් කිරීමේදී වැඩි සැලකිල්ලක් දක්වා ඇති බව මෙය පෙන්වා දෙයි. සැබැවින්ම මෙය සමුගන්නෙකුගේ උපදෙසක් බව ඔවුන් වටහා ගත්තේ එබැවිනි. ප්‍රකාශයේ හා ක්‍රියාවෙහි වෙනත් අය විමර්ශනය කර නොබලන දෑ සමුගන්නා විසින් විමර්ශනය කර බලනු ඇත. සමුගන්නෙකුගේ සලාතය ඉටු කිරීමට නබි (ﷺ) නියෝග කර සිටියේ එබැවිනි.[215] තමන් සලාතයෙන් සමු ගන්නා බවට කවරෙකු වටහා ගන්නේ ද එහි වඩාත් පූර්ණ ස්වරූපය මත පදනම් වී පරිසමාප්ත ලෙස ඉටු කරන්නට බලන්නේය. ඇතැම් විට සමුගැනීමේ දේශනාවෙහි දී එතුමාණන් ඇතැම් කරුණු ඉදිරිපත් කළා සේ එම දේශනයේදී ද සමුගැනීමේ යම් කරුණක් ඉදිරිපත් කර තිබෙන්නට පුළුවන.

***

"එහෙයින් අපට උපදෙස් දෙන්න" යන ඔවුන්ගේ ප්‍රකාශය වනාහි:

215. 'අල් අව්සත්'හි අත් තබරානි (4424) මෙය වාර්තා කර ඇත. එම ප්‍රකාශ වනාහි: ඉබ්න් උමර් තුමා මෙසේ පවසයි: මිනිසෙකු නබි (ﷺ) තුමාණන් වෙත පැමිණ, 'අල්ලාහ්ගේ දූතයාණනි, මට කතාවක් කරන්නැයි විමසා සිටියේය. එවිට එතුමාණන් එය කෙටි කර ගනිමින්: "ඔබ සමුගන්නෙකුගේ සලාතය ඉටු කරන්න. සැබැවින්ම ඔබ ඔහු නොදකින කෙනෙකු ලෙස සිටිය ද සැබැවින්ම ඔහු ඔබ දෙස බලා සිටියි. ජනයා සතුව ඇති දෑ ගැන බලාපොරොත්තු නොතබන්න. ඔබ පොහොසතෙකු වනු ඇත. නිදහසට කරුණු දක්වන දෑ පිළිබඳ මම ඔබට අවවාද කර සිටිමි." යැයි පැවසූහ. මෙම හදීසය 'අස්-සිල්සිලතු අස්-සහීහා'හි ඉමාම් අල් අල්බානී තුමා මෙය සඳහන් කර ඇත. එතුමා තවදුරටත් මා ළඟ මෙම හදීසය හසන් ගණයේ හෝ සහීහ් ගණයේ පවතී. සැබැවින්ම ඒ සඳහා බලවත් සාධක ඇත. බලන්න: 'අස්-සිල්සිලතු අස් සහීහා' (1914)

ඔවුන් එයින් අදහස් කර සිටියේ: ප්‍රමාණවත් මෙන්ම පූර්ණවත් උපදෙසකි. සැබැවින්ම එතුමාණන් සමුගන්නට යන බව ඔවුන් වටහා ගත් කල්හි, එතුමාණන්ගෙන් පසු අනුයුක්ත කොට පිළිපැදීමෙන් ඔවුනට ප්‍රයෝජනවත් වන උපදෙසක් ඔවුහු එතුමාණන්ගෙන් බලාපොරොත්තු වූවෝය. ඒ අනුව එය ආග්‍රහණය කිරීමට ප්‍රමාණවත් කරුණු මෙන්ම මෙලොව හා මතුලොව සතුට එහි විය.

***

"අල්ලාහ්ට බැතිමත් වීම, සවන් දීම හා අවනත වීම යනාදිය පිළිබඳ මම නුඹලාට උපදෙස් දෙමි." යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

මෙම පද දෙක මෙලොව හා මතුලොව සතුට ඒකරාශි කරන පද දෙකකි.

සැබැවින්ම 'තක්වාව' හෙවත් බැතිමත්භාවය මතුලොව සතුට සහතික කරන්නකි. සැබැවින්ම සවන් දීම හා අවනත වීම මුස්ලිම්වරුන්ගේ කටයුතු සහතිකරන දෑ වෙති. එහි මෙලොව සතුට පිහිටා ඇති අතරම ගැත්තන්ගේ මෙලොව ජීවිතයේ දී ඔවුන්ගේ දැහැමි කටයුතු ද එහි ඇතුළත් වෙයි. ඔවුහු එමගින් තම දහම නිරූපණය කිරීමටත් තමන්ගේ පරමාධිපතිට අවනත වීමටත් උදව් පතති.

***

"වහලෙකු නුඹලා අතර නායකත්වයට පත්වූයේ නම්" තවත් වාර්තාවකට අනුව "ඇබීසීනියානු වහලෙකු" යැයි නබි (ﷺ) තුමාණන් කළ ප්‍රකාශය වනාහි:

නබි (ﷺ) තුමාණන් පිළිබඳව සඳහන් මෙවන් වාර්තා බොහෝමයක් ඇත. මෙය අල්ලාහ් තම සමූහයාගේ කටයුතු පිළිබඳ හා ඔවුන් මත පාලනය කරන වහලෙකුගේ භාරකාරත්වය පිළිබඳ එතුමාණන්ට පෙන්වා දුන් කරුණු අතරින් එකකි.

"මිදි ගෙඩියක් මෙන් හිසක් ඇති කළු ජාතික ගැත්තෙකු නුඹලා මත ආධිපත්‍යය දැරුව ද නුඹලා සවන් දෙනු. අවනත වනු." යැයි නබි (ﷺ)

තුමාණන් ප්‍රකාශ කළ බව අනස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් සහීහ් අල් බුහාරි හි සඳහන් වී ඇත.[216]

අබූ දර් තුමා විසින් වාර්තා කළ හදීසයක් සහීහ් මුස්ලිම්හි මෙසේ වාර්තා වේ. "අවයව වෙන් කරන ලද කළු ජාතික ඇබිසීනියානු වහලෙකු වුව ද ඔහුට මා සවන් දීමටත් අවනත වීමටත් සැබැවින්ම මාගේ මිතුරාණන් (ﷺ) මට උපදෙස් දුන්හ."[217]

මෙම අර්ථයෙන් යුත් හදීස් බොහෝමයක් පැමිණ ඇත.

***

"එවිට නුඹලා මාගේ පිළිවෙත හා යහමග ගිය මග පෙන් වූ නායකයින්ගේ පිළිවෙත පිළිපැදීම නුඹලා වෙත පැවරුනු යුතුකමක් වන්නේය." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

පිළිවෙත යනුවෙන් තේරුම දී ඇති 'අස්-සුන්නා' නම් අරාබි පදය එය 'ගමන් කළ යුතු මාර්ගය' යන අරුථ දෙයි. ප්‍රතිපත්තිමය වශයෙන්, ක්‍රියාවෙන් හා ප්‍රකාශයෙන් කවර කරුණක් මත ඔහු හා යහමග ගිය කලීෆාවරු -ප්‍රධානීන්- පිහිටා සිටියේ ද එය පිළිපැදීම එහි ඇතුළත් වන්නේය.

එය පරිපුන් පිළිවෙතයි. මුල් කාලීනයන් ඒ සියල්ල ඇතුළත් වූ කරුණු මත මිස 'අස්සුන්නා' යන නාමය භාවිත නොකළහ. පසුකාලීන විද්වතුන් බොහෝ දෙනෙක් ප්‍රතිපත්තිය හා බැඳුණු කරුණුවලට 'අස්සුන්නා' යන නාමය විශේෂයෙන් භාවිත කර ඇත. හේතුව එය දහමේ මූලධර්මය වන බැවිනි. එයට වෙනස්ව කටයුතු කිරීම මහත් වරදකි.[218]

'අල් කුලෆාඋර් රාෂිදූන්' හෙවත් යහමග පෙන්වූ ප්‍රධානීන් වනාහි, ඔවුන් පිළිපදිනු ලබන්නට නියෝග කරනු ලැබූවෝ වෙති. ඔවුහු අබූ බක්ර්, උමර්,

---

216. බුහාරි (8142)
217. මුස්ලිම් (1837)
218. ඒ අතරින් ඉමාම් අබ්දුල්ලාහ් ඉබ්නු අහ්මද් අකීදා සම්බන්ධයෙන් ලියූ ඔහුගේ පොතට 'අස්සුන්නා' යනුවෙන් නම් තබා ඇත. ඉමාම් ඉබ්නු අබී ආසිම් හා වෙනත් අය ද එසේ නම් තබා ඇති අතර එය ප්‍රචලිතය.

උස්මාන් හා අලී (රළියල්ලාහු අන්හුම්) යන අය වෙති. එසේ යහමග පෙන්වූ ප්‍රධානීන් ලෙස වර්ණනා කර ඇත්තේ සැබැවින්ම ඔවුහු සත්‍යය දැන ඒ අනුව තීන්දු ලබා දුන් බැවිනි. 'අර්-රාෂිද්' මග පෙන්වන්නා යනු 'අල්-ඝාවී' යන පදයට විරුද්ධ පතයයි. 'අල්-ඝාවී' යනු සත්‍ය දැන එයට පටහැනිව කටයුතු කරන්නාය.

***

"ඒවා චාර්වක දත්වලින් තදින් හපා ගන්න." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

එය තදින් ග්‍රහණය කර ගැනීම සඳහා යෙදුනු ආදේශනයකි.

'අන්-නවාජිද්' යනු චාර්වක දත් ය.

***

"අළුතින් බිහි වූ කටයුතු පිළිබඳ මම නුඹලාට අවවාද කරමි. අලුතින් බිහි වූ සෑම දෙයක්ම නොමග ගිය දෑය." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

මෙය අලුතින් බිහි වූ නව කටයුතු අනුගමනය කිරීමෙන් වැළකී සිටින මෙන් සමූහයාට දෙන ලද අවවාදයකි.

අල් බිද්ආ යනුවෙන් අදහස් කරනුයේ ෂරීආවෙහි පෙන්වා දී තිබෙන බවට කිසිදු මූලාශ්‍රයක් නැති අලුතින් බිහි කරන ලද දෑය. ෂරීආවෙහි එය පෙන්වා දී තිබෙන මූලාශ්‍රයක් වී නම් එය භාෂාමය වශයෙන් අලුත් දෙයක් වුව ද ආගමික වශයෙන් බිද්ආවක් නොවන්නේය.

අලුතින් ඇති වූ ඇතැම් කරුණුවල යහපත ඇතැයි මුල්කාලීනයන්ගේ ප්‍රකාශවල සඳහන්ව ඇත. සැබැවින්ම එය භාෂාමය වශයෙන් ඇති වූ අලුත් දෑ මිස ෂරීආ-ආගමික නීති- වශයෙන් බිහි වූ කරුණක් නොවේ.

උමර් (රළියල්ලාහු අන්හු) තුමාගේ ප්‍රකාශයද ඒවායින් එකකි. මස්ජිදයේ එක ඉමාම්වරයකු යටතේ රමළාන් මාසයේ සලාත් ඉටු කිරීම සඳහා ජනයා

රැස්කළ අවස්ථාවේ හෙතෙම බැහැරට ඇවිත් එලෙස ඔවුන් සලාතය ඉටු කරනු දුටුවේය. පසුව එතුමා මෙසේ පවසා සිටියේය: 'මෙම 'බිද්ආව' - අලුතින් සිදු කරන ක්‍රියාව- යහපතකි.'[219] යැයි පවසීය. සැබැවින්ම උබය් ඉබ්නු කඃබ් තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. ඔහු එතුමා දෙස බලා: 'සැබැවින්ම මෙය (මීට පෙර) සිදු නොවූ දෙයකි. යැයි පැවසීය. එවිට උමර් තුමා 'සැබැවින්ම එය මම දනිමි. නමුත් එය අලංකාරය' යැයි පවසා සිටියේය.

ඉන් අදහස් කරනුයේ: සැබැවින්ම මෙම ක්‍රියාව එකී අවස්ථාවට පෙර එසේ ක්‍රියාත්මකව තිබුණේ නැත. නමුත් ඒ වෙත යොමු වීම සඳහා ආගමික මූලාශ්‍ර එයට පිහිටා තිබිණ. එම මූලාශ්‍ර අතුරින්: නබි (ﷺ) තුමාණන් රමළාන් මාස රාත්‍රියේ සලාත්හි නිරත වන මෙන් දිරි ගැන්වූහ. රමළාන් මාසයේ එක් රාත්‍රියක පමණක් නොව[220] තම සහගාමීන් සමග එසේ සලාතය ඉටු කර ඇත්තාහ. පසුව එය ඔවුන් වෙත අනිවාර්යය කරනු ලබනු ඇතැයි බිය වී ඉන් වැළකී සිටියහ.[221] එතුමාණන්ගෙන් පසු එය සුරක්ෂා කරන ලදී.

'අල්බිද්ආ' නවක දෑ දෙවර්ගයකි. ප්‍රශංසා සහගත බිද්ආව හා හෙළා දකිනු ලබන බිද්ආව වේ. කවර කරුණක් සුන්නාවට අනුගත වන්නේ ද එය ප්‍රශංසා සහගත බිද්ආවකි. කවර කරුණක් සුන්නාවට පටහැනි වන්නේ ද එය හෙළා දකිනු ලබන බිද්ආවකි යැයි ෂාෆි (රහිමහුල්ලාහ්) කළ ප්‍රකාශයකට මම සවන් දුනිමි යැයි හර්මිලා ඉබ්නු යහ්යා අප වෙත දන්වා සිටි බව ඉබ්‍රාහීම් ඉබ්නු ජුනයිද් තුමා විසින් වාර්තා කරන ලදී. එම වාර්තාකරණය ඔස්සේ අල් හාෆිල් අබූ නුඅය්ම් තුමා මෙය දන්වා ඇත. ඒ සඳහා උමර් තුමාගේ 'අලුතින් සිදු කරන ක්‍රියාව- යහපතකි' යන ප්‍රකාශය සාධක වශයෙන් ගෙන ඇත.

ෂාෆිර් තුමාගේ අදහස: අප ඉහතින් සඳහන් කළ දෑමය. එනම් සැබැවින්ම හෙළා දකින ලද බිද්ආව වනාහි: ඒ වෙත යොමු කරනු ලබන ෂරීආවෙහි කිසිදු මූලාශ්‍රයක් එයට නොමැති දෑය -ෂරීආවෙහි භාවිත වන බිද්ආව වන්නේ එයයි- ප්‍රශංසා සහගත බිද්ආව වනාහි: එය සුන්නාවට අනුගත වූවකි. එනම්: ඒ වෙත යොමු කරනු ලබන සුන්නාවෙන් මූලාශ්‍රයක් එයට ඇති දෑය. එය

219. බුහාරි (2010)

220. එක් රාත්‍රියක පමණක් නොව: එනම් රාත්‍රී බොහෝමයක යන්නයි.

221. බුහාරි (2012)

සුන්නාවට අනුගතවන බැවින් භාෂාමය වශයෙන් බිද්අත් ලෙස භාවිත කළ ද ආගමික වශයෙන් භාවිත කරනු නොලැබේ.[222]

ඉමාම් ෂාෆිඊ විසින් වාර්තා කරන ලද වෙනත් ප්‍රකාශයක. එතුමා එය විස්තර කරමින් මෙසේ පවසා සිටියහ. "අලුතින් බිහිකරනු ලබන දෑ වර්ග දෙකකි.

222. 'බිද්අත් වර්ග දෙකකි. ප්‍රශංසා සහගත හා හෙළා දකිනු ලබන දෑ ....' යන ඉමාම් අෂ්-ෂාෆිඊ තුමාගේ ප්‍රකාශය ඇතැමුන් නිසි අයුරින් වටහාගෙන නැත. බිද්අත් ඇති කරන්නන්ගෙන් ඇතැමෙකු තමන්ගේ බිද්ආව අලංකාරවත් කරනු පිණිස ඔවුහු එම ප්‍රකාශය සම්බන්ධ කර පෙන්වති. ඔවුන්ගෙන් කිසිවකුට: 'ඔබ අල්ලාහ්ගේ දහම තුළ නව කරුණු ඇතුළත් නොකරනු' යැයි පවසනු ලැබූ විට ඔහු: මෙය බිද්ආ හසනා -අලංකාර බිද්ආවකි- යනුවෙන් හෝ බිද්ආ මහ්මූදා -ප්‍රශංසනීය බිද්ආවකි- යනුවෙන් හෝ පවසයි. එතුමා පෙන්වා දී ඇති එම සටහන පිළිබඳ අපගේ අෂ්-ෂෙය්ක් අල් අල්ලාමා අබ්දුර් රහ්මාන් ඉබ්නු නාසිර් අල් බර්රාක් තුමාගෙන් විමසා සිටියෙමි. හෙතෙම: "මෙම ප්‍රකාශය ෂාෆි තුමාගේ සැකය ඇති කරන ප්‍රකාශයකි. නොමග ගිය අලුතින් යමක් බිහි කරන්නන් -ඔවුන් එසේ සිදු කරන දෑ- ඒ සමග කිසිදු සම්බන්ධයක් නොපැවතුණ ද එය ඔවුන් ඒ සමග සම්බන්ධ කිරීමට හැකි ප්‍රකාශයකි. එතුමාගේ ප්‍රකාශය අවසානයේ එහි අරමුණු පැහැදිළි කර ඇත. එනම්: 'සුන්නාවට අනුගත වූ දෑ එය ප්‍රශංසනීයය. එයට පටහැනි දෑ හෙළා දකිනු ලබන්නකි' රමළානයේ රාත්‍රි සලාතයේ දී එක් ඉමාම් වරයකු මත මිනිසුන් එක්රැස්කිරීම සම්බන්ධයෙන් ෂෙයික්තුමා ප්‍රශංසනීය බිද්ආවක් ලෙස නම් කිරීමට පෙන්වා දුන් 'අලුතින් සිදු කරන ක්‍රියාව- යහපතකි' යන උමර් තුමාගේ ප්‍රකාශයත් එලෙස ඔවුන් එයට සාක්ෂි වශයෙන් ගනිති. සැබැවින්ම එහි අපේක්ෂා කරනු ලබනුයේ භෂාමය අර්ථයෙනි. දහම තුළ අලුතින් ඇති කරන කරුණක් නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ සීමාව මත නොපිහිටියේ නම් එය අනුමත නොවන්නකි. එතුමාණන් මෙසේ පවසා සිටියහ: "අපගේ කටයුතුවලදී කවරෙකු එහි නොමැති දෙයක් අලුතින් ඇති කරන්නේ ද එය ප්‍රතික්ෂේප කරනු ලැබූවකි."

මේ අනුව ප්‍රශංසනීය හෝ හෙළා දකිනු ලබන බිද්ආ ලෙස අලුතින් බිහිකරනු ලබන දෑ කොටස් කර දැක්වීම එය ප්‍රකාශ කරන අයගේ අපේක්ෂාව නිවැරදිව පිහිටුණ ද අවශ්‍ය නොවන්නකි. ඊට හේතුව මෙහි මතුපිටින් ඇති දෑ "කටයුතුවල නරකම දෑ අලුතින් ඇති කරන දෑය.", "සෑම බිද්ආවක්ම නොමග යෑමකි" යන නබි තුමාණන්ගේ ප්‍රකාශය සමග ගැටෙන්නෙකි. තමන් ආරම්භ කළ දෑ - එය ඉතා පිවිතුරුය යැයි - සාධාරණීකරණය කිරීම ආශාවන් අනුගමනය කරන්නන් හා අඥානයින් හට ව්‍යසනකාරී තත්ත්වයක් උදා කර දී ඇති අතර එය ඔවුහු දහම ලෙස ගෙන ඇති බැවිනි. එය අල්ලාහ් අවසරය දී නැති පිළිවෙතකි. (ෂෙයික් තුමාගේ ප්‍රකාශය අවසන්) අල්ලාහ් ඔහුට ආශිර්වාද කරත්වා. එතුමාණන් ගුණ කියූ යහපත කියූ අමතර ව දැක්වූ කරුණු ඉතා යහපත් විය. අප වෙනුවෙන් අල්ලාහ් ඔහුට යහපත් ප්‍රතිඵල පිරිනමත්වා!

අල් කුර්ආනයට හෝ සුන්නාවට හෝ මූලාශ්‍රයට හෝ ඉජ්මාවට හෝ පටහැනිව පවතින අලුතින් බිහි කරනු ලැබූ දෑ මෙය නොමග ගිය බිද්ආව වෙයි. ඒ කිසිවකට පටහැනි නොවන සේ පවතින යහපත් කරුණක් එසේ අලුතින් බිහි කරනු ලබන්නේ නම් එය හෙළා දකිනු නොලබන අලුතින් බිහි කරනු ලැබූ කරුණකි.

***

## الحَدِيْثُ التَّاسِعُ والعِشْرُونَ

## විසි නව වන හදීසය

عَنْ مُعَاذٍ رَضِيَ اللهُ عَنْهُ

قَالَ: قُلْتُ: يَا رَسُولَ اللهِ أَخْبِرْنِي بِعَمَلٍ يُدْخِلُنِي الْجَنَّةَ وَيُبَاعِدُنِي مِنَ النَّارِ،

قَالَ: "لَقَدْ سَأَلْتَ عَنْ عَظِيمٍ وَإِنَّهُ لَيَسِيرٌ عَلَى مَنْ يَسَّرَهُ اللهُ عَلَيْهِ: تَعْبُدُ اللهَ لَا تُشْرِكُ بِهِ شَيْئًا، وَتُقِيمُ الصَّلَاةَ، وَتُؤْتِي الزَّكَاةَ، وَتَصُومُ رَمَضَانَ، وَتَحُجُّ الْبَيْتَ."

ثُمَّ قَالَ: "أَلَا أَدُلُّكَ عَلَى أَبْوَابِ الْخَيْرِ؟ الصَّوْمُ جُنَّةٌ، وَالصَّدَقَةُ تُطْفِئُ الْخَطِيئَةَ كَمَا يُطْفِئُ الْمَاءُ النَّارَ، وَصَلَاةُ الرَّجُلِ فِي جَوْفِ اللَّيْلِ" ثُمَّ تَلَا: {تَتَجَافَى جُنُوبُهُمْ عَنِ الْمَضَاجِعِ} [السجدة: 16] حَتَّى بَلَغَ: يَعْلَمُونَ [السَّجْدَةِ: 16 - 17]،

ثُمَّ قَالَ: "أَلَا أُخْبِرُكَ بِرَأْسِ الْأَمْرِ وَعَمُودِهِ وَذُرْوَةِ سَنَامِهِ؟"

قُلْتُ: بَلَى يَا رَسُولَ اللهِ، قَالَ: رَأْسُ الْأَمْرِ الْإِسْلَامُ، وَعَمُودُهُ الصَّلَاةُ، وَذُرْوَةُ سَنَامِهِ الْجِهَادُ"

ثُمَّ قَالَ: "أَلَا أُخْبِرُكَ بِمِلَاكِ ذَلِكَ كُلِّهِ؟"

قُلْتُ: بَلَى يَا رَسُولَ اللهِ،

فَأَخَذَ بِلِسَانِهِ، قَالَ: "كُفَّ عَلَيْكَ هَذَا"

قُلْتُ: يَا نَبِيَّ اللهِ، وَإِنَّا لَمُؤَاخَذُونَ بِمَا نَتَكَلَّمُ بِهِ؟

فَقَالَ: "ثَكِلَتْكَ أُمُّكَ، وَهَلْ يَكُبُّ النَّاسَ فِي النَّارِ عَلَى وُجُوهِهِمْ، أَوْ قَالَ عَلَى مَنَاخِرِهِمْ إِلَّا حَصَائِدُ أَلْسِنَتِهِمْ."

رَوَاهُ التِّرْمِذِيُّ، وَقَالَ: حَدِيثٌ حَسَنٌ صَحِيحٌ.

මුආද් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

එතුමා: අල්ලාහ්ගේ දූතයාණෙනි, ස්වර්ගයට මා ඇතුළත් කරන නිරා ගින්නෙන් මා දුරස් කරන ක්‍රියාවක් ගැන මට දන්වා සිටින්නැයි" මම විමසා සිටියෙමි යැයි පවසා සිටියේය. එතුමා: සැබැවින්ම ඔබ වැදගත් කරුණක් පිළිබඳ විමසුවෙහිය. අල්ලාහ් කවරෙකුහට පහසු කරන්නේ ද එවැන්නන්හට සැබැවින්ම එය පහසුය. ඔබ අල්ලාහ්ට ගැතිකම් කරන්න. ඔහුට කිසිවක් ආදේශ නොකරන්න. සලාතය විධිමත්ව ඉටු කරන්න. සකාත් ද නිකුත් කරන්න. රමළාන් උපවාසය රකින්න. දේව නිවස කරා හජ් වන්දනා කරන්න."

පසුව එතුමාණන්: යහපත්කමේ දොරටු පිළිබඳ මා නුඹලාට කියා දිය යුතු නොවේ ද? උපවාසය පලිහකි. සදකා හෙවත් දානය, ජලය ගින්දර නිවා දමන්නාක් මෙන් වැරදි නිවා දමන්නකි. රාත්‍රිය මැද කොටසේ මිනිසා ඉටු කරන සලාතයක් ඇත. යැයි පවසා පසුව "තතජාෆා ජුනූබුහුම් අනිල් මළාජිඉ..." -ඔවුන්ගේ ඇළපැති නිදිහයනින් ඈත් ව තබති ...- යන (සූරා සජදා හි 16 වැනි) පාඨයේ සිට "... යඃලමූන්" -... ඔවුහු දැන සිටිති- යන (එහි 17 වැනි) පාඨය දක්වා පාරායනය කළහ.

පසුව එතුමාණන්: "කටයුත්තේ සිරස, එහි කුළුණ හා එහි උච්චතම ස්ථානය ගැන මම ඔබට දන්වා සිටිය යුතු නොවේ ද?

මම: එසේය අල්ලාහ්ගේ දූතයාණනි, යැයි පැවසුවෙමි.

එතුමාණන්: කටයුත්තේ සිරස ඉස්ලාමයයි. එහි කුළුණ සලාතයයි. එහි උච්චතම ස්ථානය ජිහාද් හෙවත් අරගලයයි. යැයි පැවසූහ.

පසුව එතුමාණන් තවදුරටත්: මේ සියලු දැහි පදනම මා ඔබට දන්වා සිටිය යුතු නොවේ ද? විමසා සිටියහ.

මම: එසේය අල්ලාහ්ගේ දූතයාණනි, යැයි පැවසුවෙමි.

එවිට එතුමාණෝ එතුමාණන්ගේ දිව අල්ලා 'ඔබට එරෙහි වීමෙන් මෙය වළක්වා ගන්න' යැයි පැවසූහ.

මම: අල්ලාහ්ගේ නබිවරය, අප කවර කරුණක් කතා කරන්නේ ද එමගින් අප හසුකරගනු ලබන්නෙමු ද? යැයි විමසුවෙමි.

(අරාබි ව්‍යවහාරයේ පවතින පිළිකුල පෙන්වන පදයක් වන) සකුලත්ක උම්මුක! යැයි පවසා ජනයා ඔවුන්ගේ මුහුණු මත මුණින් ඇද දමනුයේ ඔවුන්ගේ දිවවල් නෙළාගත් දෑ මිස වෙන කුමක් වන්නේ ද?

මෙය ඉමාම් තිර්මිදි විසින් දන්වා ඇති අතර එතුමා: මෙය හසන් සහීහ් ගණයට අයත් හදීසයක් බව දන්වා ඇත.

***

-විග්‍රහය-

යහපත්කමේ දොරටු පිළිබඳ මා නුඹලාට කියා දිය යුතු නොවේ ද? යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

ඉස්ලාමයේ ඇති වාජිබාත් -හෙවත් අනිවාර්යය කටයුතු ඉටු කිරීම- මත ස්වර්ගයට පිවිසීම අනුගත වී ඇති බව සඳහන් කළ පසුව අමතර අන් නවාෆිල් -හෙවත් අතිරේක පිළිවෙත්හි යහපත් දොරටු පිළිබඳ ඊට පරව පෙන්වා දී ඇත. අල්ලාහ්ගේ හිතමිතුරන් අතුරින් වඩාත් ශ්‍රේෂ්ඨ අය වනුයේ අනිවාර්යය කටයුතුවලට පසුව අතිරේක පිළිවෙත් කිරීමෙන් ඔහු වෙත වඩාත් සමීප වූවන් වෙති.

***

"උපවාසය පලිහකි." යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

පලිහ යනු ගැත්තා මුවා වන්නට බලන යුධ උපකරණයකි. යුධමය අවස්ථාවකදී පහර කැමෙන් ආරක්ෂා වන්නට බලන ආරක්ෂක ඵලකයක් මෙනි. උපවාසය ද එලෙසමය. එය මෙලොවෙහි සිදුවන පාපකම් වලින් අදාළ පුද්ගලයා ආරක්ෂා කරනු ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කර සිටියි: "අහෝ විශ්වාස කළවුනි නුඹලා ආරක්ෂා වනු පිණිස නුඹලාට පෙර විසූ අයට උපවාසය නියම කළාක් මෙන් නුඹලා මතද උපවාසය නියම කරනු ලැබ ඇත." (සූරා අල් බකරා: 83) එය පාපකම්වලින් ආරක්ෂා කරන පළිහක් ලෙස පිහිටන විට එය ඔහුව මතුලොවෙහි නිරා ගින්නෙන් ආරක්ෂා කරන පළිහක් බවට පත් වන්නේය.

***

"සදකා හෙවත් දානය, ජලය ගින්දර නිවා දමන්නාක් මෙන් වැරදි නිවා දමන්නකි. රාත්‍රිය මැද කොටසේ මිනිසා ඉටු කරන සලාතයක් ඇත." යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

ඉන් අදහස් කරනුයේ: තවදුරටත් සදකාව මෙන් එය ද වැරදි ඉවත් කරනු ඇත යන්නයි. එයට සාධක වශයෙන් ඉමාම් අහ්මද් විසින් පළ කළ මුආද් තුමා විසින් ලබා උර්වා ඉබ්නු අන්-නස්සාල් විසින් කළ වාර්තාව පෙන්වා දෙයි. එතුමා: අපි නබි (ﷺ) තුමාණන් සමග තබූක් යුද්ධයෙන් පැමිණෙමින් සිටියෙමු. එවිට මෙම හදීසය එතුමාණන් මෙනෙහි කළහ. එහදී "උපවාසය පලිහකි. සදකාව -දානය- හා ගැත්තෙකු රාත්‍රිය මැද භාගයේ නැගිට සලාත් ඉටු කිරීම වැරදි මකා දමනු ඇත.[223]

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බවට බිලාල් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් තිර්මිදි හි මෙසේ සඳහන් වී ඇත. "රාත්‍රියේ සලාත් ඉටු කිරීම නුඹලා මත පැවරුනු වගකීමකි. හේතුව සැබැවින්ම එය නුඹලාට පෙර විසූ දැහැමියන්ගේ උද්යෝගයයි. සැබැවින්ම රාත්‍රියේ අවදි වී සලාත් ඉටු

223. කතෘ තුමා මෙම හදීසය වාර්තා කරන අතරවාරයේ උර්වා ඉබ්නු අන්-නස්සාල් නමැත්තා මුආද් (රළියල්ලාහු අන්හු) තුමාගෙන් මෙම හදීසය අසා නැති බව විස්තර කරයි.

කිරීම අල්ලාහ් වෙත සමීප කරවන්නකි. පාපකමින් දුරස් කරන්නකි. පාපකම්වලට ප්‍රතිකර්මයකි. ශරීරයෙන් ලෙඩරෝග ඉවත් කරන්නකි.''

අබූ උමාමා විසින් වාර්තා කරනු ලැබූ මේ හා සමාන හදීසයක් ඉමාම් තිර්මිදි විසින් පළ කර ඇත. (එය බිලාල් තුමාගේ හදීසයට වඩා පූර්ව සාධක සහීහ් හදීසයක් වන්නේය)[224]

සැබැවින්ම රහසිගත ව ලබා දෙන සදකාව -දානය- වැරදි නිවා දමන බවත් පරමාධිපතියාණන්ගේ කෝපය නිවා දමන බවත් ඉහත සඳහන් වී ඇත. එලෙසම රාත්‍රී කාලයේ සලාතය පිළිබඳවත් සඳහන් වී ඇත.

පසුව එතුමාණන් ''තතජාෆා ජුනූබුහුම් අනිල් මළාජිඉ...'' -ඔවුන්ගේ ඇළපැති නිදිහයනින් ඈත් ව තබති ...- යන (සූරා සජදා හි 16 වැනි) පාඨයේ සිට ''... යඃලමූන්'' -... ඔවුහු දැන සිටිති- යන (එහි 17 වැනි) පාඨය දක්වා පාරායනය කළහ.

තේරුම: (16) ''(රාත්‍රී නැමදුම සඳහා) ඔවුන්ගේ ඉලපත් නිදි යහනින් ඉවත්ව පවතියි. ඔවුහු බියෙන් හා අපේක්ෂාවෙන් තමන්ගේ පරමාධිපතිව අයැදිමින් සිටිති. තවද අපි ඔවුනට දුන් දැයින් වියදම් කරති. (17) ඔවුන් කරමින් සිටි දෑ

224. තිර්මිදි (3549), මෙය ගරීබ් ගණයට අයත් හදීසයකි. බිලාල් තුමාගේ හදීසය මේ අයුරින් මිස අපි නොදනිමු. පසුව තවදුරටක් අවධාරණය කරමින් සැබැවින්ම මෙම හදීසය එතුමා ළඟ ළර්ෆ් ජිද්දන් (වඩාත් දුර්වල වාර්තාකරණයක්) යන ගණයට අයත් බව පෙන්වා දෙයි. පසුව ''රාත්‍රියේ සලාත් ඉටු කිරීම නුඹලා මත පැවරුනු වගකීමකි. හේතුව සැබැවින්ම එය නුඹලාට පෙර විසූ දැහැමියන්ගේ උද්යෝගයයි. එය අල්ලාහ් වෙත සමීප කරවන්නකි. පාපකමින් දුරස් කරන්නකි. පාපකම්වලට ප්‍රතිකර්මයකි'' යන අබූ උමාමාගේ හදීසය අවධාරණය කළේය. පසුව ඔහු -අබූ ඊසා- 'බිලාල් තුමා විසින් වාර්තා වූ ඉද්රීස්ගේ හදීසය වඩාත් නිවැරදි 'සහීහ්' ගණයට අයත් බව පවසා සිටියේය.
මා පවසා සිටිනුයේ: අෂ්-ෂෙයික් අල් අල්බානි තුමා ද මේ සම්බන්ධයෙන් එවැන්නක්ම අනුගමනය කර ඇති බවයි. එතුමා: බිලාල් තුමා විසින් වාර්තා වූ හදීසය ළර්ෆ් ජිද්දන් ගණයට අයත් බවත් (බලන්න: 'ළර්ෆ් අත් තර්ගීබ්' (357) අබූ උමාමා විසින් වාර්තා වූ හදීසය හසන් ලිගය්රිහි ගණයට අයත් බවත් (බලන්න: 'අස්-සහීහා (624) අවධාරණය කරයි.
අප සඳහන් කළ දෑහි සාරාංශය: සැබැවින්ම මෙම හදීසය අබූ උමාමාගේ වාර්තාකරණය අනුව ස්ථිර හදීසයක් බවයි. නමුත් එහි ''ශරීරයෙන් ලෙඩරෝග ඉවත් කරන්නකි.'' යන ප්‍රකාශය සඳහන්ව නැත.

සඳහා ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් සඳහා (ස්වර්ගයේ) සඟවා ඇති නෙතට දැකුම් කලු දෑ කිසිදු ආත්මයක් නොදන්නේය.

සැබැවින්ම (ﷺ) තුමාණන් නබි රාත්‍රි සලාතයේ මහිමය පිළිබඳ මෙනෙහි කරන අවස්ථාවේ එය පැහැදිළි කරනු පිණිස මෙම වැකි දෙක පාරායනය කර ඇත්තාහ.

***

"රාත්‍රියේ මැදභාගයේ ගැත්තාගේ සලාතය" යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

තහජ්ජුද් සලාතය ඉටු කිරීමේ උතුම්ම වේලාව මෙහි සඳහන් කර ඇත. එනම් රාත්‍රියේ මැද කොටසයි.

සැබැවින්ම රාත්‍රියේ මැද භාගය යනුවෙන් භාවිතා කරනු ලබන විට ඉන් අදහස් කරන්නේ මධ්‍යම රාත්‍රියයි. එය අවසන් රාත්‍රියේ මැද කොටස යැයි පවසන විට රාත්‍රියේ දෙවන භාගයේ මැද කොටසයි. පහළ කරන ලද දේව වාක්‍ය සඳහන් කරන වේලාව එයයි.

"කටයුත්තේ සිරස, එහි කුළුණ හා එහි උච්චතම ස්ථානය ගැන මම ඔබට දන්වා සිටිය යුතු නොවේ ද? මම: එසේය අල්ලාහ්ගේ දූතයාණනි, යැයි පැවසුවෙමි. එතුමාණන්: කටයුත්තේ සිරස ඉස්ලාමයයි. එහි කුළුණ සලාතයයි. එහි උච්චතම ස්ථානය ජිහාද් හෙවත් අරගලයයි." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

සිරස, එහි කුළුණ හා එහි උච්චතම ස්ථානය යනා දී වශයෙන් කරුණු තුනක් මෙහි දී නබි (ﷺ) තුමාණන් විසින් සඳහන් කර ඇත.

මෙහි කටයුත්ත යනුවෙන් අදහස් කරනුයේ දහමයි. වෙනත් වාර්තාවක එය ෂහාදා ප්‍රතිපත්තිමය ප්‍රකාශ දෙක යනුවෙන් විස්තර කර ඇත. කවරෙකු එම සාක්ෂියේ ප්‍රකාශ දෙක මතුපිටින් මෙන්ම අභ්‍යන්තරයෙන් පිළි නොගන්නේ ද ඔහුට ඉස්ලාමයේ කිසිදු කොටසක් නැත.

දහම බලගන්වන පාද වනුයේ සලාතයයි. එමගින් දහම පවතී. එය කූඩාරමක් එහි කණු මත පිහිටන්නාක් බඳුය.

එහි උච්චතම ස්ථානය වනුයේ: එනම් එහි ඇති වඩාත් උසින් හා ඉහළින් පිහිටනුයේ අල් ජිහාද් නම් ප්‍රයත්නයයි. අනිවාර්යය කටයුතු ඉටු කිරීමෙන් පසු පවතින ඉතා ශ්‍රේෂ්ඨතම ක්‍රියාව මෙය බව පෙන්වා දී ඇත. ඉමාම් අහ්මද් හා සෙසු විද්වතුන් පවසා සිටිනුයේ ද එලෙසමය.

***

“මේ සියලු දෑහි පදනම මා ඔබට දන්වා සිටිය යුතු නොවේ ද? විමසා සිටියහ. මම: එසේය අල්ලාහ්ගේ දූතයාණනි, යැයි පැවසුවෙමි. යන ප්‍රකාශය වනාහි:

මෙය දිව ප්‍රවේසම් කර ගැනීමත් එය පාලනය කිරීමත් එය සීමා කිරීමත් පෙන්වා දෙයි. සියලු යහපතවල මූලය එයයි. කවරෙකු තම දිව පාලනය කර ගත්තේ ද එහි කාර්යය ඔහු සතු වන්නේය. ඔහු එයට තීන්දු දෙයි. එමෙන්ම ඔහු එය පාලනය කරයි.

ඔවුන්ගේ දිවවල් නෙළාගත් දෑ යනුවෙන් අදහස් කරනුයේ තහනම් කරන ලද කතාවෙන් හිමිවන ප්‍රතිවිපාක හා එහි දඬුවම්ය. සැබැවින්ම මිනිසා තම ප්‍රකාශයෙන් හා ක්‍රියාවෙන් රෝපණය කරන දෑ මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ නෙළා ගනු ඇත. එහෙයින් කවරෙකු යහපතක් රෝපණය කරන්නේ ද ඔහු ගෞරවය නෙළා ගනු ඇත. නමුත් කවරෙකු නපුරක් රෝපණය කරන්නේ ද ඔහු දුක නෙළා ගනු ඇත.

සෙයිද් ඉබ්නු අස්ලම් තම පියාගෙන් ලමා වාර්තා කළ හදීසයක් ඉමාම් මාලික් තුමා විසින් මෙසේ පළ කර ඇත. සැබැවින්ම උමර් (රළියල්ලාහු අන්හු) තුමා අබූ බක්ර් (රළියල්ලාහු අන්හු) තුමා තම දිව අදිමින් සිටිය දී එතුමා අතරට පිවිසුණහ. එවිට උමර් තුමා ඕහ් අල්ලාහ්ට ඔබට සමාව දෙත්වා යැයි පැවසීය. එවිට අබූ බක්ර් තුමා ‘සැබැවින්ම මෙය ගෙන දෙන දේ මා වෙත ගෙන දී ඇත.” යනුවෙන් පවසා සිටියහ.

ඉබ්නු මස්ඌද් තුමා: නැමදුමට සුදුස්සා ඔහු හැර වෙනත් කිසිවකු නොවූ අල්ලාහ් මත දිවුරා “මිහිතලයේ දිවට වඩා දිගුකලක් සිර ගත කරන්නට අවශ්‍ය වෙනත් කිසිවක් නැත.” යැයි පවසමින් සිටියහ.

යූනුස් ඉබ්නු උබෙය්ද් තුමා විසින් මෙසේ ප්‍රකාශ කර ඇත: තම දිව වැඩකට ඇති යම් කරුණක් මත වී නම් මිස එය ඔහුගේ සෙසු කටයුතුවලදී ද දැහැමි කටයුත්තක් ලෙස පිහිටනු මම දැක නැත. [225]

225. දිව හා බැඳුණු දැහි සැහීමට පත් විමට බලන්නන් මෙම පොතෙහි 15 වැනි හදීසය වෙත යොමු වී බලන්න.

## الحَدِيْثُ الثَّلاَثُوْنَ

## තිස් වන හදීසය

عَنْ أَبِي ثَعْلَبَةَ الْخُشَنِيِّ رَضِيَ اللهُ عَنْهُ، عَنِ النَّبِيِّ ﷺ، قَالَ:

"إِنَّ اللهَ فَرَضَ فَرَائِضَ، فَلَا تُضَيِّعُوهَا، وَحَدَّ حُدُودًا فَلَا تَعْتَدُوهَا، وَحَرَّمَ أَشْيَاءَ، فَلَا تَنْتَهِكُوهَا، وَسَكَتَ عَنْ أَشْيَاءَ رَحْمَةً لَكُمْ غَيْرَ نِسْيَانٍ، فَلَا تَبْحَثُوا عَنْهَا".

حَدِيثٌ حَسَنٌ، رَوَاهُ الدَّارَقُطْنِيُّ وَغَيْرُهُ.

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බව අබූ සඃලබා අල්-කුෂනිය්යි (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

“නියත වශයෙන්ම අල්ලාහ් ‘ෆරාඉළ්’ (හෙවත් ආගමික අනිවාර්යය කටයුතු) නියම කර ඇත. එබැවින් නුඹලා ඒවා නොසලකා නොහරින්න. ඔහු සීමාවන් නියම කර ඇත. එබැවින් ඒවා ඉක්මවා නොයන්න. ඔහු ඇතැම් කරුණු තහනම් කර ඇත. එබැවින් ඒවා උල්ලංඝනය නොකරන්න. ඇතැම් කරුණු, අමතක වීමකින් නොව, නුඹලාට ආශිර්වාදයක් වනු පිණිස ඒවා පිළිබඳ ඔහු නිහඬ වී ඇත. එබැවින් ඒවා ගැන නොසයන්න.”

මෙය හසන් ගණයට අයත් හදීසයක් වන අතර ඉමාම් දාරුකුත්නි හා වෙනත් අය විසින්ද මෙය වාර්තා කර ඇත.

***

## -විග්‍රහය-

අබූ බක්ර් ඉබ්නු අස්සම්ආනී තුමා: “මෙම හදීසය ආගමික මූලිකාංග අතරින් වැදගත් මූලිකාංගයකි.” යැයි පැවසීය. එතුමා තවදුරටත්: “එහෙයින් කවරෙකු මෙම හදීසය ක්‍රියාත්මක කරන්නේ ද සැබැවින්ම ඔහු කුසල් උපයා ගනී. දඬුවමින් ආරක්ෂිත වෙයි. ඊට හේතුව සැබැවින් කවරෙකු අනිවාර්යය කටයුතු ඉටු කර, තහනම් කරන ලද දැයින් වැළකී, නියමිත සීමාවන් අබියස නතර වී, එහි නැති අඩුපාඩු ගැන සෙවීම අතහැර දමන්නේ ද සැබැවින්ම ඔහු අතිරික්තයේ කොටස් සම්පූර්ණ කර ඇත. දහමේ වගකීම් පූර්ණවත් කර ඇත. එමෙන්ම මෙම හදීසයේ සඳහන් කරනු ලැබූ මෙම වර්ග අතරින් ෂරීආ පිළිවෙත් බැහැර නොවීමද ඊට හේතු වන්නේය.

සැබැවින්ම ෆරාඉල් හෙවත් අනිවාර්යය කටයුතු වනාහි: අල්ලාහ් තම ගැත්තන්හට ඉටු කිරීම සඳහා පැවරූ සලාතය, සකාතය, උපවාසය හා හජ් වැනි අනිවාර්යය කළ දෑය.

තහනම් කරනු ලැබූ දෑ වනාහි: අල්ලාහ් ඒ වටා වැට බැඳ ඇති, ඒ වෙත සමීප වීමෙන් ද ඒවා සිදු කිරීමෙන් ද ඒවායෙහි නිරත වීමෙන් වළක්වා ඇති තහනම් දෑය.

ඉක්මවා යෑම අල්ලාහ් තහනම් කළ ඔහුගේ සීමාවන් වනාහි: සමස්තයක් වශයෙන්ම මෙහි අදහස: එය සිදු කිරීමට අවසර දී ඇති දෑ අනිවාර්යය හෝ අතිරේක හෝ අනුමත හෝ කවර ස්වරූපයකින් වුව ද එක සමාන බවයි.

එය ඉක්මවා යෑම යනු: ඒවා ඉක්මවා ගොස් ඔහු තහනම් කළ දෑ සිදු කිරීමයි.

‘අල්හුදූද්’- යන අරාබි පදය සීමාවන් යනුවෙන් මෙහි භාවිත කෙරී ඇත. ඉන් අදහස් කරනුයේ තහනම් කරනු ලැබූ දෑ පමණය. එක් අවස්ථාවක එවිට නුඹලා අල්ලාහ්ගේ සීමාවන්ට කිට්ටු නොවනු යැයි සඳහන් කරනු ලැබ ඇත. උත්තරීතර අල්ලාහ්ගේ එවැනි ප්‍රකාශයක් මෙසේය: ‘මේවා අල්ලාහ්ගේ සීමාවන්ය. එහෙයින් නුඹලා ඒවාට සමීප නොවනු. (සූරා අල් බකරා: 187)

තහනම් කරන ලද මහා අපරාධ සඳහා නියම කරන ලද දණ්ඩ නීති සඳහා ද ‘හුදූද්’ නම් නාමය භාවිත කෙරේ. හද්දුස් සිනා -කාමයේ වරදවා හැසිරීමේ

දණ්ඩ නීතිය- හද්දුස් සරිකා -සොරකමේ දණ්ඩ නීතිය, හද්දු ෂූර්බිල් කම්රි' මත්පැන් පානය කිරීමේ දණ්ඩ නීතිය යනුවෙන් පවසනු ලැබ ඇත. ආගමික නීති විශාරදයින් අතර 'හුදූද්' යන නාමය භාවිතයේ තිබීම ප්‍රචලිත කරුණකි.

ඒ පිළිබඳ නිහඬව සිටි දෑ වනාහි: එහි නීතිය පිළිබඳ අනුමත ද අනිවාර්යය ද තහනම් කර ඇත් ද යන වගක් සඳහන් කරනු නොලැබූ දෑය. එය සමා කරනු ලද්දකි. එවැන්නක් සිදු කරන්නාහට වරදක් නැත.

"එබැවින් ඒවා ගැන නොසයන්න." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

ඒවා ගැන සෙවීමෙන් තහනම් කරන ලද කරුණු අතරට: කවර කරුණක් විශ්වාස කරන මෙන් පවසා එහි ස්වරූපය පිළිබඳ පැහැදිළි කර නොමැත්තේ ද එවන් ගුප්ත තොරතුරු සහිත කරුණුය. එවන් දෑ ගැන සෙවීම තහනම් කරන ලද දෑ අතරට පත් වන්නේය. සැබැවින්ම එය සැකය හා කුතුහලය ඇති කරවයි. බොරු පැවසීමට ක්‍රමයෙන් යොමු කරවයි.

නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බවට අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලද හදීසයක් සහීහ් මුස්ලිම් හි මෙසේ වාර්තා වී ඇත. 'මෙය අල්ලාහ්ය, ඔහු සියලු මැවීම් මවා ඇත්තේය, එසේ නම් අල්ලාහ්ව මැව්වේ කවුදැ?යි පවසනු ලබන තෙක් මිනිසා ප්‍රශ්න කරමින්ම සිටිති. කවරෙකුට එවන් කිසිවකට මුහුණ දීමට සිදු වූයේ නම් ඔහු 'මම අල්ලාහ්ව විශ්වාස කළෙමි' යැයි පැවසිය යුතුය.[226]

226. මුස්ලිම් (134) ෂෙයිතාන්ගෙන් යම් බලපෑමක් ඇති වූ විටෙක මුස්ලිම්වරයකු පැවසිය යුතු දැයින් එක් ක්‍රමයකි මෙය.
සහීහ් ගණයට අයත් හදීස්වල සඳහන් පරිදි එවන් තත්ත්වයකදී මුස්ලිම්වරයා පැවසිය යුතු හා ක්‍රියා කළ යුතු ඇතැම් ක්‍රම මෙහිදී කෙටියෙන් සඳහන් කිරීමට කැමැත්තෙමි.

1. 'ආමන්තු බිල්ලා' - මම අල්ලාහ්ව විශ්වාස කළෙමි.
2. මුස්ලිම්හි සඳහන් තවත් වාර්තාවක් පරිදි 'ආමන්තු බිල්ලාහි වරසූලිහි' මම අල්ලාහ් හා ඔහුගේ දූතයාණන්ව විශ්වාස කළෙමි.
3. අල්ලාහ්ගෙන් ආරක්ෂාව පැතීම හා එසේ ප්‍රතික්ෂේප කිරීමට තුඩු දුන් වාදය අවසන් කර ගැනීම.

ඉස්හාක් ඉබ්නු රාහවී මෙසේ පවසයි: "මැවුම්කරු(ගේ පැවැත්ම) පිළිබඳ සොයා බැලීමට අවශ්‍ය නොවන්නේය. ගැත්තන්හට අවශ්‍ය වනුයේ තමන්ට ඇසෙන්නට ලබන මැවීම් සම්බන්ධයෙන් පරිශීලනය කර බැලීමයි. ඊට වඩා වැඩියෙන් සොයා නොබැලිය යුතුයි. ඔවුන් එසේ සිදු කළේ නම් මං මුළා වී යනු ඇත."

එතුමා තවදුරටත්: අල්ලාහ් මෙසේ පවසා සිටියි "ඔහුගේ ප්‍රශංසාවෙන් ඔහු ව පිවිතුරු කරනු මිස වෙනත් කිසිවක් නැත." (සූරා අල් ඉස්රා: 44) දඩු කැබලි රොටි සහ ඇඟලුම් ඔහුව පිවිතුරු කරනුයේ කෙසේදැ?යි විමසීම සුදුසු නොවන්නේය. සැබැවින්ම මේ සියල්ල පිවිතුරු කරමින් සිටින්නේය යන නිවැරැදි දැනුම පිහිටිය යුතුයි. එය අල්ලාහ් වෙතය. ඔහු අභිමත කරන පරිදි හා ඔහු අභිමත කළ සේ ඔවුන්ගේ පිවිතුරු කිරීම පිහිටිය යුතු අතර තමන් දන්නා දැහි පමණක් මිස වෙනත් කිසිවක නිරත වීම සුදුසු නැත. අල්ලාහ් දන්වා ඇති දෑ ගැන මිස වෙනත් කරුණක් හා එවන් දෙයක් කතා කිරීම ද සුදුසු නැත. ඊට වඩා අමතර ව කතා කිරීමට ද සුදුසු නැත. එහෙයින් නුඹලා අල්ලාහ්ට භක්තිමත් වනු. මෙවන් සැකයට තුඩු දෙන කරුණුවල නිරත නොවනු. හේතුව සැබැවින්ම එය සත්‍යය පිළිවෙතින් වෙනත් දෙසකට යොමු වීම නුඹලා ව විනාශ මුඛය කරා ගෙන යනු ඇත.

මේ සියල්ල උපුටා දක්වා ඇත්තේ ඉස්හාක් තුමා විසින් ලබා හර්බ් තුමාය (ඔවුන් දෙදෙනාටම අල්ලාහ් ආශිර්වාද කරත්වා!)[227]

4. 'සදකල්ලාහු වරසූලුහු' අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් සත්‍යය ප්‍රකාශ කර ඇත.
5. 'අල්ලාහු අහද්, අල්ලාහුස් සමද්, ලම් යලිද්, වලම් යූලද්, වලම් යකුන් ලහු කුෆුවන් අහද්' අල්ලාහ් ඒකීයය. අල්ලාහ් අවශ්‍යතාවන්ගෙන් තොරය. "ඔහු දාව බිහි කළේ හෝ බිහි කරනු ලැබුවේ හෝ නැත. ඔහුට සමාන කිසිවකු හෝ නැත.' යැයි පවසා පසුව වම් දෙසට කෙළ ගසන මෙන් තෙවරක් ඉඟි කොට ෂෙයිතාන්ගෙන් ආරක්ෂාව පැතිය යුතුය. මෙය අබූ දාවූද් තුමා හසන් ගණයට අයත් වාර්තාකරණයකින් පළ කර ඇති හදීසයකි.

227. කිසියම් කුකුසක් හෝ සැකයක් හෝ තම හදවතෙහි හට ගත් අයහට වඩාත් ප්‍රයෝජනවත් වැදගත් ෆත්වා -ආගමික තීන්දුවක්- අෂ්-ෂෙයික් මුහම්මද් ඉබ්නු සාලිහ් අල් උසයිමීන් සතුව ඇත.

අල්ලාහ් සම්බන්ධයෙන් බැඳුණු කරුණුවලදී ෂෙයිතාන් ඔහුට විශාල වශයෙන් කුකුස් ඇති කළ ඒ ගැන ඔහු ද දැඩි බියකින් පසු වූ මිනිසෙකු පිළිබඳ ෂෙයික් තුමාගෙන් විමසන ලදී.
එවිට එතුමා මෙසේ පිළිතුරු දී ඇත්තාහ: ඉන් ඇති වන ප්‍රතිඵලය ගැන බියවන විමසන්නාගේ ගැටලුව පිළිබඳ මෙනෙහි කරනු ලැබූ දැ වනාහි: මම ඔහුට පවසා සිටිනුයේ: සැබැවින්ම යහපත් ප්‍රතිඵල මිස වෙනත් කිසිදු ප්‍රතිඵලයක් ඒ සඳහා ඔහුට නොවනු ඇතැයි මම ඔහුට සුබ පතමි. සැබැවින්ම ෂෙයිතාන් මෙවන් කුකුස් ඇති කරනුයේ මුඃමින්වරුන් තුළය. එය ඔවුන්ගේ සිත් තුළ පවතින ආරෝග්‍යමත් ප්‍රතිපත්තිය කැළඹීමටත් ආධ්‍යාත්මික හා චින්තනික මතෙහි ඔවුන් හෙළන්නටත් පිරිසිදු විශ්වාසය ඔවුනට මුළා කරන්නටත්ය. මෙය දේව විශ්වාසීන් අතරට මැදි වූ ආරම්භක තත්ත්වය නොවේ. එය අවසානය ද නොවේ. මෙම තත්ත්වය සහාභාවරුන්හටද මැදි විය. අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ පවසා සිටියි. අල්ලාහ්ගේ දූතයාණන්ගෙන් (ﷺ) පිරිසක් පැමිණ එතුමාගෙන්: සැබැවින්ම අපගේ සිත් තුළ ඒ ගැන කතා කිරීමට පවා බරපතල කරුණක් අපි දකින්නෙමු. එවිට එතුමා: "නුඹලා එය අත් විඳිනේනේදැ"යි විමසා සිටියේය. ඔවුහු: 'එසේය' යැයි පිළිතුරු දුන්නෝය. එතුමා: "දේව විශ්වාසයේ පැහැදිලිතාව එය වේ" යැයි පැවසූහ. (මුස්ලිම්)

බුහාරි හා මුස්ලිම් හි සඳහන් තවත් ප්‍රකාශයක: සැබැවින් නබි (ﷺ) තුමාණන්: ෂෙයිතාන් නුඹලා අතරට පැමිණ, මෙසේ මවා ඇත්තේ කවුරුන් ද මෙසේ මවා ඇත්තේ කවුරුන් ද යැයි නුඹේ පමරාධිපති ව මවා ඇත්තේ කවුරුන් දැයි පවසන තෙක්ම කොඳුරමින් සිටියි. එය ඔබ අත් විඳින විට අල්ලාහ්ගෙන් ආරක්ෂාව පතන්නය. එයින් වැළකී සිටින්න." යැයි පවසා සිටියහ.

ඉබ්නු අබ්බාස් තුමා විසින් වාර්තා කරන ලද හදීසයක: මිනිසෙකු නබි (ﷺ) තුමාණන් වෙත පැමිණ: මාගේ සිත මා හට යමක් පවසයි. ඒ ගැන මම කතා කරනවාට වඩා පරවියෙක් බවට පත්වීම වඩාත් ප්‍රිය කරමි යැයි පැවසීය. එවිට එතුමාණන්: ඔහුගේ කරුණ කුතුහලය වෙත යොමු කළ අල්ලාහ්ටම සියලු ප්‍රශංසා යැයි පවසා සිටියහ. (මූලාශ්‍රය: අබූ දාවූද්)

එබැවින් මෙම ප්‍රශ්නය විමසා සිටි අයට මා පවසා සිටිනුයේ: සැබැවින්ම මෙය ෂෙයිතාන්ගේ කුකුසක් බව ඔබට පැහැදිලි වූ විට ඔබ ඒසමග අරගල කළ යුතුයි. එය දරා ගත යුතුයි. සැබැවින්ම ඔබ කැපවීමෙන් යුතු ව නියම කරන ලද අනිවාර්ය කටයුතු ඉටු කොට ඔබට සිතට පහළ වූ කුකුස් නොසළකා හැර එහි පසුපසින් මතුවන දැයින් වැළකී සිටියහොත් ඒ සමගම ඔබට කිසිදු හානියක් සිදු කරන්නට එයට නොහැක. නබි (ﷺ) තුමාණන් : "මාගේ සමූහයාගේ හදවත් තුළ ඇති වන කුකුස් ඔවුන් ඒ අනුව කටයුතු නොකරන තාක් හෝ ඒ ගැන කතා නොකරන තාක් සැබැවින්ම අල්ලාහ් ඔවුනටම සමාව දෙනු ඇත." (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්) ඔබ තුළ කුකුස ඇති කර ගත් දැ ගැන ඔබ විශ්වාස කරන්නේ ද එසේ නැතිනම් එය සැබෑ ලෙසින් දකින්නේද එමගින් අල්ලාහ් ව වර්ණනා කළ හැකිදැයි විමසා සිටින විට ඔබ මෙසේ පැවසිය යුතුයි. 'ඒ ගැන කතා කිරීම අපට සුදුසු නොවීය. ඔබ පිවිතුරුය. මෙය අතිමහත් සාධකයකි.' යැයි පවසන්න. ඔබේ

හදවතින් හා ඔබේ දිවෙන් එය පිළිකුල් කරන්නේ නම් එයින් පලා යැමෙන් මිනිසුන් අතර වඩාත් දුරින් සිටිනුයේ ඔබ වනු ඇත. එවිට කුකුස හා වැරදි ඇති වූ වහාම ඔබේ සිතට ෂෙයිතාන් මැදි වී ඇති බවත් එමගින් ඔහු ඔබ නොමග යැවීමට හා ඔබේ දහම ඔබට ඇන්දවීමට උත්සාහ කරන බවත් ඔබේ සිතට වැටහෙනු ඇත. එබැවින් ඔබ එය නොවටිනා දෙයක් බව දකිනු ඇත. ඔබේ සිතට ෂෙයිතාන් ඒ පිළිබඳ සැක පහළ නොකරනු ඇත. උදාහරණයක් වශයෙන් වැසියන්ගෙන් පිරුණු විශලා නගරයක් ඇති බවට ඔබට අසන්නට ලැබේ. එහි පැවැත්ම පිළිබඳ ඔබේ සිතෙහි කිසිදු සැකයක් නැත. එවිට ඒ ගැන මිනිසාට සැකය ඇති කිරීමට ෂෙයිතාන්ට කිසිදු මැදි වීමක් ඇත. නමුත් දේව විශ්වාස වන්තයාගේ විශ්වාසය විනාශ කර දැමීමට විශාල මැදිවීමක් ෂෙයිතාන්ට පවතී. ඔහු ඔහුගේ සිත් තුළ ඇති දැනුමේ හා යහමාර්ගයේ ආලෝකය නිවාදමන්නටත් සැකය හා කුතුහලය යන අන්ධකාරයේ ඔහුව හෙළන්නටත් තැත් කරයි. නබි (ﷺ) තුමාණන් සාධනීය ප්‍රතිකාරයක් අපට පැහැදිලි කර ඇත්තාහ. එනම් 'අල්ලාහ්ගෙන් ආරක්ෂාව පැතිය යුතුයි. ඉන් වැළකී සිටිය යුතුයි යන එතුමාගේ ප්‍රකාශයයි. මිනිසා ඉන් වැළකී අල්ලාහ් අබියස ඇති දෑට ආශා කරමින් ඔහුට ගැතිකම් කිරීමෙහි නිරත වූ විට අල්ලාහ්ගේ බලයෙන් එය ඔහුගෙන් ඉවත් වී යයි.

ඔබේ සිතට පහළ වන සියලු අනුමානයන් හෙළා දකින්න. දැන් ඔබ අල්ලාහ් නමදින්න. ඔහුට කණ්ණලව් කරන්න. ඔහුට ගරු බුහුමන් කරන්න. කවර කරුණක් සැකය ඇති කරන්නේ ද එවැන්නක් විස්තර කරන අයකු පිළිබඳ ඔබට අසන්නට ලැබුණේ නම් ඔබට හැකිනම් එය විනාශ කර දමන්න. එවිට කවර කරුණක් සැකයට තුඩු දුන්නේද එය සිදුවුනු යථාර්ථයක් නොවන නමුත් එය කුකුස් හා සැකයන් බව හා එයට කිසිදු පදනමක් නොමැති බව වැටහෙනු ඇත.

මාගේ උපදෙස පහත සඳහන් අයුරින් සාරාංශ ගත වී ඇත.

1. අල්ලාහ්ගෙන් රැකවරණය පැතීම, නබි (ﷺ) තුමාණන් නියෝග කළ පරිදි එවන් සියලු ආකාරයේ අනුමානයන්ගෙන් සම්පූර්ණයෙන්ම වැළකී සිටීම.
2. අල්ලාහ්ව මෙනෙහි කිරීම, මෙවන් කුකුස් සහිත කරුණුවල නිරත කරවීමෙන් ආත්මය පාලනය කිරීම.
3. අල්ලාහ්ගේ නියෝග පිළිපදිමින් හා ඔහුගේ තෘප්තිය බලාපොරොත්තු වෙමින් නැමදුම්වල හා ආගමික කටයුතුවල දැඩි සේ කැපවී කටයුතු කිරීම. කැපවීමෙන් යුතුව මුළුමණින් නැමදුම් කිරීමට හැරෙන මොහොතේ - ඉන්ෂා අල්ලාහ්- එවන් කුතුහලයන් තුළ නිරත වීම ඔබට අමතක වී යනු ඇත.
4. අල්ලාහ් වෙත අධික වශයෙන් යොමු වීම. එම කටයුත්ත පිළිබඳ ඔබට සමාව දෙන මෙන් ප්‍රාර්ථනා කර සිටීම.

සියලු ආකාරයේ නපුරුකම් හා පිළිකුල් සහගත දැයින් මිදීමටත් සුවය ලැබීමටත් ඔබ වෙනුවෙන් මම අල්ලාහ්ගෙන් ඉල්ලා සිටිමි.

'මජ්මූඃ අල් ෆතාවා' නම් කෘතියෙන් උපුටා ගත් ෂෙයික් තුමාගේ ප්‍රකාශයේ අවසානයි. මෙය අෂ්-ෂෙයික් ෆහ්ද් අස්-සුලෙයිමාන්ගේ එකතුවකි. (1/57)

## الحَدِيْثُ الحَادِي والثَّلاثُوْنَ

## තිස් එක් වන හදීසය

عَنْ سَهْلِ بْنِ سَعْدٍ السَّاعِدِيّ قَالَ:

جَاءَ رَجُلٌ إِلَى النَّبِيِّ ﷺ فَقَالَ: يَا رَسُولَ اللهِ دُلَّنِي عَلَى عَمَلٍ إِذَا عَمِلْتُهُ أَحَبَّنِي اللهُ، وَأَحَبَّنِي النَّاسُ.

فَقَالَ: "ازْهَدْ فِي الدُّنْيَا يُحِبَّكَ اللهُ، وَازْهَدْ فِيمَا فِي أَيْدِي النَّاس، يُحِبَّكَ النَّاسُ".

حَدِيثٌ حَسَنٌ رَوَاهُ ابْنُ مَاجَهْ وَغَيْرُهُ بِأَسَانِيدَ حَسَنَةٍ.

සහ්ල් ඉබ්නු සඃද් අස්-සාඉදීය්යි (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

මිනිසෙකු නබි (ﷺ) තුමා වෙත පැමිණ: අල්ලාහ්ගේ දූතයාණෙනි, එය මා ඉටු කළ විට අල්ලාහ් මට ප්‍රිය කරන එමෙන්ම මිනිසුන් ද මට ප්‍රිය කරන ක්‍රියාවක් පෙන්වා දෙන්නැ'යි විමසා සිටියේය.

එවිට එතුමාණන්: 'ඔබ මෙලොවෙහි සරල ව ජීවත් වන්න. අල්ලාහ් ඔබට ප්‍රිය කරනු ඇත. ජනයා අතර තිබෙන දෑහි ඔබ සරල ව ජීවත් වන්න. මිනිසුන් ඔබට ප්‍රිය කරනු ඇත.

මෙම හදීසය හසන් ගණයට අයත් හදීසයකි. ඉබ්නු මාජා මෙන්ම වෙනත් අය විසින් ද හසන් ගණයට අයත් වාර්තාවලියකින් මෙය පළ කර ඇත.

***

## -විග්‍රහය -

මෙම හදීසය වැදගත් උපදෙස් දෙකක් අන්තර්ගත කොට ගෙන ඇත.

පළමුවැන්න: මෙලොවෙහි චාම් ගතිය -සරල භාවය-. සැබැවින්ම එය අල්ලාහ්ගේ ආදරය ගෙන දෙන්නකි.

දෙවැන්න: මිනිසුන් අතර සරල ජීවිතය. සැබැවින්ම එය මිනිසුන්ගේ ආදරය ගෙන දෙන්නකි.[228]

මෙලොවෙහි සරල භාවය වනාහි:

ඒ ගැන පැසසුම් කරමින් හා මෙලොවෙහි පවතින දැඩි ආශාව පහත් කරමින් පෙන්වා දෙන අල් කුර්ආන් වැකි බොහෝමයක් සඳහන් ව පැමිණ ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. ‘නමුත් ඔවුන් මෙලොව ජීවිතය තෝරා ගනිති. මතුලොව උතුම්ය. සදා පවතින්නකි.” (සූරා අල් අඃලා: 16,17) තවදුරටත් අල්ලාහ් මෙසේ පවසයි: “මෙලොව වස්තුව නුඹලා ප්‍රිය කරන්නෙහුය. අල්ලාහ් මතු ලොව ප්‍රිය කරයි.” (සූරා අල් අන්ෆාල්: 67) කාරූන්ගේ කතා වස්තුවෙහි අල්ලාහ් මෙසේ පවසයි: “ඔහු තම සමූහයා අතරට අලංකාරයෙන් යුතුව පිටත්ව පැමිණියේය. මෙලොව ජීවිතය ප්‍රිය කරන්නන් කාරූන්ට දෙනු ලැබූවාක් මෙන් අපට ද විය යුතු නොවේ ද සැබැවින්ම ඔහු අති මහත් භාග්‍ය වන්තය යැයි පවසා සිටියේය. නමුත් දැනුම දෙනු ලැබූවන් නුඹලාට විනාශය අත් වේවා! විශ්වාස කොට දැහැමි ක්‍රියාවන් සිදු කරන්නන් හට අල්ලාහ්ගේ තිළිණ උතුම්ය. ඉවසිලිවන්තයින් හැර වෙනත් කිසිවකු එය නොලබන්නේය යැයි පවසා සිටියේය.” (සූරා අල් කසස් 79:80), උත්තරීතර අල්ලාහ් මෙසේද පවසයි. “මෙලොව ජීවිතය පිළිබඳ ඔවුහු සතුටු වූහ. මෙලොව ජීවිතය මතුලොවෙහි ස්වල්ප භුක්ති විඳීමක් පමණි. (සූරා අර්:රඃද්: 26) උත්තරීතර අල්ලාහ් තවදුරටත් මෙසේ පවසයි. “නබිවරය ඔබ පවසන්න: මෙලොව භුක්ති විඳින සම්පත් අල්පය. බිය

228. ජනයා අතර පවතින සරලභාවය මෙලොවෙහි තිබිය යුතු පොදු සරලභාවය තුළට ඇතුළත් වන්නකි. එහි සරලභාවයෙන් යුතුව කටයුතු කිරීම අල්ලාහ්ගේ ආදරය හා මිනිසුන්ගේ ආදරය අනිවාර්යය කරනු ඇත. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්තරීෆී)

බැතිමත් වූවන් හට මතුලොව උතුම්ය. රට ඉදි කෙන්දක් තරම්වත් නුඹලා අපරාධ කරනු නොලබති.'' (සූරා අන් නිසා: 77)

ෆිර්අවුන් පැළැන්තියෙන් දෙවියන් කෙරෙහි විශ්වාස තැබූ අයකු පිළිබඳ අල්ලාහ් පවසා සිටින විට දී ඔහු තම සමූහයා දෙස බලා මෙසේ පැවසූ බව දන්වා සිටියි. ''විශ්වාස කළ තැනැත්තා: 'මාගේ සමූහයනි, නුඹලා මා අනුගමනය කරනු යහ මග මම නුඹලාට මග පෙන්වමි. මාගේ ජනයිනි, සැබැවින්ම මෙලොව ජීවිතය ස්වල්ප භුක්ති විඳීමක් පමණි. සැබැවින්ම මතු ලොව සදා නිවහනයි.'' (සූරා ගාෆිර්: 38,39)

තම ක්‍රියාවෙන් තම උත්සාහයෙන් හා තම චේතනාවෙන් මෙලොව ජීවිතයට ඇලුම් කරන්නා පහත් කරමින් අල්ලාහ් ප්‍රකාශ කර ඇත. පෙර සඳහන් 'ඉන්නමල් අඃමාලු බින්නිය්යාත්' නම් හදීසය යටතේ ඒ පිළිබඳ විස්තර කර ඇත.

අල්ලාහ් අබියස මෙලොවෙහි පහත් භාවය හා අල්ප භාවය පිළිබඳ සඳහන් හදීස් බොහෝමයක්ම ඇත.

ජාබිර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් සහීහ් මුස්ලිම්හි මෙසේ සඳහන් වෙයි. සැබැවින්ම නබි (ﷺ) තුමාණන් වෙළඳ පොළක් අසලින් ගමන් ගත්හ. මිනිසුන් ද ඒ දෙපස විය. එතුමා මිය ගිය කන් කොට සතෙකු අසළින් ගමන් ගත්හ. පසුව එය ඉදිරිපත් කරමින් උගේ කන අල්ලා මෙසේ පැවසූහ: 'මෙයට දිර්හමයක් දෙන්නට ඔබ අතුරින් කවරෙකු කැමැත්තේදැ?'යි විමසූහ. එවිට ඔවුහු: සැබැවින්ම උගෙන් කිසිවක් අප ප්‍රිය කරන්නේ නැත. උගෙන් කිසිවක් අපට කළ හැක්කේ ද නැත. යැයි පිළිතුරු දුන්නෝය. එතුමා 'සැබැවින්ම එය ඔබ අයිති කර ගන්නට කැමැත්තේදැ?යි විමසීය. ඔවුහු අල්ලාහ් මත දිවුරා පවසමි. ඌ ජීවතුන් අතර ද සිටියත් උගේ අඩු පාඩුවක් ඇත. එය ඌ කන් කොට සතෙකු වීමය. එසේ නම් මිය ගිය තත්ත්වයේ එය කෙසේ විය හැකිදැයි පවසා සිටියෝය. එවිට එතුමාණන්: 'අල්ලාහ් මත දිවුරා පවසමි. මෙය නුඹලා වෙතට පත් වීමට වඩා අල්ලාහ් අබියස මෙලොවට ඇත්තේ ඉතා පහත් තත්ත්වයකි.'[229]

229. මුස්ලිම් (2957)

නබි (ﷺ) තුමාණන් පැවසූ බව අල්-මුස්තව්රිද් අල්-ෆිහ්රී තුමා විසින් මෙසේ වාර්තා කර ඇත. "මෙලොව මතුලොව සමග බලන කල ඔබ අතුරින් කිසිවකු තම ඇඟිල්ල මුහුදේ දමා ගත් විට කවර කරුණක් ඉන් ලැබෙන්නේ ද එවැන්නක් දකින්නාක් මෙන් මිස නැත."[230]

යම් කරුණකදී සරලභාවය -අස්සුහුද්- යන්නෙහි අර්තය: එයින් නිදහස් වීම එහි පවතින අල්පභාවය සහ ඒ ගැන දක්වන බලවත් උනන්දුව යනාදිය උදෙසා ඉන් ඉවත්වී සිටීමය. අරාබියෙන් 'ෂය්උන් සහීද්' යනුවෙන් පවසනු ලැබේ. මෙහි පදානුගත අර්ථය 'අල්ප ස්වල්ප දෙයකි' යන්නයි.

මුල්කාලීනයන් හා ඉන් පසු පැමිණි ඇතැමුන් මෙලොවෙහි සරලභාවය පිළිබඳ විස්තර කිරීමේදී ප්‍රකාශ ගණනාවක්ම කර ඇති අතර ඒ ගැන වූ ඔවුන්ගේ ප්‍රකාශ විවාධාකාරය.

ඉමාම් අහ්මද් 'අස්-සුහුද්' නම් කෘතියෙහි මෙසේ වාර්තා කර ඇත. අබූ මූසා අල් කව්ලානී තුමා: 'මෙලොව සරල භාවය යනු අනුමත දෑ තහනම් කිරීම හෝ මුදල් නාස්ති කිරීම හෝ නොව සැබැවින්ම මෙලොවෙහි සරලභාවය යනු ඔබේ දෑතෙහි ඇති දෑට වඩා අල්ලාහ්ගේ දෑතෙහි ඇති දෑ ගැන දැඩි විශ්වාසය ඇති කර ගෙන යම් අභාග්‍යයක් ඇති වූ විටෙක එය ඔබට දිටගම පැවතුණ ද එහි ප්‍රතිඵල හා එහි භාග්‍යය පිළිබඳ දැඩි අපේක්ෂාවෙන් පසුවීමය.'

යූනුස් ඉබ්නු මය්සරා විසින් ලබා ඉබ්නු අබිද් දුන්යා එය මෙසේ දන්වා සිටියි. "මෙලොව සරල භාවය අනුමත දෑ තහනම් කිරීමෙන් හෝ මුදල් නාස්ති කිරීමෙන් හෝ ඇති නොවන්නකි. නමුත් මෙලොව සරලභාවය යනු ඔබේ දෑතෙහි ඇති දෑට වඩා අල්ලාහ්ගේ දෑතෙහි ඇති දෑ පිළිබඳ ඔබට දැඩි විශ්වාසයයක් ඇති වීමයි. එමෙන්ම කරදරයකදී ඔබේ තත්ත්වය හා එවැන්නක් සිදු නොවන විටක දී ඔබේ තත්ත්ව එක සමාන වීම හා සාධාරණයේ දී ඔබව පැසුසුම් කරන්නා හා ඔබට අපහාස කරන්නා සමසේ පිහිටීමයි."

230. මුස්ලිම් (2858)

මෙලොවෙහි සරලභාවය කරුණු තුනකින් විස්තර කෙරී ඇත. ඒ සියල්ල හදවත හා බැඳුණු ක්‍රියාවන් වන අතර ශාරීරික අවයව සමග බැඳුණු ක්‍රියාවන් නොවන්නේය.

ඒවායින් පළමුවැන්න: ගැත්තෙකු ඔහුගේ අතේ ඇති දෑ පිළිබඳ තිබෙන විශ්වාසයට වඩා අල්ලාහ්ගේ අතේ ඇති දෑ පිළිබඳ දැඩි විශ්වාසයකින් පසුවීම. නිවැරැදි ස්ථිර විශ්වාසයෙන් හා එහි ශක්තිමත් භාවයෙන් එය බිහි වන්නේය. සැබැවින්ම අල්ලාහ් තම ගැත්තන්ට පෝෂණය ලබා දීමේ වගකීම භාර ගෙන ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි. "මහපොළොවේ කවර සත්වයකු වුව ද එහි පෝෂණය අල්ලා මත මිස නැත." (සූරා හූද්:6)

කවරෙකු ස්ථිර විශ්වාසය තහවුරු කරන්නේ ද ඔහුගේ සියලු කටයුතුවලදී ඔහු අල්ලාහ් පිළිබඳ විශ්වාසය තබයි. ඒ සඳහා වූ ඔහුගේ සැළසුම පිළිගනියි. බලාපොරොත්තු සහගතව හා බියෙන් සෙසු මැවීම් සමග සම්බන්ධ වීම නවතාලයි. පිළිකුල් සහගත කරුණු තුළින් මෙලොව සෙවීමෙන් එය ඔහුව වළක්වයි. කවරෙකු මෙලෙස සිටින්නේ ද ඔහු සැබෑ ලෙසින් මෙලොවෙහි සරලභාවය රකින්නෙකු වන්නේය. ඔහුට මෙලොවෙහි කිසිවක් නොවූවද ඔහු මිනිසුන් අතර වඩාත් පොහොසත් අයකු වන්නේය.

දෙවැන්න: ගැත්තාට මෙලොව ජීවිතයේ දී මුදල් හෝ දරුවන් නැති වී යාම හෝ වෙනත් යම් අභාග්‍යයක් අත් වූ විට මෙලොවහි ඔහුට අහිමි ගිය දෑට වඩා කුසල් ප්‍රමාණයක් ඔහුට ඉතිරි වනු ඇතැයි අපේක්ෂා කිරීමයි. මෙය ද හට ගැනෙනුයේ පරිපූර්ණ විශ්වාසය තුළිනි.

සැබැවින්ම නබි (ﷺ) තුමාණන් එතුමාණන්ගේ ප්‍රාර්ථනාවෙහි මෙසේ පවසා සිටි බව ඉබ්නු උමර් තුමා විසින් වාර්තා කොට ඇත. එනම්:

اللَّهُمَّ اقْسِمْ لَناَ مِن خَشيتِكَ مَا تحُولُ بهِ بينَنَا وبينَ معاصيكَ، ومن طاعتِكَ ما تبلِّغُنَا بهِ جنَّتَكَ، ومِن اليقينِ مَا تهوِّنُ بهِ علينَا مصائِبَ الدُّنيا.

අහෝ අල්ලාහ්, අප අතර හා ඔබට අකීකරු වීමේ ක්‍රියාවන් අතර බාධකයක් ලෙස ක්‍රියාත්මක වන පරිදි ඔබ පිළිබඳ බිය අපට බෙදා දෙනු මැනව! එමෙන්ම ඔබේ ස්වර්ගය වෙත අපව ළඟා කරවන පරිදි ඔබට කීකරුවීම අපට

බෙදා දෙනු මැනව! මෙලොවෙහි විපත් දරා ගැනීමට අපට පහසු වන පරිදි ස්ථිරත්වය අපට බෙදා දෙනු මැනව![231]

මෙය මෙලොව සරලභාවයේ හා ඒ පිළිබඳ ආශාව නොමැති කමේ සලකුණු අතරින් එකකි. අලී (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ පවසයි: 'කවරෙකු මෙලොව සරලභාවය රකින්නේ ද අභාග්‍යයන් ඔහුට පහසු වනු ඇත.'

තුන්වැන්න, එම ගැත්තා ඉදිරියේ යුක්තිසහගතව ඔහුට පැසසුම් කරන්නා හා ඔහුට දොස් නගන්නා එක සේ සමාන ව හිදීමය. මෙයද මෙලොව ජීවිතයේ සරලභාවය එය පහත් ලෙස සැලකීමේ හා ඒ ගැන පවතින අඩු ආශාව පෙන්වා දෙන සලකුණකි. කවරෙකු ළඟ මෙලොව අති වැදගත් වන්නේ ද ඔහු ප්‍රශංසාව ප්‍රිය කරන අතර අපහාසයට ලක්වීම පිළිකුල් කරයි. කවරෙකු යුක්තියේ දී ඔහුට ප්‍රශංසා කරන්නා හා අපහාස කරන්නා එකසේ සමාන ව සිටින්නේ ද ඔහුගේ හදවතින් මැවීම්හි තත්ත්වය පහත වැටීම, සත්‍යයට ඇති ආදරය පිළිබඳ පූර්ණත්වය සහ ඔහුගේ ස්වාමියාගේ තෘප්තිය පෙන්නුම් කරයි.

මෙලොව ජීවිතයේ සරලභාවය විස්තර කිරීමේදී වෙනත් ප්‍රකාශ ගණනාවක්ම මුල්කාලීනයන් විසින් වාර්තා කර ඇති අතර. ඒ සියල්ල ඉහත සඳහන් අදහස වෙත යොමු වන්නේය.

***

'ඔබ මෙලොවෙහි සරල ව ජීවත් වන්න. අල්ලාහ් ඔබට ප්‍රිය කරනු ඇත." යන හදීසයේ විග්‍රහය වෙත යොමු වී බලමු.

මෙම හදීසය මෙලොවෙහි සරලභාවයෙන් ජීවත්වන්නන්හට සැබැවින්ම අල්ලාහ් ප්‍රිය කරන බව පෙන්වා දෙයි. ඇතැම් මුල්කාලීනයින් විසින් මෙසේ වාර්තා කර ඇත: "ඊසා (අලෛයිහිස් සලාම්) තුමාගේ මිතුරන්: අල්ලාහ් ඒ සම්බන්ධයෙන් අප ව ප්‍රිය කරන ක්‍රියාවක් අපහට උගන්වන්නැ'යි

231. තිර්මිදි (3502), එතුමා: මෙය හසන් ගරීබ් වර්ගයට අයත් හදීසයක් බව පවසා සිටියි. අෂ්-ෂෙයික් අල් අල්බානී තුමා 'සහීහ් අල් ජාමිඃ' හි (1268) මෙය හසන් වර්ගයට අයත් හදීසයක් බව සඳහන් කර ඇත.

එතුමාගෙන් ඉල්ලා සිටි විට එතුමා: 'මෙලොව ජීවිතයට දැඩි කැමැත්තක් නොදක්වන්න. අල්ලාහ් නුඹලාව ප්‍රිය කරනු ඇත.' යැයි පැවසීය."

මෙලොව ජීවිතයට ඇලුම් කරන හා මතුලොවට වඩා මෙලොවට වැදගත්කමක් දෙන පුද්ගලයින් පිළිබඳ අල්ලාහ් පහත් කොට පවසා ඇත: "එසේ නොව, නමුත් නුඹලා මෙලොව ජීවිතය ප්‍රිය කරන්නෙහුය. තවද මතුලොව නොසලකා හරින්නෙහුය." (සූරා අල් කියාමා: 20,21) තවත් පාඨයක: "තවද නුඹලා ධනය දැඩි සේ ඇලුම් කරන්නෙහුය" (සූරා අල් ෆජ්ර්: 20) තවත් පාඨයක: "තවද සැබැවින්ම ඔහු වස්තු මෝහයේ දැඩිව සිටියි." (සූරා අල් ආදියාත්: 8) ඉන් අදහස් කරනුයේ ධනයට ඇලුම් කිරීමයි. මෙලොව ඇලුම් කරන්නා අපහාසයට ලක්වී තිබීම එයට ඇලුම් නොකරන එය පිටුදකින මෙන්ම එය අතහැර දමන්නා ප්‍රශංසාවට ලක්වීම පෙන්වා දෙයි.

හසන් තුමා මෙසේ පවසයි: 'කවරෙකු මෙලොවට හා එහි වින්දනයට ඇලුම් කරන්නේ ද මතුලොව පිළිබඳ කැමැත්ත ඔහුගේ හදවතින් බැහැර වී යයි."

අවුන් ඉබ්නු අබ්දිල්ලාහ් තුමා මෙසේ පවසයි: 'හදවත තුළ පවතින මෙලොව හා මතුලොව වනාහී තුලාවේ පැතිකඩ දෙකක් මෙනි. ඒ දෙකින් එකක් ප්‍රමාණයෙන් වැඩි වූ කල අනෙක බරින් සැහැල්ලු වී යයි.'

වහබ් තුමා මෙසේ පවසයි: 'සැබැවින්ම මෙලොව හා මතුලොව වනාහී බිරියන් දෙදෙනෙකු සතු මිනිසෙකු මෙනි. ඔවුන් දෙදෙනාගෙන් එකියක් පිළිබඳ තෘප්තියට පත් වූයේ නම් අනෙක් තැනැත්තිය කෝපයට ලක් වෙයි.!

මෙලොව පිළිබඳ පහත් කොට කතා කරමින් කුර්ආනයේ හා සුන්නාවේ පැමිණ ඇති කරුණු වනාහී ඒවා ලොව අවසන් දිනය තෙක් එකිනෙක පසුපසින් එන රාත්‍රිය හා දහවල යන එහි කාලය වෙත යොමු කරන්නක් වන්නේ නැත. සැබැවින්ම අල්ලාහ් ඒ දෙක මෙනෙහි කිරීමට හා කෘතඥවීමට අපේක්ෂා කරන්නන්හට අනුප්‍රාප්තිකයක් වශයෙන් ඇති කළේය.

එමෙන්ම ආදම්ගේ දරුවන් හට නවාතැනක් හා තොටිල්ලක් වශයෙන් අල්ලාහ් ඇති කළ මහපොළොවට එම අපහාසය යොමු වන්නේ ද නැත. ජලය ගලා යන කඳු මුහුදු ගංගා හා උල්පත් වෙත යොමු වන්නේ ද නැත. එහි පැළවෙන ගහකොළ හා පැළෑටි වෙත යොමු වන්නේ ද නැත. එමෙන්ම

ව්‍යාප්තව තිබෙන සතුන් හා වෙනත් දෑ වෙත යොමු වන්නේ ද නැත. හේතුව සැබැවින්ම ඒ සියල්ල අල්ලාහ් තම ගැත්තන් හට පිරිනමා ඇති ආශිර්වාද වේ. එහි ඔවුනට ප්‍රයෝජන තිබෙනවාක් මෙන්ම එය නිර්මාණය කළ අයගේ ඒකීයත්වය, ඔහුගේ බලය හා ඔහුගේ ශක්තිය පෙන්වා දෙන සාධක හා එය සලකා බැලීම ඔවුනට ඇත.

සැබැවින්ම එම අපහාසය යොමුවනුයේ මෙලොව සිදුවන ආදම්ගේ දරුවන්ගේ ක්‍රියාවන් වෙතය. ඊට හේතුව බොහෝ වේලාවට ඔහුගේ අවසානය ප්‍රශංසා සහගත නොවන අයුරින් ඒවා පිහිටන බැවිනි. නමුත් ඒවා ඔහුගේ අවසානයට හානි පමුණුවන සේ හෝ ප්‍රයෝජනවත් නොවන සේ හෝ පිහිටනු ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. "නුඹලා දැන ගනිවු. මෙලොව ජීවිතය සෙල්ලමකි විනෝදයකි ශෝභාලංකාරයකි නුඹලා එකිනෙකා අතර ආඩම්බරකම් පාන්නකි සම්පත් හා දරුවන් වැඩි කිරීමේ තරගකාරිත්වයකි. (මේ සියල්ල) වර්ෂාවක් බඳුය. (එනම් එම වර්ෂාවෙන්) එහි පැළෑටි (වැඩීම) ගොවියන් සතුටින් පිනවයි. පසුව එය වියළෙනු ඇත. එවිට එය කහ පැහැ බවට පත් වනු නුඹ දකින්නෙහිය. පසුව එය (දිරා ගිය) පිදුරු බවට පත් වන්නේය. තවද මතුලොවෙහි (පාපතරයින්ට) දැඩි දඬුවමක් ඇත. (සැදැහැමියන්ට) අල්ලාහ්ගෙන් වූ සමාවක් ද තෘප්තියක් ද ඇත. තවද මෙලොව ජීවිතය රවටාලන වින්දනයක් මිස (අන් කිසිවක්) නැත." (සූරා අල් හදීද් :20)[232]

සෑම තත්ත්වයකදීම මෙලොවෙහි සරලභාවය අල්ලාහ්ගේ නබිවරුන්ගේ ඔහුගේ සමීපතයින්ගේ හා ඔහුට වඩාත් ප්‍රියි කරන්න්ගේ සංකේතයක් විය.

දෙවන උපදෙස වනාහි: මිනිසා අතර පිළිපදින සරලභාවයයි. එය මිනිසුන්ගේ ආදරය අනිවාර්යය කරන්නකි.

---

232. මෙලොව අතහැර දමන මෙන් උනන්දු කර ඇත්තේ මතු ලොව කටයුතු ඇගවීමෙන් හා එය සඳහන් කරමින් එය උනන්දු කරවීම සම්බන්ධ කර ගනිමිනි. මතුලොව කටයුත්තක් වෙත යොමු වීමේ හේතුවකින් මිස මෙලොව මුලුමණින් අතහැර දමන මෙන් උනන්දු කරවා ශරීආවේ කිසිවක් පැමිණ නැත. මතුලොව කටයුතු අධිකව ඉටු කිරීමත් සමගම මෙලොව කටයුතු සිදු කිරීම අපහාසයට ලක්වන කරුණක් නොවන්නේය. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්-තරීෆී)

හසන් තුමා මෙසේ පවසයි: 'මිනිසුන්ගේ දැත්වල ඇති දෑ ඔබ අපයෝජනය නොකරන තාක්කල් ඔබ මිනිසුන් හට ගෞරවයක් වීම -හෝ මිනිසුන් ඔබට ගෞරවය කිරීම - අඛණ්ඩව සිදුවෙමින් පවතී. ඔබ එසේ කටයුතු කළෙහි නම් ඔවුහු ඔබ අවතක්සේරුවට ගන්නා අතරම ඔබේ කතාව පිළිකුල් කරති. ඔබට වෛර කරති.

මිනිසුන්ගෙන් ඉල්ලා සිටීමෙන් වැළකී සිටින මෙන් හා ඔවුන්ගෙන් අවශ්‍යතාවන්ගෙන් තොරව සිටින මෙන් නියෝග කරමින් පැමිණි නබි තුමාණන්ගේ හදීස් ගණනාවක් ඇත. කවරෙකු මිනිසුන් ළඟ ඇති දෑ ඔවුන්ගෙන් ඉල්ලා සිටින්නෙද ඔවුහු ඔහුව පිළිකුල් කරති. ඔහුට වෛර කරති. සැබැවින්ම ධනය ආදම්ගේ දරුවන්ගේ ආත්මයට ප්‍රිය මනාප වස්තුවකි. එහෙයින් ඔවුන් ප්‍රිය කරන යමක් කවරෙකු ඔවුන්ගෙන් ඉල්ලා සිටින්නේ ද ඒ හේතුවෙන් ඔවුහු ඔහුව පිළිකුල් කරනු ඇත. මිනිසුන් අතර ඇති දෑහි කවරෙකු සරල ලෙස කටයුතු කරන්නේ ද එයින් ඔවුන්ගෙන් වැළකී සිටින්නේ ද එවිට සැබැවින්ම ඔවුහු ඔහුට ප්‍රිය කරනු ඇත. ඒ හේතුවෙන් ඔවුහු ඔහුට ගරු කරනු ඇත. ඔහුද ඔවුන් මත රජකම් කරනු ඇත. එය බසරා වාසීන්ට ගැමි අරාබිවරු පවසා සිටියාක් මෙනි. එනම්: මෙම ගම්මාන වාසීන්ගේ නායකයා කවුරුන්දැ?යි ඔවුහු විමසා සිටියෝය. ඔවුහු: 'අල් හසන්' යැයි පිළිතුරු දුන්නෝය. ඔවුහු: ඔහු ඔවුන්ගේ නායකයා බවට පත් ව ඇත්තේ කුමන හේතුවක් නිසාවෙන් දැයි විමසුවෝය. ඔවුහු: 'ජනයා ඔහුගේ දැනුමේ අවශ්‍යතාවයෙන් පසුවෙති. එමෙන්ම ඔහු ඔවුන්ගේ මෙලොව සම්පතින් අවශ්‍යතා රහිත අයෙකි.

-මෙලොව හා එහි වැසියන් පිළිබඳ විස්තර කිරීමේ දී- ඇතැම් මුල්කාලීනයන්ගේ ප්‍රකාශය කෙතරම් මනරම් ද?

එය කිසිවක් කළ නොහැකි මළ කඳක් මිස නැත.

ඒවා ඇදගෙන යන්නට බලන සුනඛයින් එහි වෙති.

ඔබ එයින් වැළකුණෙහි නම් එහි වැසියන්ට ඔබ ශාන්තියක් වන්නෙහිය

ඔබ එය ඇද ගන්නෙහි නම් එහි සුනඛයින් ඔබව ඉවත් කරනු ඇත.

***

## الحَدِيْثُ الثَّانِي والثَّلاثُوْنَ
## තිස් දෙවන හදීසය

عَنْ أَبِي سَعِيدٍ الْخُدْرِيِّ رَضِيَ اللهُ عَنْهُ، أَنَّ النَّبِيَّ ﷺ قَالَ:

"لَا ضَرَرَ وَلَا ضِرَارَ"

حَدِيثٌ حَسَنٌ، رَوَاهُ ابْنُ مَاجَهْ وَالدَّارَقُطْنِيُّ وَغَيْرُهُمَا مُسْنَدًا،

وَرَوَاهُ مَالِكٌ فِي " الْمُوَطَّإِ " عَنْ عَمْرِو بْنِ يَحْيَى، عَنْ أَبِيهِ، عَنِ النَّبِيِّ ﷺ مُرْسَلًا، فَأَسْقَطَ أَبَا سَعِيدٍ، وَلَهُ طُرُقٌ يَقْوَى بَعْضُهَا بِبَعْضٍ.

සැබැවින්ම නබි (ﷺ) ප්‍රකාශ කළ බව අබූ සඊද් අල් කුද්රි (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

"හිංසා කළ යුතු නැත. හිංසා කරනු ලැබිය යුතු ද නැත."

හසන් ගණයට අයත් හදීසයකි. ඉබ්නු මාජා අද්දාරුකුත්නී හා වෙනත් ඉමාම්වරුන් විසින් මෙය පළ කර ඇත.

නබි (ﷺ) ප්‍රකාශ කළ බව තම පියාගෙන් ලබා අම්ර් ඉබ්නු යහ්යා විසින් වාර්තා කළ මුර්සල් ගණයේ හදීසයක් ලෙස 'අල්-මුවත්තා'හි ඉමාම් මාලික් විසින් ද මෙය වාර්තා කර ඇත. අබූ සඊද් තුමාව ඉන් ඉවත් කර ඇති අතර එකක් අනෙක බලවත් කරන මාර්ග ගණනාවක් එය සතුය.

***

-විග්‍රහය-

අබූ සඊද් තුමාගේ හදීසය ඉබ්නු මාජා විසින් පළ කර නැති අතර එය පළ කර ඇත්තේ අද්දාරකුත්නී, හාකිම් හා බයිහකී යන හදීස්වේදීන් විසිනි. ෂයික් තුමා පවසන පරිදි සැබැවින්ම මෙම හදීසය පළ වී ඇති ඇතැම් මාර්ග අනෙක් මාර්ග බලවත් කරන්නක් ලෙස පිහිටා ඇත.

අබූ අම්ර් ඉබ්නු අස්-සලාහ් පවසා සිටිනුයේ: 'මෙම හදීසය දාරකුත්නී විසින් විවිධ වාර්තාකරණයන්ගෙන් පළ කර ඇති අතර ඒවායෙහි සමස්තය බලන කල එම හදීසය ඒවා බලවත් කරයි. එය අලංකාරවක් කරයි. විද්වතුන් බහුතර දෙනා එය පිළිගෙන ඇති අතරම සාධකයක් ලෙස ද එය ගෙන ඇති' බවයි.

ඉමාම් අහ්මද් තුමා මෙම හදීසය සාධකමය හදීසයක් ලෙස ගෙන නබි (ﷺ) තුමාණන් 'හිංසා කළ යුතු නැත. හිංසා කරනු ලැබිය යුතු නැත. යැයි ප්‍රකාශ කළ බව පවසා සිටියි.

***

"හිංසා කළ යුතු නැත. හිංසා කරනු ලැබිය යුතු නැත." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

'අල් ළරර්' (හිංසාවක් කිරීම) හා 'අල් ළිරාර්' (හිංසාවක් කරනු ලැබීම) යන පද දෙක අරත වෙනසක් තිබෙන්නේද නැද්ද යන වග හදීස් වේදීහු විවිධ මතභේද දරති.

තහවුරු කරන අයුරින් එම පද දෙක එකම අර්ථයෙන් පිහිටා ඇති බව ඇතැමුන් පවසති.

ප්‍රචලිත ප්‍රකාශය වනුයේ ඒ දෙක අතර වෙනසක් ඇති බවයි. පසුව 'අල් ළරර්' යනු: තමන්ට එමගින් ප්‍රයෝජනය ලැබිය හැකි අයුරින් වෙනත් අයකු මත හිංසාවක් ගෙන ඒමය. 'අල් ළිරාර්' යනු එමගින් තමන්ට ප්‍රයෝජනයක් නොලැබෙන අයුරින් වෙනත් අයකු වෙත හිංසාවක් ගෙන ඒමයි. එය තමන්ට හිංසාවක් ඇති නොකරන දෙයක් වළක්වා එමගින් වළක්වනු ලැබූ අයට (එය වැළැක්වීම හේතුවෙන්) හිංසාවක් ඇති කරන අයකු මෙනි. මෙම ප්‍රකාශය වඩාත් නිවැරදි ප්‍රකාශයක් බව පිරිසක් පවසා ඇති අතර ඔවුන් අතරට අබ්දුල් බර් හා ඉබ්නු අස්-සලාහ් ඇතුළත් වෙති.

තවත් ප්‍රකාශයක 'අල් ළරර්' යනු තමන්ට හිංසා නොකළ අයකුට හිංසා කිරීම හා 'අල් ළිරාර්' යනු තමන්ට හිංසා සිදු කළ අයට සුදුසු නොවන අයුරින් හානි සිදු කිරීම වේ යැයි ද පවසනු ලැබ ඇත.

මේ සියලු තත්ත්වයන් තුළ නබි (ﷺ) තුමාණන් හිංසාව හා හිංසා කරනු ලැබීම වළක්වා ඇත්තේ අසාධාරණ ලෙස සිදු කරනු ලැබීමක් වශයෙනි. සාධාරණ ලෙස කිසිවකු මත හිංසාවක් සිදු කිරීම වනාහි: එය අල්ලාහ් පැන වූ සීමාවන් ඉක්මවා යෑමක් හෝ වෙනත් අයකුට අපරාධයක් සිදු කිරීමක් විය යුතුය. මෙය කොහෙත්ම මින් අදහස් කරන්නේ නැත. සැබැවින්ම මින් අදහස් කරනුයේ සාධාරණත්වයෙන් තොර ව හිංසාවක් ඇති කිරීමය.

***

'ලා ළරර' -හිංසා කළ යුතු නැත.- යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශයේ පොදුවේ ඇතුළත් වන කරුණක් වනුයේ. සැබැවින්ම අල්ලාහ් ඔහුගේ ගැත්තන්හට සෑම අවස්ථාවකම ඔවුනට හානි පමුණුවන දෑ ක්‍රියාත්මක කිරීමට පවරා නැත. ඔහු ඔවුනට කවර කරුණක් නියෝග කර ඇත්තේ ද සැබැවින්ම එය ඔවුන්ගේ දහමට හා ඔවුන්ගේ ලෞකික කටයුතුවලට සෙතක් වන්නේය. ඔහු කවර කරුණක් ඔවුනට තහනම් කර ඇත්තේ ද එය ඔවුන්ගේ දහමටත් ලෞකික කටයුතුවලටත් අපරාධයක් සිදු කරන්නක් වන්නේය. එමෙන්ම ඔවුන්ගේ ශරීරයට හානිපමුණුවන යමක් ඔහු තම ගැත්තන් හට නියෝග කර නැත. රෝගියකු ජලයෙන් පිරිසිදු වීමේ අනිවාර්යභාවය අහෝසි කර ඇත්තේ ද රෝගියකු හා මගියකු උපවාසය රැකීමේ අනිවාර්යය භාවය අහෝසි කර ඇත්තේ ද ඒ හේතුවෙනි.

ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලද හදීසයක් 'අල් මුස්නද්'හි මෙසේ සඳහන් වේ. අල්ලාහ්ගේ දූතයාණන්ගෙන් 'අල්ලාහ්ට වඩාත් ප්‍රියමනාම ආගමික පිළිවෙත කුමක් දැ?යි විමසන ලදී. එතුමාණන් ඉවසන සුළු පිවිතුරු දහම වේ යැයි පවසා සිටියහ. නබි (ﷺ) ප්‍රකාශ කළ බව ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් වාර්ත කරන ලද හදීසයක, 'සැබැවින්ම මම ඉවසනසුළු පිවිතුරු දහමක් සමග එවනු ලැබුවෙමි.''[233]

233. ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමියගේ වාර්තාවෙන් ඉමාම් අහ්මද් තුමා මෙය පළ කර ඇත. (233/6) මෙම හදීසය සහාබාවරුන් ගණනාවක් විසින්ම වාර්තා කරනු ලැබ ඇති අතර ඔවුන් අතරින් ජාබිර්, අබූ උමාමා යන සහාබාවරු ද වෙති. එහි වාර්තාකරණය ළඊෆ් ගණයට අයත්ය. නමුත් එයට ඇති සාක්ෂි අනුව එය හසන් ගණයට අයත් හදීසයක තත්ත්වය දක්වා සුරක්ෂිත වන්නේය. සියල්ල මැනවින් දන්නා අල්ලාහ්ය.

මෙම අර්ථයෙන් බුහාරි හා මුස්ලිම්හි අනස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් මෙසේ සඳහන් වී ඇත. සැබැවින්ම නබි (ﷺ) තුමාණන් ගමන් කරමින් සිටින මිනිසෙකු දුටුහ. සැබැවින්ම ඔහු පාගමනින් හජ් වන්දනාව ඉටු කරන්නට භාරයක් වූ අයෙකු බව පවසනු ලැබීය. එවිට එතුමාණන් "ඔහු පාගමනින් යෑමෙන් සැබැවින්ම අල්ලාහ් අවශ්‍යතාවෙන් තොරය. ඔහු වාහනයක නැග ගමන් කරත්වා" යැයි පැවසූහ. තවත් වාර්තාවක: "ඔහු ඔහුටම වේදනාව කර ගැනීමෙන් සැබැවින්ම අල්ලාහ්ට අවශ්‍යතාවයෙන් තොරය."[234]

234. බුහාරි (1865), මුස්ලිම් (164)

## الحَدِيْثُ الثَّالِثُ والثَّلاثُوْنَ

## තිස් තුන් වන හදීසය

عَنِ ابْنِ عَبَّاسٍ رَضِيَ اللهُ عَنْهُمَا أَنَّ رَسُولَ اللهِ ﷺ قَالَ:

"لَوْ يُعْطَى النَّاسُ بِدَعْوَاهُمْ، لَادَّعَى رِجَالٌ أَمْوَالَ قَوْمٍ وَدِمَاءَهُمْ لَكِنَّ الْبَيِّنَةَ عَلَى الْمُدَّعِي وَالْيَمِينَ عَلَى مَنْ أَنْكَرَ."

حَدِيثٌ حَسَنٌ، رَوَاهُ الْبَيْهَقِيُّ وَغَيْرُهُ هَكَذَا.

وَبَعْضُهُ فِي "الصَّحِيحَيْنِ "

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) ප්‍රකාශ කළ බව ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

“මිනිසුන් වාද කොට ඉල්ලා සිටින දෑ ඔවුනට පිරිනමනු ලබන්නේ නම්, මිනිසුන් (අසාධාරණ ලෙස) පිරිසකගේ ධනය හා ජීවිත ඉල්ලා වාද කරනු ඇත. එහෙත්, සාක්ෂි ඉදිරිපත් කිරීම වාද කරන්නා මත වන අතර දිවුරා සිටීම ප්‍රතික්ෂේප කරන්නා මත වේ.”

මෙය හසන් ගණයට අයත් හදීසයක් වන අතර අල්-බයිහකි සහ වෙනත් අය විසින් ද මෙය මෙලෙස වාර්තා කර ඇත.

එහි කොටසක් බුහාරි හා මුස්ලිම්හි සඳහන්ව ඇත.

***

-විග්‍රහය-

මෙම හදීසයේ මූලය ඉමාම් බුහාරි හා මුස්ලිම් විසින් ඔවුන්ගේ සහීහ් ග්‍රන්ථයන්හි පළ කර ඇති අතර එය නබි (ﷺ) තුමාණන් පැවසූ බවට ඉබ්නු අබ්බාස් තුමා ද ඔහු විසින් අබූ මුලෙයිකා ද ඔහු විසින් ඉබ්නු ජුරය්ජ් ද ලබා

වාර්තා කර ඇත. එනම්: ‘‘ජනයා වාද කොට ඉල්ලා සිටින දෑ ඔවුනට පිරිනමනු ලබන්නේ නම් පිරිසක් මිනිසුන්ගේ ප්‍රාණ හා ඔවුන්ගේ සම්පත් ඉල්ලා වාද කරති.

ෂෙයික් තුමා ගෙනහැර පා ඇති මෙම ප්‍රකාශය ඉබ්නු අස්සිලාහ් තුමා ඊට පෙර ම ‘‘අහාදීස් අල් කුල්ලියාත්’’ හි ගෙන හැර පා ඇත. එතුමා : මෙය හසන් ගණයට අයත් වාර්තාකරණයෙන් යුක්තව ඉමාම් බයිහකී තුමා පළ කර ඇති බව පවසයි.

‘සාක්ෂි ඉදිරිපත් කිරීම වාද කරන්නා මත හා දිවුරා සිටීම එය ප්‍රතික්ෂේප කරන්නා මත වේ’ යැයි නබි (ﷺ) තුමාණන් කළ ප්‍රකාශය අහ්මද් හා අබූ උබෙය්ද් යන ඉමාම්වරු විසින් නීතිමය සාධකයක් වශයෙන් ගෙන ඇත. සැබැවින්ම එම පද පෙළ නිවැරදි බවත් එමගින් නීතිමය සාධක ගනු ලබන බවත් මෙය පෙන්වා දෙයි.

මෙම අරථයෙන් යුත් හදීස් ගණනාවක් සඳහන් වී ඇත.

අල්-අෂ්අස් ඉබ්නු කයිස් තුමා විසින් වාර්තා කළ හදීසයක් බුහාරි හා මුස්ලිම් හි මෙසේ සඳහන් වේ. මා අතර හා මිනිසෙකු අතර ළිඳක් සම්බන්ධයෙන් වාදයක් විය. විසඳුමක් සොයා අපි එය අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) වෙත ඉදිරිපත් කළෙමු. එවිට අල්ලාහ්ගේ දූතයාණන් ‘‘ඔබට සාක්ෂිකරුවන් දෙදෙනෙකු විය යුතුයි. එසේ නැතිනම් ඔහු දිවුරා සිටිය යුතුයි’’ යැයි පවසා සිටියහ. මම: එසේ නම් ඔහු දිවුරා සිටිත්වා මට ගැටලුවක් නැත යැයි පැවසුවෙමි. පසුව අල්ලාහ්ගේ දූතයාණන්: ‘කවරෙකු යම් දිවුරුමක් මත දිවුරා සිටින්නේ ද ඔහු එහි වැරදි කරුවකු වුව ද එමගින් ධනය ඔහුට උරුම වන්නේය. ඔහු කෙරෙහි කෝප වූ තත්ත්වයේ අල්ලාහ් ඔහු මුණ ගැසෙනු ඇත. පසුව එය තහවුරු කරමින් අල්ලාහ් අල් කුර්ආන් වැකියක් පහළ කළේය. ‘කවරෙකු අල්ලාහ්ගේ ගිවිසුම හා ඔවුන්ගේ දිවුරුම් සුළු මිලකට විකුණන්නේ ද...’ යන ආලු ඉම්රාන්හි 77 වැනි පාඨය කියවීය.

ඉබ්නු අල් මුන්දිර් තුමා මෙසේ පවසයි: සැබැවින්ම සාක්ෂිය වාද කර කරන්නා මත හා දිවුරා සිටීම වාද කරනු ලබන ප්‍රතිවාදියා මත විය යුතු බව විද්වතුන් ඒකමතිකව ප්‍රකාශ කර ඇත. ‘සාක්ෂිය වාද කරන්නා මත’ යන ප්‍රකාශයේ අරුථ ඒ සඳහා සුදුසුකම ඇත්තේ වාද කරන්නාටය යන්නයි.

හේතුව සැබැවින්ම එය ඔහුට අනිවාර්යය වන බැවිනි. එය ඔහුගෙන් ගනු ලැබේ. 'දිවුරා සිටීම වාද කරනු ලබන ප්‍රතිවාදියා මත' යන ප්‍රකාශයේ අරුථ එනම්: එමගින් ඔහු නිදොස් වීමයි. හේතුව සැබැවින්ම එය ඔහුට අනිවාර්යය වන බැවිනි. සෑම තත්ත්වයකදීම එය ඔහුගෙන් ගනු ලැබේ. ප්‍රකාශය අවසන්

***

සාක්ෂි ඉදිරිපත් කිරීම වාද කරන්නා මත වන අතර දිවුරා සිටීම ප්‍රතික්ෂේප කරන්නා මත වේ." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

එමගින් අදහස් කරනුයේ: කවර කරුණක් වාද කර සිටින්නේද එය තමන් සතු යැයි මිනිසෙකුට එරෙහිව වාද කර, සැබැවින්ම එය එසේ වාද කරනු ලැබූ පුද්ගලායට අයිති බව ප්‍රතික්ෂේප කිරීමය. හදීසය ආරම්භයේ දී 'ඔවුන් වාද කරන දෑ මිනිසුනට පිරිනමනු ලබන්නේ නම් පිරිසකගේ රුධිරය හා ඔවුන්ගේ ධනය වෙනුවෙන් පිරිසක් වාද කරනු ඇත' යනුවෙන් පවසා ඇත්තේ එබැවිනි. වාද කරනු ලබන්නා සතු නොවූ දෙයක් තමන් සතු බව වාද කරන්නා වනාහි ඔහුගේ වාදය ප්‍රතික්ෂේප කරනු ලබන්නකි. මෙය පළමුවැන්නට වඩා ඉතා සරලය. මෙහිදී වාද කරනු ලබන්නාට සාක්ෂි අවශ්‍ය වන්නේය. නමුත් මෙහි දී සාක්ෂිය ප්‍රමාණවත් වේ. වාද කරන්නා තමන් සතු බව ප්‍රතික්ෂේප කරන වාදයකදී කවර සාක්ෂියක් ප්‍රමාණවත් වන්නේ ද එවන් සාක්ෂියක් මෙහිදීද ප්‍රමාණවත් වන්නේය.

එයට කරුණු කිහිපයක් සාක්ෂි දරනු ඇත.

ඒ අතුරින් ලුක්තා හෙවත් අහුලන ලද දෑ: ඒ ගැන විස්තර කරමින් පැමිණි විට කිසිදු සාක්ෂියකින් තොරව එකගතාවයෙන් යුතුව සැබැවින්ම එය ඔහු වෙත භාර දෙනු ලැබේ. නමුත් ඔවුන් අතරින් ඇතැමෙකු පවසා සිටිනුයේ : ඉමාම් අෂ්-ෂාෆිඊ හා අබූ හනීෆා තුමාගේ ප්‍රකාශ මෙන් 'ඔහුගේ නිවැරැදිභාවය අනුමාන කිරීමේදී එය අබිබවා ගිය විට එසේ භාර දීම සුදුසු වුව ද එය අනිවාර්යය නොවන බවයි. ඔවුන්ගෙන් තවත් ඇතැමෙකු පවසා සිටිනුයේ: ඉමාම් මාලික් හා අහ්මද්ගේ ප්‍රකාශ මෙන් එහි සඳහන්ව ඇති විස්තර සඳහන් කිරීමත් සමග එය භාර දීම අනිවාර්යය බවයි.

අල් සනීමා හෙවත් යුද්ධයේදී අත්පත් කරගත් වස්තුව- ඒ ගැන කිසිවක් වාද කරමින් කෙනෙකු පැමිණ: සැබැවින්ම එය තමන් සතුව තිබී එය දේව ප්‍රතික්ෂේපකයින් අතට පත් වූ බව පවසා එය තමන් සතුව තිබූ එකක් බව විස්තර කරන සාක්ෂියක් ඒ සඳහා ඉදිරිපත් කළ විට එය ප්‍රමාණවත් වන්නේය. ඒ ගැන ඉමාම් අහ්මද්ගෙන් 'ඒ සඳහා සාක්ෂියක් අපේක්ෂා කෙරෙන්නේ දැ?යි විමසනු ලැබූ විට ඔහු: 'සැබැවින්ම එය ඔහු සතුව තිබූ බවට පෙන්වා දෙන විස්තර කිරීමක් ඉදිරිපත් කළ යුතුය. ඒ ගැන දැන ගත්තේ නම් සේනා නායකයා විසින් එය ඔහු වෙත භාර දිය යුතුය."

අර්-රුකෙයින් ඉබ්නු අර්-රබීඃ තුමා තම පියාගෙන් ලබා වාර්තා කර ඇති බවට ඉමාම් අල් කල්ලාල් තුමා විසින් මෙසේ වාර්තා කර ඇත. "අයිනුත් තම්ර් නම් ස්ථානයේ මාගේ සහෝදරයා සතු අශ්වයෙකු අතරමං විය. එය සඃද් තුමාගේ ගාලෙහි සිටිනු ඔහු දුටුවේය. පසුව ඔහු: මේ මාගේ අශ්වයා යැයි පැවසීය. එවිට සඃද් තුමා 'ඔබට සාක්ෂි තිබේදැ?යි විමසීය. ඔහු නැත. නමුත් මම උඹ කැඳවමි එවිට ඔහු කෙඳිරි ගසනු ඇත. පසුව ඔහු උඹ කැඳවූ විට කෙඳිරි ගැසීය. පසුව එතුමා ඔහුටම එය පිරිනැමීය.

මෙය සතුරා විසින් අත්පත් කර ගනු ලැබ පසුව මුස්ලිම්වරු ඒ මත පෙනී සිටියා විය හැක. එමෙන්ම සැබැවින්ම උඹ අතරමං වූ සතෙකු බව දැන ගන්නට ලැබී එසේ අතරමං වූ සතුන් අතර තැබුවා විය හැකිය. එවිට එය 'ලුක්තා' හෙවත් අහුලනු ලැබූ දෑ මෙන් වන්නේය.

මංකොල්ල කා පැහැරගත් දෑ . භාරකරුවන්ගේ අසාධාරණය ගැන දැන ගත් විට එය පොදු අරමුදලින් නැවත ලබා දෙන මෙන් ඉල්ලා සිටියි නම්. අබ් අස්-සිනාද් තුමා මෙසේ පවසයි: "උමර් ඉබ්නු අබ්දුල් අසීස් තුමා අසාධාරණ ලෙස ගනු ලැබූ දෙයක් කැපී පෙනෙන සාක්ෂියක් නොවී සුළු ප්‍රමාණයේ සාක්ෂියක් වුව ද එය එහි අයිතිකරුවන් වෙත නැවත භාර දෙන්නට කටයුතු කළහ. ජනයා අසාධාරණයට පත් ව ඇති ස්වරූපයක් එතුමාට දැනගන්නට ලැබුණු විට ඒ සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීමට ඔහුට හැකියාවක් නොලැබුණ ද එතුමා එය ඔහුට නැවත භාර දුන්හ. ඊට හේතුව එතුමාට පෙර මිනිසුන් අතර ආණ්ඩුකල අයගේ අගතිය එතුමා දැන සිටි බැවිනි. අසාධාරණයට ලක්වූවන් සඳහා නැවත ඒවා ලබා දීමේ දී ඉරාකයේ පොදු අරමුදල් අවසන් වූ අතර අවසානයේ ඒ සඳහා සිරියාවෙන් ගනු ලැබීය."

මංකොල්ලය සොරකම යනාදී වශයෙන් පැහැර ගනු ලැබූ වස්තුව ද ‘ලුක්තා’ හෙවත් අහුලන ලද දෑ මෙනි. ඒ ගැන වාද කරන්නා විස්තර කර සිටීම ප්‍රමාණවත් වේ. එහි පවතින මතභේද පිළිබඳ කාලී තුමා විසින් විස්තර කර ඇති අතර සැබැවින්ම එය ඉමාම් අහ්මද්ගේ ප්‍රසිද්ධ ප්‍රකාශයයි.

***

## الحَدِيْثُ الرَّابِعُ والثَّلاثُوْنَ

## තිස් හතර වන හදීසය

عَنْ أَبِي سَعِيدٍ الْخُدْرِيِّ قَالَ: سَمِعْتُ رَسُولَ اللهِ ﷺ يَقُولُ:
"مَنْ رَأَى مِنْكُمْ مُنْكَرًا فَلْيُغَيِّرْهُ بِيَدِهِ، فَإِنْ لَمْ يَسْتَطِعْ فَبِلِسَانِهِ، فَإِنْ لَمْ يَسْتَطِعْ فَبِقَلْبِهِ، وَذَلِكَ أَضْعَفُ الْإِيمَانِ."
رَوَاهُ مُسْلِمٌ.

අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) කළ ප්‍රකාශයකට තමන් සවන් දුන් බව පවසමින් අබූ සඊද් අල් කුද්රි තුමා මෙසේ පවසයි.

නුඹලා අතරින් කිසිවෙකු පිළිකුල් සහගත දෙයක් දුටුවේ නම් එය ඔහු ඔහුගේ දෑතින් වළක්වත්වා. නමුත් ඔහු (එයට) හැකියාව නොදැරුවේ නම් එය ඔහුගේ දිවෙන් විය යුතුයි. (එයට ද) ඔහු හැකියාව නොදැරුවේ නම් ඔහුගේ හදවතින් විය යුතුය. එය ඊමානයේ ඉතා පහත්ම තත්ත්වයයි.

ඉමාම් මුස්ලිම් තුමා විසින් මෙය වාර්තා කර ඇත.

***

### -විග්‍රහය-

මෙම හදීසය අබූ සඊද් තුමා විසින් ද එතුමාගෙන් තාරික් ඉබ්නු ෂිහාබ් විසින් ද එතුමාගෙන් කය්ස් ඉබ්නු මුස්ලිම් විසින් ද ලබා පළ කර ඇති වාර්තාකරණය මගින් හා අබූ සඊද් තුමා විසින් ද එතුමාගෙන් ඉස්මාඊල් ඉබ්නු රජාගේ පියාණන් විසින් ද ඔහුගෙන් ඉස්මාඊල් ඉබ්නු රජා විසින් ද ලබා පළ කර ඇති වාර්තාකරණය මගින් ද මුස්ලිම් තුමා වාර්තා කර ඇත. එතුමා සතු වූ තාරික් තුමාගේ වාර්තාව වනාහි: “සලාතයට පෙර අවුරුදු දින දේශානව ආරම්භ කළේ මර්වාන් විසිනි. එවිට මිනිසෙකු ඔහු දෙස නැගී සිට: ‘දේශනාවට පෙර සලාතය විය යුතු යැ’යි පවසා සිටියේය. එවිට ඔහු : ‘මෙහි තිබිය යුතු

කරුණක් මග හැරී ඇත' යැයි පැවසීය. එවිට අබූ සර්ද් තුමා : 'මොහු[235] වනාහි එහි විය යුතු දෑ දෑ තීන්දු කළේය' යැයි පවසා පසුව මෙම හදීසය දන්වා සිටියේය.

***

මෙම අර්ථයෙන් යුත් වාර්තා ගණනාවක් වෙනත් ආකාරයෙන් ද වාර්තා වී ඇත.

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බවට ඉබ්නු මස්ඌද් තුමා විසින් වාර්තා කළ හදීසයක් මුස්ලිම් තුමා මෙසේ පළ කර ඇත. "මට පෙර පැමිණි කිසියම් සමූහයක් අතරට අල්ලාහ් එවූ කිසිදු නබිවරයකු ඔහුගේ සමූහයා අතුරින් වූ ගෝලයින් හා මිතුරන් සිටියා මිස නැත. ඔවුහු ඔහුගේ පිළිවෙත අරගත්තෝය. ඔහුගේ නියෝගය පිළිපැද්දෝය. අනතුරුව ඔවුන්ගෙන් පසු පැමිණි සමූහයා අධික වශයෙන් දිවුරා සිටියෝය. ඔවුන් නොකරන දෑ පවසා සිටියෝය. අණ කරනු නොලැබූ දෑ සිදු කළෝය. එහෙයින් ඔවුන් සමග තම දෑතින් අරගල කරන්නා මුඃමින්වරයෙකි. ඔවුන් සමග තම දිවෙන් අරගල කරන්නා ද මුඃමින්වරයෙකි. ඔවුන් සමග තම හදවතින් අරගල කරන්නා ද මුඃමින්වරයෙකි. ඉන් ඔබ්බට දේව විශ්වාසයෙන් අබ ඇටයක් තරම් හෝ නැත.[236]

තමන්ගේ හැකියාව අනුව පිළිකුල් සහගත දෑ හෙළා දැකීම අනිවාර්යය වන බව මෙම හදීසයන් පෙන්වා දෙයි. සැබැවින්ම එය හදවතින් හෙළා දැකීම අත්‍යවශ්‍ය කරුණක් වන්නේය. පිළිකුල් සහගත දෑ තම හදවත හෙළා නොදකින පුද්ගලයා වනාහි, ඔහුගේ හදවතෙහි දේව විශ්වාසය පහ වී ඇති බව පෙන්වා දෙයි.

මිනිසෙකු මෙසේ ප්‍රකාශ කරනු ඉබ්නු මස්ඌද් තුමා සවන් දුන්හ. 'යහපත විධානය නොකරන අයහපතින් නොවළක්වන අය විනාශ විය. එවිට ඉබ්නු මස්ඌද් තුමා 'තම හදවතෙහි යහපත හා අයහපත පිළිබඳ නොහඳුනන තැනැත්තා විනාශ විය' සැබැවින්ම යහපත හා අයහපත දැන සිටීම

235. මර්වාන් සිදු කළ ක්‍රියාව ප්‍රතික්ෂේප කළ පුද්ගලයා.
236. මුස්ලිම් (50)

අනිවාර්යය බවත් කිසිවකුගෙන් එය මග හැරෙන්නේ නැති බවත් කවරෙකු ඒ ගැන වටහා නොගත්තේ ද ඔහු විනාශ වී යන බවත් පෙන්වා දෙයි.

***

දිවෙන් හා දැතින් හෙළා දැකීම වනාහි: එය අනිවාර්යය වනුයේ හැකියාවේ තරමටය.

ඉබ්නු මස්ඌද් තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. "නුඹලා අතරින් කවරෙකු තමන්ට වැළැක්විය නොහැකි පිළිකුල් සහගත දෙයක් දකිමින් ජීවත් වන්නට සිදු වන්නේ ද, සැබැවින්ම අල්ලාහ් ඔහුගේ හදවතෙහි ඔහු එය පිළිකුල් කරන බව දැන සිටියි."

කවරෙකු වරදක් දැක, එය තම දිවෙන් හා තම දැතින් වැළැක්වීමට නොහැකි වූ විට ඔහු තම සිතෙහි එය පිළිකුල් කරන්නේ නම් ඔහු එය නුදුටු පුද්ගලයකු මෙන් වන්නේය. කවරෙකු එය නොදැක එය ගැන සෑහීමට පත්ව එය වැළැක්වීමට හැකියාව තිබියදීත් එය නොවැළැක්වූයේ නම් ඔහු එය දුටු පුද්ගලයකු මෙන් වන්නේය. ඊට හේතුව සැබැවින්ම වරද පිළිබඳ සෑහීමට පත් වීම තහනම් කරන ලද දැයින් වඩාත් අශීලාචාර ක්‍රියාවක් වන අතරම හදවතින් එම වරද හෙළා දැකීම එමගින් ඔහු පැහැර හැර ඇති බැවිනි. සෑම මුස්ලිම්වරයකුටම එවන් දෑ හෙළා දැකීම අනිවාර්යය වන අතර කිසිදු තත්ත්වයකදී එය කිසිවකුගෙන් ඉවත් වන්නේ නැත.

හදවතින් එය හෙළා දැකීම සෑම තත්ත්වයකදීම මුස්ලිම් වරයකුට අනිවාර්යය වන්නේය. අතින් හා දිවෙන් එසේ හෙළා දැකීම ශක්තියේ ප්‍රමාණයට අනුව පිහිටිය යුතුය.[237]

237. 'ඉක්තිලා අස්-සිරාත් අල් මුස්තකීම්' නම් කෘතියෙහි (1/272) ෂෙයිකුල් ඉස්ලාම් ඉබ්නු තය්මිය්යා මෙසේ පවසා සිටියි: 'හදවත එසේ හෙළා දැකීම වනාහි: සැබැවින්ම එය හෙළා දැකිය යුත්තක් බව විශ්වාස කිරීමක් මෙන්ම ඒ සඳහා තම පිළිකුල් භාවය පෙන්වන්නකි. එවැනි තත්ත්වයක් උදා වූ විට හදවත තුළ ඊමානය පිහිටන්නේය. මෙම යහපත් ක්‍රියාව හඳුනා ගැනීමටත් අයහපත් දෑ ප්‍රතික්ෂේප කිරීමටත් හදවත අපොහොසත් වූ විට එම හදවතින් දේව විශ්වාසය ඉවත්වී යයි."

මා පවසා සිටිනුයේ: පිළිකුල් සහගත දෑ ව්‍යාප්ත ව ඇති එමෙන්ම එවන් ක්‍රියාවන් වළක්වන පිරිස අඩුවෙන් සිටින මෙම කාල වකවානුව තුළ මේ බව

***

“එය ඊමානයේ ඉතා පහත්ම තත්ත්වයයි” යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

සැබැවින්ම යහපත විධානය කිරීම හා පිළිකුල් සහගත දැයින් වැළැක්වීම ඊමානයේ කරුණු අතරින් වන බව මෙය පෙන්වා දෙයි. එමෙන්ම ඊමානයේ කරුණු අතරින් යමක් කිරීමට හැකියාව තිබී, එය සිදු කළ තැනැත්තා නොහැකියාවෙන් එය අතහැර දමන්නාට වඩා උතුම් බව ද පෙන්වා දෙයි. කාන්තාවන් සම්බන්ධයෙන් නබි (ﷺ) තුමාණන් කළ තවත් ප්‍රකාශයක් එය තවදුරටත් පෙන්වා දෙයි. එතුමාණන්: ‘ඇයගේ දහමේ අඩුපාඩුකම් වනාහි: සැබැවින්ම ඇය දහවලේ හා රාත්‍රියේ සලාත් ඉටු නොරක රැඳී සිටීමයි’[238] යැයි පැවසූහ. එය ඔසප් කාලවල කාන්තාවන්ගේ තත්ත්වයයි. එවන් අවස්ථාවක සැබැවින්ම ඇය සලාතය ඉටු කිරීමට තහනම් කාරිනියක් වන්නීය. එය ඇයගේ දහමේ අඩුවක් ලෙස පෙන්වා දී ඇත. එමෙන්ම අනිවාර්යය කටයුත්තක් සිදු කිරීමට හැකියාව තිබී එය අතහැර දැමීමට නිදහසට කරුණු තිබුණත් එය සිදු කළ තැනැත්තා නොහැකියාවෙන් එය අතහැර දමන පුද්ගලයාට වඩා උතුම් බව පෙන්වා දී ඇත. සියල්ල මැනවින් දන්නා අල්ලාහ්ය.

***

---

දැනුවත් කිරීම අති වැදගත් කටයුත්තක් වන බවයි. දිවෙන් හා දෑතින් එවන් කටයුතු හෙළා දැකීම අතහැර දැමීමට නිදහසට කරුණු සැබැවින්ම මිනිසාට තිබිය හැක. නමුත් හදවතින් එය හෙළා දැකීම වනාහි, එය අතහැර දැමීම සඳහා කිසිදු මුස්ලිම්වරයකුට නිදහසට කරුණු දැක්වීමක් කළ නොහැක. කවරෙකු එය අතහැර දමන්නේ ද දේව විශ්වාසය ඔහුගේ හදවතින් වෙන් වී යාම ගැන ඔහුට බිය ගැන්විය යුතුය.

පිළිකුල් සහගත දෙයක් තම හදවතින් හෙළා දැකීම මුස්ලිම්වරයා වෙත පැවරුණු අනිවාර්යය වගකීමකි. අවසානයේ ඔහු එවන් තත්ත්වයක වැටුණේ නම් හෝ එවන් අය සමග හවුල් වී සිටියේ නම් හෝ සැබැවින්ම එය දේව විශ්වාසය ගැන පවතින ඉතා දුර්වල තත්ත්වය වන්නේය.

238. මුස්ලිම් (79, 80) මෙම හදීසය ඉබ්නු උමර් තුමා, අබූ හුරෙයිරා තුමා සහ අබූ සඊද් තුමා විසින් වාර්තා කර ඇත.

"නුඹලා අතරින් කිසිවෙකු පිළිකුල් සහගත දෙයක් දුටුවේ නම්" යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

සැබැවින්ම පිළිකුල්භාවය (වරද) දැකීමත් සමගම බැඳී තිබිය යුතු බව පෙන්වා දෙයි. එය වසන් කරනු ලැබ, එය ඔහු නොදුටු නමුත් ඒ ගැන ඔහු දන්නේ නම් අහ්මද් විසින් පළ කර ඇති වාර්තා ගණනාවකම සඳහන් වී ඇති ප්‍රකාශ පරිදි: "සැබැවින්ම ඔහුට එය ප්‍රදර්ශනය වී නොමැත. කවර කරුණක් සැකයට තුඩු දුන්නේ ද ඒ ගැන සොයා බැලිය යුතු නැත." යන්නයි.

එතුමා විසින් වාර්තා කළ තවත් වාර්තාවක 'වැසුනු දෙයක් තහවුරු වූ විට සැබැවින්ම එය නිරාවරණය වන්නේය. තහනම් ගීතයක හෝ තූර්ය වාදන භාණ්ඩයක හඬ සවනට වැකී, එය කවර ස්ථානයක දැයි දැන ගන්නට ලැබුණේ නම් එවිට සැබැවින්ම ඔහු එය හෙළා දැකිය යුතුය. ඊට හේතුව සැබැවින්ම පිළිකුල් සහගත ක්‍රියාව ඔහුට තහවුරු වී ඇති බැවින් හා එහි ස්ථානය මැනවින් දැන සිටින බැවිනි. එවිට ඔහු එය දුටු අයකු මෙන් වන්නේය." මෙය අහ්මද් තුමා උපුටා දක්වමින් 'එම ස්ථානය ඔහු නොදනී නම් ඔහු මත කිසිවක් නැත' යැයි පවසා ඇත.

පිළිකුල් සහගත ක්‍රියාවක් සඳහා පිරිසක් ඒකරාශි වී ඇති බව හඳුනන අයකුට බිත්ති වලින් එය ආවරණය වී ඇත්තේ නම්, එසේ එය සොයා බැලීමෙන් තහනම් කරනු ලැබූ නොමනා විපරම් කිරීමකට ඔහු ඇතුළත් වන බැවින් සුෆ්යාන් අස් සව්රී හා වෙනත් අය විසින් එය හෙළා දැක ඇත. ඉබ්නු මස්ඌද් තුමාට: 'සැබැවින්ම පුද්ගලයකු ඔහුගේ රැවුලෙන් මත් පැන් බිංදු වැටෙමින් තිබේ' යැයි පවසනු ලැබූ විට එතුමා: 'විපරම් කිරීමෙන් අල්ලාහ් අප වළක්වා ඇතැ'යි පවසා සිටියේය.

කාලි අබූ යඃලා තුමා 'අල් අහ්කාම් අස්සුල්තානිය්යා' නම් කෘතියෙහි මෙසේ සඳහන් කරයි: "අනුමානයට ලක් වූ සඟවන්නට බලන පිළිකුල් සහගත කරුණක, -විශ්වාසනීය තොරතුරකින්- දූරාචාරය හා මිනිස් ඝාතනය වැනි මග හැරිය නොහැකි තහනම් කරුණක් උල්ලංඝණය වී ඇත්නම් එසේ විපරම් කර සොයා බැලීමත් ඒ ගැන කරුණු මතු කර ගැනීමට හා සොයා බැලීමට ඉදිරිපත් වීමත් අනුමත වන්නේය. එය තහනම් කරනු ලැබූ දෑ උල්ලංඝණය වීමට පිළියම් නොකරන කරුණු මග හැරීමෙන් ප්‍රවේශම් වීමක් වශයෙනි. මේ

හැර වෙනත් තරාතිරමක වී නම් ඒ ගැන විපරම් කර සොයා බැලීම හෝ එය නිරාවරණය කර ගැනීම හෝ සුදුසු නැත.''

***

දැනගත යුතු කරුණක් වන්නේ: සැබැවින්ම යහපත නියෝග කිරීමත් අයහපතින් වැළැක්වීමත් විටෙක එහි කුසල් අපේක්ෂා කිරීම මත පිහිටනු ඇත. තවත් විටෙක එය අතහැර දැමීමෙන් දඬුවම් ලැබීමේ බිය මත ද විටෙක තහනම් කරන ලද දෑ උල්ලංඝනය කිරීමෙන් අල්ලාහ්ගේ කෝපය ඇතිවීම මත ද විටෙක දේව විශ්වාසවනත්යින් හට උපදේශනය, ඔවුනට ආශිර්වාදය, අල්ලාහ්ගේ කෝපයට හා මෙලොව හා මතු ලොව ඔහුගේ දඬුවමට හේතු වන දැයින් ඔවුන් ආරක්ෂාවීමේ අපේක්ෂාව මත ද පිහිටනු ඇත. තවත් විටෙක අල්ලාහ්ගේ කීර්තිය ඔහුගේ බලමහිමය හා ඔහුගේ ආදරය මත පිහටනු ඇත.

මේ සියලු තත්ත්වයන් හෙළා දැකීමෙහි මෘදුභාවය පිළිපදින මෙන් නියම කර ඇත. ඉමාම් අහ්මද් තුමා ''යහපත විධානය කිරීමේදී අඛණ්ඩතාව හා මෘදුභාවය වෙත මිනිසුන් අවශ්‍යතාවෙන් පෙළෙති. එය රළු භාවයෙන් තොර ව විය යුත්තකි. නමුත් ප්‍රචණ්ඩකාරී අයකු ලෙස දැනුම් දුන් මිනිසෙකු කෙරෙහි එය තහනම් වන්නේ නැත.'' එතුමා තවදුරටත් ''ඉබ්නු මස්ඌද් තුමාගේ මිතුරන් යම් පිරිසක් අසලින් ගමන් ගත් විට, තමන් පිළිකුල් කරන දෙයක් ඔවුන්ගෙන් දුටුහ. එවිට ඔවුහු: 'හේය්, අල්ලාහ් නුඹලාට කරුණා කරත්වා! හේය්, අල්ලාහ් නුඹලාට කරුණා කරත්වා! යැයි පවසා ඇත්තාහ.

එතුමා තවදුරටත්: ''ඉතා කාරුණික හා පහත් ලෙසින් නියෝග කළ යුතුය. ඔහු පිළිකුල් කරන යමක් ඔවුහු ඔහුට අසන්නට සැළැස්වූයේ නම්, ඔහු කෝප නොවිය යුතුය. ඔහුට අවශ්‍ය වන්නේ තමා වෙනුවෙන් ජයග්‍රහණය කිරීමයි.''

***

## الحَدِيْثُ الخَامِسُ والثَّلاثُوْنَ

## තිස් පස් වන හදීසය

عَنْ أَبِي هُرَيْرَةَ رَضِيَ اللهُ عَنْهُ، قَالَ: قَالَ رَسُولُ اللهِ ﷺ:

"لَا تَحَاسَدُوا، وَلَا تَنَاجَشُوا، وَلَا تَبَاغَضُوا، وَلَا تَدَابَرُوا، وَلَا يَبِعْ بَعْضُكُمْ عَلَى بَيْعِ بَعْضٍ، وَكُونُوا عِبَادَ اللهِ إِخْوَانًا."

"الْمُسْلِمُ أَخُو الْمُسْلِمِ، لَا يَظْلِمُهُ، وَلَا يَخْذُلُهُ، وَلَا يَكْذِبُهُ، وَلَا يَحْقِرُهُ.

التَّقْوَى هَاهُنَا - وَيُشِيرُ إِلَى صَدْرِهِ ثَلَاثَ مَرَّاتٍ. بِحَسْبِ امْرِئٍ مِنَ الشَّرِّ أَنْ يَحْقِرَ أَخَاهُ الْمُسْلِمَ. كُلُّ الْمُسْلِمِ عَلَى الْمُسْلِمِ حَرَامٌ: دَمُهُ وَمَالُهُ وَعِرْضُهُ" رَوَاهُ مُسْلِمٌ.

අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) ප්‍රකාශ කළ බව අබූ හුරෙය්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

"නුඹලා එකිනෙකාට ඊර්ෂ්‍යා නොකරන්න. නුඹලා එකිනෙකාට විරුද්ධව මිල වැඩි නොකරන්න. නුඹලා එකිනෙකාට වෛර නොකරන්න. නුඹලා එකිනෙකා පසුපස හැරී නොයන්න. කෙනෙකුගේ වෙළදාමට එරෙහිව නුඹලා අතුරින් කිසිවකු වෙළදාම් නොකළ යුතුයි. නුඹලා සහෝදරයන් ලෙසින් අල්ලාහ්ගේ ගැත්තන් වන්න.

මුස්ලිම්වරයා මුස්ලිම්වරයාගේ සහෝදරයෙකි. ඔහු ඔහුට අසාධාරණකම් කරන්නේ නැත. ඔහුව පහත් කරන්නේ නැත. ඔහුට බොරු කියන්නේ නැත. ඔහුට අපහාස කරන්නේ නැත.

තක්වා හෙවත් ශ්‍රද්ධාව මෙහි ඇත. එතුමා තුන් වරක් එතුමාගේ පපුව දෙසට සළකුණු කළේය.

පුද්ගලයකු නපුරු වීමට තම සහෝදර මුස්ලිම්වරයා අවතක්සේරු කිරීම ප්‍රමාණවත් වන්නේය.

මුස්ලිම්වරයාගේ රුධිරය, දේපළ සහ ගෞරවය යනාදී සියල්ල තවත් මුස්ලිම්වරයකුට තහනම්ය.

මෙය ඉමාම් මුස්ලිම් විසින් වාර්තා කර ඇත.

***

## -විග්‍රහය-

"නුඹලා එකිනෙකාට ඊර්ෂ්‍යා නොකරන්න." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

ඉන් අදහස් කරනුයේ: නුඹලා කෙනෙකු තවත් කෙනෙකුට ඊර්ෂ්‍යා නොකරන්න යනුවෙනි.

ඊර්ෂ්‍යාව මිනිස් ස්වභාවය තුළ පැළපදියම් වූවකි. එය සැබැවින්ම මිනිසා ඔහුගේ වර්ගයා අතරින් කිසිවකු කිසියම් ශ්‍රේෂ්ඨත්වයක් ලබා ඔහුට වඩා උසස් වීම පිළිකුල් කිරීමකි.[239]

මින් පසු මිනිසා තවත් කොටස් කිහිපයකට බෙදෙයි.

ඔවුන් අතුරින් ඇතැමුන්: ඊර්ෂ්‍යා කරනු ලබන්නාගේ ආශිර්වාදයන් අයුක්තිසහගත ලෙස වචනයෙන් හා ක්‍රියාවෙන් ඉවත් කිරීමට උත්සාහ දරන්නන්ය. මෙය තහනම් කරනු ලැබූ මෙන්ම ඉතා පහත් ඊර්ෂ්‍යාවයි.

නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බවට සුබෙයිර් ඉබ්නු අල් අවාම් තුමා විසින් වාර්තා කළ හදීසයක් ඉමාම් අහ්මද් හා තිර්මිදි මෙසේ දන්වා සිටියි. "නුඹලාට පෙර විසූ සමූහයාගේ රෝගයක් නුඹලා වෙතත් පෙරළී පැමිණ ඇත. එනම්: ඊර්ෂ්‍යාව හා ක්‍රෝධයයි. ක්‍රෝධය එය මුඩු කරන්නක්මය. එය රෝම මුඩු කරන්නක් නොව දහම මුඩු කරන්නකි..."[240]

239. මුඃමින්වරයා ඊර්ශ්‍යාව සඟවයි. කුහකයා එය හෙළි කරයි. එසේ නැතහොත් එය මිනිස් සිත් තුළ එය පැළපදියම් ව ඇත්තකි. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්තරීෆි)

240. අහ්මද් (1/164,165), තිර්මිදි (2510), මේ පිළිබඳ ප්‍රකාශ බොහෝමයක් ඇත. ඉමාම් තිර්මිදි එය පෙන්වා දී ඇත. නමුත් අබ්දුල්ලාහ් ඉබ්නු සුබෙයිර් විසින් වාර්තා

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බවට අබූ හුරෙය්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලද හදීසයක් අබූ දාවූද් තුමා මෙසේ ප්‍රකාශ කරයි: "සැබැවින්ම ඊර්ෂ්‍යා කිරීම මම නුඹලාට අවවාද කරමි. හේතුව සැබැවින්ම ගින්දර දර කා දමන්නාක් මෙන් ඊර්ෂ්‍යාව යහකම් කා දමන බැවිනි."[241]

ජනයා අතර තවත් පිරිසක් වනුයේ: වෙනත් කෙනෙකුට ඊර්ෂ්‍යා කරන විට ඔහුගේ ඊර්ෂ්‍යාව නියම කරන දෑ ක්‍රියාත්මක නොකරන්නන්ය. වචනයෙන් හෝ ක්‍රියාවෙන් හෝ ඊර්ෂ්‍යා කරනු ලබන්නාට කිසිදු අපරාධයක් සිදු නොකරන්නන්ය. සැබැවින්ම එමගින් ඔහුට කිසිදු පාපයක් ඇති නොවන බව හසන් තුමා විසින් වාර්තා කරනු ලැබ ඇත.

එය දෙවර්ගයකි.

ඒ දෙකින් පළමුවැන්න: ඊර්ෂ්‍යාව තම සිතෙන් ඉවත් කිරීමට නොහැකි වීමයි. නමුත් ඒ හේතුවෙන් ඔහුට පාපයක් ඇති නොවන්නේය.

දෙවැන්න: එය තෝරා ගැනීමක් වශයෙන් තම සිතට කතා කොට, පසු සලකා බැලීමක් වශයෙන් තම සහෝදරයාගේ ආශිර්වාදය ඉවත් වන තෙක්ම යළි එය මතු කර ගෙන ඒමය. මෙය පාපය මත ඇති කරගත් අධිෂ්ඨානයට සමානය. ඒ සඳහා හිමිවන දඬුවම ගැන විද්වතුන් අතර මතභේද පවතී. නමුත් මෙය ඊර්ෂ්‍යා කරනු ලබන්නාට -වචනයෙන් පවා- අපාරධයක් සිදුවීම ගැන සැහීමට පත්වීමට වඩා දුරස්ය. නමුත් ඔහු පාපියෙකු වන්නේය.

---

කොට, අල් බස්සාර් විසින් පළ කර ඇති හදීසය ඉමාම් අල් මුන්දිරි 'අත්තර්ගීබ්'හි පවසන පරිදි ඉතා හොද වාර්තාකරණයකින් පළ වී ඇත.

"සාක්ෂියේ දූෂණය, එයයි මුඩු වීම -විනාශය-' යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි, එය ද තවත් හදීසයකි. මෙම හදීසය විග්‍රහය කිරීමේ දී ඉන්ෂා අල්ලාහ් සඳහන් කරන්නාක් පරිදි සහීහ් ගණයට අයත් වූවකි.

241. අබූ දාවූද් (4903). 'තඛ්රීජ් අල් ඉහ්යා'හි (1/149) අල් ඉරාකී විසින් මෙසේ පවසා ඇත: "අබූ හුරෙයිරාගේ මෙම හදීසය අබූ දාවූද් තුමා විසින් ද වාර්තා කර ඇත. ඉමාම් බුහාරි එය සහීහ් ගණයට අයත් නොවන බව පවසා ඇත. අනස් තුමා විසින් වාර්තා කළ ඉබ්නු මාජාහි සඳහන්ව ඇති හදීසය දුර්වල වාර්තාකරණයකින් වාර්තා වී ඇත. 'තාරීහ් බග්දාද්' නම් කෘතියෙහි මෙය හසන් ගණයේ වාර්තාවක් බව සඳහන් වෙයි."

තවත් පිරිසක් වන්නේ: ඔහු ඊර්ෂ්‍යා කළ විට ඊර්ෂ්‍යා කරන්නාගේ ආශිර්වාදය තුරන් වීම ගැන ආශා නොකරන අතරම ඔහුට හිමි මහිමයන් හා සමානව උපයන්නට වෙහෙස දරා එවැන්නක් ඔහුට ද තිබිය යුතු යැයි ප්‍රිය කරන්නන්ය. නමුත් එම මහිමයන් ලෞකික කටයුත්තක වී නම් එහි යහපතක් නැත. එම මහිමයන් ආගමික කටයුත්තක වී නම් එය දැහැමිය. නබි (ﷺ) තුමාණන් සාක්ෂි දැරීම ආශා කළේය. එතුමාණන් පැවසූ බවට බුහාරි හා මුස්ලිම් හි මෙසේ සඳහන් වේ. “දෙදෙනෙකු විෂයයෙහි මිස ඊර්ෂ්‍යාවක් නැත. එනම් අල්ලාහ් ඔහුට ධනය පිරිනමා ඇත. එය රාත්‍රිය මුළුල්ලේ හා දහවල් මුළුල්ලේ වියදම් කරන මිනිසා. අල්ලාහ් ඔහුට අල් කුර්ආනය පිරිනමා රාත්‍රිය මුළුල්ලේ හා දහවල් මුළුල්ලේ ඒ අනුව කටයුතු කළ මිනිසා.[242]

මෙය ප්‍රමෝදයකි. ‘හසද්’ නොහොත් ඊර්ෂ්‍යාව යනුවෙන් එයට නම් තබා ඇත්තේ උපමා වාක්‍යයක් ලෙසිනි.

තවත් පිරිසක්: තම සිතට ඊර්ෂ්‍යාවක් හට ගැණුනු විට එය ඉවත් කිරීමටත් ඊර්ෂ්‍යා කරනු ලබන්නාට යහපත සැලසීමටත් ඔහු වෙනුවෙන් ප්‍රාර්ථනා කිරීමටත් ඔහු සතු මහිමයන් පතුරුවාලීමටත් කැප වෙති. ඔහුගේ සිතු තුළ හට ගැනුනු ඊර්ෂ්‍යාව ඉවත් කිරීමෙහි දී, තම සහෝදර මුස්ලිම්වරයා තමන්ට වඩා ශ්‍රේෂ්ඨ මෙන්ම උතුම් අයකු විය යුතු යැයි ප්‍රිය කරන තරමට පරිවර්තනය වන තෙක් විය යුතුය. දේව විශ්වාසයේ උදාරතම අදියර මෙය වේ. එය සතු පුද්ගලාය පූර්ණ දේව විශ්වාසය ඇත්තෙකි. තමන් ප්‍රිය කරන දෑ තම සහෝදරයාටත් සතු විය යුතු යැයි ප්‍රිය කරයි.

***

“නුඹලා එකිනෙකාට විරුද්ධව මිල වැඩි නොකරන්න.” යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

බහුතර විද්වත්හු එය විස්තර කර ඇත්තේ: ව්‍යාපාරික ගනුදෙනුවක ඇතිවන මිල වැඩි කිරීමයි. එනම් මිල දී ගැනීම ප්‍රිය නොකරන පුද්ගලයා භාණ්ඩයේ මිල වැඩි කිරීමය. එහි මිල අධික කිරීම තුළින් ව්‍යාපාරිකයාට ලැබෙන වාසිය

242. බුහාරි (73), මුස්ලිම් (816)

තකා හෝ එහි මිල වැඩි කිරීම තුළින් පාරිභෝගිකයාට ඇති වන පීඩාව නිසා විය හැක.

-මෙම හදීසයේ තහනම් කර ඇති- එකිනෙකාට විරුද්ධව මිල වැඩි කිරීම යන ‘අත්තනාජුස්’ නම් අරාබි පදය ඊට වඩා පොදුතාවක් ගනී. භාෂාමය වශයෙන්‘නජ්ස්’ පදයේ මූල අර්ථය: කුමන්ත්‍රණශීලී හා කූට අයුරින් යමකට බලපෑමක් ඇති කිරීම යන්නයි. -අරාබි භාෂාවේ- දඩයම් කරන්නාට ද ‘නාජිස්’ යන පදයෙන් අමතයි. ඊට හේතුව කුමන්ත්‍රණශීලීව හා උපක්‍රමශීලීව දඩයම් කිරීමට ඔහු පෙළඹෙන බැවිනි. එවිට අර්ථය වනුයේ: ‘නුඹලා එකිනෙකට වංචා නොකරන්න. කුමන්ත්‍රණශීලීව හා කූට ලෙස කෙනෙකු අනෙකා සමග ගනුදෙනු නොකරන්න’ යන්නයි.

එසේ තහනම් කරන ලද ‘අත්-තනාජුස්’ (එකිනෙකාට එරෙහිව කටයුතු කිරීම) යන පදයේ රාමුව තුළ වංචා සහගත සියලුම ගනු දෙනු වර්ග ඇතුළත් වන්නේය.

***

“නුඹලා එකිනෙකාට වෛර නොකරන්න.” යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

අල්ලාහ්ගේ කටයුත්තක මිස තමන්ගේ ආත්මාශාවන්ට අනුව මුස්ලිම්වරු තමන් අතර එකිනෙකා වෛර කිරීම තහනම් කර ඇත. සැබැවින්ම අල්ලාහ් මුස්ලිම්වරුන් සහෝදරයින් බවට පත් කර ඇති බැවිනි. සහෝදරයින් වනාහි, ඔවුන් එකිනෙකා අතර ප්‍රේම කරති. ක්‍රෝධ නොවෙති. අල්ලාහ් තම ගැත්තන්හට ඔවුන්ගේ හදවත් අතර බැඳීමක් ඇති කර ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි. “... තවද නුඹලා (එකිනෙකාට) සතුරන් ලෙස සිටි කල්හි නුඹලා කෙරෙහි වූ අල්ලාහ්ගේ භාග්‍යය පිළිබඳව සිහිපත් කරනු. එවිට නුඹලාගේ හදවත් අතර අල්ලාහ් බැඳීමක් ඇති කළේය. එබැවින් ඔහුගේ භාග්‍යයෙන් නුඹලා සහෝදරයින් බවට පත් වූහ.” (ආලු ඉම්රාන්:103)

මෙම අර්ථය අනුව කේළම් කියමින් සැරිසැරීම තහනම් කර ඇත. ඊට හේතුව එහි දී සතුරුකම හා ක්‍රෝධය ඇතිවීමක් සිදු වන බැවිනි. ඒ අතරම මිනිසුන් අතර ප්‍රතිසංස්කරණය කිරීම දිරි ගන්වා ඇත.

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බව අබූ දර්දා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් ඉමාම් අහ්මද්, අබූ දාවූද් හා තිර්මිදි යන ඉමාම්වරු විසින් මෙසේ පළ කර ඇත. එතුමාණන්: "සලාතයේ, උපවාසයේ හා සදකාවේ නිලයට වඩා උතුම් කරුණක් මම නුඹලාට දන්වා සිටින්නදැ"යි විමසා සිටියහ. ඔවුහු: එසේය, අල්ලාහ්ගේ දූතයාණනි, යැයි පැවසුවෝය. "ඒ අතර ප්‍රතිසංස්කරණය කිරීමය. ඒ අතර කලහකම් කිරීම එය විනාශයකි" යැයි පැවසූහ.[243]

අල්ලාහ් විෂයයෙහි ක්‍රෝධය ඇති කිරීම යනු එය ඊමානයේ වඩාත් ස්ථාවර බැඳීමකි. තහනම තුළ එය ඇතුළත් වන්නේ නැත.

දහම පිළිබඳ ගැටළුවලදී මිනිසුන් අතර මතභේද අධික වී ඔවුන්ගේ බෙදීම් වැඩි වූ කල්හි ඒ හේතුවෙන් ඔවුන් එකිනෙකා අතර දොස් නැඟීම් හා වෛර කිරීම් වැඩිවෙනු ඇත. ඔවුන් සෑම කෙනෙකුම තමන් අල්ලාහ් වෙනුවෙන් වෛර කරන බව පෙන්වයි. එය අදාළ විෂයෙහි පමණක් නිදහසට කරුණු දැක්වීමක් විය යුතුය. එසේ නිදහසට කරුණු දැක්වීමක් නොතිබී තම ආශාවන් අනුගමනය කරන, ක්‍රෝධය ඇති කර ගත් දෑ පිළිබඳ දැනුම සොයා බැලීම සීමා කර ගත් අයකුට ද විය හැක. එවිට මුඃමින්වරයකුට අනිවාර්යය වන්නේ තමන්ටම උපදෙස් කර ගැනීමයි. එමගින් ඔහු පූර්ණ ආරක්ෂාව ලබන්නේය. මේ ස්වරූපයෙන් ඇති දෑ ඔහුගේ සිතට ඇතුළත් නොවෙයි. එය, තහනම් කරන ලද ක්‍රෝධයෙන් ඔහුව වළක්වන ලද දෑ සිදුවීමට ඇති බිය හේතුවෙනි.

***

"නුඹලා එකිනෙකා පසුපස හැරී නොයන්න." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

අබූ උබෙයිදා තුමා මෙසේ පවසයි: 'අත්තදාබුර්' යනු: එකිනෙකා පොරබැඳීම හෙළා දැකීම යන අදහස වේ. එය මිනිසෙකු තම සහෝදරයාට පසුපස ලා

243. අහ්මද් (6/444), අබූ දාවූද් (4919), තිර්මිදි (509) මෙය සහීහ් ගණයට අයත් හදීසයක් බව හෙතෙම පවසා සිටියි.

පිටුපා යෑමය. එහි ඔහුගෙන් තම මුහුණ හැරවීම ද ඇතුළත් වන අතර එය එකිනෙකා වෙන්වීම අදහස් කරයි.

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බවට අබූ අය්යූබ් තුමා විසින් වාර්තා කරන ලද හදීසයක් බුහාරි හා මුස්ලිම් හි මෙසේ සඳහන් වී ඇත. “දින තුනකට වඩා වැඩියෙන් තම සහෝදරයාගෙන් වෙන්වී සිටීම මුස්ලිම්වරයකුට අනුමත නොවෙයි. ඔවුන් දෙදෙනා හමු වී, ඔහු මොහුගෙන් වැළකී සිටියි. මොහු ඔහුගෙන් වැළකී සිටියි. ඔවුන් දෙදෙනාගෙන් උතුම් වන්නේ සලාම් පවසා ආරම්භ කරන්නාය.”[244]

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බවට අබූ කිරාෂ් අස් සුලමීගේ හදීසයක් ඉමාම් අබූ දාවූද් විසින් මෙසේ පළ කර ඇත. “කවරෙකු තම සහෝදරයා සමග වසරක් කෝප වී සිටින්නේ ද ඔහු ඔහුගේ රුධිරය වැගුරුවා හා සමාන වන්නේය.”[245]

මේ සියල්ල ලෞකික කටයුතුවලදී එකිනෙකා වෙන්වීම සම්බන්ධයෙනි. ආගමික කරුණු වලදී වනාහී, දින තුනකට වඩා අධික වීම අනුමතය. ඉමාම් අහ්මද් එය පෙන්වා දී ඇති අතර පසුබැස්සා වූ තුන්දෙනාගේ කතාවස්තුව එයට සාධක වශයෙන් හෙතෙම ගෙන ඇත.[246]

ඉමාම් අල්කත්තාබී තුමා: ‘සැබැවින්ම පියා පුතු ව ද ස්වාමි පුරුෂයා බිරිය ව ද -ඒ අර්ථයෙන් වන සෙසු දෑ ද- විනය පුහුණු කිරීමක් වශයෙන් දින තුනකට වඩා අධික වීම අනුමතය. ඊට හේතුව නබි (ﷺ) තුමාණන් තම බිරිය මසක කාලයක් වෙන්කර තැබූහ’ යැයි සඳහන් කර ඇත.

---

244. බුහාරි (6077), මුස්ලිම් (2560)

245. අබූ දාවූද් (4915), ‘තඛ්රීජ් අහාදීස් අල් ඉහ්යා’ නම් කෘතියෙහි (3/1265) එහි වාර්තාකරණය සහීහ් ගණයට අයත් බව අල් ඉරාකී විසින් පවසා ඇත.

246. කතෘවරුයාගේ අදහස වී ඇත්තේ: බැණවැදීම, බහින්බස් වීම හා එවැනි මෙලොව කාරණාවක් හේතුවෙන් එසේ එකිනෙකා තරහ වීම දින තුනකට වඩා වැඩි වීම සුදුසු නොවන බවයි. පාප කටයුත්තක් සිදු කරන පාපියෙක් හෝ අලුතින් ආගමික කටයුත්තක් බිහි කරන්නෙක් පිටු දකින අයකු වනාහි, එහි දී දින තුනක් තුළ නැවත හැරිය යුතුයි යන අදහස නැත. එසේ වෙන්වීම -දින තුනකට වඩා අධික වුව ද - ආගමික යහපත අනුව සිදු විය යුත්තකි. නබි (ﷺ) තුමාණන් පසුබැස්සා වූ තිදෙනාව දින පනහක් වෙන් කර තැබූහ.

***

"කෙනෙකුගේ වෙළදාමට එරෙහිව නුඹලා අතරින් කිසිවකු වෙළදාම් නොකළ යුතුයි." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

"තම සහෝදරයාට එරෙහි වෙළදාම් කිරීම" යන්නෙහි තේරුම: විකුණූ යමක් තිබියදී පාරිභෝගිකයා මිලදී ගැනීම සඳහා තම භාණ්ඩයක් ඉදිරිපත් කොට පළමු ව්‍යාපාරය අහෝසි කිරීමයි.

***

"නුඹලා සහෝදරයන් ලෙසින් අල්ලාහ්ගේ ගැත්තන් වන්න." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

ඉහත සඳහන් කරුණුවලට හේතු පවසන්නාක් මෙන් නබි (ﷺ) මෙම ප්‍රකාශය සිදු කර ඇත. එකිනෙකා ඊර්ෂ්‍යා කිරීම, මිල වැඩි කිරීම, වෛර කිරීම, හෙළාදැකීම හා කෙනෙකුගේ වෙළදාමට එරෙහිව වෙළදාම් කිරීම යනාදිය ඔවුන් අතහැර දැමූ විට ඔවුහු සහෝදරයින් බවට පත් වන බව මෙහි පෙන්වා දී ඇත.

මුස්ලිම්වරුන් සහෝරදයන් බවට පත් කරන පොදු කරුණු උපයන මෙන් වූ නියෝගය ද මෙහි ඇත. එහි දී මුස්ලිම්වරයකු තවත් මුස්ලිම්වරයකුට කළ යුතු යුතුකම් ද ඇතුළත් වෙයි. එනම් සලාමයට පිළිතුරු සැපයීම. කිඹුහුම් ගිය අයකු අල්හම්දුලිල්ලාහ් කී විට එයට පිළිතුරු සැපයීම. රෝගියාගේ සුවදුක් විමසීම, ජනාසාවක අවසන් කටයුතු සිදු කිරීම, සංග්‍රහයකට පිළිතුරු දීම, කෙනෙකු හමුවන අවස්ථාවේ සලාම් පවසා ආරම්භ කිරීම, නොදන්නා දෑ පිළිබඳ උපදෙස් දීම.

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බව අබූ හුරෙය්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් තිර්මිදි හි මෙසේ සඳහන් වෙයි. 'නුඹලා එකිනෙකාට ප්‍රිය කරනු. සැබැවින්ම එසේ ප්‍රිය කිරීම හදවතේ පවතින දැඩිභාවය පහ කරනු ඇත.[247] මෙම හදීසය වෙනත් අය විසින් ද පළ කර ඇති

247. තිර්මිදි (2130), 'අත්තල්කීස්'හි (3/80) අල්හාෆිල් තුමා: එම වාර්තාකරණයේ අබූ මඃෂර් අල් මුදනී -වෙන්ව සඳහන් කර ඇත- දුර්වල කෙනෙකු බව පවසයි.

අතරය එහි පද පෙළ මෙසේය: “නුඹලා එකිනෙකාට ප්‍රේම කරනු. එවිට නුඹලා එකිනෙකා අතර ආදරය ඇති වන්නේය.”[248]

***

“මුස්ලිම්වරයා මුස්ලිම්වරයාගේ සහෝදරයෙකි. ඔහු ඔහුට අසාධාරණකම් කරන්නේ නැත. ඔහුව පහත් කරන්නේ නැත. ඔහුට බොරු කියන්නේ නැත. ඔහුට අපහාස කරන්නේ නැත” යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

මෙය සූරා අල් හුජුරාත් 10 වැනි වැකියෙන් ගනු ලැබූවකි. එනම්: “සැබැවින්ම සියලු විශ්වාසවන්තයින් සහෝදරයින්මය. එබැවින් නුඹලාගේ සහෝදරයින් දෙදෙනා අතර සමාදානය ඇති කරනු.” දේව විශ්වාසී මුඃමින්වරු සහෝදරයින් ලෙස සිටින විට තම හදවත් තුළ සෙනෙසහ ඇති කරන ඔවුන් එක්සේසත් කරන කරුණු ඔවුන් අතර නියම කරනු ලබනු ඇත. එමෙන්ම හදවත් හෙළා දකින එහි භේද ඇති කරන කරුණු ඔවුන් අතර වළක්වනු ලබනු ඇත. එය ද ඒ අතරින් එකකි.

තවදුරටත්, සැබැවින්ම සහෝදරයා වනාහි, ඔහුගේ කාර්යය වනුයේ තම සහෝදරයාට සෙත සැලසීම හා ඔහුට අත්වන හිංසාවන් වැළැක්වීමයි. එසේ අත්වන හිංසාවාන් අතරින් බරපතල වන්නේ අසාධාරණයයි.

මුස්ලිම්වරයකු තම සහෝදරයා පහත් කොට සැලකීම ද ඒ අතරින් වන්නේය. ඊට හේතුව සැබැවින්ම මුස්ලිම්වරයා තම සහෝදරයාට උදව් කිරිමට අණ කරනු ලැබ ඇති බැවිනි.

එමෙන්ම මුස්ලිම්වරයා තම සහෝදරයාට බොරු කීම ද ඒ අතරින් වන්නේය. එහෙයින් ඔහුට කතා කර, බොරු පවසා සිටීම අනුමත නොවන්නේය. ඔහු සමග කතා කළ යුත්තේ සත්‍යය පමණි.

248. ඉමාම් බුහාරි තුමා ‘අදබුල් මුෆ්රද්’හි (594) මෙය වාර්තා කර ඇති අතර අල් හාෆිළ් තුමා ‘අත්තක්ලීස්’හි (3/80) මෙය හසන් වර්ගයට අයත් හදීසයක් බව පෙන්වා දී ඇත. ඉමාම් අල්බානී තුමා ද ‘අල් ඉර්වාඃ’හි (1601) එයම අනුකරණය කර ඇත.

මුස්ලිම්වරයා තම සහෝදරයා ව අවතක්සේරු කිරීම ද ඒ අතුරින් වන්නේය. එය අහංකාරකම ඇති කරන්නකි. සැබැවින්ම අහංකාරයා තමන් දෙස බලනුයේ පූර්ණ දැසිනි. නමුත් වෙනත් අය දෙස බලන විට දොෂ සහිත බැල්මෙන් බලයි. ඔහු ඔවුන් අවමානයට පත් කරයි. හැල්ලුවට පත් කරයි. ඔවුන්ගේ යුතුකම් ඉටු කිරීමට ඉදිරිපත් නොවෙයි. ඔවුන් කිසිවකු විසින් ඔහු වෙත සත්‍යය ඉදිරිපත් කරන විට, ඔවුන් කිසිවකුගෙන් එය පිළිගන්නට ඔහු සමත් නොවෙයි.

***

"තක්වා හෙවත් ශ්‍රද්ධාව මෙහි ඇත' යනුවෙන් පවසා ඔහු තුන් වරක් ඔහුගේ පපුව දෙසට සළකුණු කළේය" යන ප්‍රකාශය වනාහි:

සැබැවින්ම අල්ලාහ් අබියස ශ්‍රේෂ්ඨතම මැවීම තක්වා හෙවත් ශ්‍රද්ධාව ඇත්තා බව මෙහි පෙන්වා දී ඇත. තම දුර්වලකම හා මෙලොවෙහි තමන්ට ලැබී ඇති සුළු කොටස හේතුවෙන් අවමානයට ලක් වූ කෙතරම් දෙනෙක්, අල්ලාහ් අබියස මෙලොවෙහි වටිනාකමක් හිමි වූ අයට වඩා වටිනාකමින් අතිමහත් වන්නේය. සැබැවින්ම මිනිසා එකිනෙකාට වෙනස් වනුයේ තක්වාව පදනම් කර ගනිමිනි. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: 'අල්ලාහ් අබියස සැබැවින්ම නුඹලා අතරින් ගෞරවාන්විත අය වන්නේ නුඹලා අතර ශ්‍රද්ධාවෙන් වැඩි අයයි." (සූරා අල් හුජුරාත්: 13)

සහ්ල් ඉබ්නු සඃද් තුමා විසින් ප්‍රකාශ කළ හදීසයක් 'සහීහ් අල් බුහාරි'හි මෙසේ පළ වී ඇත: එතුමා: මිනිසෙකු අල්ලාහ්ගේ දූතයාණන් අසළින් ගමන් ගත්තේය. එවිට එතුමාණන් අසළ වාඩි වී සිටින මිනිසෙකු දෙස බලා එතුමා: 'මොහු විෂයයෙහි ඔබේ අදහස කුමක්දැ?'යි විමසා සිටියේය. එවිට ඔහු: 'ජනයා අතර ඉතා ගෞරවනීය මිනිසෙකි. අල්ලාහ් මත දිවුරා කියමි. ඔහු විවාහ යෝජනාවක් කළ විට විවාහ කර ගනු ලැබීමටත් මැදිහත් වන විට මැදිහත් කරනු ලබන්නටත් කතා කරන විට ඔහුගේ ප්‍රකාශය සවන් දෙනු ලැබීමටත් ඔහු විශේෂ පුද්ගලයකි' යැයි පවසා සිටියේය. නබි තුමාණන් නිහඬව සිට තවත් මිනිසෙකු ගමන් ගත්තේය. එවිට අල්ලාහ්ගේ දූතයාණන් 'මොහු ගැන ඔබේ අදහස කුමක්දැ?යි විමසා සිටියහ. එවිට ඔහු අල්ලාහ්ගේ දූතයාණනි, මොහු දිළිඳු දුප්පත් ජනයා අතරින් වූ මිනිසෙකි. ඔහු විවාහ යෝජනාවක් කළ විට විවාහ කර ගනු නොලබන, මැදිහත් වන විට මැදිහත්

කරනු නොලබන, කතා කරන විට ඔහුගේ ප්‍රකාශයට සවන් දෙනු නොලබන පුද්ගලයකි.' යැයි පවසා සිටියහ. එවිට අල්ලාහ්ගේ දූතයාණන්: මේ පුද්ගලයා මේ තරම් මහපොළව පිරී තිබීමට වඩා උතුම් අයකු වන්නේ යැයි පවසා සිටියහ."[249]

***

"පුද්ගලයකු නපුරු වීමට තරම් තම සහෝදර මුස්ලිම්වරයා අපහාසයට ලක් කිරීම ප්‍රමාණවත් වන්නේය." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

ඉන් අදහස් කරනුයේ: ඔහු නපුරුවීමට තම සහෝදර මුස්ලිම්වරයා අපහාසයට ලක් කිරීම ප්‍රමාණවත් වන බවයි. එසේ තම සහෝදර මුස්ලිම්වරයා අපහාසයට ලක් කරනුයේ ඔහු මත තිබෙන අහංකාරකම නිසාවෙනි. නපුරු කටයුතු අතුරින් වඩාත් දරුණුතම නපුර වනුයේ අහංකාරයයි. නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බවට මුස්ලිම් විසින් පළ කර ඇති හදීසයක් මෙසේය. එතුමාණන්: 'අහංකාරයෙන් අණුවක තරම් ප්‍රමාණයක් සිත තුළ ඇත්තා ස්වර්ගයට පිවිසෙන්නේ නැත."[250] එහි ඇති තවත් ප්‍රකාශයක සැබැවින්ම එතුමාණන්: "අලංකාරය ඔහුගේ වේට්ටියයි. අහංකාරය ඔහුගේ උඩු සාළුවයි. එහෙයින් කවරෙකු මට දඩබ්බර වන්නේ ද මම ඔහුට දඬුවම් කරමි."[251] අල්ලාහ්ගේ දඩබ්බරකම සෙසු මැවීම්වලට නොගැලපෙන ගුණාංගයකි. එය නපුරෙකු වීමට ප්‍රමාණවත් වන්නේය.

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් සහීහ් මුස්ලිම්හි මෙසේ වාර්තා වී ඇත. "ජනයා විනාශ වී ගොස් ඇතැයි කවරෙකු පවසන්නේ ද ඔහු ඔවුන් අතර වඩාත් විනාශකාරී පුද්ගලයාය."[252] මාලික් තුමා මෙසේ පවසයි: ජනයා අතර - ඔවුන්ගේ ආගමික කටයුත්තක- දකින කරුණක් හේතුවෙන් දුකට පත් ව එසේ ප්‍රකාශ කළේ නම් එහි වරදක් ඇති බව මම නොදකිමි. නමුත් ඔහු තමන් උලුප්පා ගෙන ජනයා පහත් තත්ත්වයට පත් කරමින් එසේ ප්‍රකාශ කළේ නම්

249. බුහාරි (5091).
250. මුස්ලිම් (91)
251. මුස්ලිම් (620)
252. මුස්ලිම් (2623)

එය තහනම් කරනු ලැබූ පිළිකුල් සහගත කරුණක් වන්නේය.'' අබූ දාවූද් තුමා ඔහුගේ 'සුනන්'හි මෙය සඳහන් කර ඇත.

***

''මුස්ලිම්වරයාගේ රුධිරය, දේපළ සහ ගෞරවය යනාදී සියල්ල තවත් මුස්ලිම්වරයකුට තහනම්ය'' යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

මිනිසුන් විශාල වශයෙන් රැස්වන ස්ථානවල නබි (ﷺ) තුමාණන් මේ ගැන දේශනා කර ඇත්තාහ. හජ්ජතුල් වදා හෙවත් සමුගැනීමේ හජ් වන්දනා අවස්ථාවේ දී 'නහර්' නම් අවුරුදු දින ද අරෆා දින ද අය්යාමුත් තෂ්රීක්හි දෙවැනි දින ද එතුමා මේ ගැන දේශනා කර ඇත්තාහ.

'සුනන් අබී දාවුද්'හි ඇතැම් සහාබාවරුන් කළ ප්‍රකාශයක් මෙසේ සඳහන්ව ඇත. සැබැවින්ම ඔවුන් නබි (ﷺ) තුමාණන් සමග ගමනක නිරතව සිටියෝය. ඔවුන් අතරින් මිනිසෙකු නිදන්නට විය. ඔවුන්ගෙන් ඇතැමෙකු ඔහු සමග වූ ලණුවක් වෙත යොමු වී එය ඇද්දේය. එවිට ඔහු තිගැස්සිණ. එවිට නබි (ﷺ) තුමාණන්: ''මුස්ලිම්වරයකු බිය ගැන්වීම තවත් මුස්ලිම්වරයකුට අනුමත නොවන්නේය.'' යැයි පැවසූහ.[253]

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බවට ඉබ්නු මස්ඌද් තුමා විසින් වාර්තා කළ හදීසයක් බුහාරි හා මුස්ලිම්හි මෙසේ සඳහන් වී ඇත. ''නුඹලා තුන්දෙනෙකු සිටින්නෙහු නම්, තුන්වැන්නා හැර දමා දෙදෙනෙකු පමණක් රහසේ කතා නොකරනු. සැබැවින්ම එය ඔහු දුකට පත් කරවයි.''[254]

සැබැවින්ම මුස්ලිම්වරයකු කිසිදු යුක්තියකින් තොරව ක්‍රියාවක හෝ ප්‍රකාශයක ස්වරූපයෙන් ඔහු වෙත නපුරක් කිරීම අනුමත නොවන බව මෙම ප්‍රකාශ අන්තරගතකොට ගෙන ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. ''විශ්වාසිකයින්ට ද විශ්වාසික කාන්තාවන්ට ද ඔවුන් නොකළ දැයින් (චෝදනා කර) හිංසාවට පත් කළවුන් ඔවුන් සැබැවින්ම අවලාදයක් හා පැහැදිලි පාපයක් උසුලා ගත්තෝය.'' (සූරා අල් අහ්සාබ්: 58) සැබැවින්ම

253. අබූ දාවුද් (5004), අල් අල්බානී තුමා 'සහීහ් අල්ජාමිඃ'හි (7685) මෙය සහීහ් ගණයට අයත් හදීසයක් බව පවසා ඇත.
254. බුහාරි (6290), මුස්ලිම් (2184).

අල්ලාහ් දේව විශ්වාසවන්තයින් සහෝදරයින් බවට පත් කර ඇත්තේ ඔවුන් එකිනෙකා අතර සෙනෙහස හා ආදරය බෙදා ගැනීමටය.

මිනිසෙකු උමර් ඉබ්නු අබ්දුල් අසීස් තුමාට: මුස්ලිම්වරුන් අතර සිටින වැඩිහිටියන් ඔබ ඉදිරියේ පියා නම් ස්ථානයේ තබන්න. ඔවුන්ගේ කුඩා දරුවන් පුතු නම් ස්ථානයේ තබන්න. ඔවුන් අතර මධ්‍යස්ථ අය සහෝදරයා නම් ස්ථානයේ තබන්න. එසේ වූ විට, ඔබ මොවුන්ගෙන් කවරෙකුට හානියක් සිදු කරන්නට ප්‍රිය කරන්නේ ද? යැයි විමසීය.

යහ්යා ඉබ්නු මුආද් අර්රාසී තුමාගේ ප්‍රකාශයෙන් උපුටා ගනු ලැබූ ප්‍රකාශයක: 'ඔබෙන් කරුණු තුනක් මුඃමින්වරයාගේ පංගුව විය යුතුයි. ඔබ ඔහුට සෙතක් නොකළ ද ඔබ ඔහුට හානියක් සිදු නොකළ යුතුයි. ඔබ ඔහුට සතුටක් නොදුන්න ද ඔබ ඔහු මුළා නොකළ යුතුයි. ඔබ ඔහුට ප්‍රශංසා නොකළ ද ඔබ ඔහු අපහාසයට ලක් නොකළ යුතුයි.

***

## الحَدِيْثُ السَّادِسُ والثَّلاثُوْنَ

## තිස් හය වන හදීසය

عَنْ أَبِي هُرَيْرَةَ رَضِيَ اللهُ عَنْهُ، عَنْ رَسُولِ اللهِ ﷺ، قَالَ:

"مَنْ نَفَّسَ عَنْ مُؤْمِنٍ كُرْبَةً مِنْ كُرَبِ الدُّنْيَا، نَفَّسَ اللهُ عَنْهُ كُرْبَةً مِنْ كُرَبِ يَوْمِ الْقِيَامَةِ، وَمَنْ يَسَّرَ عَلَى مُعْسِرٍ، يَسَّرَ اللهُ عَلَيْهِ فِي الدُّنْيَا وَالْآخِرَةِ، وَمَنْ سَتَرَ مُسْلِمًا، سَتَرَهُ اللهُ فِي الدُّنْيَا وَالْآخِرَةِ، وَاللهُ فِي عَوْنِ الْعَبْدِ، مَا كَانَ الْعَبْدُ فِي عَوْنِ أَخِيهِ.

وَمَنْ سَلَكَ طَرِيقًا يَلْتَمِسُ فِيهِ عِلْمًا، سَهَّلَ اللهُ لَهُ بِهِ طَرِيقًا إِلَى الْجَنَّةِ، وَمَا جَلَسَ قَوْمٌ فِي بَيْتٍ مِنْ بُيُوتِ اللهِ، يَتْلُونَ كِتَابَ اللهِ، وَيَتَدَارَسُونَهُ بَيْنَهُمْ، إِلَّا نَزَلَتْ عَلَيْهِمِ السَّكِينَةُ، وَغَشِيَتْهُمُ الرَّحْمَةُ، وَحَفَّتْهُمُ الْمَلَائِكَةُ، وَذَكَرَهُمُ اللهُ فِيمَنْ عِنْدَهُ.

وَمَنْ بَطَّأَ بِهِ عَمَلُهُ، لَمْ يُسْرِعْ بِهِ نَسَبُهُ"

رَوَاهُ مُسْلِمٌ.

අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) ප්‍රකාශ කළ බව අබූ හුරෙය්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

කවරෙකු මුඃමින්වරයකුගෙන් මෙලොව දුෂ්කරතා අතුරින් දුෂ්කරතාවක් සැහැල්ලු කරන්නේ ද මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ පවතින දුෂ්කරතා අතරින් දුෂ්කරතාවක් අල්ලාහ් ඔහුගෙන් සැහැල්ලු කරනු ඇත. කවරෙකු දුෂ්කරතා ඇත්තෙකුට පහසුව සලසන්නේ ද මෙලොව හා මතුලොවදී අල්ලාහ් ඔහුට පහසුව සලසනු ඇත. කවරෙකු මුස්ලිම්වරයකු(ගේ වරදක්) සඟවන්නේ ද මෙලොව හා මතුලොවෙහි අල්ලාහ් ඔහුව සඟවනු ඇත. ගැත්තා තම සහෝදරයට උදව් කරමින් සිටින තාක් කල් අල්ලාහ් එම ගැත්තාට උදව් කරමින් සිටියි.

කවරෙකු දැනුම සොයමින් මාර්ගයක ගමන් කරන්නේ ද එමගින් ස්වර්ගය වෙත වූ මාර්ගය අල්ලාහ් ඔහුට පහසු කරනු ඇත. අල්ලාහ්ගේ නිවෙස් අතරින් නිවසක පිරිසක් වාඩි වී අල්ලාහ්ගේ පුස්තකය කියවමින් ඔවුන් අතර එය අධ්‍යනය කරමින් සිටින්නේ ද ඔවුන් වෙත සැනසුම පහළ වී ආශිර්වාදය ඔවුන් ආවරණය කර මලක්වරුන් ඔවුන් පිරිවරා සිටිනු මිස නැත. අල්ලාහ් ද ඔහු අබියස සිටින්නන් අතර ඔවුන් ගැන මෙනෙහි කරනු ඇත.

යහපත් ක්‍රියාවන්හි මන්දගාමී තැනැත්තා, ඔහුගේ (ඉහළ) පරම්පරාව ඔහුට ඉදිරියට යාමට ඉඩ නොදේ.

මෙම මුස්ලිම් තුමා විසින් දන්වා ඇත.

***

-විග්‍රහය-

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ මෙම හදීසය ඉමාම් මුස්ලිම් විසින් පළ කර ඇත.

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බවට ඉබ්නු උමර් තුමා විසින් වාර්තා කළ හදීසයක් බුහාරි හා මුස්ලිම්හි මෙසේ පළ වී ඇත. “මුස්ලිම්වරයා මුස්ලිම්වරයාගේ සහෝදරයා වෙයි. ඔහු ඔහුට අපරාධයක් නොකරයි. ඔහුව යටහත් නොකරයි. තම සහෝදරයාගේ අවශ්‍යතාවකදී කවරෙකු නිරත ව සිටින්නේ ද ඔහුගේ අවශ්‍යතාවෙහි අල්ලාහ් ඔහු සමග වනු ඇත. කවරෙකු යම් දුෂ්කරතාවක් මුස්ලිම්වරයකුගෙන් ඉවත් කරන්නේ ද මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ දුෂ්කරතා අතරින් අල්ලාහ් ඔහු ව ඉවත් කරනු ඇත. කවරෙකු මුස්ලිම්වරයකු(ගේ වරදක්) වසන් කරන්නේ ද මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අල්ලාහ් ඔහු ව වසන් කරනු ඇත.”[255]

255. බුහාරි (2442), මුස්ලිම් (2580)

“කවරෙකු මුඃමින්වරයකුගෙන් මෙලොව දුෂ්කරතා අතුරින් දුෂ්කරතාවක් සැහැල්ලු කරන්නේ ද මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ පවතින දුෂ්කරතා අතරින් දුෂ්කරතාවක් අල්ලාහ් ඔහුගෙන් සැහැල්ලු කරනු ඇත.” යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

සැබැවින්ම ප්‍රතිඵල පිහිටනුයේ එම වර්ගයටම අයත් ක්‍රියාවකින් බව මෙය පෙන්වා දෙයි.

දුෂ්කරතාව යනුවෙන් අර්ථ ගන්වා ඇති ‘අල් කුර්බා’ යන අරාබි පදය වනාහි: එය ව්‍යසනයක දී අදාළ පුද්ගලයාට ඇති වන අති මහත් දරුණු භාවය පෙන්වා දෙයි. එය සැහැල්ලු කිරීම යනුවෙන් අර්ථ ගන්වා ඇති ‘තන්ෆීසුහා’ යන අරාබි පදය එයින් ඔහුට සැහැල්ලුවක් ඇති කිරීම පෙන්වා දී ඇති අතර එය ගනු ලැබ ඇත්තේ හුස්ම ගැනීමට හිරවුණු උගුර ලිහිල් කරන්නාක් මෙන් පීඩයෙන් හුස්ම ගැනීමට සැලසීම යන අර්ථයෙනි.

‘අත්-තෆ්රීජ්’ යනු ඊට වඩා බලවත් එකකි. එනම් දුෂ්කරතාව ඔහුගෙන් ඉවත් කිරීමය. එනම්: ඔහුගේ එම දුෂ්කරතාව ඉවත් වී ඔහුගේ දුක හා ශෝකය ද පහවී යාමය.

ඉබ්නු උමර් තුමාගේ හදීසය පරිදි සැහැල්ලු කිරීමේ ප්‍රතිඵලය සැහැල්ලු කිරීමය. ඉවත් කිරීමේ ප්‍රතිඵල ඉවත් කිරීමය.

***

“කවරෙකු දුෂ්කරතා ඇත්තෙකුට පහසුව සලසන්නේ ද මෙලොව හා මතුලොවදී අල්ලාහ් ඔහුට පහසුව සලසනු ඇත.” යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

සැබැවින්ම දුෂ්කරතාවන් මතුලොවෙහි ද ඇති වන බව මෙය පෙන්වා දෙයි. මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනය සැබැවින්ම එය අසීරු දිනයක් යැයි අල්ලාහ් විස්තර කර ඇත. “එය දෙවියන් ප්‍රතික්ෂේප කරන්නන් හට අසීරු දිනයක් විය.” (සූරා අල් ෆුර්කාන්: 26)

මෙලොවදී මූල්‍යමය වශයෙන් දුප්පත් අයකුට පහසුව සැලසීම කරුණු දෙකින් එකක සිදු වනු ඇත.

එකක්, පහසුකම් ලැබෙන තෙක් ඔහු බලපොරොත්තුවෙන් සිටීමෙන් සිදු වන්නකි. එය අනිවාර්යය වන්නේය. 'ඔහු දුෂ්කරතාවයෙන් පසුවන්නෙකු නම් පහසුව ලබන තෙක් කල් ලබා දිය යුතුයි'' (සූරා අල් බකරා :280)

තවත් විටෙක ඔහු ණය කරුවකු වී නම් ඉන් නිදහස් කිරීමෙන් හෝ ඔහුට අත් වූ දුෂ්කරතාව ඉවත් වන තරමට පිරිනැමීමෙන් සිදු වන්නකි. ඒ කරුණු දෙකම ඔහුට මහත් භාග්‍යයකි.

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් බුහාරි හා මුස්ලිම්හි මෙසේ සඳහන් වී ඇත. ''මිනිසුන්ට ණය ලබා දෙන ව්‍යාපාරිකයෙකු විය. (ඔවුන් අතර) ඔහු දුෂ්කර අයෙකු දුටු විට, ඔහුගේ සේවකයා දෙස බලා: ඔහුගෙන් එය නොසලකා හරින්න. අල්ලාහ් අපෙන් එය නොසලකා හරිනු ඇත. ඒ අනුව අල්ලාහ් ඔහුගෙන් එය නොසලකා හැරියේය.''[256]

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ අබූ කතාදා තුමා වාර්තා කළ හදීසයක් මුස්ලිම්හි මෙසේ පළ වී ඇත. ''මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ඇතිවන දුෂ්කරතාවලින් අල්ලාහ් තමන් මුදවාලීම ගැන කවරෙකු සතුටු වන්නේද ඔහු දුෂ්කරතාවයෙන් පෙළෙන්නාට සහනයක් ඇති කරත්වා එසේ නැත්නම් එයින් ඔහු ඉවත් කරත්වා''[257]

***

''කවරෙකු මුස්ලිම්වරයකු(ගේ වරදක්) සඟවන්නේ ද මෙලොව හා මතුලොවෙහි අල්ලාහ් ඔහුව සඟවනු ඇත'' යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

මෙම අර්ථයෙන් යුත් ප්‍රකාශ බොහෝමයක් ඇත.

මුල්කාලීනයන්ගෙන් කෙනෙකු විසින් මෙසේ වාර්තා කරනු ලැබ ඇත. ඔහු: ''කිසිදු අඩුපාඩුවක් නොමැති පිරිසක් මම දුටිමි. පසුව ඔවුහු මිනිසුන්ගේ අඩුපාඩුකම් කියන්නට පටන් ගත්තෝය. එවිට මිනිසුන් ද ඔවුනට අඩුපාඩු

256. බුහාරි (2078), මුස්ලිම් (1562).
257. මුස්ලිම් (1563)

කියන්නට පටන් ගත්තේය. අඩුපාඩුකම් ඇති පිරිසක් මම දුටුමි. මිනිසුන්ට අඩුපාඩු කීමෙන් ඔවුහු වැළකී සිටියෝය. ඔවුන්ගේ අඩුපාඩු අමතක කරනු ලැබිණ." එය මෙසේ හෝ තවත් ව්‍යූහයකින් ප්‍රකාශ කර තිබෙන්නට පුළුවන.

එයට සාක්ෂි වශයෙන් අබූ බර්සා තුමාගේ හදීසය පිහිටා ඇත. නබි (ﷺ) තුමාණන් මෙසේ පවසා සිටියහ: තම දිවෙන් පවසා විශ්වාස කළවුනි, ඔහුගේ සිත තුළට දේව විශ්වාසය ප්‍රවේශ වී නැත. මුස්ලිම්වරුන්ට නුඹලා දොස් නොපවරනු. ඔවුන්ගේ රහසිගත දෑ පසුපස සොයා නොයනු. කවරෙකු එසේ ඔවුන්ගේ රහසිගත දෑ පසුපස සොයා යන්නේ ද අල්ලාහ් ඔහුගේ රහසිගත දෑ පසුපස හඹා එයි. කවරෙකුගේ රහසිගත දෑ පසුපසින් අල්ලාහ් හඹා එන්නේ ද ඔහුගේ නිවසෙහිම ඔහුව නිරාවරණය කරයි." මෙය ඉමාම් අහ්මද් හා අබූ දාවූද් විසින් පළ කර ඇත.[258] එම අර්ථයෙන් යුත් ඉබ්නු උමර් තුමාගේ හදීසයක් ඉමාම් තිර්මිදි තුමා විසින් ද පළ කර ඇත.[259]

***

"ගැත්තා තම සහෝදරයට උදව් කරමින් සිටින තාක් කල් අල්ලාහ් එම ගැත්තාට උදව් කරමින් සිටියි." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

මිනිසෙකුගේ අවශ්‍යතාවක් ඉටු කර දීම සඳහා අල්හසන් අල්බසරී තුමා ඔහුගේ මිතුරන්ගෙන් පිරිසක් එව්වේය. එවිට එතුමා ඔවුනට: 'නුඹලා අස්සාබිත් අල්බුනානි සමග යන්න. ඔබ සමග ඔහුව ද කැටුවාගෙන යන්න. යැයි පැවසුවේය. එවිට ඔවුහු සාබිත් වෙත පැමිණියෝය. එවිට ඔහු: 'මම ඉඃතිකාෆ් (මස්ජිදයේ රැඳී සිටිමි)' යැයි පැවසීය. පසුව ඔවුන් හසන් වෙත නැවත පැමිණ ඔහු ගැන තොරතුරු පවසා සිටියෝය. එවිට ඔහු: 'නුඹලා ඔහුට ගිහින් කියන්න: අහෝ අඃමෂ් ඔබේ සහෝදර මුස්ලිම්වරයාගේ අවශ්‍යතාවක් සඳහා ඔබ ගමන් කළේ නම් එය ඔබට හජ් වන්දනාවකින් පසුව තවත් හජ් වන්දනාවක් ඉටු කිරීමට වඩා ශ්‍රේෂ්ඨ වන බව ඔබ නොදන්නෙහිදැ?යි

258. අහ්මද් (4/420), අබූ දාවූද් (4880). අෂ්-ෂෙයික් අල් අල්බානී තුමා 'සහීහ් අල් ජාමිඃ'හි (7984) මෙය සහීහ් ගණයට අයත් හදීසයක් බව පවසයි.

259. තිර්මිදි (2032), මෙම පාඩම තුළ එම අර්ථයෙන් යුත් හදීස් ඉමාම් සව්බාන්, අල් බරා, බුරෙයිදා සහ අබ්දුල්ලාහ් ඉබ්නු අබ්බාස් යන අය විසින් වාර්තා කර ඇත.

ඔහුගෙන් විමසා සිටින්නැ?යි පවසා සිටියහ. එවිට ඔවුහු සාබිත් වෙත නැවත ගියෝය. පසුව ඔහු ඔහුගේ ඉඃතිකාෆයෙන් මිදී ඔවුන් සමග පිටත්ව යන්නට විය.

අබූ බක්ර් සිද්දීක් (රළියල්ලාහු අන්හු) තුමා අසල් වැසියන් සඳහා ඔවුන්ගේ එළුවන්ගෙන් කිරි දොවන්නෙකු විය. ඔහු කලීෆා ධූරයට පත්වූ කල්හි ඔවුන් අතර සිටි කාන්තාවක්. දැන් ඔහු ඒවායින් කිරි දොවන්නේ නැත! යැයි පවසා සිටියාය. එවිට අබූ බක්ර් තුමා: "එසේය. මා කවර කරුණක් තුළ ප්‍රවේශ වූයේ ද එවැන්නක් මා සිදු කරමින් සිටි කිසිවකින් වෙනස් නොකළ යුතු යැයි මම අපේක්ෂා කරමි" යැයි හෝ වෙනත් පද පෙළකින් හෝ පවසා ඇත්තාහ.

ඔවුහු එසේ කිරි දොවමින් සිටියේ සැබැවින්ම අරාබිවරුන් අතර කාන්තාවන් කිරි දොවන කටයුතු වල නිරත නොවූ බැවිනි. එය ඉතා අශීලාචාර දෙයක් ලෙස සැලකූහ. පිරිමි පාර්ෂවය නැති වූ විට තමන් වෙනුවෙන් කිරි දොවන්නට කාන්තාවන්ට අවශ්‍ය විය.

උමර් තුමා වැන්දඹු කාන්තාවන් රැකබලා ගන්නෙකු වූහ. රාත්‍රියේ ඔවුනට ජලය ගෙනැවිත් දෙයි. එවන් එක් කාන්තාවකගේ නිවසට එතුමා පිවිසෙනු දුටු තල්හා තුමා ඇය වෙත දහවල් කාලයේ ගියේය. ඇය ඇස් නොපෙනෙන එක්තැන් වූ මැහැලිලියක් වූවාය. පසුව ඔහු ඇයගෙන්: ඔබ ළඟ මේ මිනිසා කුමක් කරන්නේදැ?යි විමසා සිටියේය. ඇය: 'මේ මේ දේට පෙර මට දුන් ප්‍රතිඥාවකි මෙය. මට යහපත කරන්නට ඔහු මා වෙත පැමිණෙයි. කිලිටි මගෙන් බැහැර කරයි." යනුවෙන් පැවසුවාය.

අබූ වාඉල්[260] තුමා අසල්වැසි කාන්තාවන් හා ඔවුන් අතර සිටින මැහැල්ලියන් අතර සෑම දිනකම සැරිසරන්නෙකු විය. ඔවුනට අවශ්‍ය වන දෑ හා ඔවුනට සෙත සලසන දෑ මිලට ගෙනැවිත් දුන්නේය.

260. අබූ වාඉල්: ඔහු ඉබ්නු සල්මාගේ එකසුපන් සහෝදරයා වෙයි. තාබිඊන් අතර ප්‍රධානියෙකි. ඔහු නබි (ﷺ) තුමාණන් නුදුටුව ද ඔහුගේ කාලයේ ඔහු හිඳ ඇත. අබූ බක්ර් තුමා හැර සෙසු කලීෆාවරුන් සමග කතා කර ඇත. එතුමා සමගත් කතා කළ බව සඳහන් වී ඇත. ජනයා අතර ඉබ්නු මස්ඌද් තුමාගේ හදීස් පිළිබඳ වඩාත් දැනුමැත්තෙකු විය. හිජ්රි සියය ලැබීමට පෙර මිය ගියේය. ඉමාම් දහබී මෙසේ

මුජාහිද් තුමා මෙසේ පවසයි: "ගමනක දී ඉබ්නු උමර් තුමාට සේවය කිරීම සඳහා මම පැමිණියෙමි. එවිට එතුමා මට සේවය කරන්නෙකු විය."!

දැහැමියන් අතරින් බහුතරයක් දෙනා ගමනේදී තම මිතුරන් හට උදව් කරන බවට කොන්දේසි පනවන්නන් වූහ.

***

"කවරෙකු දැනුම සොයමින් මාර්ගයක ගමන් කරන්නේ ද එමගින් ස්වර්ගය වෙත වූ මාර්ගය අල්ලාහ් ඔහුට පහසු කරනු ඇත" යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

දැනුම සෙවීම සඳහා මාර්ගයේ ගමන් කිරීම යන කාරණාව තුළ (භෞතික වශයෙන්) නියම මාර්ගයේ ගමන් කිරීම ඇතුළත් වන්නේය: එනම් විද්වතුන්ගේ සභාවන් වෙත පාගමනින් යාමයි. එමෙන්ම දැනුම ලබන්නට අවශ්‍ය මාධ්‍යයන් මත ගමන් කිරීම ද ඇතුළත් වන්නේය. උදාහරණ ලෙස එය කට පාඩම් කිරීම, අධ්‍යයනය කිරීම, සාකච්ඡා කිරීම, ආවර්ජනය කිරීම, ලිවීම, අවබෝධ කර ගැනීම යනාදිය පෙන්වා දිය හැක. මෙවන් දෑ දැනුම ලබන්නට මාධ්‍යයන් ලෙස පිහිටන භෞතික මාර්ග වන්නේය.

***

"එමගින් ස්වර්ගය වෙත වූ මාර්ගය අල්ලාහ් ඔහුට පහසු කරනු ඇත" යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

එමගින් අපේක්ෂා කරනු ලබනුයේ: සැබැවින්ම අල්ලාහ් දැනුම සොයන්නාට ඒ සඳහා පහසුකම් සලසනු ඇත. එය පහසු කරනු ඇත යන්නයි. සැබැවින්ම දැනුම ස්වර්ගය වෙත සේන්දු කරවන මාර්ගයකි. තවදුරටත් ඉන් අපේක්ෂා කරනු ලබනුයේ: දැනුම සොයන ශිෂ්‍යකු අල්ලාහ්ගේ තෘප්තිය බලාපොරොත්තු වූ විට එයින් ප්‍රයෝජනය ලබන්නටත් ඒ අනුව කටයුතු

---

පවසයි: 'මේ නායකයා දැනුමෙහි හා ක්‍රියාවෙහි සිරස ලෙස වැජඹුණහ' යැයි මම පවසා සිටිමි. බලන්න: 'අස්-සෙයිර්' (4/161)

කිරීමටත් අල්ලාහ් ඔහුට පහසු කරනු ඇත. එය ඔහුට යහමග ලැබීමට හා ස්වර්ගයට පිවිසීමට හේතුවක් වන්නේය.

දැනුම සොයන්නාට එමගින් ප්‍රයෝජන ලබන වෙනත් දැනුම් සම්භාරයක්ද ලබා ගන්නට අල්ලාහ් පහසු කරන අතර එය ඔහුට ස්වර්ගය වෙත සේන්දු කරවන මාධ්‍යයක් වන්නේය.

එම ප්‍රකාශයට අතුළත් වන තවත් කරුණක් වන්නේ මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ස්වර්ගයේ මාර්ගය පහසු කිරීම යන්නයි. එනම් අස්සිරාත් පාළම ඊට පෙර හා පසු ඇතිවන අර්බුධයන් වැනි දෑය.

අල්ලාහ් හඳුනා ගැනීමටත් ඔහුගේ තෘප්තිය ලඟා කර ගන්නටත් ඔහුට සමීප වී ජය ලබන්නටත් මතුලොව තරණයට කිරීමටත් ප්‍රයෝජනවත් දැනුමෙන් මිස වෙනත් මාර්ගයක් නැත. එය අල්ලාහ් කවර කරුණක් සමග තම දූතයාණන් එව්වේ ද එමෙන්ම කවර කරුණක් තම පුස්තකයේ පහළ කළේ ද එම මාර්ගයයයි.

***

“අල්ලාහ්ගේ නිවෙස් අතරින් නිවසක පිරිසක් වාඩි වී අල්ලාහ්ගේ පුස්තකය කියවමින් ඔවුන් අතර එය අධ්‍යනය කරමින් වාඩි වී සිටින්නේ ද ඔවුන් වෙත සැනසුම පහළ වී ආශිර්වාදය ඔවුන් ආවරණය කර මලක්වරුන් ඔවුන් පිරිවරා සිටිනු මිස නැත. අල්ලාහ් ද ඔහු අබියස සිටින්නන් අතර ඔවුන් ගැන මෙනෙහි කරනු ඇත.” යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

කුර්ආනය කියවීමටත් එය අධ්‍යයනය කිරීමටත් මස්ජිද්වල වාඩි වී සිටීමේ උතුම් භාවය පෙන්වා දෙයි.

අල්ලාහ්ගේ නිවසේ වාඩි වී අල්ලාහ්ගේ කුර්ආනය අධ්‍යයනය කරන්නන්හට හිමි වන කොටස් හතරක් නබි (ﷺ) තුමාණන් මෙහි දී දන්වා ඇත.

පළමුවැන්න: ඔවුන් වෙත සකීනත් හෙවත් සැනසුම පහළ වීම

දෙවැන්න: ආශිර්වාදය ඔවුන් ආවරණය කිරීම “සැබැවින්ම අල්ලාහ්ගේ ආශිර්වාදය දැහැමියන්ට වඩාත් සමීපය” (සූරා අල් අඃරාෆ්: 56)

තුන්වැන්න: මලක්වරුන් ඔවුන් පිරිවරාගෙන සිටීම.

සිව්වැන්න: අල්ලාහ් තමන් අබියස සිටින්නන් අතර ඔවුන් ගැන මෙනෙහි කිරීම. අල්ලාහ් තම ගැත්තා පිළිබඳ මෙනෙහි කිරීම යනු: ඔහුගේ මලක්වරුන් අතර සිටින ප්‍රධාන මලක්වරුන් ඉදිරියේ ඔහු පැසසුමට ලක් කිරීම, ඔහු ගැන ඔවුන් සමග ආඩම්භරයෙන් කතා කිරීම, ඔහු සිහිපත් කරමින් ඔහු ගැන සැලකිල්ලක් දැක්වීමයි.

මෙම කරුණු හතර අල්ලාහ් මෙනෙහි කිරීම සඳහා ඒකරාශීවන සෑම කණ්ඩායමකටම හිමි වන්නේය.

***

"යහපත් ක්‍රියාවන්හි මන්දගාමී තැනැත්තා, ඔහුගේ (ඉහළ) පරම්පරාව ඔහුට ඉදිරියට යාමට ඉඩ නොදේ." යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

එහි අර්ථය: ගැත්තෙකුහට මතුලොව තරාතිරම් ලඟා කරවන ක්‍රියාවයි. එහෙයින් උත්තරීතර අල්ලාහ් අබියස උසස් තරාතිරම් වෙත ළඟා කරවන එම ක්‍රියාවන්හි මන්දගාමී තැනැත්තා, ඔහුගේ පරපුර ඉදිරියට පැමිණ එම තරාතිරම් ඔහුට ලඟා කරවිය නොහැක. සැබැවින්ම අල්ලාහ් ප්‍රතිඵල සැලසුම් කර ඇත්තේ ක්‍රියාවන් මත පදනම් කරමින් මිස පරම්පරාව මත පදනම් කරමින් නොවේ. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. "(පරමාන්ත දිනය සඳහා) සූරා පිඹිනු ලැබූ විට එදින ඔවුන් අතර ඥාති සබඳතාවන් නොමැත. තවද ඔවුහු එකිනෙකා (තොරතුරු) විමසා නොගන්නෝය." (සූරා අල් මුඃමිනූන්: 101)

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලද හදීසයක් බුහාරි හා මුස්ලිම්හි මෙසේ සඳහන් වී ඇත. "ඔබේ සමීප ඥාතීන්හට අවවාද කරන්න" යන සූරා අෂ්-ෂුඅරාහි 214 වන පාඨය පහළ කරනු ලැබූ අවස්ථාවේ අල්ලාහ්ගේ දූතයාණන් මෙසේ ප්‍රකාශ කළහ. "අහෝ කුරෙය්ෂ් ජනයිනි, ඔබ ඔබගේ ආත්මාවන් අල්ලාහ්ගෙන් මිලට ගන්න. අල්ලාගෙන් වූ කිසිවක් ඔබගෙන් ඉවත් කිරීමට මට හැකියාවක් නැත. අහෝ! අබ්බාස් ඉබ්නු අබ්දුල් මුත්තලිබ්, අල්ලාගෙන් වූ කිසිවක් ඔබගෙන් ඉවත් කිරීමට මට හැකියාවක් නැත. අහෝ! අල්ලාගේ දූතයාණන්ගේ නැන්දනිය වූ සෆිය්යා, අල්ලාහ්ගෙන්

වූ කිසිවක් ඔබගෙන් ඉවත් කිරීමට මට හැකියාවක් නැත. අහෝ! මුහම්මද්ගේ දියණිය ෆාතිමා, ඔබ කැමති දෑ මගෙන් ඉල්ලන්න නමුත් අල්ලාහ්ගෙන් වූ කිසිවක් ඔබෙන් ඉවත් කිරීමට හැකියාවක් නැත.[261]

මෙයට සාක්ෂි වශයෙන් අම්ර් ඉබ්නු අල් ආස් විසින් වාර්තා කළ හදීසයක් බුහාරි හා මුස්ලිම්හි මෙසේ සඳහන් වී ඇත. සැබැවින්ම එතුමා නබි (ﷺ) කළ ප්‍රකාශයකට තමන් සවන් දුන් බව පවසමින්: “සැබැවින්ම මාගේ පියාගේ පරම්පරාව මට හිතවතුන් නොවෙති. සැබැවින්ම මාගේ හිතවතුන් වනුයේ අල්ලාහ් හා දැහැමි මුඃමින්වරුන්ය.”[262] සැබැවින්ම ඔහුගේ හිතවත්කම කෙතරම් සමීප වුව ද පරම්පරාව තුළින් ඇති කර ගන්නක් නොවන බවත් එය ලබා ගත හැක්කේ දේව විශ්වාසය හා දැහැමි ක්‍රියාවන් තුළින් බවත් පෙන්වා දී ඇත. එහෙයින් කවරෙකු දේව විශ්වාසයෙන් හා ක්‍රියාවෙන් පූර්ණවත් අයකු වූයේ ද ඔහුය ඔහුට වඩාත් සමීපතයා වන්නේ. ඔහු ඔහුට සමීප ඥාතියෙකු හෝ එසේ නොවන්නට හෝ පුළුවන.

එම අර්ථයෙන් ඇතැමුන් මෙසේ පවසා ඇත:
සැබැවින්ම! මිනිසාට ඔහුගේ දහමින් තොර කිසිවක් නැත.
සමීපතයින් මත යැපී ඔබ ශ්‍රද්ධාව අත නොහරින්න.
ඉස්ලාම් සල්මාන් ෆාරිස් ව ඔසවා තැබීය.
ආදේශ තැබීම අභාග්‍යවන්ත අබූ ලහබ් පහත් කළේය.

***

261. බුහාරි (4771), මුස්ලිම් (206)
262. බුහාරි (5990), මුස්ලිම් (215)

## الحَدِيْثُ السَّابِعُ والثَّلاثُوْنَ

## තිස් හත් වන හදීසය

عَنِ ابْنِ عَبَّاسٍ رَضِيَ اللهُ عَنْهُمَا عَنْ رَسُولِ اللهِ ﷺ فِيمَا يَرْوِي عَنْ رَبِّهِ تَبَارَكَ وَتَعَالَى قَالَ:

"إِنَّ اللهَ كَتَبَ الْحَسنَاتِ وَالسَّيِّئَاتِ ثُمَّ بَيَّنَ ذَلِكَ، فَمَنْ هَمَّ بِحَسنَةٍ فَلَمْ يَعْمَلْهَا كَتَبَهَا اللهُ عِنْدَهُ حَسنَةً كَامِلَةً، وَإِنْ هَمَّ بِهَا فَعَمِلَهَا كَتَبَهَا اللهُ عَزَّ وَجَلَّ عِنْدَهُ عَشْرَ حَسنَاتٍ إِلَى سَبْعِمِائَةِ ضِعْفٍ إِلَى أَضْعَافٍ كَثِيرَةٍ، وَإِنْ هَمَّ بِسَيِّئَةٍ فَلَمْ يَعْمَلْهَا كَتَبَهَا اللهُ عِنْدَهُ حَسنَةً كَامِلَةً، وَإِنْ هَمَّ بِهَا فَعَمِلَهَا كَتَبَهَا اللهُ سَيِّئَةً وَاحِدَةً"

رَوَاهُ الْبُخَارِيُّ وَمُسْلِمٌ.

උත්තරීතර උත්කෘෂ්ට තම පරමාධිපති පිළිබඳ අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) දන්වා සිටි බව ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරනු ලැබ ඇත.

සැබැවින්ම අල්ලාහ් යහකම් හා අයහකම් ලියා ඇත. පසුව ඔහු එය මෙසේ පැහැදිළි කළේය. කවරෙකු යම් යහකමක් කරන්නට අධිෂ්ඨාන කර එය ඔහු සිදු නොකළේ නම් අල්ලාහ් ඒ සඳහා පූර්ණ කුසලක් ඔහු අබියස ලියනු ඇත. ඔහු එය අධිෂ්ඨාන කර එය සිදු කළේ නම් කීර්තිමත් සර්වබලධාරී අල්ලාහ් ඔහු අබියස කුසල් දහයක් ලියන අතර එය හත්සිය වාරයකින් ද එය ද වාර ගණනාවකින් ද ගුණ කර ලියනු ඇත. එමෙන්ම ඔහු නපුරක් කරන්නට අධිෂ්ඨාන කර එය සිදු නොකළේ නම් අල්ලාහ් ඔහු අබියස පූර්ණ කුසලක් ලියනු ඇත. ඔහු එය අධිෂ්ඨාන කර පසුව එය සිදු කළේ නම් අල්ලාහ් එයට එක් පාපයක් පමණක් ලියනු ඇත.

මෙය බුහාරි හා මුස්ලිම් වාර්තා කොට ඇත.

***

මෙම හදීසය ඉබ්නු අබ්බාස් තුමාගේ වාර්තාවෙන් බුහාරි හා මුස්ලිම් යන ඉමාම්වරු විසින් පළ කර ඇත. මුස්ලිම්හි එන වාර්තාවෙහි එම හදීසය අවසානයේ අමතර ප්‍රකාශයක් සඳහන් වී ඇත. එනම්: 'එසේ නැතහොත් අල්ලාහ් එය මකා දමනු ඇත. විනාශ වී යන්නෙකු මිස අල්ලාහ් කෙරෙහි විනාශකාරී ක්‍රියාවක් කරන්නේම නැත.''යනුවෙනි.

මෙම අර්ථයෙන් යුත් හදීස් ගණනාවක්ම ඇත.

මෙම කරුණු පෙළ, යහකම් හා අයහකම් සටහන් කිරීම මෙන්ම යහකම් හා අයහකම් ගැන අධිෂ්ඨාන කිරීම යනාදී කරුණු අන්තර්ගත කොට ගෙන ඇත. ඒවා වර්ග හතරකි.

පළමු වර්ගය: යහකම් සිදු කිරීමයි. එම යහකම ඒ හා සමාන දහ ගුණයකින් ගුණ කරනු ලැබේ. එය වාර හත්සිය දක්වා ද ඊටත් වඩා අධික වාර ගණනයකින් ද ගුණ කරනු ලැබේ.

දෙවන වර්ගය. අයහකම් සිදු කිරීමයි. කිසිදු ගුණ කිරීමකින් තොරව ඒ හා සමාන අකුසලක් පමණක් ලියනු ලැබේ. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: "(විනිශ්චය දින) කවරෙකු යහපතක් ගෙන එන්නේ ද ඔහුට එය මෙන් දහ(ගුණ)යක් ඇත. තවද කවරෙකු අයහපතක් ගෙන එන්නේ ද එවැන්නක් (පමණක්) මිස ප්‍රතිවිපාක වශයෙන් දෙනු නොලැබේ. තවද ඔවුනට අසාධාරණයක් සිදු කරනු නොලබති." (සූරා අල් අන්ආම්: 160)

නමුත් අයහකම කාලයේ හෝ ස්ථානයේ ගෞරවය හා මහිමය අනුව ඇතැම් විට මහත් විය හැක. සහාබාවරුන් අතර පිරිසක් හරම් සීමාව තුළ වාසය කිරීමෙන් වැළකී සිටියහ. එය එහිදී වැරදි සිදුවීමට ඇති බියෙනි. ඉබ්නු අබ්බාස්, අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් ඉබ්නු ආස් යන සහාබාවරුන් ද ඔවුන් අතර වූහ. උමර් ඉබ්නු අබ්දුල් අසීස් තුමා ද එලෙස කටයුතු කර ඇත්තාහ.

ඉස්හාක් ඉබ්නු මන්සූර් තුමා මෙසේ පවසයි: එම හදීසයේ කරුණක් සම්බන්ධයෙන් මම අහ්මද් තුමා සමග කතා කළෙමි. එහිදී: 'සැබැවින්ම

අයහකමට එකකට වඩා වැඩියෙන් ලියනු ලබන්නේදැ?යි විමසුවෙමි. එතුමා: නැත, මක්කාවේ මිස එසේ අපි අසා නැත්තෙමු. එය එම නගරය ගෞරවය කිරීම සඳහා විය.'' අහ්මද් තුමා පැවසුවාක් මෙන්ම ඉස්හාක් ඉබ්නු රාහවීහ් ද පවසා ඇත.

තුන්වන වර්ගය: යහකම් කිරීමට අධිෂ්ඨාන කිරීමයි. එවිට එය සිදු නොකළ ද පූර්ණ යහපතක් ලියනු ලැබේ. ඉබ්නු අබ්බාස් තුමාගේ හදීසයක හා හුරෙයිම් ඉබ්නු ෆාතික්ගේ හදීසයක මෙසේ සඳහන් වෙයි. 'කවරෙකු යහකමක් කිරීමට අධිෂ්ඨාන කර එය ඉටු නොකළේ නම් සැබැවින් ඔහු එය හදවතට හඟවා ඇති බවත් ඒ කෙරෙහි දැඩි ආශාවෙන් සිටි බවත් අල්ලාහ් දැන සිටියි. ඔහුට යහපතක් ලියනු ලබනු ඇත.''[263] සැබැවින්ම අධිෂ්ඨානය යනුවෙන් අදහස් කරනුයේ: ක්‍රියාව මත දැඩි ආශාවක් දැකිය හැකි සැලසුම් සහගත අධිෂ්ඨානය බව මෙහිදී පෙන්වා දී ඇත. එය සිදු වූ වහාම ඇතිවන්නක් නොවේ. ස්ථිරභාවයක් හෝ සැලසුමක් නොමැති වීමෙන් එය අහෝසි වී යනු ඇත.

අධිෂ්ඨානය සමග ප්‍රකාශය හෝ ශ්‍රමය ඒකාබද්ධ වූ විට ප්‍රතිඵල ස්ථිර වන්නේය. අදාළ පුද්ගලයා කටයුතු කරන්නා සමග එකතු වන්නේය. නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බවට අබූ කබෂා තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. ''සැබැවින්ම මෙලොව පුද්ගලයින් සිව් දෙනෙකු සතුය. ධනයෙන් හා දැනුමෙන් අල්ලාහ් පෝෂණය කළ ගැත්තා. ඔහු එහි දී තම පරමාධිපතිට භක්තිමත්ව කටයුතු කරයි. එමගින් තම ඥාතී සම්බන්ධකම් පවත්වාගෙන යයි. එහි දී උරුමය අල්ලාහ් සතු බව දනී. .තරාතිරමින් වඩාත් උසස් වනුයේ ඔහුය. අල්ලාහ් ධනයෙන් පෝෂණය නොකර දැනුමෙන් පෝෂණය කළ ගැත්තා ඔහු සැබෑ අධිෂ්ඨානයෙන් යුතුව: සැබැවින්ම මට ධනය ඇත්නම් මේ පුද්ගලයාගේ ක්‍රියාව මෙන් මම ද ඉටු කරමි යැයි පවසයි. ඔහු ද එම චේතනාවෙන්ම පසුවෙයි. ඔවුන් දෙදෙනාගේම කුසල් සමානය. අල්ලාහ් දැනුමෙන් පෝෂණය නොකර ධනයෙන් පෝෂණය කළ ගැත්තා: කිසිදු දැනුමකින් තොරව ඔහුගේ ධනය ඔහු ගසා කයි. එහිදී ඔහුගේ පරමාධිපතිට බිය නොවෙයි. එහිදී ඔහු තම ඥාතීන් සමග සම්බන්ධකම් නොපවත්වයි. එහිදී උරුමය අල්ලාහ් සතු බව හඳුනා නොගනී. තරාතිරමෙන් වඩාත් නපුරුම

263. අහ්මද් (4/322), ඉබ්නු හිබ්බාන් (6171)

වන්නේ ඔහුය. දැනුමෙන් හෝ ධනයෙන් අල්ලාහ් පෝෂණය නොකළ ගැත්තා: ඔහු මෙසේ පවසයි: සැබැවින්ම මට ධනය ඇත්නම් මෙම පුද්ගලයාගේ ක්‍රියාව මමද කරමි යැයි පවසයි. ඔහු එම චේතනාවෙන්ම පසුවෙයි. ඔවුන් දෙදෙනාගේ පව්බර සමානය.'' මෙය අහ්මද්, තිර්මිදි හා ඉබ්නු මාජා යන ඉමාම්වරු විසින් පළ කර ඇත.[264]

"ඒ දෙදෙනාම ප්‍රතිඵල විෂයයෙහි එක සමානය'' යන නබි තුමාගේ ප්‍රකාශය කිසිදු ගුණ කිරීමකින් තොරව ක්‍රියාව සතු ප්‍රතිඵලයේ පදනමින්ම ඒ දෙදෙනාම එකම ස්ථාවරයක සිටින බව දරණු ඇත. ගුණ කිරීම නියම වනුයේ එම ක්‍රියාව සිදු කරන්නාටය. එය අධිෂ්ඨානය කර සිදු නොකළ තැනැත්තාට හිමි වන්නේ නැත. නමුත් සැබැවින්ම ඒ දෙක සෑම අතකින්ම සමානව පවතින්නේ නම් යහකමක් අධිෂ්ඨාන කර එය සිදු නොකළ කෙනාට ද කුසල් දහයක් හිමි වනු ඇත. එය සියලුම ප්‍රකාශවලට පටහැනිය.

සිව්වැනි වර්ගය: නපුරුකම් කිරීමට අධිෂ්ඨාන කොට ඒ සඳහා කිසිදු ක්‍රියාවක් නොකිරීමය. ඉබ්නු අබ්බාස් තුමාගේ හදීසයේ සඳහන්ව ඇත්තේ සැබැවින්ම ඒ සඳහා පූර්ණ කුසලක් හිමිවනු ඇතැයි යන්නයි. නමුත් අබූ හුරෙය්රා තුමාගේ හදීසයේ සඳහන්ව ඇත්තේ: 'සැබැවින්ම ඔහු එය අත හරිනුයේ මා වෙනුවෙනි'' යනුවෙනි. ඔහු අධිෂ්ඨාන කළ පාපකම් සිදු කිරීමට හැකියාව ඇත්තා අල්ලාහ් වෙනුවෙන් එය අතහැර දමන්නේ නම් කිසිදු සැකයකින් තොරව ඒ හේතුවෙන් ඔහුට කුසලක් සටහන් කරනු ලබන බව පෙන්වා දී ඇත. ඊට හේතුව සැබැවින්ම පාපකමක් ඔහු අතහැරීම දැහැමි ක්‍රියාවක් වන බැවිනි.

පාපයක් කිරීමට අධිෂ්ඨාන කර පසුව මිනිසුනට බියෙන් හෝ ඔවුන්ගේ අවධානය දිනා ගැනීමට හෝ එය අතහැර දැමීම වනාහි: ඇත්තෙන්ම මෙම චේතනාවෙන් එය අතහැර දැමීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවක් බව පවසනු ලැබ ඇත. ඊට හේතුව අල්ලාහ් පිළිබඳ පවතින බියට වඩා මැවීම් පිළිබඳ ඇති බියට මුල්තැන දීම තහනම් කරනු ලැබූවක් බැවිනි. එලෙසම මැවීම්වල අවධානය දිනා ගැනීමේ අරමුණ ද තහනම් කරන ලද්දකි. එවැනි කරුණක්

264. අහ්මද් (4/230), තිර්මිදි (2325), ඉබ්නු මාජා (4228). මෙය හසන් සහීහ් ගණයට අයත් හදීසයක් බව ඉමාම් තිර්මිදි තුමා ප්‍රකාශ කර ඇත.

වෙනුවෙන් පාපය අතහැර දැමීම සමග එම චේතනාව මුසු වූ විට දඬුවම් ලබනු ඇත.

(එමෙන්ම පාපකමක් අධිෂ්ඨාන කර) ඔහුට ලැබෙන අවස්ථාවෙන් එය සිදු කරන්නට උත්සාහ කොට පසුව ඔහු හා ඒ අතරට පෙරනියමය පැමිණියේ නම්, ඒ අවස්ථාවේදීත් සැබැවින්ම ඔහු ඒ සඳහා දඬුවමට ලක්වන බව පිරිසක් සඳහන් කර ඇත. එය නබි තුමාණන්ගේ ප්‍රකාශයක් පදනම් කර ගනිමිනි. එනම්: 'සැබැවින්ම අල්ලාහ් මාගේ සමූහයාට ඔවුන්ගේ සිත් කවර කරුණක් කොඳුරන්නේ ද එය ඔවුන් කතා කරන තෙක් හෝ ක්‍රියා කරන තෙක් එය නොසළකා හරින්නේය.''[265] කවරෙකු එම පාපය සිදු කරන්නට තම උත්සාහය යොදවා පසුව ඔහු එයට අසමත් වූයේද සැබැවින්ම ඔහු එය සිදු කළ අයකු මෙනි. නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශයක් සඳහන්ව ඇත්තේ ද එලෙසමය. 'මුස්ලිම්වරුන් දෙදෙනෙකු තම අසිපත්වලින් මුණ ගැසුණු විට, ඝාතනය කරන්නා හා ඝාතනය කරනු ලබන්නා යන දෙදෙනාම නිරයේ වෙති යැයි පවසා සිටියහ. එවිට ඔවුහු අල්ලාහ්ගේ දූතයාණනි, මෙය ඝාතකයාය. ඝාතනය කරනු ලැබූ පුද්ගලයාගේ තත්ත්වය කෙසේ විය හැකිදැයි විමසා සිටියෝය. එවිට එතුමා: ඔහු ද තම සහෝදරයා ඝාතනය කිරීමේ ආශාවෙන් සිටි අයෙකි' යැයි පැවසූහ.[266]

කිසිදු හේතුවකින් තොරව ඔහුගේ චේතනාව බිඳී ඔහුගේ දැඩි ස්ථාවරත්වය නිවී ගිය විට ඔහු අධිෂ්ඨාන කළ පාපය සඳහා දඬුවම් කරනු ලබන්නේ ද නැද්ද යන කරුණ වානාහි: එය කොටස් දෙකක් මත පවතී.

ඒවායින් පළමුවැන්න: ඔහුගේ අධිෂ්ඨානය අවධානම් සහිත වීම. අදාළ පුද්ගලයා එම චේතනාව සමග ජීවත් නොවී ඔහුගේ හදවත සමග එය සම්බන්ධ නොකොට, එය පිළිකුල් කර එයින් දුරස් වීම. මෙය සමාව දෙනු ලබන්නක් වන්නේය. එය නබි (ﷺ) තුමාණන්ගෙන් විමසා සිටියා වූ කුතුහලයන්ට සමානය. එවිට එතුමා: එය ඊමානයේ විනිවිදභාවය[267] යැයි පැවසූහ.

265. බුහාරි (5269), මුස්ලිම් (127).
266. බුහාරි (31), මුස්ලිම් (2888).
267. මුස්ලිම් (126)

දෙවැන්න: සිත් තුළ පතිත වන උඩුදුවන අදාළ පුද්ගලයා ඒ සමගම ජීවත් වන දැඩි අධිෂ්ඨානයයි. එදය වර්ග දෙකකි.

පළමුවැන්න: තම හදවතෙහි ක්‍රියාකාරිත්වය තුළ තමන්ට පමණක් ආවේනික වූ ක්‍රියාවක් වීම. උදාහරණ වශයෙන් ඒකීයත්වය හෝ නබිත්වය හෝ යළි නැගිටුවනු ලැබීම යනාදී දේව ප්‍රතික්ෂේපය හා කුහකත්වය සමග බැඳෙන සැක පෙන්වා දිය හැක. එය ගැත්තා දඬුවමට ලක් කරනු ඇත. එමගින් ඔහු දේව ප්‍රතික්ෂේපකයකු හෝ කුහකයකු වන්නේය.

අල්ලාහ් වෛර කරන දෙයකට ආදරය කිරීම ඔහු ආදරය කරන දෙයකට වෛර කිරීම අහංකාර හා පුහුමාන්නය යනාදී හදවත හා බැඳුනු සෙසු පාපකම් ද මෙම කොටසට එකතු කරනු ලැබේ.

දෙවන වර්ගය: එය හදවත හා බැඳුණු ක්‍රියාවක් නොවී, දුරාචාරය, සොරකම, මත්පානය, ඝාතනය, අවළාද නැගීම යනාදී ශරීර අවයව හා බැඳුණු ක්‍රියාවක් වීම. ඒ ගැන දැඩි අධිෂ්ඨානයෙන් හා චේතනාවෙන් ගැත්තා පසුවන විට ඒ සම්බන්ධයෙන් උපුටා ගන්නා ලද විද්වතුන්ගේ ප්‍රකාශ දෙකක් පවතී.

පළමුවැන්න: ඔහු වරදකරුවකු ලෙස ගනු ලැබේ. ආගමික නීතිවේදීන් හා හදීස් විශාරදයින් මෙන්ම අපගේ මිතුරන් අතරින් කතිකයින් බොහෝ දෙනා මෙම ප්‍රකාශය නිවැරැදි යැයි පවසා ඇත. ඒ සඳහා සාධක ලෙස අල්ලාහ්ගේ ප්‍රකාශ සමහරක් ඉදිරිපත් කර ඇත. එනම් “ඔවුන්ගේ හදවත් ඉපැයූ දැයින් ඔහු ඔවුන් ග්‍රහණය කරනු ඇත. (සූරා අල් බකරා:225) “සැබැවින්ම අල්ලාහ් නුඹලාගේ සිත් තුළ ඇති දෑ පිළිබඳව දන්නා බව නුඹලා දැන ගනු. එහෙයින් එයින් නුඹලා ප්‍රවේසම් වනු.” (සූරා අල් බකරා 235) එමෙන්ම “පාපය යනු තම හදවත තුළ කකියන මෙන්ම මිනිසුන් ඒ දෙස යොමුවීම ඔබ පිළිකුල් කරන දෑය.”[268] යනාදී නබිතුමාණන්ගේ ඇතැම් ප්‍රකාශ ද ඉදිරිපත් කර ඇත. තවද ඔවුහු “සැබැවින්ම අල්ලාහ් මාගේ සමූහයාට ඔවුන්ගේ සිත් කවර කරුණක් කොඳුරන්නේ ද එය ඔවුන් කතා කරන තෙක් හෝ ක්‍රියා කරන තෙක් එය නොසළකා හරින්නේය.”[269] යන එතුමාණන්ගේ ප්‍රකාශය අවධානමක් ලෙස ගෙන ඇත. ඔවුහු: කවර චේතනාවක් සමග ගැත්තා ජීවත්

268. ‘අල් අර්බඊන අන්-නවවි’ හි 26 වන හදීසය.

269. මෙය ඉහතින් සඳහන් කළ පරිදි බුහාරි හා මුස්ලිම්හි සඳහන් හදීසයකි.

වන්නේ ද ඔහුගේ සිත ඒ සමග බැඳී පවතින්නේ ද එය ඔහු ඉපැයූ හා ක්‍රියා කළ දෑ අතරට පත්වේ. ඒ සඳහා සමා කරනු ලබන්නේ නැත.

ඔවුන්ගෙන් ඇතැමෙකු: දුක්කම්කටොලු හා කරදර මගින් ඔහු මෙලොවෙහි දඬුවමට ලක්කරනු ලැබේ. තවත් ප්‍රකාශයක මළවුන් කෙරෙන් නැගිටවනු ලබන දිනයේ ගැත්තා විභාග කරනු ලැබේ. අල්ලාහ් තමන් ඉදිරියේ සීරුවෙන් තබා පසුව ඔහුට සමාව දෙනු ඇත. ඒ සම්බන්ධයෙන් දඬුවම් නොකරනු ඇත. ඔහුගේ දඬුවම විභාග කිරීමකි. - මෙ ඉබ්නු ජරීර්ගේ තේරීමයි-

දෙවන ප්‍රකාශය: චේතනා කළ වහාම වරදකරුවකු ලෙස ගනු නොලබන්නේය. එය ෂාෆි තුමාගේ කියමනට උපටා දක්වයි. අපගේ මිත්‍ර ඉබ්නු හාමිද්ගේ ප්‍රකාශය ද එයමය. එය සාමාන්‍ය ක්‍රියාදාමයක් වශයෙනි.

***

මුස්ලිම්හි සඳහන් හදීසයේ “එසේ නැතහොත් අල්ලාහ් එය මකා දමනු ඇත.” යන ප්‍රකාශය වනාහි:

සැබැවින්ම නපුරු ක්‍රියාව එය සිදු කරන්නාහට එක් පාපයක් පමණක් ලියනු ලබනු ඇත. එසේ නැතිනම් අල්ලාහ් තමන්ට අභිමත කරන පරිදි තව්බාව, සමාව අයැද සිටීම, දැහැමි ක්‍රියාවන් යනාදී කරුණු හේතුකොටගෙන ඒවාට සමාව දෙනු ඇත.

***

“විනාශ වී යන්නෙකු මිස අල්ලාහ් කෙරෙහි විනාශකාරී ක්‍රියාවක් කරන්නේම නැත.” යන ප්‍රකාශය වනාහි:

යහ ප්‍රතිඵල ගුණකර දීමෙන් හා පාපකම් නොසලකා හැරීමෙන් අල්ලාහ්ගෙන් වූ මේ මහත් දායාදයෙන් හා ඔහුගෙන් වූ විශාල ආශිර්වාදයෙන් පසුව විනාශ වී යන, පාපකම් සිදු කරන, යහකම් කිරීමෙන් ඉවත් වන හා එය පිටු දකින කෙනෙකු මිස අල්ලාහ් කෙරෙහි විනාශකාරී ක්‍රියාවක් කරන්නේ නැත.

එබැවින් ඉබ්නු මස්ඌද් තුමා මෙසේ පවසා ඇත: ''ඔහුගේ කරුණු දහය මත ඔහුගේ එක් කරුණ ඉක්මවා ගිය පුද්ගලයා විනාශ විය.''[270]

අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) ප්‍රකාශ කළ බව අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් තුමා විසින් ප්‍රකාශ කළ හදීසයක් ඉමාම් අහ්මද් අබූ දාවූද් අන්-නසාඊ තිර්මිදි යන ඉමාම්වරු විසින් මෙසේ පළ කර ඇත: ''සුහදශීලී කරුණු දෙකක් ඇත. ඒ දෙක ලබන පුද්ගලයා ස්වර්ගයට පිවිසෙනු මිස නැත. ඒ දෙක පහසුය. ඒ දෙක ක්‍රියාවට නංවන්නන් ස්වල්ප දෙනෙකි. එනම්: සෑම සලාතයකට පසුවම දස වාරයක් සුබ්හානල්ලාහ් යැයි තස්බීහ් පැවසීමත් දසවාරයක් අල්හම්දුලිල්ලාහ් යැයි තහ්මීද් පැවසීමත් දසවාරයක් අල්ලාහු අක්බර් යැයි තක්බීර් පැවසීමත්ය'' යැයි පවසා තවදුරටත් එතුමා: එය දිවෙන් පවසන එකසිය පනස් වාරයකි. තුළාවෙහි එකදාස් පන්සිය වාරයකි! ඔබ ඔබේ නිදියහනට ගිය විට සිය වාරයක් තස්බීහ් පවසන්න, තක්බීර් පවසන්න තහ්මීද් පවසන්න. එය දිවෙන් පවසන සිය වාරයකි. තුළාවෙහි එය දහස් වාරයකි!. එසේ නම් දහවලෙහි හා රාත්‍රියෙහි නුඹලාගෙන් කවර කෙනෙකු දෙදහස් පන්සිය වාරයක් වැරදි කරනු ඇත් ද?[271] ***

270. ඉන් අදහස් කරනුයේ: තම යහකම් (කරුණු දහය) මත තම පාපකම් (එක් කරුණ) ඉක්මවා ගිය තැනැත්තා පරාජිතයෙකු වන්නේය. ඔහුට විනාශය අත් වන්නේය. පාපකම්වලට එක් කරුණ යනුවෙන් නම් තබා ඇත්තේ පාපකමකට එක් අකුසලක් පමණක් ලියනු ලබන බැවිනි. එමෙන්ම යහකම්වලට කරුණු දහයක් යනුවෙන් නම් කර ඇත්තේ ඒ සඳහා එවැනි කුසල් දහයක් ලියනු ලබන බැවිනි.

271. අහ්මද් (2/120), අබූ දාවූද් (5065), තිර්මිදි (3410), නසාඊ (3/74). ඉමාම් තිර්මිදි මෙය හසන් සහීහ් ගණයට අයත් හදීසයක් බව සඳහන් කර ඇති අතර අෂ්-ෂෙයික් අල් අල්බානි 'සහීහ් අත්-තර්ගීබ් වත් තර්හීබ්'හි (606) සහීහ් ගණයට අයත් හදීසයක් බව සඳහන් කර ඇත.

සහාබාවරු නබි (ﷺ) තුමාණන්ගෙන් මෙසේ විමසා සිටියෝය: ඒ දෙක පහසු වන්නේ කෙසේද ඒ දෙක අඩුවෙන් කරන්නේ කවුරුන් ද? යැයි පවසා සිටියේය. එවිට එතුමා: ෂෙයිතාන් නුඹලාගෙන් කෙනෙකු වෙත ඔහුගේ සලාතයේ දී පැමිණෙයි. මේ මේ අවශ්‍යතා ඇති බව ඔහුට මෙනෙහි කරයි. නමුත් ඒ ගැන ඔහු කිසිවක් නොපවසයි. එමෙන්ම නිදා ගන්නා අවස්ථාවේ ද ඔහු වෙත පැමිණෙයි. පසුව ඔහු නිදා ගන්නට සළස්වයි. ඒ ගැන කිසිවක් නොපවසයි.' වාර්තා කරු : 'නබි (ﷺ) තුමාණන් ඒවා තම දෑතින් ගණන් කරනු මම දුටුවෙමි' යැයි වාර්තා කර ඇත.

## الحَدِيْثُ الثَّامِنُ والثَّلاثُوْنَ

## තිස් අට වන හදීසය

عَنْ أَبِي هُرَيْرَةَ رَضِيَ اللهُ عَنْهُ قَالَ: قَالَ رَسُولُ اللهِ ﷺ:

"إِنَّ اللهَ تَعَالَى قَالَ: مَنْ عَادَى لِي وَلِيًّا، فَقَدْ آذَنْتُهُ بِالْحَرْبِ وَمَا تَقَرَّبَ إِلَيَّ عَبْدِي بِشَيْءٍ أَحَبَّ إِلَيَّ مِمَّا افْتَرَضْتُ عَلَيْهِ، وَلَا يَزَالُ عَبْدِي يَتَقَرَّبُ إِلَيَّ بِالنَّوَافِلِ حَتَّى أُحِبَّهُ، فَإِذَا أَحْبَبْتُهُ، كُنْتُ سَمْعَهُ الَّذِي يَسْمَعُ بِهِ، وَبَصَرَهُ الَّذِي يُبْصِرُ بِهِ، وَيَدَهُ الَّتِي يَبْطِشُ بِهَا، وَرِجْلَهُ الَّتِي يَمْشِي بِهَا، وَلَئِنْ سَأَلَنِي لَأُعْطِيَنَّهُ، وَلَئِنِ اسْتَعَاذَنِي لَأُعِيذَنَّهُ."

رَوَاهُ الْبُخَارِيُّ.

අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) ප්‍රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී.

“නියත වශයෙන්ම උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා ඇත: ‘යමෙක් මාගේ වලි (මිතුරා) ට සතුරුකම් කරන්නේ නම්, මම ඔහුට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කරමි. මාගේ සේවකයා, ඔහුට පවරා ඇති ආගමික යුතුකම්වලට වඩා මට ආදරය කරන වෙනත් කිසිවකින් මා ළඟට ඔහු සමීප වන්නේ නැත. මා ඔහුට ප්‍රිය කරන තුරු මාගේ සේවකයා (අනිවාර්ය නොවන) අමතර ක්‍රියාවන් තුළින් මා වෙත සමීප වෙමින්ම සිටියි. මම ඔහුට ප්‍රිය කරන විට, ඔහු අසන ඔහුගේ ශ්‍රවණයත්, ඔහු දකින ඔහුගේ දර්ශනයත්, ඔහු දිගු හරින ඔහුගේ අතත් ඔහු ගමන් කරන ඔහුගේ පාදයත් මම වෙමි. ඔහු මගෙන් යමක් ඉල්ලා සිටියේ නම් මම එය ඔහුට දෙමි. ඔහු මාගෙන් සරණ පතන්නේ නම් මම ඔහුට රැකවරණය දෙමි.”

මෙය බුහාරි විසින් වාර්තා කර ඇත.

***

## -විග්‍රහය-

මෙම හදීසය ඉමාම් බුහාරි විසින් පමණක් වාර්තා කර ඇති අතර වෙනත් ගත් කතෘවරු වාර්තා කර නැත. අල්ලාහ්ගේ සමීපතයින් මෙනෙහි කිරීමේදී මෙය වඩාත් විශිෂ්ට හදීසයක් බව සඳහන් වේ.

***

"යමෙක් මාගේ වලි (මිතුරා) ට සතුරුකම් කරන්නේ නම්, මම ඔහුට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කරමි." යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

මිනිස් අදහස් කරනුයේ: 'යමෙකු මාගේ මිතුරන්හට සතුරුකම් කිරීම තුළින් මට විරුද්ධව සටන් කරන්නෙකු බවට පත් වීම නිසාවෙන් සැබැවින්ම මම ඔහු සමග සටන් කරන සටන්කාමියෙකු බවට පත් වන බව මම ඔහුට දන්වා සිටිමි' යන්නයි. අල්ලාහ්ගේ සතුරන් සමග විරුද්ධව කටයුතු කිරීම අනිවාර්යය වනවාක් සේම ඔවුන් සමග මිතුදම් පෑම තහනම් වනවාක් සේම ඔහුගේ සමීපතයින් සමග මිතුදම් පෑම අනිවාර්යය වන්නේය. ඔවුනට සතුරුකම් කිරීම තහනම් වන්නේය.

අල්ලාහ්ට පිටුපාන සියලුම පාපිෂ්ඨයින් ඔහු සමග සටන් කරන්නන් බව දැන ගත යුතුයි. එහෙයින් සැබැවින්ම කවරෙකු අල්ලාහ්ට පිටුපාන්නේ ද සැබැවින්ම ඔහු ඔහු සමග සටන් කරයි. නමුත් පාපකම් දරුණු වන සෑම අවස්ථාවකම අල්ලාහ්ට එරෙහිව සටන් කිරීම ද දරුණු වන්නේය. පොළිය අනුභව කරන්නන් මංකොල්ලකරුවන් අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් සමග සටන් කරන දෙපිරිසක් බව නම් කර ඇත්තේ එබැවිනි. එය ඔවුන් ඔහුගේ ගැත්තන්හට කරන අපරාධයේ හා ඔවුන් ඔහුගේ භූමියෙහි ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරීමේ දරුණු කම නිසාවෙනි. ඔහුගේ මිතුරන්හට සතුරුකම් පෑමත් එලෙසමය. ඔහුගේ මිතුරන්ට උදව් කිරීමේ භාරකාත්වය ඔහු දරා ඇත. ඔහු ඔවුනට ආදරය කරයි. ඔවුන්ව ශක්තිමත් කරයි. එහෙයින් කවරෙකු ඔවුනට සතුරුකම් පාන්නේ ද සැබැවින්ම ඔහු අල්ලාහ්ට සතුරුකම් පාන ඔහු සමග සටන් කර පුද්ගලයකු වන්නේය.

***

“මාගේ සේවකයා, ඔහුට පවරා ඇති ආගමික යුතුකම්වලට වඩා මට ආදරය කරන වෙනත් කිසිවකින් මා ළඟට ඔහු සමීප වන්නේ නැත. මා ඔහුට ප්‍රිය කරන තුරු මාගේ සේවකයා (අනිවාර්ය නොවන) අමතර ක්‍රියාවන් තුළින් මා වෙත සමීප වෙමින්ම සිටියි.” යන ප්‍රකාශය වනාහි:

සැබැවින්ම ඔහුගේ මිතුරන්ට විරුද්ධ වීම ඔහු සමග සටන් කිරීමක් බව මෙනෙහි කළ පසුව ඔවුන් සමග විරුද්ධ වීමට තහනම් මෙන්ම ඔවුන් සමග ඇසුරු කිරීමට අනිවාර්යය වූ ඔහුගේ මිතුරන් පිළිබඳ විස්තර මෙනෙහි කර ඇත. එමෙන්ම ඔහු වෙත සමීප වන දෑ ද මෙනෙහි කර ඇත.

මිතුදම් පෑමේ පදනම සමීපව කටයුතු කිරීමයි. සතුරුකමේ පදනම දුරස්ත වීමයි. අල්ලාහ්ගේ සමීපතයින් වනුයේ: ඔහු ඔවුන් වෙත සමීප වන කරුණු මගින් ඔහු වෙත සමීප වන්නට බලන ඔහුගේ මිතුරන්ය. ඔහුගේ සතුරන් වනුයේ: දුරස් කිරීමට හා නෙරපා හැරීමට අවැසි වන ක්‍රියාවන් මගින් ඔහුගෙන් දුරස් වී ගියවුන්ය.

අල්ලාහ්ගේ සමීපතම මිතුරන් කණ්ඩායම් දෙකකට බෙදේ.

එම කණ්ඩායම් දෙකින් පළමුවැනි කණ්ඩායම: අනිවාර්ය කටයුතු ඉටු කරමින් සමීප වන්නන්ය. අනිවාර්යය වගකීම් ඉටු කිරීම තහනම් කටයුතුවලින් වැළකී සිටීම යනාදිය එය ආවරණය කරයි. ඊට හේතුව මේ සියල්ල අල්ලාහ් තම ගැත්තන් හට අනිවාර්යය කළ ඔහුගේ ආගමික පිළිවෙත් අතරින් වන බැවිනි.

දෙවන කණ්ඩායම: අනිවාර්යය කටයුතු වලට අමතරව නවාෆිල් හෙවත් අතිරේක ක්‍රියාවන් තුළින් ඔහු වෙත සමීප වන්නන්ය.

මෙයින් මතු වන කරුණක් වනුයේ අල්ලාහ් වෙත සමීප වීමටත් ඔහුගේ භාරකාරත්වය යටතට පත් වීමටත් ඔහුගේ ආදරය හිමි කර ගැනීමටත් ඔහුගේ දූතයාණන් පවසා සිටි ආගමික පිළිවෙතට ඔහු යටත් වීමෙන් මිස වෙනත් මගක් නැත යන්නය. අල්ලාහ්ගේ භාරකාරත්වය, ඔහු වෙත සමීප වීම ඔහුගේ ආදරයට පත් වීම පිළිබඳ මෙම මාර්ගය හැර වෙනත් මගක් ඇති බව කවරෙකු වාද කරන්නේද සැබැවින්ම ඔහුගේ වාදයේ ඔහු බොරුකාරයකු බව පැහැදිලි

වන්නේය. එය දෙවියන්ට ආදේශ තබන්නන් අල්ලාහ් හැර වෙනත් දෑට නැමදුම් කරමින් ඔහු වෙත සමීපවන්නට බලන්නාක් මෙනි. උත්තරීතර අල්ලාහ් ඔවුන් ගැන මෙසේ පවසයි. “ඔවුන් අප අල්ලාහ් වෙත සමීප කරවීමට මිස අපි ඔවුන් නොනමදිමු” (අස්-සුමර් 3)[272] එමෙන්ම යුදෙව්වන් හා කිතුනුවන් පිළිබඳ පවසා සිටිය දී: ඔවුහු ඔහුගේ දූතයාණන් බොරුකරමින් ද ඔහු තහනම් කළ දෑ සිදුකරමින් ද ඔහු අනිවාර්යය කළ දෑ මගහරිමින් ද සිටිමින් “අපි අල්ලාහ්ගේ දරුවන්ය. තවද ඔහුගේ ප්‍රියතමයන්ය.” (අල්මාඉදා: 18) යැයි පවසා සිටියෝය.

එහෙයින් මෙම හදීසයේ අල්ලාහ්ගේ හිතමිතුරන් තරාතිරම් දෙකක් මත සිටින බව සිහිගන්වා ඇත.

පළමුවැන්න: අනිවාර්යය කටයුතු ඉටු කිරීම තුළින් සමීප වන්නන් මෙම නිලය අපේක්ෂා කරන්නන් දකුණු පස ජනයා වෙති.

දෙවැන්න: මුල් කාලීන සමීපතයින්ගේ නිලය. ඔවුහු අනිවාර්යය කටයුතු වල නිරත වීමෙන් පසුව ඊට අමතරව අතිරේක නැමදුම් කැපවීමෙන් යුතුව ඉටු කරමින් හා කුඩා වශයෙන් පිළිකුල් සහගත කරුණක් වුව ද ඉන් වැළකෙමින් අල්ලාහ් වෙත සමීපවූවන් වෙති. “මා ඔහුට ප්‍රිය කරන තුරු මාගේ සේවකයා (අනිවාර්ය නොවන) අමතර ක්‍රියාවන් තුළින් මා වෙත සමීප වෙමින්ම සිටියි.” යැයි පවසා සිටිනවාක් මෙන් එම තත්ත්වය අල්ලාහ්ගේ ආදරය ගැත්තා වෙත අනිවාර්යය කරනු ඇත. අල්ලාහ් කවරෙකුට ආදරය කළේ ද ඔහු ඔහුට ඔහුගේ ආදරය ඔහුට අවනත වීම ඔහු ව සිහිපත් කිරීමෙහි නිරත වීම යනාදිය

272. මෙලෙස ඇතැම් අඥාන ජනයා ද සැබැවින්ම මිණීවලවල්වල සිටින අව්ලියාවරු-අල්ලාහ්ගේ සමීපතයින්- තමන්ට සෙත සලසනු ඇතැයි ද එසේ නැතිනම් බලපෑම් ඇති කරනු ඇතැයි ද යන විශ්වාසයෙන් කටයුතු කරති. ඔවුන් ඔවුනට ප්‍රාර්ථනා කර සිටීමත් ඔවුන්ගෙන් උදව් පැතීමත් සමීප වීම සඳහා ඔවුන් වෙනුවෙන් සතුන් කැප කිරීමත් ඔවුන්ගෙන් සුවය හා වෙනත් අවශ්‍යතාවන් පැතීමත් ඔබ දකිනු ඇත. මෙය මහත් ෂිර්ක් -අල්ලාහ්ට ආදේශ තැබීමක්- වන්නේය. එයට අදාළ පුද්ගලයා ඉස්ලාමයෙන් භෞතික වස්තු වන්දනාව වෙත බැහැර වනු ඇත. ඒ සඳහා වූ සාධක අසීමිතය. මෙනෙහි කරනු ලැබීමට වඩා ප්‍රසිද්ධිය. කවරෙකු අල්ලාහ්ට ගරුබුහුමන් කරන්නේ ද ඔහුගේ සිතින් ෂිර්ක් හා බැඳුණු සියලු දෑ ඉවත්ව යයි. කවරෙකු අල් කුර්ආනය පරිශීලනය කරන්නේ ද එමගින් ඔහුගේ විශ්වාසය බලවත් වෙයි. සියලු ප්‍රශංසා අල්ලාහ්ටම සතුය. අප යහපත හා සත්‍ය මත ස්ථාවරත්වය පැතිය යුත්තේ ඔහුගෙන්ය. අපව පිළිගනිත්වා!

ප්‍රදානය කරනු ඇත. එය ඔහු වෙත සමීපවීම, ඔහු අබියසට ළංවීම හා ඔහු අබියසට පියවර තැබීම අනිවාර්යය කරනු ඇත.

***

"මම ඔහුට ප්‍රිය කරන විට, ඔහු අසන ඔහුගේ ශ්‍රවණයත්, ඔහු දකින ඔහුගේ දර්ශනයත්, ඔහු දිගු හරින ඔහුගේ අතත් ඔහු ගමන් කරන ඔහුගේ පාදයත් මම වෙමි." යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

මෙම ප්‍රකාශයේ අදහස වනුයේ: කවරෙකු අනිවාර්යය කටයුතු තුළින් අල්ලාහ් වෙත සමීප වන්නට වෙහෙස වී පසුව අතිරේක නැමදුම් තුළින් ද එසේ සමීපවන්නට බලන්නේ ද ඔහු ඔහුට සමීප වනු ඇත. ඊමාන් යන තත්ත්වයෙන් ඉහ්සාන් යන තත්ත්වයට උසස් කරනු ඇත. ඔහු අල්ලාහ්ව දකින්නාක් මෙන් ඉදිරියේ තබමින් ඉතා සැලකිල්ලෙන් අල්ලාහ්ව නැමදුම් කරනු ඇත. අල්ලාහ් පිළිබඳ දැනුම, ඔහුගේ ආදරය, ඔහුගේ මහිමය, ඔහු පිළිබඳ බිය, ඔහු පිළිබඳ ත්‍රස්ථය, ඔහුගේ කීර්තිය, ඔහුගේ ලෙන්ගතුකම ඔහුගේ මිතුරු කම යනාදියෙන් ගැත්තාගේ හදවත පිරෙනු ඇත. මෙම දැනුම ඔහුගේ හදවත තුළ දැසින් දකින්නාක් මෙන් ඔහුට දර්ශණය වන තරමට පිරී යනු ඇත.

අල්ලාහ්ගේ බලමහිමයෙන් හදවත පිරී ගිය විට ඔහු හැර සෙසු සියලු දෑ හදවතින් මැකී යනු ඇත. ගැත්තාට තම ආත්මාශාවන් කිසිවක් ඔහුගේ සිත තුළ ඉතිරිව පවතින්නේ නැත. තම භාරකරු කවර කරුණක් අභිමත කරන්නේ ද ඒ හැර වෙනත් අපේක්ෂාවක් ඔහුට නොවනු ඇත. එවිට ඔහුව සිහිපත් කිරීමෙන් මිස කිසිවක් කතා නොකරයි. ඔහුගේ නියෝගය පිළිපදිමින් මිස කිසිදු පියරවක් නොගනියි. එහෙයින් ඔහු කතා කළේ නම් අල්ලාහ් තුළින්ම කතා කරයි. ඔහු සවන් දෙන්නේ නම් ඔහු තුළින්ම සවන් දෙයි. ඔහු බලන්නේ නම් ඔහු තුළින්ම බලයි. ඔහු අල්ලන්නේ නම් ඔහු තුළින්ම අල්ලයි. "ඔහු අසන ඔහුගේ ශ්‍රවණයත්, ඔහු දකින ඔහුගේ

දර්ශනයත්, ඔහු දිගු හරින ඔහුගේ අතත් ඔහු ගමන් කරන ඔහුගේ පාදයත් මම වෙමි.''[273] යැයි නබි (ﷺ) තුමාණන් කළ ප්‍රකාශයේ අර්ථය එයයි.

මේ හැර වෙනත් විවරණ වෙත යොමු වන අයද වෙති. -ඒවා සිදුවීම හා ඒකාබද්ධ වීම- ඔවුන් පෙන්වා දෙනුයේ භෞතිකත්වය පදනම් කර ගෙනය. ඔවුන් ගැන අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් මැනවින් දනීය.

***

''ඔහු මගෙන් යමක් ඉල්ලා සිටියේ නම් මම එය ඔහුට දෙමි. ඔහු මාගෙන් සරණ පතන්නේ නම් මම ඔහුට රැකවරණය දෙමි.'' යන නබි (ﷺ) තුමාණන්ගේ ප්‍රකාශය වනාහි:

ඉන් අදහස් කරනුයේ: සැබැවින්ම ආදරයට පාත්‍ර වූ මොහුට අල්ලාහ් අබියස විශේෂ නිලයක් ඇති බවයි. සැබැවින්ම ඔහු අල්ලාහ්ගෙන් යමක් ඉල්ලා සිටි විට අල්ලාහ් ඔහුට පිරිනමයි. ඔහු තම පරමාධිපතිගෙන් යම් රැකවරණයක් පතන විට ඔහු ඔහුට රැකවරණය ලබා දෙයි. ඔහුගෙන් පතන විට ඔහු ඔහුට පිළිතුරු දෙයි. තම පරමාධිපති අබියස ඔහු ගැන පවතින ගරුත්වය හේතුවෙන් ඔහුගේ ප්‍රාර්ථනා පල දෙන්නක් බවට පත් වෙයි.

මුල්කාලීන දැහැමියන් අතරින් බහුතරයක් දෙනා තම ප්‍රාර්ථනාවන්ට පිළිතුරු සපයනු ලබන්නන් ලෙස ඉඳ ඇත. සඃද් ඉබ්නු අබී වක්කාස් තුමා ද එසේ ප්‍රාර්ථනාවට පිළිතුරු සපයනු ලබන්නෙකු විය. මිනිසෙකු ඔහුට එරෙහිව බොරුවක් කීවේය. එවිට ඔහු: ''අහෝ දෙවිඳුනි, සැබැවින්ම ඔහු බොරුකාරයකු වී නම් ඔහුගේ ඇස් අන්ධභාවයට පත් කරනු. ඔහුගේ ආයුෂ දිගු කොට ඔහුව පරීක්ෂණයට ලක් කරනු.'' යැයි පැවසීය. ඒ සියල්ල එම මිනිසාට අත් විය. ඔහු මාර්ගයේ අසළ සිටින්නන්හට පෙනී සිටිමින් මෙසේ පවසන්නෙකු වූහ. 'උම්මාදයෙන් පෙළෙන වයෝවෘද්ධ වැඩිහිටියෙකු සඃද්ගේ ප්‍රාර්ථනාවට ලක් විය.'[274] අලී තුමාට බැණ වදිනු දුටු පුද්ගලයකුට

273. ඇතැම් වාර්තාමය තොරුතුරු අනුව 'මා තුළින් සවන් දෙයි. මා තුළින් බලයි...' යන ප්‍රකාශය විස්තර කර ඇත්තේ: මාගේ ආශිර්වාදය තුළින් මාගේ උපකාරය තුළින් ... යනාදී ලෙසිනි. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්තරීෆි)
274. බුහාරි (755), 'මිනිසෙකු ඔහුට එරෙහිව බොරුවක් කීවේය.' යන ප්‍රකාශයේ තේරුම සැබැවින්ම ඔහු අභූත චෝදනාවක් ඔහුට එරෙහිව නැගුවේය යන්නයි.

එරෙහිව ඔහු ප්‍රාර්ථනා කළේය. හිස සොලවමින් පැමිණි ඔටුවකු ඔහුගේ අත් හා ඔහුගේ පාද පාගා මරා දමන තෙක් ඔහුගේ ස්ථානයෙන් ඔහු හැරී ගියේ නැත.

සර්ද් ඉබ්නු සෙයිද් තුමා සතු ඉඩමක් සම්බන්ධයෙන් කාන්තාවක් පැමිණිලි කර සිටියාය. එම භූමිය ඇයගෙන් ඔහු ගත් බවට වාද කළාය. එවිට ඔහු: "යා අල්ලාහ් ඇය බොරුකාරියක් නම් ඇයගේ දෑස් අන්ධ කරනු. ඇයගේ භූමියෙහිම ඇයව මරණයට පත් කරනු. යැයි ප්‍රාර්ථනා කළේය. එවිට ඇය අන්ධභාවයට පත් වූවාය. දිනක් රාත්‍රියෙහි ඇය එම භූමියේ ගමන් කරමින් සිටිය දී එහි ඇති ළිඳකට වැටී මිය ගියාය.[275]

[275]. මුස්ලිම් (1610). බලන්න: 'අල් අස්ල්' -මූලය- ප්‍රාර්ථනාවන් පිළිගනු ලැබූවන් පිළිබඳ තොරතුරු ඇතුළත් ආරෝග්‍යමත් එකතුවක් කතෘ තුමා එහි ගෙනවිත් ඇත.

## الحَدِيْثُ التَّاسِعُ والثَّلاثُوْنَ

## තිස් නව වන හදීසය

عَنِ ابْنِ عَبَّاسٍ رَضِـيَ اللهُ عَنْهُمَا، أَنَّ رَسُولَ ﷺ قَالَ:
"إِنَّ اللّهَ تَجَاوَزَ لِي عَنْ أُمَّتِي الْخَطَأَ وَالنِّسْيَانَ، وَمَا اسْتُكْرِهُوا عَلَيْهِ."
حَدِيثٌ حَسَنٌ رَوَاهُ ابْنُ مَاجَهْ وَالْبَيْهَقِيُّ وَغَيْرُهُمَا.

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) ප්‍රකාශ කළ බව ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

"නියත වශයෙන්ම අල්ලාහ් මාගේ සමූහයාට ඔවුන්ගේ වැරදි, අමතකවීම් සහ ඔවුන්ට බලහත්කාරයෙන් කිරීමට සිදු වූ දේ සඳහා සමාව ලබා දී ඇත"

මෙය හසන් වර්ගයට අයත් හදීසයකි. ඉබ්න් මාජා, අල්-බයිහකී සහ තවත් අය විසින් දන්වා ඇත.

***

### -විග්‍රහය-

'නියත වශයෙන්ම අල්ලාහ් මාගේ සමූහයාට ඔවුන්ගේ වැරදි, අමතකවීම් සහ ඔවුන්ට බලහත්කාරයෙන් කිරීමට සිදු වූ දේ සඳහා සමාව ලබා දී ඇත' යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

එහි නිර්ණායක වනුයේ: සැබැවින්ම අල්ලාහ් මාගේ සමූහයාගෙන් වැරදි ඉවත් කර ඇත. එසේ නැතහොත් එය ඔවුන්ගෙන් අතහැර දමා ඇත. 'සැබැවින්ම සමාව ලබා දීම' යනුවෙන් අර්ථවත් කර ඇත්තේ 'තජාවස' නම් අරාබි පදයයි. එයින් 'තමා ඉක්මවා ගොස් නැත' යන අදහස පෙන්වා දෙයි.

'ඔවුන්ගේ වැරදි, අමතකවීම සහ ඔවුන්ට බලහත්කාරයෙන් කිරීමට සිදු වූ දේ' යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

වැරදි හා අමතක වීම යන කරුණු දෙකට සමාව දෙන බව අල් කුර්ආනය පැහැදිළිව ප්‍රකාශ කර ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: "අපගේ පරමාධිපතියාණනි අපට අමතක වූයේ නම් හෝ අවට වැරදි ඇති වූයේ නම් හෝ අප වරදකරුවන් බවට ඔබ නොගනු මැනව!" (අල් බකරා: 286), "නුඹලාට කවර කරුණක් වරදින්නේ ද එහි කිසිදු වරදක් නුඹලාට නැත. නමුත් නුඹලාගේ සිත් උවමනාවෙන්ම කළ දෑ .... (අල් අහ්සාබ්: 5) බුහාරි හා මුස්ලිම් හි සඳහන් හදීසයක නබි (ﷺ) තුමා විසින් කරන ලද ප්‍රකාශයක් තමන්ට ඇසුණු බව පවසමින් අම්ර් ඉබ්නු ආස් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ වාර්තා කර ඇත.: 'විනිසුරුවෙකු විනිශ්චය කරන විට, පරිශීලනය කරයි. පසුව ඔහුට ප්‍රතිඵල ලැබෙයි. එහෙයින් ඔහුට කුසල් දෙකක් හිමි වන්නේය. ඔහු විනිශ්චය කර පරිශීලනය කර වැරදුනු විට ද ඔහුට කුසලක් හිමි වන්නේය.[276]

බලහත්කාරයෙන් කිරීමට සිදු වූ දේ සඳහා ද සමාව පිරිනමන බව අල් කුර්අනාය පැහැදිලිව ප්‍රකාශ කර ඇත[277]. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා සිටියි: "කවරෙකු විශ්වාස කිරීමෙන් පසු අල්ලාහ්ව ප්‍රතික්ෂේප කළේ ද (ඔහු කෙරෙහි අල්ලාහ්ගේ කෝපය ඇත.) කවරෙකු තම හදවත විශ්වාසයෙන් සැනසුමට පත්ව තිබිය දී (විශ්වාසයෙන් බැහැර වන මෙන්) බල කරනු ලබන්නේ ද ඔහු හැරය..." (සූරා අන්-නහ්ල්: 106) තවදුරටත් අල්ලාහ් මෙසේ පවසයි: "විශ්වාසිකයින්, විශ්වාසිකයින් හැර ප්‍රතික්ෂේපකයින්ව සමීප මිතුරන් ලෙස නොගත යුතුය. තවද ආරක්ෂක උපායක් ලෙස ඔවුන්ගෙන් නුඹලා පූර්වාරක්ෂාව ලබා ගැනීමට මිස..." (සූරා ආලු ඉම්රාන්: 28)

276. බුහාරි (7352), මුස්ලිම් (1716).

277. දේව ප්‍රතික්ෂේප කරන ක්‍රියාවක් සිදු කරන මෙන් බල කිරීම යන විෂයයෙහි ඔවුන් අතර පවතින මතභේද අනුව නිවැරදි ප්‍රකාශය වනුයේ සැබැවින්ම එය සිදු කළ තැනැත්තා නිදහසට කරුණු ඇති පුද්ගලයකු බවයි. බලහත්කාරයත් සමග දෙවියන් ප්‍රතික්ෂේප කරන ප්‍රකාශයක් ප්‍රකාශ කිරීම වනාහි, ඒ සඳහා නිදහසට කරුණු ඇති බව ඒකමතකි ස්ථාවරයක් පවතී. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්-තරීෆී)

වැරද්ද යනු: යමක් කිරීමට අපේක්ෂා කොට ඔහු අපේක්ෂා නොකළ දෙයක් සිදුවීමය. උදාහරණයක් වශයෙන් යුද්ධයේදී දෙවියන් ප්‍රතික්ෂේප කරන්නෙකු ඝාතනය කිරීමට අපේක්ෂා කොට නොදැනුවත්ව අල්ලාහ්ට අවනත වූ මුස්ලිම්වරයකු ඝාතනය කිරීම වැනිය.

අමතක වීම යනු: යමක් මතක තබා ගනිමින් සිටිය ද එය කරන අවස්ථාවේ අමතක වී යාමය.

මේ කරුණු දෙකටම සමාව දෙනු ලබන්නේය. ඉන් අදහස් කරනුයේ: සැබැවින්ම එහි කිසිදු පාපයක් නොමැති බවයි. නමුත් පාපය ඉවත් වීම යන කාරණාව ඔහුගේ අමතක වීම මත නීතිය ක්‍රියාත්මක වීම අහෝසි කරන්නේ නැත. උදාහරණයක් වශයෙන් කෙනෙකුට වුළූ ගැනීමට අමතක වෙයි. සැබැවින් තමන් පිරිසිදුව සිටින බව සිතා සලාතය ඉටු කරයි. එමගින් ඔහුට පාපයක් ඇති නොවන්නේය. පසුව ඔහු සලාතය ඉටු කළේ කිලිටි තත්ත්වයේ සිටිය දී යැයි පැහැදිලි වූයේ නම් ඔහු එය නැවත ඉටු කළ යුතුව ඇත. සලාතය අමතක වීමෙන් අතපසු වී පසුව මතක් වූ විට එය නැවත ඉටු කිරීම අන්වාර්යය වන්නේය. අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) මෙසේ ප්‍රකාශ කර සිටියහ. "සලාතය අතපසු වන තරමට නිදා ගත්තේ නම් හෝ එය අමතක වූයේ නම් හෝ එය මතක් විට එම සලාතය ඉටු කරත්වා. එය හැර ඒ සඳහා වෙනත් ප්‍රතිකර්මයක් නොමැත." පසුව එතුමා 'මතක් වන විට සලාතය ඉටු කරනු' යන සූරා තාහා හි 14 වන පාඨය පාරායනය කළහ.[278]

***

278. බුහාරි (572), මුස්ලිම් (684).

## الحَدِيْثُ الأَرْبَعُوْن

## හතළිස් වන හදීසය

عَنِ ابْنِ عُمَرَ رَضِـيَ اللهُ عَنْهُمَا قَالَ:

أَخَذَ رَسُولُ اللهِ ﷺ بِمَنْكِبِي، فَقَالَ: "كُنْ فِي الدُّنْيَا كَأَنَّكَ غَرِيبٌ أَوْ عَابِرُ سَبِيلٍ."

وَكَانَ ابْنُ عُمَرَ يَقُولُ: "إِذَا أَمْسَيْتَ، فَلَا تَنْتَظِرِ الصَّبَاحَ، وَإِذَا أَصْبَحْتَ فَلَا تَنْتَظِرِ الْمَسَاءَ، وَخُذْ مِنْ صِحَّتِكَ لِمَرَضِكَ، وَمِنْ حَيَاتِكَ لِمَوْتِكَ"

رَوَاهُ الْبُخَارِيُّ.

ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් වාර්තා කරන ලදී.

අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) මාගේ උරහිසින් අල්ලාගෙන "ඔබ ආගන්තුකයෙකු හෝ මඟ තරණය කරන්නෙකු මෙන් ලොවෙහි සිටිනු" යැයි පැවසූහ.

ඉබ්නු උමර් තුමා මෙසේ පවසා සිටියේය.: "ඔබ සවස් වරුවට පැමිණියේ නම්, උදේ වරුව බලාපොරොත්තු නොවන්න. ඔබ උදේ වරුවට පැමිණියේ නම් සවස් වරුව බලාපොරොත්තු නොවන්න. ඔබේ අසනීපය වෙනුවෙන් ඔබේ සෞඛයය ද ඔබේ මරණය වෙනුවෙන් ඔබේ ජීවිතය ද ගන්න.

මෙය ඉමාම් බුහාරි තුමා විසින් වාර්තා කර ඇත.

***

## -විග්‍රහය-

මෙය මෙලොව ආශාවන් සීමා කර ගැනීමේ වැදගත් මූලධාර්මික හදීසයකි. මෙලොව සදාතනික නවාතැනක් හා පදිංචි ස්ථානයක් ලෙස ගෙන එහි තැන්පත් වීම සැබැවින්ම දෙවියන් කෙරෙහි විශ්වාස තබන්නාට අවශ්‍ය වන්නේ නැත. නමුත් ඔහුට අවශ්‍ය වනුයේ එහි ගමනක් සඳහා ගමන් මල්ලක් සූදානම් කරන අයකු ලෙස සිටීමය.

ඒ සම්බන්ධයෙන් වූ නබිවරුන් හා ඔවුන් අනුගමනය කළවුන්ගේ උපදෙස් එකඟව පවතී,

ෆිර්අවුන් පැළැන්තියේ විශ්වාස වන්තයකු පිළිබඳ අල්ලාහ් පවසා සිටියදී "අහෝ මාගේ ජනයිනි, මෙලොව ජීවිතය වනාහි භුක්ති විඳීමක් පමණි. සැබැවින්ම මතු ලොව වන එයය සදා නිවහන වන්නේ." (සූරා අල් ගාෆිර්:39)

නබි (ﷺ) තුමාණන් මෙසේ පවසා සිටියහ. 'මට හා මෙලොවට ඇත්තේ කුමක් ද? මට හා මෙලොවට උපමාව මගියකුට සමානය. ඔහු ගසක සෙවණක නිදයි. පසුව විවේක ගෙන එය අතහැර දමා යයි."[279]

ආගමික විශාරදයකු විසින් මෙසේ ප්‍රකාශ කර ඇත: (මෙලොව ඔහුගෙන් දුරස් වෙමින් තිබිය දී මතුලොව ඔහු වෙත පැමිණෙමින් තිබියදී, දුරස් වෙමින් යන දෑහි නිරතව පැමිණෙන්නට යන දෑ පිටු දකින්නා ගැන මම පුදුම වෙමි.!)

මුඃමින් වරයාට මෙලොව සදාතනික නිවහනක් හෝ සදාතනික වාසස්ථානයක් හෝ නොවන්නේ නම් ඔහුගේ තත්ත්වය පහත සඳහන් තත්ත්වයන් දෙකින් එකක් වීම අවශ්‍ය වන්නේය.

---

279. මෙය ඉමාම් තිර්මිදි විසින් වාර්තා කර ඇති අතර එතුමා: මෙය හසන් සහීහ් වර්ගයට අයත් හදීසයක් බව අවධාරණය කර සිටියි. ගසක සෙවණක නිදයි යන්නෙන් අදහස් කරනුයේ කයිලූලා නින්දයි. එය තමන් හට නිදිමතක් නොතිබුණත් දහවල් කාලයෙන් සුළු කොටසක් විවේකය ගැනීමයි. 'අන්-නිහායා' (4/133)

එනම් ඔහු ආගන්තුක දේශයක පදිංචි ව සිටින ආගන්තුකයකු මෙන් වීම හෝ කවදත් පදිංචි නොවන මගියකු මෙන් වීමය.

නබි (ﷺ) තුමා ඉබ්නු උමර් තුමාට මෙම තත්ත්වයන් දෙකින් කුමන හෝ එක් තත්ත්වයක විය යුතු යැයි උපදෙස් දී ඇත්තේ එබැවිනි.

ඒ දෙකින් පළමුවැන්න: තමන් මෙලොවෙහි ආගන්තුකයකු වැනිය යන සිතුවිල්ල තම සිතට පහළ කර ගැනීමයි. ඔහු පදිංචි වීමට සිතයි. නමුත් එය ආගන්තුක දේශයකි. එහෙයින් ආගන්තුක දේශය සමග හදවතෙහි බැඳීමක් නොපවතී. නමුත් ඔහුගේ සිත බැඳී පවතිනුයේ නැවත හැරී යන ඔහුගේ දේශය සමගය. ඔහු තම දේශය වෙත නැවත යාම සඳහා අවශ්‍ය ගමන් භාණ්ඩ සපයා ගැනීමට ඔහු මෙලොවෙහි පදිංචි කරුවෙකු ලෙස සිටියි.[280]

එලෙස පසුවන්නා, තම දේශය වෙත හැරී යන අවස්ථාවේ ඔහුට අවශ්‍ය කළමනා පොදි බැඳ ගැනීම මිස වෙනත් අපේක්ෂාවක් ඔහුට පවතින්නේ නැත. දේශවාසීහු ඔවුන් ගෞරවය පත්වීම සම්බන්ධයෙන් තරඟ නොකරන අතර ඔවුන්ගේ නින්දාව ගැන තැති නොගනිති.

දෙවන තත්ත්වය වනාහි: තමන් මෙලොවෙහි කොහෙත්ම පදිංචි නොවන මගියකු වැනිය යන්න තම සිතට පහළ කර ගැනීමය. එනම් සැබැවින්ම ඔහු වනාහි, ගමනාන්තය දක්වා ගමන් කරන තෙක් හැර දමා යන සංචාරක නිකේතනවල සිටින මගියකු බඳුය. එම ගමනාන්තය මරණයයි.

කවරෙකු මෙලොවෙහි මෙවන් තත්ත්වයේ පසුවන්නේද එවිට ඔහුගේ අපේක්ෂාව වනුයේ ගමන සඳහා අවශ්‍ය ගමන් මළු ලබා ගැනීම පමණය. මෙලොව භුක්ති විඳීම් වර්ධනය කර ගැනීමේ අපේක්ෂාවක් ඔහුට නොපවතී.

***

280. ඉන් අදහස් කරනුයේ තම දේශය සඳහා යාමට සැබැවින්ම ඔහු ඔහුගේ ගමන් මලු එක්රැස් කරයි යන්නයි. මෙහි ගමන් භාණ්ඩ යනුවෙන් පරිවර්තනය කර ඇත්තේ 'අල් මරම්මා' නම් අරාබි පදයයි. එහි භාෂාමය අර්ථය 'නිවසේ භාණ්ඩ' වේ. 'ලිසාන් අල් අරබ්' හි එය සඳහන්ව ඇත. 'අර් රම්ම' යන මූලික පදය ව්‍යාකූලව ගිය දෙයක් ප්‍රතිසංස්කරණය කිරීම වෙන් වී ගිය දෙයක් එකතු කිරීම යනුවෙන් අර්ථකතනය වෙයි.

ඉබ්නු උමර් තුමාගේ උපදෙස වනාහි,

එතුමා වාර්තා කළ මෙම හදීසයෙන්ම ගනු ලැබූවක්ය. මෙහි සිතුවිලි හා ආශාවන් අඩු කර ගැනීමේ සීමාව අන්තර්ගත වී ඇත. සැබැවින්ම මිනිසා සවස් කාලයට එළැඹුණු විට උදේ කාලය අපේක්ෂා නොකළ යුතු අතර උදේ කාලයට එළැඹුණු විට සවස් කාලය අපේක්ෂා නොකළ යුතුය. ඊට පෙර තමන්ගේ අවසන් කාලය එළැඹෙනු ඇතැයි ඔහු සිතිය යුතුය.

***

"ඔබේ අසනීපය වෙනුවෙන් ඔබේ සෞඛ්‍යය ද ඔබේ මරණය වෙනුවෙන් ඔබේ ජීවිතය ද ගනු." යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

ඉන් අදහස් කරනුයේ: ඔබ සෞඛ්‍ය සම්පන්නව සිටිය දී ඔබ අතර හා ඒ අතර රෝගීබව ප්‍රවේශ වීමට පෙර දැහැමි ක්‍රියාවන් පිළිපදිනු. එමෙන්ම ඔබ ජීවත්ව සිටිය දී ඔබ අතර හා ඒ අතර මරණය පැමිණීමට පෙර එහිදී දැහැමි ක්‍රියාවන් පිළිපදිනු යන්නයි.

අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) මිනිසෙකුට උපදෙස් දෙමින් කළ ප්‍රකාශයක් ඉබ්නු අබ්බාස් රළියල්ලාහු අන්හු තුමා විසින් මෙසේ වාර්තා කරයි. "කරුණු පහකට පෙර කරුණු පහක් ප්‍රයෝජනයට ගන්න. ඔබේ මහළු වියට පෙර ඔබේ තරුණ විය, ඔබ රෝගාතුර වීමට පෙර ඔබේ සෞඛ්‍ය සම්පන්නභාවය, ඔබේ දිළිඳුකමට පෙර ඔබේ පොහොසත්කම, ඔබ කාර්යය බහුල වීමට පෙර ඔබේ විවේකය හා ඔබේ මරණයට පෙර ඔබේ ජීවිතයයි" 'මෙය සහීහ් හාකිම්'හි සඳහනකි.[281]

දැහැමි ක්‍රියාවන් සිදු කිරීමට නොහැකි තත්තවයක් උදා වී එම දැහැමි ක්‍රියාවන් හා ඔහු අතර බාධකයක් ඇති වීමට පෙර ඒවා සිදු කිරීමට යුහුසුළු වීම දේව විශ්වාසියාට අනිවාර්යය වන්නේය. කවර දිනක මිනිසා හා ක්‍රියාව අතර බාධකයක් වැටෙන්නේ ද එවිට ඒ ගැන දුක හා පාඩුව මිස වෙනකක් ඉතිරි

281. අල්හාකිම් (4/306) මෙය බුහාරි හා මුස්ලිම් යන ෂෙයික්වරු දෙදෙනාගේ කොන්දේසියට අනුකූලව පිහිටා ඇති සහීහ් හදීසයක් බව හෙතෙම සඳහන් කර ඇත. ෂෙයික් අල් අල්බානි තුමා ද 'සහීහ් අත් තර්ගීබ් වත් තර්හීබ්' නම් කෘතියෙහි මෙය සහීහ් හදීසයක් බව දන්වා ඇත. (3355)

වන්නේ නැත. ඔහු දැහැමි ක්‍රියාවන් සිදු කිරීමට පහසුකම් ඇති වාතාවරණයක් වෙත යොමු වීමට ප්‍රිය කළ යුතුයි. ආශාවන් ඔහුට සෙත සලසන්නේ නැත.

උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: "තවද නුඹලාට දඬුවම පැමිණීමට පෙර නුඹලා නුඹලාගේ පරමාධිපති වෙත නැඹුරු වී ඔහුට අවනත වවු. (එසේ නොකළේ නම්) පසුව නුඹලා උදව් කරනු නොලබන්නෝය. නුඹලා නොහැඟෙන්නන්ව සිටියදී අනපේක්ෂිතව නුඹලාට දඬුවම පැමිණීමට පෙර නුඹලාගේ පරමාධිපතිගෙන් නුඹලා වෙත පහළ කරනු ලැබූ ඉතා අලංකාර දෑ (අල් කුර්ආනය) නුඹලා අනුගමනය කරවු. අල්ලාහ්ගේ විෂයෙහි මා කළ අඩුපාඩු කෙරෙහි ද (අන් අයට) සමච්චල් කළවුන්ගෙන් කෙනෙකු වීමෙහි ද ඇති වූ අහෝ මාගේ කණගාටුව!' යැයි (කිසිදු) කෙනෙක් (පසුතැවිල්ලෙන්) නොපවසනු පිණිස ද, නැතහොත් 'සැබැවින්ම අල්ලාහ් මට යහමඟ පෙන්වා තිබුණේ නම් මම ද බිය භක්තිකයන්ගෙන් (කෙනෙකු) වී ඇත්තෙමි.' යැයි ඔහු නොපවසනු පිණිස ද" (සූරා සුමර්: 54-58)

තවද අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: (ප්‍රතික්ෂේපක) ඔවුන්ගෙන් කෙනෙකුට මරණය පැමිණි කල්හි '(එවිට) මාගේ පරමාධිපතියාණනි, මා අත හැර පැමිණි දෑහි යහකම් කිරීමට හැකි වනු පිණිස මා නැවත (ලොවට) යවනු මැනව!' යැයි ඔහු පවසනු ඇත. එසේ නොවනු ඇත. සැබැවින්ම එය ඔහු පවසන (පුහු) වදනක් පමණි. නමුත් (මරණින් පසු) ඔවුනට ඉදිරියෙන් (මළවුන්) නැවත නැගිටුවනු ලබන දින තෙක් (ලොවට නැවත පැමිණිය නොහැකි) බාධකයක් ඇත. (සූරා අල් මුඃමිනූන් 99,100)

තවදුරටත් අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි: 'නුඹලා අතුරින් කෙනෙකුට මරණය පැමිණීමට පෙර අප නුඹලාට දායාද කළ දැයින් නුඹලා වියදම් කරවු. එ(ම මරණය පැමිණි) විට 'මාගේ පරමාධිපතියාණනි, සුළු මොහොතකට මා ප්‍රමාද නොකරන්නේ ද (එසේ ප්‍රමාද කළේ නම්) මම දන් දී සැදැහැමියන්ගෙන් කෙනෙකු වන්නෙමි' යැයි ඔහු පවසයි.' යම් ආත්මයකට එහි අවසානය පැමිණි විට කිසිවිටෙක අල්ලාහ් ප්‍රමාද කරන්නේ නැත. අල්ලාහ් නුඹලා කරන දෑ පිළිබඳ තොරතුරු මැනවින් දන්නාය. (සූරා අල් මුනාෆිකූන් 10,11)

විවේකයේදී රුකූහි මහිමය ලබන්න.

ඔබේ මරණය ක්ෂණිකව විය හැකිය.

කොපමණ නිරෝගී සුවපත් අය ඔබ දැක තිබුණ ද

එම සුවපත් ආත්මය පහව ගොස් ඇත.[282]

282. මෙම කවිපෙළ දෙක ‘තබකාතුෂ් ෂාෆිඉය්යා’ නම් කෘතියෙහි අස්සුබ්කී විසින් සඳහන් කර ඇත. (2/235) ඒ දෙක ඉමාම් බුහාරි සතු වූවකි.

## الحَدِيْثُ الحَادِي والأَرْبَعُوْن

## හතළිස් එක් වන හදීසය

عَنْ عَبْدِ اللهِ بْنِ عَمْرِو بْنِ الْعَاصِ رَضِيَ اللهُ عَنْهُمَا، قَالَ: قَالَ رَسُولُ اللهِ ﷺ:

"لَا يُؤْمِنُ أَحَدُكُمْ حَتَّى يَكُونَ هَوَاهُ تَبَعًا لِمَا جِئْتُ بِهِ"

قَالَ الشَّيْخُ رحمه الله (حديثٌ حسنٌ صحِيحٌ، رويناه في "كتاب الحُجَّةِ") بإِسْنَادٍ صَحِيحٍ.

අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) ප්‍රකාශ කළ බව අබ්දුල්ලාහ් ඉබ්නු අම්ර් ඉබ්නු අල් ආස් (රළියල්ලාහු අන්හුමා) විසින් වාර්තා කරන ලදී.

“මා කවර කරුණක් ගෙන ආවේ ද එය අනුගමනය කරන්නක් ලෙස තම කැමැත්ත පිහිටන තෙක් ඔබ අතුරින් කිසිවෙකු දේව විශ්වාසියෙකු වන්නේ නැත.”

ෂෙයික් තුමා මෙය ‘සහීහ් හසන්’ වර්ගයට අයත් හදීසයක් බව පවසා ඇත. (අපි මෙය ‘කිතාබ් අල් හුජ්ජා’ නම් කෘතියෙහි වාර්තා කර ඇත්තෙමු.)

මෙය සහීහ් ගණයට අයත් වාර්තාකරණයකි.[283]

***

-විග්‍රහය-

මෙම හදීසයේ අර්ථය: දූතයාණන් (ﷺ) කවර කරුණක් ගෙන ආවේ ද එයට යටත් වීම තම කැමැත්ත බවට පත් කර ගෙන එතුමාණන් අණ කළ දෑට ප්‍රිය

283. එය මෑලූල් වර්ගයට අයත් හදීසයකි. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්-තරීෆි)

කර එතුමා තහනම් කළ දෑ පිළිකුල් කරන තෙක් මිනිසකු අනිවාර්යයෙන්ම විශ්වාස කළ යුතු කරුණු පූර්ණ ලෙස විශ්වාස කරන්නෙකු නොවන බවයි.

අල් කුර්ආනයේ නොයෙකුත් ස්ථානවල මේ සඳහා වූ උපමාවන් පැමිණ ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කරයි. "නුඹගේ පරමාධිපතිගේ නාමය මත දිවුරමින් ඔවුන් අතර ඇති වන මත ගැටුමකදී ඔවුන් නුඹව තීරකයෙකු වශයෙන් පත් කරගෙන පසුව නුඹ දුන් තීන්දුවෙහි සැකයක් තම සිත් තුළ ඔවුන් නොදැක පරිපූර්ණ අවනතභාවයෙන් අවනත වන තෙක් ඔවුන් විශ්වාසිකයෝ නොවෙති." (සූරා අන් නිසා: 65), "අල්ලාහ් ද ඔහුගේ රසූල්වරයා ද යම් කරුණක් තීන්දු කළේ නම් (කිසිදු) විශ්වාසිකයෙකුට හෝ (කිසිදු) විශ්වාසික කාන්තාවකට ඔවුන්ගේ කරුණෙහි මොවුන්ට (තම) මනාපය යොදා ගැනීමට අයිතියක් නොවීය..." (සූරා අල් අහ්සාබ්: 36), කවරෙකු අල්ලාහ් ප්‍රිය කරන යමක් පිළිකුල් කරන්නේ නම් හෝ ඔහු පිළිකුල් කරන යමක් ප්‍රිය කරන්නේ නම් හෝ එවැන්නන් පහත් කොට උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා ඇත: "එය ඔවුන් අල්ලාහ් පහළ කළ දෑ (වන අල් කුර්ආනය) පිළිකුල් කළ හෙයිනි. එබැවින් ඔවුන්ගේ (යහ) ක්‍රියාවන් ඔහු නිෂ්ඵල කළේය." (සූරා මුහම්මද්: 9), "එය සැබැවින්ම ඔවුන් අල්ලාහ්ට කෝපය ඇති කරවන දෑ අනුගමනය කොට ඔහුගේ තෘප්තිය(ට හේතු වූ දෑ) පිළිකුල් කළ හෙයිනි. එබැවින් ඔහු ඔවුන්ගේ (යහ) ක්‍රියාවන් නිෂ්ඵල කළේය. (සූරා මුහම්මද්: 28)

සෑම මුඃමින්වරයකුටම අනිවාර්යය වන්නේ:

අල්ලාහ් කවර කරුණක් ප්‍රිය කරන්නේ ද එය ප්‍රිය කිරීමය. එනම් අල්ලාහ් කවර කරුණක් ඔහුට නියම කර ඇත්තේ ද එය අනිවාර්යයෙන්ම ඉටු කිරීම සඳහා පවතින කැමැත්තයි. එමෙන්ම අල්ලාහ් අමතරව සිදු කරන්නට පවසා ඇති යමක් ඔහු පිළිපදින තරමට ඔහුගේ කැමැත්ත අධික වූයේ නම් එය ඔහුට භාග්‍යයක් වන්නේය.

එමෙන්ම අල්ලාහ් කවර කරුණක් පිළිකුල් කරන්නේ ද එය පිළිකුල් කිරීමය. එනම් අල්ලාහ් කවර කරුණකින් වැළකී සිටිය යුතු යැයි නියම කර ඇත්තේ ද එවන් තහනම් කරනු ලැබූ දෑ පිළිබඳ පවතින පිළිකුල්භාවයයි. එමෙන්ම තහනම් නොවුව ද පිළිකුල් සහගත දැයින් පවා එසේ අනිවාර්යයෙන් වැළකී

සිටින තරමට එම පිළිකුල් භාවය අධික වූයේ නම් එයද අනුග්‍රහයක් වන්නේය.

නියම ප්‍රේමය යනු ප්‍රිය කළ යුතු දෑට ප්‍රිය කිරීමෙහි හා පිළිකුල් කළ යුතු දෑට වෛර කිරීමෙහි අනිවාර්යයෙන්ම අනුගත වෙමින් පිළිපැදීමය. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: "(නබිවරය,) නුඹ පවසවු. 'නුඹලාගේ පියවරුන් ද නුඹලාගේ පිරිමි දරුවන් ද නුඹලාගේ සහෝදරයින් ද නුඹලාගේ කලත්‍රයන් ද නුඹලාගේ පවුලේ අය ද නුඹලා ඉපැයූ ධනය ද නුඹලා අලාභය (පිළිබඳව) බිය වන ව්‍යාපාරය ද නුඹලා ප්‍රිය කරන වාසස්ථාන ද (යන දෑ) අල්ලාහ්ට ද ඔහුගේ රසූල්වරයාට ද ඔහුගේ මාර්ගයේ ප්‍රයත්නය කිරීමට ද වඩා නුඹලා වෙත ඉතා ප්‍රියමනාප වූයේ නම් එවිට අල්ලාහ් තම (දඬුවමේ) අණ ගෙන එන තෙක් නුඹලා බලාපොරොත්තු වවු...." (සූරා අත් තව්බා:24) එහෙයින් කවරෙකු අල්ලාහ්ට හා ඔහුගේ දූතයාණන්ට හදවතින්ම සැබෑ ලෙස ප්‍රේම කරන්නේ නම් අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් ප්‍රිය කරන දෑ හදවතින් ප්‍රිය කිරීම ඔහුට අනිවාර්යය කරනු ඇත. එමෙන්ම අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් පිළිකුල් කරන දෑ ඔහු පිළිකුල් කරනු ඇත. අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් පිළිගන්නා දෑ පිළිගනු ඇත. අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් කෝපවන දෑට කෝප වනු ඇත. ඔහුගේ ශරීර අවයව ක්‍රියා කිරීම තුළින් එම ආදරය හා කෝපය තීන්දු කරනු ලැබේ. නමුත් එයට පටහැනිව අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් පිළිකුල් කරන යම් පාපයක් සිදු කරන්නේ නම් හෝ අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් ප්‍රිය කරන යමක් එය ඉටු කිරීම අනිවාර්ය තත්ත්වයේ හා ඉටු කිරීමට හැකියාවද තිබියදී එය අතහැර දමන්නේ නම් හෝ එය ඔහුගේ අනිවාර්යය ප්‍රේමයේ අඩුවක් ඇති බව පෙන්වා දෙයි. ඒ සඳහා ඔහු පව් සමාව ඉල්ලා සිටිය යුතුය. එම අනිවාර්යය ප්‍රේමය පූර්ණ කිරීමට යොමු විය යුතුය.

යහ්යා ඉබ්නු මුආද් තුමා මෙසේ පවසයි: "අල්ලාහ්ගේ සීමාවන් ආරක්ෂා නොකරන තත්ත්වයේ ඔහුට ආදරය කරන බව වාද කරන්නා සැබෑ ආදරය කරන්නෙකු නොවන්නේය."

පෙරටු ගාමීන් අතරින් කෙනෙකු මෙසේ පවසා ඇත්තේය.

දේව ආදරය පිළිබඳ විශ්වාස කොට ඔබ ඔහුට අකීකරු වන්නෙහිය.

එය එසේ සැසඳීම -සැබැවින්ම- කුරිරුය.

ඔබේ ආදරය සැබෑවක් නම් ඔබ ඔහුට යටත් විය යුතුය.

සැබැවින්ම ආදරවන්තයා අවනත වන්නා ප්‍රිය කරන්නා සතුය.

සියලු පාපයන් ඇති වනුයේ අල්ලාහ් හා ඔහුගේ දූතයාණන්ට දක්වන ආදරයට වඩා ආත්මාශාවන් මුල්තැන දී කටයුතු කිරීම හේතුවෙනි. අල්ලාහ් අල් කුර්ආනයේ බොහෝ තැන්වන ආශාවන්ට වහල් වී ඒවා පිළිපදින දේව ආදේශයකින් පිළිබඳ විස්තර කර ඇත. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. “එබැවින් ඔවුන් නුඹට පිළිතුරු නොදුන්නේ නම් එවිට ඔවුන් පිළිපදිනුයේ ඔවුන්ගේ මනෝ ඉච්ඡාවන් යැයි නුඹ දැන ගනිවු. තවද අල්ලාහ්ගෙන් වූ යහමගින් තොර තම මනෝ ඉච්ඡාව පිළිපදින්නාට වඩා නොමග වූ අය කවරෙකුද?...” (සූරා අල් කසස්: 50)

එමෙන්ම, නවක දෑ බිහි වනුයේ ආගමික නීතියට වඩා තම ආශාවන්ට මුල් තැන දී කටයුතු කිරීමෙනි. එවැන්නන්හට ‘ආශාවන්ට වහල් වූවෝ’ යැයි නම් කර ඇත්තේ එබැවිනි.

පුද්ගලයින්ට ආදරය කිරීමත් එලෙසමය. එහි දී අනිවාර්යය වනුයේ දූතයාණන් කවර කරුණක් ගෙන ආවේද එය පිළිපැදීමය. දෙවියන් විශ්වාස කරන්නා අල්ලාහ්ට ආදරය කිරීමත් ඔහු අදාරය කරන මලක්වරුන් රසූල්වරුන් නබිවරුන් සත්‍යවාදීන් දිවිපිදූවන් හා පොදුවේ දැහැමියන්ට ආදරය කිරීමත් අනිවාර්යය වන්නේය. එබැවින්, ඊමාන් හෙවත් දේව විශ්වාසයේ සුවය උදා කරන සළකුණක් ලෙස පුද්ගලයකුට ආදරය කිරීම පිහිටා ඇත. ඔහු අල්ලාහ් වෙනුවෙන් හැර වෙනත් හේතුවක් මත ඔහුට ආදරය නොකරයි.

අල්ලාහ්ගේ සතුරන් සමගත් පොදුවේ අල්ලාහ් පිළිකුල් කරන අය සමගත් මිතුදම් පෑම තහනම් වන්නේය. ඉහත තවත් ස්ථානයක මේ පිළිබඳ සඳහන් වී ඇත. ඒ අනුව ආගම මුළුමණින්ම අල්ලාහ් සතු වූවක් වන්නේය.

***

## الحَدِيْثُ الثَّانِي والأَرْبَعُوْن
## හතළිස් දෙවන හදීසය

عَنْ أَنَسِ بْنِ مَالِكٍ رَضِيَ عَنْهُ، قَالَ: سَمِعْتُ رَسُولَ اللهِ ﷺ يَقُولُ:

"قَالَ اللهُ تَعَالَى: يَابْنَ آدَمَ، إِنَّكَ مَا دَعَوْتَنِي وَرَجَوْتَنِي غَفَرْتُ لَكَ عَلَى مَا كَانَ مِنْكَ وَلَا أُبَالِي.يَا ابْنَ آدَمَ، لَوْ بَلَغَتْ ذُنُوبُكَ عَنَانَ السَّمَاءِ، ثُمَّ اسْتَغْفَرْتَنِي، غَفَرْتُ لَكَ. يَا ابْنَ آدَمَ، إِنَّكَ لَوْ أَتَيْتَنِي بِقُرَابِ الْأَرْضِ خَطَايَا، ثُمَّ لَقِيتَنِي لَا تُشْرِكُ بِي شَيْئًا، لَأَتَيْتُكَ بِقُرَابِهَا مَغْفِرَةً."

رَوَاهُ التِّرْمِذِيُّ وَقَالَ: حَدِيثٌ حَسَنٌ.

අල්ලාහ්ගේ දූතයාණන් කළ ප්‍රකාශයකට තමන් සවන් දුන් බව පවසමින් අනස් ඉබ්නු මාලික් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ වාර්තා කරයි.

සර්වබලධාරී අල්ලාහ් මෙසේ කීවේය:

“ආදම්ගේ පුත්‍රය, ඔබ මා අමතා මගෙන් ඉල්ලන තාක් කල්, ඔබ කළ දේට මම ඔබට සමාව දෙමි. මට කමක් නැත.

ආදම්ගේ පුත්‍රය, ඔබ කළ පාපකම් අහසේ වලාකුළු කරා ළඟා වන තරම් වුව ද (ඒ වෙනුවෙන්) ඔබ මගෙන් සමාව ඉල්ලා සිටින්නේ නම්, මම ඔබට සමාව දෙමි.

ආදම්ගේ පුත්‍රය, ඔබ පොළොව තරම් විශාල පව් කන්දරාවක් සමග මා වෙතට පැමිණ මට කිසිදු හවුල් කරුවකු ආදේශ නොකළ තත්ත්වයේ ඔබ මා හමු වූයේ නම් මම ඒ තරමට ඔබට සමාව දෙමි.”

ඉමාම් තිර්මිදි විසින් මෙය වාර්තා කර ඇති අතර මෙය හසන් ගණයට අයත් හදීසයක් බව එතුමා අවධාරනය කරයි.

***

## -විග්‍රහය-

මෙය ඉමාම් තිර්මිදිට පමණක් ආවේනික වූ හදීසයකි. එහි වාර්තාකරණයෙහි කිසිදු දොසක් දකින්නට නැත.

සැබැවින්ම මෙම කාරණා තුන මගින් සමාව හිමි වන බව මෙහි අන්තර්ගතව ඇත.

ඒවායින් පළමුවැන්න: අපේක්ෂා සහගත ප්‍රාර්ථනාව: ප්‍රාර්ථනා කිරීම නියම කරන ලද්දකි. ඒ සඳහා පිළිතුරු දීමද ප්‍රතිඥා දෙන ලද්දකි. උත්තරීතර අල්ලාහ් සූරා ඝාෆිර් 60 වන පාඨයේ: "නුඹලා මගෙන් අයැද සිටින්න. මම නුඹලාට පිළිතුරු දෙමි යැයි නුඹලාගේ පරමාධිපති පැවසීය." නබි (ﷺ) තුමාණන්: 'සැබැවින්ම ප්‍රාර්ථනාව නැමදුමකි' යනුවෙන් පවසා පසුව මෙම වැකිය පාරායනය කළ බව නුඃමාන් ඉබ්නු බෂීර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් හදීස් වේදීන් සිව් දෙනාගේ ග්‍රන්ථ වල සඳහන් වී ඇත.[284]

නමුත් ප්‍රාර්ථනාවට, එය පිළිගැනීම සඳහා වූ ඇතැම් හේතු කාරණ ඇත. එය එහි කොන්දේසි සම්පූර්ණ කිරීම හා එය වළක්වන දැයින් වැළකී සිටීම යනාදිය සමග බැඳී පවතී. එම කොන්දේසි අතරින් වඩාත් වැදගත්ම කොන්දේසිය වනුයේ: එය හදවතට ගෙන ඒම හා පිළිතුරු අපේක්ෂා කිරීමය. නබි (ﷺ) තුමා පැවසූ බවට අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් තිර්මිදිහි මෙසේ සඳහන් වී ඇත. එතුමා: 'පිළිතුරු පිළිබඳ දැඩි විශ්වාසයෙන් යුතුව අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරනු. ඊට හේතුව පුහු හා නොසැළකිලිමත් හදවතකින් ඉල්ලන ප්‍රාර්ථනාව සැබැවින්ම අල්ලාහ්

284. අබූ දාවුද් (1479), තිර්මිදි (3247), 'කුබ්රා' හි නසාඊ (6/450), ඉබ්නු මාජා (3828), ඉමාම් තිර්මිදි මෙය හසන් සහීහ් වර්ගයට අයත් හදීසයක් බව පවසා ඇත.

පිළි නොගන්නා බැවිනි.[285] එබැවින් ගැත්තා තම ප්‍රාර්ථනාවෙහි, 'අහෝ දෙවිඳුනි, ඔබ කැමති නම් මට සමාව දෙනු මැනව.' යනාදි ලෙසින් ප්‍රාර්ථනා කිරීම තහනම් කරනු ලැබ ඇත. ඔහු ඉල්ලන දෑ දැඩි විශ්වාසයෙන් යුතුව ඉල්ලිය යුතුය. සැබැවින් අල්ලාහ් එය පිළිකුල් කරන්නෙකු නොවේ.[286]

***

'... ඔබ මා අමතා මගෙන් ඉල්ලන තාක් කල්, ඔබ කළ දේට මම ඔබට සමාව දෙමි. මට කමක් නැත...' යන නබි (ﷺ) තුමාගේ ප්‍රකාශය වනාහි:

ඉන් අදහස් කරනුයේ: ඔබේ වැරදි හා පාපකම් අධික වුවද ඒවා මට කිසිදු බරක් ඇති නොකරන අතරම එය මට අධික නොවන බවයි.

සමාව සඳහා වූ දෙවන කාරණාව: ඉස්තිග්ෆාර් හෙවත් පාපක්ෂමාව අයැදීමයි. පාපකම් වැඩි වී අහසේ වළාකුළු දක්වා ළඟා වූවත් සමාව අයැද සිටිය යුතුය. තවත් සඳහනක ඒවා නොපෙනෙන දුරකින් වුවද යැයි ප්‍රකාශ වී ඇත.-

ඉස්තිග්ෆාර් යනු පාපක්ෂමාව අයැද සිටීමයි. පාපක්ෂමාව අයැද සිටීම යනු පාපයෙන් අත්වන හානියට එය වසන් කිරීමත් සමග එයට ලැබෙන ආරක්ෂාවකි.

ඉස්තිග්ෆාර් වර්ග අතුරින් වඩාත් උතුම් ඉස්තිග්ෆාරය වනාහි: ගැත්තා තම පරමාධිපතිට ප්‍රශංසා කොට ආරම්භ කිරීමෙන් පසුව තම පාපය පිළිගනිමින්

285. ඉමාම් තිර්මිදි විසින් වාර්තා කර ඇත. (3479), ඉමාම් අල්බානී 'සහීහ් අත්-තර්ගීබ් වත් තර්හීබ්' හි හසන් වර්ගයට අයත් හදීසයක් බව සඳහන් කර ඇත.

286 බුහාරි (6339), මුස්ලිම් (2679, 2678)

මෙහි, සිදුවන සාමාන්‍ය වරදක් පිළිබඳ ඉතා විශිෂ්ඨ අයුරින් දැනුවත් කර ඇත. එනම්: ජනයා අතරින් වැඩි දෙනා තම සහෝදරයාට ප්‍රාර්ථනා කිරීමට සිතන විට 'ජසාකල්ලාහු කය්රන් ඉන්ෂා අල්ලාහ්' (අල්ලාහ් අභිමත කළේ නම්, අල්ලාහ් ඔබට යහපත් ප්‍රතිඵල පිරිනමත්වා) යැයි හෝ 'අල්ලාහු යුවෆ්ෆිකුක ඉන්ෂා අල්ලාහ්' (අල්ලාහ් අභිමත කළේ නම්, අල්ලාහ් ඔබට ආශිර්වාද කරත්වා) යැයි හෝ මෙවන් ව්‍යුහයෙන් යුත් ප්‍රාර්ථනාවන් අයැද සිටිති. මෙය වළක්වනු ලැබූවක් වන්නේය. මෙම හදීසය පිළිපැදීමක් වශයෙන් ප්‍රාර්ථනාව තුළ 'අභිමත කරන්නේ නම්' යන ප්‍රකාශය ඉවත් කිරීම හා එම අර්ථයෙන් පිහිටන දෑ ඉවත් කිරීමත් අනිවාර්යය වේ. සියල්ල මැනවින් දන්නා අල්ලාහ්ය.

පසුව අල්ලාහ්ගෙන් සමාව ඉල්ලා සිටීමයි. නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බව ෂද්දාද් ඉබ්නු අව්ස් තුමා වාර්තා කළ හදීසයක සඳහන් වන පරිදි එතුමාණන්: ඉස්තිග්ෆාර්හි ප්‍රධානතම ඉස්තිග්ෆාරය වනුයේ ගැත්තා:

اَللَّهُمَّ أَنْتَ رَبِّي, لَا إِلَهَ إِلَّا أَنْتَ, خَلَقْتَنِي, وَأَنَا عَبْدُكَ, وَأَنَا عَلَى عَهْدِكَ وَوَعْدِكَ مَا اِسْتَطَعْتُ, أَعُوذُ بِكَ مِنْ شَرِّ مَا صَنَعْتُ, أَبُوءُ لَكَ بِنِعْمَتِكَ عَلَيَّ, وَأَبُوءُ لَكَ بِذَنْبِي, فَاغْفِرْ لِي; فَإِنَّهُ لَا يَغْفِرُ اَلذُّنُوبَ إِلَّا أَنْتَ

(යා අල්ලාහ්! ඔබ මාගේ පරමාධිපති ය. ඔබ හැර වෙන කිසිවෙකුට නමස්කාර කිරීමට අයිතියක් නැත. ඔබ මා මැවූ අතර මම ඔබේ ගැත්තා වන අතර මම ඔබේ ගිවිසුමට අවනත වීමට හැකි උපරිමයෙන් පොරොන්දු වෙමි. මා කළ නපුරෙන් මම ඔබගෙන් රැකවරණය පතමි. මා කෙරෙහි ඔබ දක්වන අනුග්‍රහය මම පිළිගනිමි. මාගේ පව් මම දනිමි. එබැවින් මට සමාව දෙනු මැනව. මක්නිසාදයත් ඔබ හැර වෙන කිසිවෙකුට පාපයට සමාව දිය නොහැක.) යැයි පැවසීමය. මෙය ඉමාම් බුහාරි විසින් වාර්තා කොට ඇත.[287]

ඉස්තිග්ෆාර් වර්ගයට අයත් තවත් ප්‍රකාශයක් වනුයේ ගැත්තා:

أَسْتَغْفِرُ اللَّهَ الْعَظِيمَ الَّذِي لاَ إِلَهَ إِلاَّ هُوَ الْحَيَّ الْقَيُّومَ وَأَتُوبُ إِلَيْهِ

(සර්වබලධාරී අල්ලාහ්ගෙන් මම සමාව අයදිමි. ඔහු හැර නැමදුම් ලබන්නට සුදුසු කිසිවෙකු නැත. ඔහු ජීවමානය, සදා පැවැත්මක් ඇත්තාය. මම ඔහු වෙත පසුතැවිලි වෙමි) යැයි පැවසීමය. සැබැවින්ම කවරෙකු මෙය පවසා සිටින්නේ ද ඔහු යුද්ධයෙන් පලා ගිය අයකු වුව ද ඔහුට සමාව දෙනු ලබන්නේය යැයි නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බවට වාර්තා වී ඇත. මෙය අබූ දාවූද් හා තිර්මිදි යන ඉමාම්වරු විසින් වාර්තා කොට ඇත.[288]

නබි (ﷺ) තුමා පැවසූ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් සහීහ් අල් බුහාරි හි මෙසේ සඳහන් වේ: "අල්ලාහ් මත

287. බුහාරි (6306)

288. අබූ දාවූද් (1517), තිර්මිදි (3577), මෙය 'සහීහ් මුත්තසිල්' වර්ගයට අයත් හදීසයක් බව අල් මුන්දිරී තුමා සඳහන් කර ඇත.

දිවුරා පවසමි. දිනක හැත්තෑ වාරයකට අධිකව මම අල්ලාහ්ගෙන් සමාව අයැද ඔහු වෙත පසුතැවිලි වී යොමු වෙමි.''[289]

නබි (ﷺ) තුමා පැවසූ බව අල් අගස්සුල් මුස්නියියි (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් සහීහ් අල් මුස්ලිම් හි මෙසේ සඳහන් වේ: "(ඇතැම් විට) මාගේ හදවත අවුල් වී පවතී., සැබැවින්ම මම දිනකට සිය වතාවක් අල්ලාහ්ගෙන් සමාව අයැද සිටිමි.''[290]

සමාව සඳහා වූ තුන්වන කාරණාව: තව්හීද් හෙවත් අල්ලාහ් ඒකීයත්වයට පත් කිරීමයි. වඩාත් වැදගත්ම කාරණාව එයයි. කවරෙකු එය අහිමි කර ගත්තේ ද ඔහුට සමාව අහිමි වී යනු ඇත. කවරෙකු එය පිළිපදින්නේ ද සැබැවින්ම ඔහු සමාව සඳහා වූ වැදගත්ම කාරණාව ගෙන ආවේය.!

කවරෙකු ඒකීයකරණය හෙවත් තව්හීදයත් සමග මහපොළොව පිරෙන තරම් වැරදි සමග පැමිණෙන්නේද ඒ තරම් වූ සමාවක් අල්ලාහ් ඔහුට හිමි කර දෙනු ඇත. නමුත් එය අල්ලාහ්ගේ අභිමතය අනුව සිදුවන්නකි. ඔහු අභිමත කළේ නම් ඔහුට සමාව දෙනු ඇත. ඔහු අභිමත කළේ නම් ඔහුගේ පාපකම් සමග ඔහුව ග්‍රහණය කරයි. ඔහුගේ දඬුවම සදා නිරා ගින්නට හෙළන දඬුවමක් නොවනු ඇත. ඔහු ඉන් පිටව ස්වර්ගයට පිවිසෙනු ඇත.

මෙම කෘතියෙහි ෂෙයික් තුමා සඳහන් කළ අවසාන හදීසය මෙයයි. අල්ලාහ්ගේ උපකාරය හා අභිමතය පරිදි දැනුම නීති රීති හා විනය යන කරුණු ආවරණය වන පරිදි හදීස් පනහක් පූර්ණවත් කරමින් අපි ඒවා මෙහි සඳහන් කරන්නෙමු. අල්ලාහ් අපට නිවැරදි දෑ සඳහා ආශිර්වාද කරත්වා!

289. බුහාරි (6307)

290. මුස්ලිම් (2702)

## الحَدِيْثُ الثَّالِثُ والأَرْبَعُوْن
## හතළිස් තුන් වන හදීසය

عَنِ ابْنِ عَبَّاسٍ رَضِيَ اللهُ عَنْهُمَا قَالَ: قَالَ رَسُولُ اللهِ ﷺ:
"أَلْحِقُوا الْفَرَائِضَ بِأَهْلِهَا، فَمَا أَبْقَتِ الْفَرَائِضُ، فَلِأَوْلَى رَجُلٍ ذَكَرٍ" .
خَرَّجَهُ الْبُخَارِيُّ وَمُسْلِمٌ.

අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) ප්‍රකාශ කළ බව ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී.

නියමිත උරුමයන් එහි හිමිකරුවන්හට සේන්දු කරන්න, ඉතිරිව පවතින උරුමයන් පිරිමි පාර්ශවයට වඩාත් උචිතය. මෙය බුහාරි හා මුස්ලිම් යන ඉමාම්වරු විසින් වාර්තා කොට ඇත.

***

### -විග්‍රහය-

දේපොළ උරුමයන් එහි උරුමක්කරුවන් අතර බෙදා දීම සම්බන්ධයෙන් අල් කුර්ආනයේ සඳහන් ආකාරය පැහැදිලි කරන්නක් ලෙස ද උරුමක් කරුවන්ගේ තත්ත්වයන් හා ඔවුන්ගේ කොටස් පිළිබඳ අල් කුර්ආනයේ පැහැදිළිව සඳහන් කර නොමැති එසේ බෙදා දීමෙන් පසු ඉතිරි වන ධනය බෙදා දීමේ ක්‍රමය පැහැදිලි කරන්නක් ලෙස ද කුර්ආනයේ නාමිකව පවසා නැති ඉතිරි උරුමක්කරුවන් අතර බෙදා දෙන ක්‍රමය පැහැදිලි කරන්නක් ලෙස ද මෙම හදීසය පිහිටා ඇත.

මෙම හදීසය අල්කුර්ආන් පාඨ සමග සසඳා බලන කළ කොටස් අනිවාර්යයෙන්ම උරුම විය යුතු අය හා ඔවුන්ගෙන් පසු උරුමක්කරුවන්

යන සියල්ලන් අතර උරුමයන් බෙදීමේ දැනුම ක්‍රමානුකූලව පෙළගැසෙනු ඇත.[291]

291. දේපල උරුමය පිළිබඳ දැනුම හදාරන්නට මෙහි දී දිරිමත් කර ඇත. එය ජීවත්ව සිටින්නන් හා මිය ගිය ඇත්තන්ගේ උරුමය එමගින් ආරක්ෂා වන බැවිනි. මේ පිළිබඳ සඳහන් කිරීමේදී ‘පළමුව නැති වී යන දැනුම මෙය වේ’ යැයි සඳහන් වී පැමිණ ඇත. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්තරීෆි)

## الحَدِيْثُ الرَّابِعُ والأَرْبَعُوْن

## හතළිස් හතර වන හදීසය

عَنْ عَائِشَةَ رَضِيَ اللهُ عَنْهَا عَنِ النَّبِيِّ ﷺ قَالَ:
"الرَّضَاعَةُ تُحَرِّمُ مَا تُحَرِّمُ الْوِلاَدَةُ."
خَرَّجَهُ الْبُخَارِيُّ وَمُسْلِمٌ.

නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බව ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් වාර්තා කරන ලදී.

'බිහි කළ දරුවාට තහනම් කර ඇති දෑ කිරි දී හදාවඩා ගන්නා දරුවාට ද තහනම් කර ඇත.

මෙය බුහාරි හා මුස්ලිම් විසින් වාර්තා කරන ලදී.

***

-විග්‍රහය-

ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමියගෙන් ලබා උම්රා තුමිය විසින් වාර්තා කළ මෙම හදීසය බුහාරි හා මුස්ලිම් යන සහීහ් ග්‍රන්ථවල සඳහන් වේ. එමෙන්ම නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බවට ආඉෂා තුමියගෙන් ලබා උර්වා විසින් වාර්තා කළ තවත් වාර්තාවක් ඉමාම් මුස්ලිම් මෙසේ සඳහන් කර ඇත: 'පරපුරින් තහනම් වන දෑ කිරි දී හදා වඩා ගැනීමෙන් ද තහනම් වන්නේය.' නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බවට ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් කළ තවත් වාර්තාවක් ඇසුරෙන් මෙම හදීසය බුහාරි හා මුස්ලිම් යන යන ඉමාම්වරු දෙදෙනාද වාර්තා කොට ඇත.

සමස්තයක් වශයෙන් මෙම හදීසය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විද්වත්හු ඒකමතිකව එකඟ වී ඇත්තාහ. සැබැවින්ම පරම්පරාව හේතුවෙන්

කවර කරුණක් තහනම් වන්නේ ද එය කිරි දී හදා වඩා ගැනීම තුළින් ද තහනම් වන්නේය.[292]

292. කිරි දී හදාවඩා ගැනීම තුළින් ඇතැම් කරුණු තහනම් වනවාක් පමණය. නමුත් එය මව් කුස සමග සම්බන්ධ නොවන්නකි. එසේ සම්බන්ධකම් ඇති වනුයේ යහපත් අයුරින් පූර්ණ ලෙස උපකාර කිරීම හා ගිවිසුම මැනවින් ඉටු කිරීම පදනම් කර ගනිමිනි. නබි (ﷺ) තුමාට කිරි දුන් වහලියක් නිදහස් කිරීම වෙනුවෙන් නිරයේ වෙසෙන අබූ ලහබ් වෙනුවෙන් එතුමාණන් වූවාක් මෙන් එසේ ප්‍රසිද්ධ ප්‍රකාශ සඳහන් වී පැමිණ ඇත.

කිරි දී හදා වඩා ගැනීම භාග්‍යයකි. උපකාරයකි. ඒ වෙනුවෙන් කෘතඥ වීම හා උපකාර කිරීම අවශ්‍ය වේ. (අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්තරීෆි)

## الحَدِيْثُ الخَامِسُ والأَرْبَعُوْن

## හතළිස් පස් වන හදීසය

عَنْ جَابِرِ بْنِ عَبْدِ اللهِ أَنَّهُ سَمِعَ النَّبِيَّ ﷺ عَامَ الْفَتْحِ وَهُوَ بِمَكَّةَ يَقُولُ:

"إِنَّ اللهَ وَرَسُولَهُ حَرَّمَ بَيْعَ الْخَمْرِ وَالْمَيْتَةِ وَالْخِنْزِيرِ وَالْأَصْنَامِ"

فَقِيلَ: يَا رَسُولَ اللهِ، أَرَأَيْتَ شُحُومَ الْمَيْتَةِ، فَإِنَّهُ يُطْلَى بِهَا السُّفُنُ، وَيُدْهَنُ بِهَا الْجُلُودُ، وَيَسْتَصْبِحُ بِهَا النَّاسُ؟

قَالَ: "لَا، هُوَ حَرَامٌ"

ثُمَّ قَالَ رَسُولُ اللهِ ﷺ عِنْدَ ذَلِكَ: "قَاتَلَ اللهُ الْيَهُودَ، إِنَّ اللهَ حَرَّمَ عَلَيْهِمِ الشُّحُومَ، فَأَجْمَلُوهُ، ثُمَّ بَاعُوهُ، فَأَكَلُوا ثَمَنَهُ."

خَرَّجَهُ الْبُخَارِيُّ وَمُسْلِمٌ.

සැබැවින්ම නබි (ﷺ) තුමාණන් ජයග්‍රහණයේ දින මක්කාවේ සිටියදී එතුමා පවසා සිටි ප්‍රකාශයකට තමන් සවන් දුන් බව පවසමින් ජාබිර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී.

'සැබැවින්ම අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් මත් ද්‍රව්‍ය, මිය ගිය සතුන් ශූබරයින් හා පිළිම ව්‍යාපාර කිරීම තහනම් කර ඇත්තාහ.'

එවිට අල්ලාහ්ගේ දූතයාණනි, මිය ගිය සතුන්ගේ මේදය ගැන ඔබ කුමක් සිතන්නෙහි ද? සැබැවින්ම එයින් නැව්වලට අලේප කරනු ලබයි. සම්වලට තෙල් අලේප කරනු ලබයි. එමෙන්ම ජනයා එමගින් අලෝකය දල්වති. යැයි විමසනු ලැබීය.

එතුමා 'නැත! එය තහනම්ය' යැයි පිළිතුරු දුන්හ.

පසුව අල්ලාහ්ගේ දූතයාණන් ඒ සම්බන්ධයෙන් මෙසේ පවසා සිටියහ: 'අල්ලාහ් යුදෙව්වන් විනාශ කර දැමීය. සැබැවින්ම අල්ලාහ් ඔවුනට මේදය තහනම් කළේය. නමුත් ඔවුන් එය අලංකාරවත් කොට පසුව එය විකුණා එහි ලාභයෙන් අනුභව කළෝය.'

මෙය ඉමාම් බුහාරි හා මුස්ලිම් විසින් වාර්තා කර ඇත.

***

-විග්‍රහය-

මෙම හදීසය බුහාරි හා මුස්ලිම් යන ඉමාම්වරු දෙදෙනා ඔවුනොවුන්ගේ සහීහ් ග්‍රන්ථවල සඳහන් කර ඇත. නබි (ﷺ) තුමා '... සැබැවින්ම අල්ලාහ් යමක් අනුභව කිරීම තහනම් කළ විට ඉන් ලැබෙන ලාබය ද ඔහු ඔවුනට තහනම් කළේය' යැයි පැවසූ බව ඉබ්නු අබ්බාස් තුමා විසින් වාර්තා කරන ලද හදීසයක් අබූ දාවූද් විසින් දන්වා ඇත.[293]

නබි (ﷺ) තුමාණන් පැවසූ බවට අබූ හුරෙය්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් බුහාරි හා මුස්ලිම්හි මෙසේ සඳහන් වේ. "අල්ලාහ් යුදෙව්වන් විනාශ කළේය. ඔවුන් හට මේදය තහනම් කරනු ලැබීය. නමුත් ඔවුහු එය විකුණා එහි ලාබය අනුභව කළෝය.[294]

ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් වාර්තා කළ හදීසයක් බුහාරි හා මුස්ලිම්හි මෙසේ සඳහන් වේ. 'සූරා අල් බකරා හි අවසන් ආයාත් කිහිපය

293. අබූ දාවූද් (3488), ඉමාම් අහ්මද් ඔහුගේ මුස්නද් නම් ග්‍රන්ථයෙහි (1/247), ෂෙයික් අහ්මද් ෂාකිර් මුස්නද් ග්‍රන්ථය සඳහා වූ අර්ථ කථනයෙහි (4/48) එය සහීහ් ගණයට අයත් වාර්තාකරණයක් බව සඳහන් කර ඇත.

294. බුහාරි (2224), මුස්ලිම් (1582)

පහළ කරනු ලැබූ කල්හි අල්ලාහ්ගේ දූතයාණන් බැහැරට ඇවිත් මිනිසුන්හට ඒවා පාරායනය කර පෙන්වූහ. පසුව මධ්‍යසාර ව්‍යාපාර කිරීමෙන් වැළැක්වූහ.' මුස්ලිම් සතු තවත් වාර්තාවක: 'පොලිය සම්බන්ධයෙන් වූ සූරා අල් බකරාහි අවසන් ආයාත් කිහිපය පහළ කරනු ලැබූ කල්හි අල්ලාහ්ගේ දූතයාණන් බැහැරට ඇවිත් මස්ජිදයට ගොස් මධ්‍යසාර ව්‍යාපාර කිරීම තහනම් කළහ.[295]

නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බවට අබූ සර්ද් (රළියල්ලාහු අන්හු) තුමා වාර්තා කළ හදීසයක් ඉමාම් මුස්ලිම් තුමා මෙසේ දන්වා සිටියි. "සැබැවින්ම අල්ලාහ් මධ්‍යසාර තහනම් කළේය. එහෙයින් ඒවායින් කිසිවක් තමන් ළඟ තිබියදී කවරෙකුහට මෙම ආයතය දැන ගන්නට ලැබෙන්නේ ද ඔහු එයින් පානය නොකරත්වා ව්‍යාපාර නොකරත්වා" යැයි පැවසූහ. පසුව ජනයා ඔවුන් ළඟ තිබූ දෑ ගෙනැවිත් මදීනාවේ මාර්ගයේ තබා ඒවා හළා දැමූහ.[296]

ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක් ඉමාම් මුස්ලිම් තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. සැබැවින්ම මිනිසෙකු අල්ලාහ්ගේ දූතයාණන් වෙත මධ්‍යසාර බඳුනක් පරිත්‍යාගයක් කළේය. එවිට අල්ලාහ්ගේ දූතයාණන් ඔහුගෙන්: "සැබැවින්ම අල්ලාහ් එය තහනම් කර ඇති බව ඔබ නොදන්නෙහි දැ?"යි විමසීය. ඔහු 'නැතැ'යි පිළිතුරු දුන්නේය. පසුව ඔහු මිනිසෙකුට රහසින් පෙන්වීය. අල්ලාහ්ගේ දූතයාණන් 'ඔබ ඔහුට රහසින් පෙන්වූයේ කුමක් පිළිබඳව දැයි' ඔහුගෙන් විමසා සිටියහ. ඔහු: එය විකුණා දමන මෙන් මම ඔහුට නියෝග කළෙමි. යැයි පැවසීය. එතුමාණෝ: සැබැවින් "බීමට තහනම් කළ දෑ විකිණීමට ද තහනම් වන්නේය" යැයි පැවසූහ. පසුව මල්ලෙහි ඇති දෑ ඉවත යන පරිදි එය විවෘත කළේය.[297]

මෙම හදීස් සියල්ල සමස්තයක් ලෙස බැලූ විට ප්‍රයෝජන ලබන්නට අල්ලාහ් තහනම් කළ යමක් වී නම්, එය විකිණීමත් එහි ලාබය අනුභව කිරීමත් තහනම් වන්නේය. ඉහත සඳහන් කළ 'සැබැවින්ම අල්ලාහ් යමක් තහනම් කළේ නම් එහි වටිනාකම ද තහනම් කළේය.' යන වාර්තාවෙහි එය පැහැදිළිව සඳහන්

295. බුහාරි (459), මුස්ලිම් (1580)

296. මුස්ලිම් (1578)

297. මුස්ලිම් (1579)

වී ඇත. මෙම ප්‍රකාශය පොදු ප්‍රකාශයකි. ප්‍රයෝජනය ලැබීම තහනම් වන සෑම කරුණකම මෙම කියමන වලංගු වන්නේය.

## الحَدِيْثُ السَّادِسُ والأَرْبَعُوْن

## හතළිස් හය වන හදීසය

عَنْ أَبِي بُرْدَةَ، عَنْ أَبِيهِ، (أَبِي مُوسَى الْأَشْعَرِيِّ)
أَنَّ النَّبِيَّ ﷺ بَعَثَهُ إِلَى الْيَمَنِ، فَسَأَلَهُ عَنْ أَشْرِبَةٍ تُصْنَعُ بِهَا.
فَقَالَ: وَمَا هِيَ؟ قَالَ: الْبِتْعُ وَالْمِزْرُ، فَقِيلَ لِأَبِي بُرْدَةَ: وَمَا الْبِتْعُ؟ قَالَ: نَبِيذُ الْعَسَلِ، وَالْمِزْرُ نَبِيذُ الشَّعِيرِ،
فَقَالَ: "كُلُّ مُسْكِرٍ حَرَامٌ" خَرَّجَهُ الْبُخَارِيُّ.

අබූ බුර්දා (රළියල්ලාහු අන්හු) තුමා තම පියාණන් වූ අබූ මූසා අල් අෂ්අරී තුමාගෙන් ලබා ගත් හදීසයක් ඔහු විසින් මෙසේ වාර්තා කරන ලදී.

නබි (ﷺ) තුමාණෝ ඔහුව (අබූ මූසා අල් අෂ්අරීව) යමන් දේශයට යැවූහ. එතුමා ඔහුගෙන් එහි නිෂ්පාදනය කරන බීම වර්ග පිළිබඳ විමසමින් 'ඒවා මොනවා දැයි?' ඇසූහ. ඔහු අල් 'බිත්උ' හා 'අල් මිස්ර්' වේ යැයි පිළිතුරු දුන්නේය.

ඒ මොහොතේ අබූ බුර්දාගෙන් අල් 'බිත්උ' යනු කුමක්දැ?යි විමසනු ලැබූ විට එය මී පැණිවලින් සාදන ලද මධ්‍යසාර පානයක් බවත් 'මිස්ර්' යනු බාර්ලිවලින් සාදන ලද මධ්‍යසාර පානයක් බවත් පිළිතුරු දුන්නේය.

පසුව එතුමා: 'මත් බව ඇති කරන සියලු දෑ තහනම් වේ' යැයි පවසා සිටියහ.

***

## -විග්‍රහය-

මෙය බුද්ධිය පහ කරන සියලුම වර්ගයේ මත් ද්‍රව්‍ය හා මත් පැන් පරිහරනය තහනම් කිරීමේ මූලික හදීසයකි.

බුද්ධිය පහ කරන මත් ද්‍රව්‍ය වර්ග දෙකක් බව ඔබ දැන ගත යුතුය.

ඒවායින් පළමුවැන්න: එතුළ මිහිරි බවක් හා සුවයක් ඇති දෑය. පානය කිරීමට තහනම් කරන ලද මධ්‍යසාර එය වේ. විද්වතුන් පිරිසක් පවසා ඇත්තේ: 'එම මත් බව ඇති කරන වස්තුව ද්‍රව්‍යයක් හෝ සාරයක් හෝ වේවා ආහාරයක් හෝ පානයක් හෝ වේවා ධාන්‍යක් හෝ පළතුරක් හෝ වේවා කිරි හෝ වෙනත් දැයකින් හෝ වේවා ඒ සියල්ල එක සමානය. කංසා කොළවලින් සාදන ලද ගංජා හා මත් බව හා මිහිරක් ඇති කිරීම සඳහා භාවිත කරන වෙනත් දෑ ද මෙම කරුණ තුළට ඔවුහු ඇතුළත් කර ඇත.

උම්මු සලමා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් ලබා ෂහ්ර් ඉබ්නු හූෂබ් විසින් වාර්තා කරන ලද හදීසයක් සුනන් අබී දාවුද්හි මෙසේ සඳහන් වේ.

ඇය: 'ශරීරයට අහිත කරන හා මත් බව ඇති කරන සෑම දෙයකින්ම අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) තුමා තහනම් කළ බව පවසා සිටියාය.[298] ශරීරයට අහිත කරන දෑ හදීසයේ සඳහන් වන්නේ 'මුෆත්තිරින්' යන පදයෙනි. මත් බව ඇති කිරීමේ සීමාව දක්වා නොතිබුණ ද එය තහනම් වන්නේය.

දෙවැන්න: බුද්ධිය පහ කරන හා මත් බව ඇති කරන නමුත් එහි කිසිදු සුවයක් හෝ මිහිරක් හෝ නොමැති නිර්වින්දනයන් වැනි දෑය. අපගේ සමකාලීනයන් පවසා සිටිනුයේ: ප්‍රතිකාර කිරීමේ අවශ්‍යතාවක් සඳහා එය භාවිත කරන්නේ නම් අනුමත බවය. නමුත් බහුතරයක් දෙනා එයින් ඉවත්ව සිටීම යහපත් යැයි පවසති. ප්‍රතිකාර කිරීමේ අවශ්‍යතාකින් තොරව එය භාවිත කරන්නේ නම් අපගේ සමකාලීනයන් වැඩි දෙනා පවසනුයේ එය තහනම් කරනු ලැබූවක්

298. අබූ දාවූද් (3686) 'ළඊෆු සුනනි අබී දාවුද්' නම් කෘතියෙහි 793 දරණ අංකය යටතේ එය දුර්වල හදීසයක් බව ෂෙයික් අල් අල්බානී තුමා සඳහන් කර ඇත.

බවයි. කිසිදු අවශ්‍යතාවකින් තොරව බුද්ධිය පහ කිරීම එයට හේතුවන බව ඔවුහු පවසති. මත් ද්‍රව්‍ය පානය කිරීම මෙන් එය ද තහනම් වන්නේය.

ඒ සඳහා වූ දණ්ඩ නීතිය වනාහි: දැඩි ලෙස මත් බව හා වින්දනයක් ඇති දෑ පරිහරනය කිරීමෙන් දඬුවම අනිවාර්යය වන්නේය. ඊට හේතුව මිනිස් සිත් එය පතන බැවිනි. එහෙයින් එයින් වැළැක්වීමක් වශයෙන් දණ්ඩ නීතිය නියම කර ඇත.

කිසිදු මිහිරි භාවයක් හෝ වින්දනයක් හෝ නොමැති මත් බව ඇති කරන දෑ වනාහි, එයට අවවාද කිරීමක් මිස වෙනත් දඬුවමක් නැත. ඊට හේතුව එය වළක්වන ලද ප්‍රමාණයේ සීමාව දක්වා අවශ්‍ය වන තරමට මිනිස් සිත් එය නොපතන බැවිනි. එය සතුන් හා ශූබර මාංශ අනුභවය හා රුධිරය පානය කිරීම හා සමානය.

***

## الحَدِيْثُ السَّابِعُ والأَرْبَعُوْن

## හතළිස් හත් වන හදීසය

عَنِ الْمِقْدَامِ بْنِ مَعْدِي كَرِبَ قَالَ: سَمِعْتُ رَسُولَ اللهِ ﷺ يَقُولُ:

"مَا مَلَأَ آدَمِيٌّ وِعَاءً شَرًّا مِنْ بَطْنٍ، بِحَسْبِ ابْنِ آدَمَ أَكَلَاتٌ يُقِمْنَ صُلْبَهُ، فَإِنْ كَانَ لَا مَحَالَةَ، فَثُلُثٌ لِطَعَامِهِ، وَثُلُثٌ لِشَرَابِهِ، وَثُلُثٌ لِنَفَسِهِ»

رَوَاهُ الْإِمَامُ أَحْمَدُ وَالتِّرْمِذِيُّ وَالنَّسَائِيُّ وَابْنُ مَاجَهْ، وَقَالَ التِّرْمِذِيُّ: حَدِيثٌ حَسَنٌ.

අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) කළ ප්‍රකාශයකට මම සවන් දුනිමි යැයි අල් මික්දාම් ඉබ්නු මඃදි කරිබ් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී.

“මිනිසෙකු තම බඩට වඩා දරුණු ලෙස කිසිදු භාජනයක් පුරවන්නේ නැත. මිනිස් පුත්‍රයකුට ඔහුගේ කොන්ද කෙළින් තබා ගන්නා කටවල් කිහිපයක් ප්‍රමාණවත්ය. ඔහුට එසේ කිරීමට අවශ්‍ය නම්, තුනෙන් කොටසක් ඔහු ආහාරය සඳහා වෙන් කළ යුතුය. එමෙන්ම තුනෙන් කොටසක් බීමට සහ තුනෙන් කොටසක් ඔහුගේ හුස්ම සඳහා වෙන් කළ යුතුය. ”
මෙය අහ්මද්, තිර්මිදි, නසාඊ, ඉබ්නු මාජා යන ඉමාම්වරු විසින් දන්වා ඇති අතර ඉමාම් තිර්මිදි මෙය හසන් ගණයට අයත් හදීසයක් බව දන්වා ඇත.

***

-විග්‍රහය-

මෙම හදීසය සියලුම ප්‍රතිකාරවල මූලධර්මයන් ඒකරාශී කරගත් මූලධර්මයකි.

වෛද්‍ය ඉබ්නු මාසවිය්යාහ් අබූ හයිසුමාගේ කෘතියෙහි මෙම හදීසය කියවන කල්හි ඔහු මෙසේ පවසා සිටියේය. ජනයා මෙම ප්‍රකාශය අනුව කටයුතු කරන්නේ නම් ලෙඩ රෝගවලින් සුවය ලබනු ඇත. වෛද්‍ය මධ්‍යස්ථාන හා ඖෂද වෙළඳ සැළවල් වැසී යනු ඇත. ඔහු එසේ පවසා සිටියේ සෑම ලෙඩකටම මූලය අසීමිත ලෙස ආහාර ගැනීම වන බැවිනි. එමෙන්ම සමහරු සෑම ලෙඩකටම මූලය අසීමිත ලෙස ආහාර ගැනීම යැයි පවසති. මෙම ප්‍රකාශය මර්ෆූඃ ගණයට අයත් බව වාර්තා කර තිබුණ ද ඒ පිළිබඳ නිවැරැදි ප්‍රකාශයක් නොමැත. අරාබි වෛද්‍යවරයකු වූ අල් හාරිස් ඉබ්නු කල්දා: 'රෝගයේ මූලය ආහාරයයි. ප්‍රතිකර්මයේ මූලය කුසයි.' යනුවෙන් පවසා ඇත. එය ද මර්ෆූඃ ගණයට අයත් හදීසයක් ලෙස පැවසුව ද ඒ සඳහා කිසිදු නිවැරැදි සඳහනක් නොමැත.

මේවා ශරීර සුවය හා සෞඛ්‍යය පිළිබඳ සලකා බැලීමේදී අහාර ගැනීමේ ආශාව අතහැර දැමීමෙන් හා ආහාර අඩුවෙන් ගැනීමෙන් ඇතිවන ප්‍රයෝජන කිහිපයකි.

මෙමගින් හදවතට සහ එහි ආරෝග්‍යමත්භාවයට ලැබෙන ප්‍රතිලාභ වනාහි: ආහාර අඩුවෙන් ගැනීම හදවතේ මෘදු භාවයටත් වටහා ගැනීමේ ශක්තියටත් ආත්මාශාවන් බිඳ දැමීමටත් ආශාවන් හා කෝපය හීන කිරීමටත් ඉවහල් වන අතර අධික ලෙස ආහාර ගැනීම ඒ සියල්ලට ප්‍රතිවිරුද්ධ විපාක ගෙන දෙනු ඇත.

ඉබ්නු අබිද් දුන්යා ඔහුගේ 'අල් ජූඃ' නම් කෘතියෙහි මුහම්මද් බින් වාසිඃ තුමා විසින් වාර්තා කළ හදීසයක් මෙසේ වාර්තා කරයි. එතුමා: කවරෙකු තම ආශාවන් අඩු කර ගන්නේ ද ඔහු වටහා ගනු ඇත. මනා අවබෝධය ලබනු ඇත. සුවය ලබනු ඇත. මෘදු බවට පත් වනු ඇත. සැබැවින්ම අධික ලෙස ආහාර ගැනීම ඔහු අපේක්ෂා කරන බොහෝ දෑ ඔහුට බරක් වනු ඇත.

උස්මාන් ඉබ්නු සාඉදා තුමා විසින් කළ වාර්තාවක එතුමා : සුෆ්යාන් සව්රී මා වෙත ලිපියක් ලිව්වේය. එහි 'ඔබේ ශරීරය සුවෙන් තැබීමට ඔබ සිතන්නෙහි නම් ඔබේ නින්ද අඩු විය යුතුය. එමෙන්ම ආහාර ගැනීම අඩු කර ගන්න.

මාලික් ඉබ්නු දීනාර් තුමා විසින් කළ වාර්තාවක එතුමා: 'මුඃමින්වරයකුට ඔහුගේ කුස පුරවන දෑ ගැන වඩාත් සැලකීමත්වීමත් ඔහුගේ ආශාවන් ඔහු අබිබවා යෑමත් සුදුසු නොවන්නේය.'

***

අල්-මික්දාම් තුමාගේ හදීසයෙහි නබි (ﷺ) තුමා ආහාර අඩුවෙන් ගැනීම සිරිතක් කරගත් බව සඳහන් වේ. එතුමා: ආදම්ගේ පුතණුවන්ට තම කොන්ද කෙළින් තබා ගැනීම සඳහා ආහාර කටවල් කිහිපයක් ප්‍රමාණවත් වේ යැයි පවසා සිටියේය. මූඃමින්වරයෙකුට වඩා යහපත් වන්නේ ඔහුගේ කුසෙහි තුනෙන් කොටසක් ආහාර සඳහාත් තුනෙන් කොටසක් බීම සඳහාත් වෙන් කොට තුනෙන් කොටසක් වාතය සඳහා අතහැර දැමීමය. අධික ලෙස පානය කිරීම නින්ද ඇති කරනවාක් මෙන්ම ගන්නා ආහාරයේ පෝෂණය ද විනාශ කරනු ඇත.

නබි (ﷺ) තුමා සහ එතුමාගේ අනුගාමිකයෝ බොහෝ වේලාවන්හි කුසගින්නෙන් සිට ඇත. තමන්ගේ ආශාවන්ට අනුව ආහාර ගෙන ඇත්තේ අඩුවෙනි. එය ආහාර නොලැබුණු නිසාවෙන් නොව, අල්ලාහ් ඔහුගේ දූතයාණන්ට පූර්ණ හා වඩාත් යහපත් තත්ත්වයන් තෝරා දී තිබුණු වාතාවරණයකදීය.

මුස්ලිම් හි සඳහන් ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් වාර්තා කරන ලද හදීසයක, එතුමිය: ‘අල්ලාහ්ගේ දූතයාණන්(ගේ ජීවිතය) අත්පත් කර ගනු ලබන තෙක්ම අඛණ්ඩව දින දෙකක් එක දිගට තිරිඟු රොටිවලින් තම කුස පුරවාගත්තේ නැත.’[299]

මුස්ලිම් හි සඳහන් උමර් (රළියල්ලාහු අන්හු තුමා) විසින් වාර්තා කළ තවත් හදීසයක, එතුමා කුත්බා දේශනාවක් කළේය. ජනයා මෙලොව අත්විඳින දෑ පිළිබඳ මෙනෙහි කරමින් ‘අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) දිනක් ඇඹරෙමින් සිටිනු මම දුටිමි. තම කුස පුරවා ගන්නා තරමට රට ඉඳි කැබැල්ලක් හෝ එතුමා නොලැබූහ.’ යැයි පවසා සිටියේය.[300]

299. මුස්ලිම් (2970)

300. මුස්ලිම් (2978)

## الحَدِيْثُ الثَّامِنُ والأَرْبَعُوْن

## හතළිස් අට වන හදීසය

عَنْ عَبْدِ اللهِ بْنِ عَمْرٍو رَضِيَ اللهُ عَنْهُمَا عَنِ النَّبِيِّ - ﷺ -، قَالَ:
"أَرْبَعٌ مَنْ كُنَّ فِيهِ كَانَ مُنَافِقًا، وَمَنْ كَانَتْ خَصْلَةٌ مِنْهُنَّ فِيهِ كَانَتْ فِيهِ خَصْلَةٌ مِنَ النِّفَاقِ حَتَّى يَدَعَهَا: مَنْ إِذَا حَدَّثَ كَذَبَ، وَإِذَا وَعَدَ أَخْلَفَ، وَإِذَا خَاصَمَ فَجَرَ، وَإِذَا عَاهَدَ غَدَرَ.»

خَرَّجَهُ الْبُخَارِيُّ وَمُسْلِمٌ.

නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බව අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

“කරුණු හතරක් ඇත. කවුරුන් තුළ ඒවා තිබෙන්නේ ද ඔහු කුහකයකු වන්නේය. ඒවායින් එකක් ඔහු තුළ වුව ද එය ඔහු අතහැර දමන තෙක් කුහකත්වයේ කරුණක් ඔහු තුළ පිහිටයි: (එනම්) කතා කළ විට බොරු තෙපළන්නා, ප්‍රතිඥා දුන් විට කඩ කරන්නා, වාද කරන විට වැරදි කරන්නා හා ගිවිසුම් කළ විට වංචා කරන්නා”

මෙම හදීසය බුහාරි හා මුස්ලිම් විසින් දන්වා ඇත.

***

-විග්‍රහය-

මෙය සහීහ් බුහාරි හා සහීහ් මුස්ලිම් හි සඳහන් හදීසයකි.

භාෂා වේදීන් මෙය විග්‍රහ කර ඇත්තේ සැබැවින්ම කුහකත්වය යනු භාෂාමය වශයෙන් වංචාව, කුමන්ත්‍රණ කිරීම, යහපත මතුපිටින් පෙන්වා අභ්‍යන්තරය එයට පටහැනිව පිහිටීම යන ගණයට අයත් වන බවයි.

ආගමික වශයෙන් එය කොටස් දෙකකට බෙදේ.

පළමුවැන්න: අන්-නිෆාකුල් අක්බර් හෙවත් මහා කුහකත්වය. එනම්, අල්ලාහ් පිළිබඳ හා ඔහුගේ දූතවරු, ඔහුගේ දිව්‍යමය ග්‍රන්ථ, ඔහුගේ දහම් දූතවරු හා අවසන් දිනය පිළිබඳ විශ්වාසය මිනිසා මතුපිටින් පෙන්වා අභ්‍යන්තරයෙහි ඒ සියල්ල හෝ ඉන් කොටසක් හෝ ප්‍රතික්ෂේප කිරීමයි. මෙය නබි (ﷺ) තුමාගේ කාලයේ පැවතුනු කුහකත්වයයි. එවැන්නන් නින්දා අපහාස කරමින් ඔවුන් ප්‍රතික්ෂේප කරමින් කුර්ආනය පහළ විය. එයට අදාළ වූවන් නිරා ගින්නේ පහත්ම තලයේ සිටින බව එය අවධාරණය කර සිටියි.

දෙවැන්න: අන්-නිෆාකුල් අස්ගර් හෙවත් සුළු කුහකත්වය. එය ක්‍රියාවන්හි ඇති වන කුහකත්වයයි. එනම් මිනිසා දැහැමි කටයුතු ප්‍රසිද්ධයේ පෙන්වා අභ්‍යන්තරයේ එයට වෙනස් ව කටයුතු කිරීමයි.

කුහකත්වයේ මෙම මූලධර්මයන් හදීසයේ සඳහන් කරනු ලබන කරුණු වෙත යොමු වෙයි.[301] ඒවා කරුණු පහකි.

පළමුවැන්න: කෙනෙකු සත්‍ය ප්‍රකාශයක් ලෙස සිතන තරමට කතා කිරීමය. නමුත් ඔහු ඔහුට පවසා ඇත්තේ බොරුවකි.

දෙවැන්න: ප්‍රතිඥා දුන් විට කඩ කිරීම. එය වර්ග දෙකකි.

1. ප්‍රතිඥාව ඉටු නොකරන අදිටනින් ප්‍රතිඥාව දීම. මෙය දිවුරීමේ වඩාත්ම නපුරුම දිවුරුමයි.
2. ප්‍රතිඥාව ඉටු කිරීමේ අදිටනින් ප්‍රතිඥාව දුන් පසුව අළුතින් අදහසක් පහළ වී කිසිදු හේතුසාධකයක් නොමැතිවම දිවුරුම කඩ කිරීමය.

තුන්වැන්න: වාද කළ විට කූටකම් කිරීම.

ඉන් අදහස් වනුයේ උවමනාවෙන්ම සත්‍යයෙන් පෙරළී සත්‍යය බොරු බවට හෝ බොරුව සත්‍යය බවට පෙරළෙන තෙක් වාද කිරීමය. තර්ක කිරීමට හැකියාව ඇති මිනිසෙකු අසත්‍යය ජය ලබන්නට වාද කර සවන් දෙන්නාට

301. බුහාරි හා මුස්ලිම් හි සඳහන් අබූ හුරෙය්රා (රළියල්ලාහු අන්හු) තුමාගේ හදීසය සමගිනි. එහිදී 'ඔහුව විශ්වාස කරනු ලැබූ විට වංචා කරයි' යනුවෙන් සඳහන්ව ඇත.

එය සත්‍යය බව අවධාරණය කර සිටියේ නම් තහනම් කළ දැයින් ඉතා බරපතලම කරුණ හා කුහකත්වයේ ලක්ෂණ අතුරින් ඉතා පිළිකුල් සහගත ලක්ෂණය එය වන්නේය.

සිව්වැන්න: පොරොන්දු දුන් විට පොරොන්දුව ඉටු නොකර එය පැහැර හැරීමය.

පස්වැන්න: විශ්වාසය කඩ කිරීම. මිනිසෙකුට විශ්වාසයෙන් යුතුව යම් පැවරුමක් පවරනු ලැබූ විට එය ඉටු කිරීම අනිවාර්යය වන්නේය. විශ්වාසයෙන් පවරනු ලැබූ දැයක් සම්බන්ධයෙන් වංචා කිරීම කුහකත්වයේ ලක්ෂණයකි.

මෙම කරුණ දෙස සමස්තයක් ලෙස බැලූ විට, සැබැවින්ම සියලුම ආකාරයේ කුහකකම් රහසිගත හා ප්‍රසිද්ධියේ සිදු වන වෙනස් වීම් වෙත යොමු වන බවයි.

මෙහි දී සහාබාවරු කුහකත්වය සම්බන්ධයෙන් තමන් ගැනම බියට පත් වූහ. උමර් (රළියල්ලාහු අන්හු) තුමා තමන් ගැන හුදෙයිෆා (රළියල්ලාහු අන්හු තුමාගෙන් නිතර විමසා ඇත්තාහ.[302]

අබූ රජාඃ අල් උතාරිදීගෙන් මුහම්මද් (ﷺ) තුමාගේ සහගාමීන් අතුරින් කුහකත්වයට බිය වූ සහගාමීන් ඔබ මුණ ගැසී ඇත්තේ දැයි විමසන ලදී. එවිට ඔහු: 'එසේය, අල්ලාහ්ගේ ප්‍රශංසාවෙන් ඔවුන් අතරින් අවංක හදවත් ඇත්තන් මම දැක ඇත්තෙමි. එසේය ඉතා දැඩි ලෙස සිටිනු! එසේය ඉතා දැඩි ලෙස සිටිනු දැක ඇත්තෙමි.[303]

ඉබ්නු අබූ මුලෙයිකා පැවසූ බව ඉමාම් බුහාරි තුමා තම සහීහ් ග්‍රන්ථයෙහි මෙසේ සඳහන් කර ඇත. නබි (ﷺ) තුමාගේ අනුගාමිකයින් තිස් දෙනෙකු මම මුණ ගැසී ඇත්තෙමි. ඔවුන් සියලු දෙනාම කුහකත්වය සම්බන්ධයෙන් තමන්

302. එනම්, නබි (ﷺ) තුමාණන් තමන්වත් කුහකයින්ගේ ලැයිස්තුවට ගණන් ගෙන ඇත්තේද යන්නයි?

303. එසේය යැයි ප්‍රකාශ කිරීමෙන් අදහස් කරනුයේ ඔවුන් එයට ඉතා දැඩි බියකින් පසුවූ බවය. පිළිතුර සඳහා ප්‍රශ්න කර සිටියේ මුආද්ය.

ගැන බියෙන් පසුවූවෝය. හසන් තුමා විසින් සඳහන් කර ඇත්තේ 'ඒ ගැන විශ්වාසවන්තයෙකු මිස බිය වන්නේ නැත. ඒ ගැන කුහකයකු මිස නිර්භයව සිටින්නේ ද නැත.'[304]

මේ සම්බන්ධයෙන් මුල් කාලීන් විද්වතුන් විසින් වාර්තා කර ඇති කරුණු බොහෝය.

ඉමාම් අහ්මද්ගෙන් මෙසේ විමසන ලදී. නිෆාක් හෙවත් කුහකත්වය සම්බන්ධයෙන් තමන් ගැන බිය නොවන්නන් පිළිබඳ ඔබ කුමක් පවසන්නෙහි ද? එවිට එතුමා: 'කුහකත්වය සම්බන්ධයෙන් අභයදායීව සිටිය හැක්කේ කා හට දැයි හෙතෙම විමසා සිටියේය.

කුහක ක්‍රියාවන් අතුරින් අති භයානකම කරුණ වනුයේ: මිනිසා යම් ක්‍රියාවක් සිදු කොට එමගින් තමන් යහපත අපේක්ෂා කරන බව මතුපිටින් පෙන්වීමය. සැබැවින්ම ඔහුගේ ක්‍රියාව ඔහු කුමන අරමුණක් සඳහා සිදු කළේ ද එය වෙත ළඟා වනු ඇත. එය ඔහුට පූර්ණව ඉටු වනු ඇත. මෙම කූටකම ඔහුගේ ඉලක්කය සමග සේන්දු වනු ඇත. ඔහුගේ උපක්‍රමය හා වංචාව පිළිබඳ ඔහු සතුටට පත්වනු ඇත. ඔහු කවර කරුණක් ප්‍රසිද්ධියේ ඉදිරිපත් කළේ ද ඒ සඳහා මිනිසුන් ඔහුට ප්‍රශංසා කරනු ඇත. ඔහු එමගින් සගවා සිටි ඔහුගේ අරමුණ වෙත සේන්දු වනු ඇත.

මුනාෆික් හෙවත් කුහකයින් හා යුදෙව්වන් පිළිබඳ අල්ලාහ් අල් කුර්ආනයේ තීන්දු කර ඇත්තේ මෙසේය.

කුහකයින් පිළිබඳ විනිශ්චය කිරීමේදී සූරා තව්බා 107 වැනි පාඨය මෙසේ පවසා සිටියි: "හානි සිදු කිරීමටත්, දේව ප්‍රතික්ෂේපයටත්, දේව විශ්වාසීන් අතර බෙදුම් ඇති කිරීමටත්, කවරෙක් මීට පෙර අල්ලාහ් හා ඔහුගේ දූතයාණන්ට එරෙහිව සටන් කළේ ද එවැන්නන්හට (ලැගුම් ගන්නා)

304. සහීහ් බුහාරි හි කිතාබ් අල් ඊමාන් පරිච්ඡේදය: පාඩම - මුඃමින් වරයා තමන් නොදැනුවත්වම තම ක්‍රියාවන් නිෂ්ඵල වී යෑම ගැන ඇති බිය.

අල් හාෆිල් ඉබ්නු රජබ් (රහිමහුල්ලාහ්) තුමා ඔහුගේ 'ෆත්හුල් බාරී ෂර්හු සහීහ් අල් බුහාරි' නම් පොතෙහි මේ ගැන විග්‍රහ කර ඇත්තේ අනෙකුත් කාරණා සමග බලන විට ඉතා අඩු විග්‍රහයකි. යැයි මා පවසා සිටින්නට කැමැත්තෙමි.

ස්ථානයක් ලෙසටත් දේවස්ථාන) ඉදි කර (ගත් ඔවුහු' අපි යහපත මිස වෙනකක් අපේක්ෂා නොකළෙමු 'යැයි දිවුරා පවසති. තවද ඔවුන් අසත්‍යවන්තයින් බව අල්ලාහ් සාක්ෂි දරන්නේය.''

යුදෙව්වන් පිළිබඳ විනිශ්චය කිරීමේදී සූරා ආලු ඉම්රාන් හි 188 වැනි පාඨය මෙසේ සඳහන් කරයි: ''තමන් කරමින් ආ දෑ පිළිබඳ සතුටු වන තව ද තමන් නොකළ දෑ පිළිබඳ ව ප්‍රශංසා කරනු ලැබීම ප්‍රිය කරනවුන් ගැන නුඹ නොසිතනු. දඬුවමින් ඔවුන් මිදෙනු ඇතැයි නුඹ නොසිතනු. තව ද ඔවුනට වේදනීය දඬුවමක් ඇත.''

සහාබාවරුන් ඉදිරියේ සැබැවින්ම කුහකත්වය යනු රහසිගත හා ප්‍රසිද්ධ දැහි වෙනස යැයි සහතික කරනු ලැබූ කල්හි, තමන් උපදෙසට සවන් දීමෙන් ඇතිවන වහල් භාවය බිය හා තම සිතට පහළ වන කරුණු මෙලොව කටයුතු සඳහා යන විට වෙනස් වනු ඇතැයි ද එය ඔහුව කුහකයකු බවට පත් කරනු ඇතැයි බිය වූහ. ඊට නිදසුනක් ලෙස සහීහ් මුස්ලිම් හි හන්ළලා අල් උසය්යිදී විසින් වාර්තා කළ හදීසය මතක් කර දෙයි. එතුමා හඬා වැළපෙමින් අබූ බක්ර් (රළියල්ලාහු අන්හු) තුමා අසළින් ගමන් ගත්තේය.[305] එවිට එතුමා 'ඔබට කුමක් සිදුවීදැ'යි විමසා සිටියහ. ඔහු: අහෝ අබූ බක්ර් හන්ළලා කුහකයකු විය. අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) තුමා ඉදිරියේ අපි සිටින්නෙමු. එතුමා අපට ස්වර්ගය හා නිරය පිළිබඳ උපදෙස් දෙයි. අපි එය දැසින් දකින්නාක් මෙන් පවතී. නමුත් අපි නැවත හැරී ගොස් පවුලත් සමග හා අල්ප කටයුතු සමග නිරත වන විට බොහෝ දෑ අපි අමතක කර දමන්නෙමු. යැයි පැවසීය. අබූ බක්ර් තුමා: අල්ලාහ් මත දිවුරා පවසමි. සැබැවින්ම අපගේ තත්ත්වයද එලෙසම යැයි පවසා දෙදෙනාම අල්ලාහ්ගේ දූතයාණන් වෙත ගියහ. එවිට එතුමා: 'අහෝ! හන්ළලා, ඔබට කුමක් වීදැ?යි විමසූහ. ඔහු: අහෝ! අල්ලාහ්ගේ දූතයාණනි, හන්ළලා කුහකයකු විය යැයි පිළිතුරු දී අබූ බක්ර් තුමාට පැවසූ දැම එතුමාණන්ට ද පවසා සිටියේය. එවිට එතුමාණන්: 'නුඹලා මා අබියස කවර තත්ත්වයක සිටින්නේ ද ඒ තත්ත්වයේම නිරන්තරයෙන්ම සිටින්නෙහු නම්, නුඹලාගේ සභාවන්හි හා නුඹලාගේ මාර්ගයන්හි

305. හැඬූ පුද්ගලයා හන්ළලා මිස අබූ බක්ර් තුමා නොවේ.

මලක්වරුන් නුඹලාට ප්‍රාර්ථනා කරනු ඇත. නමුත් හන්ළලා, එය මොහොතින් මොහොත සිදුවන්නකි.[306]

306. මූලාශ්‍රය: මුස්ලිම්, හදීස් අංක (2750)

## الحَدِيْثُ التَّاسِعُ والأَرْبَعُوْن

## හතළිස් නව වන හදීසය

عَنْ عُمَرَ بْنِ الْخَطَّابِ رَضِيَ اللهُ عَنْهُ عَنِ النَّبِيِّ - ﷺ - قَالَ:

"لَوْ أَنَّكُمْ تَوَكَّلُونَ عَلَى اللهِ حَقَّ تَوَكُّلِهِ، لَرَزَقَكُمْ كَمَا يَرْزُقُ الطَّيْرَ، تَغْدُو خِمَاصًا، وَتَرُوحُ بِطَانًا"

رَوَاهُ الْإِمَامُ أَحْمَدُ وَالتِّرْمِذِيُّ وَالنَّسَائِيُّ وَابْنُ مَاجَهْ وَابْنُ حِبَّانَ فِي "صَحِيحِهِ" وَالْحَاكِمُ،

وَقَالَ التِّرْمِذِيُّ: حَسَنٌ صَحِيحٌ.

නබි (ﷺ) තුමා ප්‍රකාශ කළ බව උමර් ඉබ්නු අල් කත්තාබ් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී.

"සැබැවින්ම නුඹලා අල්ලාහ්ට පැවරිය යුතු නියම අයුරින් ඔහු වෙත සියල්ල පවරන්නෙහු නම්, උදෑසන හිස් බඩින් ගොස් බඩ පුරවා ගෙන එන පක්ෂියාට ආහාර සපයන්නාක් මෙන් ඔහු නුඹලාට ආහාර සපයනු ඇත."

මෙය අහ්මද්, තිර්මිදි, නසාඊ, ඉබ්නු මාජා, 'සහීහ්'හි ඉබ්නු හිබ්බාන් අල් හාකිම් යන ඉමාම්වරු විසින් වාර්තා කර ඇත.

තිර්මිදි තුමා මෙය 'හසන් සහීහ්' ගණයට අයත් හදීසයක් බව පවසා සිටියි.

***

-විග්‍රහය-

මෙය තවක්කුල් හෙවත් සියල්ල අල්ලාහ් වෙතම පැවරීම යන කරුණ සම්බන්ධයෙන් සඳහන් වන මූලික හදීසයකි. සැබැවින්ම එය පෝෂණ සම්පත් ගෙන දෙන වඩාත් වැදගත් සාධකයකි. කීර්තිමත් අල්ලාහ් සූරා අත් තලාක් හි මෙසේ පවසයි. "... තවද කවරෙකු අල්ලාහ්ට බැතිමත් වන්නේ ද අල්ලාහ් ඔහුට බැහැර වන මගක් පාදා දෙන්නේය. ඔහු නොසිතූ අයුරින් ඔහුට පෝෂණ සම්පත් ලබා දෙන්නේය. කවරෙකු අල්ලාහ් වෙත විශ්වාසය තබා (සියල්ල භාර කර)න්නේ ද ඔහු ඔහුට ප්‍රමාණවත් වන්නේය." (අත්-තලාක්: 2,3)

තවක්කුල්හි යථාර්ථය: මෙලොව හා මතුලොව කටයුතු අතරින් යහපත ගෙන දෙන හා අයහපතින් වළක්වාලන සියලු කටයුතුවලදී කීර්තිමත් අල්ලාහ් වෙත තම හදවත ස්ථාපිත කිරීමේ සත්‍යතාව, සියලු කටයුතුවල භාරකාරත්වය ඔහු වෙත පැවරීම, හා ඔහු හැර වෙන කිසිවකුට ප්‍රයෝජනයක් ගෙන දීමට හෝ හානියක් කිරීමට හෝ පිරිනැමීමට හෝ වැළැක්වීමට හෝ හැකියාවක් නැති බවට විශ්වාසය තහවුරු කිරීමයි.

සඊද් ඉබ්නු ජුබයිර් තුමා: 'තවක්කුල් යනු විශ්වාසයේ එකතුව වේ' යැයි පවසා ඇත.

වහබ් ඉබ්නු මුනබ්බහ් තුමා: අවසාන ඉලක්කය තවක්කුල් වේ' යැයි පවසා ඇත.

හසන් තුමා: 'සැබැවින්ම ගැත්තා තම පරමාධිපති වෙත තබන තවක්කුල් (පැවරුම) වන්නේ, සැබැවින්ම අල්ලාහ් වන ඔහුය ඔහුගේ විශ්වසනීයයා බව ඔහු හඳුනා ගැනීමය.' යැයි පවසා සිටියි.

***

දැනගන්න, සැබැවින්ම තවක්කුල් තැබීම ස්ථිර කිරීම තුළින් අති පිවිතුරු අල්ලාහ් පෙර නියම කරන ලද හේතු සාධක තුළ ගමන් කිරීම අහෝසි කරන්නේ නැත. ඔහුගේ න්‍යාය ඒ අයුරින්ම ඔහුගේ මැවීම් අතර ක්‍රියාත්මක වේ. සැබැවින්ම තවක්කුල් තැබීම සම්බන්ධයෙන් අල්ලාහ් නියෝග කිරීමත් සමගම ඊට ඉවහල් වන සාධක පිළිබඳව ද නියෝග කර ඇත. ශරීර අවයව මගින් එම සාධක තුළ ක්‍රියා කිරීම ඔහුට අවනත වීමකි. හදවතින්ම ඔහු

කෙරෙහි තවක්කුල් තැබීම ඔහු ව විශ්වාස කිරීමකි. උත්තරීතර අල්ලාහ් සූරා නිසා 71 වැනි පාඨයේ මෙසේ සඳහන් කරයි. "අහෝ විශ්වාස කළවුනි, නුඹලා හැකි පමණින් (ආරක්ෂිත ක්‍රියාමාර්ග අනුගමනය කරමින්) ප්‍රවේසම් වනු." සූරා අල් අන්ෆාල් 60 වන පාඨයේ "නුඹලා හැකි පමණින් සන්නද්ධ බලයෙන් හා අශ්ව බලඇණියෙන් සූදානම් වන්න."

දැනගන්න, සැබැවින්ම තවක්කුල් හි ප්‍රතිඵලය විය යුත්තේ පෙරනියමය පිළිගැනීමය. කවරෙකු තම කටයුතු අල්ලාහ් වෙත පවරා ඔහු තමන්ට නියම කළ හා තෝරාදුන් දෑ පිළිගන්නේද සැබැවින්ම ඔහු ඔහු කෙරෙහි තබන තවක්කුල් තහවුරු කළේය.

එහෙයින් අල් හසන් හා ෆුලෙය්ල් තුමා ඇතුළු තවත් ඉමාම්වරු තවක්කුල් යන පදයට පිළිගැනීම යනුවෙන් විග්‍රහ කොට ඇත.

***

## الحَدِيْثُ الخَمْسُوْنَ

## පනස් වන හදීසය

عَنْ عَبْدِ اللهِ بْنِ بُسْرٍ قَالَ:

أَتَى النَّبِيَّ - ﷺ - رَجُلٌ، فَقَالَ: يَا رَسُولَ اللهِ إِنَّ شَرَائِعَ الْإِسْلَامِ قَدْ كَثُرَتْ عَلَيْنَا، فَبَابٌ نَتَمَسَّكُ بِهِ جَامِعٌ؟

قَالَ: "لَا يَزَالُ لِسَانُكَ رَطْبًا مِنْ ذِكْرِ اللهِ عَزَّ وَجَلَّ."

خَرَّجَهُ الْإِمَامُ أَحْمَدُ بِهَذَا اللَّفْظِ

අබ්දුල්ලාහ් ඉබ්නු බුස්ර් විසින් වාර්තා කරන ලදී.

නබි (ﷺ) තුමා වෙත මිනිසෙකු පැමිණ: අල්ලාහ්ගේ දූතයාණනි, සැබැවින්ම ඉස්ලාමයේ ආගමික නීති අප වෙත අධික වී ඇත. අපි හැමෝම පිළිපැදිය හැකි පාඩමක් කියා දෙන්නැයි විමසීය.

එයට එතුමා: "සර්වබලධාරී කීර්තිමත් අල්ලාහ් මෙනෙහි කිරීමෙන් ඔබේ දිව නිරන්තරයෙන්ම තෙතමනයෙන් තබන්න" යැයි පවසා සිටියහ.

මෙම පද පෙළ ඉමාම් අහ්මද් තුමා විසින් දන්වා ඇත.

***

අධික ලෙස අල්ලාහ් ව සිහිපත් කරන මෙන් දෙවියන් විශ්වාස කරන්නන් හට ඔහු නියෝග කර ඇත. එලෙසම ඔහුව සිහිපත් කරන්නන් ඔහු ප්‍රශංසාවට පත් කරයි. උත්තරීතර අල්ලාහ් සූරතුල් අහ්සාබ් හි 41 සහ 42 වන පාඨවල මෙසේ පවසයි: "අහෝ දෙවියන් විශ්වාස කළවුනි, අධික මෙනෙහි කිරීමෙන්

මෙනෙහි කරනු. උදේ සවස ඔහු ව පිවිතුරු කරනු.'' එමෙන්ම සූරා ජුමුආහි 10 වන පාඨයේ අල්ලාහ් මෙසේ පවසයි: ''නුඹලා ජය ලබනු පිණිස අධික ලෙස අල්ලාහ්ව මෙනෙහි කරනු.'' යැයි තවදුරටත් පවසා සිටියි.

මුස්ලිම් හි සඳහන් අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ හදීසයක, සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් ජුම්දාන්[307] නම් කන්දක් අසළින් ගමන් ගත්තේය. එවිට එතුමාණෝ: ''නුඹලා ගමන් ගනු! මෙය ජුම්දාන්ය! සැබැවින්ම මුෆර්රිදූන් වරු තරණය කර ඇත'' යැයි පැවසූහ. ඔවුහු මුෆර්රිදූන්වරු කවුරුන්දැ?යි විමසා සිටියෝය. එවිට එතුමා: ''අල්ලාහ්ව අධික ලෙස මෙනෙහි කරන්නන් හා මෙනෙහි කරන්නියන්'' යැයි පිළිතුරු දුන්හ.[308]

ඉෆාලාවට සමීප වන අවස්ථාවේ අරෆා රාත්‍රිය පිළිබඳ උමර් ඉබ්නු අබ්දුල් අසීස් කළ ප්‍රකාශයක් මෙම අර්ථයෙන්ම පිහිටා ඇත. එනම්: 'අද දින තම ඔටුවා පසු කර ගිය අය අබිබවා ගොස් නැත. අබිබවා ගොස් ඇත්තේ තමන්ට සමාව දානය කරනු ලැබූ තැනැත්තාය.'

''අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) සෑම වේලාවකම අල්ලාහ්ව මෙනෙහි කරමින් සිටි බව ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් වාර්තා කරන ලද හදීසයක් සහීහ් මුස්ලිම්හි සඳහන් ව ඇත.[309]

ඉමාම් හසන් තුමා: 'අල්ලාහ්ගේ ගැත්තන් අතුරින් වඩාත් ප්‍රියමනාප වනුයේ ඔවුන් අතර අධික ලෙස ඔහුව මෙනෙහි කරන්නන්ය' යැයි පවසා ඇත.

කඃබ් තුමා: 'කවරෙකු අධික ලෙස අල්ලාහ්ව මෙනෙහි කරන්නේද ඔහු කුහකත්වයෙන් ඉවත් විය.' මෙම අර්ථයට සාක්ෂි වශයෙන් කුහකයින්ගේ ගුණාංග පිළිබඳ වර්ණනා කරමින්: 'ඔවුන් ස්වල්ප පිරිසක් හැර අල්ලාහ්ව

307. ජුම්දාන් යන කන්ද මෙහි සඳහන් කර ඇත්තේ පිවිතුරු කිරීමේ ප්‍රමාණය පෙන්වා දීමටය. නිහායා නම් කෘතියෙහි (1/292) සඳහන් වන්නේ: එය මදීනාහි ලයිලා නම් ස්ථානයේ කන්දක් බවයි: එනම්, ලයිලා නම් ස්ථානයට නුදුරින් පිහිටා ඇත්තකි.

308. මුස්ලිම් (2676)

309. මුස්ලිම් (373)

මෙනෙහි කරන්නේ නැත' යැයි අල් කුර්ආනයේ සඳහන් ව ඇත. එමෙන්ම කවරෙකු අල්ලාහ්ව අධික ලෙස මෙනෙහි කරන්නේද ඔවුන්ගේ ගුණාංග පිළිබඳවත් ඔහු පැහැදිලි කරයි. සූරතුල් මුනාෆිකීන් හි 'අල්ලාහ්ව මෙනෙහි කරන මෙන් ඔහු නියෝග කොට, ධනය හෝ දරුවන් දේව විශ්වාසී මුඃමින්වරයාව එයින් වෙනතකට යොමු නොකළ යුතු බවත් අල්ලාහ්ව මෙනෙහි කිරීමෙන් ඒවා කවරෙක් වෙනතකට යොමු කළේ ද ඔහු අලාභවන්තයින් අතරට පත්වන බවත් පවසා අවසන් කර ඇත්තේ එබැවිනි.

අර්රබීඃ ඉබ්නු අනස් තුමා ඔහුගේ ඇතැම් අනුගාමිකයන් හට පවසා සිටියේ: 'අල්ලාහ්ගේ ආදරයේ සළකුණ ඔහුව අධික ලෙස මෙනෙහි කිරීමය. එහෙයින් ඔබ ඔහුව අධික ලෙස මෙනෙහි කිරීම මිස වෙනත් කිසිවක් ඔබට ප්‍රිය මනාප නොවිය යුතුය.'

ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය: 'සෑම අවස්ථාවකම නබි (ﷺ) තුමා අල්ලාහ්ව මෙනෙහි කරමින් සිටියහ' යැයි පවසා ඇත්තාහ.

එහි අදහස වනුයේ: එතුමා නැගිට සිටින විට, ඇවිදින විට, වාඩිවන විට, හාන්සිවන විට යන සෑම තත්ත්වයකම පිරිසිදුව සිටියද කිලිටිව සිටියද අල්ලාහ්ව මෙනෙහි කර ඇති බවයි.

කාලිද් ඉබ්නු මඃදාන් නම් ඉමාම් වරයා අල් කුර්ආනය කියවීමට අමතරව සෑම දිනකම වාර හාරදහසක් පමණ තස්බීහ් (අල්ලාහ්ව සුවිශුද්ධ) කිරීමෙහි නිරත වී ඇත. එතුමා මිය ගිය කල්හි නැවීම සඳහා යහන මත තබන ලදී. එවිට එතුමා තස්බීහ් කරමින් සිටි ඇගිල්ලෙහි සළකුණු දකින්නට විය.

උමෙය්ර් ඉබ්නු හානී තුමාට මෙසේ පවසන ලදී: 'ඔබේ දිව නිහඬ වනු අපි දැක නැත. සෑම දිනකම ඔබ කොපමණ වාරයක් තස්බීහ් කරන්නෙහිද? එවිට එතුමා ඇගිලි වරදින්නේ නම් හැර සිය දහස් වාරයක් යැයි පවසා සිටියහ. එයින් අදහස් වනුයේ එතුමා තම ඇගිලි මගින් ඒවා ගණන් කර ඇති බවයි.

පිරිසක් ඉබ්රාහීම් ඉබ්නු අද්හම් තුමා ළඟ නිදා ගෙන ඇත. ඉන් එක් අයකු මෙසේ පවසා සිටියේය. "රාත්‍රියේ මා අවදිවන සෑම අවස්ථාවකම ඔහු අල්ලාහ්ව මෙනෙහි කරමින් සිටිනු මම දුටිමි. නමුත් මට එය කළ නොහැකි

විය. පසුව මම මටම 'මෙය අල්ලාහ්ගේ භාග්‍යයයි ඔහු අභිමත කරන අයට පිරිනමන්නේය' යන (අල් කුර්ආන් 5:54) පාඨය කියවා ගත්තෙමි."

අල්ලාහ් පිළිබඳ දැනුම බලවත් වන සෑම කල්හිම කිසිදු අපහසුතාවයකින් තොරව මෙනෙහි කරන්නන්ගේ දිවවල් ඔහු මෙනෙහි කිරීමට යොමු වන්නේය. එබැවින් ස්වර්ගවාසීහු ඔවුන්ගේ ආත්මාවන් අතහැර දැමුවාක් මෙන් තස්බීහ් කිරීම මග නොහරියි. මෙලෝ වැසියන්හට සිසිල් ජලය මෙන් 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යන ප්‍රකාශය ඔවුනට පිහිටනු ඇත.

අල්ලාහ්ගේ හෙවණ හැර වෙනත් කිසිදු හෙවණක් නැති දිනයේ ඔහු ඔහුගේ හෙවණ ලබා දෙන හත් දෙනා අතරින් තනිව සිටිමින් අල්ලාහ්ව මෙනෙහි කර තම දෑස්වලින් කඳුළු සලන්නා ද එක් අයකි.

මෙනෙහි කිරීම උගතුන්ගේ සිත්වලට ඉම්හිරිය. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: 'ඔවුන් වනාහි, විශ්වාස කොට අල්ලාහ්ව මෙනෙහි කිරීමෙන් ඔවුන්ගේ හදවත් සැනසුමට පත් වූවන් වෙති. අල්ලාහ්ව මෙනෙහි කිරීමෙන් එම හදවත් සැනසුමට පත් නොවන්නේද? (සූරා අර්-රඃද්)

මාලික් ඉබ්නු දීනාර් තුමා: 'අල්ලාහ්ව මෙනෙහි කිරීම මෙන් සුවයක් සුව විදින්නන් අත් නොවිදිනු ඇත.'

***

## පරිච්චේදය

### දහවල් හා රාත්‍රි කාලයේ සුපුරුදු පරිදි මෙනෙහි කළ යුතු එදිනෙදා ප්‍රාර්ථනාවන්

සෑම දහවලකම හා රාත්‍රියකම මුස්ලිම්වරුන් අල්ලාහ් ව මෙනෙහි කරනු පිණිස පස්වාරයක් එහි නියමිත වේලාවේ සලාතය ඉටු කරන මෙන් ඔහු ඔවුනට නියම කර ඇති බව කවුරුත් දන්නා කරුණකි. මෙම අනිවාර්යය කටයුත්තත් සමග ඔහුව මෙනෙහි කරනු වස් ඔවුනට අතිරේක කරුණු ද ඔහු ඔවුනට ආගමානුගත කර ඇත. එය අනිවාර්යය කටයුත්තට අමතරව පිහිටන්නකි. නමුත් අනිවාර්යය කටයුත්තක යම් අඩුපාඩුවක් වූ විට එම අඩුපාඩුව අමතර ව සිදු කරන ලද ක්‍රියාව තුළින් පුරවා දමනු ලැබේ. එසේ නැතහොත් එම අමතර ව සිදු කරන ලද කටයුතු අනිවාර්යය කළ කටයුතු වලට අමතරව අතිරේකයක් ලෙස පිහිටනු ඇත.

සලාත් වේලාවන් අතර පවතින දිගුම කාලය මෙන්ම ඒ අතර කිසිදු අනිවාර්යය සලාතයක් නොමැති කාල පරිච්ඡේදය ඉෂා සලාතය හා ෆජ්ර් සලාතය අතර කාලය හා ෆජ්ර් සලාතය හා ලුහර් සලාතය අතර කාලයයි. මෙනෙහි කිරීමෙන් අනවධානීව සිටින කාලය අධික නොවනු පිණිස අතිරේක සලාතයන් ආගමානුගත කර ඇත. ඉෂා සලාතය හා ෆජ්ර් සලාතය අතර විත්ර් සලාතයත් කියාමුල් ලෙය්ල් සලාතයත් ආගමානුගත කර ඇති අතර ෆජ්ර් සලාතය හා ලුහර් සලාතය අතර ලුහා සලාතය ආගමානුගත කර ඇත.

දිවෙන් දික්ර් කිරීම -මෙනෙහි කිරීම- සියලුම වේලාවන්හි දී ආගමානුගත කර ඇති අතර ඒවායින් සමහර දෑ ඉතා වැදගත් වන්නේය.

එසේ මෙනෙහි කරනු ලබන ඉතා වැදගත් දික්ර් අතරින් අනිවාර්යය සලාතයන්ට පසුව පවතින දික්ර් පිහිටා ඇත්තේය.

එමෙන්ම ෆජ්ර් හා අසර් යන පසු සුන්නත් නොමැති සලාතයන් දෙකට පසුව දික්ර් කිරීම සතුටුදායක වන්නේය. ඒ අනුව ෆජ්ර් සලාතයට පසු හිරු උදාවන තෙක් ද අසර් සලාතයට පසු හිරු අවරට යන තෙක් ද දික්ර් කිරීම ආගමානුගත කර ඇත. ඒ දෙක දික්ර් කිරීමේ උතුම්ම වේලාවන් වේ.

උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි: "නුඹලා උදෑසන හා සවස ඔහු පිවිතුරු කරනු." (සූරා අල් අහ්සාබ් 42)

එමෙන්ම නිදා ගැනීම සඳහා තම නිදියහනට පැමිණෙන විට සැබැවින්ම ඔහු පිරිසිදු වී -වුළු ගෙන-[310] දික්ර් කිරීමෙන් පසුව මිස නින්දට නොයාම ඔහුට සතුටුදායක වන්නේය. එවිට ඔහු තස්බීහ් තහ්මීද් හා තක්බීර් වශයෙන් පූර්ණ ව සියවාරයක් දික්ර් හි නිරත වෙයි. නබි (ﷺ) තුමාණෝ ෆාතිමා තුමිය හා අලී තුමා යන දෙදෙනාට ඔවුන් දෙදෙනා නින්දට යෑමට පෙර එසේ සිදු කරන මෙන් ඔවුන් දෙදෙනාට ඉගැන්වූහ. එමෙන්ම නින්දට යන අවස්ථාවේ නබි (ﷺ) තුමාණන් විසින් දන්වා සිටි අද්කාර් හෙවත් ප්‍රාර්ථනාවන් ප්‍රමාණවත් තරම් පැමිණ ඇත. ඒවා අල් කුර්ආනය කියවීම, අල්ලාහ්ව දික්ර් කිරීම යනාදී වශයෙන් විවිධ වර්ගවලින් යුක්තය. පසුව ඒ මතම නින්දට යා යුතුය. රාත්‍රියේ අවදි වූ විට තම නිදියහනේ පෙරළෙන විට ඒ පෙරළෙන සෑම අවස්ථාවකදීම අල්ලාහ් මෙනෙහි කළ යුතුය.

නබි (ﷺ) තුමාණන් ප්‍රකාශ කළ බව උබාදා තුමා විසින් වාර්තා කළ හදීසයක් සහීහ් අල් බුහාරි හි මෙසේ සඳහන් වේ. "රාත්‍රියෙන් කවරෙකු අවදි වී:

310. එය බුහාරි හා මුස්ලිම්හි සඳහන් ව ඇති නබි (ﷺ) තුමාණන් පැවසූ බවට අල් බර්රා ඉබ්නු ආසිබ් විසින් වාර්තා කළ හදීසයකට අනුවය. එනම් එතුමා ඔහුට "ඔබේ නිදිහයටන ඔබ පැමිණි විට සලාතය සඳහා වුළූ ගන්නා අයුරින් ඔබ වුළූ ගත යුතුයි." අල්ලාහ්ගේ දූතයාණන් ප්‍රකාශ කළ බව ඉබ්නු අබ්බාස් විසින් වාර්තා කළ හදීසයක් 'අල් අව්සත්' (5083) හි ඉමාම් අත්තබරානී විසින් මෙසේ වාර්තා කර ඇත. 'ඔබේ ශරීරය ඔබ පිරිසිදු කර ගන්න - අල්ලාහ් ඔබව පිරිසිදු කරනු ඇත- පිරිසිදුව සිටින්නෙකු ලෙසින් රාත්‍රිය ගත කරන ගැත්තා ඔහුගේ හැඟීම් තුළ ඔහු සමග මලක්වරයකු ද රාත්‍රිය ගත කරනු මිස නැත. එම මලක්වරයා යා අල්ලාහ් ඔබ ඔබේ ගැත්තාට සමාව දෙනු මැනව. සැබැවින්ම ඔහු පිවිතුරු කෙනෙකු ලෙස රාත්‍රිය ගත කර ඇත්තේය' යැයි පවසා සිටිනු මිස රාත්‍රියෙක් හෝරාවක් පෙරළී යන්නේ නැත. අල් මුන්දිරී තුමා මෙහි වාර්තාකරණය වඩාත් යහපත් බව පවසා සිටින අතරම අල් අල්බානී තුමා 'සහීහ් අත් තර්ගීබ්'හි (595) හසන් ලිගයරිහි ගණයට අයත් හදීසයක් බව සඳහන් කරයි.

لاَ إِلَهَ إِلاَّ اللَّهُ وَحْدَهُ لاَ شَرِيكَ لَهُ، لَهُ الْمُلْكُ، وَلَهُ الْحَمْدُ، وَهُوَ عَلَى كُلِّ شَىْءٍ قَدِيرٌ. الْحَمْدُ لِلَّهِ، وَسُبْحَانَ اللَّهِ، وَلاَ إِلَهَ إِلاَّ اللَّهُ، وَاللَّهُ أَكْبَرُ، وَلاَ حَوْلَ وَلاَ قُوَّةَ إِلاَّ بِاللَّهِ.

ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීක ලහු ලහුල් මුල්කු වලහුල් හම්දු වහුව අලා කුල්ලි ෂෙයිඉන් කදීරි සුබ්හානල්ලාහි වල් හම්දුලිල්ලාහි වලා ඉලාහ ඉල්ලල්ලාහු වල්ලාහු අක්බර් වලා හව්ල වලා කුව්වත ඉල්ලා බිල්ලාහ්’

තේරුම: නැමදුමට සුදුසු අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නැත. ඔහු ඒකීයය. ඔහුට කිසිදු හවුල්කරුවකු නැත. සියලු ආධිපත්‍යය ඔහු සතුය. සියලු ප්‍රශංසා ඔහු සතුය. සියලු දෑ මත බලය දරන්නාය. සියලු ප්‍රශංසා අල්ලාහ් සතුය. අල්ලාහ් සුවිශුද්ධය. නැමදුමට සුදුසු අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නැත. අල්ලාහ් අති ශ්‍රේෂ්ටය. අල්ලාහ්ගෙන් මිස කිසිදු බලයක් හෝ වෙනස් වීමක් නොමැත.

යැයි පවසා පසුව

رَبِّ اغْفِرْ لِي

තේරුම: මාගේ පරමාධිපතියාණනි, මට සමාව දෙනු මැනව.

“රබ්බිග්ෆිර්ලී” යැයි පවසයි. එසේ නැතිනම් ඔහු ප්‍රාර්ථනා කර සිටියි. එවිට ඒ සඳහා පිළිතුරු දෙනු ලබනු ඇත. ඔහු අධිෂ්ඨානයෙන් යුතුව වුළු ගෙන පසුව සලාතය ඉටු කළේ නම් ඔහුගේ සලාතය පිළිගනු ලබනු ඇත.[311]

නබි (ﷺ) තුමාණන් තම නින්දෙන් අවදි වූ විට:

الْحَمْدُ لِلَّهِ الَّذِي أَحْيَانَي بَعْدَ مَا أَمَاتَنَي وَإِلَيْهِ النُّشُورُ

“අල්හම්දු ලිල්ලාහිල්ලදී අහ්යානී බඃද මා අමාතනී වඉලයිහින් නුෂූර්”

311. බුහාරි (1154).

තේරුම: අප මිය ගිය පසුව අපව අවදි කළ අල්ලාහ්ටම සියලු ප්‍රශංසා. මළවුන් කෙරෙන් යළි නැගිටවනු ලබනුයේ ඔහු වෙතය.

යන ප්‍රාර්ථනාව පවසන්නෙකු ලෙස සිටි ඇති බව තහවුරු වී පැමිණ ඇත.[312]

පසුව එතුමා අලුයම් කාලයේ පිරිසිදු වී තහජ්ජුද් සඳහා නැගිටින විට -නබි (ﷺ) තුමාණන් විසින් වාර්තා වී ඇති පරිදි- එතුමාණන් ඒ සියලු දෑ ගෙන ආහ. එතුමාගේ තහජ්ජුද් සලාතය -සහර් කාලයේ සමාව අයැදින්නන් පිළිබඳ අල්ලාහ් පැසසුමට ලක් කළ පරිදි - සමාව අයැද සිටිමින් අවසන් කරයි. ෆජ්ර් කාලය එළැඹෙත්ම රකආත් දෙකක් ඉටු කරයි. පසුව ෆජ්ර් සලාතය ඉටු කර ෆජ්ර් සලාතයෙන් පසුව හිරු උදාවන තෙක් දෛනික දික්ර්හි නිරත වෙයි.

කරුණක අවසානය සෑම උදාසීන කරුණකම ඔබ වීමය.

කරුණක මුල මාගේ ආත්මයේ කාලය වීමය.

අල්ලාහ් වෙත පසුතැවිලි වීමත් කුඩා හා මහා පාපයන් සියල්ල සඳහා පාපක්ෂමාව අයැද සිටීමත් අනිවාර්යය වන්නේය. උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි. “තවද (ඔවුහු) කවුරුන්දයත් ඔවුන් අශික්ෂිත දැයක් කළ විට හෝ ඔවුන් තමන්ටම අපරාධ කර ගත් විට අල්ලාහ් ව මෙනෙහි කර තමන්ගේ පාපයන්ට සමාව අයැදිති...” (ආලු ඉම්රාන් 135)

එහෙයින් මේ අනුව පිළිපදින්නා ඔහුගේ සියලුම තත්ත්වයන්හි අල්ලාහ් ව මෙනෙහි කරමින් තම දිව තෙත් කර ගැනීමෙන් ඉවත් වන්නේම නැත.

***

312. බුහාරි (6325), මුස්ලිම් (2711) අල් බරා තුමාගේ හදීසකි.

# පටුන


| | |
|---|---|
| පෙරවදන අෂ්-ෂෙයික් අබ්දුල් අසීස් අත්තරීෆී | 5 |
| මුහම්මද් ඉබ්නු සුලෙය්මාන් ඉබ්නු අබ්දුල්ලාහ්ගේ ශුභාශිංසනය | 12 |
| ඉමාම් ඉබ්නු රජබ් අල් හන්බලී පිළිබඳ හැඳින්වීමක් | 15 |
| පළමු හදීසය: "සියලු ක්‍රියාවන් චේතනාවන් අනුව පිහිටනු ඇත..." | 17 |
| දෙවන හදීසය: "දිනක් අපි අල්ලාහ්ගේ දූතයාණන් (ﷺ) තුමා අබියස වාඩි වී සිටියදී සුදෝ සුදු ඇඳුමින් සැරසුණු කළුම කළු හිසකෙස් සහිත මිනිසෙකු අප වෙත උදා විය. | 31 |
| තුන්වන හදීසය: "කරුණු පහක් මත ඉස්ලාමය ගොඩ නැගී ඇත. | 42 |
| සිව්වන හදීසය: සැබැවින්ම ඔබෙන් කෙනෙකු, ඔහුගේ මැවීම ඔහුගේ මවගේ කුස තුළ දින හතළිහක් ශුක්‍රාණු බිඳුවක් සේ එක්කාසු කරනු ලැබේ | 47 |
| පස් වන හදීසය: "කවරෙකු අපගේ කටයුතුවල එහි නොමැති යමක් අලුතින් බිහි කරන්නේද ඔහු ප්‍රතික්ෂේප කරනු ලැබූවෙකි." | 55 |
| හය වන හදීසය: "නියත වශයෙන්ම හලාල් (හෙවත් අනුමත දෑ) ඉතා පැහැදිලිය. එමෙන්ම හරාම් (හෙවත් තහනම් දෑ) ද ඉතා පැහැදිලිය..." | 59 |
| සත් වන හදීසය: "දහම උපදෙසකි" | 70 |
| අට වන හදීසය: මිනිසුන්, නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියකු නොමැති බවත් | 75 |
| නව වන හදීසය: "මා නුඹලාට කවර දෙයක් තහනම් කළේද නුඹලා එයින් වැළකී සිටිනු..." | 80 |

| | |
|---|---|
| දහ වන හදීසය: "සැබැවින්ම අල්ලාහ් පිවිතුරුය. ඔහු පිවිතුරු දෑ මිස වෙනකක් පිළිගන්නේ නැත..." | 86 |
| එකොළොස් වන හදීසය: "ඔබට සැක ඇති කරන දෑ ඔබට සැක ඇති නොකරන තෙක් අතහැර දමනු." | 95 |
| දොළොස් වන හදීසය: "තමන්ට අවශ්‍ය නොවන දෑ අතහැර දැමීම පුද්ගලයකු සතු ඉස්ලාමයේ ගුණවත්බවින් එකකි." | 99 |
| දහ තුන් වන හදීසය: ඔබ අතුරින් කිසිවකු තමන් ප්‍රිය කරන දෑ තම සහෝදරයා වෙනුවෙනුත් ප්‍රිය කරන තෙක් ඔහු දෙවියන් විශ්වාස කරන්නෙකු නොවේ. | 102 |
| දහ හතර වන හදීසය: "කාමයේ වරදවා හැසිරුණු විවාහකයා, පණට පණ..." | 107 |
| පහළොස් වන හදීසය: "කවුරුන් අල්ලාහ් හා පරමාන්ත දිනය විශ්වාස කරන්නේද ඔහු යහපතම කතා කරත්වා.." | 111 |
| දහසය වන හදීසය: සැබැවින්ම මිනිසෙකු 'මට උපදෙස් දෙන්නැ'යි නබි (ﷺ) තුමාණන්හට පැවසීය..." | 126 |
| දහ හත් වන හදීසය: "සැබැවින්ම අල්ලාහ් සියලු දෑට යහපත කිරීම නියම කර ඇත..." | 134 |
| දහ අට වන හදීසය: "ඔබ කොතැනක සිටියද අල්ලාහ්ට බැතිමත්ව කටයුතු කරන්න..." | 138 |
| දහ නව වන හදීසය: දිනක් මම නබි (ﷺ) තුමාට පසුපසින් වාඩිවී (ගමනක් යමින්) සිටියෙමි. එවිට එතුමා ...." | 155 |
| විසි වන හදීසය: "මුල් කාලීන නබිවරුන්ගේ ප්‍රකාශයෙන් මිනිසා ලබා ඇති දෑ වනුයේ: ..." | 168 |
| විසි එක් වන හදීසය: "මම අල්ලාහ්ගේ දූතයාණන්ගෙන්: අල්ලාහ්ගේ දූතයාණනි, ඔබෙන් හැර වෙන කිසිවකුගෙන් මා ඒ ගැන විමසා නැති..." | 172 |
| විසි දෙවන හදීසය: සැබැවින්ම මිනිසෙකු අල්ලාහ්ගේ දූතයාණන්ගෙන්: 'මා අනිවාර්යය | 176 |

| | |
|---|---|
| සලාත් ඉටු කර, රමළාන් මාසයේ උපවාසයේ නිරත වී, | |
| විසි තුන් වන හදීසය: “පිරිසිදුකම ඊමාන් -දේව විශ්වාසයෙ-හි අඩකි. අල් හම්දු ලිල්ලාහ් -සියලු පැසසුම් අල්ලාහ්ටය යන ප්‍රකාශය ...” | 184 |
| විසි හතර වන හදීසය: “මාගේ ගැත්තනි, අසාධාරණය (අපරාධය) මම මා මතම තහනම් කර ගත්තෙමි...” | 194 |
| විසි පස් වන හදීසය: “අල්ලාහ්ගේ දූතයාණෙනි, ධනවත් අය ප්‍රතිඵල වලින් ඉදිරියට ගොස් ඇත...” | 211 |
| විසි හය වන හදීසය: “මිනිසාගෙන් වූ සෑම පුරුකකටම හිරු උදාවන සෑම දිනකම ඒ සඳහා දිය යුතු දානයක් ඇත:” | 217 |
| විසි හත් වන හදීසය: “දැහැමිකම යනු: යහපත් සදාචාරයයි. පාපය යනු ඔබේ සිත තුළ හට ගැනෙන සැකයයි. | 222 |
| විසි අට වන හදීසය: අල්ලාහ්ගේ දූතයාණෝ (ﷺ) අපට උපදෙසක් දුන්හ. එයින් හදවත් තිගැස්සී ගියේය. ඇස් කඳුළු සලන්නට විය...” | 227 |
| විසි නව වන හදීසය: “අල්ලාහ්ගේ දූතයාණෙනි, ස්වර්ගයට මා ඇතුළත් කරන නිරා ගින්නෙන් මා දුරස් කරන ක්‍රියාවක් ගැන මට දන්වා සිටින්නැයි” | 237 |
| තිස් වන හදීසය: “නියත වශයෙන්ම අල්ලාහ් ‘ෆරාඉළ්’ (හෙවත් ආගමික අනිවාර්යය කටයුතු) නියම කර ඇත.. | 245 |
| තිස් එක් වන හදීසය: මිනිසෙකු නබි (ﷺ) තුමා වෙත පැමිණ: අල්ලාහ්ගේ දූතයාණෙනි, එය මා ඉටු කළ විට අල්ලාහ් මට ප්‍රිය කරන එමෙන්ම...” | 251 |
| තිස් දෙවන හදීසය: “හිංසා කළ යුතු නැත. හිංසා කරනු ලැබිය යුතු ද නැත.” | 261 |
| තිස් තුන් වන හදීසය: “මිනිසුන් වාද කොට ඉල්ලා සිටින දෑ ඔවුනට පිරිනමනු ලබන්නේ නම්,.. තිස් හතර වන හදීසය: “නුඹලා අතරින් කිසිවෙකු පිළිකුල් | 265 |

| | |
|---|---|
| සහගත දෙයක් දුටුවේ නම් එය ඔහු ඔහුගේ දෑතින් වළක්වත්වා...” | |
| තිස් හතර වන හදීසය: “නුඹලා අතරින් කිසිවෙකු පිළිකුල් සහගත දෙයක් දුටුවේ නම් එය ඔහු ඔහුගේ දෑතින් වළක්වත්වා...” | 270 |
| තිස් පස් වන හදීසය: “නුඹලා එකිනෙකාට ඊර්ෂ්‍යා නොකරන්න...” | 276 |
| තිස් හය වන හදීසය: “කවරෙකු මුඃමින්වරයකුගෙන් මෙලොව දුෂ්කරතා අතුරින් දුෂ්කරතාවක් සැහැල්ලු කරන්නේ ද...” | 289 |
| තිස් හත් වන හදීසය: “සැබැවින්ම අල්ලාහ් යහකම් හා අයහකම් ලියා ඇත. පසුව ඔහු එය මෙසේ පැහැදිළි කළේය.. | 299 |
| තිස් අට වන හදීසය: “නියත වශයෙන්ම උත්තරීතර අල්ලාහ් මෙසේ පවසා ඇත: ‘යමෙක් මාගේ වලි (මිතුරා) ට සතුරුකම් කරන්නේ නම්,..” | 307 |
| තිස් නව වන හදීසය: “නියත වශයෙන්ම අල්ලාහ් මාගේ සමූහයාට ඔවුන්ගේ වැරදි, අමතකවීම් සහ ඔවුන්ට බලහත්කාරයෙන් කිරීමට සිදු වූ දේ සඳහා සමාව ලබා දී ඇත” | 314 |
| හතළිස් වන හදීසය: “ඔබ ආගන්තුකයෙකු හෝ මඟ තරණය කරන්නෙකු මෙන් ලොවෙහි සිටිනු” | 317 |
| හතළිස් එක් වන හදීසය: “මා කවර කරුණක් ගෙන ආවේ ද එය අනුගමනය කරන්නක් ලෙස...” | 323 |
| හතළිස් දෙවන හදීසය: “ආදම්ගේ පුත්‍රය, ඔබ මා අමතා මගෙන් ඉල්ලන තාක් කල්,...” | 327 |
| හතළිස් තුන් වන හදීසය: “නියමිත උරුමයන් එහි හිමිකරුවන්හට සේන්දු කරන්න,...” | 332 |
| හතළිස් හතර වන හදීසය: “බිහි කළ දරුවාට තහනම් කර ඇති දෑ කිරි දී හදාවඩා ගන්නා දරුවාට ද තහනම් කර ඇත.” | 334 |

| | |
|---|---|
| හතළිස් පස් වන හදීසය: 'සැබැවින්ම අල්ලාහ් හා ඔහුගේ දූතයාණන් මත් ද්‍රව්‍ය, මිය ගිය සතුන් ශූබරයින් හා පිළිම....' | 336 |
| හතළිස් හය වන හදීසය: "නබි (ﷺ) තුමාණෝ ඔහුව (අබූ මූසා අල් අෂ්අරීව) යමන් දේශයට යැවූහ. එතුමා ඔහුගෙන් එහි නිෂ්පාදනය කරන බීම වර්ග පිළිබඳ විමසමින් 'ඒවා මොනවා දැයි?' ඇසූහ." | 340 |
| හතළිස් හත් වන හදීසය: "මිනිසෙකු තම බඩට වඩා දරුණු ලෙස කිසිදු භාජනයක් පුරවන්නේ නැත." | 343 |
| හතළිස් අට වන හදීසය: "කරුණු හතරක් ඇත. කවුරුන් තුළ ඒවා තිබෙන්නේ ද ඔහු කුහකයකු වන්නේය..." | 346 |
| හතළිස් නව වන හදීසය: ""'සැබැවින්ම නුඹලා අල්ලාහ්ට පැවරිය යුතු නියම අයුරින් ඔහු වෙත සියල්ල පවරන්නෙහු නම්,..." | 352 |
| පනස් වන හදීසය: නබි (ﷺ) තුමා වෙත මිනිසෙකු පැමිණ: අල්ලාහ්ගේ දූතයාණනි, සැබැවින්ම ඉස්ලාමයේ ආගමික නීති අප වෙත අධික වී ඇත. | 355 |
| පරිච්ඡේදය: දහවල් හා රාත්‍රී කාලයේ සුපුරුදු පරිදි මෙනෙහි කළ යුතු එදිනෙදා ප්‍රාර්ථනාවන් | 359 |